විගණකාධිපතිවරයාගේ ත්‍රෛවාර්ෂික වාර්තාව

2021-2023

අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ

පටුන

			පිටු අංක.
1.	විධායක සාරාංශය		3
2.	මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය		4
3.	අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ වල ස්වාධීන නිරීක්ෂණ		
	3.1	සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය	8
	3.2	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	21
	3.3	ධීවර අමාත්‍යාංශය	25
	3.4	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය	33
	3.5	සෞඛ්‍ය අමාත්‍යාංශය	57
	3.6	ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය	113
	3.7	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	124
	3.8	විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය	140
	3.9	ආරක්ෂක අමාත්‍යාංශය	143
	3.10	අධිකරණ අමාත්‍යාංශය	153
	3.11	මහජන ආරක්ෂක අමාත්‍යාංශය	164
	3.12	වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය	172
	3.13	වාරිමාර්ග අමාත්‍යාංශය	176
	3.14	විදේශ කටයුතු අමාත්‍යාංශය	240
	3.15	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	246
	3.16	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය	252
	3.17	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය	281
	3.18	කෘෂිකර්ම අමාත්‍යාංශය	284

	3.19	වී හා ධාන්‍ය,කාබනික ආහාර,එළවළු, පළතුරු,මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය	302
	3.20	ජනමාධ්‍ය අමාත්‍යාංශය	306
	3.21	අධ්‍යාපන අමාත්‍යාංශය	308
	3.22	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය	335
	3.23	කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය	343
	3.24	ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය (ශීර්ෂය - 166)	346
	3.25	තාක්ෂණ අමාත්‍යාංශය	359
	3.26	කර්මාන්ත අමාත්‍යාංශය	363
	3.27	පරිසර අමාත්‍යාංශය	372
	3.28	වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය	387
	3.29	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	392

1. විධායක සාරාංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ සම්බන්ධයෙන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව 2021-2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල ත්‍රෛවාර්ෂික විගණකාධිපති තත්ත්ව වාර්තාව නිකුත් කෙරේ. කාලපරිච්ඡේදය තුල රජයේ අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ වෙත නිකුත් කරන ලදුව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද විගණන නිරීක්ෂණ වල සාරාංශයක් මෙම වාර්තාවේ දැක්වේ. එම නිරීක්ෂණ සම්බන්ධයෙන් විගණකාධිපති නිර්දේශ, එක් එක් විගණිත ආයතනය විසින් නිරීක්ෂණවලින් පෙන්වා දී ඇති අඩුපාඩු, වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ග හා එම නිරීක්ෂණ වල වර්තමාන ත්ත්ත්වයද සාරාංශ ගත කර මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

අනුමත ඇස්ත්මේන්තු අනුව 2021 වර්ෂයේදී 41ක් ව පැවති රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව 2022 වර්ෂයේ සැප්තැම්බර් මාසය දක්වා පැවති අතර ඉන් පසුව අහෝසි විය. රජයේ අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ නිරන්තරයෙන් වෙනස්වීමට ලක්වන විගණන අස්ථිත්වයන් වේ. ඒවායේ විෂය පථය විටින් විට වෙනස්වීමත්, අමාත්‍යාංශ ඒකාබද්ධ කිරීමත් සහ නැවත ඒවා වෙන්කිරීත් වැනි කරුණු හේතුවෙන් ජාතික විගණන පනතේ සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව විගණන අස්ථිත්වය නිශ්චිතවම හඳුනාගැනීමට අපහසු වූ අවස්ථා බොහෝමයක් පැවතුණි. එසේම එවැනි අමාත්‍යාංශවල ගණන්දීමේ නිලධාරීන් සහ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හඳුනාගැනීමට දුෂ්කර වූ අවස්ථා ද විය. තවද අමාත්‍යාංශ නිරන්තරයෙන් වෙනස්වීම්වලට ලක්වන විගණන අස්ථිත්වයන් වන හෙයින් ඉහත කාලපරිච්ඡේදය තුල සියළුම අමාත්‍යාංශ සඳහා වෙන්කර තිබූ ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනත්, ශුද්ධ ප්‍රතිපාදනත්, ඒවායේ ඉතිරිකිරීම් යනාදිය පිළිබඳව සතුටුදායක ලෙස ඇඟයීමක් කල නොහැකි විය. එසේම එම ඉතිරිකිරීම් තුළින් ජාතික අයවැය කෙරෙහි ඇතිවන අහිතකර බලපෑම පිළිබඳවද විග්‍රහයක් කල නොහැකි විය..

2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මගින් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශයන්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ.

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් හා විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන් සලකාබැලීමෙන් අනතුරුව සිව් ආකාරයක මතයන් ප්‍රකාශයට පත්කරනු ලබයි. ඒවා නම්.

තත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හෝ අනුකූල නොවීම වාර්තා වී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

තත්ත්වාගණනය කළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන හෝ නොගැලපීම් වාර්තා කර ඇති නමුත් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වලට පැතිරී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

අහිතකර මතය

මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර ඇති ප්‍රමාණාත්මක / සාවද්‍ය ප්‍රකාශයන් මූල්‍ය ප්‍රකාශන වලට ව්‍යාප්ත වී ඇති විට, අහිතකර විගණන මතය ප්‍රකාශ කෙරේ.

මතය ව්‍යාවනය කිරීම

විෂය පථය සීමා වීම හේතුවෙන් විගණකට විගණන මතය සඳහා ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වීම හා විගණක විසින් මූල්‍ය ප්‍රකාශන වල හෙළි නොවූ සාවද්‍ය ප්‍රකාශ තිබිය හැකි යැයි තීරණය කරන විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ වල මතය පිළිබඳ විස්තර

2021, 2022 සහ 2023 වසර සඳහා අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ 29කට අදාළව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන මතයන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

	2021	2022	2023
තත්ත්වාගණනය නොකල	6	6	7
තත්ත්වාගණනය කල	22	22	21
අහිතකර	-	-	-
වියාචනය	-	-	-
මතය තවමත් තීරණය කර නොමැති ගණන	1	1	1
මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැති ගණන	-	-	-

	සමාගම් නාමය	2021	2022	2023
1.	සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
2.	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
3.	ධීවර අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
4.	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
5.	සෞඛ්‍ය අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
6.	ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය	-	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
7.	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
8.	විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ

9.	ආරක්ෂක අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
10.	අධිකරණ අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
11.	මහජන ආරක්ෂක අමාත්‍යාංශය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
12.	වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
13.	වාරිමාර්ග අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
14.	විදේශ කටයුතු අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
15.	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
16.	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
17.	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
18.	කෘෂිකර්ම අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
19.	වී හා ධාන්‍ය,කාබනික ආහාර,එළවළු, පළතුරු,මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය	තත්ත්වාගණනය නොකළ	-	-
20.	ජනමාධ්‍ය අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
21.	අධ්‍යාපන අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
22.	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
23.	කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ

24.	ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය (ශීර්ෂය - 166)	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
25.	තාක්ෂණ අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
26.	කර්මාන්ත අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
27.	පරිසර අමාත්‍යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
28.	වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
29.	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ

3. අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ වල ස්වාධීන නිරීක්ෂණ

3.1 සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	358,931,976	101,900	358,830,076	-	තත්ත්වාගණනය කළ
2022	553,963,249	29,545,578	524,417,671	-	තත්ත්වාගණනය නොකළ
2023	612,627,822	28,373,046	584,254,776	-	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	රජයේ සංවර්ධන ව්‍යාපෘතින් සඳහා ඉඩම් අත්පත් කරගැනීමට අදාළ වන්දි මුදල් ප්‍රමාදයකින් තොරව ගෙවීම සහ ප්‍රමාදය මත ගෙවීමට සිදුවී ඇති අධික පොලී මුදල් අඩුකර ගැනීමේ අරමුණ ඇතිව අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ පනත සංශෝධන කිරීමට සැලසුම් කර තිබුණද, 2021 වර්ෂය අවසන් වන විටත් අදාළ සංශෝධනය සිදුකර නොතිබුණි.	2021	ඉඩම් අත්පත් කරගැනීමේ පනත කඩිනමින් සංශෝධනය කළ යුතුය.	පනතේ සංශෝධන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත. 2021.11.17, 2022.06.01, 2022.12.12 හා 2023.11.01 දිනැතිව නීති කෙටුම්පත් සම්පාදක වෙතින් කෙටුම්පත් ඉදිරිපත් කර ඇත. එම දෙපාර්තමේන්තුව සමඟ නීති සාකච්ඡා සිදුකර අවසාන අනෙකුත් සම්බන්ධයට ආයතන හා සාකච්ඡා කර සංශෝධනය කළ යුතු කොටස් හඳුනා ගැනීමට කටයුතු කර ඇත.	අවසන් කෙටුම්පත අදාළ වන අනෙකුත් ආයතන වෙත යොමු කර නිරීක්ෂණ කැඳවීමට පියවර ගෙන ඇතත් පනත සංශෝධනය කර නොමැත.
02	2019, 2020 හා සමාලෝචිත වර්ෂයට අදාළව ඉඩම් අත්පත් කරගැනීම සඳහා ක්‍රියාත්මක ගොනු ගණනින් වන්දි ගෙවා	2021	ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කරගත	පරිගණක ක්‍රමවේදය හඳුන්වාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් අදාළ අංශ දැනුවත් කිරීම,	පරිගණක පද්ධතිය සකස් කිරීම හා ව්‍යාපෘති යෝජනාව

	වැඩ අවසන් කළ ගොනු ගණන සියයට 2 කට අඩු අගයක් ගෙන තිබුණු අතර 2021 වර්ෂයේදී ක්‍රියාත්මක වුණු ගොනු 9,073 න් වැඩ අවසන් කළ ගොනු ගණන 13 ක් පමණක් විය. ඒ අනුව අත්පත් ක්‍රියාවලියට සම්බන්ධ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධ වී කඩිනමින් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.		යුතුය.	නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම, අත්කර ගැනීම් පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම හා අත්පත් අංශය තුළ සරල දත්ත පද්ධතියක් ඇති කිරීම යන ක්‍රියාමාර්ග ගෙන ඇත.	සකස් කර අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. ඉඩම් අත්පත් කරගැනීම සඳහා ප්‍රමාණවත්ව කටයුතු කර නොතිබුණි.
03	2012 වර්ෂයේදී වේරැස්ස ගඟ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ බොරලැස්ගමුව, පිටවෙල්ල පාර හා බොරුපන පාලම අතර ඇති අතහැර දමන ලද වගුරු බිම් ප්‍රදේශයේ ජල රක්ෂිතයක් නිර්මාණය කිරීම සඳහා බොරලැස්ගමුව වැවේ ගහබඩ කුඹුර, මුනමල්වත්ත, ගහබඩ ඕවිට, දෙල්ගහ ඕවිට, යල් කුඹුර යන ඉඩම්වලින් අක්කර 98 ක් අත්පත් කරගෙන තිබුණි. අදාළ අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ නියමය 2012 ජූලි 16 දින ද, 38(අ) වගන්තිය යටතේ අතුරු විධාන ආඥාව 2013 ඔක්තෝබර් 14 දිනැති අංක 1830/51 දරන ගැසට් පත්‍රයේ පළකර තිබුණද, අත්පත් කරගත් මුළු ඉඩම සඳහාම වන්දි හා පොලී මුදල් අත්පත් කරගැනීම්	2021	අදාළ ඉඩම අත්පත්කර ගැනීමේ කටයුතු අවසන්කර කඩිනමින් වන්දි ගෙවිය යුතුය.	පරිගණකගත ක්‍රමවේදය හඳුන්වාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් අදාළ අංශ දැනුවත් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම, අත්කර ගැනීම් පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සහ අත්පත් අංශය තුළ සරල දත්ත පද්ධතියක් ඇති කිරීම යන ක්‍රියාමාර්ග ගෙන ඇත.	මෙහි අත්කර ගැනීමට අදාලව මූලික පිඹුරේ වන්දි හා පොලී ගෙවීමට හැකියාවක් ඇති ඉඩම් කැබලි වලින් සියයට 40කට පමණ ආසන්න ප්‍රමාණයක් සඳහා වන්දි හා පොලී ගෙවා අවසන් කර ඇත.

	කටයුතු සම්පූර්ණ නොවීම, ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම ආදී හේතු මත මෙතෙක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.				
04	ඉඟිනිමිටිය ජලාශ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කරගැනීම සඳහා අත්පත් කරගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකාරව අතුරු විධාන ආඥාව 1984 වර්ෂයේ නිකුත් කර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 38 ක් ගතවී තිබුණු අතර ,අදාළ වන්දි මුදල ගෙවීම සඳහා රු. 5,122,123 ක ප්‍රතිපාදන මුදලක් 2014 වර්ෂයේ අමාත්‍යාංශය විසින් නවගත්තේගම ප්‍රාදේශීය මහ ලේකම් වෙත නිකුත් කර වර්ෂ 07 කට වැඩි කාලයක් ගතවී ඇතත් එම මුදල් ගෙවීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. තවද 2022 පෙබරවාරි 21 දිනැති NWG/LSD/1/ACQU1/1/6 අංක දරන නවගත්තේගම ප්‍රාදේශීය මහ ලේකම් විසින් නිකුත් කළ ලිපිය මගින් ඉඟිනිමිටිය ජලාශ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් වන්දි ගෙවිය යුතු ඉඩම් කැබලි අංක හඳුනාගත නොහැකි බවද අමාත්‍යාංශය වෙත වාර්තා කර තිබුණි.	2021	අදාළ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු අවසන් කර කඩිනමින් ගෙවිය යුතුය.	-එම-	ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතුවල ප්‍රගතිය දක්වා නොමැත.
05	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අක්කර 05 ක ඉඩමක් ගාල්ල, බද්දේගම	2021	අදාළ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු අවසන්	අත්පත් කර ගැනීම් පනතේ නව සංශෝධනය 38(අ) අතුරු ව්‍යවස්ථාව	ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතුවල ප්‍රගතිය දක්වා

	තොරතුරු තාක්ෂණය පිළිබඳ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා අත්පත් කරගැනීමට අදාළව ඉඩම් අත්කර ගැනීමේ පනතේ වගන්ති අංක 02 යටතේ දැන්වීම් පළකිරීම 2000 වර්ෂයේදීද, වගන්ති අංක 38(අ) යටතේ අතුරු ආඥාව නිකුත් කිරීම 2001 වර්ෂයේදීද සිදුකර තිබුණි. වටිනාකම රු. 8,000,000 ක් වූ වන්දි මුදල් ගෙවීම 2020 ඔක්තෝබර් 27 දින දක්වා ප්‍රමාද වීම හේතුවෙන් වර්ෂ 19 ක් සඳහා සියයට 07 බැගින් රු. 10,790,740 ක පොලී මුදල් ගෙවීමට සිදුවී තිබුණි.		කර කඩිනමින් වන්දි ගෙවිය යුතුය.	යටතේ හදිසි භුක්තිය භාර ගැනීමේ අවස්ථාව සීමා කර ඇත. පරිගණක ක්‍රමවේදය හඳුන්වාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් අදාළ අංශ දැනුවත් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම, අත්කර ගැනීම් පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සහ අත්පත් අංශය තුළ සරල දත්ත පද්ධතියක් ඇති කිරීම යන ක්‍රියාමාර්ග ගෙන ඇත.	නොමැත.
06	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු. රෙ. 103(1)(ඊ) ප්‍රකාරව හානිය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කළ යුතු වුවත් අංක KI – 1527 දරන රථය 2018 අගෝස්තු 20 දින මතුගම ප්‍රාදේශීය සභා රථගාලේදී සිදුවූ අනතුර සම්බන්ධයෙන් වූ අවසන් වාර්තාවට අනුව එම වාහනයේ ගමන් කළ ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම් වගකිව යුතු බවට තීරණය කර එම අලාභයේ වටිනාකම රු. 462,800 ක් ලෙස ගිණුම්වල දක්වා ඇතත් 2023 අප්‍රේල් 06 විගණිත දින වන විටද අලාභය අය කරගෙන නොතිබුණි.	2022	අවසන් වාර්තාවේ සඳහන් නිර්දේශ නොපමාව ක්‍රියාත්මක කළ යුතුය.	අමාත්‍ය කාර්යාලය වෙත ඒකාබද්ධ රියදුරු සේවයේ රියදුරන් අනුයුක්ත කිරීමට කටයුතු කළ අතර රථ වාහන අනතුරක් වූ වහාම ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව අදාළ නිලධාරීන්, රියදුරන් දැනුවත් කර ඇත. මේ වන විට පැවති අඩුපාඩු මගහරවාගෙන කටයුතු කරමින් සිටී.	වාහනය අනුයුක්තව සිටි නිලධාරියාගෙන් අයකර ගැනීමට තීරණය කර ඇති නමුත් වගකිව යුතු නිලධාරියා එය නොගෙවීම හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති වෙත යොමුකර ඇත.

07	මොරගහහේන උප නගර සංවර්ධනය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මොරගහහේන ගමේ පිඹුරු අංක 4406 හි අක්කර 01 රූඩ් 02 පර්චස් 20 ඉඩම (හෙක්ටයාර් 0.6545) අත්පත් කර ගැනීම සඳහා වූ ඉල්ලුම්පත 2007 සැප්තැම්බර් 06 දින නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී 2008 ජූලි 31 දිනැති ගැසට්පත් අංක 1560/16 මඟින් 38(අ) අතුරු විධානය පළ කර ඉඩමේ භුක්තිය භාරගෙන තිබුණි. ඉඩමේ භුක්තිය රජයට භාර ගෙන වසර 05 කට පසුව ඉඩම් සඳහා අයිතිවාසිකම් ඉදිරිපත් කිරීමට දැනුම් දී තිබුණු අතර වන්දි මුදල් හිමි තැනැත්තන්ගේ නම්, ලිපිනයන්, ඉඩමේ විස්තර හා වන්දි මුදල පිළිබඳ දැක්වෙන විස්තර 17 වගන්තිය යටතේ පළ කිරීමට 7 වගන්තිය පළ කල දින සිට වසර 06 ක කාලයක් ගත වී තිබුණි. මේ අනුව ඉහත ක්‍රියාවලිය සඳහා වසර 12 ක පමණ කාලයක් ඉක්මවා තිබීම හේතුවෙන් කැබලි අංක 1,10,11,14 සඳහා ගෙවන ලද වන්දි මුදල වූ රු.26,180,250 ක් සඳහා පොලී මුදල් ලෙස රු.24,227,134 ක් අනාර්ථිකව ගෙවීමට සිදු වී තිබුණු බව විගණනයේදි	2022	අනාර්ථික පොළී නොගෙනවන ආකාරයට වන්දි ගෙවීම් කළ යුතුය.	පරිගණකගත ක්‍රමවේදය හඳුන්වාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් අදාළ අංශ දැනුවත් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම, අත්කර ගැනීම් පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සහ අත්පත් අංශය තුළ සරල දත්ත පද්ධතියක් ඇති කිරීම යන ක්‍රියාමාර්ග ගෙන ඇත.	ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතුවල ප්‍රගතිය දක්වා නොමැත.

නිරීක්ෂණය විය.

08	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.103(1) ආ,එ හා 104(4) ප්‍රකාරව සොරකම්,වංචා, හදිසි අනතුරු යනාදී හානිවීම් සම්බන්ධයෙන් පොලීසියට වාර්තාකිරීම හා උචිත අවස්ථාවලදී බැංකුව, රක්ෂණ සමාගම, ඇප සහතිකකරුවන් යනාදීන් වෙත හිමිකම්පෑම් ඉදිරිපත් කිරීම කළ යුතු වුවත් 2022 අප්‍රේල් 19 දින අංක PD – 2791 දරන කැබ් රථයට වූ අනතුර සම්බන්ධයෙන් පොලීසියට හා අදාල රක්ෂණ සමාගමට වාර්තා කර නොතිබුණි.මුදල් රෙගුලාසි 104(4) අවසන් පරීක්ෂණ වාර්තාවට අනුව එම අලාභය රථය අනියුක්තකර තිබුණු නිලධාරියාගෙන් අයකර ගැනීමට නිර්දේශකර තිබියදී රු.475,000 ක් වූ වියදම අමාත්‍යාංශය වැයකර අලුත්වැඩියා කර ඇතත් එම අලාභය 2024 මාර්තු 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.	2023	අලාභය නොපමාව අයකර ගත යුතුය.	අමාත්‍ය කාර්යාලය වෙත ඒකාබද්ධ රියදුරු සේවයේ රියදුරන් අනුයුක්ත කිරීමට කටයුතු කළ අතර රථ වාහන අනතුරක් වූ වහාම ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව අදාළ නිලධාරීන්, රියදුරන් දැනුවත් කර ඇත. තවද රියදුරන් සඳහා විශේෂ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර අනතුරක් වූ වහාම පොලීසිය සහ රක්ෂණ ආයතනය ද අමාත්‍යාංශයද දැනුවත් කරන ලෙස රියදුරන් දැනුවත් කර ඇත. මේ වන විට පැවති අඩුපාඩු මගහරවාගෙන කටයුතු කරමින් සිටී.	මු.රෙ. අවසන් පරීක්ෂණය ප්‍රකාරව වාහනය අනුයුක්තව සිටි නිලධාරියාගෙන් අයකර ගැනීමට තීරණය වී ඇත. ඒ අනුව, වගකිව යුතු නිලධාරියා දැනුවත් කර ඇති අතර මෙතෙක් ප්‍රතිචාරයක් ලැබී නොමැති බැවින් නීතිමය වශයෙන් කටයුතු කිරීම සඳහා නීතිපති වෙත යොමුකර ඇත.
09	අමාත්‍යාංශයේ සංචාරක අංශයේ 2023 අයවැය යෝජනා තුල වෙරළාශ්‍රිත සංචාරක කටයුතු ප්‍රවර්ධනය (Promotion of Marine Tourism) සඳහා ව්‍යාපෘති/වැඩසටහන් 08 ක් ක්‍රියාත්මක කිරීමට ඇස්තමේන්තුගත පිරිවැය	2023	සැලසුම් කරන ලද ව්‍යාපෘති ප්‍රයෝජනවත් හා අර්ථවත් ආකාරයෙන් කළ යුතුය.	සංචාරක අංශය 2023 අයවැය යටතේ පරවි දූපතේ වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම සඳහා වූ ව්‍යාපෘතියට සහ කායන්කර්නි කොරල්පර නැරඹීම සඳහා බෝට්ටු 02 ක් මිලදී ගැනීම සඳහා	කායන්කර්නි කොරල්පර නැරඹීම සඳහා වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු කායන්කර්නි ප්‍රජා මූල

	එකතුව රු.මිලියන 14.69 ක් විය.එහිදි හඳුනාගත් එක් ව්‍යාපෘතියක් වන පරෙවි දූපතේ වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතිය වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධාන වලට පටහැනි බැවින් එය අත්හැර සලසා තිබූ රු.මිලියන 4.69 ක් වැයකර බෝට්ටු 02 ක් මිළදි ගෙන තිබූ බව නිරීක්ෂණය විය.			ප්‍රතිපාදන වෙන් කළත්, පරවි දූපතේ වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම සඳහා වූ ව්‍යාපෘතිය වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධානවලට පටහැනි බැවින් ඒ සඳහා අනුමැතිය නොලැබුණි. රු. මිලියන 4.69 ක් වැය කර බෝට්ටු 02 ක් මිලදීගෙන ඇත.	සංවිධානයක් විසින් දිස්ත්‍රික් ලේකම් (මඩකලපුව) අධීක්ෂණය යටතේ දැනට සිදු කරමින් පවතී.
10	සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයාට ලබාදී තිබූ වාහනය 2016 වර්ෂයේදී පුද්ගලික සමාගමකින් මිළදිගත් ලෑන්ඩ් රොවන් ඩිස්කවරි වර්ගයේ වාහන 02 ක රජයේ තීරු බදු සහන යටතේ ආනයනය කර මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ වාහන විය.මේ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ඇතුලත් 2023 මැයි 29 දිනැති MOF/DG/LAD/CO/53/2023 අංක දරණ ලිපියෙහි ඡේද අංක 01 ප්‍රකාරව රාජ්‍ය ආයතන වෙත වාහන මිලදී ගැනීමේ පොදු ප්‍රතිපත්තිය උල්ලංඝණය කරමින් මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කර කිරීමත්,ඡේද අංක 02 මඟින් ලියාපදිංචි කරන ලද මෝටර් රථ රජයට මිලදී ගැනීම හා ප්‍රසම්පාදන	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව සියලු මිලදීගැනීම් සිදු කළ යුතුය.	2023 ජුනි 13 දින කැබිනට් පත්‍රයෙන් ලද අනුමැතිය සහ අධිකරණ නියෝගය අනුව ලද ප්‍රතිපාදන මත ලෑන්ඩ්රෝවර් රථ 02 සඳහා ගෙවීම් කර මූල්‍ය ගණුදෙනු අවසන් කර ඇත. එම රථ 02 මිලදී ගැනීමේදී සිදුකරන ලද ප්‍රසම්පාදන කමිටුවේ වරදක් තිබේද යන්න සොයා බැලීමට විමර්ශන කමිටුවක් පත්කර ඇත.	කමිටුව මගින් සිදුකරන විමර්ශන කටයුතු මෙතෙක් අවසන් කර නැත.

	ක්‍රියාවලිය උල්ලංඝණය කිරීම සම්බන්ධ පරීක්ෂණයක් කඩිනමින් පවත්වා ඊට අදාල නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදුකළ යුතු බව දන්වා තිබුණි. වසරකට ආසන්න කාලයක් ගතව ඇතත් උක්ත උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය				
11	පසුගිය වර්ෂයේදී රු. 350,000,000 ක ප්‍රතිපාදනය වැයකර අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක කාබනික පොහොර ව්‍යාපෘති ආරම්භ කර ඒ සඳහා රු. 31,027,575 ක් වටිනා වගා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදීගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය වසා දමා ඇතත්, ව්‍යාපෘතියේ වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් හෝ වත්කම් නැවත ඵලදායී කාර්යයකට යෙදවීම සම්බන්ධයෙන් 2023 අප්‍රේල් 10 දින වන විටද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2022	වත්කම්වල ආරක්ෂාව සහ ඒවා ඵලදායිව යෙදවීම සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වේ.	කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන නියමු ව්‍යාපෘතියේ සතුව දැනට පවත්නා යන්ත්‍රෝපකරණ බැහැර කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමා විසින් 2023.11.14 දිනපත් කරන ලද කමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දීම.	අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරන ලද කමිටුවක් මඟින් වත්කම් පිළිබඳව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව දැනුවත් කර ඇති අතර එම වාර්තාවට අනුව ඉදිරි කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. සහකාර අධ්‍යක්ෂ, අනුරාධපුර ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත එවන ලද ලිපිය ප්‍රකාරව කාබනික පොහොර

					නිපදවීම සඳහා මිල දී ගත් යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ඇල්ල ප්‍රාදේශීය සභාවට, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත.
12	2021 වර්ෂයේදි ක්‍රියාත්මක කළ කාබනික පොහොර ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ ව්‍යාපෘතිය අවසන් කොට සම්පත් බැහැර කිරීම පිළිබඳ 2023 මාර්තු 28 දිනැති අමප/23/383/615/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීමට හේතු වී ඇති කරුණු, එහි මුදල් එහි මුදල් භාවිතා වී ඇති ආකාරය සහ ඒ සඳහා දායක වූ පාර්ශවයන් පිළිබඳව ස්වාධීන පූර්ණ විමර්ශනයක් සිදු කිරීමට මෙම ව්‍යාපෘතියට අදාල ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සුදුසු යෝජනා සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කර තිබුණ ද 2024අප්‍රේල් විගණිත දින දක්වාම එම කටයුතු සම්පූර්ණ කර අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	2022 2023	කාබනික පොහොර ව්‍යාපෘති වාර්තාව නොපමාව ලබාගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	ස්වාධීන පූර්ව විමර්ශනයක් සිදු කිරීම සඳහා නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් 2023 අප්‍රේල් 29 දින පත්කර ඇත.	එකී වාර්තාව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස 2023.04.27, 2023.09.15, 2023.11.20, 2024.07.11, 2023.07.27 හා 2024.08.16 දිනැති ලිපි මගින් දැනුම් දී ඇතත් එම වාර්තාව මෙතෙක් ලැබී නොමැත.
13	මාතර දිස්ත්‍රික්කය දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ	2023	ඉඩම් අත්පත් කර ගැනීම් ක්‍රියාවලිය	මෙම අත්කර ගැනීමට අදාළව මූලික පිඹුරේ වන්දි හා පොලී ගෙවීමට	ඉඩම් කැබලිවලින් සියයට 40 කට

	බැද්දේගම්මැද්ද ග්‍රාම නිලධාරී වසමේ මාර / 2794 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 35 දක්වා (කැබලි අංක 20 හා 23 හැර) පිඹුරේ හෙක්ටයාර් 0.305 ක් විශාල ඉඩම් කොටස සඳහා පනතේ 7 වගන්තිය ප්‍රකාරව 2165/69 දරණ 2020.03.06 දිනැති ගැසට් පත්‍රය 2020.07.23 දින සිට ප්‍රදර්ශණය කර ඉඩමේ අයිතිකරු වෙත, පනතේ 38(අ) අතුරු විධාන ආඥාව 2018.01.08 දින ලබාදී ඉඩම් කැබලි 33 අත්පත් කර ගැනීම සඳහා එහි අයිතිකරු වෙත 2022 පෙබරවාරි 23 වන්දි මුදල් ලෙස රු.43,700,100 ක් ගෙවා තිබුණි.මෙම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදුවීමට වසර 4 යි. මාස 01 යි දින 15 ක් ගතවීම නිසා ඒ සඳහා අමතර පොළී මුදල් ලෙස රු.12,616,658 ක් ගෙවා ඇති බව ලිපිය අනුව අනාවරණය විය.		කාර්යක්ෂමකර අමතරව රජය විසින් වැය කරන පොලී වියදම අඩුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	හැකියාවක් ඇති ඉඩම් කැබලිවලින් 40% කට පමණ ආසන්න ප්‍රමාණයක් සඳහා වන්දි හා පොලී ගෙවා අවසන් කර ඇත.	පමණ ආසන්න ප්‍රමාණයක් සඳහා වන්දි හා පොලී ගෙවා අවසන් කර ඇත. ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතුවල ප්‍රගතිය මන්දගාමීව සිදුවේ.
14	ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නකල්ස් සංරක්ෂණ කලාපයට ඉඩම් අත්පත් කරගැනීම සඳහා ගෝනමඩවත්ත ඉඩම පවරා ගැනීමට 2010 මාර්තු 17 දින ඉලුක්කුඹුර ග්‍රාම නිලධාරී කාර්යාලයේ දැන්වීම් ප්‍රදර්ශණය කර 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනත 460 වෙනි පරිච්ඡේදය 17 වෙනි වගන්තිය ප්‍රකාරව සිදුකර	2023	ඉඩම් අත්පත් කරගැනීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කර අමතරව රජය විසින් වැය කරන පොලී වියදම අඩුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	පරිගණකගත ක්‍රමවේදය හඳුන්වාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් අදාළ අංශ දැනුවත් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම, අත්කර ගැනීම් පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සහ අත්පත් අංශය තුළ සරල දත්ත පද්ධතියක් ඇතිකිරීම යන ක්‍රියාමාර්ග ගෙන ඇත.	ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතුවල ප්‍රගතිය මන්දගාමීව සිදුවේ.

	තිබුණි.මෙම ඉඩමේ හිමිකරුවකුට එහි අයිතිය මු.වි.මා.1659 හි කැබලි අංක 01 දරණ ඉඩමේ පර්චස් 89 ක්ද, නැවත පර්චස් 17.165 ක් ද නැවතත් පර්චස් 17.165 ක්ද වශයෙන් පර්චස් 123.33 ක් පවරා ගැනීම සම්බන්ධයෙන් 38(අ) වගන්තිය ප්‍රකාර 2013.11.21 දින අතුරු විධානය පළකර වසර අවුරුදු 7 යි මාස 1 දින 22 කට පසුව 17 වන වගන්තිය යටතේ වන්දි මුදල් ලෙස රු.31,770,300 ක්ද, ඒ සඳහා අමතර පොළිය වශයෙන් රු.14,955,327 ක් 2022 ජූලි මාසයේදී ගෙවා තිබුණි.				
15	කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම්ට අයත් මාළඹේ පිහිටි බාලිකා විද්‍යාලයක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය යටතේ මාලඹේ හික්ගහවත්ත ඉඩමෙන් මු.පි.කො 9134 හි කැබලි අංක 01 සහ 02 වන ඉඩමෙන් හෙක්ටයාර් 0.23522 ක් අත්පත් කරගෙන ඒ සඳහා 38(අ) අතුරු විධානය පලවූ දිනය 2010.02.15 දින විය.මෙම ඉඩම අත්පත් කර ගැනීම සඳහා අත්පත් ප්‍රදානය නිකුත් කල දිනය 2020.06.23 වූ අතර ඒ සඳහා පනතේ 17 වගන්තිය යටතේ ඉඩම් හිමිකරු වූ ද පිනෑන්ස් සමාගමක් වෙත ප්‍රදානය කල වන්දි මුදලේ	2023	ඉඩම් අත්පත් කරගැනීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කර අමතරව රජය විසින් වැය කරන පොලී වියදම අඩුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	පරිගණකගත ක්‍රමවේදය හඳුන්වාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් අදාළ අංශ දැනුවත් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම, අත්කර ගැනීම් පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සහ අත්පත් අංශය තුළ සරල දත්ත පද්ධතියක් ඇතිකිරීම යන ක්‍රියාමාර්ග ගෙන ඇත.	ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතුවල ප්‍රගතිය මන්දගාමීව සිදුවේ.

	වටිනාකම රු.40,140,000 ක් විය. කෙසේ වුවද මෙම අත්පත් කර ගැනීම සඳහා 38(අ) අතුරු විධානය පලවී වසර 10 යි මාස 09 දින 15 කට පසුව අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සිදුවී තිබීමෙන් ඒ සඳහා රු.30,320,821 ක අමතර පොලී මුදලක්ද ගෙවීමට සිදුවී තිබුණි.				
16	අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව පොලිස් ස්ථානය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම යටතේ ,ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ඉඩම් අයිතිකරු වන සර්වෝදය ශ්‍රමදාන සංගමයකට අයත් දම්සක් මන්දිරය නො.98, රාවතාවත්ත පාර, මොරටුව ආයතනයේ හෙක්ටයාර් 1.0120 ක් රජයට අත්පත් කරගෙන ඒ සඳහා 38(අ) අතුරු විධානය 2015.12.15 පළකර තිබූ අතර වන්දි වශයෙන් රු.18,484,750 ක්ද ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වසර 6 මාස 10 දින 12 ක ප්‍රමාදය මත පොලිය ලෙස රු.8,884,412 ක්ද වශයෙන් රු.10,263,954 ක් ගෙවා තිබුණි.	2023	ඉඩම් අත්පත් කරගැනීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කර අමතරව රජය විසින් වැය කරන පොලී වියදම අඩුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	පරිගණකගත ක්‍රමවේදය හඳුන්වාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් අදාළ අංශ දැනුවත් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම, අත්කර ගැනීම් පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සහ අත්පත් අංශය තුළ සරල දත්ත පද්ධතියක් ඇතිකිරීම යන ක්‍රියාමාර්ග ගෙන ඇත.	ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතුවල ප්‍රගතිය මන්දගාමීව සිදුවේ.
17	නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ සංවර්ධන කටයුතු සඳහා A,C,F සහ J ඉඩම් කැබලි අත්පත් කර ගැනීම සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් විසින් නිවිතිගල, කලවාන පාර පදිංචි පුද්ගලයෙකුගෙන්	2023	ඉඩම් අත්පත් කරගැනීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කර අමතරව රජය විසින් වැය කරන පොලී වියදම අඩුකර ගැනීමට	පරිගණකගත ක්‍රමවේදය හඳුන්වාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් අදාළ අංශ දැනුවත් කිරීම, නිලධාරීන් දැනුවත්කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම,	ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු මන්දගාමීව සිදු වී ඇත.

ඉඩමක් පවරා ගැනීම සඳහා අත්පත් කර ගැනීමේ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා 2017.01.19 දින 38(අ) අ.වි පලකර ඇති අතර ඒ සඳහා වන්දි ගෙවීම 2023.01.04 දින සිදු කර තිබුණි. ඒ අනුව වන්දි ගෙවීමට ප්‍රමාද වූ කාලය අවු 5 මාස 11 දින 16 ක් වූ අතර මේ සඳහා වන්දි වශයෙන් රු.1,255,000 ක් ද, ඊට පොලිය වශයෙන් රු.523,630 ක්ද ගෙවා තිබුණි.	අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	අත්කර ගැනීම් පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සහ අත්පත් අංශය තුළ සරල දත්ත පද්ධතියක් ඇතිකිරීම යන ක්‍රියාමාර්ග ගෙන ඇත.

3.2 බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	4,615,097,156	58,709,239	4,556,387,918	-	තත්ත්වාගණනය කළ
2022	4,939,112,009	136,147,730	4,802,964,279	-	තත්ත්වාගණනය කළ
2023	4,946,836,813	156,824,510	4,790,012,303	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ක්‍රියාකාරි සැලැස්මට අනුව පාහියංගල මානව ඇටසැකිලි සංරක්ෂණ කුටි සඳහා උෂ්ණත්ව පාලන යන්ත්‍රයක් මිලට ගැනීම සඳහා වාර්ෂික අයවැය මඟින් රු.මිලියන1.2ක් වෙන් කර, 2023 වර්ෂයේ අගෝස්තු මස අවසන් වන විට එම යන්ත්‍රය ඉන්දියාවෙන් ගෙන්වා ගැනීමට සැලසුම් කර තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දිනට වූ ප්‍රගති වාර්තාව අනුව මෙම යන්ත්‍රයට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි.	2023	ක්‍රියාකාරි සැලැස්ම අනුව අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ.	උෂ්ණත්ව පාලන යන්ත්‍රයක් ඉන්දියාවෙන් ගෙන්වා ගැනීමේ කාර්යය සඳහා කටයුතු කළ හැකි ආයතන සොයා ගැනීමට අපහසු වීම හේතුවෙන් නියමිත සැලැස්ම අනුව අවසන් කිරීමට නොහැකි විය. එසේ වුවද, එම ප්‍රමාදය හේතුවෙන් පුරාවස්තු සංරක්ෂණ ක්‍රියාවලියට අයහපත් බලපෑමක් ඇතිවීම වැළැක්වීම සඳහා එම පුරාවස්තු ඉතාමත් සුරක්ෂිතව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පියයේ තැන්පත් කර මේ වන විට එය කොළඹ ජාතික කෞතුකාගාරයේ වායු	2024 සැප්තැම්බර් 30 දින වන විට ද යන්ත්‍රයේ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර නොතිබුණි.

				සමීකරණය කරන ලද ගැලරියක විශේෂිත වීදුරු කුටියක් තුළ තැන්පත් කර ඇති බවත් උෂ්ණත්ව පාලන යන්ත්‍රය සවිකිරීමට නියමිත බව.	
2	අමාත්‍යාංශය යටතේ පාලනය වන රජරට චාරිකා නිවාසය පිහිටි ඉඩම හා එම ගොඩනැඟිල්ල අමාත්‍යාංශය යටතට පවරා ගෙන නොතිබුණි.	2023	අදාල වත්කම් අමාත්‍යාංශය යටතට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ.	මූල්‍ය නොවන වත්කම් යටතට ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට සටහන් කර ගත් බව.	2024 සැප්තැම්බර් 30 වන දින විට ද ගොඩනැගිල්ල පවරාගෙන නොතිබුණි.
3	ගොඩනැගිලි හා අනෙකුත් පහසුකම් සහිත වඩාත් ඵලදායි අයුරින් ආදායම් උත්පාදන කාර්යය සඳහා යොදා ගැනීමේ හැකියාව පවතින අපේ ගම පරිශ්‍රය වාණිජ ස්වරූපයෙන් පවත්වා ගත හැකි කටයුතු සඳහා ප්‍රතිපාදන සලසා දීමේ හැකියාවක් නොමැති බැවින් වාණිජ පරමාර්ථයෙන් පවත්වාගෙන යන ව්‍යාපෘතියක් සමග ඒකාබද්ධව හෝ ආයෝජන ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාමට පියවර ගත යුතු බව 2021 නොවැම්බර් 02 දිනැති අංක අමප/21/1883/305/007-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රකාශ කර තිබුණද වසර 02 ක කාලයක් ඉක්මවා තිබියදීත් ඒ සම්බන්ධයෙන් නිසි	2023	අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි අපේ ගම පරිශ්‍රය ආදායම් උත්පාදන කාර්යයන් සඳහා යොදා ගැනීමට සහ උපරිම උපයෝගීතාවය කින් යොදා ගැනීමට කටයුතු කළ යුතු වේ.	මේ වන විට මුදල් උත්පාදනය සඳහා කළමනාකරණ හා මූල්‍ය ක්‍රමවේද ඇතුළත් ව්‍යාපාර සංවර්ධන සැලැස්මක් සකස් කර එය ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. පැවැති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අපේ ගම පරිශ්‍රය නරඹන්නන් සඳහා වසා දමා තිබුණ අතර එම තත්ත්වය 2022 වර්ෂයේ අවසාන භාගය දක්වාම පැවතුණි. එම කාලය තුළ පරිශ්‍රයේ නඩත්තු සහ ප්‍රතිසංස්කරණ කටයුතු නිසි පරිදි සිදු කිරීමට නොහැකි වූ බැවින් පරිශ්‍රයේ බොහෝ නැරඹුම් ස්ථාන ස්වභාවික හේතු හා තත්ත්වයන් මත විනාශ වී තිබුණු බව.	2024 සැප්තැම්බර් 30 දින වන විට ද තත්ත්වය එසේම පැවතුණි.

	පියවර ගෙන නොතිබුණි. තවද, වසරකට වැඩි කාලයක සිට අහිමිව තිබුණු නරඹන්නන් සඳහා ටිකට්පත් අලෙවි කිරීමෙන් ආදායම් උපයා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබීමෙන් පරිශ්‍රයේ ඇති ගොඩනැගිලි ආකෘති හා මිනිස් රූප විනාශ වෙමින් පැවතීමත් 46 ක් පමණ වන වෙළඳ කුටිවලින් කුටි 25ක පමණ නිෂ්පාදන අලෙවිකරුවන් නොමැතිව ඌණ උපයෝජිතව පැවතීමත් යන කරුණු අනුව අපේගම පරිශ්‍රය ඌණ උපයෝජිත තත්ත්වයේ පැවතුණි.				
4	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1 ඡේදය අනුව රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් අයකරන ගාස්තු සමාලෝචනය කර වසර තුනකට වරක් සියයට 15 ක උපරිමයකට යටත්ව ගාස්තු සංශෝධනය කළ යුතු වුවද, අපේ ගම පරිශ්‍රයේ වෙළඳ කුටි සඳහා අයකරනු ලබන ගාස්තු එලෙස සංශෝධනය කර නොතිබුණි.	2023	චක්‍රලේඛ ප්‍රකාරව ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වේ.	වෙළඳ කුටි ගාස්තු සංශෝධනයට අදාළව මේ වන විට කටයුතු සිදුකර ඇත. වෙළඳ කුටි නඩත්තුවට යන වියදම, වෙළඳ කුටියේ ප්‍රමාණය හා ඒ වෙනුවෙන් සපයා ඇති යටිතල පහසුකම් මත පදනම්ව මාසික ගාස්තුවක් අයකිරීමටත්, ඊට අදාළව ද්විපාර්ශවික ගිවිසුමක් මත වෙළඳ කුටි ලබාදීමටත් අවධානය යොමු කරමින් එම කටයුතු පිළිබඳ සාකච්ඡා කර තීරණයකට එළඹීම සඳහා අමාත්‍යාංශ නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කළ අතර, එම කමිටුවේ නිර්දේශ අනුව අදාළ	2024 සැප්තැම්බර් 30 දින වන විට ද ගාස්තු සංශෝධනය සිදු කර නොතිබුණි.

ගාස්තු වැඩිවීම සියයට 15 උපරිමය ඉක්මවා තිබූ හෙයින් අනුමැතිය ලබාගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව.

3.3 ධීවර අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	692,509,671	200,767,007	491,742,664	-	තත්ත්වාගණනය කළ
2022	745,407,495	486,502,176	258,905,319	-	තත්ත්වාගණනය කළ
2023	1,016,582,271	464,222,949	552,359,322	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	විගණනයට ඉදිරිපත් කළ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟ හිටි ණය ශේෂවල එකතුව රු.743,452 ක් විය. එම හිඟ හිටි ණය ශේෂවලින් රු.629,842 ක් හෙවත් සියයට 84 ක් වර්ෂ 20 ට වැඩි කාලයක සිට අය නොවී පැවති අතර සමාලෝචිත වර්ෂයේ දී ද එම ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.	2022, 2023	හිඟහිටි ණය ශේෂ අයකර ගත යුතුය.	හිඟ හිටින අවස්ථාවලදී එම ශේෂ නැවත කඩිනමින් අය කර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත. හිඟ ශේෂ ඇති නොවීමට ද, හිඟ ශේෂයන් පැවතුණහොත් ඒවා නිරාකරණය කර ගැනීමට ද කටයුතු කර ඇත.	රු.743,452 ක ණය ශේෂයෙන් රු.629,842 ක මුදල වසර 20ක කාල පරාසයක සිට හිඟ හිට ඇත. 2024 වර්ෂයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද අංක 01/2024 දරන චක්‍රලේඛය අනුව ඉහත රු. 629,842 ක ණය ශේෂයන් පිළිබඳව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
2	මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව, වර්ෂ 2-5 ත් අතර වූ එකතුව	2021, 2022, 2023	මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කටයුතු කළ	වර්ෂ 2 ඉක්ම වූ ශේෂ සම්බන්ධයෙන් අදාල ආයතන හා	2024.09.30 දිනට වර්ෂ 2ත් 5ත් අතර ණය

	රු.167,195,801 ක තැන්පතු ශේෂ ද, වර්ෂ 5 ඉක්මවූ රු.31,910,669 ක්වූ තැන්පතු ශේෂ නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු නොකර 2023 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.		යුතුය.	නිලධාරීන්ගෙන් විමසීම් සිදු කිරීම. අදාල නෛතික උපදෙස් ගත යුතු අවස්ථාවලදී උපදෙස් ලබා ගැනීම.	ශේෂය රු.159,408,745 ක් විය.
3	2023 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශය සතු රු.994,254,549 ක්වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන විගණනයට ලබා දී නොතිබූ අතර සියලුම ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තා ද විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම වත්කම් පරීක්ෂා කිරීමට හෝ මෙම වත්කම් භෞතිකව ආයතනය සතුව පවතී ද යන්න පරීක්ෂා කිරීමට හෝ නොහැකි විය.	2022, 2023	රජයේ වත්කම්වල ආරක්ෂාව හා පැවැත්ම සඳහා විස්තරාත්මක උපලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.	මහාභාණ්ඩාගාරය මඟින් ලබා දී ඇති උපදෙස් අනුව නිරන්තරයෙන් කටයුතු කරමින් පවතී.	ස්ථාවර වත්කම්වලට අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් කර නැත.
4	නාරෙහේන්පිට, මුහන්දිරම් ඊ.බී.දාබරේ මාවතේ අංක 18/146 B දරන ස්ථානයේ පිහිටා තිබූ ධීවර අමාත්‍යාංශයේ ලේකම් තනතුර සඳහා වෙන්කර තිබූ නිල නිවස සඳහා ධීවර අමාත්‍යාංශයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයෙන් ලබා දී තිබූ සියලුම රජයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ	2023	මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මෙම නිල නිවස අයත් පොලිස් ස්ථානය දැනුවත් කර ජංගම මුර සංචාරවලදී මෙම ස්ථානය ද පරීක්ෂාවට ලක් කිරීමට පොලිස් ස්ථානය දැනුවත් කර ඇත. මෙම නිල නිවස අලුත්වැඩියා කිරීමෙන් අනතුරුව අවශ්‍යතාවයක් සහිත රජයේ නිලධාරියෙකු	මුදල් රෙගුලාසි 104 අනුව ප්‍රාරම්භ පරීක්ෂණ සිදු කර ඇති අතර මීට අදාළව නාරාහේන්පිට පොලිස් ස්ථානයට පැමිණිලි කර ඇත. එහෙත් වගකිව යුතු පාර්ශවයන්

	අස්ථානගත වී තිබෙන බව 2023 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් විගණනය වෙත වාර්තා කර තිබුණු අතර ගොඩනැගිල්ලේ සවිකර තිබූ දොර ජනෙල් අගුළු හා ගොඩනැගිල්ලේ සවිකිරීම්ද ගලවාගෙන ගොස් තිබුණි. ඒ අනුව මෙම නිල නිවස තුල තිබුණු රජයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සියල්ලම අස්ථානගත වී තිබීම සහ රජයේ ගොඩනැගිලිවලට හානි සිදු වී තිබීම නිසා රජයට සිදුවී තිබෙන රු.1,808,262ක පාඩුව පිළිබඳ මුදල් රෙගුලාසි 104(1)ප්‍රකාරව කටයුතු කර ඊට වගකිවයුතු පාර්ශව හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.			වෙත ලබා දීමට කටයුතු කිරීම.	හඳුනාගෙන නොමැත.
5	ධීවර වරායයන් සහ නැංගුරම්පල ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් වූ 2013 ජූලි 04 දිනැති අංක 1/5/1/1/අමා.සං/2013-09 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබා දී තිබූ අනුමැතියට අනුව ගාල්ල දිස්ත්‍රික්කයට අයත් කයිකාවල මුහුදු ප්‍රදේශයේ නැංගුරම්පලක් ඉදිකිරීම වෙනුවෙන් පැකේජ 01 සහ 02 වශයෙන් ලංසු කැඳවීම් සිදුකර පැකේජ	2023	ඉදිකිරීම් සඳහා සියළු ආකාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව අත්තිකාරම් මුදල් ගෙවීම් කල යුතුය.	ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර අදාල බලපත්‍ර හා අනුමැතීන් විධිමත් ලෙස ලබා ගත් පසුව ව්‍යාපෘති ආරම්භ කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබේ.	මෙම ව්‍යාපෘතියට අවශ්‍ය විධිමත් අනුමැතිය ලබා ගැනීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (CCD) වෙත අයදුම්පතක් 2013.06.06 හා 2014.07.29 දින ඉදිරිපත් කර ඇති නමුත් මෙම

	01 රු.132,602,410 ක කොන්ත්‍රාත් වටිනාකමට සහ පැකේජ 02 රු.113,198,400 ක කොන්ත්‍රාත් වටිනාකමට වසරක් ඇතුළත ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව නිම කිරීම මත පැකේජ 02 සඳහාම 2014 සැප්තැම්බර් 14 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් සමාගම විසින් පැකේජ 02 සඳහාම ඉදිකිරීම් වැඩ ආරම්භ කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් 2014 සැප්තැම්බර් 29 දින රු.49,160,162 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් පැකේජ 02 සඳහාම ගෙවීම් කර තිබුණි. කෙසේ වෙතත් මෙම කොන්ත්‍රාත්තු සඳහා ඉදිකිරීම් බලපත්‍රයක් නොතිබීම නිසා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමත් සමඟම නවතා දැමීමට සිදුවී තිබුණු අතර අත්තිකාරම් මුදල ආපසු අයකරගෙන නොතිබුණි.				ව්‍යාපෘතියට අනුමැතිය ලබා දී නොමැත. මේ වන විටත් අත්තිකාරම් මුදල ආපසු අයකරගෙන නොතිබුණි.
6	මෙම නැංගුරම්පල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ උපදේශක වශයෙන් කටයුතු කළ ආයතනය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු	2023	උපදේශන සමාගම පත්කර ගැනීමට අදාල ලිපිගොනු විගණනයට ඉදිරිපත් කළ යුතුය.	වඩාත් සුපරීක්ෂාකාරීව කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ව දැනුවත් කිරීම.	මීට අදාලව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොමැත.

	ලබන ලිපිගොනු විගණනය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම උපදේශන සමාගම සමඟ විධිමත් පරිදි ගිවිසුමක් අත්සන් කර තිබුණේ ද, එම ගිවිසුම අවලංගු කර තිබුණේ ද යන්න විගණනයට තහවුරු කරගැනීමට නොහැකි විය.කෙසේ වෙතත් විගණනය වෙත ඉදිරිපත් කෙරුණු කොන්ත්‍රාත් මුදල් ගෙවීම් ලේඛනඅනුව මෙම උපදේශනසමාගමට පැකේජ් 2 සඳහා රු.4,377,234 ක උපදේශනගාස්තුවක්ගෙවීම් කරතිබුණි. නැංගුරම්පල ඉදිකිරීම සඳහා මූලික පාරිසරික වාර්තාව (IEE) ලබාගැනීම වෙනුවෙන් රු.443,975 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දින මෙම උපදේශන සමාගම වෙත ගෙවා තිබුණ ද, එම මූලික පාරිසරික වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.				
7	ධීවර අමාත්‍යාංශය විසින් ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති 04 ක ව්‍යාපෘති නිම කිරීමේ කාලය දීර්ඝ කර තිබු අතර, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් විසින් ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් කර තිබු බිල්පත් සඳහා මුදල්	2023	ප්‍රමාද පොළි ගෙවීමට සිදු නොවන පරිදි ව්‍යාපෘති ආරම්භ කිරීම සහ ගෙවීම් සැලසුම් කළ යුතුය.	මහා භාණ්ඩාගාරයෙන් කඩිනමින් අක්මුදල් ලබා ගෙන කොන්ත්‍රාත් බිල්පත් සඳහා ගෙවීම් කිරීමට කටයුතු කිරීම.	2024.09.30 දින වනවිටත් ව්‍යාපෘති 04 න් ව්‍යාපෘති 02 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

	ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් විශාල වශයෙන් ප්‍රමාද පොලී ගෙවීම් කර තිබුණි. එවැනි අතිරේක ප්‍රමාද පොලී වියදම් සඳහා ද රජයේ ප්‍රතිපාදන මුදල් යෙදවීමට සිදුව තිබීම තුළින් රජයට විශාල මූල්‍යමය අලාභයක් සිදු වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වනවිට ධීවර අමාත්‍යාංශය විසින් ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘති 04 සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට රු.206,295,210 ක මුදලක් ප්‍රමාද පොලී ලෙස ගෙවා තිබූ අතර රු.20,029,039 ක ප්‍රමාද පොලී මුදලක් තවදුරටත් ගෙවීමට සහතික කර තිබුණි.ඒ අනුව ගෙවා තිබූ ප්‍රමාද පොලී එකතු වටිනාකම රු.226,324,249 ක් විය.				
8	අමාත්‍යාංශ කාර්යාල ගොඩනැගිලේ අතිරේක මහල් 3 ක් ඉදිකිරීම සඳහා 2016 නොවැම්බර් 23 දිනැති අමප/16/2333/725/044 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු.242,511,455 කට 2018 ජුනි 12 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ඒ අනුව 2018 ජුනි 26 දින කොන්ත්‍රාත් සමාගම වැඩ ආරම්භ	2023	රජයේ දේපළ වලට සිදු වී තිබෙන හානිය කඩිනමින් වගකිවයුතු පාර්ශව වෙතින් අයකර ගත යුතුය.	මෙවන් තත්වයන් ඇති නොවීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	රජයේ දේපලවලට සිදු වී තිබෙන හානිය අයකරගෙන නොමැත.

	කර තිබුණු අතර එය දින 365 කින් එනම් 2019 ජුනි 25 දින වැඩ අවසන් කිරීමට තිබුණු නමුත් කොන්ත්‍රාත්කරු අපේක්ෂිත කාර්යක්ෂමතාවයෙන් කටයුතු නොකිරීම හේතුවෙන් 2019 සැප්තැම්බර් 06 දින අමාත්‍යාංශය විසින් කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. මෙම කොන්ත්‍රාත්කරු අසාදුගත කිරීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. මෙම අතිරේක මහල් තුන ඉදිකිරීම් කාර්යය සිදුකිරීමේ දී කොන්ත්‍රාත්කරු නොසැලකිලිමත්ව ඉදිකිරීම් කටයුතු සිදුකිරීම නිසා අමාත්‍යාංශයේ මහල් තුළට වැසි ජලය කාන්දු වී රු.10,061,054ක රජයේ දේපලවලට හානි වී තිබුණි. 2023.12.31 දිනවන විට මෙම හානිය සිදු වී වර්ෂ 05 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද, සිදු වී තිබුණු රජයේ දේපළ හානිය අයකර ගැනීමට හා මෙවැනි හානි වලක්වා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් අවධානය යොමු කර නොතිබුණි.				
9	ජොෂ්ඨ විධායක තනතුරු 09 කට අදාළ පුරප්පාඩු 09 ක් සහ	2023, 2022	අමාත්‍යාංශයේ අරමුණු කරා ලගා වීමට බාධාවක්	දැනට පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කරන මෙන් රාජ්‍ය පරිපාලන	2024.09.30 දිනට ජොෂ්ඨ විධායක

ද්විතීක මට්ටමේ තනතුරු 02 කට අදාළ පුරප්පාඩු 32 ක් පැවතීම ධීවර අමාත්‍යාංශයේ අරමුණුකරා ළඟාවීමට බාධාවක් විය හැකිව තිබුණි.	විය හැකි පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය.	අමාත්‍යාංශය වෙත දන්වා ඇත.	තනතුරු 09කට අදාල පුරප්පාඩු 09 ක් සහ ද්වීතික මට්ටමේ තනතුරු පුරප්පාඩු 40 ක් පිරවීමට කටයුතු කර නොමැත.

3.4 කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	723,141,090	10,618,721	712,522,369	(55,216,888)	තත්ත්වාගණනය කළ
2022	1,049,523,266	17,256,267	1,032,266,999	(230,679,316)	තත්ත්වාගණනය කළ
2023	1,048,477,751	8,417,681	1,040,060,070	(464,000,990)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	යොමු අංකය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2021 වර්ෂයේදී විදේශාධාර ලෙස ලද රු.12,757,400 ක් ඵලදායිතා ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.	2021 – 154(6) 2.4 (අ)	විදේශාධාර ලබා ගැනීමේදී මුදල් රෙගුලාසි අනුව සහ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 30/94 අනුව කටයුතු කල යුතුය.	2021 වර්ෂය අවසාන කාර්තුවේ ඉතා හදිසි ප්‍රදානයක් වශයෙන් ආසියානු ඵලදායිතා සංවිධානය මගින් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය වෙත ඇමරිකානු ඩොලර් 90,000 ක ප්‍රදානයක් ලබාදීමට එකග විය. මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ කොවිඩ් මර්ධන ඒකකය සමග අදහස් ලබාගෙන ව්‍යාපෘති වාර්තාවක් සකස්කර ඒ සඳහා අනුමැතිය ලබාගන්නා ලදී.	2024 වර්ෂයේ සිට විදේශාධාර භාණ්ඩාගාර චක්‍රලේඛ 30/94 අනුව කටයුතු කර ගිණුම් තැබීමට පියවර ගෙන ඇත.
2	2021 දෙසැම්බර් 31 වන විට රු.10,014,543 ක වන්දි මුදල් 6000-0-0-17-0-26 දරන පොදු	2021 – 154(6) 2.4 (ආ)	අගතියට පත් පාර්ශවයන් වෙත වන්දි මුදල් කඩිනමින් ලබා	2021 දෙසැම්බර් 31 වන විට 6000-0-0-17-0-26 දරන පොදු තැන්පත් ගිණුමෙහි පැවති ශේෂයන් අද වන	2024 සැප්තැම්බර් 30 දිනට ශේෂය රු.50,227,157 කි. වසර 2

	තැන්පත් ගිණුමෙහි රඳවා තිබුණි. මේ තුල ඇතුලත් වන්දි ලැබී වසර 2 ඉක්මවූ වටිනාකම රු.536,326 ක් වූ අතර වන්දි මුදල් තැන්පත් කර වසර 1 ත් 2 ත් අතර අගය රු.1,371,986 ක් විය. තැන්පත් කර මාස 6 ත් වසරත් අතර අගය රු. 2,971,667 ක් විය.		දිය යුතුය.	විට පවතින ශේෂය රු.3,173,006.13 ක් වේ.	ඉක්මවූ ශේෂය රු.677,500 කි.
3	විවිධ හේතූන් මත හිමිකරුවන් වෙත ලබානොදුන් වන්දි මුදල්වලින් රු.2,023,096 ක් සඳහා වන්දි කොමසාරිස් නමින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් ආරම්භකර තිබුණි. මෙම මුදල් ගිණුම්වල තැන්පත් කර මාස 22 සිට මාස 48 දක්වා කාලයක් ගතවී තිබුණද උසාවි කටයුතු අවසන් නොවීම හේතුවෙන් හිමිකරුවන් වෙත නිදහස් කිරීමට නොහැකි වී තිබුණි.	2021 – 154(6) 2.4 (ඇ)	අගතියට පත් පාර්ශවයන් වෙත වන්දි මුදල් කඩිනමින් ලබා දිය යුතුය.	වන්දි කොමසාරිස් නමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් කර ඇති සියලුම් ගිණුම් අභියාචනා ලිපි ගොනු වන අතර ඒවායේ උසාවි කටයුතු තවමත් සිදුවෙමින් පවතී. උසාවි කටයුතු අවසන් වී එම ගිණුම් නිදහස් කරන අවස්ථාවේදී වැඩි පොලී මුදලක් අයකර දීම අරමුණුකොට ගෙන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කම්කරු වන්දි කොමසාරිස් නමින් තැන්පත් කර ඇත.	උසාවි කටයුතු අවසන් නොවීම නිසා 2024 සැප්තැම්බර් 30 දිනට නිදහස් නොකල ශේෂය රු.5,444,473 කි.
4	සේවක අර්ථසාධක අරමුදලෙහි 2021 දෙසැම්බර් 31 දින වන විට කේවල ගිණුම්වලට බැර නොවූ රු.9,933,449,162 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ කම්කරු කොමසාරිස් දායක ගිණුමේ	2021 – 154(6) 3.1 (අ)	අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීමට අදාල ප්‍රධාන කාර්යයන් වන කම්කරු අමාත්‍යාංශය යටතේ ඇති	“සී” වාර්තා වල සඳහන් දුර්වලතා මත මෙම මුදල් දීර්ඝ කාලයක සිට රඳවාගෙන පවතින අතර නිරවුල් කිරීමේදී භෞතික ලේඛන විශාල වශයෙන් පරිශීලනය කිරීමට සිදුවේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ පරිගණක දත්ත පද්ධතිය සමඟ	විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොමැත.

	රු.301,779,837 ක් දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් තැන්පත් ගිණුමේ හා දෙපාර්තමේන්තු උප කාර්යාලවලද තැන්පත් ගිණුම්වල රැඳී තිබීම, විශේෂ විමර්ශන අංශයට ලැබුණු පෙත්සම්වලින් 2021 සැප්තැම්බර් වන විට 2015 සිට 2020 දක්වා වර්ෂයන්ට අදාලව පැමිණිලි 308 ක් බවත් ඉන් සියයට 57 ක් එනම්, 178 ක් විසඳා නොතිබීම, 2021 දෙසැම්බර් 31 වන විට අක්‍රීයව පැවති නඩු සංඛ්‍යාව 5,151 ක් වන අතර එහි අයකර ගතයුතු වටිනාකම රු.3,108,693,249 ක් වීම යන කරුණු අනුව කම්කරු අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් ඉටුවී නොතිබුණි.		දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම නිසි පරිදි ඉටුකල යුතු වීම.	සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජික තොරතුරු වල පවතින නොගැලපීම් නිරවුල් කිරීමේ කටයුතු කරමින් පවතින අතර මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සහයෝගය අත්‍යාවශ්‍යව පවතී. පොදු තැන්පත් ගිණුමේ රැඳී තිබෙන මුදල් නිදහස් කිරීමේ ප්‍රගතිය ද එහි කාල විශ්ලේෂණය ද නිරන්තරයෙන් අධීක්ෂණයට ලක් කරනු ලබයි. විවිධ ක්‍රමවේදයන් සකස් කර පැරණි ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. කම්කරු දෙපාර්තමේන්තුව වෙත නඩු, පැමිණිලි පෙත්සම් විශාල සංඛ්‍යාවක් දෛනිකව එක් වෙමින් පවතින ආයතනයකි. පෙත්සම් සඳහා විසඳුම් ලබා දීම සිදු කරනු ලැබේ.විවෘත වරෙන්තු නිකුත් කර තිබීම, වගඋත්තර කරුවන්ගේ ලිපිනයන් පරීක්ෂාව කාර්යාල මට්ටමින් සක්‍රීය කිරීමට පියවර ගැනීම යනාදී කරුණු මගින් අක්‍රීයව පවතින නඩු සක්‍රීය කිරීමට පියවර ගෙන ඇත.	
5	1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත යටතේ පිහිටුවා ඇති වන්දි කොමසාරිස්	2021 – 154(6) 3.1 (ආ)	ප්‍රධාන කාර්යයන් ඉටුවන පරිදි කටයුතු කිරීම හා එම	මාරක හෝ මාරක නොවන අනතුරක් පිළිබඳව කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයට ඉල්ලීමක්	වන්දි ආඥා පනත ප්‍රකාරව අවශ්‍ය පියවරයන් අනුගමනය කරන අතර

කාර්යාලයේ දැක්ම ලෙසට, "ආපදාවකට හෝ මරණයකට පත්වන සේවකයන් වෙනුවෙන් සේවායෝජකයන්ගෙන් අප්‍රමාදව වන්දි අයකරදීම මගින් සේවක තෘප්තිය ඇති කිරීම" දක්වා තිබුණද, සේවයේ යෙදී සිටියදී සිදුවන මාරක හා මාරක නොවන අනතුරු සම්බන්ධව වන්දි අයකරදීමේ ක්‍රියාවලියේදී අධික ප්‍රමාදයන් සිදුවන බව විගණනයේදී අනාවරණය විය.	කාර්යයන් ඉටු කිරීම පිළිබඳව පසු විපරම් කිරීම අමාත්‍යාංශයේ වගකීමක් විය යුතුය.	ලැබුණු විට ඒ සඳහා නඩු ගොණුවක් විවෘත කිරීමට අඬා පනත ප්‍රකාරව විධිමත් අයදුම්පත්‍රයක් හා වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කල යුතු වේ. ඒ අනුව අයදුම්පතෙහි හා වෛද්‍ය වාර්තාවේ අඩුපාඩු තිබෙන අවස්ථාවන්හිදී ඒවා නිවැරදි කර ගන්නා තෙක් මූලික කටයුතු ආරම්භ කිරීම ද ප්‍රමාද විය හැක. නඩු ගොණුව විවෘත කර සේවා යෝජකගෙන් වාර්තාවක් කැඳවිය යුතුවේ. පනත ප්‍රකාරව එම වාර්තාව ඉදිරිපත් කිරීමට දින 30 ක කාලයක් ලබා දිය යුතු වේ. එම කාලයෙන් පසුව වාර්තාව ඉදිරිපත් නොකරන්නේ නම් හෝ අනතුර ප්‍රතික්ෂේප කරන්නේ නම් කම්කරු වන්දි අධිකරණයට යොමු කරනු ලබයි. මෙහි ඉල්ලුම්කරුවන් ආබාධිතව පසුවන බැවින් එක්වරක් හෝ පැමිණීමට නොහැකිවීම මත නඩුව නිෂ්ප්‍රභා නොකරන අතර ඔහුට යුක්තිය ඉෂ්ට වීම පිණිස වාර කීපයක් දින ලබා දෙයි. සේවා යෝජක පළමු දිනයේම බොහෝ දුරට අධිකරණය පැමිණෙන්නේ නැති බැවින් ඔවුන්	ක්‍රියාවලියෙහි සංශෝධනයක් සිදුවී නොමැත.

				අධිකරණයට ගෙන්වා ගැනීමට ලියාපදිංචි තැපැල්, පොලීසිය මඟින් ග්‍රාමසේවක මඟින් නොතීසි භාරදීමට කටයුතු කල යුතුය. එමඟින්ද ප්‍රමාද සිදු විය හැක.	
6	අම්පාර නිවාඩු නිකේතනය පිහිටි ඉඩමෙහි රියදුරන් සඳහා නවාතැන් ගන්නා ස්ථානයක් (Driver's Lodge) ඉදිකිරීම වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු මස රු.5,095,983 ක වටිනාකමකට පුද්ගලික ආයතනයකට පවරා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ගෙවිය යුතු අත්තිකාරම් වටිනාකම 20% ක් වුවද ගිවිසුම් කොන්දේසි කඩකරමින් 2021 දෙසැම්බර් 29 දින රු.1,149,855 ක්ද 2021 දෙසැම්බර් 31 දින රු.3,617,753 ක් වශයෙන් (රඳවා ගැනීම් මුදල් අඩුකල පසු) කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකමට අත්තිකාරම් ලෙස ගෙවීමට කටයුතු කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2022 ජනවාරි මස අවසන් කල යුතුව තිබූ මෙම කොන්ත්‍රාත්තුව 2022	2021 – 154(6) 3.4	වැඩ සඳහා අත්තිකාරම් ගෙවීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව හා ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කලයුතුයි.	අම්පාර නිවාඩු නිකේතනයේ පිහිටි ඉඩමේ රියදුරන් සඳහා නවාතැන් ගන්නා ස්ථානයේ ඉදිකිරීම්වල සියයට 65ක ප්‍රමාණයක් 2021 දෙසැම්බර් 31 වන විට අවසන් කර ඇති අතර වර්ෂ 2022 ජනවාරි මස වන විට සම්පූර්ණ ඉදි කිරීම් අවසන් කිරීමට කොන්ත්‍රාත් හිමියන් හා එකඟව තිබුණි. නමුත් වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය හමුවේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමේ කාලය 2022 වර්ෂයේ මැයි මස දක්වා දීර්ඝ කරන ලෙස කොන්ත්‍රාත්හිමියන් ඉල්ලා සිටි අතර අමාත්‍යංශය මඟින් මෙම දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව අදාල කොන්ත්‍රාත්හිමියන් විසින් 2022 මැයි 31 වන විට අම්පාර නිවාඩු නිකේතනයේ මෙම ඉදිකිරීම් වල කටයුතු අවසන් කොට අප අමාත්‍යංශය වෙත බාර ගන්නා ලෙස වාචිකව ඉල්ලා සිටි අතර	ප්‍රමාද ගාස්තු අයකර නොමැත.

	මැයි 25 වන විටද නිම වී නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.			කම්කරු දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු විසින් ඉදිකිරීම් වල ගුණාත්මක බව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කොට වාර්තාවක් ඉදිරිපත් කල යුතුව තිබුණි.	
7	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ කාර්යමණ්ඩල වැටුප් සැකසීමේදී වැටුප් අංශයේ කළමණාකරණ සහකාර නිලධාරිනියක විසින් වැටුප් වංචාවක් සිදුකර තිබූ අතර ඒ සම්බන්ධයෙන් 2022 ජනවාරි 11 දින හෙලිදරවු කරගෙන තිබුණි. මෙම වැටුප් වංචාව 2018 අගෝස්තු මාසයේදී පමණ සිට 2020 දෙසැම්බර් දක්වා සිදුකර තිබූ අතර දළ වශයෙන් එහි වටිනාකම රු.5,133,520 ක් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කිරීමක් සිදුකර නොතිබුණු අතර මාස 5 ½ ගතවී තිබුණ ද මූලික විමර්ශන අවසන් කර නොතිබුණි.	2021 – 154(6) 3.5 (ආ) 2023 - 154(6) 2.2 (අ)	ආයතන සංග්‍රහයේ විෂය II කොටස අනුව කටයුතු කල යුතුය.	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීමේදී සිදුවූ මුදල් වංචාව පිළිබඳව අනාවරණය වූයේ 2022 වර්ෂයේ ජනවාරි මාසයේදී බැවින් 2021 වර්ෂයේ හානි හා පාඩු යටතේ ගිණුම්ගත නොකරන ලදී. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ සමස්ත ක්‍රියාවලිය විමර්ෂණය කිරීමට පත් කළ කමිටුව මගින් මුළු අලාභය රු.5,133,520 ට ආසන්න මුදලක් ලෙස හඳුනාගෙන තිබෙන අතර වාර්තාවක් සකස් කරමින් පවතී. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් අදාල නිලධාරිණිය වැඩ තහනමට ලක් කර විදේශ ගමන් නතර කොට ඇත. අධිකරණයේ නඩුවක් ගොණු කර වංචා කළ මුදලින් කොටසක් අයකරගෙන ඇත.	අධිකරණ ක්‍රියාවලිය අවසන්ව නොමැත. රු.1,665,178 ක මුදලක් අයවීමට ඇත.

8	1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනතෙහි XII කොටසේ 57 (1) වගන්තිය අනුව සේවකයෙකුට සේවයේ යෙදී සිටියදී අනතුරක් සිදු වී දින 14 ක් තුල සේවායෝජකයා විසින් කම්කරු කොමසාරිස් වෙත වාර්තාවක් ඉදිරිපත් කලයුතු වුවද මේ සඳහා කිසියම් ක්‍රමවේදයක් සකස්කර නොතිබීම නිසා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය වෙත වාර්තා වී තිබූ අනතුරු මාස 5 සිට අවුරුදු 12 දක්වා ප්‍රමාද වී ලැබී තිබූ බව ලේඛණ අනුව අනාවරණය විය.	2021 – 154(6) 3.7 (ආ)	අදාල පනත සංශෝධනය සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගෙන විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කල යුතුය.	අනතුර සිදුවී දින 14 තුල සේවායෝජකයා විසින් කම්කරු වන්දි කොමසාරිස් වෙත වාර්තාකල යුතු වුවද ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමට නම් මහේස්ත්‍රාත් අධිකරණයක නඩුවක් පැවරිය යුතු බැවින් එය ප්‍රයෝගිකව අපහසු ක්‍රියාවලියකි. එම ක්රියාවලිය කරගෙන යාම සඳහා සුදුසු යාන්ත්‍රනයක් මෙම ආයතනයේ මේ වනතෙක් නිබී නැත.	වර්තමානය වන විටත් පහසු ක්‍රියාවලියක් හෝ වැඩපිළිවෙලක් සකස්කර නොමැත.
9	කම්කරු අමාත්‍යාංශයේ භෞතිකව නොතිබුණු නමුත් කම්කරු අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති වාහන 8 කින් එක් වාහනයක් හදිසි අනතුරකින් පසුව ගර්හිත තත්ත්වයට පත්කර 2018 වර්ෂයේදී රක්ෂණභාර අරමුදල වෙත පවරාදී තිබූ බව දැනුම් දී තිබුණි. එහෙත් එම වාහනය සඳහා 2021 වර්ෂයේදී නව ආදායම්	2021 – 154(6) 3.7 (ඇ)	මෙම වාහන පිළිබඳව කඩිනමින් තොරතුරු ලබාගෙන අවශ්‍ය විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.	මේ වන විට මෙම අමාත්‍යාංශය විසින් භාවිතයට නොගන්නා මෙම වාහන 08 පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙතින් තොරතුරු ලබා ගන්නා ලදී. එම තොරතුරුවලට අනුව එක් වාහනයක් ලේකම්, කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති බව සඳහන්ව ඇත. ඉතිරි වාහන 07 සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු විමසා ශ්‍රී	මෙතෙක් පවරාදීම සිදු වී නොමැත.

	බලපත්‍රයක් ලබාගෙන භාවිතා කරන බවත් අනෙක් වාහන 7 සම්බන්ධයෙන්ද තොරතුරු ලබාගෙන අදාල ආයතන වෙත පැවරීම 2021 වර්ෂය අවසන් වන විටද සිදු වී නොතිබුණි.			ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ හෝ වෙනත් අනුබද්ධ ආයතනයක් සතුව තිබේ නම් එම තොරතුරු මෙම අමාත්‍යාංශය වෙත දන්වා එවන ලෙස ලිපියක් මඟින් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යපාන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් වන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සතුව එක් රථයක් පවතින බව දන්වා ඇති අතර එම වාහනය විධිමත් පරිදි රථය පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. අනෙක් වාහන 06 සම්බන්ධයෙන් තොරතුරු ලබා ගත් පසුව වාහන තිබෙන ස්ථාන හඳුනාගෙන අදාල ආයතන වලට පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව	
10	යහපත් රැකියා වාතාවරණයක් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම(සුනිසි මෙහෙවර) සඳහා	2021 – 154(6) 3.7 (ඇ)	සුනිසි මෙහෙවර ප්‍රතිපාදන එම අරමුණ ඉටු කර ගැනීම සඳහා පමණක්	සුනිසි මෙහෙවර වැඩසටහන පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය සඳහා කටයුතු කරනු ලැබේ. සුනිසි රැකියා	ප්‍රතිපාදන යෙදවීම නිවැරදි කර නොමැත.

	වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා තිබූ රු.45,000,000 ක ප්‍රතිපාදනය උපයෝජනය කරමින් වෙනත් මූලධන වැය විෂයයන් 03 ක් සඳහා රු.11,856,138 ක්ද 2021 වර්ෂයේ ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු කාර්යයක් වෙනුවෙන් රු.3,028,506 ක් ද වශයෙන් රු.14,884,644 ක් වැය කර තිබුණි.		වැය කල යුතුය.	උත්පාදනය, ප්‍රවර්ධනය හා ජාතික ඵලදායිතාව, වැඩබිමෙහි හිමිකම, සමාජ ආරක්ෂණය, සමාජ කතිකාවත ප්‍රවර්ධනය සඳහා කම්කරු අමාත්‍යාංශයටත් අනුබද්ධ ආයතනවලටත් සුදුසු වාතාවරණයක් තිබීම අත්‍යවශ්‍ය වේ. එබැවින් කම්කරු අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනවල ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සහ යහපත් රැකියා ප්‍රවර්ධනය සඳහා සුදුසු වාතාවරණයක් ඇති කිරීම සඳහා මෙම ප්‍රතිපාදන යොදවා ගන්නා ලදී.	
11	අම්පාර නිවාඩු නිකේතනය පිහිටි ඉඩම 2022 මැයි මස වන විටද කම්කරු අමාත්‍යාංශය වෙත පවරගෙන නොතිබුණි.	2021 – 154(6) 3.7 (උ)	ආයතනයට අයිතියක් නොමැති ඉඩම්වල ඉදිකිරීම් සිදු නොකල යුතු අතර නිවාඩු නිකේතනය ඉදිකර අවසන් බැවින් ඉඩම පවරා ගැනීම කඩිනමින් කලයුතු වීම.	මේ සම්බන්ධව දිගින් දිගටම වන ජීවී සංරක්ෂණ අමාත්‍යාංශයටත් වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත් දැනුම් දී ඇති අතර වනජීවී අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සංවර්ධන) විසින් මෙම ඉඩම් කොටස අම්පාර අභය භූමියෙන් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් එම ක්‍රියාවලිය අවසානයේ මෙම ඉඩම් කොටස කම්කරු අමාත්‍යාංශයට පැවරිය හැකි බවත් දන්වා ඇත.	ගැසට් නිවේදනයක් මගින් අම්පාර අභයභූමියෙන් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අවසන්වී නොමැත.

12	2021 නොවැම්බර් 30 දින වන විට කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය වෙත වාර්තා වී තිබූ අනතුරු අතරින් මාරක අරතුරු 140 ක් හා මාරක නොවන අනතුරු 424 ක් සඳහා වන්දි අයකර දීමේ ක්‍රියාවලිය අවසන්ව නොතිබුණු අතර අනතුර වාර්තා වී වසර 5 ඉක්මවූ මාරක අනතුරු 14 ක් හා මාරක නොවන අනතුරු 29 ක් ද මේ තුල ඇතුලත්ව තිබුණි.	2021 – 154(6) 4.1 (අ)	වන්දි ආඥා පනතෙහි රෙගුලාසි අනුව කටයුතු කර අදාල මුදල් කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කලයුතු වීම.	මාරක හෝ මාරක නොවන අනතුරක් පිළිබඳව කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයට ඉල්ලීමක් ලැබුණු විට ඒ සඳහා නඩු ගොණුවක් විවෘත කිරීමට ආඥා පනත ප්‍රකාරව විධිමත් අයදුම්පත්‍රයක් හා වෛද්‍ය වාර්තාවක් ලද විට අයදුම්පතෙහි හා වෛද්‍ය වාර්තාවේ අඩුපාඩු තිබෙන අවස්ථාවන්හිදී ඒවා නිවැරදි කර ගන්නා තෙක් මූලික කටයුතු ආරම්භ කිරීම ද ප්‍රමාද විය හැක. ඉන් පසු නඩු ගොණුව විවෘත කර සේවා යෝජකගෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 30ක කාලයක් ලබා දිය යුතු වේ. එම කාලයෙන් පසුව වාර්තාව ඉදිරිපත් නොකරන්නේනම් හෝ අනතුර ප්‍රතික්ෂේප කරන්නේ නම් කම්කරු වන්දි අධිකරණයට යොමු කරනු ලබයි. කම්කරු වන්දි අධිකරණ ක්‍රියාවලිය සිවිල් නඩු විධාන සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය හා සාක්ෂි ආඥා පනත අනුව දිසා අධිකරණ ක්‍රියාදාමයට අනුව ක්‍රියාත්මක කල යුතු වේ.	ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදයේ වෙනසක් සිදුවී නොමැත.

13	කම්කරු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකගේ 2021 මාර්තු 22 දිනැති වාර්තාවට අනුව කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ අහඹු ලෙස තෝරාගත් වසර 5 ඉක්මවූ ගොනු 10 ක් පරීක්ෂා කිරීමේදී වසර 03 සිට වසර 09 ක් දක්වා වූ කාලයක් පුරාවට නඩු වාර 13 සිට 52 දක්වා වූ වාර ගණනක් කැඳවා තිබූ නමුත් 2021 ජනවාරි වන විටත් විසඳුමක් ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව වන්දි ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර වන්දි ලබා ගැනීමට අධික කාලයක් ගතවීමෙන් ලැබෙන වන්දි මුදලින් ලබාගත හැකි ප්‍රතිලාභයද ඔවුන්ට නොලැබී යා හැකි බැවින් වන්දි ලබාදීමේ ක්‍රියාවලියේදී අධික ප්‍රමාදයන් ඇති වීමට හේතුවන කරුණු විමසා බලා නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.	2021 – 154(6) 4.1 (ආ)	වන්දි ආඥා පනතෙහි රෙගුලාසි අනුව කටයුතු කර අදාල මුදල් කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කලයුතු වීම.	මෙම යටතේ දක්වා ඇති සියළු නඩු ගොණු කම්කරු වන්දි උසාවිවල දැනට විභාග වන නඩු වේ. මෙම අධිකරණවල දිසා අධිකරණයක ස්වරූපයෙන් උසාවි ක්‍රියාදාමයන් නියමාකාරණයෙන් අනුගමනය කල යුතු අතර දෙපර්ශවයටම සමාන අවස්ථාවන්ද ලබාදිය යුතු වේ. ඒ අනුව නඩුවක් සඳහා ගතවන කාලසීමාව නිශ්චිතව දැක්වීමට හැකියාවක් නොමැත. එමෙන්ම නිවැරදි උසාවි ක්‍රියාමාර්ග අනුව නඩු විමසීම සිදු නොකිරීමෙන් කම්කරු වන්දි උසාවියේ තීන්දුව ඉහල අධිකරණයේදී සංශෝධනයට ලක් වීමටද ඉඩ ඇත.	වන්දි ලබාදීමේ අධිකරණමය ක්‍රියාවලියේ වෙනසක් සිදුවී නොමැත.
14	කම්කරු වන්දි උසාවියේ තීරණයන්ට එරෙහිව අභියාචනා	2021 – 154(6) 4.1 (ඇ)	වන්දි ආඥා පනතෙහි රෙගුලාසි අනුව	අභියාචනා කරන ලද නඩු ගොණු සම්බන්ධව ඉහල අධිකරණයේ	නිදහස් කිරීම් සිදුකර නොමැත.

	කරන ලද ගොනු 13 කට අදාල සේවායෝජක විසින් වන්දි කාර්යාලයේ තැන්පත් කරන ලද රු.4,947,535 ක් සඳහා ඉතිරි කිරීම් ගිණුම් ආරම්භ කර තිබූ අතර මින් රු.3,729,505 ක ඉතිරි කිරීම් තැන්පත් ගිණුම් 10 ක් ආරම්භ කර වසර 1 ත් 4 ත් අතර කාලයක් ගතවී තිබුණි.		කටයුතු කර අදාල මුදල් කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කලයුතු වීම.	නියෝග ලැබෙනතෙක් ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වේ.	
15	රැකියාවේ යෙදී සිටියදී සිදුවන මාරක අනතුරු හේතුවෙන් මියයන සේවකයින්ගේ බාලවයස්කාර දරුවන්ට හිමිවන වන්දි මුදල් ඔවුන් වයස් පූර්ණත්වයට පත්වන තෙක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වන්දි කොමසාරිස් නමින් වූ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර වයස් පූර්ණත්වයට පත්වූ පසු ඔවුන් වෙත නිදහස් කිරීම සිදුකල යුතු වුවද 2021 දෙසැම්බර් 20 වන විට පැවති එලෙස වයස් පූර්ණත්වයට පත්ව නිදහස් නොකල ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.6,100,788 ක් විය.	2021 – 154(6) 4.1 (ඇ)	කඩිනමින් වන්දි මුදල් නිදහස් කිරීමට කටයුතු කලයුතු වීම.	2022 ජුනි 08 දින වන විට පවතින ශේෂය රු.1,075,000.00 ක් වේ.	නිදහස් කිරීමට කටයුතු කරමින් පවතී.
16	අගතියට පත් පාර්ශවය සඳහා හිමිවිය යුතු බවට වන්දි උසාවියේදී	2021 – 154(6) 4.1 (ඉ)	වන්දි ආඥා පනතෙහි රෙගුලාසි අනුව	කම්කරු වන්දි උසාවියේ තීන්දුව මත වන්දි මුදල නොගවෙන	ක්‍රියාවලියෙහි වෙනසක් සිදුවී නොමැත.

	තීරණය වුවද නඩු නියෝගය අනුව සේවායෝජක වන්දි මුදල නොගෙවීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට නඩු 46 ක් වරෙන්තු වශයෙන් පැවති අතර එමගින් හිමිවිය යුතු වන්දි මුදල රු.13,419,197 ක් විය. මේ අතර වරෙන්තු නිකුත් කර වසර 10 ක් ඉක්ම වූ නඩු 10 කට අදාල රු.1,873,352 ක් ද වසර 5 – 10 ත් අතර නඩු 21 කට අදාල රු.6,917,546 ක් හා අවුරුදු 1 – 4 අතර නඩු 15 කට අදාල රු.4,628,298 ක් ද ඇතුලත් විය. මේ ආකාරයට වන්දි උසාවිය මගින් තීරණය වුවද වන්දිලාභියාට මෙම මුදල නොලැබීම මත වන්දි කොමසාරිස් කාර්යාලයේ අරමුණු ඉටු වී නොතිබුණි.		කටයුතු කර අදාල ප්‍රතිලාභීන් වෙත කඩිනමින් මුදල් ලබාදීමට කටයුතු කලයුතු වීම.	අවස්ථාවලදී වගඋත්තරකරුගේ චංචල දේපල තහනමට ගෙන අයකර ගැනීමේ ක්‍රියාවලිය අදාල මහේස්ත්‍රාත් උසාවිය මඟින් ක්‍රියාත්මක කර ගැනීම සඳහා අගතියටපත් පාර්ශවය ඉදිරිපත් විය යුතු අතර ඔවුන් ඒ සඳහා සහයෝගය නොදැක්වීම මත මෙම මුදල් අයකර ගැනීම ප්‍රමාද වෙමින් ඇත. මෙම තත්ත්වය නිරවුල් කර ගැනීම සඳහා අධිකරණ සේවා කොමිසම මඟින් කම්කරු වන්දි අධිකරණයට රෙජිස්ට්‍රාර්වරයෙකු පත්කර ගැනීමටත්, වගඋත්තරකරුගේ නිශ්චල දේපළ තහනමට ගත හැකි ලෙස පනත සංශෝධනයට ඇතුලත්කර ඇති බැවින් ඉදිරියේදී මෙම ගැටළුව නිරවුල්කර ගැනීමටද හැකිවනු ඇත.	
17	2022 දෙසැම්බර් 31 දින වන විට සේවක අර්ථසාධක අරමුදලෙහි කේවල ගිණුම්වලට බැර නොවූ රු.282,726,669 ක්ද කම්කරු කොමසාරිස් දායක ගිණුමේ රු.57,174 ක්ද	2022 – 154(6) 3.1 (අ) (i)	දායක මුදල් කේවල ගිණුම්වලට බැර කිරීමට කටයුතු කල යුතුය.	අයිතිකරුගේ ගිණුම වෙත නිරවුල් කිරීමට අදාල කාර්යයන් කිරීමේදී නෛතික ලේඛණ විශාල වශයෙන් පරිශීලනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. මෙම අරමුදල් බොහෝ කාලයක සිට	ක්‍රියාවලිය පහසු හා කඩිනම් කිරීමේ කටයුතු සිදුකර නොමැත.

	කම්කරු දෙපාර්තමේන්තුවේ උපකාර්යාලවල තැන්පත් ගිණුම්වල රඳවා තිබුණි.			පැවත එනු ලබන ශේෂයන් බැවින් නිරවුල් කිරීමට යම් කාලයක් ගතවනු ඇත. නිවැරදි කිරීම් සිදු කිරීමෙන් අනතුරුව කේවල ගිණුම් වෙත මුදල් බැර කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නිලධාරීන් දැනුවත් කර තිබේ.	
18	2022 වර්ෂය වන විටද පෞද්ගලික අර්ථසාධක අරමුදල් සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු වී නොතිබුණි.	2022 – 154(6) 3.1 (අ) (ii)	පෞද්ගලික අර්ථසාධක අරමුදල් අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය.	වර්තමානයෙහි පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් පවත්වාගෙන යනු ලබන ආයතන බොහෝමයක් සේවක අර්ථසාධක අරමුදල් පනත ආරම්භ කිරීමට පෙර පැවති ආයතන බැවින් ඒවා අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණය වඩාත් ශක්තිමත් කිරීම සඳහා ඊට පනත සංශෝධනය කල යුතුය.	පනත සංශෝධනය කර නොමැත.
19	රැකියා නියුක්තිය සඳහා නියාමනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් 2022 වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක නොවුණි.	2022 – 154(6) 3.1 (අ) (iii)	මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය සකස් කළ යුතුය.	මෙම ප්‍රතිපත්තිය සම්පාදනය කර අනුමත කර වසර 05 ක් ඉක්මගොස් ඇති බැවින් එය නැවත සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමට අදාළ අංශ සම්බන්ධ කර දෙන මෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ද, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ (NHRDC) ද ඇතුළුව අදාළ ආයතන වෙතින් ඉල්ලීම් කර ඇති නමුත්	ප්‍රතිපත්ති සකස් කර ඇතත් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සිදුවී නොමැත.

				මෙතෙක් යහපත් ප්‍රතිචාර ලැබී නැත.	
20	2020 වර්ෂයේ ජාතික ඵලදායීතා සම්මාන තරඟාවලියේ ජයග්‍රාහකයන්ට පිරිනැමීම සඳහා සම්මාන කුසලාන 685 ක් සඳහා රු.4,512,123 ක ගෙවීමක් සිදුකර තිබූ අතර 2022 ජුනි 15 දින සම්මාන ගබඩාව වෙත භාර දී තිබුණි. සම්මාන භාරගෙන මසකට පසුව මේවා නිවැරදි පිරිවිතරයන්ගෙන් පවතින්නේද යන්න වාර්තාවක් කැඳවා තිබූ අතර, 2022 සැප්තැම්බර් 21 දින NPS/PR/06/001 ලිපිය පරිදි ගබඩාවට ලබාදුන් සම්මාන ඒකක 33 ක් හැර ඉතිරි ඒවා දෝෂ සහිත බව වාර්තා කර තිබුණි. එසේ තිබියදී මෙම සම්මාන කුසලාන ජයග්‍රාහකයන්ට පිරිනැමීමට කටයුතු කර තිබුණි.	2022 – 154(6) 3.5 (අ)	වඩාත් කාර්යක්ෂම හා ඵලදායී අන්දමින් ගණුදෙනු කළ යුතුය.	පවත්නා තත්ත්වය මත නිවැරදි කිරීමේ අපහසුතාවය සළකා බලා යම් සුළු අපගමනයක් පැවතිය ද සම්මාන භාවිතයට ගන්නා බැවින් සියයට 1 ක දඩයක් අයකර ජාතික ඵලදායිතා සම්මාන උළෙල පැවැත්වීම සිදු කරන ලදි.	දෝෂයන් සම්බන්යෙන් වෙනත් ක්‍රියාමාර්ග ගෙන නොමැත.
21	2015 වර්ෂයේදී ආරම්භක මූලික වියදම රු.1,465,200 ක් දරා මාසිකව රු.25,000 බැගින් නඩත්තු වියදම් රු.1,700,000 ක්ද, අනෙකුත් වියදම් සඳහා රු.133,800 ක්	2022 – 154(6) 3.6 (අ) 2023 – 154(6) 3.4 (අ)	පද්ධතිය කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරිමට කටයුතු කල යුතුය.	තවදුරටත් මෙම පද්ධතිය භාවිතයෙන් තොරව පවත්වා ගෙන යාම වෙනුවට නිසි අයුරින් ප්‍රයෝජනයට ගැනීම සඳහා පද්ධතියේ පෙර පැවති දත්ත සියල්ල උපස්ථ (backup) කොට	පූර්ණ ඵලදායකත්වයෙන් යුතුව පද්ධතිය භාවිතයට ගැනීමක් සිදු නොවේ.

	වැය දරා 2022 දෙසැම්බර් 31 වන විට එකතු පිරිවැය රු.4,299,000 ක් වූ e-breeze ව්‍යාපෘතිය එලදායීතා සම්මාන උළෙලේ කටයුතු සඳහා භාවිතා කර ඇති නමුත්, අනෙකුත් අපේක්ෂිත කාර්යයන් වූ උත්සව කළමණාකරණය හා අධ්‍යයන කළමණාකරණය නිලධාරීන්ගේ පරිපාලන කටයුතු සඳහා යොදා ගෙන නොතිබුණි.			පද්ධතිය නව අනුවාදයක් (version) ලෙස ස්ථාපනය කිරීමට තීරණය කරන ලදි. ඒ අනුව, e-breeze පද්ධතිය මෙතෙක් පැවති ඌන උපයෝජනය තත්ත්වයෙන් තොරව වඩා නිවැරදිව භාවිතාවක් හරහා ජාතික එලදායිතා ලේකම් කාර්යාලයේ උපරිම රාජකාරි කාර්යක්ෂමතාව වෙනුවෙන් යොදා ගැනීමට බලාපොරොත්තු වන බව	
22	2022 දෙසැම්බර් 31 දින වන විට එලදායීතා ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති එලදායීතා සංවර්ධන නිලධාරීන් 639 ක් සඳහා නිසි පරිදි කාර්යභාරය පැවරුමක් හෝ ප්‍රධාන කාර්යාලයෙන් නිසි අධීක්ෂණයක් සිදු වී නොතිබුණි.	2022 – 154(6) 3.6 (ආ)	නිලධාරීන් අධීක්ෂණය හා කාර්යය පැවරුම් කල යුතුය.	වැටුප් වර්ධක ලබාදීමට පෙර ඉටුකරන ලද කාර්යයන් පිළිබඳ පරිගණක ඉදිරිපත් කිරීමක් පරීක්ෂා කෙරේ. මාසික ප්‍රගති වාර්තා පරීක්ෂා කරනු ලැබේ. කාර්යයමණ්ඩල සමාලෝචන වැඩපිළිවෙලක් සඳහා අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.	අධීක්ෂණයට නිසි ක්‍රමවේදයක් සකසා නොමැත.
23	අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ලෙස දක්වා ඇති අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම ඇගයීම යන				

	කාර්යයන් හා සේවක අර්ථසාධක අරමුදල පරිපාලනය කිරීම හා කාර්යභාරයන් ඉටු කිරීමට ගන්නා ලද පියවරයන් ගෙන තිබුණද පහත සඳහන් කාර්යභාරයන් විධිමත් පරිදි අවසන්ව නොතිබුණි.	2023 – 154(6) 3.1 (අ) (i)	අරමුණ හා කාර්යභාරයන් ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී සැලැස්ම සඳහා 2023.09.12 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර 2023.10.25 දින දියත් කරන ලදි. ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මට්ටමේ අධීක්ෂණ යන්ත්‍රණය වන රැකියා සඳහා විගමනය පිළිබඳ ජාතික උපදේශක කාරක සභාව මේ විට පිහිටුවා ඇති අතර, අදාල පාර්ශ්වයෙන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත.	ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය සකස් වී නොමැත.
(අ)	ශ්‍රී ලංකාවේ ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.				
(ආ)	පුද්ගලික අර්ථසාධක අරමුදල් පරිපාලනය සඳහා 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ වගන්ති හා රෙගුලාසි සංශෝධනය.	2023 – 154(6) 3.1 (අ) (ii)	අරමුදල් පරිපාලනය සඳහා අවශ්‍ය නීතිරීති සම්පාදනය කරගත යුතුය.	පනත සංශෝධනයට අවශ්‍ය කටයුතු නියාමනය කිරීමටත්, එමගින් ප්‍රතිපාදනයන් වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරිමට කමිටුවක් පත් කර තිබේ. පනතේ වගන්ති හා රෙගුලාසි සංශෝධනයටත් නඩු පැවරීමේ ක්‍රියාවලිය විධිමත් කිරිමටත් මෙමගින් බලාපොරොත්තු වන බව.	පනත සංශෝධනය අවසන්ව නොමැත.
(ඇ)	විදේශ රැකියා නිමකර දිවයිනට පැමිණෙන පුද්ගලයින් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට විශේෂ වැඩසටහන්	2023 – 154(6) 3.1 (අ) (iii)	විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුය.	විදේශ රැකියාව නිම කර ශ්‍රී ලංකාවට පැමිණෙන විගමනික ශ්‍රමිකයන් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා බහු කාර්ය ණය	ප්‍රමාණවත් පරිදි කටයුතු ඉටුකර නොමැත.

	ක්‍රියාත්මක කිරීම.			යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇත. විදේශ ගත වීමට නියමිත විශේෂ අවධානය යොමු විය යුතු හඳුනා ගත් පවුල් ඒකක සඳහා සංවර්ධන සැලසුම් සකස් කරනු ලැබේ. ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානය (IOM) හා හෙල්විටාස් ශ්‍රී ලංකා ආයතනය සංවිධානයෙන් අප අමාත්‍යාංශය සම්බන්ධීකරණයෙන් දකුණු පළාතේ විගමනික සේවකයින් නැවත සමාජය ගත කිරීමට දායකත්වය දක්වන ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය හා මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ පුහුණු වැඩසටහනක්, නියමු වැඩසටහනක් ලෙස දකුණු පළාතේ විගමනික ශ්‍රමිකයන් 29 දෙදෙනෙකු සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කර දෙන ලද බව.	
(ඇ)	1985 අංක 21 දරන විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය.	2023 – 154(6) 3.1 (අ) (iv)	කාලීන අවශ්‍යතා පරිදි අණපනත් සංශෝධනය කල යුතුය.	පනත සංශෝධනය සඳහා අනුමැතිය ලබාගන්නා ලද්දේ 2023.04.24 දින දීය. මේ වන විට මූලික කෙටුම්පත සකස්කර අවසන් ව ඇති අතර එකී මූලික කෙටුම්පත වරින්වර සංශෝධනය කිරීමෙන් පසු අවසන් වරට 2024.05.14 දින ද	පනත සංශෝධනයේ ක්‍රියාවලිය අවසන්ව නොමැත.

				සංශෝධන පිළිබඳ සාකච්ඡාවක් පවත්වන ලදි. අවසන් කෙටුම්පතට නීතිපති නිශ්කාශන වාර්තාව ලබාදීමෙන් පසුව නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කළහැක.	
(ඉ)	වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කම්කරු නීති ප්‍රතිසංස්කරණයන් සිදුකිරීම. (Unified Labour Law Reforms)	2023 – 154(6) 3.1 (අ) (v)	අවශ්‍ය සංශෝධනයන් සිදුකල යුතුය.	වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කම්කරු නීති ප්‍රතිසංස්කරණය සඳහා මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් වෘත්තීය සමිති, හාම්පුතුන් ඇතුලු උනන්දුවක් දක්වන පාර්ශවයන් අතර සාකච්ඡා වාර 7ක් පවත්වා අදහස් ලබාගෙන දැනට ක්‍රියාත්මක පනත් 13 ක් සංශෝධනය කිරීමට හා වර්තමාන වැඩ ලොවට ගැලපෙන සේ අලුතින් ඇතුලත් වියයුතු කරුණු ද සහිතව සේවානියුක්ති පනතක් සකස් කිරීමට 2023.08.07 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. කමිටුවක් මගින් සකස් කරන ලද මූලික කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වෙමින් පවතී.	කාර්යභාරය අවසන් නොමැත.

				අවසන් කෙටුම්පත ලද විගස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කළහැකි බව.	
24	රැකියාවේ යෙදී සිටියදී අගතියටපත් පාර්ශවය සඳහා හිමිවිය යුතු බවට වන්දි උසාවියෙන් තීරණය වුවද අදාල නියෝගය අනුව සේවායෝජක වන්දි මුදල් නොගෙවීම නිසා 2023 දෙසැම්බර් 31 දිනය වන විට නඩු 54 ක් මගින් සේවකයන් වෙත නොගෙවූ වන්දි මුදල් රු.12,344,117 ක් විය. මේ අතර වරෙන්තු නිකුත් කර වසර 10 ක් ඉක්මවූ නඩු 11 ක්ද, වසර 5 – 10 අතර නඩු 22 ක් හා වසර 1 – 4 අතර නඩු 11 ක්ද විය.	2023 – 154(6) 3.2 (ඇ)	ආපදාවන්ට ලක්වූ කම්කරුවන් වෙත වන්දි ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් හා කාර්යක්ෂම විය යුතුය.	කම්කරු වන්දි උසාවි නියෝගය මත වන්දි මුදල් නොගෙවන අවස්ථාවන්හි දී වගඋත්තරකරුගේ දේපළ තහනම් කිරීම සඳහා කම්කරු වන්දි ආඥා පනත අනුව වරෙන්තුවක් නිකුත් කරනු ලබයි.එම වරෙන්තුව ක්‍රියාත්මක කිරීමේ බලතල ඇත්තේ වගඋත්තරකරු පදිංචි ප්‍රදේශයට අදාල මහේස්ත්‍රාත් අධිකරණයටය. කම්කරු වන්දි කොමසාරිස් දුන් තීන්දුව කිරීමට අදාල අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් සිදු කරනු ලැබේ.ඒඅනුව වගඋත්තරකරුගේ දේපල පෙන්වා දීම,තහනම් කළ දේපල වෙන්දේසි කර වන්දි මුදල් අයකර ගැනීමේ ආදී කටයුතු සඳහා ඉල්ලුම්කාර පාර්ශවය ඉදිරිපත් වී මහේස්ත්‍රාත් උසාවියේ එම පිස්කල් නිලධාරීන්ට සහයෝගය ලබා දිය යුතු වේ.එම කටයුතු සඳහා ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවීම මත	වන්දි ක්‍රියාවලියේ වෙනසක් සිදුවී නොමැත. තවදුරටත් නොගෙවූ වන්දි මුදල රු.12,344,117 කි.

				එම වරෙන්තු නඩු 54 කට අදාල වන්දි මුදල් මෙතෙක් අයකර ගැනීමට නොහැකි වී ඇත.	
25	ආසියානු ඵලදායිතා සංවිධානය මගින් මහියංගනය හා තෙල්දෙණිය රෝහල් වෙත වෛද්‍ය උපකරණ බෙදාදීමේ ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො.90,000 ක අධාරයක් ප්‍රදානය කිරීමට එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් ඇ.ඩො.63,000 ක් ලැබී තිබුණු අතර, ව්‍යාපෘතිය අවසන් කිරීමට වෙනත් ව්‍යාපෘතියක් සඳහා ලැබුණු (පොහොර ව්‍යාපෘතිය) ඇ.ඩො.27,000 ක් වැයකර තිබුණි. වෛද්‍ය උපකරණ බෙදාදීමේ ව්‍යාපෘතිය 2023 අප්‍රේල් අවසන් වුවද මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම නිසා මෙම මුදල ප්‍රතිපූර්ණය කරගැනීමට මෙතෙක් නොහැකි වී තිබුණි. අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු කඩිනම්ව සංවිධානය නොවීම නිසා මූලිකව සැලසුම් කල අයිතම දෙකක්	2023 – 154(6) 3.3 (අ)	අනුමත ප්‍රතිපාදන ඉක්මවා දැරූ වියදම් සම්බන්ධයෙන් කටයුතු කල යුතුය.	ආසියානු ඵලදායිතා සංවිධානයේ ආධාර මත සිදු කරන ලද මහියංගනය හා තෙල්දෙණිය රෝහල් මත වෛද්‍ය උපකරණ බෙදා දීම සඳහා අනෙකුත් ව්‍යාපෘති මගින් වැයකර තිබූ ඇ.ඩො.27,000 ක මුදල මේ වන විට ආසියානු ඵලදායිතා සංවිධානය මගින් රාජ්‍ය ගිණුම් චක්‍රලේඛන ප්‍රකාරව මේ වන විට මහාභාණ්ඩාගාරය වෙත ප්‍රතිපූරණය කර ඇත.	ඇ.ඩො.2,221 ක වියදම අයකර ගැනීමට හැකිවී නොමැත.

	මිලදී ගැනීමට නොහැකිව තිබූ අතර, විදේශ විනිමය අනුපාතිකය 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අඛණ්ඩව පිරිහෙන තත්වයකදී අනුමත ආධාර මුදල ඉක්මවා ඇ.ඩො.2,221 ක වියදමක් දැරීමට සිදුව පැවතිණි.				
26	එළදායීතා ලේකම් කාර්යාලය පවත්වාගෙන යනු ලබන සෙත්සිරිපාය දෙවන අදියර, 10 වන මහල පරිශ්‍රය සඳහා 2023 ජනවාරි සිට 2025 ජනවාරි දක්වා කාලපරිච්ඡේදයට බදුකුලී හා සේවා ගාස්තු සඳහා වර්ග අඩියක පිරිවැය සියයට 50 කින් ඉහල ගොස් තිබූ අතර, මේ සඳහා ආයතනය පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගතවී තිබුණි. 2023 වර්ෂයේ සිට මාසික බදු කුලිය රු.3,548,342 ක් වන අතර වාර්ෂික බදුකුලී වටිනාකම රු.30,578,901 ක් විය. ඉහත බදු මුදල් අවම කර ගැනීම සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු දෙපාර්තමේන්තුව සතු ඉඩකඩ තුලින්	2023 – 154(6) 3.4 (ආ)	වැයබර අවම වන ආකාරයට කටයුතු කල යුතුය.	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2024.04.30 දින අමාත්‍යාංශයේ ප්‍රධාන නිමැවුම් ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රගතිය විමසීමේ රැස්වීමේ දී කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ සිදු කළ යුතු අලුත්වැඩියා කටයුතු සිදු කිරීමෙන් අනතුරුව ජාතික එළදායිතා ලේකම් කාර්යාලය එම පරිශ්‍රයට රැගෙන යාම පිළිබඳව සාකච්ඡා කරන ලදී.	ක්‍රියාවලිය අවසන්ව නොමැත.

	පරිශ්‍රයක් ලබාගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.				
27	කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ වන්දි ලබාගැනීමේ අයදුම්පත්‍ර ඉදිරිපත් කල දිනය, අනතුරේ ස්වභාවය, කැඳවීම් කල දිනයන්, නඩු දින, වන්දි මුදල් තැන්පත් කිරීම් ආදී පරිපාලනමය තොරතුරු පරිගණක පද්ධතියකට ඇතුලත් නොවීම හේතුවෙන් තොරතුරු පරීක්ෂාව සඳහා ලිපිගොනු, ලේඛන භෞතිකව පරීක්ෂාවට ලක්කල යුතු වේ. මේ හේතුවෙන් ගොනුවල තොරතුරු කඩිනමින් ලබාගැනීම අපහසු මෙන්ම ගොනුවක් අස්ථානගතවීමෙන් තොරතුරු ලබාගත නොහැකි වීමේ අවධානමක්ද පවතී.	2023 – 154(6) 3.5	තොරතුරු පරිගණක ගතකර පරිපාලන කටයුතු පහසුකර ගැනීමට ක්‍රියාකල යුතුය.	සියළුම වන්දි උසාවි වලට අදාලව වෙන වෙනම ලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.	පරිගණක පද්ධතියක් සකස්කර නොමැත.
28	2005 අංක 10 දරන කම්කරු වන්දි සංශෝධන පනතෙහි iv වැනි කොටසේ 13(1) වගන්තිය ප්‍රකාරව වන්දි කොමසාරිස් වෙත තැන්පත් කරන ලද වන්දි මුදලක් ඒ සඳහා අයිතිය පවතින පුද්ගලයන් වෙත බෙදාදීමට කටයුතු	2023 – 154(6) 4.1	අගතියට පත්වූ කම්කරුවන්ට හිමි ප්‍රතිලාභ කඩිනමින් ලබාදීමට කටයුතු කල යුතුය.	වන්දි කොමසාරිස් වෙත තැන්පත් කරන ලද නමුත් මේ වනතෙක් බෙදා නොහළ පොදු තැන්පත් ගිණුමෙහි රඳවා තිබූ වන්දි මුදල රු.3,074,493 කි. මේ මුදල තුළ ගොනු 04 කට අදාලව තැන්පත් කළ මාස 06 ඉක්ම වූ රු.1,155,996 ක	තව දුරටත් පොදු තැන්පතු ගිණුමේ රු.3,074,942 වන්දි මුදල් ඇත.

කල යුතු වුවද 2023 දෙසැම්බර් 31 දිනය වන විට බෙදා නොහල පොදු තැන්පත් ගිණුමෙහි රඳවා තිබූ වන්දි මුදල රු.4,689,859 ක් විය.	මුදලක් පවතියි.

3.5 සෞඛ්‍ය අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	193,057,152,383	1,614,661,568	191,442,490,815	-	තත්ත්වාගණනය කළ
2022	203,692,711,803	1,858,555,082	201,834,156,721	-	තත්ත්වාගණනය කළ
2023	207,990,644,076	1,980,022,523	206,010,621,553	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2018 වර්ෂයේදී මූල්‍ය නොවන වත්කම්වල පිරිවැය රු.මිලියන 46,940.73 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර ඉන් රු.මිලියන 7,102.99 ක් 2019 වර්ෂයේදී අළුතින් ඉඩම් අත්පත් කර ගැනීමක් ලෙස දක්වා තිබුණි.	2022,2023	මෙම වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.	පවතින ගැටළු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කර නිරාකරණය කර ගැනීම සඳහා සෞඛ්‍ය ආයතන 61ක මාසික ගිණුම් සාරාංශය ගබඩා සමීක්ෂණ අංශය වෙත ලබාගෙන වත්කම් ගිණුම් තැබීම පරීක්ෂා කරනු ලබන බව.	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
02	2018 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.මිලියන 14,793.13 කින් අඩුවෙන් දක්වා තිබීම නිසා 2019 දෙසැම්බර් 31 දිනට මූලධන වත්කම් ඊට සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණි.	2022,2023	මෙම වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.	-එම-	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

03	භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන අනුව 2019 වර්ෂය තුළදී අත්පත් කර ගෙන තිබුණු ගොඩනැගිලි හා ඉදිකිරීම් පිරිවැය රු.මිලියන 6,501.94 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණු අතර 2019 වර්ෂය තුළදී අත්පත් කර ගෙන තිබුණු වත්කම්වල පිරිවැය රු.මිලියන 2,967.27 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2022,2023	මෙම වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.	තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශය වෙත ලබාදී ඇති මධ්‍යම රජය යටතේ පාලනය වන රෝහල් හා ආයතන වලට අදාළ සියලු තක්සේරු ඉඩම් හා ගොඩනැගිළි ගිණුම්ගත කිරීමට උපදෙස් ලබාදී තිබුණි. සියලු තක්සේරු කර ඇති ඉඩම් හා ගොඩනැගිළි ගිණුම්ගත කිරිමට කටයුතු කර ඇති බව.	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
04	භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන එස්ජ් 80 මූල්‍ය නොවන වත්කම් ගිණුම් මාසික සාරාංශයට හා එස්ජ් 82 සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවට අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල පිරිවැයෙහි පැවති රු.මිලියන 19,789.44 ක වෙනසට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.	2021,2022,2023	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය.	2024.09.30 දින සිට සියලුම මිලදීගැනීම් ඉන්වෙන්ට්‍රි ගත නොකර මාසික ගිණුම් සාරාංශ සැකසිය නොහැකි ලෙස New-Cigas පද්ධතිය යාවත්කාලීන කිරිමට කටයුතු කර ඇති බව.	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
05	2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2021 ජනවාරි 01 දිනට දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය රු.මිලියන 192,229.15 ක් වුවද, භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු මූල්‍ය	2021,2022,2023	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය.	-එම-	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	නොවන වත්කම් ගිණුම් මාසික සාරාංශය (SA 80) හා සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) ප්‍රකාරව එම අගය පිළිවෙලින් රු.මිලියන 172,439.71 ක් හා රු.මිලියන 184,327.77 ක් වූයෙන් පැවති පිළිවෙලින් රු.මිලියන 19,789.44 ක හා රු.මිලියන 7,901.38 ක වෙනස්කම්වලට හේතු අනාවරණය නොකෙරුණි.				
06	2021 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ACA 2(i) ආකෘතිය) හා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු මාසික වියදම් සාරාංශය (SA 10) ප්‍රකාරව, මූලධන වත්කම් අත්පත් කර ගැනීම් හා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) ප්‍රකාරව එම අගයන් අතර වූ රු.මිලියන 16,877.89 ක වෙනස සඳහා හේතු අනාවරණය නොකෙරුණි.	2022,2023	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය.	-එම-	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
07	2020 වර්ෂයේදී විවිධ දේශීය, විදේශීය ආයතන, සංවිධාන හා පුද්ගලයින් විසින් අමාත්‍යාංශයට හා ඒ යටතේ පවතින රෝහල් ආයතන හා විවිධ අංශ වෙත මූල්‍ය නොවන ආධාර හෝ පරිත්‍යාග ලෙස වටිනාකම රු.මිලියන 1,339.25 ක භාණ්ඩ උපකරණ හා වෛද්‍ය සැපයීම්ද වටිනාකම නොදත් භාණ්ඩ හා උපකරණ ඒකක	2022,2023	ගිණුම්ගත නොකළ සියළුම වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.	-එම-	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	2,444 ලබා දී තිබුණු බැව් තහවුරු වුවද ඒවායේ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.				
08	2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු විදේශාධාර ව්‍යාපෘති 54 ක් යටතේ දරන ලද රු.මිලියන 7,603.09 ක වියදම තුළ ඇතුළත් මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් හා සංවර්ධනය සඳහා දරන ලද වියදම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	2022,2023	ව්‍යාපෘති යටතේ අත්පත් කරගත් සියළුම වත්කම් ගිණුම්ගත කළ බව තහවුරු කරන ලිඛිත සාක්ෂි කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.	-එම-	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
09	2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව හා භාණ්ඩාගාර සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව එදිනට මූල්‍ය නොවන වත්කම්වල අගය හා 2022 වර්ෂයේ භාණ්ඩාගාර සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව 2022 ජනවාරි 01 දිනට එම අගය අතර රු. මිලියන 5,244.56 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනසට හේතුව විගණනයේදී පැහැදිලි නොකෙරුණි.	2022,2023	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමටකටයුතු කළ යුතුය.	-එම-	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
10	2022 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ACA 2(i) ආකෘතිය) හා	2022,2023	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය	-එම-	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය

	භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 10 ට අනුව, 2022 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම් හා භාණ්ඩාගාරයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව එම අගය අතර රු. මිලියන 11,423.16 ක වෙනසක් පැවතුණි.		ගැලපීම් සිදුකිරීමටකටයු කළ යුතුය.		ක්‍රියාත්මක කර නොතිබුණි.
11	කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6,326.05 ක මූල්‍ය නොවන වත්කම් මිලදීගෙන තිබුණු අතර මෙම වත්කම්වල පිරිවැය අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	2022,2023	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය.	-එම-	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
12	විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන 59 කට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව රෝහල් /ආයතන 25 ක ඉඩම් මෙන්ම රෝහල් /ආයතන 05 ක ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	2022,2023	කඩිනමින් මෙම වත්කම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.	තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශය වෙත ලබාදී ඇති මධ්‍යම රජය යටතේ පාලනය වන රෝහල් හා ආයතන වලට අදාල සියලු තක්සේරු ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගත කිරීමට උපදෙස් ලබාදී තිබුණි. සියලු තක්සේරු කර ඇති ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගත කිරිමට කටයුතු කර ඇති බව.	සියළුම ඉඩම් හා ගොඩනැගිලි ගිණුම් ගත කිරීම සිදුකර නොතිබුණි.

13	ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට හා සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අයිතිය පවරන ලද වාහන දෙකක පිරිවැය රු.11,550,000 ක් 2022 දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය වාර්තාවල ඇතුළත්ව තිබුණි.	2022,2023	මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.	අදාළ නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු යොදා ඇති බව.	අදළ තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.
14	ආයතන / රෝහල් හා අංශ 31 ක් වෙත 2020 හා 2021 වර්ෂ වලදී ලැබී තිබුණු රු. මිලියන 2,588.30 වටිනා භාණ්ඩ හා ආයතන / රෝහල් හා අංශ 30 ක් වෙත ලැබී තිබුණු වටිනාකම පිළිබඳ තොරතුරු ඇතුළත් නොවූ අවස්ථා 2057 කට අදාළ භාණ්ඩ විධිමත් පරිදි ලේඛනගත කර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.	2022,2023	සියළුම පරිත්‍යාග නියමිත පරිදි ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.	සියලුම පරිත්‍යාග ගිණුම්ගත කිරීම සඳහා උපදෙස් ලබාදී ඒ අනුව ගිණුම්ගත කිරීමට කටයුතු යොදා ඇති බව.	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
15	2022 වර්ෂයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල අගය රු. මිලියන 200,118.27 ක් වූ අතර 2023 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු එම වාර්තාවේ 2023 ජනවාරි 01 දිනට එම අගය රු.මිලියන 195,221.42 ක් විය. මේ අනුව රු.මිලියන 4,896.85 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනසට හේතු	2023	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය	2024.09.30 දින සිට සියලුම මිලදීගැනීම් ඉන්වෙන්ට්‍රි ගත නොකර මාසික ගිණුම් සාරාංශ සැකසිය නොහැකි ලෙස New-Cigas පද්ධතිය යාවත්කාලීන කිරිමට කටයුතු කර ඇති බව.	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	පැහැදිලි නොකෙරුණි.				
16	2023 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ACA 2(i) ආකෘතිය) හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 10 ට අනුව, 2023 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු.මිලියන 11,605.50 ක් වූවද භාණ්ඩාගාරයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව සමාලෝචිත වර්ෂයේ වත්කම් මිලදී ගැනීම රු. මිලියන 3,698.37 ක් වූයෙන් වත්කම්වල පිරිවැය රු. මිලියන 7,907.13 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2023	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය	අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු යොදා තිබුණු අතර හඳුනාගනිමින් පවතින වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතින බව.	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
17	අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු. මිලියන 204,292.96 ක් වූවද විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන 63 ක 2023 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව එම වත්කම්වල වටිනාකම රු. මිලියන 215,870.86 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. මිලියන 11,577.90 ක වෙනසක් නිරීක්ෂණය විය.	2023	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය	2024.09.30 දින සිට සියලුම මිලදීගැනීම් ඉන්වෙන්ට්‍රි ගත නොකර මාසික ගිණුම් සාරාංශ සැකසිය නොහැකි ලෙස New-Cigas පද්ධතිය යාවත්කාලීන කිරිමට කටයුතු කර ඇති බව.	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

18	2024 මාර්තු 25 දිනට විගණනය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 05 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 6,620.90 ක මූල්‍ය නොවන වත්කම් මිලදීගෙන තිබුණු නමුත් මෙම වත්කම් වලින් පිරිවැය රු. මිලියන 3,385.32 වත්කම් පමණක් අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.	2023	නිවැරදි අගයන් ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.	අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු යොදා ඇති අතර හඳුනාගනිමින් පවතින වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතින බව.	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
19	2023 දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අයත් රෝහල් /ආයතන 63 ක පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව රෝහල් /ආයතන 27 ක ඉඩම් මෙන්ම රෝහල් /ආයතන 04 ක ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	2023	කඩිනමින් මෙම වත්කම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.	මේවන විට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති සියලුම තක්සේරු වටිනාකම් New-Cigas පද්ධතියට ඇතුළත් කර ඇති බව හා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය නොවන ආයතන වලට අදාළ ඉඩම් ගොඩනැගිලි ඉවත්කිරීමට කටයුතු කරන බව.	සියළුම ඉඩම් හා ගොඩනැගිලි ගිණුම් ගත කිරීම සිදුකර නොතිබුණි.
20	2018 වර්ෂයෙන් පසු පේරාදෙණිය රෝහල් පරිශ්‍රයේ වකුගඩු ප්‍රතිකාර ඒකකයක් සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ප්‍රතිපාදන යටතේ මහල් 03 කින් සමන්විත ශල්‍ය වාට්ටු සංකීර්ණයක් ඉදිකර තිබුණද මෙම ගොඩනැගිලිවල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර	2023	ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.	මෙම ගොඩනැගිලි තක්සේරු කිරීම් සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව.	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	නොතිබුණි.				
21	මුළු පිරිවැය රු.මිලියන 204,292.96 ක් වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳව විස්තරාත්මක උපලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා සහ CIGAS වැඩසටහන අනුව දැක්වෙන වත්කම් පිළිබඳ තොරතුරු, ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් ශේෂයට ගැලපීම් කර තිබුණු රු.මිලියන 20,775.78 ක මුදලට, 2023 වර්ෂය තුළ සිදු කර තිබුණු රු. මිලියන 3,698.37 ක වත්කම් මිලදී ගැනීම් වලට මෙන්ම රු. මිලියන 6,944.27 ක වත්කම් අපහරණයන් වලට අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණු බැවින් එම අගයන් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.	2021,2022,2023	මෙම තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 42 (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	2024.09.30 දින සිට සියලුම මිලදීගැනීම් ඉන්වෙන්ට්‍රි ගත නොකර මාසික ගිණුම් සාරාංශ සැකසිය නොහැකි ලෙස New-Cigas පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව.	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
22	වෛද්‍ය සැපයීම් අංශයට අදාළව එම අංශයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් ඉදිරිපත් කරන ලද බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව බැරකම් ශේෂය රු.මිලියන 79,784.95 ක් වුවද, අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු. මිලියන 1,274.91 ක් වූයෙන් රු.මිලියන 78,510.04 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශවල අඩුවෙන් දක්වා තිබුණි.	2023	නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.	දෝෂ මගහරිමින් 2024 මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට දැනුවත් කිරීම් සිදුකළ බව.	දෝෂ මගහරිමින් 2024 මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට දැනුවත් කිරීම් සිදුකර තිබුණි.

23	2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව, කාර්යය නිම කර දින 10 ක් ඇතුළත ලබා ගත් තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වුවද, 2023 වර්ෂය තුළ අවස්ථා 67 කදී ලබා දී තිබුණු එකතුව රු.මිලියන 3.12 ක් වූ තත්ත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය නිමවී මාස 01 ත් මාස 02 ත් දක්වා අතර කාල පරාසයක් ප්‍රමාද වී පියවා තිබුණි.	2021,2022,2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව තත්ත්කාර්ය අතුරු අග්‍රිම, කාර්යය නිමවූ වහාම පියවිය යුතුය.	ගැටළුව විසදා ගැනීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන විධි ක්‍රම තවදුරටත් විධිමත් කිරීමට කටයුතු යොදමින් පවතින බව.	තත්කාර්යය අතුරු අග්‍රිම මු.රෙ.371 ප්‍රකාරව සහ මුදල් පාලන බලතල පැවරීම අනුව කාර්යය නිම වූ වහාම, උපරිම දින 10ක් ඇතුළත පියවන ලෙස සියළුම අංශ ප්‍රධානීන් දැණුවත් කර තිබුණි.
24	2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අනෙකුත් අත්තිකාරම් (7000-0-0-111-0-002) යටතේ දක්වා තිබුණු වෛද්‍ය සැපයුම් අංශයට වර්ෂ ගණනාවකට පෙර ලබාදුන් රු.1,222,599,026 ක අත්තිකාරම සමාලෝචිත වර්ෂය තුළදීද පියවීමට කටයුතු කර නොතිබුණි.	2023	නොපියවූ අත්තිකාරම් නියමිත පරිදි ගිණුම් ගත කළ යුතු අතර මෙම අත්තිකාරම් කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය.	අත්තිකාරම් ගිණුම නිරවුල් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව මේ වන විට රැස්වී 2024 වර්ෂය තුළ නාමික ප්‍රතිපාදනයක් ලබාගෙන මෙම අක්‍රිය අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීම සුදුසු බවට නිර්දේශ කර ඇති බව.	මේ සම්බන්ධව පත්කර ඇති කමිටුවේ නිර්දේශයන්ට අනුව නාමික ප්‍රතිපාදනයන් ලබාගෙන 2024 වර්ෂය අවසානයේදී පියවීමට කටයුතු කිරීමට උපදෙස් ලබාදී තිබුණි.
25	ශ්‍රී ලංකා දන්ත රෝහලෙහි හා අනුරාධපුර ශික්ෂණ රෝහලෙහි වර්ෂ 2002 හා 2019 වර්ෂ තුළදී සිදු වූ මුදල් මංකොල්ලයන් වෙනුවෙන් වූ අදාළ පාඩුව පියවීම සඳහා මහා	2023	මහාභාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතුය.	මෙම වටිනාකම් 2023 භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල 111 වැය ශීර්ෂය යටතේ ඇතුළත් කර නොමැති බව.	මෙම පාඩු පියවීම සම්බන්ධයෙන් කඩිනමින් පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන් දැණුවත් කර තිබුණි.

	භාණ්ඩාගාරය විසින් ලබාදුන් මුදලින් 2023 දෙසැම්බර් 31 දිනට නොපියවූ පිළිවෙලින් රු.2,288,037 ක් හා රු.6,321,785 ක අත්තිකාරම, මූල්‍ය ප්‍රකාශනවල (ඒසීඒ - 5) විවිධ අත්තිකාරම් යටතේ දක්වා නොතිබුණි.				
26	සැසඳුම් ප්‍රකාශයේ ඇමුණුම 3 අනුව වෙනත් රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිමට පැවති ණයගැති ශේෂය 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 59.91 ක් විය. 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1:6 සහ 1:7 යන වගන්තිවල දක්වා ඇති විධිවිධාන වලට අනුකූලව කටයුතු කර නොමැති බව නිරික්ෂණය විය. මෙම ණයගැති ශේෂයන් අතුරෙන් රු.මිලියන 42.23 ක් වූ ණයගැති ශේෂ වර්ෂ 5ට වඩා වැඩි පැරණි ණය ශේෂයන් වූ අතර එය මුළු ණයගැති ශේෂයෙන් සියයට 70 ක් පමණ විය. ඉතිරි ණයගැති ශේෂ වලින් රු.මිලියන 14.45 ක් වූ ණයගැති ශේෂ මාස 03 ඉක්ම වූ ණයගැති ශේෂ විය.	2021,202 2,2023	ආයතන සංග්‍රහයේ හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිලධාරියා ස්ථාන මාරුවී ගොස් මාස 03 ක් ඇතුළත ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.	2020 වර්ෂයේ සිට අභ්‍යන්තර ස්ථාන මාරු වී ගිය සහ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂයන් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමෙන් අනතුරුව එම වර්ෂය තුළදීම නිරවුල් කරනු ලබන බව, පැරණි ණය ශේෂයන් පිළිබඳවද තොරතුරු සොයා බලා නිරවුල් කරනු ලබන බව, පළාත් සභා තුළින් අමාත්‍යාංශය වෙත පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමේ කටයුතු සිදු කරනු ලබන අතර ස්ථාන මාරු ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් නිරවුල් කරන ලෙස අදාළ පළාත් සභා ආයතන වෙත දැනුම් දී නිරවුල් කිරීමේ කටයුතු සිදු කරන බව.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.

27	වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 271 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. මිලියන 11.22 ක් වූ අතර ඉන් රු.මිලියන 7.48 ක් හෙවත් සියයට 67 ක ණය ශේෂ වර්ෂ 5 කට වඩා පැරණි ණය ශේෂ වූ අතර රු.මිලියන 9.49 ක් හෙවත් සියයට 85 ක ණය ශේෂ වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ විය.	2021,2022,2023	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	වැඩ තහනම් වූ නිලධාරීන්ගේ ණය ශේෂයන් නිරවුල් කිරීම සඳහා මැතිවරණ කොමසාරිස් වෙතින් නිලධාරීන්ගේ වර්තමාන ලිපිනයන් ලබා ගැනීමෙන් අනතුරුව ණය ශේෂ නිරවුල් කරන ලෙස නිලධාරීන් හට දැනුවත් කිරීම, ග්‍රාම නිලධාරීන් හරහා දැනුවත් කිරීම, ප්‍රදේශයට අයත් පොලිසිය දැනුවත් කිරීම, ඇපකරුවන් දැනුවත් කිරීම වැනි ක්‍රියාමාර්ග ගැනීම තුළින් ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරන බව. 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ණය ශේෂ තුළින් රු. 815,404 ක් 2024.06.30 දින වන විට අයකර ගත් බව.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.
28	සේවය අතහැර ගිය නිලධාරීන් 1121 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 34.90 ක ණය ශේෂයන් අයවිය යුතුව තිබුණි. ඉන් රු.මිලියන 11.76 ක් හෙවත් සියයට 34 ක ණය ශේෂ වර්ෂ 5 කට වඩා පැරණි ණය ශේෂ වූ අතර රු.මිලියන 22.40ක් හෙවත් සියයට 64 ක ණය ශේෂ වර්ෂයකට වඩා	2022,2023	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ණය ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය සියළු පියවර අනුගමනය කිරීමෙන් අනතුරුව අය නොවූ ණය ශේෂයන් පොතෙන් කපා හැරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. 2023 දෙසැම්බර් 31 දිනට	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.

	පැරණි ණය ශේෂ විය. මෙම ශේෂය වසරක් පාසා අඛණ්ඩව වැඩිවන අතර, ණය අයකර ගැනීම පිළිබඳව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.			ලැබිය යුතු ණය ශේෂ තුලින් රු. මිලියන 3.9 ක් 2024.06.30 දින වන විට අයකර ගත් බව.	
29	විශ්‍රාම ගිය නිලධාරීන් 423 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය මුදල රු.මිලියන 19.99 ක් වූ අතර එයින් රු.මිලියය 7.85 ක් හෙවත් සියයට 39 ක ණය ශේෂ වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ විය.	2021,2022,2023	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සහ මියගිය නිලධාරීන්ගේ උරුමකරුවන් දැනුවත් කර අයකර ගැනීම් සිදු කරන ලෙස හා අනෙකුත් විධිවිධාන පරිදි අයකිරීම් සිදු කිරීමට උපදෙස් ලබා දී ඇති බව. 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ණය ශේෂ තුලින් රු. මිලියන 9.5 ක් 2024.06.30 දින වන විට අයකර ගත් බව.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.
30	මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පාඩුවක් හෝ අලාභ හානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවත් රු.මිලියන 22.91 ක ඖෂධ ඌණතා ද, රු.මිලියන 218.04 ක ඖෂධ කල් ඉකුත් වීම්ද, රු.මිලියන 199.26 ක ඖෂධ හානිවීම්ද සම්බන්ධයෙන් වසර 3 සිට වසර 14 ක අතර කාලයක් ගතවී ඇතත් විගණිත දිනය	2022,2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මේ තත්වයන් හඳුනා ගෙන ඉදිරි කාලය තුළ අදාළ පාර්ශවයන්ගෙන් පැහැදිලි කිරීම් ලබා ගෙන අවශ්‍ය කටයුතු සිදු කර ප්‍රගතිය ඉක්මණින් දන්වන බව. පත් කරන ලද අලුත් සාමාජිකයින් සඳහා අනුමැතිය 2024.09.09 ලබා දී මූලික පරීක්ෂණ 2024.10.15 දින සිදු කිරීමට කටයුතු යොදා ඇති බව.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.

	වූ 2023 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.				
31	වෛද්‍ය සැපයීම් අංශයට අයත්ව තිබුණු කොටිකාවත්ත අංක 53 ගබඩාව 2016 මැයි 18 දින ගංවතුරට යටවීමෙන් පසු සිදු වී ඇති හානිය රු.මිලියන 405.57 ක් ලෙස ගණනය කර තිබුණු අතර ඉන් රු.මිලියන 206.31 ක් පමණක් අදාළ රක්ෂණ ආයතනය වෙතින් 2017 ජනවාරි 30 සහ 2017 සැප්තැම්බර් 21 යන දෙදින තුළදී ලබා දී තිබුණි. ඒ අනුව තවදුරටත් අයකර ගත යුතු මුදල රු.මිලියන 199.26 ක් වූ අතර වසර 07කට වැඩි කාලයක් ගතවී ඇතත් මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 101 සිට 113 ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.	2022,2023	මේ සම්බන්ධයෙන් කඩිනම් පියවර ගත යුතුය.3	රක්ෂණ ආයතනය විසින් තවදුරටත් ගෙවීම් සිදුකළ නොහැකි බව 2024.07.17 දින දන්වා තිබුණු අතර, මුදල් රෙගුලාසි ප්‍රකාරව පොතෙන් කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාළ ලිපි ලේඛන යොමු කිරීම සඳහා කඩිනමින් කටයුතු කරන ලෙස අදාළ නිළධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති බව.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.
32	2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, සියළුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මගින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමට පියවර ගත යුතු අතර 2017 මැයි 12 දිනැති අංක DMS/0016 දරන භාණ්ඩාගාර	2021,2022,2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධ වාර්තා තබා ගැනීමටත්, ඊට අනුකූල වන පරිදි නිලධාරීන්ගේ අමතර රාජකාරී දීමනා ගෙවීම් කිරීම	සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ පැමිණීම, පිටවීම හා රාජකාරි වේලාවන් ඇතුලත බැහැර යාම සම්බන්ධයෙන් ක්‍රියාත්මක අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම" මැයෙන් අංක CA/GCR/Audit/06/2021 හා 2024.06.28 දිනැති	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	ලේකම්වරයා විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිකුත් කර තිබුණු ලිපිය ප්‍රකාරව,සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කළ හැකි පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍ර 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක නොකරන්නේ නම් වර්තමාන වැටුපට අනුව අතිකාල දීමනා නොගෙවීමට වග බලා ගත යුතු විය.නමුත් අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශයට, එයට අයත් රෝහල් හා ආයතන සඳහා රු.මිලියන 31.08 ක් වැය කර ස්ථාපිත කර තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර 213 ක් භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවති අතර වර්තමාන වැටුප පදනම් කර ගෙන 2023 වර්ෂයේදීද වැටුප් සඳහා රු.මිලියන 44,590.70 ක් ද අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා රු.මිලියන 38,236.83 ක්ද වශයෙන් මුළු මුදල රු.මිලියන 82,827.53 ක් ගෙවා තිබුණි. එසේම අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් වැය කර තිබුණු මුළු මුදල වැටුප් පිරිවැයෙන් සියයට 72 ක් පමණ වී තිබුණි.		සම්බන්ධයෙන් අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වා ගෙන යාමටත් කටයුතු කළ යුතුය.	අභ්‍යන්තර සටහන මඟින් සියළුම අංශ ප්‍රධානීන් දැණුවත් කර තිබුණි.	
33	ඩෙංගු මර්දන කටයුතු වෙනුවෙන් 2017 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම යටතේ අවිධිමත් ලෙස බඳවාගෙන තිබුණු ක්ෂේත්‍ර මදුරු මර්දන සහායකයින් 1,103 දෙනෙක් පමණ සේවයේ යොදවා තිබුණද	2022,2023	කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු	එක් එක් ආයතනයන්හි පවතින පුරප්පාඩු හා අතිරික්තයන් පිළිබඳව අවශ්‍ය කටුයුතු සිදු කරන ලෙස අදාළ අංශ ප්‍රධානීන් හා	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

කාර්යමණ්ඩල තොරතුරු වලට ඇතුළත් කර තිබුණේ තනතුරු 5 ක් පමණක් විය. මාසිකව රු.27,000 ක පමණ දීමනාවක් යටතේ සේවයේ යොදවා ඇති මෙම තනතුරු සංඛ්‍යාව සඳහා විධිමත් අනුමැතියක් 2024 මාර්තු දක්වා ලැබී නොතිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව තනතුරු 49 කට අදාළව නිලධාරීන් 14,307 ක ඌනතාවයන් පැවතියදී නිලධාරීන් 2,942 ක් අතිරික්තව සේවයේ යොදවා තිබුණි. අතිරික්ත හා ඌනතාවයන් පැවති තනතුරුවලට අමතරව තවත් තනතුරු 201 කට අදාළව නිලධාරීන් 2,932 ක කාර්යමණ්ඩල ඌනතාවයන් පැවතුණි. එසේම අතිරික්ත හා ඌනතාවයන් පැවති තනතුරුවලට අමතරව තවත් තනතුරු 26 කට අදාළව නිලධාරීන් 283 ක කාර්යමණ්ඩල අතිරික්තයක් පැවතුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2017 නොවැම්බර් 07 දින අමාත්‍යාංශයට අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) නමින් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ එක් තනතුරක් සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එහෙත් එම තනතුර පිරවීමට කටයුතු කර නොතිබුණි.	කළ යුතු අතර ඒ ඒ රෝහල් හා ආයතනවලට අනුමත කාර්යමණ්ඩලය නොඉක්මවා නිලධාරීන් හා සේවකයින් අනුයුක්ත කළ යුතුය.	ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇති බව.

34	කළුතර ශික්ෂණ රෝහලේ ශල්‍යාගාරයකින් සමන්විත අක්ෂි වාට්ටු ගොඩනැගිල්ල ඉදිකිරීමේ I වන අදියරය රු.මිලියන 44.01 ක් වූ කළ වැඩ වටිනාකමක් සහිතව 2016 දෙසැම්බර් 03 දින වැඩ අවසන් කර තිබුණු අතර එහි II වන අදියරය කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන158.71 ක් සහිතව දින 455 ක් ඇතුළත වැඩ නිම කිරීමේ කොන්දේසිය මත 2017 ජුනි 01 දින කොන්ත්‍රාත්කරුවෙකු වෙත පිරිනමා 2017 ජූලි 21 දින වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස බදු සහිතව රු.මිලියන 34.29 ක් ගෙවා තිබුණි. 2018 අගෝස්තු 30 දින සිට කොන්ත්‍රාත්කරු වැඩබිම අතහැර දමා තිබුණු අතර ඒ හේතුවෙන් 2018 දෙසැම්බර් 13 දින අමාත්‍යාංශය විසින් කොන්ත්‍රාත්තුව අවසන් කර (Terminate) තිබුණි. 2018 අගෝස්තු 30 දිනට ආවරණය කර නොගත් අත්තිකාරම් මුදල රු.මිලියන 26.67 ක් වූ අතර එය අයකර ගැනීම සඳහා රු.මිලියන 29.82 ක් වූ අත්තිකාරම් ඇපකරය මුදල් කර ගැනීමට 2022 පෙබරවාරි 07 දින වන විටත් අපොහොසත්වී තිබුණි. අමාත්‍යාංශය විසින් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එරෙහිව කොන්ත්‍රාත්කරු බස්නාහිර පළාත්බද වාණිජ	2021	අත්තිකාරම් ඇපකරය මුදල් කිරීමට කටයුතු කළ යුතු අතර ගොඩනැගිල්ල සඳහා මේ වන විට වැයකර ඇති මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්නොකිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	ගොඩනැගිල්ල සඳහා යොදා ගන්නා ලද වානේ කම්බි ආරක්ෂා කිරිමට ක්‍රමවේදයක් යෙදීම සඳහා කළුතර රෝහල වෙත ලබා දෙන ලද ප්‍රතිපාදනයෙන් අදාළ කටයුතු අවසන් කර මේ වන විට අවසන් බිල්පත් ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇති බව.	අත්තිකාරම් ඇපකරය මුදල් කිරීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

මහාධිකරණයේ නඩුවක් පවරා තිබුණු අතර 2019 නොවැම්බර් 05 දින නීතිපති දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන නීති සහ ක්‍රියා පටිපාටියට අනුකූලව නව කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ඉතිරි ඉදිකිරීම් නිම කිරීමේ හැකියාවක් පවතින බව දන්වා තිබුණි. නමුත් 2022 පෙබරවාරි 07 දින වන විටත් නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ ප්‍රකාරව කටයුතු කිරීමට අපොහොසත්වී තිබුණු අතර කොන්ත්‍රාත්කරු සමඟ මිනුම් ලබාගෙන අවසන් බිල්පත සකස් කිරීමටද කටයුතු කර නොතිබුණි. අදියර I යටතේ රු.මිලියන 44.01 ක් වූ ඉදිකිරීම් සහ අදියර II යටතේ රු.මිලියන 21.29 ක් වූ ඉදිකිරීම් සමඟ වැඩබිම අතහැර දැමීම හේතුවෙන් ගොඩනැගිල්ලේ දෙවන හා තෙවන මහල්වල කොන්ක්‍රීට් බීම්වල හා ස්ලැබ්වලට යොදා තිබුණු යකඩ කම්බි මල බැදී විනාශවී තිබුණු අතර වැසි ජලය කාන්දුවීම සහ විවිධ සතුන් ඇතුළුවීම හේතුවෙන් ගොඩනැගිල්ල විනාශ වෙමින් පැවතුණි. 2016 දෙසැම්බර් 03 දින වැඩ අවසන් කර තිබුණු බිම් මහල අළුත්වැඩියාවකින් පසුව පාවිච්චියට ගත හැකිව පැවති නමුත්, 2022 පෙබරවාරි 07 දින වන විටත් ඒ පිළිබඳව අවධානය

	යොමුකර නොතිබුණි. නිවැරදි නොවන වැය විෂයයක් යටතේ මෙම ඉදිකිරීමට අදාළ මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හේතුවෙන් ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකර තිබුණු රු.මිලියන 91.36 ක් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.				
35	අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 610.93 ක්වූ ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක වැඩ 2020 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණු අතර අමාත්‍යාංශය යටතේ ඇති රෝහල් හා ආයතන 08 ක ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 3,080.33 ක්වූ ව්‍යාපෘති 09 ක් වර්ෂ 01 සිට වර්ෂ 15 දක්වා කාලයක සිට ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් පැවතුණි.	2021	මෙම ව්‍යාපෘතිවලට සම්බන්ධ සියලු වගකිව යුතු පාර්ශවයන් සාමූහිකව කටයුතු කරමින් ව්‍යාපෘතිවල කටයුතු අවසන් කිරීමට විධිමත් පියවර ගත යුතුය	මේ වන විට මීට අදාළ සියළු ව්‍යාපෘතීන් හඳුනාගෙන ඇති අතර ව්‍යාපෘතීන් නැවත ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතින අතර ඉදිරි අයවැය යෝජනා සඳහා ද ඇතුළත් කිරිමට සැලසුම් කර ඇති බව.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.
36	හොරණ මූලික රෝහලේ සයමහල් ශල්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යය වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් **2015** සැප්තැම්බර් **16** දින ලබාදී තිබුණු රු.මිලියන **1,333.04** ක මූලික ඇස්තමේන්තුව පදනම් කරගෙන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ	2021	මෙම ව්‍යාපෘතිවලට සම්බන්ධ සියලු වගකිව යුතු පාර්ශවයන් සාමූහිකව කටයුතු කරමින් ව්‍යාපෘතිවල කටයුතු අවසන් කිරීමට විධිමත් පියවර ගත යුතුය.	අදාළ අත්තිකාරම් මුදල ආපසු ගෙවීමට කටයුතු කරන ලෙස ආයතනය වෙත දන්වා ඇති බව, ගෙවිමට ඇති වෙනත් වැඩ විෂයයන්ගේ බිල්පත් වලින් අයකර ගැනීම සඳහා භාණ්ඩාගාර උපදෙස් ලබා අවශ්‍ය අයකිරීම් කටයුතු සිදු කරමින් පවතින බව.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.

අනුමැතියට යටත්ව පිරිමැවුම් කර ඉදිකිරීමේ පදනම මත රු.මිලියන **1,333.04** ක බදු සහිත කොන්ත්‍රාත් වටිනාකමකට මාස **24** ක් ඇතුළත වැඩ නිම කිරීමේ කොන්දේසියට යටත්ව **2017** නොවැම්බර් **27** දින ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත එම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපිය අනුව දින **14** ක් ඇතුළත වැඩ ආරම්භ කළ යුතු වුවද**,** ඉදිකිරීම් භූමියේ පැවති ගැටළු හේතුවෙන් වැඩ ආරම්භ කිරීමට හැකියාවක් නොමැති බව දැන දැනම ඒ බව නොසලකා **2017** දෙසැම්බර් **15** දින වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස බදු සහිතව රු.මිලියන **221.14** ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **8:9:1** මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීද නොතිබුණි. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවූ දින සිට මාස **06** කට පසුව වැඩ ආරම්භකර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සඳහා **2019** වර්ෂයේදී රු.මිලියන **19,065** ක ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසුව **2022** වර්ෂය දක්වා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කර නොතිබුණි. ඉදිකිරීම්වල

	සතුටුදායක ප්‍රගතියක් පවත්වාගෙන නොයාම හේතුවෙන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් රු.මිලියන **4.82** ක් පමණක් ආවරණය කර ගැනීමට හැකිවී තිබුණු අතර **2022** ජනවාරි **25** දින වන විටත් වැඩ නිමකර නොතිබුණි.				
37	කළුතර ශික්ෂණ රෝහලේ කැතීට රසායනගාරය සඳහා වායු සමීකරණ පද්ධතියක් හා වෛද්‍ය ගෑස් පද්ධතියක් සපයා සවිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුව, දින 63 ක් තුළ වැඩ නිම කිරීමේ පදනම මත රු.මිලියන 5.11 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව 2020 සැප්තැම්බර් 16 දින කොන්ත්‍රාත්කරුවෙකු වෙත පිරිනමා තිබුණි. පිරිවැය රු.මිලියන 3.02 ක්වූ වැඩ විෂයයන් 04 කට අදාළ මිල විශ්ලේෂණයන් හා එම වැඩ විෂයයන් 04 ට අදාළ තාක්ෂණික පිරිවිතර තහවුරු කිරීම සඳහා සැසඳුම් වාර්තාවක් විගණනය සඳහා ඉදිරිපත් නොකළ හෙයින් එම වැඩ විෂයයන් 04 ට අදාළ ඇස්තමේන්තුගත ඒකක මිල පිළිබඳව හෝ ඉදිකිරීම්වල නිවැරදිතාවය පිළිබඳව හෝ තහවුරු කර ගත නොහැකි විය. එම වැඩ විෂයයන් 04 යටතේ වූ තාක්ෂණික පිරිවිතරයන්ට අනුව සවිකිරීමට එකඟවී තිබුණු වර්ගවලට වඩා	2021	මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	අංක MH/FS/PI/26/2022 /A-188/390 යටතේ මූලික විමර්ශනය සිදු කර ඒ අනුව අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් නිදහසට කරුණු විමසා උපදෙස් දී ගොණුව නිමකර ඇති බව.	වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

	වෙනස් වර්ගවල උපාංග රෝහලේ එකඟතාවයකින් හෝ අනුමැතියකින් තොරව සපයා සවිකර තිබුණි.				
38	කළුතර ශික්ෂණ රෝහලේ ඇන්ජියෝග්‍රෑම් (Angiogram) කාමරය කැතීට රසායනගාරයක් බවට නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව, දින 63 ක් තුළ වැඩ නිම කිරීමේ පදනම මත රු.7,897,480 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව 2020 අගෝස්තු 24 දින කොන්ත්‍රාත්කරුවෙකු වෙත පිරිනමා තිබුණි. 2017 මැයි 25 දින නිමකර තිබුණු නව සායනික ගොඩනැගිල්ලේ හතරවන මහලේ රු.මිලියන 2.21 ක් වැය කර සවිකර තිබුණු ඊයම් තහඩු සහිත දොරවල් 02 ක් හා ජනේල 02 ක් ගලවා ඉවත්කර රෝහල් භූමියෙන් ඉවතට රැගෙන යාම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුවේ සෘණ අගයක් ලෙස රු.400,000 ක් ඇතුළත් කර තිබුණු නමුත් ඊට අදාළ මිල විශ්ලේෂණය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. එසේම එම දොරවල් හා ජනෙල් ගලවා ඉවත් කිරීමට ඇස්තමේන්තු පිළියෙල කළේ කුමන පරමාර්ථයකින්ද යන බව තහවුරු නොකෙරුණි. මෙම වැඩ විෂයය සඳහා සෘණ රු.400,000 ක් පිරිවැය ඇස්තමේන්තුවට	2021	මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	-එම-	වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

ඇතුළත් කර තිබුණු නමුත් ලංසු ලියවිලිවල එම මිල සෘණ අගයක් වන බවට හෝ එම මුදල කළ වැඩ වෙනුවෙන් ගෙවීම් කිරීමේදී අඩුකරන බවට හෝ තොරතුරු ඇතුළත් කර නොතිබුණි. 2020 දෙසැම්බර් 23 දින වන විට රු.මිලියන 8.67 ක් වූ කළ වැඩ වටිනාකමක් සහිතව වැඩ අවසන් කර තිබීම මත 2021 මැයි 30 දින ඉන් රු.මිලියන 4 ක් වූ කොටස් ගෙවීමක් සිදුකර තිබුණි. නමුත් අවසන් බිල්පත නිරවුල් කිරීම සම්බන්ධව පැණ නැඟුණු ගැටළු සහගත තත්ත්වය පිළිබඳ උපදෙස් ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත යොමුකර තිබුණු නමුත් ඒ පිළිබඳව නිසි අවධානයකින් කටයුතු කර නිවැරදි උපදෙස් ලබාදී නොතිබුණි. ඒ වෙනුවට අමාත්‍යාංශයේ පරිපාලන නිලධාරි (ගොඩනැගිලි) විසින් කොන්ත්‍රාත්කරු වෙත රු.5,000 ක් ගෙවා ඊයම් තහඩු සහිත දොරවල් 02 ක හා ජනේල 02 කොන්ත්‍රාත්කරුට රැගෙන යාම නිර්දේශ කර තිබුණි. මේ අනුව නිලධාරීන් හිතාමතා හෝ නොසැලකිල්ල හෝ හේතුවෙන් 2017 වර්ෂයේදී සවිකර තිබුණු නමුත් භාවිතයට ගෙන නොතිබුණු පිරිවැය රු.2,214,000 ක් වූ දොරවල් 02 ක් හා ජනේල 02 ක් ගලවා ඉවත් කර රැගෙන යාමට රු.5,000 ක්

	කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට කටයුතු කර තිබුණි. එසේම පිරිවැය ඇස්තමේන්තුව තුළ ඇතුළත් රු.1,350,000 ක් වූ වැඩ විෂයයන් දෙකකට අදාළ මිල විශ්ලේෂණ විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.				
39	ද සොයිසා කාන්තා රෝහලේ බිළිඳු මළ සිරුරු, ගබ්සා කොටස්, අජීවී ශරීර අවයව හා වැදෑමහ වැනි මෘත ශරීර කොටස් ඉවත් කර වළ දැමීම සඳහා 2019 දෙසැම්බර් මාසයේ සිට 2021 ඔක්තෝබර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 2.24 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණි. බැහැර කිරීම් ඒකකයක මූලික පිරිවැය ඇස්තුමේන්තුවක් සකස් කර නොතිබීම, කොන්ත්‍රාත්කරුවන්ගේ තාරාදියක් යොදා ගැනීමට ඉඩ හැරීම, එම තරාදි යාවත්කාලීනව ක්‍රමාංකනය කර ඇති බව තහවුරු කර නොගැනීම, ජලය ඉවත් කර වැදෑමහ බර මිනුම් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා නොදීම, බැහැර කිරීම් සඳහා වැඩි බර ප්‍රමාණයක් යෙදීමට ඉඩහැරීම හා නීත්‍යානුකූලව මෙම බැහැර කිරීම් සිදුකරන බව තහවුරු කර නොගැනීම වැනි කරුණු හේතුවෙන් මෘත ශරීර කොටස් බැහැර කිරීම සම්බන්ධයෙන් රෝහල් අභ්‍යන්තර පාලනය සහ	2021	මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	අංක MH/FS/PI/11/2022 /A-193/395 යටතේ මූලික විමර්ශනය සිදු කර ඇති බව, නිළධාරීන්ගෙන් නිදහසට කරුණු විමසා තදින් අවවාද කර ගොනුව නිමකර තිබුණු අතර, 2019.11.29 දින සිට 2021.12.30 දක්වා කාල වකවානුව තුළ කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබූ රු. 1,020,970 මුදල අය කර ගැනීමට කටයුතු කර ඇති බව.	වැඩිපුර ගෙවන ලද මුදල අයකර ගැනීමට අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතුණු බව නිරීක්ෂණය විය. වැදෑමහ කිලෝග්‍රෑම් 01ක්, බිළිඳු මළ සිරුරක්, ගබ්සා කොටස් කිලෝග්‍රෑම් 01 ක් සහ ශරීර අවයව කිලෝග්‍රෑම් 01 ක් බැහැර කිරීම සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබීම හේතුවෙන් කිසිදු සැසඳීමකින් තොරව 2020 වර්ෂයේ ඒකක මිල ගණන් වලට සාපේක්ෂව 2021 වර්ෂයේදී එම ද්‍රව්‍ය ඒකකයක් වෙනුවෙන් සියයට 521 සිට සියයට 6371 ක් දක්වා වූ අවාසිදායක මිල විචලනයන් සහිතව කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කර තිබුණු ඒකක මිල ගණන් මත පදනම්ව රෝහල විසින් ගෙවීම් කර තිබුණි. ඒ හේතුවෙන් 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ අජීවී ශරීර කොටස් බැහැර කිරීමේ වියදම සියයට 8070 කින් සහ ගබ්සා කොටස් බැහැර කිරීමේ වියදම සියයට 696 කින් ඉහල ගොස් තිබුණි. 2021 දෙසැම්බර් 21 දින සිට 2022 ජනවාරි 25 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී රෝහල තුළ සිදුකර තිබුණු දරු ප්‍රසූත 553 කින් ඉවත් කර තිබුණු වැදෑමහවල බර කිලෝග්‍රෑම් 550 ක් සහිත බඳුන් බහා තිබුණු ශීතකරණයේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් එම බඳුන්වල ජලය එකතුවී තිබුණු බව 2022 ජනවාරි 26 දින

	සිදුකර තිබුණු භෞතික විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. ඒ අනුව ජලය සමඟ වැදැමහ ඒකකයක සාමාන්‍ය බර ග්‍රෑම් 995 ක් විය. එසේම 2022 පෙබරවාරි 02 හා 03 යන දිනවලදී සිදුකර තිබුණු දරු ප්‍රසූති 19 කදී බැහැර කර තිබුණු වැදැමහවල බර ග්‍රෑම් 10,700 ක් වූයෙන් වැදැමහ ඒකකයක සාමාන්‍ය බර ග්‍රෑම් 563 ක් විය. අන්තර්ජාලයෙන් ලබාගන්නා ලද තොරතුරු අනුව දරු ප්‍රසූතියේ දී බැහැර කරන වැදැමහක බර පරාසය ග්‍රෑම් 500 සිට ග්‍රෑම් 800 දක්වා විහිදෙන බවත් එය ශීතකරණයේ ගබඩා කිරීම නිසා එකතුවන ජලය සමඟ වැදැමහක බර කිලෝග්‍රෑම් 01 ක් වන බවත් නිරීක්ෂණය විය. එම නිර්නායකය මත ගණනය කළ විට 2019 නොවැම්බර් 29 දින සිට 2021 ඔක්තොබර් 26 දින දක්වා වූ වර්ෂ 01 මාස 11 ක කාලපරිච්ඡේදය තුළදී වැදෑහම කිලෝග්‍රෑම් 29,616 ක් වෙනුවෙන් රු.මිලියන 1.02 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩියෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.				
40	විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව, 2020 වර්ෂය තුළදී අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු ඉදිකිරීම් ව්‍යාපෘති 62 ක්	2021	කොන්ත්‍රාත්කරු හා උපදේශක යන පාර්ශවයන් එකිනෙකට ස්වාධීන ආයතන විය යුතු	උපදේශන සේවා සඳහා තරඟකාරී මිල ගණන් කැඳවා ඉටු කර ගැනීමට අවශ්‍ය උපදේශකයින් ලියාපදිංචිය සඳහා	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලඟා කරගෙන නොතිබුණි.

අතරින් ඇස්තමේන්තු පිරිවැය රු.31,650,382,750 ක් වූ ව්‍යාපෘති 30 ක කොන්ත්‍රාත්කරු හා උපදේශක (Contractor and Consultant/Engineer) යන තනතුරු දෙකම එකම ආයතනයක් වෙත පවරා තිබුණු බවත්, ඒ හේතුවෙන් ව්‍යාපෘතියක් වඩා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකර ගැනීම කෙරෙහි මෙන්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සාධාරණත්වය, ස්වාධීනත්වය හා විනිවිදභාවය ආරක්ෂා කිරීම කෙරෙහිද බලපෑම් සිදුවිය හැකි බවත් නිරීක්ෂණය විය. 1991 වර්ෂයේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ අත්සන් කර තිබුණු ගිවිසුමකට අනුව 2021 වර්ෂය දක්වා උපදේශන කාර්යයන් තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව එම කාර්යාංශය වෙත පවරා තිබුණු අතර 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 62 ක අතරින් ව්‍යාපෘති 52 ක උපදේශන සේවා සැපයීම එම කාර්යාංශය වෙත පවරා තිබුණි. ඒ අනුවද තරඟකාරීත්වය තුළින් ලබා ගත හැකිව තිබුණු ආර්ථික වාසි අහිමිවී තිබුණි. සමහර අවස්ථාවලදී පමණක් උපදේශන සේවාව සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හා රාජ්‍ය සංවර්ධන හා	අතර රජයට අවම පිරිවැයක් දැරීමට සිදුවන පරිදි හා වඩාත් ගුණාත්මක සේවාවක් ලබා ගත හැකි පරිදි මෙම ආයතන තොරාගත යුතුය.	ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති බව.

	නිර්මාණ නිතිගත සංස්ථාව තෝරාගෙන තිබුණු බැවින් උපදේශන සේවා ලබාගැනීම පිළිබඳ ස්ථිර හා විධිමත් ප්‍රතිපත්තියක් අමාත්‍යාංශය විසින් අනුගමනය කර නොතිබුණු බවද නිරීක්ෂණය විය.				
41	රාජ්‍ය ආයතනයක් වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ (CECB) උපදේශකත්වය යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) විසින් ඉදිකරනු ලබන රු. මිලියන 583.78 ක ඇස්තමේන්තුගත වටිනාකමකින් යුත් හලාවත දිස්ත්‍රික් මහ රෝහලෙහි වෛද්‍ය වාට්ටු සංකීර්ණ ගොඩනැගිල්ලෙහි 2022 සැප්තැම්බර් 23 විගණිත දිනය වන විට ව්‍යුහාත්මක ඉදිකිරීම් සිදුකරමින් පැවතුණි. 2018 පෙබරවාරි 19 දින ආරම්භ කර තිබුණු මෙම ව්‍යාපෘතියේ දින 735 ක ගිවිසුම් කාලය විගණිත දිනය වන විට දින 937 ක් පමණ ගතවී තිබුණි.	2022	සැලසුම් කළ පරිදි නියමිත කාලය තුළ නිමකිරීමට කටයුතු කළ යුතුය.	හලාවත දිස්ත්‍රික් මහ රෝහලේ වෛද්‍ය වාට්ටු සංකීර්ණ ගොඩනැගිල්ල මහාචාර්යය ඒකකයක් ලෙස නිම කිරිමට ලයිසියම් ආයතනය සමග සාකච්ජා කරන බැවින් ඉදිකිරිම් තාවකාලිකව නවතා ඇත.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.
42	නව පිළිකා ඒකකයේ පිරිවැය රු. මිලියන 364.09 ක් වූ Elekta Synergy Platform LINAC යන්ත්‍රයක් සවිකර ඉන් සියයට 80 ක මුදලක් එනම් රු.මිලියන 293.37 ක් 2019 ජූනි 28 හා 2019 ඔක්තෝබර් 25 දින ගෙවා තිබුණි. එමඟින් අතුරු ආබාධ අවම කරමින්	2022	මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	01. Elekta Synergy Platform LINAC යන්ත්‍රයෙන් 2024 සැප්තැම්බර් 02 සිට සැප්තැම්බර් 30 දක්වා ප්‍රතිකාර	02. විගණන නිර්දේශය පරිදි මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

පිළිකා ප්‍රදේශයේ හා එහි සීමාව නිවැරදිව හඳුනාගෙන විකිරණය ඉතා නිවැරදිව පිළිකාව වෙත පමණක් යොමු කිරීමේ හැකියාව පැවති අතර මෙම යන්ත්‍රය උපයෝගී කරගෙන 2021 නොවැම්බර් 11 දින සිට 2022 නොවැම්බර් 14 දින දක්වා රෝගීන් 771 දෙනෙකු වෙත ප්‍රතිකාර කර තිබුණි. තවද මෙම යන්ත්‍රය මඟින් දිනකට රෝගීන් 50ත් 60 ත් අතර ප්‍රමාණයකට ප්‍රතිකාර කිරීමේ හැකියාව පැවතුණි. එසේ වුවද, යන්ත්‍රය සවිකර ඇති බංකරය තුළ ඇති ඉහත ඡේදයේ සඳහන් මධ්‍යගත වායු සමීකරණ පද්ධතියේ කම්ප්‍රෙෂර් යන්ත්‍රය අක්‍රියවීම හේතුවෙන් මෙම යන්ත්‍රය 2022 නොවැම්බර් 14 දින සිට රෝගී සත්කාර කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. පිරිවැය රු. මිලියන 233.55 ක් වූ Elekta Compact LINAC යන්ත්‍රයක් 2021 අප්‍රේල් 06 දින නව පිළිකා ඒකකයේ ස්ථාපිත කර තිබුණ අතර එදින සිට 2022 මාර්තු 20 දින දක්වා එනම් මාස 23 ක කාලයක් නිෂ්කාර්යව පැවති බවත් ඒ හේතුවෙන් එම යන්ත්‍රයේ වගකීම් කාලය ද යන්ත්‍රය නිෂ්කාර්යව තිබියදී අවසන් වීමේ අවදානමක් පැවති බවත් නිරීක්ෂණය විය.	1370 ක් සිදුකර ඇති බව.

43	2019 ප්‍රසම්පාදන සැලැස්මට අනුව වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවේ තීරණය පරිදි හම්බන්තොට හා මහරගම අපේක්ෂා යන ශික්ෂණ රෝහල් දෙක වෙනුවෙන් Digital fluoroscopy යන්ත්‍ර දෙකක් මිලට ගැනීම සඳහා ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය මඟින් 2019 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි. උපකරණ පිරිවැය රු.මිලියන 172.40 ක් හා ස්ථාපිත කිරීමේ හා කාමර වැඩිදියුණු කිරීමේ පිරිවැය රු.මිලියන 4 ක් වූ මෙම උපකරණ වසර 2 ක වගකීම් කාලයකට යටත්ව 2020 ඔක්තෝබර් 16 දින ඇණවුම් කර තිබුණි. ඇණවුම් කොන්දේසිවලට අනුව උපකරණ 2020 දෙසැම්බර් 25 දිනට පෙර සැපයිය යුතු වුවත් මෙම උපකරණ ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකයේ ප්‍රධාන ගබඩාව වෙත භාර දී තිබුණේ 2021 පෙබරවාරි 12 දිනදීය. හම්බන්තොට ශික්ෂණ රෝහලෙහි සවිකිරීමට සැලසුම් කර තිබුණු යන්ත්‍රය කරාපිටිය ශික්ෂණ රෝහලෙහි සවිකර තිබුණු අතර මහරගම රෝහලේ යන්ත්‍රය ස්ථානගත කිරීමේ ස්ථානයෙහි ඉදිකිරීම් 2023 මාර්තු 31 දින වන විටත් අවසන් කර නොතිබුණු අතර මෙම උපකරණයේ වගකීම් කාලය 2023 පෙබරවාරි 13 දින අවසන්වී	2022	මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	අදාළ යන්ත්‍රය යථාතත්වයට පත්කර රෝගී ප්‍රතිකාර සඳහා භාවිතා කරනු ලබන බව.	විගණන නිර්දේශය පරිදි මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

	තිබුණි.				
44	2019 වර්ෂයේදී කල්මුණේ අෂ්රෆ් අනුස්මරණ රෝහලට ලබා දී තිබුණු හෙක්ටයාර් 1.4309ක වපසරියකින් යුත් ඉරවිලික්කන්ඩම් (Iravelikkandam) ඉඩම වටා තාප්පයක් ඉදිකිරීම අදියර 3ක් යටතේ රු. මිලියන 27.84 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවකට 2021 වර්ෂය තුළ සිදුකර තිබුණි. මෙම ප්‍රසම්පාදනයේ අදියර තුනටම අදාළව පිළියෙල කරන ලද ව්‍යුහාත්මක සැලසුම් (Structural Plans), ඇස්තමේන්තුගත වැඩ ප්‍රමාණයන් ගණනය කළ ආකාරය තහවුරු කෙරෙන මිනුම් වාර්තා (Taking off sheets) සහ වැඩ බිම් ලොග් සටහන් පොත් 2022 නොවැම්බර් 29 දින විගණන අවස්ථාව දක්වා උපදේශන සේවා සපයන ආයතනය විසින් රෝහල වෙත ලබා දී නොතිබුණු අතර එම ලේඛන ලබා ගැනීමකින් තොරව රෝහල විසින් එම ආයතනය වෙත ගෙවීම් කර තිබුණි. තෙවැනි අදියරට අදාළ වැඩ විෂය A-01 යටතේ යටතේ බොරළු හෝ අනුමත ගුණත්වයෙන් යුත් පිරවුම් මාධ්‍යයක් යොදා මායිම් තාප්පයේ අත්තිවාරම දෙපස අඟල් තුනක තට්ටු වශයෙන් යෙදීම සඳහා ඇස්තමේන්තු කළ බොරළු ප්‍රමාණය මීටර්	2022	විධිමත් පරීක්ෂාවක් සිදුකර පිළිතුරෙහි වූ කරුණු තහවුරු කර විගණනයට ඉදිරිපත් කළයුතු අතර තහවුරු කළ නොහැකි කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර විගණනය විසින් යෝජනා කළ භෞතික පරීක්ෂණය මඟින් මිනුම්වල නිවැරදිතාවය තහවුරු කළ යුතුය.	කලපුවට ආසන්නව පිහිටා ඇති මෙම ඉඩම පහත් මට්ටමක පවතින බැවින් ඉතා කුඩා වර්ෂාපතනයකදී පවා එය ගංවතුරට ලක් වේ. කෙසේ වෙතත්, වැඩ බිම විගණන පරීක්ෂණයට සූදානම් වූ වහාම විගණන පරීක්ෂාව සඳහා දින දැනුම් දීමට අපේක්ෂා කරන බව.	2024 ඔක්තෝබර් දක්වා මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

කියුබ් 575ක් වුවත් කොන්ත්‍රාත්කරු විසින් බොරළු මීටර් කියුබ් 2235.86 ක් එනම් ඇස්තමේන්තු කළ අවශ්‍යතාවය ඉක්මවා සියයට 289 ක බොරළු යෙදූ බවට රු. මිලියන 4.88 ක මුදලක් විධිමත් පරිදි කළ වැඩ ප්‍රමාණය නිශ්චිතව තහවුරු කර ගැනීමකින් තොරව, සාවද්‍ය සමෝච්ච රේඛා සිතියමක් (Contour Plan) මත පදනම්ව හා යොදන ලද පිරවුම් මාධ්‍යයේ ගුණත්වය හා සුසංහසනය පිළිබඳ රසායනාගාරපරීක්ෂණ වාර්තා රහිතව ගෙවා තිබුණි. මෙම වැඩ විෂයය සඳහා වූ මිනුම්වල නිවැරදිතාවය භෞතික පරීක්ෂණයක් මඟින් විගණනයට තහවුරු කරන ලෙස ඉල්ලීම් කළද 2023 ජූලි 17 දින දක්වා එම භෞතික පරීක්ෂණය සංවිධානය නොකරන ලදි. එසේම අදියරයන් තුනම වෙනුවෙන් කොන්ක්‍රිට් බීම් සහ කොන්ක්‍රීට් කණු සඳහා භාවිතා කරන ලද කොන්ක්‍රීට් වෙනුවෙන් රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීමකින් තොරව රු. මිලියන 1.06 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණු අතර 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතේ 20 (1) වගන්තිය ප්‍රකාරව විධිමත් බදු ඉන්වොයිස් පතක් ලබා ගැනීමකින්

	තොරව රු.748,649 ක එකතු කළ අගය මත බදු මුදලක් කොන්ත්‍රාත්කරු වෙත හා උපදේශක ආයතනය වෙත ගෙවා තිබුණි.				
45	කොළඹ ජාතික රෝහලේ බාහිර රෝගී අංශයේ රසායනාගාරය සඳහා Fully Automated Biochemistry Analyzer උපකරණයක් මිලදී ගැනීම වෙනුවෙන් 2019 අගෝස්තු 30 දින ජාතික තරඟකාරී ලංසු කැඳවීම් ක්‍රමය අනුගමනය කරමින් මිල ගණන් කැඳවා 2021 මැයි මාසයේදී රු.මිලියන 7.50 ක් වටිනා මෙම උපකරණය මිලදී ගෙන තිබුණිද එවකට බාහිර රෝගී රසායනාගාරය සතුව පැවති උපකරණය භාවිතයෙන් සිදුකළ සාමාන්‍ය දෛනික පරීක්ෂණ ධාරිතාවය වූ පරීක්ෂණ 614 ඉක්මවා අවම වශයෙන් දෛනිකව පරීක්ෂණ 4,000 ක පමණ ප්‍රමාණයක් සිදුකළ හැකි මෙම උපකරණය මිලදී ගැනීමේ අවශ්‍යතාවය හඳුනාගෙන නොතිබුණු බවත්, මෙම ප්‍රසම්පාදනයට අදාළව රෝහල විසින් සකස් කර තිබුණු තාක්ෂණික පිරිවිතර ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයට යොමුකර අනුමත කරවා ගෙනද නොතිබුණු අතර මෙවැනි උපකරණ මිලදී ගැනීමේදී ඇතුළත් කළ යුතුවන තීරණාත්මක නිර්ණායකයන් 02 ක් එයට	2022	උපකරණ මිලදී ගැනීමේ දී එහි අවශ්‍යතාවය නිවැරදිව ඇගයීම් කළ යුතු අතර එය විධිමත් පරිදි ලේඛන ගත කළ යුතුය. සම්මත තාක්ෂණික පිරිවිතර ඇත්නම් එම අනුමත පිරිවිතර භාවිතා කළ යුතු බවටත් සම්මත තාක්ෂණික පිරිවිතරයන් නොමැති විටෙක සකස් කරන ලද තාක්ෂණික පිරිවිතර ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයට යොමුකර අනුමත කරවා ගත යුතු බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් චක්‍රලේඛයක් මඟින් අනිවාර්ය කළ යුතුය. රජයේ ප්‍රසම්පාදන	අංක MH/FS/PI/24/2022 /A-190/392 යටතේ මූලික විමර්ශනයක් සිදු කරමින් පවතින බව, එසේම පහත සඳහන් ක්‍රියාමාර්ග මේ වන විට ක්‍රියාත්මක කරනු ලබන බව. • උපකරණවල අවශ්‍යතාවය නිශ්චිත පරිදි දක්වා ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය වෙතින් අනුමැතිය ලබා ගැනීම සිදුවේ. • මේ සඳහා ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයෙන් සකස් කරන ලද සම්මත පිරිවිතර උපයෝගී කරගන්නා අතර තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ ඉංජිනේරුවරයෙකු ඇතුළත් කරන බව. • සියලු ප්‍රසම්පාදනයන්ව ලදී රජයේ	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.

ඇතුළත් කර නොතිබුණු බවත්, තෝරා ගෙන තිබුණු ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු පිරිවිතර අතරින් තීරණාත්මක (CRITICAL) පිරිවිතර 05 ක්, අවශ්‍යතා පිරිවිතරවලට පටහැනි වූ බැවින් එම ලංසුවද ප්‍රතික්ෂේප කළ යුතුව තිබුණු නමුත් ඒ වෙනුවට ඒ පිළිබඳව පැහැදිලි කිරීමකින් තොරවම ප්‍රසම්පාදන කමිටුව විසින් එම ලංසුකරුගෙන් උපකරණය මිලදී ගැනීම සඳහා නිර්දේශය ලබාදී තිබුණු බවත්, පිරිවිතරවල අයිතම අංක 41.4 අනුව Original Equipment Manufacturer (OEM) certificate certifying the equipment is brand new and the date of Manufacturer certified by the manufacturer shall be handed over with the equipment යන පිරිවිතරය ප්‍රධාන නිර්ණායකයක් වුවද ඉහත උපකරණය ලබාදෙන අවස්ථාවේදී මෙම සහතිකය ලබාදී නොතිබීම නිසා මෙම උපකරණය Brand new තත්ත්වයේ උපකරණයක්ද යන්න තහවුරු නොවුණු බවත්, තෙවන පාර්ශවීය ප්‍රතික්‍රියක භාවිතයෙන් සිදුකරන පරීක්ෂණ වර්ග 15 මොනවාද යන්න හඳුනාගෙන එම ප්‍රතික්‍රියක සඳහා විවෘත තරඟකාරී අවම මිලක් ලබාගැනීමට 2022 මාර්තු 31 වන තෙක් රෝහල විසින් කටයුතු කර

මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. අවශ්‍ය නිර්නායක ලංසු ලේඛනවලට ඇතුළත් නොවීම, අවශ්‍යතා පිරිවිතරවලට පටහැනි වීම, සහ Reagent, Consumable හා Calibrator සම්බන්ධයෙන් සියයට 27 ක මිල වැඩිවීම පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව සිය අවධානය යොමු නොකිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදු කර කරුණු තහවුරු කළ යුතුය. තෙවන පාර්ශවීය ප්‍රතික්‍රියක භාවිතයෙන් සිදුකරන පරීක්ෂණ වර්ග 15 මොනවාද යන්න හඳුනාගෙන එම ප්‍රතික්‍රියක සඳහා විවෘත තරඟකාරී අවම මිලක් ලබාගැනීම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කරන ලෙස නිළධාරීන්ට උපදෙස් දී ඇති බව.

- පූර්ව ලංසු රැස්වීම් පැවැත්වීම සිදු කරනු ලබන බව.
- අවශ්‍ය අවස්ථාවලදී තෙවන පාර්ශවීය ප්‍රතික්‍රියක භාවිතයෙන් සිදු කරන ඇතැම් පරීක්ෂණ වර්ග සඳහා විවෘත මිල ගණන් කැඳවීම සිදු කරනු ලබන බව.

	නොතිබුණු බවත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ හා අත්පොතෙහි 2.12, 2.14.1, 4.2.2 සහ 6.3.6 යන විධිවිධානවලට අනුකූලව ප්‍රසම්පාදනය සිදුකර නොතිබුණු බවත්, මෙම වර්ගයේ උපකරණ සඳහා භාවිතා කරන Reagent, Consumable හා Calibrator සම්බන්ධයෙන් මීට වසර 01 මාස 08 කට පෙර එනම් 2017 ජනවාරි 06 දින ඉදිරිපත් කර තිබුණු ඒකකයක මිල ගණන් (වැට් රහිත) හා මෙම උපකරණ සම්බන්ධයෙන් 2019 සැප්තැම්බර් 17 දින ඉදිරිපත් කර තිබුණු ඒකකයක මිල ගණන් (වැට් රහිත) අතර සියයට 27ක මිල වැඩිවීම පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව සිය අවධානය යොමු නොකිරීම නිසා ඉහතින් දැක්වූ උපකරණය සඳහා භාවිතා කරන Reagent, Consumable හා Calibrator වෙනුවෙන් වැඩි වටිනාකමක් සැපයුම්කරු වෙත ගෙවීමේ පරිසරයක් රෝහල විසින් නිර්මාණය කර දී තිබුණු බවත් නිරීක්ෂණය විය.		කඩිනම් කළ යුතුය.		
46	2019 අප්‍රේල් 22 දින විගණකාධිපති තුමා විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාහන කළමනාකරණය පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණයන්	2022	මෙම තොරතුරු කඩිනමින් විගණනයට ඉදිරිපත් කළ යුතුය.	අමාත්‍යාංශය සතු වාහන උපයෝජනය පිළිබඳව වූ තොරතුරු අංක CA/AQ/FCC 05/INFO/2023/38 හා 2024.09.10 දිනැතිව විගණනය	විගණකාධිපති තුමා විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාහන කළමනාකරණය පිළිබඳ විශේෂ විගණන

	සම්බන්ධයෙන් අවශ්‍ය නිවැරදි කිරීම් හා එම විශේෂ විගණන වාර්තාවේ ඇතුළත් නිර්දේශයන් ක්‍රියාත්මක කිරිම සතුටුදායක මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය. අමාත්‍යාංශය සතු වාහන උපයෝජනය පිළිබඳව වූ 2021 හා 2022 වර්ෂ දෙකට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි				වෙත යොමුකර ඇති බව, එසේ ලබා දී ඇති තොරතුරු මඟින් 2021 -2023 වර්ෂවලට අදාල වර්තමාන තත්ත්වය දක්වා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ඉතාමත් දුර්වල තත්ත්වයක පැවතුණි.
47	අමාත්‍යාංශ වාහන කළමනාකරණ පරිගණක දත්ත පද්ධතියට අනුව 2023 මාර්තු 17 දිනට වාහන 1301 ක් පිළිබඳ දත්ත ඇතුළත් කර තිබුණු බව පෙන්නුම් කළද එම වාහන අංක අතර වාහන අංක 04 ක් අවස්ථා 3 බැගින්ද වාහන අංක 98 ක් අවස්ථා 2 බැගින්ද ඊට ඇතුළත් කර තිබුණි.	2022		වාහන කළමනාකරණ පරිගණක දත්ත පද්ධතිය වගකිව යුතු නිලධාරියෙකු භාරයට පත්කර විධිමත්ව පවත්වා ගත යුතුය.	දත්ත ඇතුළත් කිරීමේදී වූ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.
48	අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය විසින් නඩත්තු කරනු ලබන වත්කම් ලේඛන විධිමත් පරිදි වගකිව යුතු නිලධාරියෙකු භාරයේ පවත්වාගෙන ගොස් නොතිබුණි. මෙම වත්කම් ලේඛන දෙකෙහි ඇතුළත් හඳුනාගත හැකි සටහන් අනුව වාහන 1167 ක් නිකුත් කිරීමේදී නිකුත් කිරීමේ නියෝගයක් මත නිකුත් කර නොතිබුණු අතර වාහන 1870 කට අදාළව ලැබීම් නියෝගයක් ලබා ගැනීමට කටයුතු කර	2022		වාහන සම්බන්ධ වත්කම් ලේඛන විධිමත් පරිදි වගකිව යුතු නිලධාරියෙකු භාරයේ පවත්වා ගත යුතු අතර මුදාහැරීම්, පැවරීම් හෝ නිකුත් කිරීම් නිවැරදිව මෙම වත්කම් ලේඛනවල සටහන් කර වගකිව යුතු නිලධාරියෙකු	වත්කම් ලේඛනය ප්‍රධාන කළමනාකරණ සහකාර භාරයට පත්කර ඇති අතර නිකුත් කිරීමේ හා ලැබීම් නියෝග මේ වන විට නිසි පරිදි නිකුත් කරමින් පවතින බව.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.

	නොතිබුණි.		විසින් නම හා අත්සන යොදා ඒ බැව් සහතික යුතුය.		
49	යථෝක්ත විශේෂ විගණන වාර්තාව අනුව අමාත්‍යාංශය සතු වාහන 679 අස්ථාන ගතවී ඇති බව දක්වා තිබුණි. මින් වාහන 240 ක් හඳුනා ගත් බව ප්‍රකාශ කළද එය තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර තවදුරටත් වාහන 439 ක් පිළිබඳව තොරතුරු 2024 ඔක්තෝබර් 15 දින දක්වා සොයා ගැනීමට, උක්ත විශේෂ විගණන වාර්තාව නිකුත් කර වර්ෂ 05 ක් පමණ ගතවී ඇතත් නොහැකි වී තිබුණි.	2022	අස්ථාන ගතවූ වාහන සම්බන්ධව කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය කරමින් භෞතික පරීක්ෂණයක් සිදු කරන ලද බව, තොරතුරු විශ්ලේෂණ කටයුතු සිදු කරමින් පවතින බව.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.
50	විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අමාත්‍යාංශය සහ ආයතන/ රෝහල් හා අංශ 68 ක් සතුව පැවති වාහන 1216 න් වාහන 201 ක් පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය විසින් නඩත්තු කරනු ලබන පරිගණක දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබුණු අතර වාහන 277 ක් පිළිබඳ තොරතුරු වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. විගණනයේදී හඳුනාගත් හා ලැබුණු තොරතුරු අනුව අමාත්‍යාංශයට ලැබුණු/ මිලදීගත් වාහන 2299 ක් සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු විගණනයට	2022	වාහන සම්බන්ධ දත්ත පද්ධතිය හා වත්කම් ලේඛන විධිමත් පරිදි පවත්වා ගත යුතුය.	දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබුණු වාහන 201 න් වාහන 23 ක තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති අතර තවත් වාහන දෙකක් නැවත අදාළ ආයතන වෙත ලබා දී තිබූ බැවින් දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව, ඉතිරි වාහන 176 භාවිත කරනු ලබන ආයතන වෙත, දත්ත පද්ධතිය වෙත තොරතුරු ඇතුළත් කරන ලෙස දන්වා	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.

	ඉදිරිපත් නොවීය. මෙම වාහන 2299 න් වාහන 1540 ක් ප්‍රවාහන අංශය විසින් නඩත්තු කරනු ලබන වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබුණද ඉන් වාහන 35 ක් නිකුත් කළ ස්ථාන මොනවාද යන්න සටහන් කර නොතිබුණි. එසේම වාහන 759 ක් පිළිබඳ තොරතුරු මෙම වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. මීට අමතරව තවත් වාහන 56 ක් පිළිබඳව තොරතුරුද විගණනයට ඉදිරිපත් නොකෙරුණි			යවා තිබුණි. මෙම දත්ත පද්ධතියේ යාවත්කාලීන කිරීම් අදාළ සමාගම විසින් ම සිදු කළ යුතු අතර, මේ වන විට එම සමාගම ඒ සඳහා ප්‍රතිචාර නොදක්වයි. ඒ අනුව, වාහන තොරතුරු රැස් කිරීමට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයීය දත්ත පද්ධතිය භාවිත කරන අතර, ඉන්ධන සඳහා FMIS දත්ත පද්ධතිය භාවිත කරනු ලබන බව.	
51	භාවිතයෙන් ඉවත් කරනු ලබන වාහන කඩිනමින් අපහරණය කිරීමේ ක්‍රමවේදයක් අමාත්‍යාංශය විසින් වර්ෂ ගණනාවක සිට සිදුකර නොතිබුණි. 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද වාහන අපහරණ ක්‍රියාවලිය 2022 අප්‍රේල් 10 දින දක්වා ද අවසන් කර නොතිබුණි. සෞඛ්‍ය අමාත්‍යාංශය සතු වාහනයක් 2022 වර්ෂයේදී වෙන්දේසියේදී විකුණන ලද වාහනක් ලෙසට සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර අයිතිය පවරා ගැනීමට කටයුතු කිරීම පිළිබඳව බස්නාහිර පළාත් මොටර් රථ දෙපාර්තමේන්තුව විසින් 2022 ජනවාරි 28 දින සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත ලිඛිතව දන්වා තිබුණි. නමුත් 2023 අප්‍රෙල් 10 දින	2022	ලියාපදිංචි අයිතිය සෞඛ්‍ය ලේකම් හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් නමින් පවතින අපහරණය කළ යුතු වාහන කඩිනමින් අපහරණය සඳහා කටයුතු කළ යුතුය.	සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් 2024.01.29 දින මුල්ලේරියාව වාහන අංගනයේදී වාහන 40 ක් ද අබිලි වාහන ලෙස 30 ක් ද වශයෙන් සියලු වාහන 70 ක් ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කරන ලද බව,	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණු අතර අපහරණය කළ යුතු තවත් වාහන විශාල ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය විය.

	දක්වා අමාත්‍යාංශය සතු මෙම වාහනය නීත්‍යානුකූලව නැවත ලබා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් වගකිව යුතු නිලධාරීන් විසින් ගෙන නොතිබුණි.				
52	2020 වර්ෂයේදී රු. මිලියන 239.48 ක් වැය කර මිලදීගත් යතුරු පැදි 805 ක් අමාත්‍යාංශයේ වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර මෙම යතුරු පැදි ලබාදුන් පුද්ගලයින් සමඟ ලිඛිත ගිවිසුම් වලට එළඹීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.	2022	කඩිනමින් ලිඛිත ගිවිසුම්වලට එළඹිය යුතුය.	යතුරු පැදි 805 න් 778ක් සම්බන්ධයෙන් මේ වනවිට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සමග ගිවිසුම් ගත වී ඇත. තව දුරටත් ගිවිසුම්ගත වියයුතු යතුරු පැදි 27 ඉතිරිව පවති. මේ සම්බන්ධයෙන් අදාළ ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල වෙත දැනුවත් කර ඇති බව.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.
53	අමාත්‍යාංශ ලේකම් හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් නමින් ලියාපදිංචි කරන ලද යතුරු පැදි 721 ක් පිළිබඳ තොරතුරු අමාත්‍යාංශයේ වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.	2022	මෙම තොරතුරු කඩිනමින් විගණනයට ඉදිරිපත් කළ යුතුය.	ලියාපදිංචි කරන ලද යතුරු පැදි 721 ක් අතරින් යතුරු පැදි 497 ක් මේ වන විටත් වත්කම් ලේඛනයට ඇතුළත් කර ඇති අතර තවත් යතුරු පැදි 105 ක් මේ වන විට වත්කම් ලේඛනයට ඇතුළත් කරමින් පවතින බව, ඉතිරි යතුරු පැදි 119 හි තොරතුරු වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට තරම් ප්‍රමාණවත් නොවන හෙයින් එම තොරතුරු මේ වන	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.

				විට සොයා ගැනීමට කටයුතු කරමින් පවතින බව.	
54	වත්කම් ලේඛනයයේ ඇතුළත් යතුරු පැදි සංඛ්‍යාව 891 ක් වූ අතර මින් යතුරු පැදි 840 නිකුත් කිරීම, නිකුත් කිරීමේ නියෝගයක් මඟින් සිදුකර නොතිබුණි.	2022	මෙම තොරතුරු කඩිනමින් විගණනයට ඉදිරිපත් කළ යුතු අතර අමාත්‍යාංශය සතු යතුරු පැදි සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට පියවර ගත යුතුය.	අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරන බව.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලඟා කරගෙන නොතිබුණි.
55	පේරාදෙණිය ශික්ෂණ රෝහලේ ප්‍රසූතිකාගාරය තුළ 2018 වර්ෂයේ නව ශල්‍ය කාමරයක් ඉදිකර තිබු අතර ඊට අවශ්‍ය භෞතික සම්පත් වන ශල්‍ය ඇඳක්, නිර්වින්දන යන්ත්‍රය, මොනිටර් යන්ත්‍රය යනාදී උපකරණ සපයා තිබුණ ද 2023 ඔක්තෝබර් 22 වන විටද නව ශල්‍යාගාරයේ සැත්කම් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	ව්‍යාපෘති සැලසුම් කිරීමේදි එම ව්‍යාපෘතිය ප්‍රයොජනයට ගැනීමට අවශ්‍ය වන මානව සම්පත් සපුරා ගැනීමේ හැකියාවද සලකා බැලිය යුතුය.	මෙම රෝහලේ ප්‍රසූතිකාගාරය ඉදිකර අවශ්‍ය උපකරණ ලබා දී තිබුනද එම නව ශල්‍යාගාරය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍යම කාර්ය මණ්ඩලයේ හිඟතාවය මත පැරණි ශල්‍යාගාරය තුළදීම ශල්‍යකර්ම ඉටුකිරීම සිදු කළ බව.	මානව හා භෞතික සම්පත් සපයා ගැනීමට කටයුතු කර මෙම ප්‍රසූතිකාගාරය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.
56	ජාතික ECMO මධ්‍යස්ථාන ඒකකය ඉදිකිරීම වෙනුවෙන් කරාපිටිය ශික්ෂණ රෝහල විසින් පුද්ගලික සමාගමක් සමඟ රු.මිලියන 21 ක වටිනාකමකට 2021 දෙසැම්බර් 27 දින ගිවිසුම් ගතවී තිබුණි. රෝහලේ හෘද හා උරස් ශල්‍ය දැඩි සත්කාර	2023	ව්‍යාපෘතිකඩිනමින් අවසන් කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගත යුතුය.	ස්වේච්ඡා ආයතනයක් මගින් ඉදිකිරීම් කරගෙන යනු ලබන බව, ඉදිකිරීම් අවසන් වූ පසු සෞඛ්‍ය සේවා කටයුතු සඳහා යොදා ගනු ලබන බව.	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.

	ඒකකය ආසන්නයේ ඉදිකිරීම් ආරම්භ කර අතරමඟ වැඩ නතර කර තිබුණු මෙම ඉදිකිරීම් වෙනුවෙන් විගණිත දින වන විට කොන්ත්‍රාත්කරුට එකතුව රු. මිලියන 7.32 ක් ගෙවා තිබුණි. මෙම කාර්ය මෙතෙක් අවසන් කර නොතිබුණි.				
57	කරාපිටිය ශික්ෂණ රෝහලේ රක්ත කාන්දු පෙරණ ඒකකය හා වකුගඩු රුධිරවාහිනී බද්ධ කිරීමේ ඒකකය ස්ථාපිත කිරීම වෙනුවෙන් රු.මිලියන 790.08 ක් වටිනා ඇස්තමේන්තුවක් මත මහල් 8කින් සමන්විත ගොඩනැඟිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2014 අගෝස්තු 13 දින වැඩ ආරම්භ කර තිබුණු අතර, 2023 ජුනි 02 විගණිත දින වන විට ඉදිකිරීම් ආරම්භ කර වසර 08 ක් ඉක්ම ගියද, ඇස්තමේන්තු ප්‍රකාරව ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි. එසේම රු.මිලියන 83.57ක්වූ කාණ්ඩ 20 කට අදාළ ශල්‍ය හා වෛද්‍ය උපකරණ අයිතම් 114 ක් 2023 ජුනි 02 විගණිත දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වැඩ අවසන් කිරීමට ප්‍රථම රක්ත කාන්දු පෙරණ ඒකකයට හා වකුගඩු රුධිරවාහිනී බද්ධ කිරීමේ ඒකකයට අවශ්‍ය එකතුව රු.මිලියන 198.86 ක්වූ ශල්‍ය හා වෛද්‍ය උපකරණ	2023	එක් එක් ආයතන විසින් යොමු කරනු ලබන පිළිතුරු ඒ අකාරයෙන්ම විගණනය වෙත ඉදිරිපත් නොකළ යුතු අතර මෙම ව්‍යාපෘතියේ වැඩ කොටස් නිමකර කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	රක්තකාන්දු පෙරන ඒකකය හා වකුගඩු රුධිර වාහිනී බද්ධකිරීමේ ඒකකයේ ඉදිකිරීම් සියයට 99 ක් අවසන් කර ඇති බව, දැනට පවරා ගැනීමට නියමිත එම ඒකකයේ ශල්‍යාගාරය සහ දැඩි සත්කාර ඒකකයෙහි ඉදිකිරීම් හි අඩුපාඩු පවතින බව එම ඒකක නිරීක්ෂණය කරන ලද සෞඛ්‍ය අමාත්‍යංශ නිලධාරීන් , රෝහල් අධ්‍යක්ෂක හා ඒකක ප්‍රධානීන්ට නිරීක්ෂණය වී ඇති බැවින් එම නිර්දේශ නොපමාව ක්‍රියාත්මක කිරීමට අදාළ ඉදිකිරීම් පාර්ශවයන්ට දැනුම් දී ඇති බව, නමුත් එම ඒකකයේ දැනට සේවය කරනු ලබන කාර්ය මණ්ඩලයෙන් දැනට භාරගන්නා ලද කොටස්වල පවතින	2024 ඔක්තෝබර් දක්වා ප්‍රමාණවත් ප්‍රගතියක් ලගා කරගෙන නොතිබුණි.

	හා කාර්යාල උපකරණ මිලදීගෙන තිබුණු අතර, 2023 ජුනි 02 විගණිත දින වන විට ඒවා ගොඩනැගිල්ලේ තැනින් තැන ගොඩගසා නිෂ්කාර්යයව පැවතුණි. ගොඩනැගිල්ලේ ස්ථාපිත කර තිබුණු මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය තුළින් ජලය ගොඩනැගිල්ලේ අභ්‍යන්තර ස්ථානවලට කාන්දු වෙමින් පැවතුණ බවත්, ඒ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු.මිලියන 73.45 ක් නිෂ්කාර්ය වියදම් වී තිබුණු බවට නිරීක්ෂණය විය.			අඩුපාඩු සම්බන්ධයෙන් හා භාර ගැනීමට නියමිත ශල්‍යාගාරය හා දැඩි සත්කාර ඒකකයේ ඉදිකිරීම් දෝෂ සම්බන්ධයෙන් දැනුම් දී ඇති බව, කොන්ත්‍රාත් ආයතනය විසින් අදාළ නිවැරදි කිරීම් කඩිනමින් සිදුකරමින් පවතින අතර එම ඉදිකිරීම් සම්පූර්ණ කළ විගස රෝහල මඟින් දැනට භාරගෙන නොමැති ශල්‍යාගාර සහ දැඩි සත්කාර ඒකකය පවරා ගැනීමට කටයුතු කර රෝගී සත්කාර සේවාවන් එම ඒකකවල ආරම්භ කිරීමටත් නියමිත බව.	
58	කරාපිටිය ශික්ෂණ රෝහල තුළ විවිධ ව්‍යාපෘති වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කර ඇති එකතුව රු.මිලියන 4,133.5 ක් වූ ගොඩනැගිලි 05 ක් වෙනුවෙන් විගණිත දින වන විට කොන්ත්‍රාතකරුවෙකුට ව්‍යාපෘති 03 වෙනුවෙන් එකතුව රු. මිලියන 1,361.7 ක් ගෙවා තිබුණු අතර ව්‍යාපෘති 02 වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට ගෙවූ මුදල්	2023	මෙම ව්‍යාපෘති සඳහා වැයකළ මුදල් ඵලදායි කර ගැනීමට පියවර ගත යුතු අතර තවදුරටත් අයකළ යුතු අත්තිකාරම් මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	තාවකාලික ඉදිකිරීම් නවතා දැමූ ළමා වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් නැවත 2024 වර්ෂයේදී ආරම්භ කිරීම සඳහා අමාත්‍යාංශය මඟින් තීරණය කර ඇති බව, දන්ත වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් RAMP කමිටුව මඟින් තාවකාලිකව අත්හිටවුවත් නැවත එම ඉදිකිරීම් කටයුතු	තවදුරටත් අයකළ යුතු අත්තිකාරම් මුදල් නැවත අයකර ගැනීමේ කටයුතුවල දුර්වල ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි.

පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූණි. එකතුව රු. මිලියන 4,133.5 ක්වූ ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට රු.මිලියන 1,361.7 ක් ගෙවා තිබුණද වැඩ අවසන් කර නොතිබුණු අතර, ප්‍රමාද කාලය මාස 06 ත් 34 ත් අතර විය. කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණු එකතුව රු.මිලියන 681.4 ක්වූ වැඩ අත්තිකාරම්වලින් රු. මිලියන 334.2 ක් ආපසු අයකර ගෙන නොතිබුණි. විගණිත දින වන විට වැඩ අවසන් කළ යුතු එකතුව රු.මිලියන 3,274.6 ක්වූ ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

ආරම්භ කර කඩිනමින් සිදුකරමින් පවතින බව, වකුගඩු ඒකකයේ ඉදිකිරීම් අවසන් කර ඇතත් එම ගොඩනැගිල්ලේ සමහර ඉදිකිරීම් සම්බන්ධව දෝෂ හඳුනාගෙන ඇති බැවින් ගනු ලැබූ තීරණ අනුව එම අඩුපාඩු හැකි ඉක්මනින් නිවැරදි කර රෝහල වෙත භාර දීමට එම අදාළ පාර්ශවයන් එකඟ වී ඇති බව, එම නිර්දේශ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර එම වැඩ කටයුතු අවසන් වූ පසු ගොඩනැගිල්ල රෝහලට භාර ගැනීමට කටයුතු සිදු කරන බවත් රෝගී සත්කාරක සේවා නව ඒකකවල ආරම්භ කිරීමටත් බලාපොරොත්තු වන බව, ශල්‍ය වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් සියයට 55 ක් පමණ භෞතික ප්‍රගතියක් 2024 දෙවන කාර්තුව අවසානයේ පෙන්නුම් කරන අතර එහි 2024 දෙසැම්බර් වනවිට බිම් මහල ,තුන්වන මහල ,සිව්වන මහල හා පස්වන මහල

			ඉදිකිරීම් අවසාන කිරීමට බලාපොරොත්තු වන බව, 2025 වර්ෂයේ මෙම ගොඩනැගිල්ලේ රෝගී සත්කාරක සේවාවන් ආරම්භකිරීමට බලාපරොත්තු වන බව, ආසාත ඒකකයේ රෝගී සත්කාරක සේවාවන් දැනටමත් ආරම්භ කර ඇති බවත් ඉහල මාලයේ ස්වසන රෝග ප්‍රතිකාර ඒකකයේ වැඩ කටයුතු 2024 වර්ෂයේ ආරම්භ කර ඇති බව, කෙසේ වෙතත් තව දුරටත් අයකර ගත යුතු අත්තිකාරම් මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අතිරේක ලේකම් (ඉංජිනේරු සේවා) වෙත උපදෙස් ලබා දී ඇති බව.	
59	සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2023 අමාත්‍යාංශය යටතේ පවතින රෝහල් වෙත පැමිණෙන හෘද රෝගීන් හෘද සැත්කම් සඳහා ශ්‍රී ජයවර්ධනපුර රෝහල වෙත යොමු කිරීම, එම රෝගීන්ට එම රෝහල විසින් සිදුකරනු ලබන හෘද සැත්කම් හා ප්‍රතිකාර සඳහා වූ ගාස්තු, එම රෝහල	විනිවිදභාවයකින් යුත් ක්‍රමවේදයක් සකස් කර විධිමත් පරිදි අනුමත කළ යුතු අතර එම ක්‍රමවේදය චක්‍රලේඛයක් ලෙස ප්‍රකාශයට පත්කළ යුතුය.	මේ වන විට ශ්‍රී ලංකා ජාතික රෝහල සහ කුරුණෑගල ශික්ෂණ රෝහල මඟින් යොමු කිරීම් පත්‍රිකා (Referral Forms) මඟින් රෝගීන් යොමු කරනු ලබයි. ශ්‍රී ජයවර්ධනපුර රෝහල සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ	2024 ඔක්තෝබර් දක්වා විගණන නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

වෙත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන ඖෂධ හා අනෙකුත් වෛද්‍ය සැපයීම්වල වටිනාකමට හිලව් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මනා විනිවිදභාවයකින් යුත් විධිමත් ක්‍රමවේදයක් සකස් කර ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන එම ක්‍රමවේදය මෙම ක්‍රියාවලියට සම්බන්ධවන සියළු පාර්ශවයන් වෙත චක්‍රලේඛයක් ලෙස හෝ වෙනත් ලිඛිත නියෝගයක් ලෙස නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමක් (MOU) සකස් කිරීමට තීරණයක් ගෙන තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව වෛද්‍ය සැපයීම් අංශය විසින් ශ්‍රී ජයවර්ධනපුර රෝහලට අවස්ථා 207 කට අදාළව නිකුත් කරන ලද ඉන්වොයිස්වල ඖෂධ ඇතුළු වෛද්‍ය සැපයීම්වල වටිනාකම සඳහන් කර නොතිබුණි. මෙසේ අයකිරීමකින් තොරව වෛද්‍ය සැපයීම් ශ්‍රී ජයවර්ධනපුර රෝහලට නිකුත් කිරීම සඳහා ලැබුණු විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

පවතින ආයතනයක් වන බැවින් අවබෝධතා ගිවිසුමක් ((MOU)) සකස් කිරීමට තීරණයක් ගෙන තිබුණද එය අවශ්‍ය නොවන බව වැටහීම හේතුවෙන් එම තීරණය ක්‍රියාත්මක නොවිණි. නමුත් විධිමත් ක්‍රමවේදයකට අනුව මෙම හෘද සැත්කම් සිදු වේ. 2023.05.08 දිනැති හා අංක අමප/23/0741/610/029 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතියෙහි මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ පදනම් කර ගනිමින් 2023.08.02 දිනැතිව පත්කල ත්‍රිපුද්ගල කමිටුවක් පත්කල අතර එම කමිටුවෙහි නිර්දේශ හා අනුමැතිය ඇතිව ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල වෙත රෝගීන් යොමු කිරීම සිදු කෙරේ. හෘද සැත්කම් බිල්පත් පියවීම සඳහා අතිරේක ලේකම්(වෛද්‍ය සේවා) යටතේ 2024 වර්ෂයේ සිට වෙනම වැය විෂයක් යටතේ අතිරේක ප්‍රතිපාදන වෙන්කර දී ඇත.

				ඒ අනුව එම වැය ශීර්ෂය හරහා 2024 ජනවාරි මස සිට ශ්‍රී ජයවර්ධනපුර රෝහල මඟින් යොමු කරනු ලබන බිල්පත් සඳහා ගෙවීම් සිදු කරනු ලබයි.	
60	අනායාචිත ව්‍යාපෘති යෝජනාවකට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, චීන සමාගමක් සහ මැලේසියානු සමාගමක් අතර 2019 ඔක්තෝබර් 02 දින අත්සන් කරන ලද ගිවිසුමකට අනුව විද්‍යුත් රූප සංරක්ෂණය, සන්නිවේදන විකිරණ තොරතුරු පද්ධතිය (PACS/RIS) රෝහල් 20 තුළ ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් කිසිදු ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමක්, ව්‍යාපෘතියට අදාළව පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමක් හෝ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් හෝ සිදුකළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. යෝජිත රෝහල් 20 තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 33.25 ක්වූ අතර එම මුදලෙහි පොලීය එක්සත් ජනපද ඩොලර් මිලියන 1.31 ක් සමඟ වර්ෂ 11 ක් තුළ ගෙවිය යුතු විය. මෙම ව්‍යාපෘතියේ පළමු	2023	මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ සිට වගකිව යුතු නිලධාරීන් කටයුතු කළ ආකාරය සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර රට තුළ පවතින ආර්ථික තත්ත්වයට අනුව ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තීරණය කර ගිවිසුම් සංශෝධනය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.	අංක MH/FS/PI/31/2024 /A-17/30 යටතේ මූලික විමර්ශනයක් සිදු කරමින් පවතන බව.	ගිවිසුම් සංශෝධනය කිරීමට අදාළ ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

අදියර ලෙස රෝහල් 05 ක පද්ධතිය ස්ථාපිත කිරීම මාස 03 ක් ඇතුළත අවසන් කිරීමටත් ඉතිරි රෝහල් 15 ක පද්ධතිය ස්ථාපිත කිරීම අවුරුදු 02 ක් තුළ නිම කිරීමටත් එකඟ වී තිබුණද ව්‍යාපෘතියේ කටයුතු කිසිඳු ආකාරයකට නියමිත කාල රාමුව ඇතුළත ක්‍රියාත්මක කිරීමට අදාළ පාර්ශවයන් කටයුතු කර නොතිබුණි. 2022 ජූලි මස පුද්ගලයින් 05 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් රෝහල් 05කට අදාළව මෙම ව්‍යාපෘතියේ පළමු වාරිකය ගෙවීමට පෙර ව්‍යාපෘතියේ ක්‍රියාත්මකභාවය පිළිබඳ ඇගයීමක් සිදුකර තිබුණු අතර ඒ අනුව නිර්ණායකයන් 04 ක් සතුටුදායක නොවන (Not Satisfactory) බවත්, නිර්ණායකයන් 38 ක් සම්පූර්ණයෙන් සතුටුදායක නොවන (Partially Satisfactory) බවත් දක්වා තිබුණි. මේ අනුව සමස්ථයක් ලෙස මෙම ව්‍යාපෘතිය රෝහල් 05 ක ක්‍රියාත්මක කිරීම සතුටුදායක මට්ටමක නොමැති බව මෙම ඇගයීමට අනුව තහවුරු වී තිබුණි. 2023 මාර්තු 20 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද රෝහල් 05 ට අදාළව කොටස් ගෙවීමක් කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණද, අමාත්‍යාංශය

	පත් කළ 05 දෙනෙකුගෙන් යුත් කමිටුවේ නිර්දේශය, අමාත්‍යමණ්ඩල අනුමැතිය හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද කරුණු දැක්වීම් සැලකිල්ලට නොගෙන රෝහල් 20 තුළම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් පසුව එළඹෙන ඊළඟ වර්ෂයේදී ගෙවිය යුතු වාරික මුදල වූ එ.ජ.ඩොලර් මිලියන 3.02 ක සම්පූර්ණ වාරික මුදල ගෙවා තිබුණි.				
61	ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය යටතේ පවතින විද්‍යුත් අංශයට Patient Monitors සඳහා වටිනාකම රු.24,520,000 ක් වූ SP02 Sensors අයිතම 4,000 ක අමතර කොටස් උපාංග ප්‍රසම්පාදනයේදී ලංසු කොන්දේසි 3.7 ට අනුව ලංසුකරුවන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය ලබාගෙන තිබිය යුතු වුවත් එසේ ලියාපදිංචි සහතිකය නොමැති ලංසුකරුවන් තිදෙනෙකුගෙන් සාම්පල කැඳවා ලංසු ඇගයීම සිදුකර ලියාපදිංචි සහතිකය නොමැති ලංසුකරුවකුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ලංසු ඇගයීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.7, 7.8.6, හා 7.11 ට අනුකූලවද කටයුතු කර නොතිබුණි.	2023	මේ සම්බන්ධයෙන් විමර්ශනය කර වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය.	අංක MH/FS/PI/30/2023 /B-173/346 යටතේ මූලික විමර්ශනයක් සිදු කරමින් පවතින බව.	මූලික විමර්ශනයක් ආරම්භ කර තිබුණි

62	2022 වර්ෂයේදී වෛද්‍ය සැපයීම් අංශය විසින් සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (HSEP) හරහා රු.268,500,000 ක් වටිනා ශල්‍ය ගෝස් මීටර් මිලියන 03 ක් ආනයනය කර මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. PRONTO පද්ධතියෙන් ලබාගත් තොරතුරු අනුව රෝහල්වල වාර්ෂික ගෝස් අවශ්‍යතාවය දළ වශයෙන් මීටර් මිලියන 53 ක් වූ අතර වෛද්‍ය සැපයීම් අංශය විසින් වාර්ෂිකව මීටර් මිලියන 30 ක් පමණක් ඇස්තමේන්තු කර ඇණවුම් ඉදිරිපත් කළ ද අමාත්‍යාංශය විසින් කාර්තුවකට මීටර් මිලියන 6 බැගින් මීටර් මිලියන 24 ක් සඳහා පමණක් කෝටා ලබා දී තිබුණි. මේ හේතුවෙන් ව්‍යාජ හිඟයක් පෙන්නුම් කර හදිසි මිලදී ගැනීම් සිදුකිරීමට අවස්ථාව සලසා ගෙන තිබුණු බවද නිරීක්ෂණය විය. 2022 වර්ෂයේදී වෛද්‍ය සැපයීම් අංශයේ ලියාපදිංචි ශල්‍ය ගෝස් සැපයුම්කරුවන් 302 න් සැපයුම්කරුවන් 36 දෙනෙකු විසින් 2022 වර්ෂයේ ඇතිව තිබුණු ආර්ථික අර්බුදය හේතුවෙන් පැවති මිල ගණන් යටතේ තම කෝටාවට අදාළ ගෝස් සැපයීමට නොහැකි බව දැනුම් දීමත්, මුළු වාර්ෂික අවශ්‍යතාවය නිවැරදිව ඇස්තමේන්තු කර අවශ්‍යතාවය සපුරා ගැනීමට කටයුතු නොකිරීමත්	2023	මේ සම්බන්ධයෙන් විමර්ශනය කර වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය.	අංක MH/FS/PI/2024/27 /A-74/133 යටතේ මූලික විමර්ශනයක් සිදු කරමින් පවතින බව.	මූලික විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

හේතුවෙන් රෝහල්වල ගෝස් හිඟයක් හටගෙන තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව මාස 03ක ආරක්ෂිත තොගයක් පවත්වා ගෙන යාම සඳහා ගෝස් මීටර් මිලියන 03 ක් ලබා ගැනීමටත්, රු.මිලියන 500 ඉක්ම වූ ප්‍රසම්පාදනයන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවට සිදුකළ නොහැකි වීම මත ඇණවුම මීටර් මිලියන 03 දක්වා අඩුකර ලංසු කැඳවීමටත්, වැඩබලන වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂකගේ සහභාගීත්වයෙන් 2022 නොවැම්බර් 21 දින පැවති ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේදී වෛද්‍ය සැපයීම් අංශයේ හදිසි අවශ්‍යතාවයක් ලෙස දක්වමින් ලංසු ඉදිරිපත් කර තිබුණු එකම ලංසුකරුකරුට ගෝස් මීටර් මිලියන 03 ක ඇණවුම ප්‍රදානය කිරීමටත් අනුමැතිය ලබා දී තිබුණි. ඒ වන විට වෛද්‍ය සැපයීම් අංශය තුළ වැඩි මිලට ගෝස් මිලදී ගැනීමේ හදිසි අවශ්‍යතාවයක් නොතිබුණු බවත්, ඇණවුම ප්‍රදානය කළ අවස්ථාව වනවිට දේශීය සැපයුම්කරුවන් විසින් ගෝස් මීටර 3,635,700 ක ප්‍රමාණයක් වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු බවත් නිරීක්ෂණය විය. මෙම සැපයුම්කරු, වෛද්‍ය සැපයීම් අංශයේ කෝටා ක්‍රමය යටතේ රු.74.96

බැගින් ගෝස් සපයන ලද දේශීය සැපයුම්කරුවකු බවත්, මෙම ඇණවුමේදී මීටරයක් රු.89.50 බැගින් ඉන්දියාවෙන් ආනයනය කර සැපයීමට ලංසුව ඉදිරිපත් කර තිබුණු බවත් නිරීක්ෂණය විය. නමුත් මෙම තොගය සැබෑ ලෙසම ඉන්දියානු නිෂ්පාදකයෙන්ම ලබාගත් තොගයක්ද නැතිනම් දේශීයව නිෂ්පාදනය කළ තොගයක්ද යන්න වෛද්‍ය සැපයීම් අංශය විසින් තහවුරු කරගෙන නොතිබුණි. මේ හේතුවෙන් දේශීය වශයෙන් තොග තිබිය දී ගෝස් ආනයනය කිරීම නිසා මීටරයක් සඳහා වැඩිපුර රු.14.54 බැගින් මීටර මිලියන 03 ක් මිල දී ගැනීමෙන් රු.මිලියන 43.6 ක පාඩුවක් රජයට සිදු වන බවත්, රු.මිලියන 43.6 පාඩුවක් විඳිමින් පොරොත්තු තොගයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති බවත්, මුළු වාර්ෂික අවශ්‍යතාවය නිසි පරිදි ඇස්තමේන්තු කර දේශීය සැපයුම්කරුවන්ගේ කෝටාව ඉහළ නංවා දේශීය කර්මාන්තය සුරැකෙන පරිදි අදාළ සැපයීම් ලබා ගැනීමට නිලධාරීන් කටයුතු කර නොතිබුණු බවත් විගණනයේ දී නිරීක්ෂණය විය.

63	චීන ආධාර යටතේ රෝහල් වල සෞඛ්‍ය පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් නාවලපිටිය දිස්ත්‍රික් රෝහලට 2022 මාර්තු 29 දින ලබා දෙන ලද වටිනාකම රු.20,940,561 (USD73,734.37*284) ක GE Health Care/ Model/Optima XR 646 දරන Digital Static X – Ray යන්ත්‍රය ස්ථාපිත කිරීම සඳහා රු.19,970,008 ක පිරිවැයක් දරා තිබුණද යන්ත්‍රය රෝගී සත්කාර සඳහා 2023 දෙසැම්බර් 31 දින වන විටද භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි.	2023	වර්ෂ දෙකකට වැඩි කාලයක් නිෂ්ක්‍රියව පවතින ආකාරයට උපකරණ ලබා දීම සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් සිදුකළ යුතුය.	ඇණවුම් කර ඇති Lead Door සවිකළ විගස අදාළ සමාගම මෙහෙයුම් පරීක්ෂණ (Test Run) කිරීමෙන් අනතුරුව උපකරණය රෝගී සත්කාරක සේවාව සඳහා කඩිනමින් යොදා ගැනීමට අපේක්ෂිත බව.	2024 ඔක්තෝබර් දක්වා විගණන නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
64	2021 පෙබරවාරි 04 දින සිට 2023 පෙබරවාරි 03 දින දක්වා වර්ෂ දෙකක වැටුප් සහිත විදේශ නිවාඩු අනුමත කර තිබුණු වෛද්‍යවරයෙකු 2021 පෙබරවාරි 04 දින විදේශ ගතවී නැවත 2021 ජූලි 07 දින ශ්‍රී ලංකාවට පැමිණ තිබුණු බව ඔහුගේ විදේශ ගමන් පිළිබඳව ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව තහවුරු විය. නමුත් ඔහු ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව අමාත්‍යාංශයට ඒ බව දැනුම්දී නොතිබුණු අතර අදාළ පුහුණු දීමනාව හා මාසික වැටුප් ලබාගෙන තිබුණි. මේ ආකාරයට 2021 ජූලි 08 දින සිට 2021 සැප්තැම්බර් 02 දින දක්වා	2023	පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර නිලධාරියා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය.	ප්‍රගතිය පසුව දැනුම් දීමට කටයුතු කරන බව.	2024 ඔක්තෝබර් දක්වා විගණන නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	නියමිත පරිදි සේවයට වාර්තා නොකර වැටුප් හා විදේශීය පුහුණු දීමනාව ලබාගෙන තිබුණි. 2021 සැප්තැම්බර් 03 දින වෛද්‍යවරයා යාපනය ශික්ෂණ රෝහලේ රාජකාරි භාරගෙන තිබුණි. මෙම කාලපරිච්ඡේදයට අදාළ පුහුණු දීමනාව පසුව ප්‍රතිපූර්ණය කර තිබුණද විධිමත් අධිකාරි බලයක් රහිතව ගෙවන ලද වැටුප් හා දීමනා නැවත අයකරගෙන නොතිබුණි.				
65	වෛද්‍ය නිලධාරියෙකු තම විදේශීය පුහුණු කාලය තුළ 2020 පෙබරවාරි 11 දින නැවත ශ්‍රී ලංකාවට පැමිණ ඇති බව ඔහුගේ විදේශ ගමන් පිළිබඳව ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව තහවුරු විය. නමුත් එම වෛද්‍යවරයා නැවත ශ්‍රී ලංකාවට පැමිණි දිනය 2020 මාර්තු 30 බව දන්වා ඇත. මේ අනුව වෛද්‍යවරයා 2020 පෙබරවාරි 11 සිට 2020 මැයි 15 දින දක්වා සේවයට වාර්තා නොකිරීමට හේතුව විගණනයට තහවුරු නොවීය. එසේම මෙම කාලපරිච්ඡේදයට අදාළව ගෙවන ලද වැටුප් හා දීමනා පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර වැටුප් හා දීමනා ගෙවීමේ පදනම හා ලබාගත් අනුමැතිය	2023	මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගත යුතුය.	ප්‍රගතිය පසුව දැනුම් දීමට කටයුතු කරන බව.	2024 ඔක්තෝබර් දක්වා විගණන නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	කුමක්ද යන්නත් විගණනයට තහවුරු නොකෙරුණි. එසේම 2020 මාර්තු 30 දින සිට 2021 නොවැම්බර් 27 දින දක්වා වෛද්‍යවරයා රාජකාරි කළ බව දක්වා තිබුණද 2020 මාර්තු 30 දින සිට 2020 මැයි 15 දින දක්වා රාජකාරි කලේ කුමන ආයතනයකද යන්න හා ඉටුකරන ලද රාජකාරීන් මොනවාද යන්න තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.				
66	2009 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කොළඹ ජාතික රෝහලේ විකිරණවේදී විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් විදේශ ගමන් 29 ක් සිදුකර තිබුණි. මෙම නිලධාරියා සඳහා විකිරණවේදී පුහුණුවක් වෙනුවෙන් 2018 මාර්තු 01 සිට 2018 අගෝස්තු 31 දක්වා මාස 6 ක වැටුප් සහිත විදේශ නිවාඩුවක් අනුමත කර තිබුණි. එහිදී මෙම පුහුණුව මාස 03 ක කාලයක් ඇමරිකා එක්සත් ජනපදයේ විශ්වවිද්‍යාලයකින් හා මාස 03 කාලයක් ඉන්දියාවේ Medanta neuro, vascular Center හිදී ද සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ නමුත් අනුමත කර තිබුණු කාලය තුළ විදේශ පුහුණුවට සහභාගිවී නොතිබුණු අතර ඒ වෙනුවෙන් රු.289,400 ක ගුවන් ටිකට්පත් ගාස්තුවක්	2023	මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගත යුතුය.	අංක MH/FS/PI/2024/08 /A-144/269 යටතේ මූලික විමර්ශනයක් සිදු කරමින් පවතී.	මූලික විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

සහ මාස 03 හි ජීවන වියදම් දීමනා ලෙස එක්සත් ජනපද ඩොලර් 5,781 (රුපියල් වටිනාකම 1,849,920) ක් හා උණුසුම් ඇඳුම් දීමනා ලෙස බ්‍රිතාන්‍ය ස්ටාර්ලින් පවුම් 75 (රුපියල් වටිනාකම 30,525) ක මුදලක් එම නිලධාරියා වෙත ගෙවා තිබුණි. නමුත් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු ප්‍රකාරව, මෙම නිලධාරියා 2018 ජුනි 30 දින විදේශ ගතව 2018 ජූලි 31 දින නැවත දිවයිනට පැමිණ ඇති බවත්, ඒ අනුව දින 32 ක් පමණක් විදේශ ගතවී සිටි බවත්, අනුමත වැටුප් සහිත විදේශ නිවාඩු 2018 ජූලි 09 දින අවසන්ව පැවතීම හේතුවෙන් 2018 ජූලි 10 වන දින සිට නැවත ලංකාවට පැමිණි 2018 ජූලි 31 දින දක්වා දින 22ක කාලයක් අනුමත විදේශ නිවාඩු දීර්ඝ කර ගැනීමකින් තොරව සිට ඇති බවත් නිරීක්ෂණය විය. ii. එසේම ඉහත මාස 06 ක පුහුණු කාලයෙන් ඉන්දියාවේ Medanta neuro, vascular Center ආයතනයේදී ලබා ගැනීමට නියමිතව තිබුණු මාස 03 ක පුහුණුව සඳහා ගුවන් ගමන් ටිකට්පත් ගාස්තුව ලෙස රු.119,200 ක් හා ජීවන වියදම් දීමනා ලෙස ඉන්දියානු රු.211,143 (ශ්‍රී ලංකා රුපියල් වටිනාකම 812,900) ගෙවා තිබුණි. නමුත් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ලබා

ගත් තොරතුරු ප්‍රකාරව, මෙම නිලධාරියා දින 06 ක් පමණක් විදේශ ගතවී සිටි බවත් නිරීක්ෂණය විය. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු ප්‍රකාරව, මෙම නිලධාරියා 2009 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අවස්ථා 29 කදී විදේශ ගත වී තිබුණු අතර ඉන් විදේශ ගත වීම් අවස්ථාවන් 20 කට අදාළව නිලධාරියා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 23:1 ප්‍රකාරව විධිමත් පරිදි විදේශ නිවාඩු ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර විදේශ නිවාඩු අනුමත කරවා ගෙන නොතිබුණි. ඒ අනුව ආයතන සංග්‍රහයට පටහැනිව රාජ්‍ය සේවයේ සිටිය දී, විදේශ නිවාඩු අනුමත කරවා ගැනීමකින් තොරව විදේශ ගත වීම සම්බන්ධයෙන් මෙම නිලධාරියාට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවයත්, එලෙස විදේශ ගතව සිටි කාලය සඳහා ගෙවන ලද වැටුප් හා දීමනා ගණනය කර ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.6 ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	අතිරික්තය (ඌනතාවය) රු.	මතය
2021	-	-	-	-	-
2022	73,350,530	270,510	73,080,020	-	තත්ත්වාගණනය නොකළ
2023	58,008,222	602,248	57,405,974	-	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	ප්‍රජාවගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම අරමුණු කරගෙන 2021 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ උද්‍යාන 2 ක්, යාපනය සහ මන්නාරම යන ප්‍රදේශවල, උතුරු නැගෙනහිර සංවර්ධන, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර තිබුණ අතර කලින් කල අමාත්‍යාංශ 11 ක් යටතේ පවත්වාගෙන ආ මෙම තාක්ෂණික උද්‍යාන 2022 ජූලි 22 දිනැති අති විශේෂ ගැසට්පත්‍ර අංක 2289/43 ප්‍රකාරව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයට පවරා තිබුණි. තොරතුරු	2023	තොරතුරු තාක්ෂණ උද්‍යානවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අමාත්‍යාංශය පූර්ණ අධීක්ෂණයක් සිදු කළ යුතු අතර අවශ්‍ය කටයුතු සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	2023 ඔක්තෝබර් 25 දින තොරතුරු තාක්ෂ උද්‍යාන, වෘත්තීය පුහුණු අධිකාරිය වෙත පවරා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් රාජ්‍ය ඇමතිගේ ප්‍රධානත්වයෙන් වෘත්තීය පුහුණු අධිකාරියේ උප සභාපති සමඟ පවත්වන ලදී. ඒ අනුව මෙම තොරතුරු තාක්ෂණ උද්‍යානය වෘත්තීය පුහුණු අධිකාරිය වෙත පැවරිමට කටයුතු කරමින් පවතින බැවින් යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානයේ කාර්යයභාර	තොරතුරු තාක්ෂණ උද්‍යාන අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින වෘත්තීය පුහුණු අධිකරිය වෙත පවරා දීම සඳහා කටයුතු කරමින් පවතී.

	තාක්ෂණ උද්‍යාන සඳහා නිශ්චිත කාර්යය මණ්ඩලයක් හඳුනා ගෙන නිසි අනුමැතිය ලබා ගෙන නොතිබුණද යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානයට කාර්යය මණ්ඩලය වශයෙන් 47 දෙනෙකුද මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යානයට කාර්යය මණ්ඩලය 12 දෙනෙකුද බඳවා ගෙන තිබුණි. එසේ වුවද ප්‍රවර්තන වර්ෂය වන විට යාපනය හා මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යාන සඳහා කාර්ය මණ්ඩලය පිළිවෙලින් 7 දෙනෙකු හා 6 දෙනෙකු දක්වා අඩු වී තිබුණි. බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර නොතිබීම හේතුවෙන් යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විධායක නිලධාරි තනතුර සඳහා සංවර්ධන නිලධාරි සේවයේ දෙවන ශ්‍රේණියේ නිලධාරියකු බඳවා ගෙන තිබුණි. කෙසේ වෙතත් මෙම උද්‍යානවල පවතින සේවක පුරප්පාඩු, සිසුන් ආකර්ෂණය කිරීමේ වැඩසටහන් හා නව පාඨමාලා හඳුන්වා දීම පිළිබඳව අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.			නිලධාරිගේ ඉල්ලීම පිළිබඳ පියවර ගැනීම ප්‍රමාද කළ බව.	
2.	2023 වර්ෂයේදී යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානය යටතේ	2023	- එම-	තොරතුරු තාක්ෂණ උද්‍යාන ඵලදායි ලෙස කරගෙන	-එම -

සහතිකපත්‍ර පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා 11 කට සහ මාර්ගගත හා අන්තර්ජාල තාක්ෂණය පිළිබඳ වැඩමුළු 3 කට සිසුන් 320 ක් ලියාපදිංචි කිරීමට සැලසුම් කර තිබුණද පාඨමාලා 2 කට හා එක් වැඩමුළුවකට ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව 43 ක් එනම් සියයට 13 ක් විය. 2020 වර්ෂයේ සිට ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 126 සිට 2023 වර්ෂය වන විට 43 දක්වා ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බව තවදුරටත් නිරීක්ෂණය විය. එසේම මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යානය යටතේ පාඨමාලා 10 ක් සඳහා අපේක්ෂිත සිසුන් සංඛ්‍යාව 300 ක් වුවද පාඨමාලා 3 ක් සඳහා ලියාපදිංචි වී තිබුණු සිසුන් සංඛ්‍යාව 155 ක් විය. යාපනය හා මන්නාරම උද්‍යාන දෙකෙන් අපේක්ෂිත පාඨමාලා ගාස්තු ආදායම පිළිවෙලින් රු.1,129,000 ක් හා රු.2,185,000 ක් වුවද ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව අඩු වීම හේතු කොට ගෙන රාජ්‍ය ආදායමට එකතු කර ගත හැකිව තිබුණේ යාපනය උද්‍යානයෙන් රු.131,080 ක්ද මන්නාරම උද්‍යානයෙන් රු.833,500 ක්ද වශයෙන් විය. මෙම

යාමට හැකියාව ඇති වෘත්තීය පුහුණු අධිකාරිය වැනි ආයතනයක් වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බවත්, සිසුන්ගේ යොමුවීම වඩාත් පවතින්නේ පිළිගැනීම ඉහළ ආයතන වෙත බව.

	උද්‍යාන නඩත්තුව හා පාඨමාලා පැවැත්වීම සඳහා 2023 වර්ෂයේදී යාපනය හා මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යාන සඳහා වැය කර තිබුණු පිරිවැය පිළිවෙලින් රු.6,330,201 ක් හා රු.4,999,863 ක් විය. ඒ අනුව උද්‍යාන දෙක සිසුන් 198 දෙනෙකුගෙන් එකතු කළ ආදායමට වඩා රු.10,365,484 ක් වැඩියෙන් වැය කර තිබුණි.				
3.	දිනෙන් දින ඉහළ යන ඉඩම් ඉල්ලුමට සරිලන පරිදි කොළඹ නගරය පුළුල් කිරීම සඳහා කොළඹ වරායට යාබද ඉඩම් ගොඩකිරීමේ යෝජනාවක් වශයෙන් කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිමය වෙනස්වීම් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘති සමාගම විසින් ඇ.ඩොලර් මිලියන 143 ක වන්දි මුදලක් ඉල්ලුම් කර තිබුණු අතර ඒ වෙනුවට හෙක්ටයාර් 2 ක වාණිජමය ඉඩමක් ව්‍යාපෘතිය සමාගමට ලබා දී තිබුණි. මෙම ඉඩමේ තක්සේරු වටිනාකම වාර්තා කර නොතිබුණු අතර වන්දි	2023	රජයට අලාභයක් නොවන පරිදි කටයුතු කළ යුතුය.	මේ සඳහා අංක PMO/06/03/CM/70/ 2016 හා 2016 ජූලි 14 දිනැති කැබිනට් සංදේශය හේතු වී ඇති බව.	අංක අමප/10/1377/702/ 018-I හා 2016.08.10 දිනැති "වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය - කොළඹ වරාය නගර ව්‍යාපෘති සමාගම විසින් වන්දි හිමිකම් ඉවත් කර ගැනීම" කැබිනට් තීරණය අනුව කටයුතු කරන බැවින් ප්‍රගතිය පිළිබඳව වාර්තා කර නැත.

	මුදල හෝ ඉඩමේ වටිනාකමින් රජයට අලාභයක් සිදු වී තිබුණි.				
4.	වරාය නගරයේ අපජලය කළමනාකරණය සඳහා ස්ථිර විසඳුමක් සපයන තුරු තාවකාලික විසඳුම සඳහා අපේක්ෂිත වියදම රු.මිලියන 1,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද සැලස්මේ වෙනස් කිරීම් හා මිල ගණන් ඉහළ යාම් හේතුවෙන් ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 3,700 දක්වා වැඩි වී තිබුණි. මෙම කාර්යය කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වූ ත්‍රෛපාර්ශවීය ගිවිසුම් ප්‍රකාරව 2019 වර්ෂයේදී අවසන් විය යුතු වුවත් ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර තිබුණේ 2022 දෙසැම්බර් මසයේදීය. 2017-2019 කාලය තුළදී රු.මිලියන 1,600 ක මුදලක් මහා භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණද 2023 සැප්තැම්බර් 30 දින වන විටත් ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොතිබුණි. එසේම, රු.මිලියන 2,900 ක මුළු පිරිවැයකට ඇස්තමේන්තු කර තිබුණු ස්ථිර විසඳුමේ කාර්යයද 2022 වර්ෂයේදී සම්පූර්ණ කළ යුතු වුවද 2023 සැප්තැම්බර් 30 දින වන	2023	රු.මිලියන 1,000 ක් යටතේ තාවකාලික විසඳුම 2019 වර්ෂයේදී නිම කිරීමට 2020 හා 2021 තුළ පැවති කොවිඩ් වසංගතය හා ගෝලීය ආර්ථික අර්බුදය බලපෑමක් කර නොතිබුණි. ත්‍රෛපාර්ශවීය ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය.	සැලැස්මේ වෙනස්කම් හා මිල ගණන් ඉහළ යාම මත ව්‍යාපෘතියේ පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 1,000 සිට රු.මිලියන 3,700 ක් දක්වා වැඩි වී තිබෙන බව හා උතුරු අපජල සම්බන්ධතාවය වසර 3 ක කාලයක් තුළ නිම කිරීමට තීරණය කර ඇති බව	කොළඹ වරාය නගරයේ අපජලය කළමනාකරණය සඳහා වන ඉදිකිරීම්වල මේ වන විට ප්‍රගතිය සියයට 84.83 ක් වන අතර 2024 වර්ෂය වන විට සම්පූර්ණ වියදම රු.මිලියන 793.05 ක් වී ඇත. 2025 දෙසැම්බර් වන විට සියළුම ඉදිකිරීම් කටයුතු නිම කිරීමට සැලසුම් කර ඇත.

	විටත් මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර නොතිබුණි. 2022 වර්ෂය වන විට තාවකාලික හා ස්ථිර විසඳුම් දෙකම ආරම්භ කර නොතිබුණ හෙයින් ස්ථිර විසඳුම ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශයේ අවධානය යොමු කර නොතිබීමෙන් තාවකාලික විසඳුමට වැය කරන රු.මිලියන 3,700 රජයට සිදු වන පාඩුවක් බව නිරීක්ෂණය විය.				
5.	ත්‍රෛපාර්ශවීය ගිවිසුමෙහි 24.1.2 ඡේදය ප්‍රකාරව, හෙක්ටයාර් 91 ක් වූ පොදු ඉඩම් ප්‍රමාණය තුළ වූ වරාය නගරයේ මුහුදු වෙරළ ප්‍රදේශය ශ්‍රී ලංකා රජය සතු විය යුතු වුවත් ව්‍යාපෘති සමාගම විසින් මුහුදු වෙරළ ප්‍රදේශයට අයත් ඉඩම්, අවන්හල් කිහිපයකට තාවකාලිකව කුලියට දීමට කටයුතු කර එම අවන්හල්වලින් ආදායම් එකතු කර ගෙන තිබුණි.	2023	ත්‍රෛපාර්ශවීය ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය.	කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය ඉදිකිරීම් භූමියක් ලෙස පවතින අතර සියලුම නඩත්තු හා අදාළ කටයුතු කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘති සමාගම මඟින් සිදු කරනු ලබන අතර ඒ සම්බන්ධ කිසිදු පිරිවැයක් නොදරයි. එබැවින් මෙම ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම ව්‍යාපෘති සමාගම විසින් එකතු කරනු ලැබේ.	2024 මාර්තු 27 දින නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පැවති සාකච්ඡානලින් ලද උපදෙස් අනුව වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත ප්‍රකාරව මුහුදු වෙරළ ප්‍රදේශයට අයත් ඉඩම් තාවකාලිකව කුලියට දිමට ප්‍රතිපාදන නොමැති බැවින්, දැනට ක්‍රියාතමක වන ක්‍රියාකාරකම් සඳහා කාල දිගුවක් ලබා නොදීමට සහ ඉදිරියේ දී නව ක්‍රියාකාරකම් සඳහා බලපත්‍ර නිකුත් නොකිරීමට වරාය නගර ආර්ථික කොමිෂන් සභාව තිරණය කර ඇත.

6.	ත්‍රෛපාර්ශවීය ගිවිසුමෙහි උපලේඛන අංක 10 අනුව, වාණිජමය ඉඩම්, පොදු ඉඩම් සහ මාර්ග සඳහා වූ ඉඩම් ඇතුළුව ඉඩම් කොටස් 118 ක වැඩබිම් වැඩි දියුණු කිරීම 2019 සැප්තැම්බර් 16 දින වන විට අවසන් කළ යුතු වුවත් 2023 සැප්තැම්බර් 30 දින වන විට ඉඩම් කොටස් 85 කට පමණක් අවසන් කිරීමේ සහතික ලබා දී තිබුණි. තවද, මාර්ග, පාලම් හා උමං මාර්ග 2020 මාර්තු 14 දින වන විට අවසන් කළ යුතු වුවද, 2023 සැප්තැම්බර් 30 දින වන විට සියයට 50 ට වැඩි ප්‍රතිශතයකින් නිම කර තිබුණු අතර ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි. 2020 මාර්තු 09 අවසන් කළ යුතු භූමි අලංකරණ කටයුතුද 2023 නොවැම්බර් 30 දින වන විටත් අවසන් කර තිබුණේ සියයට 77 ක් පමණි. අදියර 7 කින් නිමකිරීමට සැළසුම් කර තිබුණු දකුණු මලාපවාහන මාර්ගය නිම කිරීම 2023 ජූලි 11 සිදු කළ යුතු වුවද 2023 සැප්තැම්බර් 30 වන විටත් එහි අදියර තුනක් සැළසුම් අදියරේ පැවතුනි.	2023	-එම -	සමාගම විසින් නිසි ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ අමාත්‍යාංශය යන ආයතන දෙකම ඉතිරි ඉඩම් කට්ටි සඳහා නිම කිරීමේ සහතිකය නිකුත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව හා ව්‍යාපෘතියේ කාලසටහන අනුව කොවිඩ් 19 වසංගතය හා ආර්ථික අභියෝගයන් වැනි බාහිර සාධකවලින් බලපෑම් එල්ල වූ අංගයන් ද ආවරණය කරමින් වසර 08 ක් තුළ ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට අපේක්ෂා කරයි.	මේ වන විට සියලුම වාණිජමය සහ පොදු ඉඩම් කොටස් සඳහා අවසන් කිරීමේ සහතික පත්‍ර නිකුත් කර ඇත. 2024 ජූලි 31 වන දින වන විට මාර්ග හා පදික වේදිකාවේ වැඩ, වාහන සඳහා වූ පාලම්, උමං මාර්ග වැඩ, මගී පාලම් ප්‍රගතිය සියයට 90 ට වැඩි බව වාර්තා කර ඇත. පාලම් 5 න් 3ක් සම්පූර්ණයෙන් නිම කර ඇති අතර වාහන සඳහා වූ පාලම් 5 න් 2 ක් සම්පූර්ණයෙන් නිම කර තිබුණ අතර 2024 ජූලි මස 31 දින වන විට භූමි අලංකරණ කටයුතු අදියර, සියයට 94.8 ක ප්‍රගතියක් ලබා තිබුණි. දකුණු මල ප්‍රවාහන පද්ධතිය නිම කර නොතිබුණ අතර ඉතිරි අදියර දෙක මෙතෙක් ඉදි කර නොතිබුණි.
7.	ත්‍රෛපාර්ශ්වික ගිවිසුමට අනුව පොදු ඉඩම්, අලෙවි කළ හැකි ඉඩම්	2023	-එම -	උපලේඛන 14 හි ඡේද 10 හා 11 හි දැක්වුණේ අමතර භූමිය වෙන්	ඉඩම් වෙන් කිරීමේ වෙනසක් සිදු කර නොමැත.

	(GOSL) හා අලෙවි කළ හැකි ඉඩම් (ව්‍යාපෘති සමාගම) සඳහා වෙන් කළ යුතු ඉඩම් ප්‍රමාණය පිළිවෙලින් 91, 62 හා 116 ක් වූ අතර වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය 93.65 ක්, 60.85 ක් හා 118.16 ක් වශයෙන් වූ බැවින් වැඩියෙන් වෙන් කර තිබුණු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 3.66 ක් විය.			කරනු ලබන ක්‍රමවේදය යි. උපලේඛන 14 හි පළමු ඡේදයෙහි දැක්වුණු ඉඩම් ලබාගැනීමේ ක්‍රමවේදයේ අමතර භූමිය ශ්‍රී ලංකා රජය හා ව්‍යාපෘති සමාගම අතර සාධාරණ ලෙස බෙදීම සඳහා අවස්ථාව සලසා තිබූ බව.	
8.	ටෙක්නෝ පාර්ක් ඩිවෙලොප්මන්ට් ප්‍රයිවෙට් ලිමිටඩ් සමාගම 2021 සැප්තැම්බර් 29 දින රජයේ සම්පූර්ණ කොටස් හිමි සමාගමක් වශයෙන් සංස්ථාපනය කර තිබුණි. මෙම සමාගම අංක 2289/43 හා 2022 ජූලි 14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. ආරම්භයේදී අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර තිබුණද එහි සාමාජිකයින් වරින් වර ඉල්ලා අස්වීම හේතුවෙන් ක්‍රියාකාරි මට්ටමේ නොතිබුණි. සංගමික ව්‍යවස්ථාවලියෙහි 43(i), (iii) & (iv) සහ 43(2) වගන්ති ප්‍රකාරව සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. තවද, සංගමික	2023	අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 6.6 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු අතර සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ටෙක්නෝ පාර්ක් ඩිවෙලෝප්මන්ට් පුද්ගලික සමාගම සඳහා සභාපතිවරයකු හා අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් පත් කරන ලෙස මෙම අමාත්‍යාංශය විසින් ජනාධිපති ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කරන ලද බව සහ දැනට අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් පත් කර ඇති බව. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත්වීම නිසා සමාගමක් ලෙස ක්‍රියාකාර්ත්වයක් නොපවතින බැවින් වාර්ෂික වාර්තා පිළියෙල කර ගැනිමට නොහැකි වී ඇති බව.	නව අධ්‍යක්ෂ මණ්ඩලය හා ලේකම්වරු පත්කර ගැනිමේ කටයුතු අවසන් වී ඇති අතර 2024 සැප්තැම්බර් 04 දින නව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරන බව වාර්තා කර ඇත.

	ව්‍යවස්ථාවලියෙහි 43(5) වගන්තිය ප්‍රකාරව වාර්ෂික වාර්තා පිළියෙළ කර නොතිබුණි.				
9.	ගාල්ල හා කුරුණෑගල තාක්ෂණික උද්‍යාන සඳහා ඉඩම් අක්කර 31 රූඩ් 02 පර්චස් 23 ක් හා අක්කර 50 ක් ලබා ගන්නා ලෙස 2021 අප්‍රේල් 08 හා 2021 ජූනි 17 දිනැති ජනාධිපති ලේකම්ගේ ලිපි මඟින් දන්වා තිබුණද ඉන් ලබා ගෙන තිබුණේ ගාල්ල සඳහා අක්කර 29 රූඩ් 03 පර්චස් 7.15 ක් සහ කුරුණෑගල සඳහා අක්කර 20 ක් පමණි. තවද, කුරුණෑගල ඉඩමෙහි පිහිටා තිබෙන නිවාස දෙක සඳහා විකල්ප ඉඩම් ලබාදීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙහි අධීක්ෂණය යොමුව නොතිබුණි.	2023	අදාළ වෙනස්කම් වලට හේතු විමසා බැලිය යුතුය.	2021 අප්‍රේල් 08 දිනැති ජනාධිපති ලේකම් කාර්යාලයේ ලිපියෙන් අක්කර 31 රූඩ් 02 පර්චස් 23 ක් අත්පත් කර ගන්නා ලෙස දන්වා තිබුණද, අක්මීමන ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නිකුත් කරන ලද සන්තකය භාර දීමේ සහතිකය අනුව තාක්ෂණ අමාත්‍යාංශයට භාර දී ඇත්තේ අක්කර 29 රූඩ් 03 පර්චස් 7.15 ක් පමණක් බව. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට අදාළව නවතම තොරතුරු සහ නිවාස දෙක ඉදිකිරීම සඳහා විකල්ප ඉඩම් ලබා දීමේ තොරතුරු මෙම අවස්ථාවේ අමාත්‍යාංශය සතුව නොමැති අතර කුරුණෑගල ප්‍රදේශීය ලේකම් කාර්යාලයෙන් තොරතුරු සොයා බලන ලෙස අමාත්‍යාංශයේ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලද බව.	නව අධ්‍යක්ෂ මණ්ඩලය අධීක්ෂණ කටයුතු සිදු කරමින් සිටී.
10.	ගාල්ල තාක්ෂණික උද්‍යානයේ ඉංජිනේරු උපදේශකට 2022 අප්‍රේල් මස සිට	2023	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර	මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයෙන් බිල් පත් ලැබී ඇති බව හා	ලේකම්වරු පත්කර ගැනීමේ කටයුතු අවසන් වී ඇති අතර 2024 සැප්තැම්බර්

	රු.18,173,751 ක් කුරුණෑගල උද්‍යානයේ ඉංජිනේරු උපදේශකට 2023 දෙසැම්බර් 31 දිනට රු.36,188,088 ක් සහ ගාල්ල උද්‍යානයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට 2022 මාර්තු 31 දින රු.950,601,926 ක් ගෙවීමට තිබුණි.		ගෙවීම් පිළිබඳව තහවුරු කිරීම් ලබා ගත යුතුය.	2022 වර්ෂයේ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉල්ලා අස්වීමත් සමඟ සමාගමේ ක්‍රියාකාරීත්වය නැවතීම මේ සඳහා හේතු වී ඇති බව	04 දින නව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරන බව වාර්තා කර ඇත.
11.	ගාල්ල හා කුරුණෑගල තාක්ෂණික උද්‍යාන 2021 වසරේ ආරම්භ කර වසර 2 ක් ගත වී තිබුණද භෞතිකව පරීක්ෂාව සිදු කළ 2024 පෙබරවාරි 05 දින වන විටත් ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. මෙම ප්‍රමාද කිරීම හේතුවෙන් ගාල්ල හා කුරුණෑගල තාක්ෂණික උද්‍යාන කොන්ත්‍රාත් ගිවිසුම්වල 14.6 වගන්ති ප්‍රකාරව කොන්ත්‍රාත්තුව ප්‍රමාද කිරීම මත පිළිවෙලින් රු.236,355,010 ක් හා රු.416,802,172 ක් ප්‍රමාද ගෙවීම් ලෙස ටෙක්නෝ පාර්ක් ඩිවෙලොප්මන්ට් ප්‍රයිවෙට් ලිමිටඩ් සමාගම විසින් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව රජයට සිදුවී ඇති පාඩුව රු.653,157,182 ක් විය.	2023	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ව්‍යාපෘතිය සක්‍රිය වූයේ 2022 අප්‍රේල් දක්වා පමණි. රාජ්‍ය වියදම් පාලනය පිළිබඳ මුදල් අමාත්‍යාංශයේ අංක 03/2022 හා 2022 මාර්තු 26 දිනැති අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල් නොමැතිකම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අත්හිටුවන ලදී. තවද, ටෙක්නෝ පාර්ක් ඩිවලෝප්මන්ට් ප්‍රයිවෙට් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2022 අගෝස්තු 25 දින ඉල්ලා අස්විය. ඒ අනුව ව්‍යාපෘතියේ කිසිදු කටයුත්තක් සිදු වී නොමැති බව. ව්‍යාපෘති සමාගම විසින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ප්‍රමාද කිරීම සඳහා පොළිය ඉල්ලා ඇති බව.	ලේකම්වරු පත්කර ගැනිමේ කටයුතු අවසන් වී ඇති අතර 2024 සැප්තැම්බර් 04 දින නව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරන බව වාර්තා කර ඇත.
12.	නුවරඑළිය හා නුවර යෝජිත තාක්ෂණික උද්‍යාන ඉදිකිරීම් කටයුතු සඳහා තෝරාගෙන	2023	ව්‍යාපෘති වාර්තාවෙහි කාල රාමුවට අනුව කටයුතු	නිරීක්ෂණය සමඟ එකඟ වන බව.	ලේකම්වරු පත්කර ගැනිමේ කටයුතු අවසන් වී ඇති අතර 2024 සැප්තැම්බර්

	තිබුණු සමාගම 2021 නොවැම්බර් 16 හා 2022 පෙබරවාරි 24 දින ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කර තිබුණද එහි ඉදිකිරීම් කටයුතු වාර්තා කරන දිනය වන විටත් කටයුතු ආරම්භ කර නොතිබුණි.		කළ යුතුය.		04 දින නව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරන බව වාර්තා කර ඇත.
13.	අමාත්‍යාංශය වෙත වෙනත් රජයේ ආයතන වෙතින් ලබා දී තිබුණු වාහන 16 ක් අමාත්‍යාංශයට පවරා ගැනීමකින් සහ ලියාපදිංචි අයිතියකින් තොරව 2023 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජන කරමින් පැවතුණි. ඒ අනුව කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා විසින් නිකුත් කළ 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 ට පටහැනිව වත්කම් භාරයේ තබා ගෙන තිබුණි.	2022,2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ගරු රාජ්‍ය අමාත්‍යතුමාට භාවිතයට සුදුසු වාහනයක් අමාත්‍යාංශය සතුව නොමැති වීම මත ඉන් එක් වාහනයක් මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් විසින් ගරු රාජ්‍ය අමාත්‍යතුමා ලබා දී ඇති බව සහ අමාත්‍යාංශය විසින් භාවිතා කරන වාහන විධිමත්ව අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව.	වාහන පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් ඇත.

3.7 නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	අතිරික්තය (ඌනතාවය) රු.	මතය
2021	114,095,064	-	114,095,064	-	තත්ත්වාගණනය කළ
2022	2,445,023,912	1,991,638,969	453,384,943	-	තත්ත්වාගණනය කළ
2023	2,392,624,573	1,766,221,584	625,402,989	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර් තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
	ශීර්ෂය 411- නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය				
1	වෙනත් මුලධන වියදම් යටතේ ඇති යටිතල පහසුකම් සංවර්ධන වැයවිෂයය (2506) යටතේ 2021 වර්ෂය තුල රු.මි.8,280.18 සංවර්ධන කටයුතු සඳහා වැයකර තිබුණි. නමුත් එම ප්‍රාග්ධන වියදම දැරීම තුලින් පැන නැගුණු වත්කම් හෝ කෙරීගෙන යන වැඩ පිළිබඳව ගිණුම් ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි.	2021	මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු බව.	මහා භාණ්ඩාගාරය විසින් හඳුන්වා දී ඇති ගිණුම්කරණ පද්ධතිය තුලින් හෙළිදරව් කිරීමේ පහසුකම් සපයා නොමැති අතර දැනට ක්‍රියාත්මක වන ගිණුම් ක්‍රමවේදයට අනුව අදාල හෙළිදරව් කිරීම් ගිණුම්වල සිදුකර ඇත.	ඒ සඳහා මෙතෙක් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
2	තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ හෝමාගම හයිලෙවල්	2021	ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව	පිළිතුරු ලබා දී නොතිබුණි.	කැබලි අංක 376 හා 377 සඳහා අධිකරණයේ

	මාර්ගයේ සිට කටුවාන හංදිය දක්වා නව ප්‍රවේශ මාර්ගය හයිලෙවල් මාර්ගය හා සම්බන්ධ කිරිමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 713 කට ප්‍රදානය කර තිබුණි. වැඩ ආරම්භ කර වර්ෂ 3 කට අධික කාලයක් ගත වී ඇතත් ඉඩම් කැබලි දෙකක ඉඩම් පවරා ගැනීම හා වන්දි මුදල තක්සේරු නොකිරීම නිසා මීටර් 50 ක පමණ වූ දුර ප්‍රමාණයක මාර්ග සංවර්ධන කටයුතු 2022 පෙබරවාරි 28 දින සිට නතර කර තිබුණි. 2022 අප්‍රේල් 19 දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මෙම මාර්ගය පවරා තිබුණු නමුත් එම මාර්ගයේ ඉදිකිරිම් සඳහා රු.මි.540.83 ක් වැය කර තිබුනද ප්‍රධාන මාර්ගය හා සම්බන්ධ කිරීමට එම නිම නොකල මීටර් 50 ක් වූ දුර ප්‍රමාණය හේතුවෙන් මාර්ගය මහජන උපයෝජනය සඳහා යොදා ගැනීමට නොහැකි වී තිබුණි.		කටයුතු කිරීමෙන් අනතුරුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (ආ) වගන්තිය අනුව කටයුතු කල යුතුය.		පවතින නඩු විභාග වන බැවින් ඒකී නඩු කටයුතු අවසන් වූ වහාම ඉතිරි මීටර් 50 ක මාර්ග කොටස සංවර්ධනය කිරීමට පියවර ගැනීමට නියමිතය.
3	බස්නාහිර පළාත් ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සැහැල්ලු දුම්රිය ධාවනපථ 04 න් 03ක් පෞද්ගලික රාජ්‍ය හා හවුල්කාර (PPP) පදනම මත සිදු කිරීමට සැලසුම් කර තිබුණි. ප්‍රවාහන පද්ධතිය පිළිබඳව 2017 වර්ෂයේ සක්‍යතා අධ්‍යයනයක්, පාරිසරික බලපෑම පිළිබඳ ඇගයීමක් හා සමාජීය බලපෑම පිළිබඳ	2021	ව්‍යාපෘති සැලසුම් කල පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.	පිළිතුරු ලබා දීමට කල් ඉල්ලා තිබුණි.	මෙම ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට කරගෙන යාමට රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා තෙක් නතර කර ඇත

	ඇගයීමක් සඳහා රු.මි. 453.58 ක් වැය කර තිබුණි. කැබිනට් අනුමැතිය අනුව අමාත්‍ය මණ්ඩලය ප්‍රසම්පාදන කමිටුව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස ආයෝජිකයින්ගෙන් අයදුම්පත්‍ර කැඳවා යෝජනා ඉදිරිපත් කිරීමට මාස 6ක කාලයක් ලබා දී තිබුණි. ඉදිරිපත් වූ ආයෝජකයන් 17 දෙනෙකුගේ ඇගයීම් කටයුතු විදේශ උපදේශන සමාගමකට ලබාදී රු. මිලියන 45.16 ක් ගෙවා තිබුණි. නමුත් රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත මෙම ව්‍යාපෘතිය නවතා දමා තිබූ අතර මෙම ව්‍යාපෘති කාර්යාලය 2022 මැයි 31 දින වසා දමා තිබුණි. ව්‍යාපෘති කාර්යාලය සඳහා 2017 වර්ෂයේ සිට 2020 ඔක්තොම්බර් මස දක්වා රු. මිලියන 196.65 ක් මෙම අමාත්‍යාංශයෙන් වැය කර තිබුණි. ඒ අනුව එකතුව රු.මිලියන 695. 39 ක් වූ වියදම් නිෂ්කාර්ය වී තිබුණි.				
4	මහකොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ දියවන්නා ඔය පුළුල් කිරීම සඳහා ඉඩම් පවරා ගැනීමේදී වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් පවරාගෙන තිබුණු එක් ඉඩමකට හිමිකම් කියූ විදේශීය සමාගමක් විසින් අන්තර් ජාතික ආයෝජන ආරවුල් සමථ කිරීමේ මධ්‍යස්ථානය වෙත ශ්‍රී ලංකා රජයට එරෙහිව 2016 ජුලි 07 දින නඩු	2021	මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බව .	පිළිතුරු ලබාදී නොතිබුණි.	මුදල් අයකර ගැනීමට අදාල කරුණු පිළිබඳ මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවක් සිදුකර ඉදිරි තීරණ ගැනීමට සැලසුම් කර ඇත. ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන්

	පවරා තිබුණි. ගොනුකල නඩුව සඳහා විදේශ නීති උපදේශකයන්ගේ සහාය ලබාගැනීම වෙනුවෙන් සහ ඒ වෙනුවෙන් පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ විදේශ ගමන් වියදම් ද ඇතුළුව මුළු වියදම රු.මි.405 ක් වූ අතර මෙම වටිනාකම තුල ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මි. 25.58 ක් ද ඇත. 2020 මාර්තු 05 හා 2020 දෙසැම්බර් 02 දිනැති නඩු තීන්දු අනුව විදේශීය සමාගම විසින් ශ්‍රී ලංකා රජයට පවුම් 387,162.34 ක් ගෙවිය යුතුව තිබුණි. විදේශීය සමාගම මෙම මුදල නොගෙවීම හේතු කොට ගෙන එම මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග 2022 ඔක්තෝබර් 31 දින දක්වා අමාත්‍යාංශය ගෙන නොතිබුණි.				නීතිපති දෙපාර්තමේන්තුව විසින් මේ වනතෙක් තීරණයක් දැනුම් දී නැත.
5	කොල්ලුපිටිය සිට දෙහිවල ඇල දක්වා යෝජිත විනෝදාස්වාද මුහුදු වෙරළ තීරය නිර්මාණය කිරීම 2017 අප්‍රේල් 30 දින ආරම්භ කර 2023 දෙසැම්බර් 31 දින නිම කිරීමට සැලසුම් කර තිබූ අතර මේ සඳහා ඇස්තමේන්තුගත වියදම රු.මි.1820.78 ක් වි ය. ව්‍යාපෘති සක්‍යතා අධ්‍යයන වාර්තාව හා පාරිසරික බලපෑම් වාර්තාව 2020 දෙසැම්බර් 31 වන විට	2021	සැලසුමට අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදුකරන අතරතුර රාජ්‍ය මුදල් වැය කිරීමේදී අපේක්ෂිත ඉලක්ක ලගා කිරීමට කටයුතු කලයුතුය.	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල ව්‍යාපෘති කාර්යාලය වසා දැමීමෙන් පසු ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යාම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට පවරා ඇත	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල ව්‍යාපෘති කාර්යාලය වසා දැමීමෙන් පසු ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යාමට නාගරික සංවර්ධන අධිකාරීය වෙත පවරා ඇත. සංවර්ධන අධිකාරීය විසින් ගත් ක්‍රියාමාර්ග

	අවසන් කර තිබූ අතර මේ සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනය (NARA) වෙත රු.මි.117.86 ක් ගෙවා තිබුණි. අමාත්‍යාංශ ව්‍යාපෘති ඒකකය 2020 ඔක්තෝම්බර් 20 දින වැසීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ නාගරික සංවර්ධන අධිකාරියට පවරා තිබූ අතර මෙතෙක් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන යාම සඳහා 2017 සිට 2020 දක්වා රු.මි.99.37 ක් වැයකර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 47 ක්ව පැවතුණි.				පිලිබඳව වාර්තා ඉ දිරිපත් කර නැත.
	ශීර්ෂය -123- නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය				
1	අමාත්‍යාංශය විසින්, වෙනත් මූලධන වියදම් යටතේ ඇති යටිතල පහසුකම් සංවර්ධන වැය විෂයය **(2506)** මගින් **2021** වර්ෂය තුල රු. මිලියන 15,718.38 ක් සංවර්ධන කටයුතු සඳහා වැයකර තිබුණි. නමුත් එම වියදම දැරීම තුලින් පැන නැගුණු වත්කම් හෝ කෙරීගෙන යන වැඩ පිලිබඳව ගිණුම් ප්‍රකාශන තුල හෙලිදරව් වී නොතිබුණි.	2021	ප්‍රාග්ධන වියදම් දැරීම තුලින් පැන නැගුණු වත්කම් හෝ කෙරීගෙන යන වැඩ පිලිබඳව හඳුනාගැනීම සඳහා ක්‍රමවේදයක් හඳුනාගත යුතුය.	මහාභාණ්ඩාගාරය විසින් හඳුන්වා දී ඇති ගිණුම්කරන පද්ධතිය තුලින්, මේ පිලිබදව හෙලිදරවු කිරීමේ පහසුකම සපයා නොමැත.	ඒ සඳහා මෙතෙක් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
2	නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින්	2021	රේඛිය අමාත්‍යාංශයේ	පිළිතුරු සපයා නැත	මු.රෙ.104(1) පරීක්ෂණය

	සීමාසහිත රියල් එස්ටේට්එක්චේන්ජ් (පුද්ගලික) සමාගම පවරා ගැනීමේදී සිදුව තිබූ මුල්‍ය වංචාවට අදාලව නීතිපති විසින් 2021 ඔක්තෝබර් 28 දින ලබාදුන් උපදෙස් අනුව අලාභය සම්බන්ධව අදාල පුද්ගලයින්ට එරෙහිව නඩු කටයුතු පැවරිය හැකිද යන්න සලකා බැලීම සඳහා මුදල් රෙගුලාසි 103 යටතේ අදාල රේඛීය අමාත්‍යාංශය විසින් පියවර ගතයුතු බව සඳහන් වුවද එම අධිකාරිය අයත් රේඛීය අමාත්‍යාංශය වන නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් ඒ පිළිබඳව 2022 ජුනි වන විටත් පියවර ගෙන නොතිබුණි.		මැදිවත්වීම මත මෙය නිරාකරණය කිරිමට කටයුතු කල යුතු බව		පැවැත්වීම සඳහා කම්ටුවක් පත්කර ඇත.
3	සුබිත පුරවර නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බුලත්සිංහල ඇගල්ඔය බහු මාදිලි ගොඩනැගිල්ල ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය වෙත 2016 අගෝස්තු 16 දින රු. මිලියන 41 ක කොන්ත්‍රාත් වටිනාකමකට ප්‍රදානය කර තිබුණි. නමුත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරිමෙන් අනතුරුව අදියර 03කට කොටස්කර කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 153 ක් දක්වා සියයට 272 කින් වැඩිකර තිබුණි. තවද ශ්‍රවණාගාරය සඳහා ආසන සවිකිරීම,	2022	අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගෙන ඉදිකිරීම් සැලසුම් කල යුතු වන අතර, ඉදිකරන ලද ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත හැකි පරිදි සම්පූර්ණ කර අදාල අංශ වෙත පැවරීමට කටයුතු කළ යුතු බව.	2021 නොවැම්බර් 16 දින සිට වසර 30 ක කාලයක් සඳහා පාඨමාලා පැවැත්වීම සඳහා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත අවබෝධතා ගිවිසුමක් යටතේ ලබා දී ඇත.	ගොඩනැගිල්ල අංගසම්පූර්ණ ලෙස නිම නොකිරීම හේතුවෙන් පූර්ණ වශයෙන් ප්‍රයෝජනයට නොගන්නා අතර පන්ති පැවැත්විය හැකි ස්ථාන පමණක් ප්‍රයෝජනයට ගනු ලැබේ .

	වායුසමනය කිරීම, ආලෝකකරණය, විදුලි සෝපානය, වේදිකා තිර දැමීම ආදී වැඩකොටස් ආවරණය නොකර ගොඩනැගිල්ලේ භුක්තිය බුලත්සිංහල ප්‍රාදේශීය සභාව වෙත 2018 ඔක්තෝබර් 20 දින භාර දී තිබුණු නමුත් ගොඩනැගිල්ලේ අසම්පූර්ණභාවය හේතුවෙන් ප්‍රයෝජනයකට ගත නොහැකිව පැවතුණි. කෙසේ වුවද 2021 නොවැම්බර් 16 දින වෘත්තීය පුහුණු අධිකාරිය වෙත අවබෝධතා ගිවිසුමකින් ගොඩනැගිල්ල පවරා දී තිබුණි. මේ අනුව ගොඩනැගිල්ල ඉදිකර වසර 04 ක් පමණ ගතවී තිබුණද එම ගොඩනැගිල්ල ඉදිකිරීමේ අපේක්ෂිත කාර්යයන්ට යොදා ගෙන නොතිබුණු බව 2023 මාර්තු 03 දින සිදු කරන ලද ස්ථානීය විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.				
4	රු.මිලියන 563 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2018 ඔක්තෝබර් 26 දින ප්‍රදානය කර තිබුණු පිටිපන තලගල මාර්ගය අදියර 1 සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඉදිරි වැඩකටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා 2019 මාර්තු 06 සහ 2020 නොවැම්බර් 27 දින එකතුව රු.මිලියන 114 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් ගෙවා	2022	ප්‍රමුඛ අවශ්‍යතාවයන් මත ව්‍යාපෘති හඳුනා ගැනීම හා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම සඳහා නීත්‍යානුකූල ලෙස කටයුතු කිරීම හා ඉලක්කගත කාලයන් තුළ ව්‍යාපෘති නිමකර	ඉඩම් හිමිකරුවන් විසින් එකී ඉඩම් වලට ඇතුලත් වී සංවර්ධන කටයුතු සිදු කිරීමට විරෝධතාවය එල්ල කීරීම හේතුවෙන්, රජයේ ඉඩම් පනතේ 14(2) (බී) වගන්තිය යටතේ ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා හෝමාගම මහේස්ත්‍රාත්	නඩුව තවමත් පවතී.

	තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (ආ) ඡේදය ප්‍රකාරව ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කළහැකි බවට කරුණු සනාථ කර ගැනීමෙන් තොරව අදාල කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු බැවින් ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේදී, ඉඩම් අත්පත්කර ගැනීම හා වන්දි ගෙවීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන්ගෙන් විරෝධතා මතු වී තිබුණි. එම විරෝධතා හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණු බැවින් ආවස්ථික පිරිවැයක් සහිතව අරමුදල් භාවිතා කරමින් ඉදිකිරීමට නියමිත මාර්ග ඉදිකර අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයාට ලබා දීමට නොහැකි වී පැවතුණි.		අදාළ ප්‍රතිලාභ මහජනතාවට ලබාදීම අමාත්‍යාංශයේ වගකීම වන බව.	අධිකරණයේ අංක 49528 හා 49529 යටතේ නඩු පවරා ඇත.	
5	අමාත්‍යාංශයේ නිවාස අංශය විසින් 2017 - 2020 කාලපරිච්ඡේදය තුළදී ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු. මි. 4,989 ක් වූ නිවාස ව්‍යාපෘති 10ක් යටතේ නිවාස 27,555 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වනවිට ඒ සඳහා රු.මි. 4,025 ක් වැය කර තිබුණු අතර ඉන් නිවාස 5,604 ක පමණක් වැඩ නිමකර තිබුණි. ප්‍රගති වාර්තා අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 25	2022	ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘතිවල අත්‍යවශ්‍යතාවය අනුව අරමුදල් සපයාගෙන ව්‍යාපෘති සම්පූර්ණ කර ප්‍රතිලාභීන්ට ලබා දිය යුතු බව.	2020 වර්ෂයේ සිට එහි අවිච්ඡේද ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන, අක්මුදල් නොලැබීම හා ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉහළ යාම නිසා නිවාස ඉදි කිරීමේ පිරිවැය වැඩි වී ඇත. ඒ අනුව නිවාස ඒකකයක් සඳහා ලබාදෙනු ලබන මුදල නිවසේ සම්පූර්ණ වැඩ අවසන් කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ. ඒ අනුව අතිරේක මුදල් ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් ප්‍රගතියෙහි වෙනසක් සිදුවී නොතිබුණි.

	ට අඩු නිවාස ව්‍යාපෘති 07ක් ද සියයට 25ත් 50ත් අතර වූ ව්‍යාපෘති 02 ක් ද සියයට 75 ට වැඩි ව්‍යාපෘති එකක් ද වී තිබුණි. මෙම ව්‍යාපෘති යටතේ ඉදිකළ යුතු අනෙකුත් නිවාස වල ඉතිරි වැඩ සම්පූර්ණ නොකොට අතරමග නවතා දමා තිබුණි.				
6	2030 වර්ෂය වන විට සියලු දෙනාටම ප්‍රමාණවත් ආරක්ෂිත නිවාස ලැබීම හා වාසස්ථාන වැඩිදියුණු කිරීම තිරසර සංවර්ධන ඉලක්කයක් ලෙස හඳුනාගෙන තිබුණද **2022** දෙසැම්බර් 31 දිනට අවසානයේදි ලබාගෙන තිබු ප්‍රගතිය ඉලක්කගත ප්‍රමාණයෙන් 8කට වඩා පහළ මට්ටමක පැවතුණි.	2022	සපුරාගත හැකි ඉලක්කයන් හඳුනාගතයුතු බව හා ඉලක්කළගා කර ගැනීමට කටුයුතු කිරීම කළමනාකරණ යේ වගකීම වන බව	නව ඉදිකිරීම් තාවකාලිකව නැවැත්වූ අතර අඩක් නිමකල ව්‍යාපෘති ප්‍රතිපාදන හා අක්මුදල් ප්‍රමාණවත් පරිදි ලබානොදීම නිසා අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට නොහැකි විය.	මේ දක්වා ලබාගෙන ඇති ප්‍රගතිය 0% - 49% අතර විය.
7	2021 හා 2022 යන වර්ෂවලදී පුනරාවර්තන වැය විෂයයන් 45 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 45 ක් වෙනුවෙන් ප්‍රතිපාදිත රු. මිලියන 125 ක් හා රු. මිලියන 28,933 ක මුදලින් පිලිවෙලින් රු.මිලියන 74 ක් හා රු.මිලියන 10,404 ක් ඉතිරිවී තිබුණි.	2021 2022	අවශ්‍ය ප්‍රතිපාදන නිවැරිදිව පුරෝකථනය කල යුතු බව.	අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී සත්‍ය වශයෙන්ම ඇතිවේයැයි අපේක්ෂා කරන පුරෝකථනයන් මත ඇස්තමේන්තු පිළියෙල කිරීම සිදුකරනු ලැබේ.	2023 වර්ෂය තුලදිද, මෙලෙස ප්‍රතිපාදිත මුදලින් වැඩි ප්‍රතිශතයක් ඉතිරිවී තිබුණි.
8	සංශෝධිත ගිවිසුම අනුව හෝලුවාගොඩ කෘෂි පාරිසරික උද්‍යාන ව්‍යාපෘතිය 2021 අගෝස්තු 21 දින ආරම්භ කර 2023 අගෝස්තු 30 දින නිම කිරීමට සැලසුම් කර තිබුණු නමුත් 2023 දෙසැම්බර් 31	2023	විධිමත් අනුමැතියක් මත ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බව.	65% කට වඩා වැඩ ප්‍රමාණයක් ඒ වන විට නිමකර තිබූ බැවින්, වැඩ නිම නොකිරීම මත ව්‍යාපෘතිය අතහැර දැමුවහොත් වන පාඩුව සලකා බලා මෙහි ඉදිකිරීම් කටයුතු 2023	අනුමැතිය ලැබී නොමැත.

	දින වන විට මෙම ව්‍යාපෘතියේ මුළු වියදම රු.මිලියන 450.56 ක් එනම් ගිවිසුම්ගත මුදල මෙන් සියයට 131 ක් වී තිබුණු අතර මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ජාතික සැලසුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින්ද තොරව සිදුකර තිබුණි.			දක්වා ක්‍රියාත්මක කරන ලදී.	
9	ඇස්තමේන්තුගත මුදල රු.මි. 19,127 ක් වූ අරුවක්කාලු සනීපාරක්ෂක කසළ රැඳවුම් ව්‍යාපෘතිය 2018 ජනවාරි 01 දින ආරම්භ කර 2019 ජුනි 30 වන විට අවසන් කිරීමටද පැකේජ 04 ක් යටතේ ක්‍රියාත්මක කිරීමටද සැලසුම් කර තිබුණි. එම ව්‍යාපෘතියේ කසල හුවමාරු මධ්‍යස්ථානය , සනීපාරක්ෂක බිම් පිරවුම ඉදිකිරීම සහ දුම්රිය මාර්ග දීර්ඝ කිරීම යන පැකේජ 03 හි ඉදිකිරීම් කටයුතු චීන සමාගමක් වෙත පවරා තිබුණු නමුත් එම ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිම කර නොතිබුණි. අවශ්‍ය කරන යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේ පැකේජය යටතේ**,** දුම්රිය එන්ජින් කට්ටල 04 ක් රු.මිලියන **8.27** ක් වැයකර 2019 දෙසැම්බර් 31 වන විට ආනයනය කර වසර 03 ගතවී තිබුණු අතර බහාලුම් පෙට්ටි 94 ක් ඇ.ඩො.මි. 0.8ක් වැයකර 2022 අප්‍රේල් 22 දින ආනයනය කර ගබඩා කර	2023	ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයාට කඩිනමින් ලබාදීම සඳහා පියවර ගත යුතු බව.	ආයතන 3 ක් EOI ඉදිරිපත් කල අතර ඒවා ඇගයීමෙන් අනතුරුව නැවත 2024 මාර්තු 22 දින CANC ඉදිරිපත් කරන ලදී. ඒ අනුව යෝජනා සඳහා ඉල්ලීම් (RFP) කැඳවීම සඳහා මේ වන විට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.	වර්තමානය වන විට ව්‍යාපෘතියේ ඇස්තමේන්තුග ත පිරිවැය රු.මි. 33,237 කි. ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සිදුකිරීමට හා තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා දැනට කසල කළමනාකරණ කටයුතු සිදු කරන රාජ්‍ය ආයතන සමඟ සාකච්ඡා කර ඒ අය මඟින් අදාළ මෙහෙයුම් කටයුතු සිදු කිරීමට උත්සහ කලද එම රාජ්‍ය ආයතන කිසිවකුට ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍යමය ධාරිතාවක් නොමැති බැවින් එයද අසාර්ථක වී ඇත.

	තිබුණි. දුම්රිය වැගන් 34 ක් ඇ.ඩො.මි.2.3ක වටිනාකමකට ඉන්දියන් සමාගමකින් ආනයනය කර ගැනීම සඳහා 2019 ඔක්තෝබර් 21 දින ගිවිසුම් අත්සන් කර තිබුණද අදාල ආයතනය විසින් ගිවිසුම ප්‍රකාරව ව්‍යුහාත්මක සංකල්පීය සැලැස්ම ඉදිරිපත් නොකිරීම නිසා ගිවිසුම නිෂ්ක්‍රිය කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂාවසානය වන විටද දුම්රිය වැගන් සපයාගැනීමට නොහැකි වී තිබුණි. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය සඳහා 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 24,016 ක් වැය කර ලබා තිබූ භෞතික ප්‍රගතිය සියයට 92 ක් විය. මෙහි කටයුතු නිම කර රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වය මත මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට සැළසුම්කර තිබුණ ද, අමාත්‍යාංශය විසින් මෙතෙක් එය ක්‍රියාත්මක කර නොතිබුණි.				
10	මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ මැදි ආදායම් ලාභීන්ගේ දායකත්වය මත නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති 12ක් 2020 හා 2021 වර්ෂවලදී ආරම්භ කර තිබුණි. නිවාස ඒකක 2,939කින් යුත් නිවාස ව්‍යාපෘති 09 ක් සඳහා 2023 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන11,353.15 ක වියදමක් දරා තිබුණි. එසේ	2023	ව්‍යාපෘතිය සම්පූර්ණ කර අපේක්ෂිත ප්‍රතිලාභ ලඟා කරගත යුතු බව.	ව්‍යාපෘති 04 ක් ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 උපදෙස් අනුව නතර කර ඇත. ව්‍යාපෘති 02ක නිවාසවල මිල ගණන් ඉහළ යාම හේතුවෙන් නිවාස මිලදී ගැනීමට ගැණුම්කරුවන් ඉදිරිපත් නොවීය. එක් ව්‍යාපෘතියක වැඩ 2024 මැයි 05 දින අවසන් කර ඇත. එක්	දැනට පවතින තත්ත්වය අනුව ඉතිරි ඉදිකිරීම් සිදු කිරීමට හැකියාවක් නොමැති බව දන්වා ඇත.

	වුවද, 2022 දෙසැම්බර් 31 දිනෙන් පසු මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක තත්වයේ නොවුණි.			ව්‍යාපෘතියක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර අඩුපාඩු සකස් කිරීම සිදු වෙමින් පවතී.	
11	නාගරික පුණර්ජීවන ව්‍යාපෘතිය යටතේ අඩු අදායම් ලාභීන් වෙනුවෙන් කොළඹගේ මාවත නිවාස 615 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 2,546.10 ක ඇස්තමේන්තු වටිනාකමක් මත 2014 ඔක්තොම්බර් 30 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. නමුත් 2020 නොවැම්බර් 20 දින වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 39 කදී වැඩකටයුතු අත්හිටුවා තිබුණි. එදින වන විට සංස්ථාව විසින් රු.මිලියන 1,255.30 ක් හෙවත් මුළු වටිනාකමින් සියයට 49 ක් වැය කර තිබුණි. වසර 3 ක සිට එමගින් කිසිදු ඵලදායි ප්‍රයෝජනයක් ලබාගෙන නොතිබුණු බැවින් උක්ත ව්‍යාපෘතිය සඳහා දරන ලද රු.මිලියන 1,255.30 ක මුදල නිශ්කාර්ය වී තිබුණි.	2023	ව්‍යාපෘතිය සම්පූර්ණ කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා කරගත යුතු බව.	අදහස් දක්වා නොමැත.	කොළඹගේ මාවත ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා අරමුදල් වෙන්කරන ලෙස 2024 අයවැය මඟින් ද ඉල්ලීම් කර ඇති අතර මෙතෙක් ප්‍රතිපාදන ලැබී නොමැත. තවද 2025 අයවැය සඳහා ද ප්‍රතිපාදන වෙන් කිරීමට ඉල්ලා ඇත.
12	යාපනය නගර සභා ගොඩනැගිල්ල නැවත ගොඩනැගීම සඳහා රු.මිලියන 2,142.48 ක කොන්ත්‍රාත් වටිනාකමකට ඉංජිනියරිං සර්විසස් පුද්ගලික සමාගම වෙත පවරා තිබුණි. ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් 10 දින ආරම්භ කර 2021 ඔක්තෝබර් 09 දින නිම	2023	මහා පරිමාණ ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය සහ වේගවත් කිරීම පිළිබඳ කමිටුවේ (RAMP) නිර්දේශ ක්‍රියාත්මක කල යුතු බව.	RAMP තීරණය මත මෙම ව්‍යාපෘතිය යාපනය නගර සභාව විසින් භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් RAMP කමිටුව විසින් නැවත රැස්වීමක් කැඳවන ලදී. එහිදී ව්‍යාපෘතිය නිම කිරීම සඳහා සුදුසු විසඳුමක් සලකා බලන	උතුරු පළාත් ආණ්ඩුකාරතුමා ඉතිරි කටයුතු කරගෙන යාම සඳහා 2025 මුදල් වර්ෂය සඳහා අයවැයෙන් මුදල් වෙන් කරන ලෙස ඉල්ලීමක් කර

	කිරීමට සැලසුම් කර තිබුණු නමුත් නියමිත කාල සීමාව තුල ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකිවී තිබුණු බැවින් 2024 ඔක්තෝබර් 09 දින දක්වා දින 1,125 ක දින දීර්ඝ කිරීම් 04 ක් ලබා දී තිබුණි. තවද 2023 දෙසැම්බර් 31 වන විට එහි භෞතික කාර්යසාධනය සියයට 66 ක් වූ අතර මූල්‍ය කාර්යයසාධනය රු.මිලියන 1,636.15 ක් විය. මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් විටිනාකම රු. මිලියන 3,769 දක්වා රු.මිලියන 1,627කින් වැඩිකිරීමට කටයුතු කර තිබුණි. කොන්ත්‍රාත් පරිපාලන සහ උපදේශන ඒකකවල අසාර්ථක අධීක්ෂණය ඊට හේතු වී තිබුණි. මහාපරිමාණ ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය සහ වේගවත්කිරීම(RAMP) සම්බන්ධව 22/1286/604/022 හා 2022 සැප්තැම්බර් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලබාදී ඇති නියෝග පරිදි මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් නිම කිරීමේ වගකීමත් සමගම සමස්ථ ගොඩනැගිල්ල යාපනය නගර සභාවට පැවරීමට තීරණය කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.			ලෙස දැනුම් දෙන ලදී. ඒ අනුව අදියර 1 වශයෙන් හඳුනාගත් කොටස පමණක් නිමකර සම්පූර්ණ ව්‍යාපෘතියම යාපනය මහනගර සභාවට භාරගැනීමට එකඟත්වයට භාරදීමට සැලසුම් කරන ලදී.	තිබේ. එම ඉල්ලීම පිළිබඳව උපදෙස් පතා ලිපියක් ජාතික මෙහෙයුම් මැදිරිය (NOR) වෙත යොමුකිරිම සඳහා අමාත්‍යාංශ ලේකම්තුගේ අත්සන සඳහා යොමුකර ඇත .
13	කඩ කාමර 258 ක් සහිත පානදුර පොදු වෙළෙඳපොල සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව, මූලික ලංසු	2023	ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා අධික්ෂණය කෙරෙහි	මෙම ව්‍යාපෘතිය මේ වන විට නිසියාකාරව ක්‍රියාත්මක වෙමින් පවතින අතර, නිසි ලෙස අධ්‍යයනය	සැලසුම් කල කාලය තුල කොන්ත්‍රාත්තුව නිම කිරීමට නොහැකිවී

	සුදුසුකම් පරීක්ෂාවේදී ප්‍රතික්ෂේප වූ කොන්ත්‍රාත් ආයතනය වෙත රු. මිලියන 385 (වැට් රහිත) කට 2021 සැප්තැම්බර් 23 දින පිරිනමා තිබුණු අතර 2023 මාර්තු 24 දින අවසන් කල යුතුව තිබුණි. නමුත් ඒදිනට වැඩ අවසන් නොකිරීම නිසා 2024 ජනවාරි 15 දින දක්වා දින 297 ක් දින දීර්ඝ කිරීම් ලබාදී තිබුණි. ඉදිකිරීම් කටයුතු නිසි පරිදි අධීක්ෂණය හා මෙහෙයවීම කෙරෙහි අමාත්‍යාංශයේ අවධානය යොමුවී නොතිබුණු බැවින් සංශෝධිත කොන්ත්‍රාත්කාලය තුළ දී ද ඉදිකිරීම් කටයුතු නිම කළ නොහැකි වී තිබුණි.		අමාත්‍යාංශයේ අවධානය යොමු කර නියමිත කාලය තුල වැඩ නිමකරවා ගැනීමට කටයුතු කල යුතු බව.	කරන ලද කාලය දීර්ඝ කිරීමේ ඉල්ලීම අනුමැතිය සඳහා යොමු කර ඇත.	ඇත. මූලික අදියරේ කටයුතු සිදුකරමින් පවතී.
14	රු. මිලියන 8,413 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ අඩු ආදායම් පවුල් සඳහා නිවාස ඒකක 14,022 ක් "ඔබට ගෙයක් රටට හෙටක් ව්‍යාපෘතිය" යටතේ ඉදිකිරීමට යෝජිත විය. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2022 දෙසැම්බර් වන විට අවසන් කල යුතු වුව ද රු.මිලියන 7,704.95 ක් වැය කර 2023 දෙසැම්බර් 31 දින වන විට ද සියයට 79 ක ප්‍රගතියක් හෙවත් නිවාස ඒකක 7,744 ක් පමණක් ඉදිකර තිබුණු අතර නිවාස ඒකක 75 ක් ඉදිකිරීම අත්හිටුවා තිබුණි.	2023	සැලසුම් කළ පරිදි කාලීනව ව්‍යාපෘති සම්පූර්ණ කල යුතු බව.	භාණ්ඩාගාරයෙන් නිසි පරිදි ප්‍රතිපාදන නොලැබීම මත නියමිත වසර තුළ සම්පූර්ණ නිවාස ගණන නිමකල නොහැකි විය.	2024 සැප්තැම්බර් 30 දින වන විටද, ප්‍රගතිය වෙනස් වී නොතිබුණි.

15	2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2(i) ඡේදය ප්‍රකාරව, ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරනු ලබන වාහන, තම ආයතනයේ නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය හිමි ආයතනය වෙත විධිමත්ව පැවරීමට කටයුතු කල යුතු වුවද, නීත්‍යානුකූල හිමිකම අමාත්‍යාංශය සතු නොවූ රු. මිලියන 414.81 ක් වටිනාකමැති වාහන 31 ක් අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලැබීය.	2023	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු බව.	එම වාහන වල හිමිකම් පවරා ගැනීමේ ගැටළු පැවතීම නිසා නීත්‍යානුකූල හිමිකම පවරා ගැනීමට ප්‍රමාද වී ඇත.	වාහන 21 ක හිමිකම තවමත් නිරවුල් වී නැත .
16	සියක් නගර වැඩසටහන යටතේ අමාත්‍යාංශ ප්‍රතිපාදන මත සිදු කරන ලද රු.මිලියන 8,845 ක් වටිනා ව්‍යාපෘති 29 ක් නීත්‍යානුකූලව අදාල ආයතනයන්ට භාර දී නොතිබුණි. එමෙන්ම එම වත්කම් කිසිදු ආයතනයක ගිණුම් ප්‍රකාශන වල ඇතුළත් නොවීම හේතුවෙන් මෙම වත්කම් ගිණුම්වලින් අත්හැරීමට හැකියාවක් පවතුණි.	2023	වත්කම් නීත්‍යානුකූලව භාරදිය යුතු බව.	මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අවස්ථාවේ අදාල ආයතන භාර ගැනීමට එකඟතාව ලබා දී ඇතත් ඉදිකිරීමේ අවසන් කිරීමෙන් පසු යම් යම් ගැටලු ඉදිරිපත් කරමින් එම ව්‍යාපෘති භාර ගැනීම ප්‍රමාද කරමින් සිටී.	මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නැත.
17	2019 සැප්තැම්බර් 30 වැඩ අවසන් කළ වටිනාකම රු. මිලියන 370 ක් වූ මහර පරිපාලන හා වාණිජ සංකීර්ණයේ ඉදිරිපස කඩකාමර සහ සියලු පහසුකම් සහිත භෝජනාගාරය වසර 05ක් පමණ නිශ්කාර්යව	2023	ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අඩුපාඩු නිවැරදි කර එය ඵලදායීව උපයෝජනය කර රජයට වාසිදායක වන පරිදි ආදායම් උත්පාදනය කළ	මහර ප්‍රදේශයේ එවකට පැවති අඩුපාඩුවක් වූ රාජ්‍ය ආයතන සහ පොදු කටයුතු සඳහා විධිමත් ස්ථානයක් නොමැතිවීමේ අඩුව මගහරවා ගැනීමට එවකට ප්‍රාදේශීය	මහර ප්‍රාදේශීය සභාවේ ඉල්ලීම සලකා බලා වසර 30 ක කාලයක් සඳහා පරිපාලන හා වානිජ සංකීර්ණය කළමනාකරණ

පැවතුණි. සෝපාන යන්ත්‍ර දෙක සහ සියලු පහසුකම් සහිත ආසන 428 කින් සමන්විතව ශ්‍රවනාගාරය වැඩ නිමකල දින සිට කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. ගොඩනැගිල්ලේ අකුණු සන්නායක මෙන්ම විද්‍යුත් පරිපථ කිසියම් පිරිසක් විසින් ගලවා ගෙන ගොස් තිබුණි. 2023 ජූනි 06 දින කොන්ත්‍රාත්තුවේ රඳවුම් මුදල් වෙනත් ව්‍යාපෘති වෙනුවෙන් ගෙවිය යුතු බිල්පත් හා රඳවුම් මුදල් වෙනුවෙන් හිලව්කර තිබුණි. මෙකී ගොඩනැගිල්ල ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතීම රාජ්‍ය මුදල් අකාර්යක්ෂම ලෙස පරිහරණය කිරීමක් වන අතර මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.	යුතු බව.	සභාව සතු ගොඩනැගිල්ල පැවති ස්ථානයේ බහු කාර්යය ගොඩනැගිල්ලක් ඉදිකිරිමට යෝජනා කර ඇත.	මණ්ඩල අනුමැතියට යටත්ව ප්‍රාදේශීය සභාව වෙත පැවරීමට එකඟතාවය පලකර ඇත.

3.8 විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	අතිරික්තය (ඌනතාවය)රු.	මතය
2021	-	-	-	-	තත්ත්වාගණනය නොකළ
2022	-	-	-	-	තත්ත්වාගණනය නොකළ
2023	-	-	-	-	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	මෙ.වො 31 ක ධාරිතාවක් ජාතික විදුලි ජාලයට ලබාගැනීමේ අරමුණින් ක්‍රියාත්මක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 19,288 ක් වූ මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කලද අවුරුදු 3 ක ප්‍රමාද කාලයකින් පසුව මෙහි වැඩ කටයුතු 2018 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. එසේම ලබාගත් ණය මුදල වෙනුවෙන් රු.මිලියන 28 කට ආසන්න මුදලක් (USD 177,931) කැපකිරීම් ගාස්තු ලෙස (commitment charges) 2017 වර්ෂයේදී ගෙවීමට සිදුව තිබුණි. ව්‍යාපෘතියේ ණය කාලය 2024 ජුනි මස අවසන් වන අතර	2021, 2022, 2023	නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති නිම කිරිමට කටයුතු කර අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගත යුතුය.	ඒක දේශීක මත්සයකු හමුවීම, මහවැලි අධිකාරියේ දැනුම් දීම මත ජලාශයේ වේල්ලේ සැලසුම නැවත වෙනස් කිරීමට සිදුවීම පාරිසරික අනුමැතීන්ගේ ප්‍රමාදය, කොවිඩ් වසංගත තත්වය සහ ඉන් පසු ඇතිවූ ආර්ථික අර්බුදය හමුවේ ප්‍රමාද වූ මෙම ව්‍යාපෘතිය මේ වන විට 73% භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇති අතර රු. මිලියන 16,844 ක මුදලක් වැය කර ඇත. ව්‍යාපෘතියේ ණය පහසුකම අවසන් වන 2024 ජුලි 13 දිනට අපේක්ෂිත භෞතික ප්‍රගතිය 85% කි. ඉතිරි වැඩ සඳහා අරමුදල් සම්පාදනයට ආසියානු	2024.06.30 දිනට ප්‍රගතිය සියයට 75 ක් වී තිබුණි.

	අනෙකුත් සිවිල් වැඩ හා ඉදිකිරීම් අවසන් කිරීමට 2025 දෙසැම්බර් 30 දක්වා වසරක ණය දිගුවක් ඉල්ලා තිබුණි. තවද, 2023 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 14,269 ක් වැය කර තිබූ අතර භෞතික ප්‍රගතිය සියයට 64 ක් වී තිබුණි.			සංවර්ධන බැංකුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය මඟින් ජලවිදුලි නිෂ්පාදනය ආරම්භ කිරීමට 2024 වසර අවසාන වීමට පෙර හැකිවනු ඇතැයි අපේක්ෂිතය.	
2	බස්නාහිර, මධ්‍යම හා උතුරු මැද පලාත්වල සම්ප්‍රේෂණ ජාල සංවර්ධනය කිරීම හා සම්ප්‍රේෂණ හානි අවම කිරීමේ අරමුණින් පැකේජ් 4 ක් යටතේ ක්‍රියාත්මක ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය හා කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය 2015 ජනවාරි ආරම්භ කර 2018 ජනවාරි නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, 2023 දෙසැම්බර් 31 දින වනවිට රු.මිලියන 39,942 ක් වැයකර තිබූ මෙම ව්‍යාපෘතියේ පැකේජ 1 හා 2 හි සැලකිය යුතු භෞතික ප්‍රගතියක් නිරීක්ෂණය නොවූ අතර, ක්‍රියාත්මක කිරීමකින් තොරව කොන්ත්‍රාත් ගිවිසුම අවසන් (terminate) කර තිබූ පැකේජ 3 හා 4 හි නැවත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.	2021, 2022, 2023	නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති නිමකිරිමට හා අත්හිටුවා ඇති වැඩ කොටස් නිමකිරීමේ යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.	මෙම ව්‍යාපෘතිය JICA අරමුදල් ලබාදීම අත්හිටුවීම මත අපේක්ෂිත භෞතික ප්‍රගතිය අත්කර ගැනීමට නොහැකි වී ඇත. පවතින ආර්ථික ප්‍රතිසංස්කරණ තුළ JICA අරමුදල් ලබා ගැනීම දුෂ්කර වීම මත ලංකා විදුලිබල මණ්ඩලයේ අරමුදල් භාවිතාකර පැකේජ 01 සහ 02 ක්‍රියාත්මක කලද පැකේජ 03 සහ 04 තාවකාලිකව නැවැත්වීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටු කිරීමට නොහැකි බව පැහැදිලි වේ.	ලංකා විදුලිබල මණ්ඩලයේ අරමුදල් භාවිතා කර පැකේජ 01 සහ 02 ක්‍රියාත්මක වේ. පැකේජ 03 සහ 04 තාවකාලිකව නවත්වා ඇත.

3	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 (3)හා 104 (4) ට අනුකූල නොවී, 2021 – 2023 කාලය තුල සිදු වූ වාහන අනතුරු 07 ක ප්‍රාරම්භක වාර්තා බොහෝ ප්‍රමාද වී නිකුත් කර තිබූ අතර ඒවායේ අවසන් වාර්තා 2024 මැයි වන විට ද නිකුත් කර නොතිබුණි.	2021, 2022, 2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ.	අලුත්වැඩියා කටයුතු හා පොලිස් වාර්තා ලැබුණ විගස මුදල් රෙගුලාසි ප්‍රකාර අදාළ වාර්තා නිකුත් කිරීමට කටයුතු කරනු ලබයි.	අදාල අවසන් වාර්තා මේ වන විට ද නිකුත් කර නොතිබුණි.
4	අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ තනතුරක් සඳහා අවිධිමත් ලෙස වැඩ බැලීමේ පත්වීමක් ලබා දී වසර 07 ක් සඳහා වැටුප් වශයෙන් රු. 2,047,347 ක් ගෙවා තිබීම සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවට නිරීක්ෂණයක් ඇතුළත් කර තිබුණද, 2024 අප්‍රේල් 30 දින දක්වාම එම මුදල් නැවත අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2022, 2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතු අතර අවිධිමත් දීමනා ගෙවීම් නැවත අයකර ගැනීමේ හා මු.රෙ 135, 136,137,138 අනුව කටයුතු කල යුතු වේ.	මූලික විමර්ශනයක් සිදු කිරීමට අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇති අතර කමිටු තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරමි.	මේ දක්වා අය කර නොතිබුණි.

3.9 ආරක්ෂක අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	36,927,847,351	515,377,047	36,412,470,304	-	තත්ත්වාගණනය කළ
2022	43,044,570,365	941,895,796	42,102,674,569	-	තත්ත්වාගණනය කළ
2023	40,694,316,668	894,999,209	39,799,317,459	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1	මූලික ආදායම් ඇස්තමේන්තු හා සත්‍ය ආදායම අතර සියයට 130 සිට සියයට 147 දක්වා විචලනයන් පැවති අතර 2023 වර්ෂයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ සත්‍ය ආදායම අතරද සියයට 36 සිට සියයට 91 දක්වා විචලනයන් පැවතුණි.	2023	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2015 ප්‍රකාරව රජයේ අයවැය ඇස්තමේන්තුව සකස් කිරිම සඳහා වාර්ෂිකව ආදායම් නිවැරදිව ඇස්තමේන්තු කළ යුතුය.	2024 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු ප්‍රතිසංශෝධිත ආදායම ඇස්තමේන්තුවට අනුකූලව සත්‍ය ආදායම ප්‍රතිග්‍රහණය කිරීම සිදුවන බව පෙන්වා දෙමි.	ප්‍රවර්තන වර්ෂයේ තෙවන කාර්තුව දක්වා ප්‍රතිසංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා තථ්‍ය ආදායම අතර විචලනයන් පැවති බව නිරීක්ෂණය වේ.
2	අමාත්‍යාංශයේ 2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් තුලින් වර්ෂය තුල අපේක්ෂිත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 176 ක විචලතාවයක් පැවති බැවින් ආදායම් ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල කර නොතිබුණි.	2023	ආදායම් ඇස්තමේන්තු හැකිතාක් තාත්වික ලෙස පිළියෙල කළයුතු වීම.	ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්ම තාත්වික ලෙස පිළියෙල කිරීමට සටහන් කරගෙන ඇත. 2024 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව සාමසාධක මෙහෙයුම් සඳහා යොමු කරන භට පිරිස්, උපකරණ සැපයීම්,	ප්‍රවර්තන වර්ෂයේ තෙවන කාර්තුව දක්වා ප්‍රතිසංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා තථ්‍ය ආදායම අතර සැළකියයුතු විචලනයන් පැවති බව නිරීක්ෂණය වේ.

				නිලධාරීන් ස්ථානගත කිරීම යනාදිය සලකා තාත්වික ආකාරයට පිළියෙල කර ඇත.	
3	2023 වර්ෂයට අදාළ අවස්ථා 39 කදී එකතුව රු. 3,106,817 ක් වූ වියදම් 2024 වර්ෂයේ ප්‍රතිපාදන වලින් වැය කර තිබුණු නමුත් එම වියදම් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි 94 (2) හි විධිවිධාන අනුව බැරකම් හඳුනාගෙන, බැදීම් හා බැරකම් ලේඛණයෙහි ඇතුළත් කළ යුතු වීම.	මු.රෙ. 94(2) ප්‍රකාරව හැකිතාක් දුරට බැදීම් හා බැරකම් හඳුනාගෙන ලේඛණ වලට ඇතුලත් කිරීමට හැකිවන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට සටහන් කරගෙන ඇති බව.	සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ සෑම වර්ෂයකදීම බැරකම් නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.
4	මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය බලතල පැවරීම සිදුකලයුතු වුවත් එක්සත් ජාතීන්ගේ සාමසාධක ආදායම හා බලපත්‍ර ගාස්තු ආදායමට අදාලව මූල්‍ය බලතල පවරා නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම	මු.රෙ.135 ප්‍රකාරව බලපත්‍ර ගාස්තු සහ සාම සාධක ආදායම යන ආදායම් ශීර්ෂ දෙක සඳහා මූල්‍ය බලතල පැවරීම, 2025 වර්ෂයේ සිට සිදු කිරීමට අපේක්ෂිත බව.	2024 වර්ෂයට අදාලව එක්සත් ජාතීන්ගේ සාමසාධක ආදායම හා බලපත්‍ර ගාස්තු ආදායමට අදාලව මූල්‍ය බලතල පැවරීම 2024 වර්ෂයට අදාලව සිදුකර නොතිබුණි.
5	අමාත්‍යාංශය විසින් වැටුප් ගෙවනු ලබන රාජ්‍ය බුද්ධි සේවාව හා ජාතික ශිෂ්‍යභට බලකාය යන අංශවලට අයත් නිළධාරීන් 2,292 ක් පිළිබඳව අනුමත/තත්‍ය කාර්යය මණ්ඩලය හෝ එහි මාසික වෙනස්වීම් පිළිබඳ පාලන වාර්තා පවත්වාගෙන නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි 453(ඌ) ප්‍රකාරව කටයුතු කර සම්පූර්ණ සේවක සංඛ්‍යාව පාලනය පිළිබඳ වාර්තා නිවැරදිව පවත්වා ගත යුතු වීම.	ඉදිරියේදී රාජ්‍ය බුද්ධි සේවයේ තොරතුරු මාසිකව ගෙන්වා ගැනීමටත් විධිමත් පරිදි පාලන වාර්තා පවත්වාගෙන යාමටත්, කාර්ය මණ්ඩල තොරතුරු කළමනාකරණ	අනුමත/තත්‍ය කාර්යය මණ්ඩලය හෝ එහි මාසික වෙනස්වීම් පිළිබඳ පාලන වාර්තා පවත්වා ගැනීමේ දුර්වලතා තවදුරටත් පවතී.

				සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා දැනුවත් කර ඇත.	
6	2023 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවීගිය, විශ්‍රාමික, මියගිය, වැඩ තහනම් සහ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 5,004,395ක් වූ අතර වර්ෂ 05 සිට වර්ෂ 20ට වැඩි කාල පරාසයක සිට අයවීම් හිඟහිට තිබුණු ශේෂ වල එකතුව රු. 1,297,832 ක් විය.	2023	2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/RED/2015/8/පොදු(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි මාර්ගෝපදේශ අංක 01 ප්‍රකාරව කටයුතු කර හිඟහිටි ණය ශේෂ අයකර ගත යුතු වීම.	වර්ෂ 20 ට වැඩි අය කර ගත නොහැකි රු.590,703 ක් වූ ණය ශේෂ 03 ක් පොත් වලින් කපා හැරීම සඳහා යොමුකිරීම, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම, වාරික වශයෙන් අයකර ගැනීම, ණය පියවන ලෙස අවසාන දැනුම්දීම් සිදුකිරීම, විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගැනීම වැනි ක්‍රියාමාර්ග මඟින් හිඟ ණය අයකර ගැනීමට කටයුතු කරන බව.	ප්‍රවර්තන වර්ෂයේ තෙවන කාර්තුව දක්වා හිගණය අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 31ක් වන අතර තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු. මිලියන 3.44 ක් පැවතුණි.
7	කිසියම් නිශ්චිත කාර්යයක් සඳහා ලබාදෙන තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්ය නිම කල විගසම පියවීමට කටයුතු කල යුතු වුවත්, අවස්ථා 64 කදී විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ රු. 3,648,332 ක අත්තිකාරම් දින 25 සිට දින 200 දක්වා කාල පරාසයක ප්‍රමාදයක් සහිතව පියවීම සිදුකර තිබුණි.	2023	මුදල් රෙගුලාසි 371 (2) (ආ) ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්ය නිම කල විගසම පියවීමට කටයුතු කල යුතු වීම.	මෙ සම්බන්ධව අදාළ අංශ හා ආයතන නැවත දැනුවත් කිරීමටත් අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේද අනුගමනය කිරීමටත් කටයුතු සිදු කරනු ලබන බව.	තත්කාර්ය අතුරු අග්‍රිම පියවීමේ ප්‍රමාදයන් තවදුරටත් පවතී.

8	ආරක්ෂක හමුදා මුලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රමාදය, ණයවර ලිපි විවෘත කිරීමේ ප්‍රමාදවීම ආදිය හේතුවෙන් අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත් නිමකිරීමට නොහැකිවීම මත කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කිරීමට සිදුව තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එවැනි සැපයුම් කොන්ත්‍රාත්කරුවන් 02 දෙනෙකු විසින් රු. 837,497,744 ක් හා එක්සත් ජනපද ඩොලර් 3,675,029 ක් වූ කාලය දීර්ඝ කිරීමේ හිමිකම් පෑම් (Claims for EOT) 19 ක් ඉල්ලුම් කර තිබුණි.	2023	අනාර්ථික වියදම් ඇතිවීම වලක්වා ගැනීම හා අනවශ්‍ය ප්‍රමාදයන් පාලනය කරගැනීමට ප්‍රමුඛතාව දිය යුතු වීම.	ව්‍යාපෘතිය මගින් පාලනය කල නොහැකි තත්ත්වයන් මත කොන්ත්‍රාත්කරුව න් විසින් කාලය දීර්ඝ කිරීමේ හිමිකම් පෑම් ඉල්ලුම් කර ඇත. පැවති හිමිකම් පෑම් 19 අතරින් 09 ක් නිරවුල් කර ඇත.	අනාර්ථික වියදම් වලක්වා ගැනීමේ හා අනවශ්‍ය ප්‍රමාදයන් පාලනය කරගැනීමේ වගකීම තවදුරටත් අදාලවේ.
9	ජාතික ආපදා සහන සේවා මෙහෙයුම් යටතේ ක්‍රියාත්මක නායයෑමෙන් නිවාස අහිමිවූ හා අධි අවදානම් කලාපවල ජීවත්වන පවුල් ආරක්ෂිත ස්ථානයන්හි නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 3ක ඉදි කර තිබූ නිවාස 205 ක් සඳහා ජල මූලාශ්‍ර නොමැතිකම හා දිස්ත්‍රික් 3ක පිහිටි නිවාස 82ක් සඳහා විදුලිය පහසුකම් නොතිබිම හේතුවෙන් එකතුව රු.344,400,000ක මූල්‍ය ආධාර ලබාගත් ප්‍රතිලාභීන් එම නිවාස වල පදිංචි වී නොතිබුණි. තවද එකතුව රු.15,900,000 ක ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන් 17 දෙනෙකු විසින් එම	2023	ආරක්ෂිත ස්ථානයන්හි පුද්ගලයන් පදිංචි කිරීමේදී ජලය , විදුලිය වැනි මූලික අවශ්‍යතා සපුරාගත හැකිවන පරිදි යටිතල පහසුකම් පවතින ස්ථානවල පදිංචි කළ යුතු වීම.	නැවත පදිංචි කිරීම් සඳහා යොදාගත් රජයේ ඉඩම් සඳහා ජලය හා විදුලිය ලබාදීමේ කටයුතු සඳහා ප්‍රතිපාදන ඉල්ලා තිබූ මහනුවර හා රත්නපුර දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත රු. මිලියන 39.96 ක ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කළ බව.	කාලීනව කටයුතු නොකිරීමෙන් මූලික අරමුණු ඉටුකිරීමේ ප්‍රමාදයන් තවදුරටත් පවතී.

	නිවාසවල සහ ඉඩම්වල හිමිකම අතහැරදමා තිබුණි.				
10	ආරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 05කට අදාලව එකතුව රු.200,600,000 ක ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන් 258 දෙනෙකු ප්‍රතිලාභ ලබාගත් අදියරට අදාල කාර්යයන් ඉටුකිරිමකින් තොරව ඉදිකිරිම් කටයුතු අත්හැරදමා තිබුණු අතර එකතුව රු. 82,700,000ක ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන් 90 දෙනෙකු ප්‍රතිලාභ ලබාගත් අදියරට අදාල කාර්යයන් පමණක් ඉටුකර ඉදිකිරිම් කටයුතු අත්හැරදමා තිබුණි.	2023	විධිමත් අධීක්ෂණයක් සහිතව ව්‍යාපෘතියේ මූලික අරමුණු ලඟාකර ගැනීම සඳහා කටයුතු කළයුතු වීම.	නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තු වේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතී. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ කෙටුම්පත් කරඇති අතර යාවත්කාලීන දත්ත පද්ධතියක් මත ඉදිකිරිම් කටයුතු අත්හැර දමන පාර්ශව හදුනාගැනීමත් ඔවුන් පිළිබද ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමටත් අපේක්ෂිතය.	කාලීනව කටයුතු නොකිරීමෙන් මූලික අරමුණු ඉටුකිරීමේ ප්‍රමාදයන් තවදුරටත් පවතී.
11	ආරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ නිවසක් සහිත ඉඩමක් මිළදිගැනිම සඳහා එකතුව රු.9,600,000 ක ප්‍රතිලාභ ලබාගත් පුද්ගලයන් 06 දෙනෙකු විසින් එම මුදල් භාවිතාකර ඉඩම් මිලදී ගෙන නොතිබුණි.	2023	ප්‍රතිලාභ මුදල් අදාල කාර්යයට යොදන බවට තහවුරුවක් සහිත වගවීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළයුතු වීම.	අවභාවිතාවන් වැලැක්වීම සඳහා මුදල් ආපසු අයකර ගැනීමේ ක්‍රමවේද සහිතව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ කෙටුම්පත් කරඇත.	අවභාවිතාවන් වැලැක්වීමේ ක්‍රමවේද ක්‍රියාත්මකවීම ප්‍රමාණවත් නොවේ.

12	2023 සැපයුම් වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදාවේ කඳවුරුගත සාමාජිකයන් 151,429 ක් වෙනුවෙන් අමු හා වියළි ආහාර සැපයීම සඳහා අමාත්‍යාංශය විසින් රු. බිලියන 96 ක ලංසු පිරිනමා තිබුණු අතර ත්‍රිවිධ හමුදා විසින් ඒකාකාර හා නිශ්චිත ක්‍රමවේදයක් මත ආහාර ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. ශ්‍රී ලංකා යුධ හමුදාවේ පුද්ගලයකුගේ දෛනික සහල් අවශ්‍යතාවය ග්‍රෑම් 190ක් ලෙස සම්මතයක් පවත්වාගනු ලැබුවද, ග්‍රෑම් 633 ක් ලෙස සලකා ඇස්තමේන්තු සකස් කර තිබුණි. තවද එක් නාවික හමුදා සාමාජිකයෙකුගේ එක් දිනක ආහාර අවශ්‍යතාවය සහල් ,ධාන්‍ය, එළවළු, මස් ,මාළු සහ කරවල ඇතුළු ආහාර වර්ග 140 කින් කි.ග්‍රෑ. 27. 590 ක් ලෙසට අතාත්වික හා අධි ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි.	2023	පූර්ව වර්ෂ වල සත්‍ය පාරිභෝජනයද සැලකිල්ලට ගනිමින් තාත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල කල යුතු වීම.	2025 වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදා තුළවාසී ප්‍රමාණ සැලකිල්ලට ගෙන තාත්විකව ඇස්තමේන්තු පිළියෙල.කිරීමට කටයුතු කර ඇති බව.	2024 වර්ෂය සඳහා තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොමැත.
13	ත්‍රිවිධ හමුදාවේ කඳවුරුගත සාමාජිකයන්ට අහාර සැපයීමට අදාළ ලංසු ඇගයීමේදී එක් එක් ආහාර ද්‍රව්‍යයය සඳහා සාධාරණ මිලක් තීරණය කර එම මිල මත සියයට 10 ක උපරිමයක් වන පරිදි දිවයිනේ කුමන හෝ කඳවුරකට සැපයීම සඳහාවූ උපරිම මිල තීරණය කරන බව දක්වා ඇතත් හඳුනාගත් සාධාරණ වෙළඳපල මිලට වඩා සියයට 22 සිට සියයට	2023	රජයට අවම පිරිවැයක් දැරීමට සිදුවන අයුරින් හා උපරිම වාසි සැලසෙන අයුරින් කටයුතු කළ යුතු වීම.	ඉදිරිපත් කරනු ලබන ලංසු අගයන් මත ප්‍රසම්පාදන ප්‍රදානය සිදු නොකරන අතර ලංසුකරුවන් සමග මිල සාකච්ඡා වට කීපයක් පවත්වා වෙළඳපල මිල කෙරෙහි අවධානය යොමුකර රජයට	මෙම තත්ත්වය 2024 වර්ෂයේදීද පැවති බව නිරීක්ෂණය වේ.

	103 දක්වා වැඩි මිලකට කොළඹ හා තදාසන්න ප්‍රදේශවල කඳවුරු 05 කට සහල් වර්ග සැපයීමට ලංසු පිරිනමා තිබූ අතර එම කඳවුරු 05 සඳහා පරිප්පු, කරවල හා කිරිපිටි සැපයීම හඳුනාගත් සාධාරණ වෙළඳපල මිලට වඩා සියයට 42 සිට සියයට 102 දක්වා වැඩි මිලකට ලංසු පිරිනමා තිබුණි.			අවම පිරිවැයක් වන ලෙසට සාධාරණ මිලක් තීරණය කර ඇත.	
14	මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කලයුතු වුවත්, මූලික ප්‍රතිපාදනය මෙන් සියයට 108 සිට සියයට 1503 දක්වා ප්‍රතිශතයක අතිරේක ප්‍රතිපාදන සලසාගැනීම, මුදල් රෙගුලාසි 66 මගින් ලබාගත් අතිරේක ප්‍රතිපාදනයද ඉක්මවූ ඉතිරිකිරීම් පැවතිම, සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණු අවස්ථා පැවතීම ආදිය හේතුවෙන් ඇස්තමේන්තු සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	2023	උපරිම කාර්යක්ෂමතාව යකින් යුතුව එක් එක් වැය විෂයය සඳහා සලසා ඇති ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු වීම	2024 වර්ෂයේදී මු.රෙ 66 මඟින් මාරු කර ගන්නා ලද ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවය කින් උපයෝජනය කිරීමටත්, වර්ෂය අවසානයේ ප්‍රතිපාදන ඉතිරි නොවන පරිදි ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කර ගැනීමට හා ආරක්ෂක අමාත්‍යවරයාගේ වියදම් සඳහා වෙන්කළ ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවය කින් උපයෝජනය කිරීමට උපදෙස් ලබා දී ඇත.	අනුයාත පූර්ව වර්ෂ තුන තුළ මෙම තත්ත්වය පැවතී ඇත.
15	සන්නද්ධ සේවා අතර ඒකාබද්ධ උපාය මාර්ගික සංනිවේදනය පවත්වාගැනීමේ අරමුණින් යුතුව උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2016 වර්ෂය අවසානයේ	2021	සැලසුම් කල පරිදි අපේක්ෂිත ඉලක්කයන් කරා ලගාවිය යුතුය.	2022 වර්ෂයේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම සහ 03/2022 ජාතික අයවැය චක්‍රලේඛය අනුව වියදම් පාලනය හා	ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකළ මුදල් සඳහා පසුගිය වර්ෂ 08 තුළ ප්‍රමාණවත් ප්‍රතිලාභ ලැබී නොමැත.

	අවසන් වීමට යෝජිතව පැවතියද ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය කාර්යය වර්ෂ 06 ක් ප්‍රමාදවීම ආදිය හේතුවෙන් ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. ඒ අනුව 2016 සහ 2017 වර්ෂවලදී රු.මිලියන 600.7 ක පිරිවැය මත ඉදිකළ සංනිවේදන කුළුණු 11 හා විදුලි ජනක යන්ත්‍ර 22 ක් අපේක්ෂිත අරමුණු යොදාගැනීමට නොහැකිව තිබුණි.			2022,2023 හා 2024 වර්ෂ වල දී ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතිය තාවකාලිකව නතර කරන ලදී. විදුලි උත්පාදක යන්ත්‍ර ත්‍රිවිධ හමුදාව සහ විශේෂ කාර්ය බලකායේ ගුවන් විදුලි යන්ත්‍ර ප්‍රති විකාශන අවශ්‍යතාවන් සඳහා භාවිතා කරනු ලබයි. 2025 හා 2026 වර්ෂ සඳහා කාලය දීර්ඝ කිරීමට කැබිනට් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.	
16	අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 28 ඇතුළු තනතුරු 118 ක්ද. ජාතික ශිෂ්‍යභට බලකායේ ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී යන තනතුරු ඇතුළු තනතුරු පුරප්පාඩු 68 පැවතුනි.	2023/ 2021	අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතු වීම.	ආරක්ෂක අමාත්‍යාංශයේ පවත්නා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත්කර ඇත. ජාතික ශිෂ්‍යභට බලකායේ පුරප්පාඩු පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ උපදෙස් ලබාගන්නා ලෙස	මෙම තත්ත්වය අමාත්‍යාංශයේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමේදී බාධාවක් වී තිබුණි.

				දැනුම් දී ඇත.	
17	අමාත්‍යාංශය හා ඒ යටතේ වන අනෙකුත් අංශවල රාජකාරි සඳහා ත්‍රිවිධ හමුදා කාර්යය මණ්ඩලය ලෙස නිලධාරීන් හා සෙසු නිළයන්ට අයත් හමුදා සාමාජිකයින් 700 ක් සේවා නියුක්ත කර තිබුණු අතර ඒ සඳහා වන පාරිශ්‍රමික අදාල ත්‍රිවිධ හමුදා විසින් දරා තිබුණි.	2022	අත්‍යාවශ්‍ය හා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුය.	ත්‍රිවිධ හමුදා සාමාජිකයන් අනුයුක්ත කිරීම සඳහා නීතිමය පසුබිමක් ඇතිකර ගැනීම පිළිබඳව 2023 නොවැම්බර් 28 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අවධාරණය කරන ලදී.	ත්‍රිවිධ හමුදා සාමාජිකයන් අනුයුක්ත කිරීම සඳහා නීතිමය පසුබිමක් ඇතිකර ගැනීම පිළිබඳව 2023 නොවැම්බර් 28 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අවධාරණය කරන ලදී.
18	2021 දෙසැම්බර් 21 දිනැති අයවැය චක්‍රලේඛ අංක 03/2021 හා 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මගින් රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා උපදෙස් ලබා දී තිබුණද මුදල් වැය කිරීමේ දී අනාර්ථිකව හා අරපිරිමැසුම් රහිතව කටයුතු කළ පහත අවස්ථා පැවති බව නියැදි පරීක්ෂාවලදී නිරීක්ෂණය විය. • ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ එක් දින සම්මන්ත්‍රණයක් වෙනුවෙන් සංග්‍රහ වියදම් ඇතුළු අනෙකුත් වියදම් වෙනුවෙන් රු. 5,197,413 ක් දරා තිබීම. • පාඨමාලාවකට සහභාගි වූ නිලධාරීන් 31 ක් සඳහා නවාතැන් පහසුකම් ලබාදීම සඳහා ගෘහ ඒකක 24 ක නිවාස සංකීර්ණයක්	2022	චක්‍රලේඛ උපදෙස් අනුව රාජ්‍ය වියදම් පාලනයට කටයුතු කළයුතු අතර වියදම් දැරීමේදී ආර්ථිකව, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කටයුතු කිරීමෙන් රජයට අවම පිරිවැයක් හා ප්‍රශස්ථ නිමවුමක් ලැබෙන අයුරින් කටයුතු කළ යුතුවේ.	ප්‍රවාහන හා නවාතැන් කුලී වියදම් අවමකර ගනිමින් 2024 වර්ෂය සඳහා කිලෝමීටර් 01 ක පමණ දුරකින් යුත් මාසික කුලිය රු.2,876,500. ක ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගන්නා ලදි. ඉදිරියේදී මේ සඳහා රජයේ ඉඩමක් පවරාගෙන නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ජාත්‍යන්තර අනුග්‍රහය ලබාගැනීමේ හැකියාව අධ්‍යනය කරමින් පවතී.	ප්‍රමාණවත් පරිදි වියදම් පාලනයක් නොමැත.

රු.මිලියන 72 කට කුලියට ගැනීම හා රු. 3,000,000 බැගින් මාසික කුලිය ගෙවා තිබීම.

- මාස 03ක කාලයක් නිශ්කාර්යව පැවති නිවාස සංකීර්ණයේ බදුකුලී වෙනුවෙන් රු. 10,500,000 ක අනාර්ථික වියදමක් දරා තිබීම.
- දේශකවරු සඳහා රු.2,322,261 ක දීමනා ගෙවා තිබියදී ප්‍රවාහන පහසුකම් වෙනුවෙන් රු. 2,756,383 ක වාහන කුලී සහ ඉන්ධන වියදම්ද දරා තිබීම.

3.10 අධිකරණ අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,114,316,272	41,235,577	2,073,080,695	-	තත්ත්වාගණනය කළ
2022	4,520,790,254	101,598,722	4,419,191,532	-	තත්ත්වාගණනය කළ
2023	5,097,297,958	171,927,248	4,925,370,710	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2018 ජනවාරි 24 දිනැති අංක 5/2018 (I) චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 5/2008 දරන චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මකකර නොතිබුණි.	2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය.	පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කිරීමට කටයුතු සිදු කරමින් පවතී. එය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන අතර ඉදිරියේදී එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය කෙටුම්පත් කරමින් පවතී.
2	යාපනය දිස්ත්‍රික්කයේ වැසි ජලයෙන් වගා කටයුතු සිදුකිරීමේ පද්ධති 3000ක් ඉදිකිරීම සඳහා වූ රු.මිලියන 100ක ඉන්දියානු රජයේ ප්‍රදානය හා රු.මිලියන 20ක විදේශ ප්‍රධාන	2023	සැලසුම් කළ කාර්යයන් නිසි පරිදි නිමකිරීමට කටයුතු කළ යුතු ය.	අදාළ අවබෝධතා ගිවිසුමේ කාලය දීර්ඝ කිරීම සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය එකඟතාවය පළකර ඇති අතර, ඊට අදාළ	මේ වන විට ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබා ගෙන ඇති අතර, දෙපාර්ශවය අතර ගිවිසුම් අත්සන් කිරීමට අදාළ

	මූලාකරණය සඳහා වූ ප්‍රතිපාදනය, ව්‍යාපෘතියේ කාලය දීර්ඝකර නොගැනීම නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකිවීමෙන් සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.			කෙටුම්පත් ලිපිය විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මෙම අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. අදාළ කටයුතු නිශ්චය කිරීමෙන් පසු කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගත යුතු අතර, එම අනුමැතිය ලැබුණු පසු ගිවිසුම අත්සන්කර ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු නිම කිරීමට අපේක්ෂිත බව දන්වා තිබුණි.	කටයුතු සිදු කරමින් පවතී. නමුත් අමාත්‍යාංශ විෂයය වෙනස් වීම නිසා මෙම කාර්යාලය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත අනුයුක්තකර ඇත. එබැවින් නව අමාත්‍යාංශය සමඟ මේ පිළිබඳව සාකච්ඡාකර ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරන බව අදාළ ආයතනය විසින් දන්වා ඇත.
3	යුක්තිය පසිඳලීම පිළිබඳ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අමප/20/1400/330/013 අමාත්‍ය මණ්ඩල තීරණය මගින් විශේෂ ඒකකයක් පිහිටුවා තිබූ අතර, එහි එක් සුවිශේෂ කර්තව්‍යක් වූ සිවිල් නීති ප්‍රතිසංස්කරණය වෙනුවෙන් පිහිටුවන ලද උපදේශන කමිටු සාමාජිකයින් සඳහා 2022 දක්වා රු.7,238,875 ක ගෙවීම්කර තිබුණ ද, එහි ප්‍රගති වාර්තා විධිමත් පරිදි අත්සන්කර තහවුරු කිරීමක්කර නොතිබුණු අතර, 2023 වර්ෂයේ මේ	2023 2022	සැලසුම් කළ කාර්යයන් නිසි පරිදි නිමකිරීමට කටයුතු කළ යුතු ය.	සිවිල් නීති ප්‍රතිසංස්කරණ කමිටුව මගින් යොමුකර ඇති වාර්තා මාර්ගගත ක්‍රමය ඔස්සේ යොමුකර ඇති බැවින්, අත්සන්කර නොමැති බව ද එම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ ක්‍රියාත්මක නොකළ ද, 2022 වර්ෂයේ එම ව්‍යාපෘතියට අදාළ වියදම් එම ව්‍යාපෘතිය වෙනුවෙන් වූ 110-01-02-08-2509 වැය විෂයයට හර කර ඇති බව දක්වා තිබුණි.	පූර්වයෙන් පත් කරන ලද කමිටු සාමාජිකයන් ස්වේච්ඡාවෙන් එම කටයුතුවල නිරත වන අතර, එම කමිටුව විසින් යෝජනා කරන ලද සිවිල් නීති ප්‍රතිසංස්කරණවලට අදාළ කාර්යයන් ඉටු කරමින් පවතින බව දන්වා ඇත.

	යටතේ වූ රු.5,000,000ක ප්‍රතිපාදනයෙන් වියදම රු.78,158 ක් විය. මෙම වියදම තුළ තාවකාලික රියදුරන් 03 දෙනෙකු වෙනුවෙන් ගෙවූ අතිකාල දීමනා හා දෛනික වැටුප් වියදම් හා භාෂා පරිවර්තන දීමනාවක් ලෙස රු.72, 379ක් ගෙවා තිබුණි. මේ අනුව යුක්තිය පසිදලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මකකර නොතිබුණි.				
4	අධිකරණ අමාත්‍යාංශය විසින් භුක්ති විඳින නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි හෙක්ටයාර් 0.2023 ක් වූ ඉඩම, රක්වාන සංචාරක බංගලාව පිහිටි රූඩ් 01 පර්චස් 10 ක් වූ ඉඩම, බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි හෙක්ටයාර් 0.1760ක් වූ ඉඩම හා අධිකරණ පියස ඉදිකරන සමාගමකට අයත් හෙක්ටයාර් 2.4281 (අක්කර 06) ඉඩම් පවරාගැනීමේ කටයුතු අවසන්කර නොතිබූ අතර, වටිනාකම් තක්සේරු කරගෙන ද නොතිබුණි.	2023 2022 2021	ඉඩම් කඩිනමින් පවරාගෙන තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු ය.	නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි ඉඩම අමාත්‍යාංශය වෙත පවරාදීමට ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ද, රක්වාන සංචාරක බංගලාව පිහිටි ඉඩම පවරාගැනීමට මැනුම් කටයුතු සඳහා මිනින්දෝරු අධිකාරීවරයා වෙත ද, බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි ඉඩම විධිමත්ව පවරාදීම සඳහා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් වෙත ද, දන්වා තිබුණි. අධිකරණ පියස ඉදිකරන BCC ලංකා සමාගමට අයත් ඉඩම අත්කරගැනීම වෙනුවෙන් වන්දි	නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි ඉඩම අමාත්‍යාංශය වෙත කඩිනමින් පවරාදෙන ලෙස 2024.07.04 දින ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත නැවතත් ඉල්ලීම්කර ඇති බව දන්වා තිබුණි. රක්වාන සංචාරක බංගලාව පිහිටි ඉඩම් කොටස පවරාදීම සඳහා මැනුම් කටයුතු නොමිලේ සිදු කරවාගැනීමට මිනින්දෝරු අධිකාරී වෙත ඉල්ලීම්කර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි.

				මුදලක් තීරණය වී ඇති අතර, පවරාදීමේ කාලරාමුව සම්බන්ධයෙන් ඉදිරියේදී දැනුම් දෙන බව ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම්දී ඇති බව දන්වා තිබුණි.	බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි ඉඩම අධිකරණ අමාත්‍යාංශය වෙත පවරාදීම සඳහා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් වෙත භාරදෙන මෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත 2024.06.13 දින දැනුම්දී ඇත. මෙතෙක් එම අධිකාරිය ඒ සම්බන්ධව කටයුතු කර නොමැති බව දන්වා තිබුණි. අධිකරණ පියස ඉදිකරන BCC ලංකා සමාගමට අයත් ඉඩම වන්දි නොගෙවා පැවරුම් සහතිකයක් මඟින් මෙම අමාත්‍යාංශය වෙත පවරාදීමේ කාලරාමුව සම්බන්ධයෙන් ඉදිරියේදී දැනුම් දෙන බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත.
5	මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති 01/2011 චක්‍රලේඛය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 10 දෙනෙකු 2023 දෙසැම්බර් 31 වන විට ඇප තබා නොතිබුණි.	2023 2022	යොමුගත මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	මෙම නිලධාරීන්ට අදාළව ඇප තැබීමේ කටයුතු සිදු කරන අතර, මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සඳහා යොමුකර ඇති බව දන්වා තිබුණි.	නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය මේ වන තෙක් ලැබී නොමැති බැවින් සිහි කැඳවීමක් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.

6	සමථ මූල මණ්ඩලයක ධූරකාලය අවසන් වූ පසු සමථ මූල මණ්ඩල පත්කිරීමට වසර 04 කට ආසන්න කාලයක් ගත වී තිබුණි. බොහෝ සමථ මූල මණ්ඩල සාමාජිකයින්ගේ ධූරකාලය අවසන් වුව ද, නව පත්වීම් සඳහා දැන්වීම් පළ කිරීම (ගැසට් නිවේදන) ප්‍රමාදවීමෙන් සාමාජිකයන් පත් කිරීම දක්වා වූ කාර්යයන් සිදු කිරීමට ප්‍රමාද වී තිබුණි. නියැදි විගණන පරීක්ෂාවට අනුව සමථ මණ්ඩලවල ධූරකාලය අවසන් වී තිබුණ ද, විගණන දිනය වන 2024 පෙබරවාරි 06 දින වන විට ද පත් කිරීම් සිදුකර නොතිබුණු අවස්ථා 45 නිරීක්ෂණය විය.	2023	ධූරකාලය අවසන්වීමෙන් පසු කඩිනමින් පත්වීම් කළ යුතු ය.	පත්වීම් ලබාදීමේදී සිදුවන ප්‍රමාදයන් මගහරවා ගැනීමට මේ වන විට සමථ මූල මණ්ඩලවල ධූර කාලය අවසන්වීමට පෙර ගැසට් නිවේදනය සඳහා යොමු කිරීම සිදු කරමින් පවතින අතර, එය ධූර කාලය අවසන් වන දින සිට මාස 06 කට පෙර සිදු කරන බව දන්වා තිබුණි.	පත්වීම් ලබාගැනීමේදී සිදුවන ප්‍රමාදයන් මහ හරවා ගැනීමට මේ වන විට සමථ මූල මණ්ඩලවල ධූරකාලය අවසන්වීමට පෙර ගැසට් නිවේදනය සඳහා යොමු කිරීම සිදු කරමින් පවතින අතර, එය ධූරකාලය අවසන් වන දින සිට මාස 06කට පෙර සිදු කරනු ලබයි. 2024.12.31 දින දක්වා ධූර කාලය අවසන්වීමට නියමිත සියලුම සමථ මූල මණ්ඩල සඳහා මේ වන විට ගැසට් නිවේදන මඟින් නාමයෝජනා කැඳවා ඇත.
7	සමථ මණ්ඩල කොමිෂන් සභා සාමාජිකයන්ට රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් ගෙවනු ලබන රු.25,000 ක මාසික දීමනාව ගෙවීමේදී ඇතැම් සාමාජිකයන් සියලුම	2023	සියලුම සාමාජිකයන්ගේ උපරිම දායකත්වය ලබාගැනීමට කටයුතු කළ යුතු ය.	කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1281/II හා 2016 අගෝස්තු 11 හා 2016 ඔක්තෝබර් 05 දිනැති ලිපි අනුව සමථ මණ්ඩල කොමිෂන් සභාවේ සභාපති ඇතුළු	මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් විමසා ඇති අතර, මේ වන තෙක් පිළිතුරු ලැබී නොමැත. නැවත සිහිකැඳවීමක්

	රැස්වීම්වලට සහභාගී වී තිබූ අතර, සමහර සාමාජිකයින් එක් රැස්වීම් වාරයකට පමණක් සහභාගී වී තිබුණි. එසේ වුව ද, සහභාගීත්වය නොසලකා මාසික දීමනාව සියලුම සාමාජිකයින්ට ගෙවා තිබීම හේතුවෙන් රැස්වීම් සඳහා සියලුම සාමාජිකයින්ගේ උපරිම දායකත්වය ලබාගැනීමට නොහැකි වී තිබුණි.			කොමසාරිස්වරුන්ට දීමනා ගෙවනු ලබන අතර, ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ද උපදෙස් විමසා සුදුසු පරිදි දීමනා ගෙවීම් කිරීමට කටයුතු කිරීමට නියමිත බව දන්වා තිබුණි.	කිරීමට කටයුතු කරනු ලැබේ.
8	දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවා ඇති විශේෂ (ඉඩම්) සමථ මණ්ඩල 16 ක් පැවතිය ද මන්නාරම, වවුනියාව, යාපනය, අනුරාධපුර, ත්‍රිකුණාමලය, මඩකලපුව විශේෂ සමථ මණ්ඩල නැවත පත්කිරීම සිදුකර නොමැති අතර, ගාල්ල, මාතර, පුත්තලම, කෑගල්ල දිස්ත්‍රික්කවල විශේෂ සමථ මණ්ඩල පිහිටුවා නොතිබුණි.	2023	සමථ මණ්ඩල පිහිටුවීම හා සාමාජිකයින් පත්කිරීම් කඩිනමින් කළ යුතු ය.	විශේෂ (ඉඩම්) සමථ මූල මණ්ඩල නැවත පත්කිරීම් නොකළ ද, නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවට අනුව ඉටුකළ යුතු රාජකාරී බොහොමයක් පවතින බව දන්වා තිබුණි.	දැනට ස්ථාපනයකර ඇති විශේෂ (ඉඩම්) සමථ මූල මණ්ඩල 16න් මන්නාරම, වවුනියාව, යාපනය, අනුරාධපුරය, මඩකලපුව යන සමථ මූල මණ්ඩල නැවත පත් කිරීම් සිදු කිරීමට කටයුතු කරමින් පවතින අතර, දැනට ස්ථාපනය කර නොමැති ඉඩම් සමථ මූල මණ්ඩල 09 සඳහා ද නාමයෝජනා කැඳවා සමථකරුවන් බඳවාගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බවත්, 2003 අංක 21 දරන (විශේෂ වර්ගවල ආරවුල්) සමථ මණ්ඩල පනතෙහි

					උපලේඛනයේ 4(2) වගන්තිය ප්‍රකාරව දැනට ස්ථාපනයකර ඇති සමථ මූල මණ්ඩලයන්හි ධූරකාලය අවසන්ව පැවතිය ද නව මණ්ඩලය පත්කරන තෙක් බාධාවකින් තොරව සමථ මණ්ඩල කටයුතු පවත්වාගෙන යා හැකි බවත් දන්වා තිබුණි.
9	ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද කැබ් රථයක් 2010 වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශයේ භාවිතය සඳහා ලබාදී තිබූ අතර, එය 2018 වර්ෂයේදී අනතුරකට ලක්වීම සම්බන්ධයෙන් වූ අවසන් පරීක්ෂණ වාර්තාව හා 2021 මැයි 12 දිනැති අතුරු වාර්තාව අනුව වසර 05කට පසු මෙම රථය අලුත්වැඩියා කිරීමට තීරණය වී තිබුණි. නමුත් 2023 මැයි 03 මෝටර් රථ දෙපාර්තමේන්තු ලිපියට අනුව මෙම වාහනයේ චැසි අංක හා එන්ජින් අංක මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත හා නොගැළපීම හේතුවෙන්	2023	තක්සේරු වාර්තාවක් ලබාගෙන කඩිනමින් සුදුසු කටයුතු කළ යුතු ය.	රථය අපහරණය කිරීම සඳහා ක්‍රියා කිරීමේදී රථයේ චැසි අංකයට අදාළ දත්තයන් ගැළපීමක් සිදු නොවූ හේතුව මත ඒ පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් සිදු කරමින් පවතින බව දන්වා තිබුණි.	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ වාර්තා ලැබී නොමැති බැවින් සිහි කැඳවීම් ලිපි යොමුකර ඇත.

	අමාත්‍යාංශයට පවරාගැනීම ගැටලු සහගත බැවින් අමාත්‍යාංශ භූමියේ වසර 06 ක පමණ කාලයක සිට ගාල් කර පැවතුණි.				
10	වසර 05 කට අධික කාලයක් අබලන්ව පැවති ත්‍රීවීලර් රථයක් අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි.	2023 2022	අපහරණය කිරීමට කටයුතු කළ යුතු ය.	QB – 2005 ත්‍රීවීලර් රථය අපහරණය කිරීම සඳහා තක්සේරු කමිටුව විසින් ලබාදී ඇති තක්සේරු වාර්තාව මේ වනවිට ලබාදී ඇති අතර, අපහරණයට අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි.	මු.රෙ.770(4) හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 7/2024 අනුව ඉදිරියේදී මෙම රථය අපහරණය කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ.
11	ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා ව්‍යාපෘතිය අවසන්කර දින 07 ක් ඇතුළත අදාළ විස්තර සමඟ අමාත්‍යාංශයට වෙත එවිය යුතු වුවත්, දිස්ත්‍රික්ක/ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒ අනුව කටයුතුකර නොමැති වීම නිසා ව්‍යාපෘතිවල සත්‍ය වියදම විගණනයට තහවුරු නොවුණි.	2023	අදාළ වාර්තා නියමිත පරිදි ගෙන්වා ගත යුතු ය.	2024 මැයි මස වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත නිලධාරීන්ගෙන් සියයට 85 ක් පමණ ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා අදාළ විස්තර සමඟ අමාත්‍යාංශය වෙත ලබාදී ඇති අතර, නව තාක්ෂණය යොදාගෙන වාර්තා කැඳවීමට ක්‍රමවේදයක් සලසා ගන්නා මෙන් නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. එමෙන්ම මින් ඉදිරියට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන වාර්තා සහ අවසන් ව්‍යාපෘති	2024 සැප්තැම්බර් මස 30 දින වන විට ආන්තීකරණයට ලක් වූ පාසැල් දරුවන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ප්‍රා/ලේ කාර්යාලවලට නිදහස්කර ඇත. ඉන් ව්‍යාපෘති 3ක් අවසන්කර ඇති අතර, ඒ සඳහා ප්‍රගති වාර්තා ලැබී ඇත. අනෙකුත් ව්‍යාපෘති අවසන් වූ පසු දින 07ක් ඇතුළත ප්‍රගති වාර්තා ලබාගැනීමට අදාළ නිලධාරීන් දැනුවත්කර ඇති බවත්, එම වාර්තා

				වාර්තා විගණනය වෙත නිසි පරිදි ලබාදීමට සටහන්කරගත් බව දන්වා තිබුණි.	විද්‍යුත් තැපැල මඟින් ගෙන්වා ගැනීමට උපදෙස් ලබාදී ඇති බවත් කාරුණිකව දන්වමි.
12	චීන රජයේ ආධාර මත ප්‍රතිසංස්කරණය කෙරෙන ශ්‍රී ලංකා උපරිමාධිකරණ සංකීර්ණය විස්තීර්ණ ලෙස නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන වියදම් සෘජුව ප්‍රදාන ආයතනය විසින් සිදු කරන අතර, 2023 වර්ෂය සඳහා 110-2-27-2001(13) යටතේ රු.මිලියන 350 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2023 වර්ෂයට අදාළව කිසිදු වියදමක් දරා නොතිබුණි. එසේ වුව ද, ඉතිරිවීමට හේතු ලෙස "වියදම් වාර්තා ලබාගැනීමේ දුෂ්කරතා මත මෙම වැය විෂයය යටතේ වියදම් වාර්තා කිරීමට නොහැකි වී ඇත" ලෙස දක්වා තිබුණි.	2023	වියදම් වාර්තා ලබාගැනීමට කටයුතු කළ යුතු ය.	මෙම ව්‍යාපෘතියට අදාළව ප්‍රදාන ආයතනය මඟින් සෘජු වියදම් දරන අතර, එම වියදම් වාර්තා ලබා ගැනීමේ දුෂ්කරතා මත මෙම වැය විෂයය යටතේ වියදම් වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි බව දන්වා තිබුණි.	අදාළ වියදම් වාර්තා ලබාදෙන ලෙස චීන පාර්ශවය වෙත ඉල්ලීම් කර ඇති අතර, එම වාර්තාව මේ වන තුරු ලැබී නොමැති බව දන්වා සිටිමි.
13	අධීක්ෂණ සමථ මණ්ඩල පුහුණු නිලධාරින් 02 ක් වසර 8 කට අධික කාලයක සිට පුරප්පාඩුව පැවතිය ද, පුරප්පාඩු පිරවීමට කටයුතුකර නොතිබුණි.	2023	පුරප්පාඩු තනතුර සඳහා බඳවාගැනීමට කටයුතු කළ යුතු ය.	කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024 ජනවාරි 01 දිනැති ලිපියෙන් බඳවාගැනීම් සිදුකිරීමට අනුමැතිය ලබාදී ඇති අතර, ඒ අනුව ඉදිරියේදී	කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024 ජනවාරි 01 දිනැති ලිපියෙන් බඳවාගැනීම් සිදු කිරීමට අනුමැතිය ලබාදී ඇති අතර, ඒ අනුව

				බදවාගැනීමේ කටයුතු සිදු කිරීමට නියමිත බව දන්වා තිබුණි.	බදවාගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.
14	අධිකරණ අමාත්‍යාංශය, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පිහිටි ගොඩනැගිල්ල අයත් ඉඩමේ පිඹුරු පිටපත ලබාගෙන ඉඩම පවරාගැනීමේ කටයුතු අවසන් කරගෙන නොතිබුණි.	2022 2021	දේපළ අමාත්‍යාංශය වෙත පවරාගෙන තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු ය.	මෙම දේපළ සම්බන්ධයෙන් හිමිකම තහවුරු කෙරෙන ලේඛන ඉදිරිපත් නොකොට තක්සේරු වාර්තාවක් ලබාදිය නොහැකි බව තක්සේරු දෙපාර්තමේන්තුව දන්වා ඇත. එබැවින් අදාළ ඉඩමේ නීත්‍යානුකූල අයිතිය මෙම අමාත්‍යාංශය වෙත ලබාගැනීමෙන් අනතුරුව එම ඉඩමේ සහ ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකම ලබා ගැනීමටත් තක්සේරු වාර්තාව ලද විගස එම වටිනාකම් CIGAS වැඩසටහන හරහා ගිණුම්ගත කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි.	මෙම ඉඩම 2023.08.04 දින මෙම අමාත්‍යාංශය වෙත පවරාගෙන ඇති අතර, එම ඉඩමේ හා ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකම ලබාගැනීම සඳහා 2023.08.31 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇති නමුත්, මේ වන තෙක් තක්සේරු වටිනාකම ලැබී නොමැති බව දන්වා තිබුණි.
15	මහල් 02 කින් යුතුව පුත්තලම නීති ආධාර හා ප්‍රජා විශෝධන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තය 2010 සැප්තැම්බර් 15 දින බාහිර පාර්ශවයකට රු.5,583,770 ක කොන්ත්‍රාත්තු වටිනාකමට පිරිනමා තිබුණු අතර, 2011 මාර්තු 27 දින වැඩ අවසන්කළ යුතුව තිබුණත්, අවස්ථා 03	2022 2021	වැඩ ඇරඹීමේ අත්තිකාරම් මුදල් හා කාර්යසාධන ඇපකරයෙන් අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.	මෙම අයවිය යුතු කාර්යසාධන ඇපකර හා අත්තිකාරම් මුදල් අයකර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව මගින් උපදෙස් ලබාගැනීම සඳහා යොමුකොට ඇති අතර, ඉදිරියේදී නීතිපති උපදෙස් අනුව කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	2021.03.03 නීතිපති දෙපාර්තමේන්තුවෙන් කොන්ත්‍රාත්තුවට අදාළ ලියවිලි මුල් පිටපත (CIDA/SBD 3) ඉල්ලා ඇති අතර, 2024.07.21 දින ලබාදී ඇත. නීතිපති දෙපාර්තමේන්තුවෙන් කිසිඳු පිළිතුරක් තවමත් ලැබී

කදී එහි කාලය 2022 ඔක්තෝබර් 13 දක්වා දීර්ඝ කරගෙන තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් නොකර ඉදිකිරීම් අතරමග නතර කර තිබූ අතර, මේ හේතුවෙන් ප්‍රජා විශෝධන වරදකරුවන් උපදේශයනට ලක්කිරීම හා කාර්යාල කටයුතු කිරීම සඳහා වෙනම කාර්යාලයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි. තව ද එම කොන්ත්‍රාත්කරුට 2010 ඔක්තෝබර් 21 දිනැතිව ගෙවා තිබුණු වැඩ ඇරඹීමේ අත්තිකාරම් මුදලින් රු.254,691 ක් ද, කාර්යසාධන ඇපකරයෙන් අයවිය යුතු රු.339,535 ක් ද 2022 දෙසැම්බර් 31 දිනට අයකරගෙන නොතිබුණි.		නොමැත.

3.11 මහජන ආරක්ෂක අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	7,929,941,825	34,854,805	7,895,087,020	-	තත්ත්වාගණනය නොකළ
2022	8,333,048,451	42,717,085	8,290,331,366	-	තත්ත්වාගණනය කළ
2023	8,959,008,794	47,576,801	8,911,431,993	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	විශේෂ කාර්ය බලකායේ කලපලුවාව විවාහක නිල නිවාස සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2007 වර්ෂයේදී ගෙවන ලද අත්තිකාරම් මුදලින් මෙතෙක් අය නොවූ රු. 4,917,900ක් අයවිය යුතුව ඇත.	2021 2022	හිඟ හිටි ණය ශේෂ අය කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගගත යුතු ය.	නීති මඟින් කටයුතු කරමින් පවතී.	නීති මඟින් කටයුතු කරමින් පවතින බව.
2	එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී (Formed Police Unit) සඳහා විශේෂ කාර්ය බලකා නිලධාරීන් යෙදවීමට අදාළ ව්‍යාපෘතිය. අංක අමප/16/0738/703/083 දරන 2016 මැයි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක්සත්	2021 2022 2023	අපේක්ෂිත අරමුණු අප්‍රමාදව ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු ය.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය දැනුවත් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය දැනුවත් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව.

ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බලඇණියක් මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට අවශ්‍ය අවි ආයුධ, ඇතුළු අනෙකුත් උපකරණ මිලදී ගැනීමට රුපියල් මිලියන 1590 ක මුදලක් ලබාදී තිබුණි. එම මුදල් ප්‍රමාණවත් නොවීම මත 2017 අගෝස්තු 30 වන දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/17/1811/784/001 -1 යටතේ තවත් රුපියල් මිලියන 1175 ක මුදලක් සඳහා ද අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.1872,800,823ක වියදමක් දරා තිබුණත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම මත මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ විනිමය වැඩි කරගැනීම, මෙම ඒකකයේ රාජකාරී නියුක්ත නිලධාරීන්ට අමතර ආදායමක් ලැබීම ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකාය වෙත ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ලබාගැනීම, සහභාගී වන නිලධාරීන්ගේ නිපුනතා වර්ධනය හා ජාත්‍යන්තර වශයෙන් අත්දැකීම් ලබාගැනීම, විශේෂ කාර්ය බලකායේ සුදුසුකම් සහිත

	නිලධාරීන් හට අවස්ථා ලබාදීම තුළින් අභිප්‍රේරණය කිරීම යන අරමුණු ඉටුවී නොතිබුණි. එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා රැගෙන යාම සඳහා මිලදී ගත් වාහන 57 ක් ටේලර් 03 ක් සහ අනෙකුත් භාණ්ඩ හා උපකරණ ලබාගැනීම සඳහා රුපියල් මිලියන 1873 ක් පමණ වැයකර තිබුණි. සාමසාධක රාජකාරී සඳහා පිටව යාම ප්‍රමාදවීම මත මිලදී ගන්නා ලද වාහන ඇතුලු අනෙකුත් භාණ්ඩ හා උපකරණ වර්ෂ 01 සිට වර්ෂ 06 අතර කාලයක් නඩත්තු කරමින් නිශ්කාර්යව පැවතීම සහ එම භාණ්ඩවලට ලබාදී ඇති වගකීම් කාලය ද උපයෝජනයකින් තොරව ඉකුත් වීම, උපකරණ නිෂ්ක්‍රීයව පැවතීමෙන් සිදුවන හානි පිළිබඳ අවධානම මෙන්ම සමහර භාණ්ඩ කල් ඉකුත්වී පැවතීම ද විගණනයට නිරීක්ෂණය විය.				
3	විශේෂ කාර්ය බලකායෙහි පවතින ඉඩම් 19 ක් පවරාගෙන නොතිබුණි.	2022	ඉඩම් පවරා ගැනීමට කඩිනම් පියවරගත යුතු වීම.	ඉඩම් පවරාගෙන තක්සේරු වාර්තා ලබා ගැනීමට ක්‍රියා කරමින් පවතී.	ඉඩම් 19 න් 03 ක් මේ වන විට පැවරීමේ කටයුතු අවසන් කර තක්සේරු වාර්ථා ලබාගැනීමට ක්‍රියා කරන බව.

4	විශේෂ කාර්ය බලකායේ වාකරේ, වාලච්චේන ඉඩම් සහ ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් ලබාගෙන නොතිබුණි.	2022	වත්කම්වල තක්සේරු වටිනාකම ලබාගැනීමට කඩිනමින් පියවරගත යුතු වීම.	තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.	තක්සේරු වාර්තා ලබා ගැනීමට ක්‍රියා කර ඇති බව.
5	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමෙහි නිලධාරීන් මිය යෑම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම, සේවය හැරයාම සහ අනෙකුත් හේතූන් මත දැනට අමාත්‍යාංශයේ සේවයේ යෙදී නොමැති නිලධාරීන් හා සේවකයන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වර්ෂයට වඩා වැඩි හිඟ ණයශේෂ එකතුව රු.646,979 ක් වූ අතර, ඒ අතරින් වර්ෂ 05 ඉක්ම වූ වැඩ තහනමට ලක් වූ සේවකයින් තිදෙනෙකුගෙන් අය විය යුතු රු.118,793 ක හිඟ ණයශේෂයක් පැවතුණි.	2021 2022 2023	හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් අනුව කටයුතු කළ යුතු ය.	ණය අය කර ගැනීමට ක්‍රියා කරමින් පවතින අතර, ණය අය කර ගැනීමට නොහැකි නිලධාරීන් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් සිටී.	වර්ෂයට වඩා වැඩි ණය ශේෂ එකතුව වූ රු. 646,979 න් මේ වන විට රු. 39,798 ක් අය කර ගෙන ඇති බවත්, වර්ෂ පහට වඩා වැඩි රු. 118,793 ක ණය ශේෂයෙන් රු. 111,020 ක් අයකරගෙන ඇති බවත් ණය අය කර ගැනීමට නොහැකි නිලධාරීන් සම්බන්ධයෙන් නෛතිකව කටයුතු කරමින් පවතින බව.
6	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතු ය.	2024 වර්ෂයේ බැරකම් ලේඛනය පවත්වා ගැනීමට කටයුතු කරමින් පවතී.	2024 වර්ෂයේ බැරකම් ලේඛනය පවත්වා ගැනීමට කටයුතු කරමින් පවතින බව.

7	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන චක්‍රලේඛයේ 07 ඡේදය අනුව සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගන්නා ලද හා අපහරණය කරන ලද වාහන හැර අනෙකුත් වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර නොතිබුණි.	2023	2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 ඡේදයට අනුව කටයුතු කළ යුතු ය.	2024 වර්ෂයේ මිලදී ගන්නා සහ අපහරණය කරන ලද අනෙකුත් වත්කම් වලද තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කරමින් පවතී.	2024 වර්ෂයේ මිලදී ගන්නා සහ අපහරණය කරන ලද අනෙකුත් වත්කම් වලද තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරමින් පවතින බව.
8	සුහුරුපාය ගොඩනැගිල්ලේ 10 වන මහලේ එක් බිම් කොටසක පමණක් ඉලෙක්ට්‍රොනික හැඳුනුම්පත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පවත්වාගෙන ගිය ද, 10 වන මහලේ බිම් කොටස් දෙකක් සඳහා සහ 8 වන මහලේ බිම් කොටසක් සඳහා ව්‍යාපෘති මුදල් වලින් ජල හා විදුලි බිල්පත් ගෙවා තිබුණි. ඒ අනුව 2023 වර්ෂය සඳහා ව්‍යාපෘති කාර්යාලයට අයත් නොවන බිම් කොටස් දෙකක් සඳහා රු.16,662,198ක විදුලි ගාස්තුවක් සහ රු.1,030,913ක ජල ගාස්තුවක් ගෙවා තිබුණි. තව ද විදුලි ගාස්තු වෙනුවෙන් හිඟ පොළී ලෙස රු.107,811ක මුදලක් ද ව්‍යාපෘති ඒකකය විසින් ගෙවා තිබූ බව නිරීක්ෂණය	2023	ජල හා විදුලි බිල්පත් ගෙවීමේදී විද්‍යුත් හැඳුනුම්පත් ව්‍යාපෘතියට අයත් බිම් ප්‍රමාණයට සහ අදාළ බිල්පත් නියමිත දිනට ගෙවීමට කටයුතු කළ යුතු ය.	මේ වන විටත් එලෙසම ගෙවීම් කරමින් පවතී.	මේ වන විටත් එලෙසම ගෙවීම් කරමින් පවතින බව.

විය.

9	විශේෂ කාර්ය බලකාය විසින් එකම කාණ්ඩයට අයත් භාණ්ඩ එකවර මිල කැඳවීම්කර ලබාගැනීමට හැකියාව තිබියදී අවස්ථා 20 කදී මිල කැඳවීම්කර එකම ආයතනයකින් රු.3,321,832ක් වැයකර භාණ්ඩ මිලදීගෙන තිබූ අතර, කඳවුරු සඳහා අවශ්‍ය ගෑස් ලිප් 18 ක් අවස්ථා 10 කදී මිල කැඳවීම්කර එකම ආයතනයකින් මිලදීගෙන රු.618,000ක මුදලක් ගෙවා තිබුණි. මේ අනුව එකවර මිල කැඳවීම්කර භාණ්ඩ ලබාගැනීමට හැකියාව තිබියදී අවස්ථා කිහිපයකදී මිල කැඳවිම්කර භාණ්ඩ මිලදී ගෙන තිබුණි.	2023	ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී පිරිවැය අවම වන පරිදි උපරිම කාර්යක්ෂමතාව යකින් කටයුතු කළ යුතු ය.	ඉදිරියේදී එකම කාණ්ඩයේ භාණ්ඩ එක් ප්‍රසම්පාදනයක් ලෙස මිල ගණන කැඳවීමට ක්‍රියා කරමින් පවතී.	එකම කාණ්ඩයේ භාණ්ඩ එක් ප්‍රසම්පාදනයක් ලෙස මිල ගණන කැඳවීමට ක්‍රියා කරමින් පවතින බව.
10	1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනතේ 9 (ඇ) වගන්තිය අනුව සෑම අවුරුද්දකට ම යටත් පිරිසෙයින් එක් වරක්වත් නියමිත ආකාරයට රාජ්‍ය නොවන සංවිධානවල ගිණුම් විගණනය කිරීමට සැලැස්විය යුතු වුව ද, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව 2022 වර්ෂයේ ක්‍රියාකාරී මට්ටමේ	2023	1980 අංක 31 දරණ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනතේ 9(ඇ) වගන්තිය අනුව කටයුතු කළ යුතු ය.	විගණනය කරන ලද මූල්‍ය වාර්තා එවන ලෙස අදාළ සංවිධාන දැනුවත් කර ඇත. අවුරුදු 03 කට වඩා වාර්තා ඉදිරිපත් නොකරන ලද සංවිධාන අක්‍රිය සංවිධාන ලෙස නම් කිරීම.	විගණනය කරන ලද මූල්‍ය වාර්තා එවන ලෙස අදාල සංවිධාන දැනුවත් කර ඇති බව සහ වසර 03 කට වඩා වාර්තා ඉදිරිපත් නොකරන ලද සංවිධාන අක්‍රීය සංවිධාන ලෙස නම් කර ඇති බව.

	පවතින රාජ්‍ය නොවන සංවිධාන 691 න් විගණනය කරන ලද මූල්‍ය වාර්තා ඉදිරිපත්කර ඇත්තේ සංවිධාන 54 ක් පමණි.				
11	මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව 476 ක් වුවද පුරප්පාඩු 166 පැවැති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 35 ක් පුරප්පාඩු පැවැතීම අමාත්‍යාංශ කටයුතු පවත්වාගෙන යෑමට බාධාවක් වී තිබූ අතර, උක්ත පුරප්පාඩු තුළ අධ්‍යක්ෂ (ශ්‍රී.ල.ඉ.සේ), අධ්‍යක්ෂ (සැලසුම්), සහකාර ලේකම් හා අභ්‍යන්තර විගණක යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු ද අන්තර්ගත විය.	2021 2022 2023	පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවරගත යුතු ය.	පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය අංශ දැනුවත් කිරීම් සිදුකර ඇත.	පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය අංශවලින් ඉල්ලීම් සිදුකර ඇති බව.
12	විශේෂ කාර්ය බලකායේ නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 10,745 ක් වුව ද, පුරප්පාඩු 3,475 පැවැති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 32 ක් විය.	2021 2022 2023	පවතින පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවරගත යුතු ය.	අවශ්‍ය පුරප්පාඩු පුරවා ගැනීමට කඩිනමින් ක්‍රියා කරමින් පැවතීම.	අවශ්‍ය පුරප්පාඩු පුරවා ගැනීමට ක්‍රියාකරමින් පවතින බව.
13	විශේෂ කාර්ය බලකායේ කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලධාරීන් 03 දෙනෙකු, පොලිස් පරීක්ෂක නිලධාරීන් 80 දෙනෙකු, උප පොලිස් පරීක්ෂක (ප්‍රවාහන) නිලධාරීන් 03 දෙනෙකු,	2022 2023	අතිරික්ත සේවකයන්ට අදාළ අනුමත සීමා සංශෝධනයට කඩිනම් පියවරගත යුතු ය.	අතිරික්ත සේවකයන්ට අදාළ අනුමත සීමා සංශෝධනයට මෙතෙක් පියවර ගෙන නොමැත.	අතිරික්ත සේවකයන්ට අදාළ අනුමත සීමා සංශෝධනයට මෙතෙක් පියවර ගෙන නොමැති බව.

	පොලිස් සැරයන් නිලධාරීන් 428 දෙනෙකු හා පොලිස් සැරයන් රියදුරු නිලධාරීන් 32 දෙනෙකු අතිරික්තව සේවයේ යෙදී තිබුණි.				
14	විශේෂ කාර්ය බලකායට අනුයුක්ත සිවිල් සේවක කාර්ය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 709 ක් වුව ද, පුරප්පාඩු 182 ක් පැවැති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 26 ක් විය.	2022 2023	පවතින පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවරගත යුතු ය.	ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත මෙම බඳවාගැනීම් කර ගැනීමට වාර්තා කර ඇත.	ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත මෙම බඳවා ගැනීම් කර ගැනීමට වාර්තා කර ඇති බව.

3.12 වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	130,307,876	130,307,876	-	-	තත්ත්වාගණනය කළ
2022	213,240,849	213,240,849	-	-	තත්ත්වාගණනය කළ
2023	248,981,028	248,981,028	-	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2020 මැයි 12 දින සිට 2021 මාර්තු 22 දින දක්වා අමාත්‍යාංශ ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස පත්ව සිටි නිලධාරීන් දෙදෙනෙක් වෙත මාසික වැටුප්, ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලෙස පිළිවෙලින් රු. 1,258,526 ක් හා රු. 1,564,328 ක මුදලක් ගෙවා තිබුණද සේවයට වාර්තා කිරීම සම්බන්ධයෙන් පැමිණීම්, පිටවීම් පිළිබඳ ලේඛන වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි.	2022 2.4 (අ) (i)	පැමිණීම්, පිටවීම් ලේඛන හා කාර්යසාධන වාර්තා අනුව ගෙවීම් කළ යුතුය.	පැමිණීමේ හා පිටවීමේ ලේඛන ලබාදෙන ලෙස දන්වා ඇතත් එම ලේඛන පාලන අංශය වෙත ලබාදී නොමැත.	මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොමැත.
2	අංක KR 1491 දරන සංචිත වාහනය සඳහා 2022 වර්ෂයේදී හා පෙර	2022 2.4 (අ) (ii)	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	වැලක්වීමේ ක්‍රියාමාර්ග දන්වා නොමැත.	මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් මේ

	වර්ෂයේදී ඉන්ධන ලබාදී තිබුණද එම වාහනයට අදාලව ධාවන සටහන් ලැබී තිබුණේ මාස 07 කට අදාළව පමණි. විගණනයට ඉදිරිපත් කල ධාවන සටහන්වල අඩංගු විස්තර අනුව එම වාහනය එම කාලය තුල ලේකම්තුමියගේ නිල නිවස හා ලේකම්තුමියගේ රාජකාරී සඳහා යොදවා ගෙන තිබූ අතර 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008/(VI) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය සඳහා අදාල මාසික ඉන්ධන දීමනාව වූ රු. 26,620 ක් ලබා ගනිමින් සිටියදී සංචිත වාහනය සඳහා ඉන්ධන ඇණවුම් මඟින් රු. 156,470 ක පෙට්‍රල් ලීටර් 1,006 ක ප්‍රමාණයක් ලේකම්තුමියගේ රාජකාරී සඳහා නැවත ලබාදී තිබුණි.				දක්වා ගෙන නොමැත.
3	අමාත්‍යාංශය විසින් 2023 ජුනි 16 සිට 2023 දෙසැම්බර් 12 දක්වා වූ කාල පරාසය තුල වසර 02 ක කොන්ත්‍රාත් කාලයකට වෙළඳ ප්‍රදර්ශන සම්බන්ධීකරණ නිලධාරීන් 05 දෙනෙකු සහ කළමනාකරණ සහකාරවරු 03 දෙනෙක් සඳහා පත්වීම්	2023 2.2 (ආ)	අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.	වැලක්වීමේ ක්‍රියාමාර්ග දන්වා නොමැත.	අදාළ තොරතුරු මේ දක්වා ඉදිරිපත් කර නොමැත.

	ලබාදී තිබූ අතර ඔවුන්ගේ පත්වීම් වල නීත්‍යානුකූලභාවය, බඳවාගැනීමේ ක්‍රියාවලිය, ඔවුන්ගේ දීමනා තීරණය කිරීමේ පදනම, රාජකාරී පැවරුම් කිරීම, රාජකාරී සඳහා වාර්තා කරන ස්ථාන, ආසන්නතම අධීක්ෂණ නිලධාරියා හා රාජකාරී ඉටුකිරීම සම්බන්ධ පිළිගත හැකි ලිඛිත වාර්තාවන් විගණනයට ඉදිරිපත් නොවූ අතර රු.1,911,667 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ඉහත නිලධාරින්ට 2023 ජූලි සිට 2024 පෙබරවාරි දක්වා මහපොළ භාර අරමුදල මගින් ලබාගත් අත්තිකාරම් මුදලින් ගෙවා තිබුණි.				
4	අමාත්‍යාංශයේ අරමුණු අතුරින් ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සකස් කර නිම කිරීම, අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාල දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යෑම හා දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමග සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම සහ ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මග	2023 3.1 (අ) 2022 3.1 (අ) 2021 3.1 (අ)	අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියේ දෙවෙනි කෙටුම්පතද සකස් කර ඇති අතර එය ලෝක වෙළෙඳ සංවිධානයේ තාක්ෂණික සහාය මත වැඩිදියුණු කිරිම ආරම්භ කර ඇත. ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා එම කාර්යාලයේ ගොනු ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතියක් ලෝක බුද්ධිමය දේපළ සංවිධානය අනුග්‍රහයෙන් 2024	මේ දක්වා අරමුණු ඉටු වී නොමැත.

	පෙන්වීම යන ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.			වර්ෂයේ අගභාගයේදී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	
5	පාරිභෝගිකයා වඩාත් සුරක්ෂිත කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල නීති අණපනත් යාවත්කාලීන හා සංශෝධන කඩිනම් කලයුතු නමුත් 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබද අධිකාරී පනත, 2003 අංක 36 දරන ජාතික බුද්ධිමය දේපල පනත හා 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිත සේවා පනත 2023 වර්ෂය අවසන් වන විටත් සංශෝධනය කර නොතිබුණි.	2023, 3.1 (ඇ)	පනත් සංශෝධනය කිරීමට කටයුතු කල යුතුය.	මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ සංශෝධන ඇතුලත් කෙටුම්පත මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති අතර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතට හා ජාතික බුද්ධිමය දේපල පනතට යෝජිත සංශෝධනයන් ඇතුලත් කරන ලද කෙටුම්පත් නීතිපති දෙපාර්තමේන්තුව හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	සංශෝධන කටයුතු මේ වන විටත් අවසන් වී නොමැත.
6	තිරසාර සංවර්ධනය යටතේ ඉලක්කයක් ලෙස ආහාර හිඟයක් ඇති නොවන ලෙස ආහාර සංචිතයක් පවත්වා ගැනීම අධීක්ෂණය කිරීම දක්වා තිබුණද එලෙස ආහාර සංචිත පවත්වා ගැනීම සිදුකර නොතිබුණු අතර සංචිත පවත්වාගෙන යාමට නිසි ක්‍රමවේදයක් ඇති කිරීමටද කටයුතු කර නොතිබුණි.	2023 4 (අ) 2022 4 (ආ) 2021 3.2	ආහාර සංචිත පවත්වා ගැනීමේ නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය.	ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන හෙයින්, ආහාර සංචිත පවත්වා ගැනීමට නොහැකි වී ඇති බව.	මේ දක්වා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොමැත.

3.13 වාරිමාර්ග අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	18,262,130,555	24,135,781	18,237,994,774	-	තත්ත්වාගණනය කළ
2022	20,711,971,558	24,353,274	20,687,618,284	-	තත්ත්වාගණනය කළ
2023	20,723,346,355	127,685,278	20,595,661,077	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	භාණ්ඩාගාර ලේකම් විසින් වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධව නිකුත්කළ 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් වැය විෂය අංක 2506 - යටිතල පහසුකම් සංවර්ධනය යටතේ 2020 සහ 2021 වර්ෂයන් තුළ රු. 57,064,188,815 ක් වැයකර සංවර්ධනය කරන ලද දේපළ නිශ්චිත ලෙස හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.	2022 2021	භාණ්ඩාගාර ලේකම් විසින් 2017 ජූනි 28 දින නිකුත්කර ඇති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය මඟින් ලබාදී ඇති උපදෙස් අනුව නව ජලාශ ඉදි කිරීම, ජලාශයන්හි වේලි ශක්තිමත් කිරීම, වාරිමාර්ග පද්ධති වැඩිදියුණු කිරීම, වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය, වාරි ඉඩම් සංවර්ධනය සහ වාහන හා අනෙකුත් වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත	2101 සිට 2105 දක්වා වැය ශීර්ෂ වලින් ජනනය වන මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කර තිබූ අතර වැය විෂය 2506 - යටිතල පහසුකම් සංවර්ධනය යටතේ දරන ලද මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධව 2022 වර්ෂයේ සිට ගිණුම්කරණ ප්‍රතිපත්ති සකස් කර ගිණුම්ගත කිරීමට උපදෙස් ලබාදී තිබුණි.	නව ජලාශ ඉදි කිරීම, ජලාශයන්හි වේලි ශක්තිමත් කිරීම, වාරිමාර්ග පද්ධති වැඩිදියුණු කිරීම, වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය, වාරි ඉඩම් සංවර්ධනය සහ වාහන හා අනෙකුත් වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි.

			වාර්තා කිරීමට කටයුතු කළ යුතුය.		
2	මොරගහකන්ද කළුගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතියට තීරුබදු සහන බලපත්‍ර යටතේ වාහන 180 ක් හා යන්ත්‍රෝපකරණ 182 ක් 2013 හා 2014 වර්ෂවලදී ආනයනය කර තිබූ අතර එම බලපත්‍රයන්හි වලංගු කාලය වසර 1 ත් 2 ත් අතර පරාසයක පැවති අතර ව්‍යාපෘතිය 2016 ජුලි 22 දිනෙන් අවසන් වියයුතු වුවද 2018 අප්‍රේල් 26 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර ඇතත් ඊට අනුරූපීව අදාල බලපත්‍රයන් හි කාලය දීර්ඝ නොකර එම වාහන අවිධිමත් පරිහරණයට ඉඩකඩ සලසා තිබුණි.ආනයන බලපත්‍ර කොන්දේසි උල්ලංගනය හේතුවෙන් වාහන 41 ක් ශ්‍රී ලංකා රේගුව වෙත භාරදෙන ලෙස දැනුම් දී තිබුණි. එයින් වාහන 16 ක් කොන්ත්‍රාත් සමාගම විසින්ද ඉතිරි වාහන 30 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින්ද භාවිතා කරන බව රේගුවේ ප්‍රධාන සහකාර නිවාරන නිලධාරී වෙත දැනුම් දී තිබුණි. එසේම වාහන 46 ක් පිලිබඳව සඳහන්	2023	වාහන බලපත්‍ර කාලසීමාව දිර්ඝ කිරීම හා ඒවා පැවරීමේ නීත්‍යානුකූල භාවය, තහවුරු කල යුතුය.	ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමත් සමඟ එම වාහන පාවිච්චි කිරීමේ කාලය ද දීර්ඝ කිරීමට ඉල්ලුම්කර නොමැත. දැනට එම නිලධාරීන් කිසිවෙකු නොමැති බැවින් තොරතුරු සොයා ගැනීමේ හැකියාවක් නොමැත. ගිවිසුමෙහි 14:1 (b) වගන්තිය යටතේ ආනයනය කරන ලද භාණ්ඩ කොන්ත්‍රාත්කරු විසින් ප්‍රතිඅපනයනය නොකරන්නේ නම් අදාළ බදු මුදල් ගෙවා මෙම රටෙහි භාවිත කිරීමට ප්‍රතිපාදන සලසා තිබුනද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ප්‍රතිඅපනයනය නොකරන ලද වාහන හා යන්ත්‍ර මේ දක්වා අදාළ බදු මුදල් ගෙවා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඇතත් අදාල උපලේඛන ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් අතිරේක වාහන 5 හඳුනාගත නොහැකි විය. මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (කාර්ය පැවරුම්)ගේ ලිපිය අනුව කොන්ත්‍රාත් සමාගම විසින් මෝටර්රථ වල අයිතිය පවරා ගැනීම සඳහා වූ ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති බව සඳහන් වුවද එම ලිපි ගොනුව විගණනයට ඉදිරිපත් නොවීය. මෙම ව්‍යාපෘතිය සඳහා ආනයනය කරන ලද තවත් වාහන 134 ක් හා භාණ්ඩ අයිතම 182 ක් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම පරිදි පවරා දීමට වාරිමාර්ග අමාත්‍යාංශයේ විරෝධතාවයක් නොමැතිබව වාරිමාර්ග අමාත්‍යාංශ අතිරේක ලේකම් විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී තිබුණි.කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද වාහන 16 සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණයෙන් අනතුරුව රේගු ආඥාපනතේ විධි විධාන යටතේ අයකළ හැකි රු.මි. 476 ක දඩය රු.මි. 105 ක් දක්වා අඩුකර 2020 ඔක්තෝබර් 15 දින අයකර ඇතත් එම වාහන හා භාණ්ඩ තීරුබදු අයකර

	කොන්ත්‍රාත්කරු වෙත පැවරුබවට විගණනයට තහවුරු නොවීය.				
3	භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පිරිවැය යුරෝ 20,629,921.18 හෙවත් රුපියල් මිලියන 3,628.39 ක් යටතේ විදේශීය සමාගමක් සමඟ ඉංජිනේරු, ප්‍රසම්පාදන සහ ඉදි කිරීම් (EPC) කොන්ත්‍රාත්තුවක් ලෙස ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට වාරිමාර්ග හා ජල සම්පත් අමාත්‍යාංශ ලේකම් විසින් 2017 ඔක්තෝම්බර් 03 වන දින ගිවිසුමකට එළඹ තිබුණි.මෙම ව්‍යාපෘතියේ දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා යූරෝ 1,473,462 ක් වෙන් කර තිබුණද ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට සමගාමීව දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිනොකිරීම තුළ ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත	2021	දත්ත මධ්‍යාස්ථානය ඉදිකිරිමේ අවශ්‍ය කටයුතු සිදු කල යුතු අතර සැලසුම් කල පරිදි කටයුතු නොකිරිම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරින් සම්බන්ධව ක්‍රියාමාර්ග ගතයුතු වීම.	සැලසුම් සියල්ල මේ වන විට නාගරික සංවර්ධන අධිකාරය වෙත ඉදිරිපත්කර ඇතත් සින්නක්කර ගිවිසුම පවා මේ වන තුරුත් ලබා දී නොමැත, කෙසේ නමුත් මේ වන විටත් දත්ත මධ්‍යස්ථානයක් රත්මලාන ව්‍යාපෘති කාර්යාලයෙහි ස්ථාපිත කර තිබුණි.	සැලසුම් කල දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම කර නොතිබුණි.

	ප්‍රතිලාභ ලබාගත නොහැකි වී තිබුණි.	
4	ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධව බස්නාගොඩ ජලාශ ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිවරයා සහ China Machinery Engineering Corporation සමාගමේ සභාපතිවරයා අතර 2013 මැයි 15 වන දින එළඹ තිබූ කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඇ.ඩො. මිලියන 229.5 ක වටිනාකමකින් යුත් උක්ත ව්‍යාපෘතිය 2014–2017 කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කර අවසන් කිරීමට නියමිතව තිබුණි. එම ව්‍යාපෘතියේ මූලික ජල මූලාශ්‍රය වූ බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, 2016 මාර්තු 22 හා 2019 ජූනි 12 යන දිනයන් හිදී අවබෝධතා ගිවිසුම් දෙකකට එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) විසින් ලබාදුන් නිර්දේශ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව (CAPC) විසින්	2022

බස්නාගොඩ ජලාශයේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.2,347,406,831 කට චීනයේ සිනෝහයිඩ්‍රෝ සමාගම (Sinohydro Corporation Limited) වෙත ප්‍රදානය කිරීම සඳහා නිර්දේශ ලබා දී තිබුණි. ඒ සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් උක්ත සමාගම සමඟ 2019 ජූනි 13 වන දින රු.2,394,354,968 ක (රු.46,948,137ක ජාතිය ගොඩනැගීමේ බදු ඇතුළත්ව) වටිනාකමකින් යුත් ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ව්‍යාපෘතියට අදාළව පහත නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.				
(අ) මෙහිදී නිලධාරීන් හයදෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) කොන්ත්‍රාත්තුව සඳහා අවම මිල ඉදිරිපත් කර තිබුණු කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ රු.මිලියන 2,093 ක ලංසුව රු. මිලියන 2,347ක් ලෙස නිවැරදි විය යුතු බවට ගණනය කර තිබුණි. එහිදී ඉංජිනේරු	2022	වගකීම් විරහිතව ක්‍රියා කර ඇති තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමටත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නොසලකා කටයුතු කිරීම නීතිය බලාත්මක	වගකීම් විරහිතව ක්‍රියා කර ඇති තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමට අදාළ පත්වීම් බලධාරීන් වෙත යොමුකර නොතිබුණි . මීට අමතරව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින්	තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබූ අතර රජයට සිදු කර ඇති පාඩුව අයකර ගැනීමට නීතිය බලාත්මක

ඇස්තමේන්තුවේ අයිතම අංක 05 යටතේ මූලික වැඩ සඳහා (Preliminaries) කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ රු.මිලියන 99.689ක වියදමට රු.254,062,080 ක අමතර වටිනාකමක් එකතු කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) කටයුතු කර තිබුණි. එසේ වුවද කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ මිල ගණන් තුළ අයිතම අංක 4 යටතේ ස්ථාපනය කීරීම, ඉදිකිරීම සහ වෙනත් සේවාවන් (Installation/ Construction and other Services) ලෙස රු.254,062,080 ක් දක්වා තිබූ අතර ඒ පිළිබඳ නොසලකා තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) අයිතම අංක 5 සඳහාද සාවද්‍ය ලෙස රු.254,062,080ක් එකතු කර ඉදිරිපත් කළ ලංසුවට වඩා රු. 254,062,080ක් වැඩියෙන් කොන්ත්‍රාත්තුව පැවරීමට නිර්දේශ කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සිදුකර තිබුණු උක්ත සංශෝධනය ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් කොන්ත්‍රාත් ප්‍රසම්පාදන ලේඛනයේ මූලික නිර්ණායකයන්ට පටහැනි වූ අතර	කිරීමේ නියෝජිත ආයතන වෙත පැමිණිලි කළ යුතුය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නොසලකා කටයුතු කිරීම තුළ රජයට සිදු කර ඇති පාඩුව අයකර ගැනිමට නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන වෙත පැමිණිලි කර නොතිබුණි .	කිරීමේ නියෝජිත ආයතන වෙත පැමිණිලි කර නොතිබුණි .

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(අ)(v) වගන්තිය අනුව ලංසුකරුගෙන් ලිඛිතව පැහැදිලි කිරීම් ලබා නොගෙන රු. 254,062,080 කින් කොන්ත්‍රාත් වටිනාකම වැඩි කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණි. එහිදී ප්‍රසම්පාදන අස්ථිත්වය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.3 යටතේ පැවරී ඇති වගකීම් නිසිලෙස ඉටු කරද නොතිබුණි.				
(ආ) තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර රු.254,062,080 කින් වැඩිකරන ලද වටිනාකමට කොන්ත්‍රාත්තුව පිරිනැමීම හා ඒ මත පදනම්ව අත්තිකාරම් ගණනය කර ගෙවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත 2019 වර්ෂයේදී වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස (Mobilization advance) රු. 50,812,416 ක් වැඩිපුර ගෙවා තිබුණි.	2022	වැඩිපුර ගෙවා ඇති රු.50,812,416ක අත්තිකාරම් මුදල සඳහා 2019 වර්ෂයේ සිට ආපසු අයකර ගනු ලබන දින දක්වා වූ කාල සීමාවට අදාළව පොලිය ගණනය කර එම පොළිය කොන්ත්‍රාත්කරු ගෙන්හෝ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.	අත්තිකාරම් මුදල් ලෙස කොන්ත්‍රාත්කරු වෙත ගෙවන ලද රු. 50,812,416 මුදලින් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමේදී (Interim payment) රු. 40,223,654 මුදලක් අඩු කර ගෙන ඉතිරි මුදල වන රු.10,587,862 ඉදිරි ගෙවීම් කටයුතු වලදී අඩු කර ගැනීමට තවදුරටත් ඉතිරිව ඇත..	වැඩිපුර ගෙවා ඇති අත්තිකාරම් මුදල සඳහා ආපසු අයකර ගනු ලබන දින දක්වා වූ කාල සීමාවට අදාළව පොලිය ගණනය කොන්ත්‍රාත්කරු ගෙන් හෝ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කොන්ත්‍රාත්කරු සමඟ 2019 ජූනි 13 වන දින	2022	කොන්ත්‍රාත් ගිවිසුමෙහි විශේෂිත කොන්දේසි පිළිබඳ	කොන්ත්‍රාත්කරුට වාසිදායක ලෙස ගෙවීම් කළ නිලධාරීන්ට එරෙහිව	කොන්ත්‍රාත් ගිවිසුමෙහි විශේෂිත කොන්දේසි පිළිබඳ

එළඹ තිබුණු කොන්ත්‍රාත් ගිවිසුමෙහි iv වන කොටසෙහි ඇතුළත් විශේෂිත කොන්දේසි (Particular Conditions of Contract) 14.4 උප වගන්තිය යටතේ වූ අතුරු ගෙවීම් සහතික කිරීමට අදාළව නිමකළ යුතු භෞතික ප්‍රගතිය ළඟා කරගෙන නොතිබිය දී වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් දැනුවත් කිරීමකින් තොරව හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව (CAPC) විසින් අනුමත කරතිබූ කොත්ත්‍රාත් ගිවිසුම අනුමැතියකින් තොරව වෙනස් කර ගෙවීම් සහතික කිරීමට භාවිතා කොට තිබුණි. ඒ අනුව 2020 සිට 2022 දක්වා අතුරු ගෙවීම් (Interim Payments) 11 ක් මගින් රු.401,165,861ක් විධිමත් අධිකාරී බලයකින් තොරව හා කොන්ත්‍රාත් ගිවිසුමේ අදාළ වගන්තිය පිළිබඳ නොසලකා ගෙවීම් කර තිබුණි.		නොසලකා හැර, අමාත්‍යාංශ ලේකම්ගේ හා අමාත්‍යමණ්ඩල අනුමැතියෙන් තොරව කොන්ත්‍රාත්කරුට වාසිදායක ලෙස ගෙවීම් කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුයි.	විනයානුකූලව කටයුතු කර නොතිබුණි.	නොසලකා ගෙවීම් කල නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කර නොතිබුණි.
(ඇ) ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් වලට අදාළ First Edition 1999 (ISBN2 – 8843-0220-9) පොදු මාර්ගෝපදේශයේ 14.2 උප වගන්තිය ප්‍රකාරව අත්තිකාරම් ගෙවීම්	2022	කොන්ත්‍රාත් ගිවිසුමෙහි විශේෂිත කොන්දේසි පිළිබඳ නොසලකා හැර, අමාත්‍යාංශ ලේකම්ගේ අධිකාරී බලයෙන්	කොන්ත්‍රාත්කරුට වාසිදායක ලෙස ගෙවීම් කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කර නොතිබුණි	නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කර නොතිබුණි.

නැවත අයකර ගැනීම මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 30 සම්පූර්ණ කිරීමෙන් පසුව සිදුකරනු ලබන බවට වූ විශේෂ කොන්දේසියට සමගාමීව 14.4 උප වගන්තියෙහි වූ ගෙවීම් ලේඛනයට (Schedule of Payment) අදාළ විශේෂ කොන්දේසි ඇතුළත් කර තිබුණද ඒ පිළිබඳ නොසලකා ගෙවීම් කිරීම හේතුවෙන් 2022 ඔක්තෝබර් 31 දිනට ව්‍යාපෘතියේ අදාළ ගෙවීම් සහතික කරන දින වන විට භෞතික කාර්යසාධනය සියයට 17.09 ක් ව පැවතියදී, 2020-2022 කාලපරිච්ඡේදය තුළ අතුරු ගෙවීම් 11 ක් මගින් රු. 401,165,861 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.		තොරව කොන්ත්‍රාත්කරුට වාසිදායක ලෙස ගෙවීම් කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුයි.		
(ඉ) ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු වන Chaina Machinery Engineering Corporation විසින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අතිරේක සමානාධිකාරිවරයා අමතන ලද අංක CMEC/ATTANA/20120730/007 හා 2012 ජූලි 30 දිනැති ලිපිය මගින් ප්‍රධාන කොන්ත්‍රාත්තුවට අතිරේකව සිදුකරනු ලබන කාර්යන්හි	2022	මෙම කොන්ත්‍රාත්තුව භාර ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ගෙවීම් සහතික කිරීම, කොන්ත්‍රාත් පරිපාලනය, යන කාර්යයන් තුළ අතිරේක කාලයක්, අමතර පරිපාලන පිරිවැයක් හා අවිධිමත්භාවයක් සිදු වී තිබේද යන්න පරීක්ෂණ	ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ගෙවීම් සහතික කිරීම, කොන්ත්‍රාත් පරිපාලනය, යන කාර්යයන් තුළ අතිරේක කාලයක්, අමතර පරිපාලන පිරිවැයක් හා අවිධිමත්භාවයක් සිදු වී තිබේද යන්න සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලයක් පත් කර තහවුරු කර ගැනීමට කටයුතු කර	පරීක්ෂණ මණ්ඩලයක් පත් කර තහවුරු කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(Indirect Works) සමස්ත වගකීම ඍජුවම ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පැවරෙන බවත් උප කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යන් ඉටුකිරීමේ ප්‍රමාදයන් නිසා දැරීමට සිදුවන අමතර පිරිවැය හේතුවෙන් ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ කාර්යන්ට සිදුවන අහිතකර බලපෑම සම්බන්ධයෙන් වන කිසිදු වගකීමක් එම සමාගම වෙත නොපැවරෙන බවත්, එකී ප්‍රමාදයන් සඳහා කාලය දීර්ඝ කිරීම් ලබා ගැනීමට හා ඒ සඳහා වන අතිරේක පිරිවැය ලබාගැනීමට තම සමාගමට අයිතියක් පවතින බවත් දැනුම් දී තිබුණි. ව්‍යාපෘතිය 2017 වසරේ නිම කළ යුතු වුවද එම කාල සීමාව තුළ ජල මූලාශ්‍රයේ ඉදිකිරීම් කටයුතු නිමකිරීම ප්‍රායෝගිකව කළ නොහැකිව තිබියදී ඒ පිළිබඳ සැලකිලිමත් වීමෙන් තොරව 2016 මාර්තු 12 දින වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති සමඟ පළමු අවබෝධතා ගිවිසුමට (MOU) එළඹ තිබුණි. එහිදී දෙපාර්තමේන්තුව විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා

මණ්ඩලයක් පත් නොතිබුණි.

කර තහවුරු කර ගත යුතුය.

	ගැනීමෙන් තොරව අදාළ උප කොන්ත්‍රාත්තුව භාර ගෙන තිබූ අතර 2019 ජූනි මස 12 දින දෙවන අවබෝධතා ගිවිසුමට එළඹෙන අවස්ථාව වන විටත් ප්‍රධාන කොන්ත්‍රාත් ගිවිසුමේ කාලය අවසන් වී තිබුණි. කොන්ත්‍රාත්තුව මේ දක්වා නිම කර නොතිබීම මේ හේතුවෙන් ප්‍රධාන කොන්ත්‍රාත්කරුට කාලය දීර්ඝ කර ගැනීමට සහ අතිරේක පිරිවැය සඳහා හිමිකමක් පැවතීම හා එහි වගකීම උප කොන්ත්‍රාත්කරු ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත විතැන් කිරීමේ හැකියාවක් පැවතුණද ඒ සම්බන්ධව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.				
5	මහා/මධ්‍යම පරිමාණ ව්‍යාපෘති පිළිබඳ දස අවුරුදු සැලැස්ම අනුව මහගල්ගමුව වැව ප්‍රගුණවත් කිරීම, පහළ මල්වතු ඔය ජලාශය ඉදිකිරීම, රිදිමාලියද්ද ඒකාබද්ධ සංවර්ධනය, කිවුල් ඔය ජලාශය, කවුඩුල්ල වම් ඉවුර ප්‍රධාන ඇළ දම්සෝපුර වැව දක්වා දීර්ඝ කිරීම, රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධනය සහ මහවැලි බී කලාපය මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධනය යන ව්‍යාපෘති 7 ක	2022	දස අවුරුදු සැලැස්ම තුළ ඇතුළත් ව්‍යාපෘතිය ප්‍රමාදයට බලපෑ හේතුන් හා ජාතික ආර්ථිකයට අහිමි වූ දායකත්වය පිළිබඳ ඇගයීමක් සිදු කොට අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය. පහළ මල්වතු ඔය ව්‍යාපෘතිය හැර ඉතිරි ව්‍යාපෘති අත්හැර දමා ඇති බැවින් එම	දස අවුරුදු සැලැස්ම තුළ ඇතුළත් එක් එක් ව්‍යාපෘතිය ප්‍රමාද වීමට බලපෑ හේතු හා එකී ප්‍රමාදය තුළින් ජාතික ආර්ථිකයට අහිමි වූ දායකත්වය පිළිබඳ ඇගයීමක් සිදු කොට අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කර නොතිබුණි.	ව්‍යාපෘතිය ප්‍රමාදයට බලපෑ හේතුන් හා ජාතික ආර්ථිකයට අහිමි වූ දායකත්වය පිළිබඳ ඇගයීමක් සිදු කොට අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කර නොතිබුණි.

ශක්‍යතා අධ්‍යයනයන් නිමකිරීමෙන් අනතුරුව 2012 - 2017 කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමට 2011 සැප්තැම්බර් 28 දිනැති අංක 11/1851/508/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී තිබුණි. එම ව්‍යාපෘති 7 ට අදාළව රු. මිලියන 76,043 ක් වූ මුළු පිරිවැය ඇස්තමේන්තු යටතේ 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6,528 ක් වැය කර තිබුණු නමුත් එකී ව්‍යාපෘති අතරින් එක් ව්‍යාපෘතියක්වත් සමාලෝචිත වර්ෂය දක්වා සම්පූර්ණයෙන් නිම කර නොතිබූ අතර ව්‍යාපෘති 3 කට අදාළව නිම කිරීමේ ප්‍රතිශතය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක වලින් සියයට 1 ත් 5 ත් අතර විය. එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් නව කුඹුරු හෙක්ටයාර් 68,000 කට පමණ වාරි ජලය සැපයීම, දැනට වගාකරනු ලබන ඉඩම් හෙක්ටයාර් 203,000 ක් සඳහා යල මහ දෙකන්නයේම ජලය සැපයීම සහ මෙ.වොට්. 200 ක විදුලි බලය නිෂ්පාදන අරමුණු කර තිබුණද එම ප්‍රතිඵල ජාතික ආර්ථිකයට එක් වී නොතිබුණි.

ව්‍යාපෘති ඉදිරියට ක්‍රියාත්මක කිරීමේ හැකියාව සලකා බලා මෙවැනි ප්‍රමාදයන් වැළකෙන පරිදි ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.

6	අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 49,994 ක් වූ ඵලදායිතා ප්‍රවර්ධනය සහ වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය (PEISEIP) සහ තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති 2 සඳහා සැලසුම් කළ කාලය මෙන් දෙගුණයකටත් වැඩි කාලයක් ගතවී තිබුණද නිමකර නොතිබුණි. 2017 හා 2014 වර්ෂවල සිට ආරම්භ කර තිබූ එම ව්‍යාපෘතීන්හි කාලය දීර්ඝ කිරීම සඳහා විවිධ අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණ ද එම ප්‍රමාදයන් හේතුවෙන් මූලික අරමුණු යටතේ හඳුනාගෙන තිබූ වාසි සැලසුම්ගත පරිදි ලබා ගැනීමට නොහැකි වීම පිළිබඳව විශ්ලේෂණයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද උක්ත ව්‍යාපෘති 2 සඳහා වර්ෂ 9 ක කාල සීමාවක් තුළ දරා ඇති රු. මිලියන 2,354.05ක පිරිවැයෙන් මේ දක්වා ජාතික ආර්ථිකයට කිසිදු දායකත්වයක් ලැබී නොතිබුණි.	2023	ව්‍යාපෘති 2 සඳහා දරා ඇති පිරිවැයෙන් මූලික අරමුණු සඳහා දායකත්වයන් පිළිබඳ නැවත විමසා බැලිය යුතුය	ව්‍යාපෘති 2 හි ඉදිකිරීම් අවසන් කර එමගින් බලාපොරොත්තු වූ මූලික අරමුණු ලගා කර ගැනීමට කටයුතු කර නෙතිබුණි.	මූලික අරමුණු සඳහා දායකත්වයන් සිදු වී නොතිබුණි.

7	2014 වර්ෂයේ ආරම්භ කළ ගිං නිල්වලා ව්‍යාපෘතිය සඳහා 2014.09.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව 2014.11.05 වන දින වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, චීනයේ ඉදිකිරීම් සමාගමක් සමඟ ඇ.ඩො.මිලියන 690ක වටිනාකමකින් යුත් ඉංජිනේරුමය ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) ගණයේ කොන්ත්‍රාත්තුවක් සඳහා ගිවිසුමක් අත්සන් කර තිබුණි. 2017වර්ෂයේ නිම කිරීමට යෝජිතව තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා රු.4,011,054,982ක සංචලන අත්තිකාරමක් 2014 හා 2015 වර්ෂවල ගෙවා තිබුණි.මූලික භූ විද්‍යාත්මක සමීක්ෂණ හා මැනුම් කටයුතු ආරම්භ කළද 2015 දී ව්‍යාපෘතිය නතර කරන ලදී. 2023 වර්ෂයේ සිට කාර්යය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා ඇතත් මේ දක්වා කටයුතු ආරම්භ කර නැත. 2023 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 4,089.54ක් වැය කර ඇතත් කිසිදු දායකත්වයක් මෙම ව්‍යාපෘතිය මගින් ජාතික ආර්ථිකයට ලැබී නොතිබුණි.එසේම අමාත්‍ය මණ්ඩල	2023	ව්‍යාපෘති සඳහා වර්ෂ 8 ක කාල සීමාවක් තුළ දරා ඇති පිරිවැයෙන් මූලික අරමුණු සඳහා දායකත්වයක් පිළිබඳ නැවත විමසා බැලිය යුතු අතර අදාළ පාරිසරික අනුමැතියන් ලබා ගැනීමට කටයුතු කල යුතුය. වර්ෂ 4 ක් ගත වි ඇතත් එය ලබාගෙන නොතිබියදි ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යමින් පැවතුණි. තවද ව්‍යාපෘතිය සඳහා බඳවා ගත් කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැටුප්, දීමනා හා අනෙකුත් වියදම් ගෙවමින් ව්‍යාපෘතියේ කටයුතු වර්ෂ 8 ක් අඛණ්ඩව ප්‍රමාද වීම තුළ එය අනාර්ථික හා අතිරේක වැය බරක් බවට පත්ව තිබුණි.	අදාළ පාරිසරික අනුමැතියන් ලබා ගැනීමට මෙතෙක් නොහැකි වීම මත ව්‍යාපෘතිය සිදු කරගෙන යාමේ ප්‍රමාද වීම් සිදුව ඇත.	පාරිසරික අනුමැතියන් ලබා ගැනීමට හෝ මූලික අරමුණු සඳහා දායකත්වයක් පිළිබඳ නැවත විමසා බැලීමක් සිදුවී නොතිබුණි.

	තීරණය අනුව වන රක්ෂණ දෙපාර්තමේන් තුවේ එකගතාවය හා අනුග්‍රහය ලබාගත යුතු බව සදහන්කර වර්ෂ 4 ක් ගත වි ඇතත් එය ලබානොගෙන ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යමින් පැවතුණි. තවද ව්‍යාපෘතිය සදහා බදවා ගත් කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැටුප්, දීමනා හා අනෙකුත් වියදම් වෙනුවෙන් වර්ෂ 5 ක කාලසීමාවක් තුළ රු.මිලියන. 57 ක් දැරීමට සිදු වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු වර්ෂ 8 ක් අඛණ්ඩව ප්‍රමාද වීම තුළ එය අනාර්ථික හා අතිරේක වැය බරක් බවට පත්ව තිබුණි.				
8	අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/01/ASP/2016/01 (VoIII) දරණ 2016.06.23 දිනැති ලිපිය මගින් ආර්ථක කළමනාකරණය පිළිබද අනුකමිටුව විසින් මෙම ව්‍යාපෘතිය නිල්වලා ගග ආශ්‍රිතව පමණක් සිදු කිරීමට නිර්දේශ කරන බවත්, ඒ අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දී තිබූ නමුත් එකී අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමකින් තොරව 2017.07.20 දින	2021	ආර්ථික කළමනාකරණය පිළිබද අනුකමිටුව විසින් මෙම ව්‍යාපෘතිය නිල්වලා ගග ආශ්‍රිතව පමණක් සිදු කිරීමට හා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙස කළ නිර්දේශ නොසලකා හැර ඇති පාර්ශව සම්බන්ධයෙන් සොයාබලා විධිමත් පියවර ගතයුතු වීම.	වගකිවයුතු පාර්ශවයන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ආරම්භ කර නොතිබුණි. වාපෘතියේ වැඩ අවසන් කර එහි ප්‍රතිලාබ මහජනතාව වෙත ලැබීමට කටයුතු කර නොතිබුණි.	අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමකින් තොරව අවබෝධතා ගිවිසුම යටතේ සිදු කරනු ලබන අධ්‍යයනයන් හා සැලසුම් නිෂ්ප්‍රභා වී තිබුණි.

ගිවිසුමට එළඹ තිබුණි. එමගින් ගිං ගග හා නිල්වලා යන කොටස් 2 ම පිළිබඳ අධ්‍යනයන් කිරීමට පවරා තිබුණි. නිර්දේශ අනුව ආර්ථික කළමනාකරණ අනුකම්ටුව මඟින් ව්‍යාපෘතිය නිල්වලා ගඟ ආශ්‍රිතව පමණක් සිදු කිරීමට කර තිබූ නිර්දේශය නොසලකා එළඹ තිබූ ගිවිසුම මඟින් UNESCO සංවිධානය විසින් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ගිං ගග ආශ්‍රිතව හා නිල්වලා ගඟ යන කොටස් 2 ක සඳහාම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්කාර ආයතනය සමඟ එකඟතාවයකට පැමිණ තිබුණි. එම නිසා මෙම ව්‍යාපෘතියට අදාළ වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතනවල අනුමැතීන් ලබා ගැනීමට නොහැකි වීම සහ මහජන විරෝධතා එල්ල වීම ආදී තත්වයන් නිර්මාණය වී තිබුණි. ඒ බව අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි ද අනාවරණය කර තිබුණි. ඒ අනුව 2017 වර්ෂයේ අවිධිමත් ලෙස එළඹී අවබෝධතා ගිවිසුම යටතේ සිදු කරනු ලබන අධ්‍යයනයන් හා සැලසුම් ද නිෂ්ප්‍රයෝජන වන බව

	නිරීක්ෂණය විය.				
9	උමා ඔය ද්‍රෝණියේ සිට දක්ෂිණ කලාපයේ කිරිදිඔය ද්‍රෝණියට ජලය ඝන මීටර් මිලියන 145 ක් වාර්ෂිකව හැරවීම ප්‍රධාන අරමුණ කරගෙන ශ්‍රී ලංකා වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා ඉරාන සමාගමක් සමඟ 2008 අප්‍රේල් 28 දින ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ඊට අදාළ සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව ඇමරිකානු ඩොලර් මිලියන 529.06 ක් හෙවත් රු.මිලියන 74,325.75ක් විය. ව්‍යාපෘතිය 2008 වර්ෂයේ ආරම්භ කර වසර 07 කින් එනම් 2015 නොවැම්බර් 15 දින නිම කිරීමට මූලිකව අපේක්ෂා කර තිබුණි. උක්ත ව්‍යාපෘතියේ මූලස්ථායී වැඩ සඳහා 2023 දෙසැම්බර් 31 දිනට ඇමරිකානු ඩොලර් මිලියන 504.05 ක් වැඩ සහතික කොට ගෙවා තිබුණි. පහත නිරීක්ෂණයන් කෙරේ.	2023 2022 2021			
	(අ) ව්‍යාපෘතිය සඳහා අරමුදල් ඉරාන අපනයන සංවර්ධන බැංකුව මගින්	2023 2022	ව්‍යාපෘතීන් හි ක්‍රියාකාරීත්වය තුළ ව්‍යුහාත්මක	ව්‍යාපෘතීන් හි ක්‍රියාකාරීත්වය තුළ ව්‍යුහාත්මක	ව්‍යාපෘතීන් හි ක්‍රියාකාරීත්වය තුළ ව්‍යුහාත්මක

මූල්‍යනය කිරීමට යටත්ව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොන්ත්‍රාත්කරු තෝරාගෙන 2007 නොවැම්බර් 27 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2013 වර්ෂයේදී ඉරානය ආර්ථික සම්බාධක හේතුවෙන් අදාළ ප්‍රදානය කරන ලද ණය මුදල අත්හිටුවා තිබීම හේතුවෙන් විදේශීය ණය ගිවිසුම යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 50 ක් හෙවත් රු.මිලියන 6,522.85 ක් මූල්‍යනයෙන් අනතුරුව 2023 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතියේ පිරිවැය වූ ඇමරිකානු ඩොලර් මිලියන 453.913 ක් හෙවත් රු.මිලියන 67,737,738 ක් ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින් මූල්‍යකරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය දේශීය අරමුදල් මගින් ඉදිරියට ගෙන යාම පිළිබඳ තීරණය කිරීමේදී ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීම තුළින් ශ්‍රී ලංකා රජයට ලබාගත හැකිව තිබූ තරඟකාරී වාසි පිළිබඳ තක්සේරු කිරීමක් සිදුකර අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි.	2021	වෙනස්කම් හා තරඟකාරී වාසි පිළිබඳ තක්සේරු කර අමාත්‍ය මණ්ඩලය දැනුවත් කළ යුතුය.	වෙනස්කම් හා තරඟකාරී වාසි පිළිබඳ තක්සේරු කර අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	වෙනස්කම් සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය වසර 7 ක් තුළ එනම් 2015 නොවැම්බර් 15 දිනට නිම කිරීමට නියමිතව පැවතියද 2023 දෙසැම්බර් 31 දින වන විට ප්‍රමාද කාලය වසර 8 ක් ඉක්මවා තිබුණි. ව්‍යාපෘතියෙන් අපේක්ෂා කල විදුලි බල ජනන පද්ධතියට මෙගාවොට් 120 ක විදුලි බලයක් එකතු කිරීම තුළින් දිනකට විදුලිබල මණ්ඩලයට රු. මිලියන 55 කට නොවැඩි මුදලක් ඉතිරිවන බව ගණන් බලා තිබූ අතර ඒ අනුව ව්‍යාපෘතිය වසර 8 ක් ප්‍රමාදවීම තුළින් සිදුව තිබූ පාඩුව රු.මිලියන 162,250 ක් වී තිබුණි. තවද මෙම ප්‍රමාදය හේතුවෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටි නව ඉඩම් හෙක්ටයාර 4,500 ක් හා දැනට වගා කෙරෙන ඉඩම් හෙක්ටයාර 1,500 ක් සඳහා වාරි ජලය සැපයීම, පානීය හා කර්මාන්ත සඳහා වාර්ෂිකව ඝන මීටර් මිලියන 30 ක ජලය සැපයීම, බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල සහ ඇටැම්පිටිය ප්‍රදේශවල පානීය ජල අවශ්‍යතා සැපයීම යන ප්‍රතිලාභ අත් කර ගැනීමට	2023 2022 2021	ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමේදී ව්‍යාපෘති මූලික අරමුණු යටතේ හඳුනාගෙන ඇති ප්‍රතිලාභ ප්‍රමාද වීම හා ඒ සඳහා දැරීමට සිදු වන අතිරේක පිරිවැය පිළිබඳ විශ්ලේෂණයක් සිදු කර වාර්තා කළ යුතුය.	මේ වන විට විදුලි බල ජනන පද්ධතියට මෙගාවොට් 120 ක විදුලි බලයක් එකතු කිරීමට කටයුතු කර තිබුණි.	ව්‍යාපෘතියේ මූලික අරමුණු යටතේ හඳුනාගෙන ඇති ප්‍රතිලාභ ප්‍රමාද වීම හා ඒ සඳහා දැරීමට සිදු වන අතිරේක පිරිවැය පිළිබඳ විශ්ලේෂණයක් මේ දක්වා සිදුකර නොතිබුණි.

නොහැකි වී තිබුණි.

(ඇ) ව්‍යාපෘති ප්‍රමාදය මගින් සේවායෝජක වන ශ්‍රී ලංකා ජනරජයට සිදුවී ඇති පාඩුව හා ඊට අදාළ ආවස්ථික පිරිවැය ගණනය කොට EPC කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. ව්‍යාපෘතියට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 71 ක් ඉදිරිපත් කර තිබූ නමුත් එම කිසිදු අවස්ථාවකදී කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 0.01ක් වශයෙන් උපරිමය සියයට 5 ක් දක්වා එනම් ඇ.ඩොලර් මිලියන 26.453 ක් ප්‍රමාද ගාස්තු ලෙස අයකළ හැකි බවට අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි. ප්‍රමාද ගාස්තුව ලෙස අයකරගෙන තිබුණේ ඇ.ඩොලර් 6,631,364ක් පමණක් වූ අතර අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි එම මුදලින් ඇ.ඩොලර් 5,305,091 ක් ආපසු කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.	2023 2022 2021	අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත්කරු ගෙන් අයකර ගැනීමට පිළිබඳ තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතුය.	කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 0.01ක් වශයෙන් උපරිමය සියයට 5 ක් දක්වා එනම් ඇ.ඩොලර් මිලියන 26.453 ක් ප්‍රමාද ගාස්තු ලෙස අයකළ හැකි බවට අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි.	ගිවිසුම් ප්‍රකාරව අයකළ හැකිව තිබූ සම්පූර්ණ ප්‍රමාද ගාස්තුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඈ) මෙම ව්‍යාපෘතියේ ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සඳහා 2023	2023	කාලය දීර්ඝ කිරීමට පෙර ප්‍රමාදවීමේ	කාලය දීර්ඝ කිරීම හේතුවෙන් පැන නගින පිරිවැය	අමාත්‍ය මණ්ඩල තීරණය අනුකූලව ප්‍රමාද

ජනවාරි 08 දින වාරිමාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් ව්‍යාපෘති කාලය 2023 ජූනි 30 දින දක්වා යෝජනා කර තිබුණි. ඒ සඳහා මුදල් ඇමතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ 2023 ජනවාරි 16 දිනැති නිරීක්ෂණ අනුව කටයුතු කිරීමට යටත්ව අනුමැතිය ලබා දී තිබූ අතර ව්‍යාපෘතිය දිගින් දිගටම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රමාද වන දිනක් පාසාම ජාතික විදුලිබල පද්ධතියට දෛනික 120MW විදුලිබල ප්‍රමාණයක් එකතු කිරීමට නොහැකි වන හෙයින් ලංකා විදුලිබල මණ්ඩලයට බාහිර පාර්ශවයෙන් විදුලිය මිලදී ගැනීමට දිනකට රුපියල් මිලියන 100 ක් පමණ අමතරව වැය කිරීමට සිදු වන බැවින් කොන්ත්‍රාත්කරු විසින් 2023 ජූනි 30 දිනට ව්‍යාපෘතිය අවසන් කිරීමට අපොහොසත් වන්නේ නම් එම දිනෙන් පසුව ගත වන දිනයක් පාසාම කොන්ත්‍රාත්කරුගෙන් නිසි වන්දියක් ලබා ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමේ ගිවිසුම සකස් විය යුතු බවට මුදල් අමාත්‍යවරයා යෝජනා කර තිබුණි. එසේ වුවද	ආවස්ථික පිරිවැය ගණනය කර ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීම කළ යුතුය. අමාත්‍ය මණ්ඩල තීරණය අනුකූලව ප්‍රමාද කාලය සඳහා ගණනයට විධිමත් ක්‍රමවේදයක් සකස් කර කොන්ත්‍රාත්කරු ගේ එකගතාවය මත අයකර ගැනිමට කටයුතු කළ යුතුය.	කොන්ත්‍රාත්කරු විසින් දරා ගත යුතු බව හා නියමිත දිනට ව්‍යාපෘතිය නිම නොකිරීම හේතුවෙන් පැන නගින ආවස්ථික පිරිවැය අය කර ගැනීමට සිදු වන බව කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දිය යුතුව තිබූ නමුත් එසේ සිදු කර නොතිබුණි.	කාලය සඳහා ගණනයට විධිමත් ක්‍රමවේදයක් සකස් කර කොන්ත්‍රාත්කරු ගේ එකගතාවය මත අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

ඊට අනුකූලව ගිවිසුම සකස් කිරීමකින් තොරව අමාත්‍ය මණ්ඩල තීරණය නොසලකාහරිමින් ව්‍යාපෘති කාලය දීර්ඝ කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. තවද අමාත්‍ය මණ්ඩල තීරණ අනුව රජයට අමතර වැය බරක් නොමැතිව දීර්ඝ කරනු ලබන කාලය තුල ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කල යුතු බවට නියම කර තිබූ බැවින් EPC කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධානයන්ට අනුකූලව කාලය දීර්ඝ කිරීම හේතුවෙන් පැන නගින පිරිවැය කොන්ත්‍රාත්කරු විසින් දරා ගත යුතු බව හා නියමිත දිනට ව්‍යාපෘතිය නිම නොකිරීම හේතුවෙන් පැන නගින ආවස්ථික පිරිවැය අය කර ගැනීමට සිදු වන බව කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දිය යුතුව තිබූ නමුත් එසේ සිදු කර නොතිබුණි.				
(ඉ) කොන්ත්‍රාත්කරු විසින් 2023 ජූලි මස ඉදිරිපත් කර තිබූ දෙවන හිමිකම්පෑමේ බිල්පත මගින් කාලය දීර්ඝ කිරීමට අදාළ හේතු 8 ක් සඳහා ඇමරිකානු ඩොලර් 105,159,108 ක් ඉල්ලුම් කර තිබුණි. ඒ තුළ 2020 දෙසැම්බර් සිට 2023 ජූලි දක්වා	2023	අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේදී නිවැරදි තොරතුරු ඇතුළත් කිරීමට වගබලා ගත යුතුය.	කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනීම සම්බන්ධයෙන් වූ ක්‍රියාමාර්ග මෙතෙක් අනුගමනය කර නොතිබුණි.	හිමිකම් පෑම පිළිබඳ තොරතුරු හෝ කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

දීර්ඝ කල කාල සීමාව වෙනුවෙන් පුද්ගල පිරිවැය ඇමරිකානු ඩොලර් 56,152,590 ක් හා යන්ත්‍රෝපකරණ පිරිවැය ඇමරිකානු ඩොලර් 4,555,841 ක් ද 2020 මාර්තු 21 සිට 2020 ජූනි 15 දක්වා දීර්ඝ කල කාලසීමාව වෙනුවෙන් පුද්ගල පිරිවැය ලෙස ඇමරිකානු ඩොලර් 10,402,273 ක් හා යන්ත්‍රෝපකරණ පිරිවැය ලෙස ඇමරිකානු ඩොලර් 403,089 ක් ද ඇතුළත්ව පැවතුණි. එහිදී FIDIC අන්තර්ජාතික ගිවිසුම් කොන්දේසි හා අමාත්‍ය මණ්ඩල තීරණයන් මගින් පනවා තිබූ සීමාවන් නොසලකා කොන්ත්‍රාත් පරිපාලන කටයුතු මෙහෙයවා තිබූ අතර මෙම හිමිකම් පෑම පිළිබඳ තොරතුරු හෝ කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනීම පිළිබඳ උක්ත සංදේශය තුළ දක්වා නොතිබුණි.				
(ඊ) ව්‍යාපෘතියේ ප්‍රමාදයන් සඳහා කොන්ත්‍රාත්කරු ප්‍රමාද ගාස්තු හිමිකම වශයෙන් ඇමරිකානු ඩොලර් 181,337,171 ක ප්‍රමාද ගාස්තුවක් ඉල්ලා තිබුණි. මේ පිළිබඳ සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින්	2023 2022	ප්‍රමාද ගාස්තු හිමිකම සොයා බලා ගණනය කල යුතුය	ප්‍රමාද ගාස්තු හා සානුකම්පිත ගාස්තු ලෙස කොන්ත්‍රාත් කරු වෙත ගෙවීමට නිර්දේශ කරන ලද ඇ.ඩොලර් මිලියන 38.62 නැවත විමර්ෂණය කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	ප්‍රමාද ගාස්තු හිමිකම සොයා බලා ගණනය කර නොතිබුණි.

නිලධාරීන් 7 දෙනෙකුගෙන් සමන්විත සාකච්ඡා සම්මුති කමිටුවක් පත් කර තිබූ අතර එම කමිටුව විසින් මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් ගණනය කර ඉදිරිපත් කරන ලද ඇමරිකානු ඩොලර් 181,337,171 ක ප්‍රමාද ගාස්තුව වෙනුවට, ඇමරිකානු ඩොලර් 19,517,082 ක ප්‍රමාද ගාස්තුවක් නිර්දේශ කර තිබුණි. ඉරාන රජයට පනවා තිබූ ආර්ථික සම්බාධක හා වෙනත් දුෂ්කරතා හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් මුහුණ දෙනු ලබන මූල්‍යමය බාධාවන් සඳහා සානුකම්පිත හේතූන් මත අමාත්‍ය මණ්ඩලයේ කැමත්ත පරිදි, ඇමරිකානු ඩොලර් 19,094,795 ක අමතර ගාස්තුවක් ගෙවීමට ද නිර්දේශ කර තිබුණි. ඒ අනුව ඇ.ඩොලර් මිලියන 38.62 ක් ප්‍රමාද ගාස්තු ලෙස ගෙවීමට කමිටුව නිර්දේශ කර අර්ථ ගන්වමින් අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණි.				
(උ) කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේදී “රජය වෙත අමතර වියදමකින් තොරව දීර්ඝ කරන ලද කාල සීමාව තුළ සියලු ඉදි කිරීම් නිම කර ව්‍යාපෘතිය විධිමත්ව රජය වෙත භාර දීම”	2023	අමතර ගාස්තු හිමිකම සොයා බලා ගණනය කල යුතුය.	කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේදී “රජය වෙත අමතර වියදමකින් තොරව දීර්ඝ කරන ලද කාල සීමාව තුළ සියලු ඉදි කිරීම් නිම කර ව්‍යාපෘතිය විධිමත්ව	අමතර ගාස්තු හිමිකම සොයා බලා ගණනය කිරීමට කටයුතු කර නොතිබුණි..

යන කොන්දේසිය පනවා තිබූ නමුත් එම කොන්දේසිය පිළිබඳව සැලකිල්ලක් දක්වා නොතිබීම, කමිටු නිර්දේශය තුළ සානුකම්පිත හේතූන් මත අමාත්‍ය මණ්ඩලය කැමැත්ත මත ඇමරිකානු ඩොලර් 19,094,795 ක අමතර ගාස්තුවක් ගෙවීමට නිශ්චිත නොවූ හා වෘත්තීමය භාවිතයෙන් තොර නිර්දේශ ඇතුළත් කර තිබුණි.			රජය වෙත භාර දීම" යන කොන්දේසිය සපුරාගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හඳුන්වා දීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	
(ඌ) ව්‍යාපෘතියේ ප්‍රතිස්ථාපන මාර්ගයේ මුල් සැලසුමට ඇතුළත් කර තිබූ පුහුල්පොළ වෙල්ල ඉදිකිරීමේ පූර්ව අවශ්‍යතාවයක්ව පැවති බදුල්ල, වැලිමඩ මාර්ගයේ පවතින පැරණි මාර්ගයේ මීටර් 250 ක් අමතරව දිර්ඝ කර නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් තම විෂය පථයෙන් බැහැරව යමින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කල රු.133,476,320 ක ඇස්තමේන්තුව අනුමත කර තම ඉන්වොයිස් වලින් අඩු කර ගෙවීමට කැමැත්ත පලකර තිබුණි. ඒ අනුව එම මාර්ගය සකස් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට භාරදීමට යොජනා කර තිබුණ ද, මාර්ගය සකස් කර	2023	මූලික සැලැස්මෙන් පරිබාහිරව කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉදිකිරීම් වෙනුවෙන් ගෙවීම් කරන ලද නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය.	මූලික සැලැස්මෙන් පරිබාහිරව කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉදිකිරීම් වෙනුවෙන් ගෙවීම් කරන ලද නිලධාරීන්ට එරෙහිව මෙතෙක් විනයානුකූල ක්‍රියාමාර්ග ආරම්භකර නොතිබුණි.	මූලික සැලැස්මෙන් පරිබාහිරව ගෙවීම් අයකර නොතිබුණි.

නොතිබුණු අතර පුහුල් පොළ වේල්ල වැඩ බිම ප්‍රවේශ මාර්ගය හා නව මාර්ගය සකස් කිරීම සඳහා ඇමරිකානු ඩොලර් 1,514,094 ක් ඇස්තමේන්තු කර ඉන් ඇමරිකානු ඩොලර් 115,156 ක්ද ගෙවා තිබුණි.				
(එ) ව්‍යාපෘතියේ ප්‍රධාන උමඟෙහි ඇති වූ ජල කාන්දුව සඳහා වන්දි වශයෙන් කොන්ත්‍රාත්කරු විසින් අදාළ රක්ෂණ සමාගමෙන් ඇමරිකානු ඩොලර් 5,000,000 ක වන්දියක් ලබාගෙන තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් වින්දිත පාර්ශව වෙත ගෙවිය යුතු වන්දි වෙනුවෙන් 2021 අගෝස්තු 31 වන විට රජයේ මුදලින් රු.1,931,346,396 ක් ගෙවා තිබූ අතර රජයෙන් ගෙවූ වන්දි මුදල් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු බවට 2019 මැයි 22 දින ගිණුම් කාරක සභාව විසින් නියෝග කර තිබූ නමුත් ඉන් රු.මිලියන 1,124.62 ක් විගණිත දිනය දක්වාම අය කර ගෙන නොතිබුණි. ඔවුන්ගෙන් අයකර ගත් මුදල නැවත ගෙවන ලෙස කොන්ත්‍රාත්කාර සමාගම විසින් ඉල්ලීමක් සිදු කර තිබුණි. තවද	2023 2022 2021	රජයෙන් ගෙවූ වන්දි මුදල් කොන්ත්‍රාත්කරු ගෙන් අයකර ගත යුතු බවට ගිණුම් කාරක සභාව විසින් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.	ගිණුම් කාරක සභාව විසින් නියෝග කර තිබූ වන්දි මුදල් රු.මිලියන 1,124.62 ක් මේ දක්වා අය කර ගෙන නොතිබුණි	ගිණුම් කාරක සභාව විසින් ලබාදුන් නියෝග අනුව රජයෙන් ගෙවූ වන්දි මුදල් කොන්ත්‍රාත්කරු ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

බලපෑමට ලක් වූ ජනතාව වෙත ගෙවන ලද වන්දි මුදල් හා පානීය ජලය සැපයීම වෙනුවෙන් සමාගම විසින් දරා ඇති ඇමරිකානු ඩොලර් මිලියන 6.108 ක වියදම ද ලබා දෙන ලෙස සමාගම ව්‍යාපෘතියෙන් ඉල්ලා තිබුණි.				
(ඒ) වාරිමාර්ග අමාත්‍යවරිය විසින් 2024 පෙබරවාරි 05 දින ඉදිරිපත් කර තිබූ අංක අමප/24/0044/623/002 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය මගින් උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ඇමරිකානු ඩොලර් මිලියන 514 ක පිරිවැයක් දරා නිම කරන ලද ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2024 මාර්තු 31 දිනට අවසන් කිරීමත් සමඟ ව්‍යාපෘති කළමණාකරණ ඒකකය මගින් ව්‍යාපෘතිය නඩත්තු කරන ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යන ආයතන වෙත එහි මෙහෙයුම් කටයුතු භාර දී වත්කම් හා ලේඛණ භාරදීම සිදු කල යුතුව පැවතුණද අදාල වත්කම් හා ලේඛණ ෆරාබ් සමාගමෙන් ව්‍යාපෘති කළමණාකරණ ඒකකය භාර ගෙන අදාළ	2023	අදාල වත්කම් හා ලේඛණ ෆරාබ් සමාගමෙන් ව්‍යාපෘති කළමණාකරණ ඒකකය වෙත භාර ගෙන අදාළ ආයතන වලට භාර දීමට කටයුතු කළ යුතුය.	මේ වන විට (2024.08.05) ව්‍යාපෘතියේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු බාරගන්නා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පුහුල්පොල ජලාශය සහ ආශ්‍රිත ඉඩම් සහ ඩයරබා ජලාශය සහ ආත ඉඩම් සහ සම්බන්ධිත උමග (Link Tunnel) බාරදී ඇත. එසේම භූගත විදුලි බලාගාරය සහ Switch Yard, ඩයරබා අලිකොටාර ප්‍රධාන උමං මාර්ගය (15KM HR Tunnel), Switch Yard/ Badulla Transmission Line යන වත්කම් දැනටමත් භෞතිකව ලංකා විදුලි බල මණ්ඩලය වෙත බාරදී ඇත.	අදාල ආයතන වෙත මෙහෙයුම් කටයුතු භාරදී සියළුම වත්කම් හා ලිපි ලේඛන භාරදීමට කටයුතු කර නොතිබුණි.

	ආයතන වලට භාර දීමට කටයුතු කර නොතිබුණි.				
	(ඹ) අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කරන ලෙස නිර්දේශ කර තිබුණි.ඒ අනුව FARAB සමාගම සමඟ ඇති කර ගත් ගිවිසුම් කාලසටහන සංශෝධනය කිරීම හා ව්‍යාපෘති අධ්‍යක්ෂ ද ඇතුළුව ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අවම කාර්යමණ්ඩලයෙහි සේවා කාලය දීර්ඝ කිරීම" යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණද එහිදි 2023 ජුනි 30 දිනෙන් පසුව ගත වන දිනයක් පාසාම කොන්ත්‍රාත්කරුගෙන් නිසි වන්දියක් ලබා ගත යුතු බවට ඉකුත් අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධව කිසිදු සඳහනක් කර නොතිබුණි.	2023	අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේදී නිවැරදි තොරතුරු ඇතුළත් කිරීමට වගබලා ගත යුතුය.	2023 ජුනි 30 දිනෙන් පසුව ගත වන දිනයක් පාසාම කොන්ත්‍රාත්කරුගෙන් නිසි වන්දියක් ලබා ගත යුතු බවට ඉකුත් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙතෙක් කටයුතු කර නොතිබුණි.	අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේදී නිවැරදි තොරතුරු ඇතුළත් කිරීමට වගබලා ගත යුතු බවට නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි.
10	මාදුරුඔය දකුණු ඉවුරු ඇල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 38,500.90 ක් ඇස්තමේන්තු කර	2023			

තිබුණු අතර ප්‍රධාන ඇල ඇතුළුව සංවර්ධන කාර්යන් 14 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි.ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.				
(අ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2021 සිට 2023 දක්වා රු.1.689,000,000 ක ප්‍රතිපාදන වෙන්කර ඉන් රු.836,104,531 ක් හෙවත් සියයට 50 ක් පමණක් වැයකර ඇතත්, ප්‍රමුඛතා පදනම මත ඉටුකල යුතු කාර්යන් හදුනාගෙන ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක වී නොතිබුණි. එහිදී ප්‍රධාන ඇල මාර්ගය සඳහා ප්‍රමුඛතාවය ලබා දීමකින් තොරව රු.මිලියන 7,475 ක ඇස්තමේන්තු මත පාලම් ඇතුළු ප්‍රධාන වෙලඳපොල මාර්ගය ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඒ යටතේ දම්මින්න සිට වලමන්ඩිය දක්වා මාර්ගය කිලෝමීටර් 0+630 සිට කිලෝමීටර් 4+030 දක්වා කොටස වැඩිදියුණු කිරීම රු.93,459,575 ක ඇස්තමේන්තුව 2021 ජුලි 30 දින ආරම්භ කර තිබූ අතර 2023 සැප්තැම්බර් වන විට වැට් බදු ඇතුළුව රු.82,985,198 ක පිරිවැයක් දරා තිබුණි.	2023	ප්‍රමුඛතා පදනම මත ඉටුකල යුතු කාර්යන් හදුනාගෙන ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර වැඩ අවසන් කළ යුතුය.	වැඩ අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.	ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ප්‍රමුඛතා පදනම මත ඉටුකල යුතු කාර්යන් හදුනා ගැනීම කර නොතිබුණි.

උක්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේදී නිසි සැලැස්මකින් තොරව මාර්ගයේ තැනින් තැන කි.මි. 3.4 ක් කැනීම් කර තිබුණි.				
(ආ) රු.93,459,575 ක්වූ පිරිවැය යටතේ දම්මින්න වලමණ්ඩිය මාර්ගය කිලෝමීටර් 0+630 Km සිට 3+400 Km දක්වා කොටස කාපට් ඇතිරිමට ඇස්තමේන්තුවක් අනුඥාත කර තිබුණි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වැලි කැනීම් බලපත්‍ර ලබාදුන් ස්ථානයන්ට ප්‍රවේශ වීමේ පහසුව අරමුණු කරගෙන මෙම මාර්ගය ඉදිකිරීමට ප්‍රමුඛතාවය ලබාදී තිබුණි.එහිදී දම්මින්න වලමන්ඩිය මාර්ගය කාපට් දමා සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබූ නමුත් එහි ABC දැමීමෙන් පසු කාපට් ඇතිරීම වෙනුවට තාර ස්ථරයක් දමා ඉදිකිරීම් අතරමග නවතා තිබුණු අතර ඒ වන විට මුළු පිරිවැය රු.45,241,775 ක්වූ වැඩ කොටස් නිම කර නොතිබුණි. ඒ පිළිබඳ නොසලකා අන්‍යෝන්‍ය එකඟතාවය මත ගිවිසුම අවසන් කිරීමට කටයුතු කර තිබුණි.	2023	සැලසුම් කළ පරිදි මාර්ගයේ වැඩ නිමකිරීමට කටයුතු කළ යුතුය.	දම්මින්න වලමණ්ඩිය මාර්ගය කිලෝමීටර් 0+630 Km සිට 3+400 Km දක්වා කොටස කාපට් අතුරා සංවර්ධනය කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	සැලසුම් කළ පරිදි මාර්ගයේ වැඩ නිම කර නොතිබුණි.
(ඇ) රු.82,985,198 ක්	2023	හානි	හානි	හානි

වැයකර කිලෝමීටර් 3.4 ක් වූ මෙම මාර්ගය ABC අතුරා අතරමග වැඩ නවතා තිබූ මාර්ග වසරකට අඩු කාලයක් තුල තැනින් තැන පලුදු වී තිබුණි. එසේ වුවද හානි පුනරුත්ථාපනය සඳහා තැන්පතුවක් හෝ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකරගෙන නොතිබූ අතර හානිය අයකරගෙන හෝ මාර්ගය ප්‍රතිසංස්කරණය කරද නොතිබුණි.		පුනරුත්ථාපනය සඳහා තැන්පතු ලබා ගැනීම සහ මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු කොන්ත්‍රාත්කරු ලවා ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.	පුනරුත්ථාපනය සඳහා තැන්පතුවක් හෝ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමක් හෝ සිදුකර නොතිබුණි.	පුනරුත්ථාපනය සඳහා තැන්පතු ලබා ගැනීම හෝ ප්‍රතිසංස්කරණය කොන්ත්‍රාත්කරු ලවා ඉටුකර නොතිබුණි.
(ඈ) මාර්ගය ඉදිකිරීම සඳහා ගෙවීම් කිරීමේදී රු.7,258,698 ක අමතර වැඩ, රු.13,948,399 ක අතිරේක වැඩ හා රු. 12,067,706 ක මිල වැඩිවීම් සඳහා ද විධිමත් අනුමැතියකින් තොරව ගෙවීම් කර තිබුණි.	2023	විධිමත් අනුමැතියකින් තොරව ගෙවීම් සිදුකළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය.	රු.7,258,698 ක අමතර වැඩ, රු.13,948,399 ක අතිරේක වැඩ හා රු. 12,067,706 ක මිල වැඩිවීම් සඳහා ද විධිමත් අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.	විධිමත් අනුමැතිය ලබාගැනීමටත්, අනුමැතියකින් තොරව ගෙවීම් කල නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම කර නොතිබුණි.
(ඉ) ගිවිසුමේ 7 වන කොන්දේසිය අනුව ගිවිසුමේ සඳහන් නියමිත කාලය තුල වැලි කැණීම් සිදු කිරීම පැහැර හැරියහොත් හෝ අපොහොසත් වුවහොත් ඒ සම්බන්ධයෙන් පළමු පාර්ශවයට සිදු වන හානිය සම්බන්ධයෙන් රු. 300,000 ක වන්දි මුදලක් පළමු පාර්ශවය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ගෙවීමට දෙවන පාර්ශවය වන කොන්ත්‍රාත්කරු එකඟ	2023	අයවිය යුතු වන්දි කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය.	වැලි කැනීම් සිදුකිරීමට අපොහොසත් වී තිබූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයවිය යුතු රු.3,300,000 ක වන්දි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අයවිය යුතු වන්දි අයකර නොතිබුණි.

	වී තිබුණි. එහෙත් කොන්ත්‍රාත්කරුවන් 11 දෙනෙකු ගිවිසුම ප්‍රකාරව වැලි කැනීම් සිදුකිරීමට අපොහොසත් වී තිබූ නමුත් ඔවුන්ගෙන් අයවිය යුතු රු.3,300,000 ක වන්දි අයකර ගෙන නොතිබුණි.				
11	මිණිපේ වම් ඉවුර හා දකුණු ඉවුර ඇළ මාර්ග සඳහා ජල පාලන හා මිනුම් පහසුකම් සහිතව මිණිපේ අමුණ එසවීමේ කොන්ත්‍රාත්තුව දින දීර්ඝ කිරීමෙන් තොරව වසර 02 කට ආසන්න කාලයක් පවත්වාගෙන ගොස් තිබූ අතර, මෙම කාලය තුළ කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 22 ක් විය.මෙම කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.මිලියන 2,912.85 දක්වා වැඩිකර ඉතිරි වැඩ මුල් කොන්ත්‍රාත්කරු මඟින් ඉටු කරවා ගැනීමට සංශෝධිත ගිවිසුම් අංක 02 අත්සන් කිරීමටත්, කොන්ත්‍රාත් කාලය 2023 සැප්තැම්බර් 21 දින දක්වා වැඩි කිරීමටත් 2023 ජූනි 05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව අත්සන් කරන ලද සංශෝධිත ගිවිසුමේ කොන්ත්‍රාත්තු වටිනාකම ඇතුලත් නොකර ගිවිසුම අත්සන්	2023	සංශෝධිත ගිවිසුමේ කොන්ත්‍රාත්තු වටිනාකම ඇතුලත් නොකර ගිවිසුම අත්සන් කළ නිලධාරීන්ට එරෙහිව විනයානු කූලව කටයුතු කළ යුතු අතර වැඩිකර තිබූ කොන්ත්‍රාත් වටිනාකම වූ රු. මිලියන 1,048.05 තුළ වූ රු. මිලියන 996.10 ක මිල විචලනය ගණනය කිරීම හා එහි නීත්‍යානුකූල භවය නැවත සමාලෝචනය කල යුතුය.	වැඩිකර තිබූ කොන්ත්‍රාත් වටිනාකම වූ රු. මිලියන 1,048.05 තුළ වූ රු. මිලියන 996.10 ක මිල විචලනය ගණනය කිරීම හා එහි නීත්‍යානුකූල භවය නැවත සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි.	සංශෝධිත ගිවිසුමේ කොන්ත්‍රාත් වටිනාකම ඇතුලත් ගිවිසුම අත්සන් කිරීම හෝ එම නිලධාරීන්ට එරෙහිව මෙතෙක් විනයානු කූලව කටයුතු කර නොතිබුණි.

	කර තිබුණු අතර වැඩිකර තිබූ කොන්ත්‍රාත් වටිනාකම වූ රු.මිලියන 1,048.05 තුළ රු. මිලියන 996.10 ක මිල විචලනයන් විය.				
12	මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්පත් කරගැනීම සඳහා 2012-2023 කාල සීමාව තුළ රු.මිලියන 9,457.66 ක් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිදහස් කර තිබුණි. විවිධ හේතු මත වන්දි ගෙවීම් අවසන් වී නොතිබුණු අතර ඉඩම් පවරා ගැනීමේ කටයුතුද ඊට සමගාමීව ප්‍රමාද වී තිබුණි. එම එක් එක් ව්‍යාපෘතියේ ඉඩම් කොටස් පවරා ගැනීම, ව්‍යාපෘතියේ කටයුතු සඳහා ඒවා භාවිතා කළ ආකාරය හා අත්පත්කර ගැනීමේ ක්‍රියාවලියේ එක් එක් පියවරයන්ට අදාළ තොරතුරු නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි ලේඛනයක් සකස්කර, යාවත්කාලීන කරන ලද පරිගණකගත තොරතුරු පද්ධතියක් පවත්වා ගෙනගොස් නොතිබුණි.	2022	ව්‍යාපෘතියට ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය හා වන්දි ගෙවීම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වා ගත යුතු අතර ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිදහස් කරනු ලැබූ ප්‍රතිපාදන වලින් ගෙවනු ලැබූ වන්දි පිළිබඳ වාර්තා කැඳවා වන්දි ගෙවීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය.	අදාළ තොරතුරු නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි ලේඛනයක් සකස්කර, යාවත්කාලීන කරන ලද පරිගණකගත තොරතුරු පද්ධතියක් පවත්වා ගෙනයාමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.	ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය හා වන්දි ගෙවීම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් හා ගෙවනු ලැබූ වන්දි පිළිබඳ වාර්තා කැඳවා වන්දි ගෙවීමේ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.
	(අ) මොරගහකන්ද ජලාශයට දේපළ අත්පත් කරගැනීම සම්බන්ධයෙන් ව්‍යාපෘති කාර්යාලයේ ඉඩම් අංශය විසින් 2022 වර්ෂයේ සකස් කර	2022	ඉඩම් අංශයේ වාර්තා අනුව හා ගෙවීම් වාර්තා අනුව සංඛ්‍යා සැසඳීම් කර නිවැරදි කිරීම් සිදු කළ යුතුය. ඉඩම්	ඉඩම් අංශයේ වාර්තා අනුව හා ගෙවීම් වාර්තා අනුව සංඛ්‍යා සැසඳීම් කර නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි. ප්‍රාදේශීය	ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය හා වන්දි ගෙවීම් පිළිබඳ තොරතුරු

තිබුණු වාර්තා අනුව 2022 වර්ෂය අවසානයට ලග්ගල, නාවුල, මැදිරිගිරිය, කන්තලේ හා ඇළහැර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 තුළ හෙක්ටයාර් 3833.45ක් වූ ඉඩම් කට්ටි 16125ක් පවරා ගැනීම වෙනුවෙන් රු. මිලියන 9457.66ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. ව්‍යාපෘතියේ ගෙවීම් වාර්තා අනුව 2022 වර්ෂය අවසානයට ඉඩම් හෙක්ටයාර් 4450.93ක් පවරා ගැනීම වෙනුවෙන් රු. මිලියන 11,196.48ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. ඒ අනුව තොරතුරු එකිනෙක නොගැළපීම හේතුවෙන් නිරවද්‍ය බවට තහවුරු නොවීය.		අත්පත් කරගැනීමේ කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිදහස් කරනු ලැබූ ප්‍රතිපාදන වලින් එක් එක් ඉඩම් කැබලි සඳහා ගෙවනු ලැබූ වන්දි පිළිබඳ වාර්තා කැඳවා එක් එක් ඉඩම් කැබැල්ල සඳහා ගෙවනු ලැබූ වන්දි මුදල පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුළත් කර දත්ත පද්ධතියක් සකස් කර විගණනයට ඉදිරිපත් කළ යුතුය.	ලේකම්වරුන් වෙත නිදහස් කරනු ලැබූ ප්‍රතිපාදන වලින් එක් එක් ඉඩම් කැබලි සඳහා ගෙවනු ලැබූ වන්දී පිළිබඳ විස්තර ඇතුලත් වාර්තා පිළියෙල කර නොතිබුණි.	ඇතුළත් දත්ත පද්ධතියක් හා ගෙවනු ලැබූ වන්දි පිළිබඳ වාර්තා කැඳවා වන්දි ගෙවීමේ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.
(ආ) මොරගහකන්ද කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතියෙහි නැවත පදිංචි කිරීමේ සැලැස්මේ 5.1.5 ඡේදය අනුව මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන් වූ පවුල් 302 ක් මැදිරිගිරිය D කලාපයේ පදිංචි කිරීමට යෝජනා කර එම කලාපය තුළ නබඩවැව, දහම්වැව හා බණ්ඩාරවැව ලෙස නව ගම්මාන 3 ක් හා බිසෝපුර ලෙස ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමටත් එම ගම්මාන තුළ ඉඩම්	2022	නැවත පදිංචිකිරීම් සඳහා ප්‍රදේශ හඳුනා ගැනීමේදී නිසි පරිදි ශක්‍යතා අධ්‍යන සිදු නොකර මූලික සැලසුම් වලට පරිබාහිරව සිදු කළ නැවත පදිංචි කිරීම් හේතුවෙන් රාජ්‍ය සම්පත් අවභාවිතා වීම හා ඌන උපයෝජනය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන විනයානුකූලව	නැවත පදිංචි කිරීම සඳහා හඳුනාගෙන ස්ථාපිත කර තිබූ ගම්මාන, මඩ කුඹුරු ඉඩම් හා එම ගම්මානයන්හි ඉදිකර තිබුණු සෞඛ්‍ය මධ්‍යස්ථාන, සමූපකාර, පොදු වෙළඳපොළ, සමෘද්ධි බැංකු, බස් නැවතුම්පොළ හා අනෙකුත් පොදු පහසුකම් ගොඩනැගිලි පූර්ණ වශයෙන් භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.	නැවත පදිංචි කිරීමේ සැලැස්මේ ඌන උපයෝජිත ගොඩනැගිලි මේ දක්වා ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

හෙක්ටයාර් 2,072 ක් ගොවි බිම් කට්ටි 2,680 ක් ලෙස හා ඉඩම් හෙක්ටයාර් 914 ක් ගෙවතු ඉඩම් කට්ටි 3,350 ක් ලෙස සංවර්ධනය කර අදාළ පවුල් වෙත බෙදාදීමටත් හඳුනා ගෙන තිබුණි. එහිදී මොරගහකන්ද කළුගඟ ජලාශ ව්‍යාපෘතියේ පහළ නිම්න සංවර්ධන කාර්යයන් යටතේ 2009 සිට 2022 වර්ෂය දක්වා රු.මිලියන 4,446.26 ක් වැය කර තිබුණි. එයින් ඉඩම් කට්ටි 7ක් පමණක් මොරගහකන්ද කළුගඟ ජලාශ ඉදිකිරීමේදී අවතැන් වූ පවුල් වෙත බෙදා දී තිබුණු අතර ඉතිරි පවුල් සඳහා වන්දි ගෙවීම සිදුකර තිබුණි. වෙන් කර තිබූ ඉතිරි ඉඩම් කට්ටි වලින් කොටසක් ඉඩම් කච්චේරි පවත්වා මැදිරිගිරිය හා ලංකාපුර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පදිංචිකරුවන් වෙත බෙදා දී තිබුණු අතර කොටසක් තව දුරටත් බෙදා දිය යුතුව පැවතුණි. ඒ අනුව ව්‍යාපෘතියේ මූලික සැලසුම් අනුව නැවත පදිංචි කිරීම සඳහා හඳුනාගෙන ස්ථාපිත ගම්මාන, මඩ කුඹුරු ඉඩම් හා එම ගම්මානයන්හි ඉදිකර තිබුණු සෞඛ්‍ය

කටයුතු කළ යුතුය.

ඌන උපයෝජිත ගොඩනැගිලි සැලසුම් සහගතව ව්‍යාපෘතිය වෙනුවෙන් භාවිතා කළ යුතුය.

මධ්‍යස්ථාන, සමූපකාර, පොදු වෙළඳපොළ, සමෘද්ධි බැංකු, බස් නැවතුම්පොළ හා අනෙකුත් පොදු පහසුකම් ගොඩනැගිලි ඌන උපයෝජිතව පැවතියදී ඉඩම් ව්‍යාපෘතියෙන් පරිබාහිරව අවධිමත්ව තෝරාගත් පිරිස් වෙත බෙදා දී තිබුණි.				
(ඇ) මොරගහකන්ද ජලාශයේ සිට කි.මී. 6.225 ක් දුරට ඉදිකරන ඇළ මාර්ගයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 64 ක්ව තිබියදී කොන්ත්‍රාත්කරුට ඇති වූ මූල්‍ය අවහිරතා මත කොන්ත්‍රාත්තුව තවදුරටත් කරගෙන යාමට නොහැකි වීම හේතුවෙන් 2021 ජූලි 13 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධන සුරක්ෂණය මුදල් කර අලාභය අයකර ගැනීමට උත්සාහ දැරීමේදී කොන්ත්‍රාත්කරු පැවරූ නඩුවක් හේතුවෙන් එම මුදල් අයකර ගැනීමට නොහැකි වි තිබුණි. ඒ අනුව ලබා දුන් අත්තිකාරම් සුරක්ෂණයෙන් රු. මිලියන 185.89 ක්ද කාර්යසාධන සුරක්ෂණයේ වටිනාකම වූ රු.මිලියන 390.51 ක්ද මේ දක්වා අයකර	2023	නඩු තීන්දුව ලැබු විගස රජයට වූ අලාභය කොන්ත්‍රාත්කරු ගෙන් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.	නඩු තීන්දුව මෙතෙක් ලැබී නොමැත රජයට වූ අලාභය මෙතෙක් අයකර නොතිබුණි.	නඩු තීන්දුව ලැබී නොමැති අතර අලාභය කොන්ත්‍රාත්කරු ගෙන් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

ගැනීමට නොහැකි වී තිබුණි.				
(ඇ) වයඹ ඇළ මාර්ගයේ නැබඩගහවත්ත සිට මහකිතුල පිවිසුම් උමඟ දක්වා කි.මී.17+050 ක ඇළ ඉදිකරන විදේශ සමාගම විසින් අදාළ කොන්ත්‍රාත්තුව 2018-2021 කාලය තුළ නිම කළ යුතු වුවත් ඉදිකිරීම් සිදු කරන ප්‍රදේශවල ඉඩම් කොටස් පවරා ගෙන භූමියේ අයිතිය නිරවුල් කර භාරදීමට වසර 2½ ක කාලයක් ප්‍රමාද වීම නිසා 2023 දෙසැම්බර් 05 දක්වා අවස්ථා 04 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. මෙම ප්‍රමාද වීම හේතුවෙන් වැට් බදු සහිතව රු.මිලියන 7,226.62 කට ලබා දී තිබූ කොන්ත්‍රාත්තුව රු.මිලියන15,154.74 දක්වා රු. මිලියන 7,928.12 කින් එනම්, සියයට 110 කින් වැඩි වී තිබුණි. 2022 වර්ෂයේ සිට ඇති වූ ආර්ථික හා මූල්‍ය අවපාතය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍යවල පිරිවැය ඉහළ යාම හේතු ලෙස දක්වමින් වෙන් කර තිබූ රු. මිලියන 162 ක මිල විචලනය රු. මිලියන 5,827.7 දක්වා වැඩි කර තිබුණි.	2023	ඉඩම් අත්පත් කර ගැනීම, ව්‍යාපෘතියේ ඉදිකිරීම් සැලසුම් හා මිල විචලනය ගණනය කිරීම නැවත සමාලෝචනය කල යුතුය.	2023 වර්ෂය අවසාන වනවිට අභියාචනා මණ්ඩලය මඟින් අයිතිකරුවන් දෙදෙනෙකු ඇතුළුව තිදෙනෙකු සතු නිරවුල් නොවූ ඉඩම් කැබලි 6 හි ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සාකච්ඡා මාර්ගයෙන් අත්පත් කර ගැනීමට කටයුතු කර තිබුණි.	ඉඩම් අත්පත් කර ගැනීම, ව්‍යාපෘතියේ ඉදිකිරීම් සැලසුම් හා මිල විචලනය ගණනය කිරීම නැවත සමාලෝචනය සිදුකර නොතිබුණි.
(ඉ) කොන්ත්‍රාත්තුවේ	2023	මෙහි සැලසුම් නැවත	මිනුම් නිර්මාණ	

අතිරේක වැඩ හා ප්‍රමාණ වෙනස් වීම් සඳහා රු. මිලියන 540 ක් වෙන්කර තිබුණද එය රු.මිලියන 2,024.9 දක්වා රු. 1,484.9 කින් වැඩි කර තිබුණි. එහිදී මීටර් 13 ක් පළලට විවෘතව සකස් කිරීමට සැලසුම් කර තිබූ ඇළ මාර්ගය පසුව උපදේශක සමාගම විසින් මීටර් 10 ක් පළල ඇළ මාර්ග 02 ක් ලෙසට සංවෘතව කොන්ක්‍රීට් යොදා සකස් කිරීමට තීරණය කර ඒ අනුව සැලසුම් වෙනස් කිරීම හේතුවෙන් කොන්ක්‍රීට් ඝන මීටර් 45,425 ක් අතිරේකව යෙදීමට සිදුව තිබීම නිසා රු. මිලියන 1,245.54 ක් අතිරේකව වැය කිරීමට සිදුව තිබුණි. මෙහිදී උපදේශක සමාගමේ නිර්මාණ සැලසුම් කිරීම අභියෝගයට ලක්ව තිබුණි. 2023 දෙසැම්බර් 05 දක්වා පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණත්, 2023 දෙසැම්බර් 31 දිනටද කොන්ත්‍රාත්තුව නිමකර නොතිබූ අතර එදිනට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 91.4 ක් විය.	නිර්මානය කල උපදේශක සමාගමේ නිර්මාන සැලසුම් නැවත සමාලෝචනය හා ගෙවීය යුතු ගාස්තු පරික්ෂාකර ගෙවිය යුතුය. මූලික සැලැස්මට අනුව කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන්කර එහි ප්‍රතිලාභ මහජනතාවට ලැබෙන පරිදි කටයුතු කල යුතුය.	කටයුතු සඳහා සහ ඉන් අනතුරුව ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය නැවත මුල සිට ආරම්භ කිරීමෙන් වැඩිපුර කාලයක් ගතවීම වැළැක්වීම පිණිස සැලසුම වෙනස් කර තිබුණි.	සැලසුම් නැවත සමාලෝචනය හා ගෙවීය යුතු ගාස්තු නැවත පරික්ෂාකර නොතිබූ අතර සැලැස්මට අනුව කොන්ත්‍රාත්තු වේ වැඩ අවසන්කර නොතිබුණි.
(ඊ) මෙම 2023 කොන්ත්‍රාත්තුව යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් දේවහුව ඉංජිනේරු කාර්යාලය	මූලික සැලැස්මට පටහැනිව ක්‍රියා කල නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.	නිලධාරින්ට එරෙහි විනයානුකූල ක්‍රියාමාර්ග ආරම්භ කර නොතිබුණි.	දේවහුව ඉංජිනේරු කාර්යාලය අළුත්වැඩියාව සහ නවීකරණය කිරීම කර

	අළුත්වැඩියාව සහ නවීකරණය කිරීම සඳහා රු. මිලියන 10 ක මුදලක් වෙන් කර තිබූ අතර, එය ඉටු නොකර එම මුදලින් රු. මිලියන 9.6 ක් වැයකර ව්‍යාපෘතියේ උපදේශක සමාගම සඳහා දෙමහල් නිවසක් කුලී පදනම මත ලබාගෙන තිබුණි.				නොතිබූ අතර මූලික සැලැස්මට පටහැනිව ක්‍රියා කල නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
13	මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන් සඳහා උපදේශන සේවා ලබාගැනීම සම්බන්ධව පහත නිරීක්ෂණ කෙරේ.	2023			
	(අ) මෙම වැඩසටහන සූදානම් කිරීමේ තාක්ෂණ සහාය (PPTA) සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් පත්කළ කණ්ඩායමේ ප්‍රධානියා පසුව මෙම වැඩසටහනේ උපදේශන සමාගමේ සේවයට බැඳී ව්‍යාපෘතියේ කණ්ඩායම් නායක හා ප්‍රධාන සැලසුම් ඉංජිනේරු ලෙස වසර 07 ක කාලයක් සේවය කරමින් පැවතුණි. ඒ සඳහා මසකට යුරෝ 26,000 ක (රු.මිලියන 8.5) වැටුපක් ගෙවූ අතර, 2023 ජූනි වනවිට රු. මිලියන 702.18 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් වැඩසටහන සූදානම් කිරීමේ කාර්යයන් ගණනාවකට	2023	ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් වැඩ සටහන් සූදානම් කිරීමේ කාර්යයන් ගණනාවකට සම්බන්ධ වූ පුද්ගලයෙකු උපදේශන සමාගමේ සේවය කරන සමාගමකින් උපදේශන සේවා ලබාගැනීමේ කටයුතු කල නිලධාරින් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	මේ සම්බන්ධනේ විධිමත් පරික්ෂණයක් සිදුකර නොතිබුණි.	ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් වැඩ සටහන් සූදානම් කිරීමේ කාර්යයන් ගණනාවකට සම්බන්ධ වූ පුද්ගලයෙකු උපදේශන සමාගමේ සේවය කරන සමාගමකින් උපදේශන සේවා ලබාගැනීමේ කටයුතු කල නිලධාරින් සම්බන්ධයෙන් මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

සහාය වූ පුද්ගලයෙකු වැඩසටහනේ උපදේශන සමාගමේ සේවය කිරීම තුළින් වැඩසටහන් සුපරීක්ෂණයේ ස්වාධීනත්වය අභියෝගයකට ලක්ව තිබුණි. මෙම උපදේශකවරයාගේ සේවය ලබා ගැනීම ආසියානු සංවර්ධන බැංකුව 2013 වර්ෂයේ නිකුත් කල උපදේශකවරුන් යොදා ගැනීම සඳහා වූ අත්පොතෙහි 1.11 ඡේදයටද පටහැනි විය.				
(ආ) සිදුකිරීමට යෝජිත ඉදිකිරීම් කොන්ත්‍රාත් වල විෂයය පථය (Define the scope output and the length of the services) කොන්ත්‍රාත්වල කාර්යසාධනය පදනම් කරගෙන තීරණය කළ හැකි බැවින් ඒ මත උපදේශන ගාස්තු ගෙවීම කලයුතු වුවත්, කාලය පදනම් කරගෙන උපදේශන ගාස්තු ගෙවීම සඳහා 2015 නොවැම්බර් 16 සිට මාස 60 ක කාලයකට ඇ.ඩො.මිලියන 22.09 ක වටිනාකමකට උපදේශන කොන්ත්‍රාත්තු ගිවිසුමකට එළඹ තිබුණි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වල ඇති වූ ප්‍රමාදය නිසා ව්‍යාපෘති කාලය දීර්ඝ වී තිබූ නිසා	2023	කාර්යසාධනය පදනම් කරගෙන උපදේශන ගාස්තු ගෙවිය යුතු වුවද කාලය පදනම් කර ගෙන උපදේශන ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් උපදේශන සේවා කොන්ත්‍රාත් ගිවිසුම නැවත සමාලෝචනය කර ක්‍රියාමාර්ග ගත යුතුය	මේ සම්බන්ධනේ විධිමත් පරික්ෂණයක් සිදුකර නොතිබුණි.	කාර්යසාධනය පදනම් කරගෙන උපදේශන ගාස්තු ගෙවීමට උපදේශන සේවා කොන්ත්‍රාත් ගිවිසුම නැවත සමාලෝචනය කර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

මෙම දීර්ඝ වූ කාලය පදනම් කරගෙන උපදේශන ගාස්තුද ගෙවීමට සිදුවීමෙන් 2024 ජූනි 30 දක්වා අවස්ථා 06 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර පිරිවැය ඇ.ඩොලර් මිලියන 41.56 දක්වා වැඩිකර තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව විසින් අදියර 01 සහ 02 සඳහා උපදේශන ගාස්තු ගෙවීමට වෙන්කර තිබුණේ ඇ.ඩො. මිලියන 25.93 ක් බැවින්, අනිකුත් වියදම් සඳහා වෙන්කළ මුදලින් වැඩි වූ උපදේශක ගාස්තු ගෙවීමට සිදු වී තිබුණි. එසේම ව්‍යාපෘතිය ආරම්භයේදී විදේශිකයින් 34 දෙනෙකු උපදේශන කටයුතු සඳහා බඳවා ගෙන තිබූ අතර, වර්තමානයේ විදේශිකයන් 08 දෙනෙකු සේවයේ යෙදෙමින් පැවතුණි. විදේශීය පුද්ගලයෙකුට මසකට යුරෝ 16,000 සිට 26,000 (රු. මිලියන 5.5 සිට රු. මිලියන 9) දක්වා පරාසයක වැටුප් ද, යුරෝ 110 සිට 70 අතර පරාසයක දෛනික යැපීම් දීමනා ද ගෙවමින් පැවතුණි. මෙම විදේශීය පුද්ගලයන් වෙත 2023 ජූනි 30 දිනට යුරෝ 12,843,998 (රු.මිලියන 4,341) ක වැටුප්ද යුරෝ

1,068,599 (රු.මිලියන 361.18) ක යැපීම් දීමනා ද ගෙවා තිබුණි.				
(ඇ) ව්‍යාපෘතියේ කටයුතු සඳහා විදේශීය උපදේශන සමාගම විසින් එයට අනුබද්ධ දේශීය සමාගම් 02 ක් හරහා දේශීය සේවකයන් 161 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර, දැනට එයින් 110 දෙනෙකු සේවයේ යෙදෙමින් පැවතුණි. මෙම කාර්ය මණ්ඩලයට අමතරව කොළඹ ව්‍යාපෘති කාර්යාලයේ සහ කොන්ත්‍රාත් ක්‍රියාත්මක වන ප්‍රදේශවල පිහිටා ඇති වැඩබිම් කාර්යාල 08 ක සේවය කරන 48 ක කාර්ය මණ්ඩලයක් සඳහාද කාලය පදනම් කරගෙන උපදේශන ගාස්තු ගෙවමින් පැවතුණි. එසේම ව්‍යාපෘතියට අයත් වාහන 14 ක්, යතුරු පැදි 03 ක් උපදේශන සමාගම වෙත ලබා දී තිබූ අතර 2023 ජූනි 30 දිනට ඒවායේ මෙහෙයුම් හා නඩත්තුව සඳහා රු. මිලියන 67 ක වියදම් ව්‍යාපෘතිය විසින් දරා තිබුණි.මෙමඋපදේශන සමාගම භාවිතා කරන ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීම සඳහා රු. මිලියන 9.65 ක්ද, විවිධ ස්ථානවල පවත්වාගෙන උපදේශන	2023	උපදේශන සේවා කොන්ත්‍රාත් ගිවිසුම නැවත සමාලෝචනයට ලක් කළ යුතුය.	උපදේශන සේවා ලබාගැනීම කාර්යාල පවත්වාගෙන යාම වාහන සඳහා වියදම් දැරීම හා ව්‍යාපෘති මෙහෙයුම් වියදම් දැරීම සම්බන්ධයෙන් විධිමත් පරික්ෂණයක් සිදුකර නොතිබුණි.	උපදේශන සේවා ලබාගැනීම කාර්යාල පවත්වාගෙන යාම වාහන සඳහා වියදම් දැරීම හා ව්‍යාපෘති මෙහෙයුම් වියදම් දැරීම සම්බන්ධයෙන් උපදේශන සේවා කොන්ත්‍රාත් ගිවිසුම නැවත සමාලෝචනයට ලක් කර නොතිබුණි.

සමාගමට අයත් කාර්යාල පිහිටුවීම සඳහා රු. මිලියන 13.47 ක්ද, ඒවා නඩත්තු කිරීම සඳහා රු. මිලියන 84.83 ක්ද 2023 ජූනි 30 දිනට වැය කර තිබුණි.				
(ඇ) ආසියානු සංවර්ධන බැංකුව 2013 වර්ෂයේ නිකුත් කළ, බැංකුව සහ එහි ණයගන්නන් විසින් උපදේශකවරුන් යොදවා ගැනීමේ මග පෙන්වීම් අත්පොතෙහි 1.11(b) සහ (c) ඡේද අනුව උපදේශක කොන්ත්‍රාත්තුව සඳහා තෝරාගන්නා සමාගම හෝ සමාගම් අදාළ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වෙනත් කොන්ත්‍රාත් (උදා:- නිර්මාණ සැලසුම් සකස් කිරීම, පාරිසරික ඇගයීම්) කලින් සිදුකර තිබේනම් උපදේශන කටයුතු සඳහා එම සමාගම් නැවත පත්කර නොගත යුතු අතර, ආසියානු සංවර්ධන බැංකුව සහ ණය ගන්නා (වාරිමාර්ග අමාත්‍යාංශය) ආයතනවල සේවකයින් සමඟ පවුල් හා ව්‍යාපාරික සබඳතා ඇති පුද්ගලයන්ද උපදේශන කටයුතු සඳහා දායක කර නොගත යුතු වේ. එසේ වුවද, මෙම වැඩසටහනේ උතුරු මැද හා වයඹ ඇළවල් ඉදිකිරීම සහ මිණිපේ	2023	උපදේශන සේවා කොන්ත්‍රාත් ගිවිසුම හා එහි කාර්ය මණ්ඩල සංයුතිය නැවත සමාලෝචනය කළ යුතුය.	මේ සම්බන්ධයෙන් විධිමත් විමර්ෂනයක් සිදුකර නොතිබුණි.	උපදේශන සේවා කොන්ත්‍රාත් ගිවිසුම හා එහි කාර්ය මණ්ඩල සංයුතිය නැවත සමාලෝචනය සිදුකර නොතිබුණි.

ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිවල නිර්මාණ සැලසුම්, පාරිසරික ඇගයීම් වාර්තා, ශක්‍යතා අධ්‍යනය වාර්තා හා නවීකරණ වාර්තා සකස් කර ඒ සඳහා රු. මිලියන 102.98 ක මුදලක් මහවැලි උපදේශක කාර්යාංශ සමාගම හරහා ලබාගත් සමාගම පසුව මෙම වැඩසටහනේ ප්‍රධාන උපදේශක සමාගමේ ශ්‍රී ලංකා නියෝජිත සමාගම ලෙස 2015 වර්ෂයේ සිට කටයුතු කරමින් පැවතුණි. තවද එම නියෝජිත සමාගමේ ප්‍රධාන කාර්ය මණ්ඩලය ණය ගැනුම්කරු වූ වාරිමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වල විශ්‍රාමලත් නිලධාරින්ගෙන් සමන්විත විය.				
(ඉ) මහකිතුල උමං මාර්ගය, මහකිතුල හා මහකිරුල ජලාශ 02 හා එම ජලාශ 02 අතර ඇළ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2020 – 2024 කාලය තුළ රු.මිලියන 9,978.48 ක වටිනාකමකට ඉදිකිරීමට භාරගත් සමාගමට ඉදිකිරීම් කටයුතු සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් සහ ඉදිකිරීම් උපකරණ නොමැති වීම, දුර්වල වැඩබිම් කළමනාකරණය යන	2023	කාර්යසාධන ඇප බැදුම්කර හා අත්තිකාරම් ඇප බැදුම්කර මුදල් කර රජයට වූ පාඩුව පියවාගැනීමට කටයුතු කල යුතුය.	කොන්ත්‍රාත්තුව යටතේ සිදුකරන ලද ඉදිකිරීම් හා ඒ යටතේ වියදම් දැරීම් නැවත සමාලෝචනයට ලක්කර නොතිබුණි.	කාර්යසාධන ඇප බැදුම්කර හා අත්තිකාරම් ඇප බැදුම්කර මුදල් කර රජයට වූ පාඩුව පියවාගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

හේතු මත සැලසුම් ප්‍රකාරව ඉදිකිරීම් ප්‍රගතිය පවත්වා ගෙන යාමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2023 මැයි 26 අවසන් කර තිබූ අතර, ඒ වනවිට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 2.97 ක ඉදිරිකිරිම් ප්‍රගතියක් පමණක් වාර්තා කර තිබූ කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණද මහකිතුල හා මහකිරුල ජලාශ ඉදිකිරීම සහ ඒ අතර පිහිටි මහදඹේ ජලාශය වැඩි දියුණු කිරීම සඳහා අක්කර 778 ක කැලෑ ප්‍රදේශයක පිහිටි ගස් 47,552 ක් රාජ්‍ය දැව සංස්ථාව විසින් කපා ඉවත් කර තිබුණු අතර, එසේම මහකිතුල ජලාශයේ වැව් බැම්ම සකස් කිරීම සඳහා අත්තිවාරම් කපා මැටි දමා අදාළ වැව් බැම්මේ සියයට 1.5 ක වැඩ නිමකර තිබූණි. ඒ සඳහා රු. මිලියන 58.2 ක වියදමක්ද ඉදිකිරීම් අධීක්ෂණය වෙනුවෙන් උපදේශන සමාගමේ කාර්ය මණ්ඩල වැටුප්, කාර්යාල වියදම් හා වාහන නඩත්තුව සඳහා රු. මිලියන 139 ක් වැයකර තිබුණි.

මෙම ඉදිකිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු යාන් ඔය ව්‍යාපෘතියේද

ඉදිකිරීම් සිදුකර තිබූ අතර, එම ව්‍යාපෘතිය සඳහා බදු සහන සහිතව ගෙන එන ලද යන්ත්‍ර සූත්‍ර උපකරණ සහ වාහන 143 ක් සඳහා ගෙවිය යුතු රේගු බදු ගෙවීම් කර මෙම ව්‍යාපෘතිය සඳහා පාවිච්චි කිරීමට 2021 අගෝස්තු 30 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම නිසා මෙම යන්ත්‍ර සූත්‍ර කොන්ත්‍රාත්කරු ඉවත් කරගෙන ගොස් තිබුණි.				
(ඊ) කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරු හා උපදේශක සමාගමේ භාවිතයට අමානෝ තහඩු යොදා ඉදිකළ තාවකාලික ගොඩනැගිලි 02 ක් සහ උපදේශක සමාගම විසින් පාවිච්චි කළ ආපන ශාලාවක් ව්‍යාපෘතියට භාර දී තිබුණි. මෙම භාරගත් ගොඩනැගිලි ස්වාධීන කමිටුවක් යොදා තක්සේරු කර භාරගෙන නොතිබූ අතර, භාරගත් ගොඩනැගිලි 2023 සැප්තැම්බර් 01 දින සිට මාස 06 ක් ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂණ සමාගමක සේවය ලබා ගැනීම වෙනුවෙන් රු. මිලියන 3.57 ක් වැයකර තිබුණි.	2023	භාරගත් වත්කම් තක්සේරු කර භාරගැනීම හා ඒවා ගිණුම්ගත කිරීමත් කළ යුතුය.	භාරගත් ගොඩනැගිලි ස්වාධීන කමිටුවක් යොදා තක්සේරු කර මෙතෙක් භාරගෙන නොතිබුණි.	භාරගත් වත්කම් තක්සේරු කර ඒවා ගිණුම්ගත කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.
(උ) 2024 දෙවන	2023	ව්‍යාපෘතියේ ඉතිරි	මෙම වැඩසටහනේ	ව්‍යාපෘතියේ

	කාර්තුවේ අදියර 03 සඳහා ලබා දීමට යෝජිත ඇ. ඩොලර් මිලියන 93 ක මුදල යොදවා උතුරු මැද පළාත් ඇළෙහි උමං විදුම් යන්ත්‍ර 02 ක් යොදවා ගෙන සිදුකරන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව, මහවැලි කලාප වල ගොවීන් සඳහා කෘෂිකාර්මික යෙදවුම් ලබා දීම සහ මෙහෙයුම් වියදම් දැරීම පමණක් සිදු කිරීමට යෝජිතව ඇත. ඒ අනුව, මෙම වැඩසටහනේ ඉතිරි වැඩ කොටස් නිම කිරීමට කාලවකවානු තීරණය කර හෝ ඒ සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම පිළිබඳ නිශ්චිත සැලසුමක් සකස් කර නොමැති වීම නිසා ශ්‍රී ලාංකීය ජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.		වැඩ නිම කිරීමට කාලවකවානු තීරනය කර ඒ අනුව අරමුදල් සම්පාදනය කර ගැනීම කළ යුතුය.	ඉතිරි වැඩ කොටස් නිම කිරීමට කාලවකවානු තීරණය කර ඒ සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම පිළිබඳ නිශ්චිත සැලසුමක් මෙතෙක් සකස් කර නොතිබුණි.	ඉතිරි වැඩ නිම කිරීමට කටයුතු කර නොතිබුණි.
14	මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන අදියර 02 යටතේ උතුරු මැද පළාත් ඇළෙහි කෝඳුරුවාව සිට නාමල්පුර දක්වා කි.මී, 27.7 දිග උමං ඇළ ඉදිකිරීම.	2023			
	(අ) මින්නේරිය - ගිරිතලේ ස්වාභාවික රක්ෂිතය, සීගිරිය අභය භූමිය, මින්නේරිය ජාතික උද්‍යානය හා හුරුළු වැව රක්ෂිතය තුළදී ඇළ ඉදිකිරීම	2023	තාක්ෂණික වශයෙන් යෝග්‍ය, ජාතික වශයෙන් ඵලදායී, පාරිසරික වශයෙන් අවම බලපෑම් වන හා පිරිවැය අවම වන	මේ සම්බන්ධයෙන් නැවත විමර්ෂනයක් සිදුකර නොතිබුණි.	නිර්දේශ වලට අනුව පාරිසරික වශයෙන් අවම බලපෑම් වන හා පිරිවැය අවම වන පරිදි කැණීම් කිරීමේ

පොළව ඇතුලතින් පමණක් Cut & Cover, double Conduit හෝ tunnel යන ක්‍රමවේද යොදාගෙන ඉදිකරන ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණි. එසේ වුවද මෙහිදී තාක්ෂණික වශයෙන් යෝග්‍ය, ජාතික වශයෙන් ඵලදායී, පාරිසරික වශයෙන් අවම බලපෑම් වන ක්‍රමවේදය ලෙස පිරිවැය අධික ක්‍රමයක් වූ උමං විදුම් යන්ත්‍ර 02 ක් යොදාගෙන කැණීම් කිරීමේ ක්‍රමවේදය තෝරා ගෙන තිබුණි.		පරිදි කැණීම් කිරීමේ ක්‍රමවේදයක් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය.		ක්‍රමවේදයක් තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ආ) කැණීම් සඳහා අවශ්‍ය 1 වන උමං විදුම් යන්ත්‍රය චීනයේ සිට ආනයනය කර වැඩබිම වෙත ප්‍රවාහනය කර එය සවිකිරීම වෙනුවෙන් රු. මිලියන 6,690.97 ක එකඟ වූ සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද උමං විදුම් යන්ත්‍රය ත්‍රිකුණාමලය වරායෙන් පිටතට එන අවස්ථාව වන විට එහි පිරිවැය රු. මිලියන 2,155.97 ක් වී තිබුණි. ඒ අනුව ත්‍රිකුණාමලය සිට නාමල්පුර දක්වා යන්ත්‍රය ප්‍රවාහනය කර එකලස් කිරීම සහ කොන්ත්‍රාත්කරුගේ ලාභය වෙනුවෙන් රු.මිලියන 4,535ක මුදලක් ගෙවා තිබුණි.	2023	ලංසු ඇගයීමේදී කාර්යක්ෂම හා පිරිවැය අවම වන කොන්ත්‍රාත් ක්‍රමවේදය තෝරාගැනීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය.	ලංසු කැඳවීම හා ලංසු ඇගයීම සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කල යුතු ආකාරය සම්බන්ධයෙන් දැනුවත් කිරීම් හා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග අභ්‍යන්තර චක්‍රලේඛ මගින් නිලධාරින් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්තුව පිරිනැමීමට වසර 2½ ක් ප්‍රමාද වීම නිසා කොන්ත්‍රාත්තුව නිම කිරීමේ කාලය 2027 මාර්තු 10 දක්වා දීර්ඝ වී තිබුණු අතර 2025 ජූනි මාසයේ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට Drill & Blasting ක්‍රමය යටතේ ඉදි කිරීමට නියමිතව තිබූ කි.මී. 10.4 ක් වූ දුර ඉදිකිරීම සඳහා දෙවන උමං විදුම් යන්ත්‍රයක් යොදවා ගෙන තිබුණි.	2023	කොන්ත්‍රාත් පරිපාලන සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය.	ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇතිවීම වලක්වා ගැනීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.	කොන්ත්‍රාත් පරිපාලන සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කර නොතිබුණි..
(ඈ) උපදේශන සමාගම විසින් උමං විදුම් යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, වැඩබිම වෙත ප්‍රවාහනය කර සවි කිරීම සඳහා පිරිවැය ලෙස රු. මිලියන 7,255.40 ක් ඇස්තමේන්තු කර තිබූ අතර කොන්ත්‍රාත්කරු විසින් ඒ සඳහා රු.මිලියන 6,690.97 ක මිලක් ඉදිරිපත් කර තිබුණි. මෙම යන්ත්‍ර 2 ආනයනය කිරීමේදී ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කර තිබූ ඉන්වොයිස් පත්‍ර 2 අනුව එම යන්ත්‍ර 02 හි CIF වටිනාකම් පිළිවෙළින් ඇ.ඩො.10,581,673 (රු.මිලියන 2,147.97) ක් සහ ඇ.ඩො.9,476,342 (රු. මිලියන 3,523.61) ක් එනම් එකතු වටිනාකම රු. මිලියන 5,671.58 ක්	2023	ඇස්තමේන්තු පිළියෙල කිරීම හා උපදේශකයින් තෝරා ගැනීම සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය.	ඇස්තමේන්තු පිළියෙල කිරීම හා උපදේශකයින් තෝරා ගැනීම සම්බන්ධයෙන් ඉදිරියේදී ක්‍රියාකලයුතු ආකාරය සම්බන්ධයෙන් උපදෙස් නිකුත් කර නොතිබුණි.	ඇස්තමේන්තු පිළියෙල කිරීම හා උපදේශකයින් තෝරා ගැනීම සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කර නොතිබුණි.

විය. ඒ අනුව උපදේශක සමාගම විසින් ප්‍රමාණ පත්‍ර සකස් කිරීමේදී මෙවැනි යන්ත්‍රයක වටිනාකම පිළිබඳ තහවුරුවක් ලබා නොගෙන මෙම අයිතමය සඳහා අධි ඇස්තමේන්තු සකස් කර තිබුණි.				
(ඉ) 2 වන උමං විදුම් යන්ත්‍රයක් යෙදවීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කළ තාක්ෂණ ඇගයීම් කමිටුවම නිර්දේශ කර නොතිබුණු අතර අමාත්‍යාංශ ලේකම් විසින් විශේෂ තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුව විසින් යෝජනාවේ ශක්‍යතාවය සැක සහිත වන බවත් කොන්ත්‍රාත්තුව සඳහා අමතර අරමුදල් ආයෝජනය කිරීම සාධාරණීකරණය කළ නොහැකි බවට නිර්දේශ ඉදිරිපත් කර තිබිය දී එම කමිටුවේ තීරණය පිළිගැනීමට කටයුතු කර නොතිබූ අතර නැවත පත්කළ විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් 2 වන උමං විදුම් යන්ත්‍රයක් යෙදවීමට නිර්දේශය ලබා ගෙන තිබුණි. එහිදී කමිටු 2ක් මිලදීගැනිම ප්‍රතික්ෂේප කළ බව	2023	අමතර අරමුදල් ආයෝජනය කිරීම සාධාරණීකරණය කළ නොහැකි බවට වූ කමිටුවේ තීරණය පිළිගැනීමට කටයුතු නොකර අමාත්‍ය මණ්ඩලය වෙත ව්‍යාජ තොරතුරු සැපයූ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය.	අමාත්‍ය මණ්ඩල දැනුවත් කිරීමේදී නිවැරදි තොරතුරු සැපයීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් නිලධාරින් දැනුවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.	විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි. ව්‍යාජ තොරතුරු සැපයූ නිලධාරීන්ට එරෙහිව ක්‍රියා කර නොතිබුණි.

අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි.			
(ඊ) 02 වන උමං විදුම් යන්ත්‍රයද චීනයේ සිට ආනයනය කර වැඩබිම වෙත ප්‍රවාහනය කර එය සවිකිරීම වෙනුවෙන් රු. මිලියන 6,690.97 ක සම්පූර්ණ මුදල කොන්ත්‍රාත්කරුට ගෙවීමට එකඟව 2024 මාර්තු 15 වනවිට එයින්, රු. මිලියන 6,021.87 ක් ගෙවා තිබුණි. උමං විදුම් යන්ත්‍රය ත්‍රිකුණාමල වරායෙන් පිටතට එන අවස්ථාව වන විට එහි පිරිවැය රු.මිලියන 3,635.61 ක් වී තිබුණි. ඒ අනුව, ත්‍රිකුණාමලය සිට කෝඳුරුවාව දක්වා යන්ත්‍ර ප්‍රවාහනය කර එකලස් කිරීම වෙනුවෙන් රු. මිලියන 3,055.36 ක් ගෙවා තිබීම විගණනයේදී මතභේදයට තුඩු දී තිබුණි. 2022 නොවැම්බර් 22 ආනයනය කරන ලද 2 වන උමං විදුම් යන්ත්‍රය 2023 මාර්තු සිට 2024 මාර්තු දක්වා තාවකාලිකව ක්‍රියාත්මක නොකිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණි. යන්ත්‍රය සවිකිරීමෙන් පසු 2023 මාර්තු සිට මාස 8 ක කාලයක් නිෂ්කාර්යව තිබී 2023 නොවැම්බර් 23 සිට ක්‍රියාත්මක කිරීම	2023	ඉදිකිරීමේ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව කටයුතු තළ යුතුය.	-එම -

	ආරම්භ කර තිබුණු අතර, එදින සිට 2024 පෙබරවාරි 29 දින දක්වා මාස 3 ක කාලයකට ප්‍රගතිය මීටර් 399.91 ක අවම මට්ටමක තිබුණි.				
	(උ) කොන්ත්‍රාත්තුව අවසානයේ විදුම් යන්ත්‍ර 2 ගලවා වරාය දක්වා ප්‍රවාහනය කිරීම වෙනුවෙන් රු. මිලියන 179.99 ක් ප්‍රමාණ පත්‍රයට ඇතුල් කර තිබුණි. ඒ අනුව රු. මිලියන 13,381.94 ක් වටිනා යන්ත්‍ර 2 වෙනුවෙන් වැයකළ පිරිවැයෙන් කොටසක් හෝ මුදලක් තක්සේරු කර නැවත ලබා ගැනිමට ගිවිසුම් මගින් එකඟ වී නොතිබූ අතර යන්ත්‍ර 2 කිසිදු අයකිරීමක් රහිතව මෙරටින් රැගෙන යාමට එකඟ වී තිබුණි.	2023	ඉදිකිරීමේ ඇස්තමේන්තු පිළියෙල කිරීම හා කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය.	මෙවැනි තත්වයන් ඉදිරියේදී ඇතිවීම වලක්වාගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හඳුන්වාදී නොතිබුණි.	ඉදිකිරීමේ ඇස්තමේන්තු පිළියෙල කිරීම හා කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට පියවර ගෙන නොතිබුණි.
15	උතුරු මැද පළාත් ඇල ඉදිකිරීම මඟින් මහකනදරාව ජලාශයට ලබා ගන්නා ජලයෙන් රඹෑව, මැදවච්චිය ප්‍රදේශයට පානීය ජලය සැපයීම සඳහා රු. මිලියන 11,515 ක් ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ ජපන් අන්තර්ජාතික සහයෝගීතා නියෝජ්‍යායතන ආධාර මත අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය ආරම්භ කර එහි වැඩ	2023	ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකිවන පරිදි ඇල ව්‍යාපෘතිය ඉදිකිරීම් කඩිනම් කිරීමට ඉඩම් පවරා ගැනීම හා වන්දි ගෙවීම කඩිනම් කල යුතුය	ඉඩම් පවරා ගැනීම හා වන්දි ගෙවන ලද ඉඩම් කට්ටිවල ඉඩමේ භුක්තිය ඉඩම් හිමියන්ගෙන් භාර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	උතුරු මැද පළාත් ඇල ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කර ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

	කටයුතු නිම වීමට ආසන්න මට්ටමක පැවතුණද, උතුරු මැද පළාත් ඇල ව්‍යාපෘතිය නියමිත කාලය තුල ක්‍රියාත්මක නොවීම නිසා මෙම ව්‍යාපෘතියේ ජලය මහකනදරාව ජලාශයට ලැබෙන තෙක් මෙම පානීය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල නොහැකි මට්ටමක පැවතුණි.එසේම උතුරු මැද පළාත් ඇළ ඉදිකිරීමට පවරාගත් ඉඩම් සඳහා වන්දි ගෙවා තිබූ අතර තවදුරටත්, ඉඩම් කට්ටි 259 ක් එනම් මුළු ප්‍රමාණයෙන් සියයට 40 ක් පවරා ගත යුතුව පැවතුණි. තවද, වන්දි ගෙවන ලද ඉඩම් කට්ටි 385 ක ඉඩමේ භුක්තිය ඉඩම් හිමියන්ගෙන් භාර ගෙන වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පවරා ගැනීම මේ දක්වා සිදු කර නොතිබුණි.				
16	මොරගහකන්ද ජලාශයේ සිට කන්දරා ඔය දක්වා කි.මී. 96 ක් දුරට ගමන් කරන උතුරු මැද පළාත් ඇළෙහි කි.මී. 27.7 ක් දිග උමං ඇල මාර්ගය පමණක් 2025 වර්ෂයේ වැඩසටහන අවසන් වනවිට නිම කිරීමට මේ වන විට සැලසුම් කර ඇත. මේ නිසා කි.මී. 68.3 වූ ඉතිරි ඇල මාර්ගය ඉදිකර එහි ප්‍රතිලාභ ලබා ගැනීම	2023	මාර්ගය ප්‍රතිලාභ මහජනතාවට ලබාගැනීමට හැකි වන පරිදි සැලැස්මක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත උතුරු මැද මහ ඇළේ ඉතිරි වැඩ කොටස් අවසන් කිරීම සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන සම්පාදනය කිරීම සඳහා නව ව්‍යාපෘතියක් සැලසුම් කිරීමට ආසියානු සංවර්ධන බැංකුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව	උමං ඇල මාර්ගය කැණීම් කොන්ත්‍රාත්තුව ආරම්භකර නොතිබුණි.

	සඳහා නිශ්චිත සැලැස්මක් විගණිත දිනය වන තුරු ඉදිරිපත්ව නොතිබුණි. කි.මී. 27.7 ක් දිග උමං ඇල මාර්ගය කැණීම් කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දිනට සියයට 21 ක් විය.			විසින් මේ වන විට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරමින් පවතින බව දක්වා තිබුණි.	
17	2018 වර්ෂයේදී රු. මිලියන 7,146.91 ක වටිනාකමට පිරිනමා තිබූ කළුගඟ මොරගහකන්ද යා කරන උමං ඇළ මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2021 සැප්තැම්බර් 10 දින නිමකල යුතු වුවත් නියමිත කාලය තුල නිම කිරීමට නොහැකි වීම නිසා 2023 දෙසැම්බර් 21 දක්වා දීර්ඝ කර තිබුණි. නමුත්, එදිනට ද ඉදිකිරීම් ප්‍රගතිය සියයට 90 ක් විය.	2023	ව්‍යාපෘතිය අවසන් කර ප්‍රතිලාභ ලැබීමට සැලැස්විය යුතුය.	ඉලුක්කුඹුර - පොත්තේවෙල දක්වා වූ ප්‍රවේශ මාර්ගය හැර අනෙකුත් ඉදිකිරීම් කටයුතු සියයට 100 ක් අවසන් කර ඇත.	කළුගඟ මොරගහකන්ද යා කරන උමං ඇළ මාර්ගය ඉදිකිරීමේව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කර ඇතත් එහි ප්‍රතිලාභ ලඟාකර ගැනීම පිළිබඳ කටයුතු කර නොතිබුණි.
18	මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන විසින් 2022 වර්ෂයේ මිලදී ගත් පොහොර තොගයක් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින පොහොර සමාගම් 02 කට භාරදී තිබූ අතර එහිදී රු.මිලියන 55.23 ක් වටිනා පොහොර මෙ.ටොන් 161.5(බෑග්3,230) ක ඌණතාවයක් ඇති වී තිබුණි. මේ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමට	2023	පොහොර තොග ඌනතාවය අයකරගැනීම කළ යුතුය	මේ සම්බන්ධව සංක්ෂිප්ත වාර්තාවක් ව්‍යාපෘතිය විසින් සකස් කරමින් පවතින බව දක්වා තිබුණි.	පොහොර තොග ඌනතාවය අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

	වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් පත්කළ පරීක්ෂණ කමිටුවක් මඟින් වරාය අධිකාරියේ වාර්තා නැවත නිවැරදි කර එම නිවැරදි වාර්තා පදනම් කරගෙන සැපයුම්කාර සමාගමෙන් ඌණතාවය අයකර ගැනීමට නිර්දේශ කර තිබුණත්,එම අලාභය සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට නොහැකි වී තිබුණි.				
19	දේශීය කෘෂිකාර්මික භෝග වැඩි දියුණු කිරීමේ වැඩසටහන යටතේ මහවැලි කලාප 5 ක හා හුරුළු වැව ප්‍රදේශවල ගොවීන්ට දෙමුහුම් මිරිස් බීජ දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා Poly Tunnel ඒකක 50 ක් සපයා සවිකිරීමේ ව්‍යාපෘතියක් රු.මිලියන 91.57 ක කොන්ත්‍රාත් වටිනාකමකට ක්‍රියාත්මක කර තිබුණි. මේ සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු Poly Tunnel සකස් කිරීම සම්බන්ධ පෙර පළපුරුද්දක් ලබා නොතිබුණු අතර, 2018-2020 කාලය තුල අලාභ ලබා 2021 කාලය තුල පමණක් ලාභයක් ලැබූ සමාගමක් විය. 2023 මැයි 15 දිනට වැඩ නිම කිරීමට එකඟ වී තිබුණද 2024 අප්‍රේල් 30 දින වන විටත් Poly Tunnel	2023	මිල ගණන් ඇගයිම හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් අනලස්ව ක්‍රියාකර ඇත්ද යන්න පරික්ෂාකර එම නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය.	මේ වන විට Poly Tunnel ඒකක 50 ක් සපයා සවිකිරීමේ කටයුතු අවසන් කර ඇත.	මිල ගණන් ඇගයිම හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් අනලස්ව ක්‍රියාකර ඇත්ද යන්න පරික්ෂාකර නොතිබුණි.

	42 ක් පමණක් සවිකර තිබුණ අතර 2024 මැයි 31 දක්වා අවස්ථා තුනකදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි.				
20	වාරිමාර්ග අමාත්‍යාංශය නමින් වාහන 654 ක් ලියාපදිංචි වී වාහන ලේඛනය අනුව හා පරිහරණය කරණු ලබන වාහන සංඛ්‍යාව 74 ක් විය. ඒ අනුව වාහන 580 ක් විගණිත දින වන විට අමාත්‍යාංශය භාරයේ නොපැවතුණි.	2023	අමාත්‍යාංශය භාරයේ නොපවතින වාහන සම්බන්ධයෙන් සොයාබැලීමට කටයුතු කළ යුතුය.	අමාත්‍යාංශය භාරයේ නොපැවතුණු වාහන මේදක්වා හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.	අමාත්‍යාංශය භාරයේ නොපවතින වාහන සම්බන්ධයෙන් සොයාබැලීම කර නොතිබුණි.
21	අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති වාහන 580 අතරින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වාහන 43 ක්ද, මහවැලි අධිකාරිය වාහන 253ක්ද, බලශක්ති අමාත්‍යාංශය වාහන 04ක්ද, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත වාහන 28 ක්ද නිදහස් කර දිගු කාලසිමාවක් ගතවී ඇතත් අයිතිය එම ආයතන වෙත පැවරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අදාළ වාහන එම ආයතන භාරයේ පවතින බවට වාර්ෂිකව සනාථ කර ගැනිමක්ද කර නොතිබුණි.	2023	වාහන පරිපාලනය සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය	වාහන වල අයිතිය එම ආයතන වෙත පැවරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අදාළ වාහන එම ආයතන භාරයේ පවතින බවට වාර්ෂිකව සනාථ කර ගැනිමක්ද කර නොතිබුණි	වාහන පරිපාලනය සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කර නොතිබුණි.
22	මහවැලි අධිකාරිය වෙත ලබා දී තිබූ වාහන 253 න් වාහන 16 ක් මහවැලි අධිකාරිය භාරයේ නොපැවතුනු අතර	2023	අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති වාහන ලබාදී ඇති ආයතන වෙත	මහවැලි අධිකාරිය භාරයේ නොපැවතුනු වාහන හඳුනාගැනීමට මේදක්වා කටයුතු	අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති වාහන ලබාදී ඇති

	අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ලේඛන ගතකිරීමකින් තොරව වාහන විවිධ අංශය විසින් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව ඩබල් කැබ් රථ 11 ක් DSDP/තණමල්විල ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලබා දී තිබුණද මහවැලි අධිකාරියේ සංවිධාන ව්‍යුහය තුල එවැනි කලාප කාර්යාලයක් තණමල්විල පිහිටා නොතිබුණි.		පවරා දීම යුතුය.	කර නොතිබූ අතර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ වාහන ලේඛන ගතකිරීමේ කටයුතු විධිමත් කර නොතිබුණි.	ආයතන වෙත පවරා දීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.
23	අමාත්‍යාංශ ලේකම් නමින් පැවති අංක 56–8184 දරන කැබ් රථය අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව මහවැලි අධිකාරිය විසින් 2023 වර්ෂයේදී වෙන්දේසි කර තිබූ අතර එහි ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.	2023	වාහනය වෙන්දේසි කිරීම සොයාබැලිය යුතු අතර එහි ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සනාථ කර ගත යුතුය.	වෙන්දේසි කරන ලද වාහනයේ ආදායම මේදක්වා ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.	වාහනය වෙන්දේසි සම්බන්ධයෙන් සොයාබලා එහි ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීම කර නොතිබුණි.
24	මුල්‍ය ප්‍රකාශන වල ඇතුළත් පොත් වලින් කපාහැරීම් පිළිබද ප්‍රකාශනයේ තව දුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති වාහන අනතුරු 2 කට අදාළව එකතුව රු.10,561,210 ක් ශේෂයක් වූ අතර, ඉන් අංක WPPG 0456 දරන වාහනයේ සිදුවූ අනතුරට අදාළව සිදුව තිබූ අලාභය රු. 10,482,500 ක් 2023	2023	මු.රෙ.පරීක්ෂණයේ නිර්දේශය පරිදි එම අලාභය කඩිනමින් අයකර ගත යුතුය.	අදාල අලාභ මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ සහය සහ උපදෙස් ඉල්ලා 2023.10.09 දිනැති ලිපිය මඟින් අදාල ලේඛණ ඇතුලත්ව අමාත්‍යාංශයේ නීති නිලධාරී විසින් ලේකම්තුමා හරහා නීතිපති වෙත යොමු	මු.රෙ.පරීක්ෂණ යේ නිර්දේශය පරිදි එම අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

	දෙසැම්බර් 31 දිනට රක්ෂණ ආයතනයෙන් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. අනතුර සිදු වන අවස්ථාවේදී රියදුරු මත්පැන් පානය කර වාහනය ධාවනය කර තිබූ බැවින් රක්ෂණ ආයතනය හිමිකම ගෙවීම ප්‍රතික්ෂේප කර තිබූ අතර මු.රෙ.104 පරීක්ෂණයෙන් වගකිවයුතු පාර්ශවය වූ රියදුරු වෙතින් අලාභය අයකර ගැනීම නිර්දේශ කර තිබුණි. ඒසේ වුවද එම අලාභය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.			කිරිමට කටයුතු සිදු කර තිබුණි .	
25	වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන ගෙවීම් පටිපාටිය, මුදල් රෙගුලාසි 135 ප්‍රකාර මුල්‍ය පාලනය සම්බන්ධව කාර්යයන් පැවරීමට අනුකූල නොවන බැවින් එම පටිපාටිය නිවැරදි කරන ලෙස 2011 මාර්තු 22 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී අමාත්‍යාංශ ලේකම්ට නියෝග කර වසර 13ක් ගත වී තිබුණද 2024 මැයි 31 වන විටත් නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි.	2023	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කර ඒ පිළිබඳ තක්සේරුවක් සමඟ රාජ්‍ය ගිණුම්කාරක සභාව වෙත වාර්තා කළ යුතුය	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී අමාත්‍යාංශ ලේකම්ට ලබාදුන් නියෝග මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.	ගණු ලැබූ ක්‍රියාමාර්ග රාජ්‍ය ගිණුම්කාරක සභාව වෙත වාර්තා කර නොතිබුණි.
26	මොරගකන්ද ජල විදුලි	2023	ලංකා විදුලිබල	ඉදිරියේ දී ආදායම්	විදුලිබල

	බලාගාර ව්‍යාපෘතියේ අදියර I, II හා III මගින් උත්පාදිත විදුලිය වෙනුවෙන් 2021 – 2023 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් රු.3,697,431,708 ක ඉන්වොයිස්පත් ඉදිරිපත් කර තිබූ නමුත් ඉන් සියයට 23 ක් හෙවත් රු. 853,731,252 ක් පමණක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගෙවා තිබුණි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉහත සඳහන් පරිදි ගෙවිය යුතු හිඟ ආදායම් එකතුව රු. 2,843,700,456 ක් වූ අතර ඉදිරිපත් කර තිබූ ඉන්වොයිස්පත් සඳහා ගෙවීම් කල යුතු දිනය නියම කර, ප්‍රමාණවත් ගෙවීම් කාලයක් ලබාදී අනතුරුව පොළි අයකල හැකිවන පරිදි ගිවිසුම්ගතව නොතිබීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයෙන් අදාළ මුදල් සහ පොළිය අයකර ගැනීමට නොහැකි වී තිබුණි.		මණ්ඩලයෙන් අයවිය යුතු හිඟ ආදායම් සම්බන්ධයෙන් හා ගෙවීම් කල යුතු දිනය නියමකර ප්‍රමාණවත් කාලයක් ලබා දී අනතුරුව පොලී අයකල හැකිවන පරිදි ගිවිසුම් ගතවීමට කටයුතු කල යුතුයි.	ගෙවීම කිරීම සඳහා දිනයක් නියම කර ප්‍රමාණවත් කාලයක් තුළ ලංකා විදුලි බල මණ්ඩලයෙන් මෙම ආදායම් රැස් කර ගැනීමට කටයුතු කල යුතු බවත්, එම ලබා දුන් කාලය අවසන් වූ පසුත් ගෙවීම් කිරීමට අපොහොසත් වන්නේ නම් ප්‍රමාද වීම් සඳහා පොලී අය කිරීමට හැකි වන පරිදි ගිවිසුම් ගතවීමට අවශ්‍ය පියවර කඩිනමින් ගන්නා මෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය දැනුවත් කිරීමට කටයුතු කල බව දක්වා තිබුණි.	මණ්ඩලයෙන් අයවිය යුතු විදුලි ගාස්තු සම්බන්ධයෙන් මෙතෙක් ගිවිසුම් ගතවීමට කටයුතු කර නොතිබුණි.
27	ජපාන රජයේ ආධාර යටතේ 2003–2013 කාලසීමාව තුල ක්‍රියාත්මක කර තිබූ නිවත්කම් දනන් බලගැන්වීමේ (PEACE) ව්‍යාපෘතියේ 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති	2023	වත්කම් පරිපාලනයේ දුර්වලතා පිළිබඳ විගණකාධිපති පෙන්වා දී ඇති කරුණු පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නිරවුල්	ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් ජල බවුසර්, කැබ් රථ හා ශීතකරණ කැබ් රථයේ පැවැත්ම හා භාවිතය පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර	JICA ආයතනය විසින් නිරවුල් කිරීමේ සහතිකපත් නිකුත්කිරීමට කටයුතු කර නොතිබුණි.

	වාර්තාව නිකුත් කර වසර 10 ක් ගතවී ඇතත් ඒ මගින් පෙන්වා දී ඇති වත්කම් පරිපාලනයේ පැවති දුර්වලතා පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. එම නිරීක්ෂණ සම්බන්ධව JICA ආයතනය විසින් නිරවුල් කිරීමේ සහතිකපත් ඉල්ලා වසරක් ගතවී ඇතත් ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් ජල බවුසර්, කැබ් රථ හා ශීතකරණ කැබ් රථයේ පැවැත්ම හා භාවිතය පිළිබඳ විශ්වාසනීය තොරතුරු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර නොතිබිම හේතුවෙන් අදාල නිරවුල් කිරීමේ සහතික නිකුත්කිරීමට නොහැකිවී තිබුණි. ඒ හේතුවෙන් ජපාන රජයේ ණය ආධාර මුදල් එකවර පියවීමට ශ්‍රී ලංකා රජයට සිදුවන තත්වයක් නිර්මාණය වී තිබුණි.		කිරීමේ සහතිකපත් සකස් නොකල නිලධාරින් සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතුය.	ඇත.රජරට සංවර්ධන බැංකුවේ ණය ලබාදීම් හා පොලී අයවීම් වලට අදාල ලේඛන මේතෙක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.	
28	අමාත්‍යාංශය යටතේ වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සම්පත් යොදා ආරම්භ කරන ලද මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම ව්‍යාපෘති කමිටුව විසින් තෝරාගත් බාහිර ආයෝජකයකු සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම	2023	ප්‍රතිසංවිධාන අනුමැතීන්ට අනුව, අපේක්ෂිත කාර්යයන්හි කාලරාමුව අනුව ආයෝජකයින්ගේ සුදුසු ව්‍යාපෘති තෝරා ගැනිමට කටයුතු කල යුතුයි.	අදාල ප්‍රතිසංවිධානය කිරීම සඳහා ඉදිරියට සිදුකිරීමට අපේක්ෂිත කාර්යයන්හි කාලරාමුව අනුව මේ දක්වා සුදුසු ව්‍යාපෘති තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා අපේක්ෂිත කාර්යයන්හි කාලරාමුව අනුව සුදුසු ව්‍යාපෘති තෝරා ගැනීමට කටයුතු කර

	සඳහා 2018 සැප්තැම්බර් 18 දිනැති අංක අමප/18/2083/803/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව සමාගම රාජ්‍ය පෞද්ගලික කොටස් හිමි ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අභිලාෂයන් කැඳවීමට 2022 පෙබරවාරි 28 දින 2022/338/5117 අංක දරන තීරණය මඟින් අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි.අදාල ප්‍රතිසංවිධානය කිරීම සඳහා ඉදිරියට සිදුකිරීමට අපේක්ෂිත කාර්යයන්හි කාලරාමුව අනුව 2024 අප්‍රේල් 22 දින වනවිට සුදුසු ව්‍යාපෘති තෝරා ගතයුතු වුවත්, එම කටයුතු නිමකර නොතිබුණි.				නොතිබුණි.
29	ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් අනුබද්ධිත සමාගම් දෙකක් වන මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම 2012 වර්ෂයේදීද, ස්වභාවික සම්පත් කළමනාකරණ (පුද්) සමාගම 2019 වර්ෂයේදී ද ඈවර කිරීමට තීරණය කර තිබුණද, විගණිත දින වූ 2024 මැයි 31 වන විටද ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	2023	ඈවර කිරීමේ කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය.	ඈවර කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.	ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.
30	වාරිමාර්ග අමාත්‍යාංශයට	2023			

2018 වර්ෂයේදී අනුයුක්ත කර තිබූ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III පන්තියේ නිලධාරියෙකු වෙත අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන), අධ්‍යක්ෂ (තාක්ෂණික විගණන) වශයෙන් අමාත්‍යාංශයේ තනතුරු දෙකක්ද, ඒ යටතේ පවතින සමාගමක ප්‍රධාන විධායක නිලධාරි හා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු ලෙස සහ අමාත්‍යාංශය යටතේ වූ ව්‍යාපෘතියක ව්‍යාපෘති අධ්‍යක්ෂ වශයෙන් තනතුරු 4 ක වගකීම් පවරා තිබුණි.ඒ සඳහා වූ පහත සඳහන් අනුමැතීන් ඉදිරිපත් නොවුණි.				
(අ) වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තාක්ෂණික විගණන) තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා 2018 සැප්තැම්බර් 15 දින සිට පත්කර තිබුණද ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය විගණනය වෙත ඉදිරිපත් නොවීය.	2023	නිත්‍ය තනතුරට අමතරව රාජකාරී ඉටුකිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතුයි.	රාජකාරී ඉටු කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලබාගත් අනුමැතිය මේදක්වා විගණනයට ඉදිරිපත් නොවීය.	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ආ) කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි 2:3:2 වගන්තිය අනුව ව්‍යාපෘතියක, ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා පූර්ණකාලීන පදනම මත නිලධාරියෙකු පත් කළ යුතු වුවද ව්‍යාපෘතියේ	2023	කළමණාකරණ සේවා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතුයි.	ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා පූර්ණකාලීන පදනම මත නිලධාරියෙකු පත් කිරීමට මේදක්වා කටයුතු කර නොතිබුණි.	කළමණාකරණ සේවා චක්‍රලේඛ ප්‍රකාරව පූර්ණකාලීන පදනම මත නිලධාරියෙකු පත් කර නොතිබුණි

ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා 2020 සැප්තැම්බර් 29 දින සිට වැඩ බැලීමේ පදනම උක්ත නිලධාරියා පත්කර තිබුණි.				
(ඇ) අමාත්‍යාංශය යටතේ වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු සමාගමක් ලෙස මහවැලි උපදේශන කාර්යාංශය ස්ථාපනය කර තිබුණි. රජයේ සේවයේ තනතුරක සිටියදීම එවැනි ආයතනයක තනතුරක් දැරීම සඳහා ප්‍රතිපාදන නොමැති අතර රාජ්‍ය සේවා කොමිසම් සහා කාර්ය පටිපාටි රීති ප්‍රකාරව එවැනි ආයතනයක සේවයට රජයේ නිලධාරීයෙක් තාවකාලිකව හෝ ස්ථිරව හෝ රජයේ සේවයෙන් මුදාහැරිය යුතුවේ. කෙසේ නමුත් මෙම නිලධාරීයා රජයේ සේවයේ තනතුරක සිටියදීම මහවැලි උපදේශන කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධාරී හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස පත් කර තිබුණි.	2023	අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිසම් සහා කාර්ය පටිපාටි රීති ප්‍රකාරව කටයුතු කලයුතුයි	මෙම නිලධාරියාගේ පත්වීම අවලංගුකර වෙනත් සුදුසු නිලධාරියෙකු පත් කිරීමට මෙදක්වා කටයුතු කර නොතිබුණි.	අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිසම් සහා කාර්ය පටිපාටි රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.14 විදේශ කටයුතු අමාත්‍යාංශය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	අතිරික්තය (ඌනතාවය) රු.	මතය
2021	13,860,983,302	1,384,344,828	12,476,638,474	-	තත්ත්වාගණනය කළ
2022	14,522,566,386	2,188,056,214	12,334,510,172	-	තත්ත්වාගණනය කළ
2023	14,623,720,492	1,301,381,117	13,322,339,375	-	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	අංක 7002-0-0-35-13 දරන අග්‍රිම ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 50,970,216 ක් වූ අතර එය 2013 හා ඊට පෙර වර්ෂවලට අදාළ නොපියවූ අත්තිකාරම්වලින් සමන්විත වී තිබුණි.මෙම ශේෂය තුළ විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශගත වූ කාර්ය මණ්ඩලයට ලබාදෙන ලද භාවිතයට නොගන්නා නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු 103 කට අදාළ රු.32,474,452 ක් හා අතුරු අග්‍රිම රු.18,495,764 ක් පැවතුණි.	2021/2022/2023	නොපියවූ අත්තිකාරම් කඩිනමින් නිරවුල් කළ යුතුය.	අමාත්‍යාංශය අභ්‍යන්තරිකව කමිටු පත්කර පෙන්වා දී ඇති ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	අග්‍රිම නිරවුල් කර නැත.
2	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 ප්‍රකාරව නොපියවූ තත්කාර්ය අතුරු අග්‍රිම	2021/2022/2023	තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.	තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ.	අග්‍රිම නිරවුල් කර නැත.

	69 ක රු.18, 495,764 ක ශේෂයක් පැවතුණි. මෙම තත්කාර්ය අතුරු අග්‍රිම ශේෂය තුළ රු.1,585,560 ක් වර්ෂ 20 ක් ඉක්මවා තිබුණු අතර රු.16,910,769 ක් වර්ෂ 10 ක සිට වර්ෂ 20ක් දක්වා අතර කාල පරාසයකට අයත්ව තිබුණි.				
3	අංක 7002-0-0-35-23 දරන අග්‍රිම ගිණුමට අදාළව 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.959,519,202 ක් වූ අග්‍රිම ගිණුම් ශේෂය තුළ රු.56,629,614 ක් දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබා තිබුණු තැන්පතු 134 කට අදාළ වී තිබුණි. එම වටිනාකමින් රු.2,486,516ක් වර්ෂ 20 ක් හා රු.10,177,716 ක් වර්ෂ 10 ක් ඉක්ම වූ තැන්පතු වටිනාකම් වී තිබූ අතර රු.27,754,083 ක් වර්ෂ 05 ත් වර්ෂ 10 ත් අතර කාල පරාසයකට අයත්ව තිබුණි.	2021/2022/ 2023	නොපියවූ අග්‍රිම පියවීමට කටයුතු කළ යුතු අතර විදේශ දූත මණ්ඩල නිලධාරීන්ගේ සේවය අවසන් වන අවස්ථාවේදී නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු අය කර ගැනීම කළ යුතුය.	පදිංචි වී නොමැති නිවාසවලට තබන ලද ආරක්ෂිත තැන්පතු අයකිරීමට අදාළව අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.	ආරක්ෂිත තැන්පතු අයකරගෙන අග්‍රිම නිරවුල් කර නැත.
4	අංක 7002-0-0-35-23 දරන අග්‍රිම ශේෂය තුළ වසා දමන ලද දූත මණ්ඩල තුනකට අදාළ නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු රු.9,199,873 ක් නිරවුල් කර නොතිබුණි.	2021/2022/ 2023	කඩිනමින් තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.	මෙම ශේෂ පිළිබඳව නිර්දේශ ලබාදීමට කමිටුවක් පත්කර ඇත.	තැන්පතු නිරවුල් කර නැත.

5	ලන්ඩන් දූත මණ්ඩලයට අදාළව තැන්පත් කර තිබූ ස්ටර්ලින් පවුම් 8786 ක් උපලබ්ධි වී නොතිබුණු අතර විදේශ දූත මණ්ඩල 05 ක 2016 සිට 2023 වර්ෂය දක්වා කාලයට අදාළ චෙක්පත් 10ක් හඳුනා නොගත් හර ලෙස පැවතුණි.	2022/ 2023	තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල් හා හඳුනා නොගත් හර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.	උපලබ්ධි වී නොතිබුණු මුදල් ඉදිරියේ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	උපලබ්ධි නොවූ තැන්පත් මුදල් හා හඳුනා නොගත් හර නිරවුල් කර නැත.
6	ඕස්ට්‍රේලියාව, ස්වීඩනය හා කෙන්යාව යන රටවල විදේශ දූත මණ්ඩලවල ශ්‍රී ලංකා රජයට අයත් ගොඩනැගිලි පැවතියද ඒවා නඩත්තු නොකර සමාලෝචිත වර්ෂයේ නිල නිවාස කුලී වශයෙන් රු.173,537,875ක් ගෙවා තිබුණි.	2021/20 22/ 2023	වත්කම් ප්‍රශස්ථ අන්දමින් නඩත්තු නොකිරීම සම්බන්ධයෙන් නිලධාරීන් වගකිව යුතුය.	මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට කමිටුවක් පත්කර ඇත.	ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම සිදුකර නැත. වත්කම් නඩත්තු නොකිරීමට අදාළ නිලධාරීන්ට එරෙහිව පියවර ගෙන නැත.
7	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය ප්‍රකාරව පත්කිරීමක් හෝ උසස් කිරීමක් කළ හැක්කේ අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරකට පමණි. එසේ වුවද, විදේශ සේවයේ අනුමත අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සංඛ්‍යාව 09 ක් වුවද, වැඩ බැලීම සඳහා පත්කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරු 08 දෙනෙක් ඇතුළුව තථ්‍ය ප්‍රමාණය 17 ක් විය. තවද වැඩබලන අතිරේක	2022/ 2023	වැඩබැලීම සඳහා පත් කිරීම් කිරීමේදී ආයතන සංග්‍රහය හා කාර්ය පරිපාටික රීති සංග්‍රහය අනුගමනය කළ යුතුය.	අදාළ පත්කිරීම් ස්ථාපිත කර ගැනීමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.	කාර්ය පරිපාටික රීති සංග්‍රහය අනුව කටයුතු කර නැත.

	ලේකම්වරු 05 දෙනෙකු පත්කිරීම සඳහා පත්කිරීම් බලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.				
8	විගණකාධිපති වාර්තාවල ඇතුළත් පහත සඳහන් වන්දි ඉල්ලීම් සම්බන්ධයෙන් 2024 මැයි 30 දිනය වන විටත් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. (i) සෞදි අරාබියේ රැකියාවක් සඳහා ගොස් තිබුණු පුද්ගලයෙකු 2012 ඔක්තෝබර් 24 දින අනතුරකට භාජනය වී පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීම. (ii) කුවේට් රාජ්‍යයෙහි ගෘහ සේවිකාවක් ලෙස රැකියාවක් සඳහා 2009 දෙසැම්බර් 19 දින විදේශ ගතවූ කාන්තාවක් 2012 ජනවාරි 29 දින මිය යාම. (iii) වර්ෂ 17ක පමණ කාලයක් කුවේට් ගෘහ සේවයේ යෙදී සිටි කාන්තාවක් අසනීප වී සුරක්ෂාගාරයට පැමිණීම හා ඒ තුළදී මියයාම.	2022/ 2023	තානාපති කාර්යාලයේ නිලධාරීන්ගේ වගකීම කාර්යක්ෂමව ඉටු කළ යුතුය.	වන්දි ඉල්ලීම් සිද්ධි පිළිබඳ අධ්‍යනය කර අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා අතිරේක ලේකම් (ප්‍රදූත) ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පිහිටුවා ඇති අතර වන්දි සිද්ධීන්වලට අදාළ ලිපිගොනු මුල සිට අධ්‍යනය කර අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට කටයුතු කෙරෙමින් පවතින බව.	නිර්දේශය පරිදි වන්දි ඉල්ලීම් සඳහා ඉදිරි පියවර ගෙන නැත.

	(iv) පෙද්දාහීදි 2011 වර්ෂයේදී මරණයට පත්වූ පුද්ගලයෙකු සියදිවි නසා ගැනීමක්ද මරණයට පත් වීමක් ද යන්න සනාථ කර ගැනීම හා වන්දි ලබා ගැනීම.				
9	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි156(i) (අ) ප්‍රකාරව සේවයෙන් ඉවත්ව ගොස් සිටි නිලධාරිනියකට වැටුප් වශයෙන් රු.558,471ක් වැඩිපුර ගෙවීම් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	වැඩිපුර ගෙවීම් ප්‍රතිපූරණය කර ගැනිමට කටයුතු කළ යුතුය.	නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අවශ්‍ය ලේඛන නීති අංශය වෙත යොමු කර ඇත.	වැඩිපුර ගෙවූ මුදල අයකරගෙන නොමැත.
10	2010 හා ඊට පෙර වර්ෂයන්හිදී කටාර් රාජ්‍යයෙහි සේවා නියුක්තිය සඳහා ගොස්, අනතුරු හේතුවෙන් මිය ගිය ශ්‍රී ලාංකිකයන් 06 දෙනෙකුගේ වන්දි ලබා ගැනීම් ලිපිගොනු කාල ප්‍රමාදයන් හේතුවෙන් වසා දැමීමට කම්කරු අධිකරණය තීරණය කර තිබුණි. මෙහිදි ඉල්ලුම්කරුවන් නිසි පරිදි ලියවිලි කාලීනව ඉදිරිපත් කර තිබියදී කටාර් තානාපති කාර්යාලයේ නිලධාරීන් නියමිත කාලයේදි වන්දි ලබාගැනීමට වගකිව යුතු අන්දමින් කටයුතු සිදු නොකිරීම මත වන්දි	2023	නිලධාරීන්ගේ වගකීම කාර්යක්ෂමව ඉටු කළ යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග ඉදිරිපත් කර නොමැත.	වගකීම් විරහිතව ක්‍රියා කළ නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නැත.

	හා දීමනා ලබාගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.				
11	පත් කිරීම් බලධරයාගේ අනුමැතිය නොමැතිව පත්කරන ලද වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරු 08 දෙනෙකු වෙනුවෙන් නිල වාහන වෙන් කර තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.3,650,191ක් ඉන්ධන දීමනා වශයෙන් ගෙවා තිබුණි.	2023	නිල වශයෙන් හිමි නොවන දීමනා නොගෙවිය යුතු අතර එසේ ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශය පරිදි වැඩිපුර ගෙවීම් අයකර ගෙන නැත.

3.15 රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	8,466,873,679	133,937,274	8,332,936,405	-	තත්ත්වාගණනය කළ
2022	16,260,864,783	308,204,245	15,952,660,538	-	තත්ත්වාගණනය කළ
2023	16,463,873,188	201,396,039	16,262,477,149	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	විගණන වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	රජයේ නිවාසයක් වෙන්කර දියහැක්කේ රජයේ නිළධාරියෙකුට පමණි. එසේ වුවත් සමුළු නිවාස 2 ක් 1983 හා 2001 වර්ෂවලදී පිළිවෙලින් රු.275 ක සහ රු.1,000 ක මාසික කුලියකට ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයට ලබා දී තිබුණි.	2021	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	වෙළඳපල කුලිය රු.42,000 බැගින් තක්සේරු කර ඇත. එම කුලිය ගෙවන ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයට දැනුම් දී ඇති බව.	නිර්දේශය ක්‍රියාත්මක කර නැත.
2	කැප්පෙටිපොල මාවතේ සමුළු නිවාස කඩා ඉවත් කර නව නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේදී රු.මිලියන 322ක් ලබාදී තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. එසේ කඩා ඉවත් කිරීමට යෝජිතව තිබුණු කැප්පෙටිපොල මාවතේ සමුළු නිවාස 11ක් 2009 වර්ෂයේ සිට මේ දක්වාම කුලී අයකර ගැනීමකින් තොරව තාවකාලික පදනම මත	2022	නව රජයේ නිවාස සංකීර්ණය ඉදිකිරීමට කටයුතු කළ යුතුය. සියලු නිවාස පරිපාලනය අමාත්‍යාංශය සතු විය යුතුය.	2009 වර්ෂයේ සිට ජනාධිපති කාර්යාලයේ ආරක්ෂක අංශ සඳහා වෙන් කළ නිවාසවල පදිංචිකරුවන් හඳුනා ගැනීමෙන් අනතුරුව මාසික කුලිය අය කිරීමට කටයුතු කරන බව හා වර්තමාන තත්ත්වය මත එම නිවාස අවශ්‍ය වන්නේද යන්න විමසා ඇති බව.	නිර්දේශය ක්‍රියාත්මක කර නැත.

	ජනාධිපති ආරක්ෂක අංශ නිලධාරීන්ට ලබාදී තිබුණු අතර මෙම නිවාසවල පරිපාලනය අමාත්‍යාංශයේ පාලනයෙන් බැහැරව පැවතුණි.				
3	20.02.01.01 ආදායම් සංකේතාංකයට අයත් සම්පූර්ණ ගොඩනැගිලි මොනවාද යන්න හඳුනාගැනීම සඳහා දත්ත පද්ධතිය සකස් කිරීම 2021 වර්ෂයේදී ආරම්භ කර තිබුණ ද 2024 මැයි 30 දක්වා සියළු ගොඩනැගිලි දත්ත පද්ධතියට ඇතුළත් කිරීම අවසන් කර නොතිබුණි.	2023	දත්ත පද්ධතිය කඩිනමින් සකස්කර අදාළ ආදායම් සංකේතාංකය යටතේ ගොඩනැගිලි කුලී, රාජ්‍ය අදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය.	මෙම අමාත්‍යාංශයට අයත් ගොඩනැගිලි වර්ග කර හඳුනාගත හැකි පරිදි දත්ත පද්ධතිය සකසා හිඟ නිවාස කුලී දත්ත පද්ධතියට ඇතුළත් කරමින් පවතී.	අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අදාල ගොඩනැගිලි දත්ත පද්ධතියට ඇතුළත් කර නැත.
4	ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් හිඟ ආදායම් එකතු කර ගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති හිඟ ආදායම් තව තවත් එකතුවීම වැළැක්වීම සඳහා ක්ෂණිකව පියවර ගතයුතු වුවත්, ආයතන 32 කින් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ගොඩනැගිලි හිඟ කුලී ආදායම රු.332,724,629ක් වී තිබුණු අතර ඉන් රු.198,688,576ක් 2020 දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂවල සිට අයවිය යුතුව පැවැතුණි.	2022/ 2023	හිඟ නිවාස කුලි අයකර ගැනීමට හා හිඟකුලී තව තවත් එකතු වීම වැලැක්වීම සඳහා ක්ෂණිකව පියවර ගතයුතුය.	ලිපි මඟින් දැනුවත් කිරීම, අදාළ ආයතනවල සහභාගිත්වය මඟින් හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කිරිම සහ දුරකතන මඟින් නිරන්තරයෙන් පසුවිපරම් කරන බව.	2024.06.30 දිනට රු.83,910,102 ක් අයකර ගෙන ඇත.
5	තනතුරු සඳහා නිවාස ඉදිකර, උපලේඛනගත	2023	ආයතන සංග්‍රහයේ විධිවිධාන	නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන	නිර්දේශය ක්‍රියාත්මක කර

	කළ හැකිය. 2003 ඔක්තෝබර් 17 දිනැති අංක 11/2003 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් මෙම අමාත්‍යාංශය සතුව උපලේඛනගත නිවාස නොමැති බවට දක්වා තිබුණි. එසේ වුවද ආයතන සංග්‍රහයට හා මෙම චක්‍රලේඛයට පටහැනිව අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පොදු නිවාස 06ක් හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් පොදු නිවාස 16ක් උපලේඛනගත කර ලබාදී තිබුණි.		අනුගමනය කළ යුතු අතර අමාත්‍යාංශයේ උපලේඛනගත නිවාස ඇති කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය.	නොමැත.	නැත.
6	දිගින් දිගටම අමාත්‍ය කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණයේදී ඌනතා ලෙස හඳුනාගෙන තිබුණු වත්කම් අයිතම් ඒකක 257ක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් 2024.06.20 දින පත්කර ඇති බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නැත.
7	සීමා නීර්ණය සඳහා පළමු අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදී වසර දෙකක් හා දෙවන අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදී වසරක් ගතවී තිබුණි. එහෙත් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය සහිත සවිස්තරාත්මක අවසන් වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත 2024 මැයි 30 දිනවන විටත් ඉදිරිපත් කර	2023	සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව කඩිනමින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.	දිස්ත්‍රික්ක 16ක සම්බන්ධීකරණ කමිටු නිර්දේශයන් ලබාදී ඇත. වාර්තා ඉදිරිපත් නොකරන ලද අනෙකුත් දිස්ත්‍රික්කයන් වෙත එම වාර්තා කඩිනමින් ඉදිරිපත් කරන ලෙස ලිපි යොමුකර ඇති බව.	නිර්දේශය ක්‍රියාත්මක කර නැත.

නොතිබුණි.

8 **ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය**

(i)	සමාලෝචිත වර්ෂයේ සලසාගෙන තිබූ රු. මිලියන 1,500 ක ප්‍රතිපාදනයෙන් රු. මිලියන 1,463 ක් ඉතිරිව පැවතුන අතර සැලැසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2017 වර්ෂයේ සිටම දිගින් දිගට ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.	2022/ 2023	සලසාගත් ප්‍රතිපාදන සැලසුම් සහගතව අදාළ කාර්යය සඳහා උපයෝජනය කළ යුතුය.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පවතී.	ව්‍යාපෘතිය මන්දගාමීව ක්‍රියාත්මක කරමින් පවතී.
(ii)	උක්ත ව්‍යාපෘතියට අදාළව ප්‍රචාරණ හා සන්නිවේදන අවශ්‍යතා සපුරා ගැනීමේ කාර්යය වැට් රහිතව රු.25,762,474කට ප්‍රචාරක ආයතනයකට පවරා තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුමගනය කළ යුතුය.	කෙටුම්පත් කරන ලද ගිවිසුම අදාළ ආයතනය වෙත මේ වන විට යොමුකර ඇති බව	ගිවිසුම් අත්සන් කර නැත.

	(iii) තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (1) වගන්තිය ප්‍රකාරව පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂිතයක් මත කොන්ත්‍රාත් මුදලින් සියයට 20ක උපරිමයක් දක්වා අත්තිකාරම් ගෙවිය හැකි වුවත්, ගෙවීමේ සුරක්ෂිතයක් ඉදිරිපත් නොකර තිබියදීත් ගිවිසුම් මුදලින් සියයට 50 ක අත්තිකාරම් ලෙස රු.13,911,736ක් වැට් සහිතව එම ප්‍රචාරණ ආයතනයට ගෙවා තිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුමගනය කළ යුතුය.	සැලසිනේ ආයතනයට ලබාදී ඇති 50%ක අත්තිකාරම් මුදලට සමානුපාතික කාර්ය ප්‍රමාණයකට අදාල නිමවුම් මඟින්, අත්තිකාරම පියවා ගැනීමට කටයුතු කරමින් පවතින බව.	අත්තිකාරම් මුදල පියවා නැත.
9	**ගාල්ල දිස්ත්‍රික්කයේ ආසන 2000ක ශ්‍රවනාගාරයක් ඉදිකිරීම**				
	(i) මේ සඳහා 2019 – 2020 කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 2,700 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද 2023 ජුනි 14 දින වන විට රු. මිලියන 718.6 ක් වැයකර ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි.	2023	දරන ලද වියදම නිෂ්කාර්ය වීමට ඉඩ නොහැර ශ්‍රවණාගාරය ඉදිකිරීමේ අරමුණ ඉටුකර ගත යුතුය.	කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීම හා ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කිරීම.	වියදම නිශ්කාර්ය වී ඇත.
	(ii) උක්ත ශ්‍රවණාගාරය ඉදිකිරීම සම්බන්ධව	2023	කාර්යසාධන බැඳුම්කරයේ හා	අත්තිකාරම් මුදලින් අයකර නොගත් ශේෂය	බැඳුම්කරවල කාලය දීර්ඝ

	2022 පෙබරවාරි 15 දින කල් ඉකුත්වී තිබුණු රු.132,843,884 ක් වූ කාර්යසාධන බැඳුම්කරය දින දීර්ඝ කර ගැනීමට හෝ මුදල් කරගැනීමට කටයුතු කර නොතිබුණු අතර ආපසු අයකර නොගත් අත්තිකාරම් මුදල රු.475,358,225ක් විය.		අත්තිකාරම් බැඳුම්කරයේ දින දීර්ඝ කරගත යුතුය.	සඳහා බැංකු ඇපකරය වෙනුවට ආයතනික ඇපකරයක් ඉදිරිපත් කිරීමට කරන ලද ඉල්ලීමට ලේකම් තුමා විසින් එකඟතාවය ලබාදී ඇති බව හා කොන්ත්‍රාත්කරු විසින් එවන ලද ආයතනික ඇපකරය අමාත්‍යාංශ නීති නිලධාරීගේ නිර්දේශයට යොමුකර ඇති බව.	කිරීමක් සිදු කර නැත.
10	පළාත් සභා සහ පළාත් පාලන අංශය යටතේ ලියාපදිංචි කර තිබූ එහෙත් වාහන ලැයිස්තුවට ඇතුළත්ව නොතිබූ හා භෞතිකව නොපවතින වාහන 04ක් කවර ආයතනයක් භාරයේ පවතීද යන්න නිශ්චය කර ගැනීමට නොහැකි වී තිබුණි.	2023	වත්කම්වල අයිතිය හා පැවැත්ම තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.	එක් වාහනයක් ගලෙන්බිඳුනු වැව ප්‍රාදේශීය සභාවේ ඇති බව.	වාහන 03ක පැවැත්ම තහවුරු කරගෙන නැත.

3.16 ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	303,530,516	114,407,540	189,122,976	-	තත්ත්වාගණනය කළ
2022	194,330,940,390	5,282,596,057	189,048,344,333	-	තත්ත්වාගණනය කළ
2023	461,976,102,641	873,371,208	461,102,731,433	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණන ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ප්‍රවාහන අංශය සතු මෝටර් රථ වාහන 15 ක් මේ වන විට වෙනත් රාජ්‍ය ආයතන විසින් භෞතිකව පරිහරණය කරනු ලැබුවද, මේ දක්වා එම වාහන විධිමත්ව පවරා දීමට හෝ නැවත ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. එහි ගිණුම්ගත වටිනාකම රු.මිලියන 33.7 ක් වූ වාහන 08 ක් හා තවදුරටත් ගිණුම්ගත නොකළ වාහන 07 ක් ඇතුළත් විය. මේ හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ වත්කම් ගිණුමේ නිවැරදිතාවයද, විගණනයට තහවුරු නොවුණි.	2023	සන්තකය විධිමත්ව පවරා දී ඇති වාහනවල අයිතිය විධිමත්ව පවරා දිය යුතුය. ඒ අනුව වත්කම් ලේඛන කාලීනව යාවත්කාලීන කළ යුතුය.	වෙනත් ආයතන විසින් පරිහරණය කරන වාහන අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලෙස දැනුම් දී ඇත.	අයිතිය විධිමත්ව පවරා නොදුන් වාහන තවදුරටත් පැවතුණි.

2	විධිමත්ව අපහරණය කළ බවට සාක්ෂි විගණනයට අනාවරණය නොවුණු අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති කාර් රථ 10 ක්, කැබ් රථ 10 ක්, ජීප් රථ 02 ක්, මෝටර් බයිසිකල් 02 ක් හා ලොරි රථයක් වර්තමානයේ භාවිතාකරනු ලබන පාර්ශව පිළිබද අනාවරණය කර ගැනීමට නොහැකිව පැවතුණි. ප්‍රවාහන අංශය විසින් මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර මෙම වාහන 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ වාහන ලැයිස්තුවට හා වත්කම් ගිණුමට ඇතුළත්ව නොතිබීම හේතුවෙන් 2023 වර්ෂයේ ගිණුම්වල ඇතුළත් වත්කම්වල වටිනාකම ඌණ ගණනය වී තිබුණි.	2023	අස්ථාන ගත වූ වාහන සම්බන්ධව ජාතික විගණන පනතේ 38(1)(ඌ) වගන්තිය අනුව නීතිය බලාත්මක කිරීමට නියෝජිත ආයතන වෙත පැමිණිල්ලක් කළ යුතුය.	කමිටුවක් පත් කර විමර්ශනයක් සිදු කර ඇත.	භාවිතාකරනු ලබන පාර්ශව පිළිබද අනාවරණය කර ගැනීමට නොහැකිවූ වාහන තවදුරටත් පැවතුණි.
3	2016 - 2023 වර්ෂ 08 ක් දක්වා සී/ස අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්) සමාගමේ සිදු වූ සියලු ගනුදෙනු තහවුරු කිරීමට අදාළ මූල්‍ය ප්‍රකාශන හා කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.	2023	සමාගමේ මූල්‍ය ප්‍රකාශන වහාම පිළියෙල කර අනුමත කල යුතුය. වගකීම් පැහැර හැර ඇති නිලධාරීන් හා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් හඳුනාගෙන ආයතන සංග්‍රහයේ II කොටස XLVIII	වැළැක්වීමේ ක්‍රියාමාර්ග විගණනයට අනාවරණය නොකෙරුණි.	මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණු අතර වගකීම් පැහැර හැර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

			පරිච්ඡේදයේ 29 වගන්තිය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.		
4	විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ප්‍රවාහන හා මාහාමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අධිවේගී මාර්ග, මහාමාර්ග හා පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 04 ක සිවිල් වැඩ සඳහා 2023 දෙසැම්බර් 31 දිනට ගෙවීම් හිඟහිට ඇති අතුරු ගෙවීම් වටිනාකම රු.මිලියන 280.37 ක් වූ අතර සිවිල් වැඩ හා ඉඩම් අත්පත්කර ගැනීම්වලට අදාලව ගෙවීම් යාවත්කාලීනව සිදු නොවීම නිසා 2023 දෙසැම්බර් 31 දිනට වූ අතිරේක බැඳීම් වටිනාකම රු.මිලියන 78.81 ක් විය.	2023	බැරකම් හා බැඳීම් නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කළ යුතුය.	හිඟහිට ඇති අතුරු ගෙවීම් කාලීනව නිරවුල් කිරීම මගින් අතිරේක බැඳීම් අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණි	බැරකම් හා බැඳීම් නිවැරදිව හඳුනාගැනීමට ඵලදායී වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.
5	2023 අයවැය යෝජනා අනුව මාර්ග නඩත්තු අරමුදලක් පිහිටුවීම සඳහා යෝජනා කර තිබුණු අතර එම අරමුදල පිහිටුවීම සඳහා 2023 අයවැය යෝජනා මගින් රු.මිලියන 100 ක් වෙන්කර තිබුණු බව සඳහන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් වාහන ආදායම් බලපත්‍ර මත බද්දක් අයකිරීම සඳහා සකස් කරන ලද පනත්	2023	රාජ්‍ය ප්‍රතිපත්ති නිශ්චිත කාලසීමාවන් තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තිය යටතේ වූ පද්ධති සමාලෝචනයේදී විශේෂ අවධානය යොමු කර ලිඛිත	පනත් කෙටුම්පත ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.	අයවැය යෝජනා මේ දක්වා ක්‍රියාත්මකව නොපැවතුණි.

	කෙටුම්පත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව සඳහන් කළද එම අරමුදල පිහිටුවීම මේ දක්වා සිදුවී නොතිබුණු අතර එමගින් අපේක්ෂිත අරමුණු ලබා කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.		උපදෙස් නිකුත් කළ යුතුය.		
6	**මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව**	2023			
(i)	විෂය භාර අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම සඳහා 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 6(1) වගන්තිය යටතේ මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාවක් පිහිටුවිය යුතු අතර, මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව නිල බලයෙන් පත්වන සාමාජිකයන් 15 ක ගෙන් ද, 6(1)(ආ) ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් 05 ක ගෙන් ද සමන්විත විය යුතු වුවද, කමිටුව සඳහා නිල බලයෙන් පත්වන සාමාජිකයන් දෙදෙනෙක් පත්කර නොතිබුණි.		පනත ක්‍රියාත්මක දින සිට උපදේශක සභා පිහිටුවීමකින් තොරව පනතේ 6(2) වගන්තිය යටතේ කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කර ලබාදෙන උපදෙස් අනුව කටයුතු කළ යුතුය.	උක්ත උපදේශක සභාව සඳහා පත්කළ යුතු සාමාජික තනතුරු 04 ක් සඳහා පුද්ගලයන් නම් කර ඇත.	පනතේ විධිවිධාන ප්‍රකාරව උපදේශක සභාව ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.
(ii)	ඉහත පරිදි පත්කළ සාමාජිකයන් කැඳවා පනතේ 6(2) යටතේ පැවරී ඇති කාර්යයන් ඉටුකිරීමට එහි සභාපති ලෙස නිල බලයෙන් වගකීම පැවරී ඇති	2023	පනතේ විධිවිධාන නොසලකා කටයුතු කිරීම සම්බන්ධයෙන් විනයානුකූල කටයුතු කිරීම සඳහා ආයතන	-	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	ලේකම්වරයා කටයුතු කර නොතිබුණු අතර එම කාර්යයන් සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත උපදෙස් ලබාදී නොතිබුණි.		සංග්‍රහයේ II කොටස XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට අදාල විනය බලධාරීන් වෙත වාර්තා කළ යුතුය.		
7	**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය** 2023 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුව විසින් රු.මිලියන 1,551.36 කට සමාන එ.ජ.ඩො.මිලියන 8.52 ක් ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබුණු අතර එම මුදලින් සියයට 95 ක් වූ රු.මිලියන 1,469.05 ක් ශක්‍යතා අධ්‍යයන සහ සවිස්තරාත්මක සැලසුම් සඳහා වන උපදේශන සේවා වෙනුවෙන් වැය කර තිබුණි. 2021 මාර්තු මාසයේදී මෙම ව්‍යාපෘතියට අදාල ශක්‍යතා අධ්‍යයන සහ සවිස්තරාත්මක සැලසුම් වාර්තා සකස් කර රේඛීය අමාත්‍යාංශය වෙත භාර දී තිබුණු අතර වර්ෂ 2 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද දුම්රිය පද්ධතිය සංවර්ධනය කිරීමේ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා එම වාර්තා භාවිතා කිරීම අවම මට්ටමක තිබුණි.	2023, 2022	ශක්‍යතා අධ්‍යයන සිදුකර ඇති ව්‍යාපෘති රාජ්‍ය ආයෝජන වැඩසටහනට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය.	ප්‍රමාණවත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට තොරතුරු ඉදිරිපත් වී නැත.	අතරමග ඇණහිට ඇති ව්‍යාපෘති රාජ්‍ය ආයෝජන වැඩසටහනට නැවත ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

8	**කුරුණෑගල හබරණ දුම්රිය මාර්ගය** 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ඉඩම් අත්පත් කර ගැනීමේ වියදම් ලෙස රු.මිලියන 349.06 ක මුදලක් ඇතුළුව සමස්ථ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 568 ක මුළු වියදමක් දරා තිබුණ ද, මෙම ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂය වන විට ආයෝජකයන් හෝ අරමුදල් සපයා ගනු ලබන මාර්ගයක් හඳුනාගෙන නොතිබුණි. තවද, ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක නොකිරීමට රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම හේතුවෙන් මෙතෙක් දරන ලද මුළු මුදල නිශ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.	2022	ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම අරමුදල් සම්පාදන මාර්ග නිශ්චය කළ යුතු බව.	ප්‍රමාණවත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට තොරතුරු ඉදිරිපත් වී නැත.	අරමුදල් සම්පාදන මාර්ග පූර්ව නිශ්චය කරගැනීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.
9 (i)	**ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන** අත්හැර දැමූ කොන්ත්‍රාත් පැකේජ 12 අතරින් 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පැකේජ 6 ක ඉතිරි වැඩ මෙම වැඩසටහන හරහා ඉටු කිරීමට නැවත ප්‍රදානය කර තිබූ අතර මූලික කොන්ත්‍රාත් මිල සමඟ සන්සන්දනය කිරීමේදී නැවත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වල වටිනාකම රු.මිලියන	2021	වැඩසටහනේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කල යුතු අතර දුර්වල කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.	කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග වාර්තා වී නොමැත.	ව්‍යාපෘති අවසානය දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාක්මකව නොතිබුණි.

	4,808.8 කින් වැඩි වී තිබුණි. එබැවින් දූර්වල ව්‍යාපෘති කළමනාකරණය හේතුවෙන් රජයට අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.				
10	**දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 සහ 2.6 උප වගන්තිවලට අනුව ප්‍රසම්පාදන කමිටුව සහ තාක්‍ෂණික ඇගයීම් කමිටුව විසින් ඉංජිනේරු ඇස්තමේන්තුව, ලංසු ලේඛන සහ ප්‍රමාණ පත්‍ර නිසි ලෙස ඇගයීම සිදුකළ යුතු වුවත්, ඉහත මාර්ගෝපදේශවලට පටහැනිව ඉංජිනේරු ඇස්තමේන්තු, ලංසු ලේඛන සහ ප්‍රමාණ පත්‍රවල අයිතමයන් වැරදි අර්ථකතනයන් සිදුකිරීම සහ අනුපාත විෂමතා හේතුවෙන්, කොන්ත්‍රාත් පැකේජ 02කට අදාළව 2021 දෙසැම්බර් 31 දින වන විට වැඩසටහනට රු.මිලියන 48.2 ක පාඩුවක් දැරීමට සිදුව තිබුණි.	2021	වැඩසටහන සඳහා සිදු වී ඇති අලාභය අයකරවා ගැනීමට කටයුතු කළ යුතුය.	ප්‍රමාණවත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට තොරතුරු ඉදිරිපත් වී නැත.	අලාභය අයකරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.
11	කොන්ත්‍රාත් කොන්දේසිවල උප වගන්ති 108.4 සහ 120.7 අනුව වැඩසටහන අවසානයේ සියලුම	2023	සේවායෝජකගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා ආර්ථිකමයභාවය සැලකිල්ලට ගෙන	ප්‍රමාණවත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට තොරතුරු ඉදිරිපත් වී නැත.	කොන්දේසි බලාත්මක කිරීමට පෙර තාක්ෂණි ඇගයීම් කමිටුව

	රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මිනින්දෝරු උපකරණ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දෙනු ලැබුවද, රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මිනින්දෝරු උපකරණ සඳහා පිළිවෙලින් රු.මිලියන 397.77 ක් හා රු.මිලියන 533.12 ක් එකවර ගෙවීමක් ලෙස ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන සහ දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන විසින් 2023 දෙසැම්බර් 31 දින වනවිට ගෙවා තිබුණි. මේ අනුව කොන්ත්‍රාත්කරුවන්ට හිතකර කොන්ත්‍රාත් කොන්දේසි අනවශ්‍ය ප්‍රතිලාභ ලබා දීමට හේතු වනු ඇති බවට නිරීක්ෂණය විය.		කොන්ත්‍රාත්කරුවන්ට අනිසි ප්‍රතිලාභ ලබා දීම වැළැක්වීම සඳහා ලංසු ලේඛණ සමාලෝචනය කිරීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් විශේෂ අවධානයක් යොමු කළ යුතුය.		විසින් සමාලෝචනයට ලක් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මකව නොතිබුණි.
12 (i)	**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - පොදු** ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ සේවා සැපයුම් ප්‍රදේශ 04 ක් සඳහන් කර තිබුණද ගැටමාන ප්‍රදේශයේ දකුණු පසින් වර්ග මීටර 26,475 ක් සහ වම් පසින් වර්ග මීටර 33,373 ක ඉඩම් අත්පත් කර ගැනීම පමණක් කර තිබුණි. කෙසේ වුවද, දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ කිසිඳු අදියරක සේවා සැපයුම් ප්‍රදේශ ඉදිකිරීම සඳහා	2021	දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය සඳහා සේවා ප්‍රදේශයන් සකස්කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගත යුතු වීම.	ප්‍රමාණවත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට තොරතුරු ඉදිරිපත් වී නැත.	නව සේවා ප්‍රදේශයන් ඉදිකිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මකව නොතිබුණි.

	ඇස්තමේන්තු කර නොතිබුණු අතර වැඩ ප්‍රමාණ පත්‍රවල ප්‍රතිපාදනද සපයා නොතිබුණි. ඒ අනුව, දක්ෂිණ අධිවේගී මාර්ගයේ කිලෝමීටර 46 ස්ථානයෙන් පසු අධිවේගී මාර්ග භාවිතා කරන්නන් සඳහා කිසිදු සේවා සැපයුම් ප්‍රදේශයක් නොමැති බැවින් වැලිපැන්න සිට හම්බන්තොට දක්වා කි.මී. 176 ක් ගමන් කරන මගී ජනතාවට සේවා සැපයුම් සැලසීම ගැටළු සහගත තත්ත්වයක පැවතුණි.				
(ii)	2021 දෙසැම්බර් 31 දිනට පිළිවෙළින් ඉඩම් කැබලි 468 ක් සඳහා රු.මිලියන 21.94 ක් සහ ඉඩම් කැබලි 2113 ක් සඳහා ප්‍රමාද වූ පොලී රු.මිලියන 211.56 ක් තවදුරටත් ගෙවිය යුතු වේ. තවද, 2021 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ අංක 44 උප වගන්තිය ප්‍රකාරව මුළු ඉඩම් කැබලි 12,894 න් 3,593 ක් එනම් සියයට 27.87 ක අඩු ප්‍රතිශතයක් පමණක් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කර තිබුණි.	2021	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය.	ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බාධාවක් නොවන පරිදි සිදුකිරීමට අදාල නිර්ණායකයන් හා වගකීම් නිශ්චය කොට පාලන පද්ධතීන් ප්‍රමාණවත් පරිදි හඳුන්වා දී නොමැත.	ඉඩම් අත්පත් කර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලියාපදිංචි කර වන්දි ගෙවීම් තවදුරටත් අවසන් කර නොමැත.
13 (i)	**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - අදියර-01**	2021	චක්‍රලේඛප්‍රකාරව වාහන ආනයන කටයුතු කළ යුතු	කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සිදු කිරීමේදී නිරීක්ෂණ මඟින් දුර්වලතා	ඉදිරියේදී මෙවැනි

	සේවායෝජකයාගේ පූර්ව අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්කරු වාහන ආනයනය කර තිබීම හේතුවෙන් Toyota fortuna වාහන 04 ක්, Mercedes Benz වෑන් 1 ක් සහ නිලධාරීන්ගේ ප්‍රවාහනය සඳහා Pickup රථ 10 ක් සඳහා රේගු තීරුබදු සහනය සඳහා කොන්ත්‍රාත්කරුට ඇති අයිතිය ව්‍යාපෘතිය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වෙතත්, Toyota fortuna වාහන 02 ක් සහ කොන්ත්‍රාත්කරු වෙත ලබාදී තිබුණු Pickup රථ 10 ක් සඳහා රු.මිලියන 91.74 ක තීරුබදු පසුව ප්‍රතිපූරණය කිරීමට ව්‍යාපෘතියට සිදුවූ අතර 2018 අප්‍රේල් 23 දින ආරවුල් විනිශ්චය මණ්ඩලයේ තීරණයක් මත ප්‍රමාද වූ ගෙවීම සඳහා පොලී වශයෙන් රු.මිලියන 27.55 ක් ද ගෙවා තිබුණි. ආරවුල් විනිශ්චය මණ්ඩලයේ තීරණය කොන්ත්‍රාත්කරුට වාසිදායක ලෙස ගෙන තිබීම හේතුවෙන් ව්‍යාපෘතියට රු. මිලියන 119.3 ක අමතර වියදමක් දරා තිබුණි.		අතර කළමනාකරණ තීරණ කාලීනව ගැනීමෙන් ප්‍රමාද වූ ගෙවීම සඳහා පොලී වැනි අමතර වියදම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.	පෙන්වා දී ඇති කරුණු පිළිබඳ කටයුතු සම්බන්ධයෙන් අදාල නිර්ණායකයන් හා වගකීම් නිශ්චය කොට පාලන පද්ධතීන් ප්‍රමාණවත් පරිදි හඳුන්වා දී නොමැත.	සිදුනොවීමට අවශ්‍ය පාලනයන් ස්ථාපිත කර නොතිබුණි.
(ii)	කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 20.6	2021	ආරවුල් කඩිනමින් බේරුම්කරණය කර වැඩ නිම	කොන්ත්‍රාත් පරිපාලනයේදී නිරීක්ෂණ මඟින්	කොන්ත්‍රාත් විශේෂ කොන්දේසි

	උප වගන්තිය ප්‍රකාරව, බේරුම්කරණය කොන්ත්‍රාත් වැඩ නිම කිරීමට පෙර හෝ පසුව ආරම්භ කළ හැකි වුවද, අතෘප්තිය පිළිබඳ නිවේදනය නිකුත් කිරීමෙන් පසු බේරුම්කරණය ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත් විශේෂ කොන්දේසිවලද නිශ්චිත කාල සීමාවක් සඳහන් කර නොතිබුණි. එබැවින් රු.මිලියන 3,066.7 ක ආරවුල් හිමිකම් පෑම් 6 ක් අතෘප්තිය සම්බන්ධයෙන් නිවේදනය නිකුත් කිරීමෙන් පසු බේරුම්කරණය සඳහා තවදුරටත් විවෘතව පවතින අතර ව්‍යාපෘතියේ දෝෂ නිවේදන කාලය අවසන් වී මාස 14ක් ඉකුත් වී ඇතත් කොන්ත්‍රාත්කරු සඳහා හිමිකම අවසන් කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරු වැඩ නිම කිරීමේ ලිපිය 2021 දෙසැම්බර් 31 දක්වා ද නිකුත් කර නොතිබුණි.		කිරීමේ ලිපිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.	පෙන්වා දී ඇති කරුණු පිළිබඳ අදාල නිර්ණායකයන් හා වගකීම් නිශ්චය කොට පාලන පද්ධතීන් ප්‍රමාණවත් පරිදි හඳුන්වා දී නොමැත.	විධිමත් සමාලෝචනයකින් පසු ඇතුලත් කිරීමට ඵලදායක වැඩපිළිවෙලක් ක්‍රියාත්මකව නොතිබුණි.
14	**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - අදියර-04** කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 20.6 උප වගන්තිය අනුව ආරවුල් බේරුම්කරණයක් කොන්ත්‍රාත් වැඩ නිම	2021	අතෘප්තිය පිළිබඳ දැනුම්දීමක් නිකුත් කිරීමෙන් පසු බේරුම්කරණය ආරම්භ කිරීම සඳහා නිශ්චිත කාල සීමාවක් විශේෂිත කොන්දේසිවලට	කොන්ත්‍රාත් පරිපාලනයේදී නිරීක්ෂණ මඟින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ අදාල නිර්ණායකයන් හා වගකීම් නිශ්චය කොට පාලන පද්ධතීන් ප්‍රමාණවත් පරිදි හඳුන්වා	කොන්ත්‍රාත් විශේෂ කොන්දේසි විධිමත් සමාලෝචනයකින් පසු ඇතුලත් කිරීමට ඵලදායක වැඩපිළිවෙලක්

	කිරීමට පෙර හෝ පසුව ආරම්භ කළ හැකි වුවද, අත්‍යෘප්තිය පිළිබඳ නිවේදනය නිකුත් කිරීමෙන් පසු බේරුම්කරණය ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත්තු විශේෂ කොන්දේසිවල පවා නිශ්චිත කාල සීමාවක් නියම කර නොතිබුණි. එබැවින්, අත්‍යෘප්තිකර නිවේදන නිකුත් කිරීමෙන් පසු බේරුම්කරණය සඳහා රු.මිලියන 509.05 ක ආරවුල් හිමිකම් පෑම් 3 ක් තවමත් විවෘතව පවතින අතර ව්‍යාපෘතියේ දෝෂ දැනුම්දීමේ කාලසීමාව අවසන් වී වසර 2ක් ඉකුත්වීමෙන් පසුව පවා කොන්ත්‍රාත්කරුගේ හිමිකම තීරණය කිරීමට නොහැකි වී තිබුණි. එබැවින්, කොන්ත්‍රාත්කරු විසින් 2021 දෙසැම්බර් 31 දින දක්වා දින දක්වා කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවල 14.12 උප වගන්තියට අනුව වැඩ නිම කිරීමේ ලිපිය නිකුත් කර නොතිබුණි.		ඇතුළත් කළ යුතුය.	දී නොමැත.	ක්‍රියාත්මකව නොතිබුණි.
15 (i)	**මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන වැඩ සඳහා දේශීය බැංකු මඟින් ණය ලබා ගැනීම** 2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මාර්ග	2022	ව්‍යාපෘති සඳහා නිසි ශක්‍යතා අධ්‍යයනයකින් හා පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් අනතුරුව ක්‍රියාත්මක කලයුතු ව්‍යාපෘති	නිරීක්ෂණ මඟින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ කටයුතු සම්බන්ධයෙන් අදාල නිර්ණායකයන් හා වගකීම් නිශ්චය කොට පාලන පද්ධතීන් ප්‍රමාණවත් පරිදි හඳුන්වා	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

සංවර්ධන අධිකාරිය විසින් දේශීය බැංකු මඟින් රු. මිලියන 408,541.01 සහ එ.ජ.ඩො. මිලියන 44.72 ක් වටිනා ණය ගිවිසුම්වලට එළඹ තිබුණි. මෙම ණය මුදල් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය I හා II, කොළඹ කටුනායක අධිවේගී මාර්ගය, පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය III සහ මාර්ග කිලෝමීටර් 100,000 ක ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘති සඳහා භාවිතා කර තිබුණි. විගණනය වෙත ලබා දී ඇති තොරතුරු අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට දේශීය බැංකු මඟින් ලබාගත් ණයවලින් ආපසු ගෙවීමට ඇති ණය ප්‍රමාණය රු.මිලියන 356,059.32 ක් වී තිබුණු අතර වසර 05 ක කාලයක් තුළ දේශීය වාණිජ බැංකු වෙත ගෙවීමට සිදුවී තිබුණු පොලී ප්‍රමාණය රු.මිලියන 109,333.11 ක් විය. තවද, ණය ලබාගත් දේශීය බැංකු 07 ක් වෙත 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පොලිය, දඩ පොලිය සමඟ රු.මිලියන 37,668.72 ක් වූ අතර, හිඟව ඇති ණය වාරිකවල වටිනාකම රු.මිලියන 2,502.39 ක් විය.	හඳුනාගැනීම හා අවම පිරිවැයකින් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම කළමණාකරණ යේ වගකීම වන බව.	දී නොමැත.

(ii)	මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වසර 2 ½ ත් 4 ½ ත් අතර සහන කාලයක් මත පදනම්ව වසර 10 ත් වසර 18 ත් අතර කාලයක් තුළ ගෙවා අවසන් කිරීමේ පදනම මත දේශීය වාණිජ බැංකු 07 කින් අවස්ථාවන් 34 ක දී ලබාගෙන තිබුණු රු.මිලියන 408,541.01 කින් 2022 දෙසැම්බර් 31 දිනට තවදුරටත් ගෙවිය යුතුව තිබුණු රු.මිලියන 356,059.31 ක් වටිනා ණය, වාරික ගෙවීමේ කාලය තවදුරටත් දීර්ඝ කරමින් 2020 මාර්තු 13 දිනැති අංක MFE/ERD/14/CM/2020/065 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ණය ප්‍රතිව්‍යුහගත කර තිබුණි. ප්‍රතිව්‍යුහගතකරණයට අදාල උපදෙස් ලබා ගැනීම වෙනුවෙන් මහජන බැංකුව වෙත රු.මිලියන 10.80 ක උපදේශන ගාස්තුවක් ගෙවා තිබුණු අතර ණය ප්‍රතිව්‍යුහගත කිරීම නිසා වාර්ෂිකව වැඩි වූ පොලී අනුපාතය මත රු.මිලියන 400.74 ක අතිරේක පොලී මුදලක් ගෙවීමටද සිදුව තිබුණි.	2022	ව්‍යාපෘති සඳහා නිසි ශක්‍යතා අධ්‍යයනයකින් හා පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් අනතුරුව ක්‍රියාත්මක කලයුතු ව්‍යාපෘති හඳුනාගැනීම හා අවම පිරිවැයකින් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම කළමණාකරණයේ වගකීම වන බව.	ප්‍රමාණවත් වැළැක්වීමේ නිර්දේශ ක්‍රියාමාර්ගයන් ගෙන ක්‍රියාත්මක වී ඇති බවට තොරතුරු නොතිබුණි. ඉදිරිපත් වී නැත.
(iii)	දේශීය බැංකු මඟින් ලබාගත් ණය මුදල් සඳහා ණය පොලිය සහ	2022	ව්‍යාපෘති සඳහා නිසි ශක්‍යතා අධ්‍යයනයකින් හා	ප්‍රමාණවත් වැළැක්වීමේ නිර්දේශ ක්‍රියාමාර්ගයන් ගෙන ක්‍රියාත්මක වී ඇති බවට තොරතුරු නොතිබුණි.

වාරිකය ලෙස 2022 දෙසැම්බර් 31 දිනට හිඟව තිබුණු එම මුදල් පියවීම සඳහා භාණ්ඩාගාරයට ප්‍රතිපාදන ලබාදීමට නොහැකිවීම මත රු.මිලියන 36,671.62 ක භාණ්ඩාගාර බැඳුම්කර (Treasury Bonds) නිකුත් කර තිබුණි. තවද දේශීය බැංකු මඟින් ණය ලබා ගැනීමට අමතරව මාර්ග කි.මී. 100,000 යේ වැඩ සටහනට අදාළව මාර්ග ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් 36 දෙනෙකු වෙත ගෙවීමට තිබූ රු. මිලියන 32,217.89 ක් සඳහා ද 2022 දෙසැම්බර් 31 දින වන විට සියයට 20.0 සිට 22.5 ක දක්වා වූ පොළී අනුපාතයන් යටතේ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කර තිබුණි. මේ ආකාරයට රු. මිලියන 68,889.51 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම නිසා රජයට අමතර වියදමක් දැරීමට සිදුවන අතර එම වියදම ආසන්න වශයෙන් රු.මිලියන 15,155.69 ක් විය.	පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් අනතුරුව ක්‍රියාත්මක කලයුතු ව්‍යාපෘති හඳුනාගැනීම හා අවම පිරිවැයකින් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම කළමණාකරණ යේ වගකීම වන බව.	ඉදිරිපත් වී නැත.

16	**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 01**				
(i)	නීතිපතිවරයා විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතන ලද 2018 ඔක්තෝබර් 02 දිනැති සිය ලිපියෙන් විශේෂයෙන්ම කෙටුම්පත් ණය ගිවිසුමේ අංක 8.1 සහ 8.4 වගන්තිවල සඳහන් පිළිවෙලින් මුක්තිය සහ ණය ගිවිසුමේ විෂයෙහි බලාත්මක නීතිය යන වගන්ති සංශෝධනය කරන ලෙස ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, ණය දෙන නියෝජිතායතනය (EXIM බැංකුව) යෝජිත සංශෝධන පිළිගෙන නොතිබුණු අතර, යෝජනා කර ඇති පරිදි ගිවිසුම් කෙටුම්පතේ අදාල සංශෝධන සිදුකිරීමෙන් තොරව ගිවිසුමට එළඹ තිබුණි.	2021	ඉදිරි ණය ගිවිසුම්වලදී සඳහන් වන කොන්දේසි නිසි පරිදි සංශෝධනය කර ගත යුතුය.	ප්‍රමාණවත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට තොරතුරු ඉදිරිපත් වී නැත.	නිරීක්ෂණ මඟින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධ කොන්ත්‍රාත් කොන්දේසි සංශෝධනය කිරීමට කටයුතු කර නොමැත.
(ii)	රටේ පවත්නා ආර්ථික අර්බුදය හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් කොන්දේසි 16.1 වගන්තිය ප්‍රකාරව අන්තර් ගෙවීම් බිල්පත් ගෙවීම් ප්‍රමාද වීම මත ව්‍යාපෘතිය වෙත “Notice to Reducing Rate Work” ඉදිරිපත් කර තිබුණි. FIDIC කොන්දේසි 16.1 හා 8.4 පරිදි පැකේජ 01	2023	කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම මත සේවායෝජකට සිදුවන අතිරේක පිරිවැය වළක්වා ගැනීම සඳහා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.	කොන්ත්‍රාත්කරු විසින් 2022 ජුනි 23 දින කාර්යය අනුපාතය අඩු කිරීම සම්බන්ධයෙන් කාලය දීර්ඝ කිරීම සඳහා ඉංජිනේරුවරයාට නිවේදනයක් ලබා දී ඇත. දැනට පැකේජ 1 සඳහා 2024 ජුලි 06 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත.	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

සඳහා කාල දිගුවක් 2023 නොවැම්බර් 09 දක්වා ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. මෙහි දී FIDIC කොන්දේසි 8.3 ප්‍රකාරව සංශෝධිත වැඩ සැලැස්මක් ඉදිරිපත් කළ යුතු වුවත් එවැනි සංශෝධිත වැඩ සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. තවද, මෙම තත්ත්වය යටතේ කොන්ත්‍රාත්කරු විසින් මන්දගාමී ප්‍රගතියක් (Slow progress) යටතේ කොන්ත්‍රාත් කටයුතු පවත්වාගෙන යාම සිදු කරනු ලැබුවත් 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ ඉදිකිරීමේ හි ප්‍රගතියේ වර්ධනය සියයට 1.46 ක් බව නිරීක්ෂණය විය. ඉදිරියේ දී කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය හැර යාම හෝ ව්‍යාපෘතිය අවසන් කිරීමට අතිරේක කාලය එනම්, සම්පත් අක්‍රිය වීම (Idling of Recourse's) හා Reduced ratc of work හි දැරීමට සිදුවන වියදම් සම්බන්ධයෙන් නොයෙකුත් ඉල්ලීම් සිදු කිරීමේ (Claims) වැඩි වීම වළක්වා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය හා අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කොට විකල්ප ක්‍රියාමාර්ග ගතයුතු බව නිරීක්ෂණය කෙරේ.

	තවද, පැකේජ 01 හා පැකේජ 02 හි වැඩ බිම භාර දීම ප්‍රමාද වීම මත කොන්ත්‍රාත්කරු ඉල්ලා ඇති මුදල රු.මිලියන 2,598.76 ක් බව නිරීක්ෂණය විය.				
(iii)	2023 වර්ෂය තුළ ව්‍යාපෘතිය සඳහා ඉඩම් කැබලි 5,245 ක් අත්කරගෙන තිබුණ ද, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ මාර්ග සංවර්ධන අධිකාරියට හිමිකම් පවරා ගෙන තිබුණේ ඉන් ඉඩම් කැබලි 1,211 ක පමණි. 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රමාද පොලිය ලෙස රු.මිලියන 901.05 ක් ගෙවා තිබුණු අතර, තවදුරටත් ගෙවිය යුතු ප්‍රමාද පොලිය රු.මිලියන 220.45 ක් විය.	2023	ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත්කර ගැනීම හා වන්දි ගෙවීම සම්බන්ධයෙන් විධිමත් පරිදි ලේඛණගත තොරතුරු පවත්වා ගත යුතු අතර ඊට අදාල පටිපාටි සකස් කළ යුතුය. ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තිය යටතේ වූ පද්ධති සමාලෝචනයේදී මේ පිළිබඳ විශේෂ අවධානය යොමුකර සඵලදායී අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දිය යුතුය.	2024 සැප්තැම්බර් 30 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තියට අනුව ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි කර තිබුණේ ඉඩම් කැබලි 1,693 ක් බව විගණනයට දන්වා ඇත.	ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු විධිමත් පරිදි අවසන් කර නොමැත.
17	**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 02** මහා භාණ්ඩාගාරය හරහා ණය ලබාගැනීමේදී එවකට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟවී තිබුණු අයවැය පරතරය	2022	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතු බව.	ප්‍රමාණවත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට තොරතුරු ඉදිරිපත් වී නැත.	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

	අවම කිරීම යන කොන්දේසියට බලපෑමක් සිදුවන බැවින් සෘජුවම ණය ලබාගැනීමට මාර්ග සංවර්ධන අධිකාරියට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 124,221.35 ක ණය මුදලක් විවිධ අවස්ථාවලදී දේශීය බැංකු කිහිපයකින් ලබාගෙන තිබුණි. නමුත් අදාල ණය ගෙවීම සඳහා අධිකාරිය විසින් නැවතත් භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබාගන්නා බැවින් එම ක්‍රියාමාර්ගය මගින් අයවැය පරතරය අවම කිරීමේ අරමුණු ඉටුනොවන බව නිරීක්ෂණය විය.				
18 (i)	**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 03** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 වගන්තිය අනුව කිසියම් ප්‍රසම්පාදනයට අදාල කොන්ත්‍රාත් පැකේජ බෙදා වෙන්කිරීම (Splitting) නොකළයුතු වුවත් කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 28,840 ක් වූ දිගින් කි.මී. 12 ක් පමණක් වූ අධිවේගී මාර්ග කොටසක ඉදිකිරීම්	2022	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුය.	ප්‍රමාණවත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට තොරතුරු ඉදිරිපත් වී නැත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු වී නොමැත.

	පැකේජ 17 ක් යටතේ දේශීය කොන්ත්‍රාත් සමාගම් 14 කට ලබාදී තිබුණි. එම නිසා එයින් පැකේජ 12 ක ප්‍රසම්පාදනයන් අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවට යොමු කිරීම මගහැරී තිබුණි.				
(ii)	සති 26 ක් තුල ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට අමාත්‍යාංශයේ, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, තක්සේරු දෙපාර්තමේන්තුවේ සහ ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන්ට 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 32.4 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 44 උප වගන්තියට අනුව ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කර තිබුණේ ඉඩම් කැබලි 181 ක් පමණි.	2021	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය.	2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් කැබලි 1,118 ක් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇත.	ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු විධිමත් පරිදි අවසන් කර නොමැත.
19 (i)	**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 04** ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු කඩිනම් කර සති 26 ක් ඇතුළත අවසන් කිරීම සඳහා අමාත්‍යාංශයේ, මිනින්දෝරු	2021	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය.	ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බාධාවක් නොවන පරිදි අදාල නිර්ණායකයන් හා වගකීම් නිශ්චය කොට පාලන පද්ධතීන්	ඉඩම් අත්පත් කරගනීමේ කටයුතු විධිමත් පරිදි අවසන් කර නොමැත.

	දෙපාර්තමේන්තුවේ, තක්සේරු දෙපාර්තමේන්තුවේ සහ ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන්ට රු.මිලියන 6.02 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ඉඩම් කැබලි 3,512 න් ඉඩම් කැබලි 2,645 ක් සඳහා 9(1) වගන්තිය යටතේ විමසීම්ද, ඉඩම් කැබලි 2,018 ක් සඳහා 10(1) වගන්තිය යටතේ නිවේදන නිකුත් කිරීම්ද සිදු කර තිබුණි. ඒ අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය තවමත් මන්දගාමීව පැවතුණි.			ප්‍රමාණවත් පරිදි හඳුන්වා දී නොමැත.	
(ii)	ප්‍රමුඛතා ව්‍යාපෘති වල දුර්වල සැලසුම් හේතුවෙන්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2016 වර්ෂයේදී ආරම්භ කළද, 2022 පෙබරවාරි 28 අවසන් වන විටත් ව්‍යාපෘතියේ සිවිල් වැඩ කටයුතු ආරම්භ කර නොතිබුණි. කෙසේ වෙතත් රු.මිලියන 448.87 ක් 2021 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙනුවෙන් වැය කර තිබුණි.	2021	ඉදිකිරීම් කඩිනම් කිරීමට සෑම පියවරක්ම ගත යුතුය.	සැලසුම් දුර්වලතාවයන් මගහරවා ගැනීමට සුදුසු අභ්‍යන්තර පාලනයන් හඳුන්වාදී නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.
20	**රුවන්පුර අධිවේගී මාර්ගය** මුළු පිරිවැය රු. මිලියන 54,695 ක් වූ රුවන්පුර අධිවේගී මාර්ගයේ ව්‍යාපෘති කටයුතු 2016 දී	2022	ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේදී අරමුදල් ලබා ගැනීමට ණය සැපයුම්කරුවන් සමඟ එකඟතාවයක්	ප්‍රමාණවත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට තොරතුරු ඉදිරිපත් වී නැත.	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

ආරම්භකර තිබුණි. ඒ අනුව, කහතුඩුව අන්තර් හුවමාරුවේ සිට පැල්මඩුල්ල දක්වා අධිවේගී මාර්ගයේ කි.මී.73.9 ක් සහ කහතුඩුව සිට ඉංගිරිය දක්වා කොටසේ කි.මී. 24.3 ක ඉදිකිරීම් කටයුතු 2021 මැයි 03 දින ඉදිකිරීම් සමාගම වෙත භාරදී තිබුණු අතර අදාල ඉදිකිරීම් කටයුතු 2023 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද එම ඉදිකිරීම් ආරම්භකර වර්ෂයකට පසුව බිල්පත් සඳහා මුදල් නොගෙවීම නිසා 2022 මැයි 10 දින සිට කොන්ත්‍රාත්කරු ඒක පාර්ශවිකව ඉදිකිරීම් කටයුතු නතරකර තිබුණි. ඉදිකිරීම් සමාගම වෙත අත්තිකාරම් වශයෙන් වැට් බදු සහිතව රු.මිලියන 3,210 ක් 2021 ජූලි 13 දින ජාතික ඉතිරිකිරීමේ බැංකුව මගින් ලබාගත් ණය මුදලකින් ගෙවා ඇති අතර කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් නතර කිරීම නිසා ඉහත මුදල් ආපසු අයකර ගත නොහැකි වී තිබුණු අතර ලංකා බැංකුව හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් ලබා ගත් ණය මුදල් සඳහා 2022 ජූනි 30 දින පිළිවෙලින් රු.මිලියන 22.55 හා රු.මිලියන 264 ක	ලබාගත යුතුය.

	පොලී ගෙවීම්කර තිබුණි. මෙගා ව්‍යාපෘති සමාලෝචනය හා කඩිනම් කිරීමේ කමිටුව (RAMP) මගින් 2023 ජනවාරි 31 දින ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කර ඇති අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය සඳහා දරණ ලද වියදම රු.මිලියන 10,124 ක් විය. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු එක් වරම නතර කිරීම හේතුවෙන් ඉදිකිරීම් සඳහා කැනීම් කරන ලද ස්ථාන වල වතුර වලවල් ඇතිවීම, තැන තැන ගොඩගසන ලද පස් කඳු පැවතීම නිසා භාවිතා කරන ලද මාර්ග අවහිරවීම් කුඹුරු ඉඩම් වගාකල නොහැකි වීම් ආදී ලෙස , ප්‍රදේශයේ ජනතාවගේ ජීවනෝපාය සහ ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි සැලකිය යුතු සමාජ බලපෑම් ද ඇති වී තිබුණු බව නිරීක්ෂණය විය.				
21	2021 වර්ෂයේ ග්‍රාමීය පාලම් 466 ක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් පිරිනමා තිබුණු අතර 2023 ජුනි 30 දින වන විට සම්පූර්ණයෙන් වැඩ අවසන් කල ග්‍රාමීය පාලම් සංඛ්‍යාව 84 ක් පමණක් වී තිබුණි. එය කොන්ත්‍රාත් පිරිනමන ලද මුළු ව්‍යාපෘති	2023, 2022	අපේක්ෂිත නිමවුම කාර්යක්ෂමව ලගාකර ගත යුතුය.	ප්‍රමුඛතා පාලම් පමණක් ඉදිකිරීමට තීරණය වූ බැවින් නව ඇස්තමේන්තු යටතේ නිම කිරීමට කටයුතු යොදමින් ඇත. 2024 ජූලි 31 දිනට ග්‍රාමීය පාලම් 109 ක වැඩ අවසන් කර ඇත.	අපේක්ෂිත නිමවුම ලඟාකර ගැනීමට කටයුතු කරමින් පැවතුණි.

	සංඛ්‍යාවෙන් සියයට 18 ක අවම ප්‍රතිශතයක් වී තිබුණි.				
22 (i)	**මහනුවර උමං මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය** වර්ෂ ගණනාවක සිට මහනුවර නගරයේ පවතින දැඩි වාහන තදබදයට පිළියමක් ලෙස තැන්නෙකුඹුර සහ සුදුහුම්පොළ අතර කි.මී. 4.36 ක දුරකින් යුතු උමං මාර්ග 04 ක්, පාලම් 03 ක් හා අන්තර් හුවමාරු 04 කින් සමන්විත කි.මී. 5.56 ක දුරකින් යුතු මං තීරු 04 ක මාර්ගයක් මාස 58 කින් ඉදිකිරීම සඳහා EDCF - කොරියානු මූල්‍යකරණ නියෝජිතායතනය සමඟ එ.ජ.ඩො. මිලියන 252.3 ක එනම් ශ්‍රී ලංකා රු.මිලියන 50,461 ක වියදමකින් යුතුව 2021 සැප්තැම්බර් මස ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණු අතර මෙම ව්‍යාපෘතිය අවලංගු කර වෙනත් ඉහළ ප්‍රමුඛතා ව්‍යාපෘතියකට මුදල් වෙන් කරන ලෙස 2017 අගෝස්තු 21 දින ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටුවෙන් ඉල්ලා තිබුණු බැවින් ඒ වන විට ව්‍යාපෘතිය අක්‍රියව පැවතිණි. පසුව, ව්‍යාපෘතිය සහ එහි කාර්යයන් ආරම්භ කිරීමට පෙර මහනුවර	2023, 2022	ශක්‍යතා අධ්‍යයන අවසන් කර ඇති ව්‍යාපෘති ජාතික සංවර්ධන සැලැස්මට ඇතුලත් කළ යුතු අතර ගිවිසුම් අනුව අදාල කාර්යයන් නිම කිරීමට කටයුතු කළ යුතුය.	ප්‍රමාණවත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට තොරතුරු ඉදිරිපත් වී නැත.	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

	උමං මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම තක්සේරු කිරීම (Environmental Impact Assessment) සඳහා 2021 මාර්තු 25 දින මාර්ග සංවර්ධන අධිකාරිය සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2017 වසරේ සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පසුබිම් වැඩ කටයුතු සකස් කර තිබුණද, 2023 දෙසැම්බර් 31 වන විට පාරිසරික බලපෑම් තක්සේරුව පමණක් අවසන් කර තිබුණු අතර මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.මිලියන 95.75 න්, රු.මිලියන 78.36 ක මුදලක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි. රටේ පැවති අයහපත් තත්වය මත ක්ෂෙත්‍ර කටයුතු ප්‍රමාද වීම, ඉන්ධන හිඟය මත සිදුරු ගවේශණ කටයුතුවලට (bore exploration process) බාධා පැමිණීම හේතුවෙන් අවස්ථා 03 කදී මෙම කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කර (EOT) තිබුණි.				
(ii)	ඉඩම් අත්පත් කර ගැනීම, උපදේශන කටයුතු සහ සිවිල් වැඩ 2021 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කර	2023	පාරිසරික ඇගයීම් වාර්තා කඩිනමින් අනුමත කරගැනීමට කටයුතු කළ යුතුය	පරිසර අධ්‍යාන වාර්තාවේ අවසාන කෙටුම්පත මධ්‍යම පරිසර අධිකාරිය වෙත 2023 නොවැම්බර් මස 8 වන දින යොමු	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

	තිබුණද, පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවේ කටයුතු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් 2023 වර්ෂය අවසන් වන විටත් ඉහත කිසිදු කාර්යයක් ආරම්භ කර නොතිබුණි.			කර ඇත.	
23 (i)	**ගාලු පාරට සමාන්තර සමුද්‍රීය මාර්ගය (Marine Drive) පානදුර දක්වා දීර්ඝ කිරීම** රු.මිලියන 232.15 ක ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැයකින් දින 455 ක් ඇතුළත දෙහිවල ඇළ හරහා වූ පාලම නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය නිම කිරීමට කොන්ත්‍රාත්කරු සමඟ එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2021 සැප්තැම්බර් 13 වූ අතර, වර්ෂ 2 කට වැඩි කාලයක් ගත වී තිබුණද, 2023 දෙසැම්බර් 31 වන විටත් සිවිල් වැඩ අවසන් කර නොතිබුණි.	2023	කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම තුල සේවා යෝජකට සිදුවන අතිරේක පිරිවැය වැළකෙන පරිදි ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.	සියයට 99 ක භෞතික ප්‍රගතියක් ලඟා කර ගෙන ඇත.	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.
24	කොන්ත්‍රාත් පොදු කොන්දේසි 4.2 උප වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්ය සාධන සුරක්ෂණ ඔවුන්ගේ වියදමින් ලබා දිය යුතු වුවද, කොන්ත්‍රාත්කරුවන්ට	2023, 2021	ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු විසින් කොන්ත්‍රාත් කොන්දේසි නැවත සමාලෝචනය කළයුතු අතර ජාතික විගණන	කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සිදු කිරීමේදී නිරීක්ෂණ මඟින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ කටයුතු සම්බන්ධයෙන් අදාල නිර්ණායකයන් හා වගකීම් නිශ්වය කොට පාලන පද්ධතීන්	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

	හිමිකම් පෑමට හැකි වන පරිදි මූලික සහ පොදු අයිතම යටතේ වෙනම ගෙවීම් අයිතමයක් ප්‍රමාණ පත්‍රවල සකස් කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට කාර්ය සාධන සුරක්ෂණ වල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා මාර්ග සංවර්ධන ව්‍යාපෘති 04 ක කොන්ත්‍රාත්කරුවන්ට රු.මිලියන 2,526.09 ක මුදලක් ගෙවා තිබුණි.		පනතේ 38(1)(ඇ) වගන්තිය යටතේ වූ පද්ධති සමාලෝචනයේදී මේ පිළිබඳ විශේෂ අවධානය යොමුකර සඵලදායී අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දිය යුතුය.	ප්‍රමාණවත් පරිදි හඳුන්වා දී නොමැත.	
25	මාර්ග පුනරුත්ථාපන කටයුතුවල දුර්වල ප්‍රගතිය හේතුවෙන් උපයෝජනය නොකළ ණය මත බැඳීම් ගාස්තු (Commitment charges) ලෙස රු.මිලියන 274.02 ක් හා 1,097.18 ක් අනාර්ථික ලෙස 2022 හා 2021 වර්ෂ අවසන් වන විට පහත සඳහන් ව්‍යාපෘති විසින් ණය ප්‍රදාන නියෝජිතායතනයන් වෙත ගෙවා තිබුණි.	2022, 2021	ණය මුදල් අදාල කාලසීමාව තුල ඵලදායීව උපයෝජනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම කළමනාකරණයේ වගකීම වන බව.	කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සිදු කිරීමේදී නිරීක්ෂණ මඟින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ කටයුතු සම්බන්ධයෙන් අදාල නිර්ණායකයන් හා වගකීම් නිශ්චය කොට පාලන පද්ධතීන් ප්‍රමාණවත් පරිදි හඳුන්වා දී නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

ව්‍යාපෘතිය	2022 දෙසැම්බර් 31 දිනට ගෙවූ වටිනාකම රු.මිලියන	2021 දෙසැම්බර් 31 දිනට ගෙවූ වටිනාකම රු.මිලියන
ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන	183.52	
දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන	90.50	
දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - අදියර-01		666.22
දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - අදියර-04		430.96
එකතුව	**274.02**	**1,097.18**

26	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා 2017 මාර්තු 15 දින නිකුත්කළ අංක 32 අතිරේකය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු සහ ඊට අදාල තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් සඳහා කිසියම් කාර්තුවක් තුල ගෙවීම් කළහැකි උපරිම සීමාව එම නිලධාරියාගේ එම කාර්තුවට අදාල මූලික වැටුප නොඉක්මවියයුතු වුවත් ඊට පටහැනිව එම සීමාවන් ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 12 ක් සඳහා 2021 වර්ෂයට අදාලව රු.මිලියන 4.42 ක මුදලක් ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් විගණනය විසින් විමසීමෙන් අනතුරුව ඉහත සඳහන් නිලධාරීන් අතරින් නිලධාරීන් 11 ක් විසින් රු.මිලියන 10.04 ක් අමාත්‍යාංශය වෙත ආපසු ගෙවීම් කර තිබුණි. ඒ අනුව, අදාල නිලධාරීන් සඳහා සීමාව ඉක්මවා 2020 වර්ෂයේදීද ගෙවීම් කර තිබීමේ අවදානමක් පැවතීම විගණනයේදී බැහැර කළ නොහැකි අතර මෙම නිලධාරීන් විසින් ඉහත සඳහන් පරිදි ආපසු ගෙවූ මුදලේ නිරවද්‍යතාවයද විගණනයේදී තහවුරු නොවුණි. තවද	2021	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු සහ ඊට අදාල තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් වෙත ගෙවීම් කළ යුතුය.	ප්‍රමාණවත් වැළැක්වීමේ නිර්දේශ ක්‍රියාමාර්ගයන් ගෙන ක්‍රියාත්මක වී ඇති බවට තොරතුරු නොතිබුණි. ඉදිරිපත් වී නැත.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව නිලධාරීන් විසින් සීමාව ඉක්මවා ලබාගත් මුදල එම නිලධාරියාට දැනට සේවයේ නියුතු ආයතනයට ලෙවීම් කළ යුතු වුවත් ඉහත නිලධාරීන් විසින් අදාල ආපසු ගෙවීම් මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘතියකට බැර කිරීමට හේතු විගණනයට අනාවරණය නොවුණි.

3.17 වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	765,049,782	760,578	764,289,204	-	තත්ත්වාගණනය නොකළ
2022	982,194,305	9,733,691	972,460,614	-	තත්ත්වාගණනය නොකළ
2023	977,808,173	7,983,325	969,824,848	-	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	1992 වර්ෂයේදී රජයට අයත් එකතුව හෙක්ටයාර් 249,843 ක් වූ ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් වෙත අවුරුදු 53 ක කාලයක් සඳහා බදු කුලී පදනම මත පවරා දී තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට එම සමාගම් 10කින් රජයට අයවිය යුතු රු.587,146,771ක බදු ආදායම හිඟව පැවතියද , මු.රෙ.176(2) ප්‍රකාරව භාණ්ඩාගාරය හා එක්ව අප්‍රමාදව හිඟ හිටි ආදායම් එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	හිඟ බදු හා වාර්ෂික බදු ආදායම් නියමිත පරිදි අයකර ගැනීමට විධිමත් පියවර ගත යුතුය.	වැවිලි සමාගම් 09 කින් අයවිය යුතු මුළු හිඟ බදුකුලිය වූ රු.260,639,247 ක් අයකර ගෙන ඇත. කුරුණෑගල වැවිලි සමාගමේ හිඟ බදුකුලියෙන් රු.13,769,750 ක් අයකර ගෙන ඇත.	2024 අප්‍රේල් 30 දිනට කුරුණෑගල වැවිලි සමාගමෙන් රු.312,737,974 ක හිඟ බදුකුලිය මේ දක්වා අය වී නොමැත.
2	1995 වර්ෂයේ නොවැම්බර් 27 දින කුරුණෑගල වැවිලි සමාගම සමඟ ඇතිකරගත් අංක 1558 දරන කල් බදුකුලී	2023	ගිවිසුම පරිදි බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු අතර බදු ගිවිසුමේ අනෙකුත්	රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ	කුරුණෑගල වැවිලි සමාගම විසින් හිඟ බදු කුලිය ගෙවීම් කර නොමැති අතර අමාත්‍යාංශ

	සංශෝධිත ගිවිසුම අනුව එදිනට පැවති ශුද්ධ වත්කම් ප්‍රමාණය මත ගණනය කළ බදු මුදල වසර 53 ක් තුළ වසරකදී සමාන වාරික හතරකින් ගෙවිය යුතු වුවද ශුද්ධ වත්කම් අඩුවීම මත සමාගම විසින් වසරකට ගෙවිය යුතු බදු මුදල අඩුවෙන් ගෙවීම නිසා 2023 දෙසැම්බර් 31 දිනට රු.326,507,724 ක් කුරුණෑගල වැවිලි සමාගමෙන් අයවිය යුතු අතර ඉන් රු.168,290,244 ක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පැවත තිබුණු බව නිරීක්ෂණය විය. බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් කල් බදු සංශෝධන ගිවිසුමෙහි 2(a) සහ 5(c) ඡේද අනුව ද කටයුතු කර නොතිබුණි.		කොන්දේසි පරීක්ෂා කර හා සමාලෝචනය කර එකඟ වූ බදු මුදල් නොගෙවීම් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කළ යුතුය.	ප්‍රධානත්වයෙන් හා කුරුණෑගල වැවිලි සමාගමේ සභාපතිගේ සහභාගීත්වයෙන් 2024.05.09 දින හිඟ බදුකුලිය සම්බන්ධයෙන් රැස්වීමක් පවත්වා කරුණු සමාලෝචනය කරන ලද අතර සමාගමේ බදු කුලිය ගණනය කිරීම සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීමට උපදෙස් ලබාදී ඇත. කුරුණෑගල වැවිලි සමාගම විසින් බදු කුලිය ගෙවීමේ ගැටළුව සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් විමසා ඇත.	ලේකම් විසින් කැඳවන ලද වාර්තාව මේ දක්වා ලැබී නොමැත. නීතිපති උපදෙස්ද මේ දක්වා ලැබී නොමැත.
3	2017 පෙබරවාරි 15 දින අංක PE/PL/RP/Gen/2017 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වැවිලි අමාත්‍යාංශ ලේකම් වෙත වැවිලි සමාගම් විසින් රජයේ ඉඩම් උප බදුදීම් තුළින් උපයන කුලී ආදායමෙන් සියයට 20 ක ගාස්තුවක් ඒකාබද්ධ අරමුදලට කාර්තුමය පදනමින් අය කිරීමට නියම කර තිබුණු බැවින් ඒ අනුව 2023 දෙසැම්බර් 31	2023	වැවිලි සමාගම් විසින් රජයේ ඉඩම් උපබදුදීම් තුළින් උපයන කුලී ආදායමෙන් සියයට 20ක ගාස්තුවක් ඒකාබද්ධ අරමුදලට කාර්තුමය පදනමින් ගෙවීමට විධිමත් පියවරක් නොපමාව ගත යුතුය.	හිඟ උප බදු කුලිය ගෙවීම් කරන ලෙස අදාල ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත 2024.09.30 දින දැනුම් දී ඇත.	2024 ජූලි 31 දිනට රු. 14,884,917ක හිඟ උප බදු කුලී අයකර ගෙන ඇති අතර තව දුරටත් හිඟ මුදල රු.5,037,981 ක් විය.

	දිනට ලැබිය යුතු රු.39,068,269කින් සමාලෝචිත වර්ෂයේදී රු.19,145,371ක් පමණක් ලැබී තිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟහිටි උප බදු මුදල රු.19,922,898ක් විය. 2023 වර්ෂය සඳහා වැවිලි සමාගම් 10කින් උප බදු කිසිවක් අයවී නොතිබුණි.				
4	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභ හානි සිදු වී වර්ෂ 01 ත් වර්ෂ 12 ත් අතර කාලයක් ගත වී තිබුණු සිද්ධීන් 06 ක් සම්බන්ධයෙන් එකතුව රු. 5,221,961 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි.	2023	පාඩු හා හානි අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අයකර ගත නොහැකි පාඩු හා හානි සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් කර විධිමත් අනුමැතියක් මත කපා හැරිය යුතුය.	සිද්ධීන් 3ක් සම්බන්ධයෙන් නඩු පවරා ඇති අතර ඉතිරි සිද්ධීන් සම්බන්ධයෙන් අලාභය පොත්වලින් කපා හැරීමට අනුමැතිය ලැබී ඇත	නඩු පවරා ඇති රු.4,844,030 ක් මේ දක්වා අය වී නොමැත. කපාහැරීමට අනුමැතිය ලැබුණු රු.377,931 ක් මේ දක්වා කපාහැර නොමැත.

3.18 කෘෂිකර්ම අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,924,987,997	20,929,448	1,904,058,549	-	තත්ත්වාගණනය කළ
2022	3,148,673,973	71,128,249	3,077,545,724	-	තත්ත්වාගණනය කළ
2023	3,199,378,072	53,255,906	3,146,122,166	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතන විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ තත්ත්වය
1	වී මිලදී ගැනීමේ වැඩසටහනෙහි පසුගිය වර්ෂයේ හිඟ ආදායමින් රු.138,204,923 ක් හා ප්‍රවර්තන වර්ෂය තුළ රු.209,107,022 ක හිඟ ආදායම් ඇතුළුව එකතුව රු.347,311,945 ක ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2022 වර්ෂයේ මුළු හිඟ ආදායම වූ රු.437,085,714 කින් 2023 වර්ෂයේදී රු.60,407,579 ක් අයවී තව දුරටත් හිඟ ආදායම රු.376,678,135 කි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් ආදායම් රැස් කිරීම පිළිබඳව අමාත්‍යාංශ අධීක්ෂණයේ දුර්වලතාවය හිඟ ආදායම් රැස් කිරීමේ අකාර්යක්ෂමතාවයට ප්‍රධාන වශයෙන් බලපා	2021 2023	අය නොවීමට හේතු සොයා බලා කඩිනමින් හිඟ ආදායම් අයකරගත යුතුය.	මේ පිළිබඳ අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත විශේෂ අවධානය යොමු කරන ලෙසත් හිඟ ආදායම් වහාම අයකර ගැනීමට කටයුතු කරන ලෙසත් දන්වා ලිපි යොමු කිරීම.	පසුගිය වර්ෂයන්ගේ හිඟ ආදායමින් තවදුරටත් අයවීමට ඇති ශේෂය රු.370,963,494 ක් වේ.

	තිබුණි.				
2	කෘෂිකර්ම අමාත්‍යාංශයේ භාවිතයේ ඇති වෙනත් රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් වාහන 15 ක අයිතිය පවරා නොගෙන ඒවායේ රු.51,500,000 ක වටිනාකම, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි.	2021	වෙනත් රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් වාහනවල අයිතිය පවරා ගත යුතුය.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක : 02/2017 ප්‍රකාරව වාහන 05 ක අයිතිය පවරා ගෙන තිබුණි. තවත් එක් වාහනයක් අදාළ ආයතනයට භාරදී තිබුණි. අනෙක් වාහන පවරාගැනීමට කටයුතු කරනු ලැබේ.	වාහන 09 ක අයිතිය තවදුරටත් පවරා ගෙන නොතිබුණි.
3	කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලියට ගත් ගොඩනැගිල්ලේ බදු ගිවිසුම් කාලය අතරතුර අවශ්‍ය වුවහොත් බදු ගැනුම්කරුට සහ බදු දීමනාකරුට ගිවිසුම අවසන් කළ හැකි ආකාරය පිළිබඳ කොන්දේසියක් බදු ගිවිසුමට ඇතුළත්ව නොතිබුණි. එම අඩුපාඩුව නිසා වසර 5 කට බදුගත් මෙම දේපළ සිව්වන අවුරුද්දේදී ආපසු භාර දෙන අවස්ථාවේ ඉතිරිව ඇති බදු කාලයට සමානුපාතිකව කුලී ප්‍රමාණයක් අඩු කර ගැනීමට අවස්ථාව අහිමිව ගොස් තිබුණු අතර ගොඩනැගිල්ල භාවිතා නොකළ කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.310,939,139 ක බදු මුදලක් ගෙවා තිබුණි.	2021	මෙවැනි වියදම් නොදැරීමට වගබලා ගත යුතුය.	කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	ඉතිරිව ඇති බදු කාලයට සමානුපාතිකව කුලී ප්‍රමාණයක් අඩු කර ගැනීමට කොන්දේසියක් බදු ගිවිසුමට ඇතුළත් කර නැත.

	එම වියදම අනාර්ථික වැයක් ලෙස නිරීක්ෂණය විය.				
4	බදු කාලය තුළ බදු ගැණුම්කාර පාර්ශවය වෙතින් බදු ගොඩනැගිල්ලට සිදුවී ඇති හානිය සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙහි ඉංජිනේරු අංශයේ නිලධාරීන් හා තක්සේරු දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් එක්ව 2021 මාර්තු, අප්‍රේල් කාලය තුළ පරීක්ෂාවක් සිදුකර ඇති අතර, උක්ත පරීක්ෂාව සඳහා සහභාගී වන ලෙස බදු දීමනාකාර පාර්ශවය වෙත දැනුම්දී ඇතත්, බදු දීමනාකාර සමාගම උක්ත පරීක්ෂාව සඳහා සහභාගීවීම ප්‍රතික්ෂේපකර ඇත. බදු දේපළෙන් ඉවත්වීමේදී දෙපාර්ශවයේ සහභාගීත්වයෙන් සුදුසු තාක්ෂණික ආයතනයක් මගින් අලාභානි වාර්තාවක් කැඳවිය යුතු බවට ගිවිසුම තුළ කොන්දේසි ඇතුළත්කර නොතිබීම හේතුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි නිලධාරීන් විසින් සිදු වී ඇති හානිය ලෙස රු.12,710,236 කටත් බදු දීමනාකාර සමාගම ගොඩනැගිල්ලට සිදුවූ හානිය රු.28,250,056 කටත් තක්සේරු කර වාර්තා සකස් කිරීම	2021	මෙවැනි අනාර්ථික වැය නොදැරීමට වගබලාගත යුතුය.	කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	බදු ගොඩනැගිල්ලට සිදු වී ඇති අලාභය දෙපාර්ශවය විසින් තක්සේරු කරන ආකාරය හෝ අලාභ හානි වාර්තා කැඳවිය යුතු අකාරය පිළිබඳ වගන්තියක් ගිවිසුම තුළ අන්තර්ගත කර නැත.

	හේතුවෙන් පාර්ශවයන් අතර හානි පාඩු සම්බන්ධයෙන් මතභේදාත්මක තත්ත්වයන් නිර්මාණය වී ඇති අතර කෘෂිකර්ම අමාත්‍යාංශයේ කිසිදු සහභාගීත්වයකින් තොරව බදු දීමනාකාර විසින් ඒකපාර්ශවීය පිළියෙල කරන ලද තක්සේරු වාර්තාවකට අනුව රු.15,539,820 ක වැඩිපුර බැරකමක් ඇතිවීමේ අවදානමක් නිර්මාණය වී තිබුණි.				
5	ගිවිසුම් කොන්දේසි අංක II ප්‍රකාරව ගිවිසුම අවසන්වී බදු දේපළ භාරදීමෙන් එක් මසක කාලයක් තුළ බදු දීමනා කරු විසින් රු.මිලියන 63 ක ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල බදුගැණුම්කරු වෙත ලබා දීමට කටයුතු කළ යුතු වේ. එහෙත් බදු ගැණුම්කරු බදු දේපළ භාරදී ගිවිසුම අවසන් කිරීමට ක්‍රියාකරන ලද සෑම අවස්ථාවකදීම බදු දීමනාකාර පාර්ශවය ඊට එරෙහිවීම හා ගිවිසුමේ මූලික කොන්දේසිවලට අනනුකූලව ක්‍රියාකරමින් ඇති නිසා උක්ත තැන්පතුව ලබා ගැනීමට නොහැකි වී තිබුණි.	2021	තැන්පතු මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	2024.10.04 වන දින නීතිපති මගින් DPJ ආයතනය ගෙවීමට එකඟ වූ රුපියල් ලක්ෂ 300 ක මුදල කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ගෙවන ලෙස දන්වමින් එම ආයතනය වෙත යැවීමට තීරණය කර තිබුණි.තවද මිලියන 63 ක මුළු මුදල පූර්ණ වශයෙන් අයකර ගැනීම සඳහා අධිකරණයේ නඩු පැවරීම පිණිස කෙටුම්පත් කර ඇති පැමිණිල්ල සම්බන්ධව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කරන බවටද එහිදී නීතිපති දෙපාර්තුමේන්තුව වැඩිදුරටත් සඳහන් කර තිබුණු බව සඳහන් කර තිබුණි.	තැන්පතු මුදල අය කර ගෙන නොමැත.
6	අමාත්‍යාංශයේ භාවිතයේ පවතින KS-6781 දරන වාහනයේ තක්සේරු	2022	වාහනවල අයිතිය පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවල	අදාල චක්‍රලේඛ, මුදල් රෙගුලාසි ප්‍රකාරව යතුරුපැදිය ඇතුළු	යතුරුපැදිය ඇතුළු වාහන 11 ක් මූල්‍ය

	වටිනාකම විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි. එම වාහනය හා TP-4769 දරන යතුරු පැදිය ඇතුළුව තක්සේරු වටිනාකම්වල එකතුව රු. 179,272,000 ක් වූ වාහන 16 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. කෙසේ නමුත් එම වාහනවලින් 12 ක ලියාපදිංචි අයිතිය කෘෂිකර්ම අමාත්‍යාංශය නමින් නොපවතින අතර එම වාහන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කිරීම හෝ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2017 දෙසැම්බර් 21 දිනැති හා අංක 2/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව අදාළ අමාත්‍යාංශය වෙත නැවත භාරදීමක් හෝ සිදුකර නොතිබුණි.		ඇතුළත් කිරීමට හෝ වාහන අයිතිය පවතින ආයතන වෙත නැවත භාරදීමට හෝ කටයුතු කළ යුතුය.	වාහන 11 ක් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර ඇත. ලියාපදිංචි අයිතිය මහජන ආරක්ෂක අමාත්‍යාංශය සතු වාහන 02 ක් එම අමාත්‍යාංශය වෙත භාර දී ඇත.	ප්‍රකාශන වලට ඇතුළත් කර ඇත. තවත් වාහන 02 ක් අදාළ ආයතනය වෙත භාර දී ඇත. වාහනයක් නැවත භාරදීමක් සිදුකර නොතිබුණි. එක් වාහනයක් අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.
7	අමාත්‍යාංශයට නීත්‍යානුකූල හිමිකාරීත්වය නොමැති වටිනාකම රු. 24,700,000 ක් වූ වාහන 07 ක් ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි.	2022	වාහනවල අයිතිය පවරාගත යුතුය.	අදාල චක්‍රලේඛ, මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන 03ක් කෘෂිකර්ම අමාත්‍යාංශ නමින් පවරා ගෙන ඇත. අනෙක් වාහන 04 පවරා ගැනීමට අදාළ ලිපි ලේඛන අදාළ අමාත්‍යාංශ වෙත යොමුකර තිබුණි.	වාහන 03ක් කෘෂිකර්ම අමාත්‍යාංශ නමින් පවරා ගෙන ඇත. අනෙක් වාහන 04 මෙතෙක් පවරාගෙන නොතිබුණි.
8	මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් පශු සම්පත් අංශයට හිමිකාරීත්වය ඇති එකතු වටිනාකම රු. 139,800,000 ක් වූ	2022	වාහන ආපසු අමාත්‍යාංශය වෙත ලබාගැනීමට කටයුතු කළ යුතුය.	CAA-0024 ජීප් රථය- මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා	වාහන 02 ක් අමාත්‍යාංශය වෙත භාරදීමට කටයුතු කරන දැනුම් දී තිබුණු

වාහන 08 එම අංශයේ හෝ අමාත්‍යාංශයේ වෙනත් අංශයක හෝ භෞතිකව නොපවතින අතර ඒවා ආපසු ලබා ගැනීම සිදුකර නොතිබුණි.

දීමට කටයුතුකර ඇත. PD-8931- කැබ් රථය හා GF 9312- ජීප් රථය වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා දීමට කටයුතුකර ඇත.

KX - 8136 ජීප් රථය- නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා දීමට කටයුතුකර ඇත. KX – 7664 කාර් රථය- තාවකාලික පදනම මත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත.

CAH – 1634 ජීප් රථය- තාවකාලිකව වී අලෙවි මණ්ඩලය වෙත අනුයුක්ත කර ඇත.

KO – 0024 ජීප් රථය- තාවකාලික පදනම මත ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත ලබා දී ඇත.

KO – 4865 මෝටර් රථය - ලියාපදිංචි අයිතිය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් නමින් පවතින බැවින් ද රථයේ ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත හා වාහනය පශු සම්පත් අංශය සතුව නොපැවතීම හේතුවෙන් පශු සම්පත් අංශයේ ස්ථාවර වත්කම්

නමුත් භාරදී නොතිබුණි.

				ලේඛනයේ මෙම රථය ඇතුළත්ව තිබේ නම්, ඉන් එය ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දැනුම් දී ඇත.	
9	පශු සම්පත් අංශයේ කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවි ව්‍යවසායකයින් සංවර්ධනය හා කිරි පොකුරු ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රතිශෝධිත අයවැය අනුව රු.32,000,000 ක මූල්‍ය ප්‍රතිපාදනයක් ලබාදී තිබුණු අතර සියයට 93ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන තිබුණද සැලසුම්ගත ක්‍රියාකාරකම් 05ක් සම්බන්ධයෙන් භෞතික ප්‍රගතිය අත්කර ගැනීම සියයට 2ත් 3ත් අතර වූ අවම මට්ටමක පැවතුණි. රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධ 2022.04.26 දිනැති හා අංක 03/ 2022 දරන ජාතික අය වැය චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොතිබුණු අතර දරන ලද පිරිවැය නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.	2022	ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතුය.	මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන 2023 වර්ෂයේ දී ලබා දී නැත.	සැලසුම්ගත ක්‍රියාකාරකම් 05ක් සම්බන්ධයෙන් භෞතික ප්‍රගතිය අත්කර ගෙන නොතිබීම සම්බන්ධයෙන් ක්‍රියාකර නොතිබුණි.
10	පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන යටතේ පේදුරුතුඩුව පශු වෛද්‍ය කාර්යාල ගොඩනැගිල්ල නැවත ඉදිකිරීමට 2022 වර්ෂය	2022	අපේක්ෂිත කාර්යය සාධන මට්ටම ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.	ආරම්භක අත්තිකාරම හා පළමු බිල්පතට අදාළව රු.මි.6.32ක් ගෙවීම් කර ඇත. එවකට පැවති ගොඩනැගිලි අමුද්‍රව්‍ය හිඟය සහ මිල	ආරම්භක අත්තිකාරම හා පළමු බිල්පතට අදාළව රු.මි.6.32 ක් ගෙවීම් කර

	තුළ රු.21,210,000 ක ප්‍රතිපාදන වෙන්කර ඉන් රු.6,810,000 ක් ගෙවීම් කර තිබියදී ගොඩනැගිලි අමුද්‍රව්‍ය මිලය හා මිල ඉහළ යාම හේතුව ලෙස දක්වමින් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීමක් මත පදනම්ව කොන්ත්‍රාත් ගිවිසුමට පටහැනිව ගිවිසුමේ දෙපාර්ශවය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාපනය අංශයේ ඉංජිනේරු අත්සන් කරන ලද දිනය රහිත ලිපියක් මගින් මෙම කොන්ත්‍රාත්තුව නිම නොකර නවතා දැමීමට කටයුතු කර තිබුණි.			ඉහළ යෑම හේතුවෙන් මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. 2023 වර්ෂයේදී ලබා ගන්නා ලද රු.මිලියන52.97 ක ඇස්තමේන්තුවකට නැවත ඉදිකිරීම සඳහා 2023 වසරේ දී රු.මිලියන 25 ක් වෙන් කර රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුවේ (PERC) උපදෙස් පරිදි මෙම ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවා 2024 වසරේදී මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.60 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. උතුරු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් මේ වනවිට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.	අවිධිමත් ලෙස ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
11	පශු සම්පත් අංශයේ සූකර කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පරිසර හිතකාමී සූකර ගොවිපලවල් ඉදිකිරීම යන ක්‍රියාකාරකම යටතේ ගොවිපලවල් 110ක් පිහිටුවීමට ඉලක්කගත වී තිබුණද ගොවිපලවල් 49ක් පමණක් ඉදිකර තිබුණු අතර එම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 37කි.	2022	ඉදිනොකළ පරිසර හිතකාමී සූකර ගොවිපලවල් 61 ඉදිකළ යුතුය	ඉදිනොකළ පරිසර හිතකාමී සූකර ගොවිපලවල් 61 ඉදිකිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන තිබුණු බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.	පරිසර හිතකාමී සූකර ගොවිපලවල් 61 ක් ඉදිකර නොතිබුණි.

12	පශු සම්පත් අංශයේ ඵලදායිතා වැඩිදියුණු කිරීම තුළින් මධ්‍යම හා කුඩා පරිමාණ කිරි ගොවිපොළ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ අභිජනන කළමනාකරණය හරහා සුළු හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළවල් ඇතිකිරීමේ ව්‍යාපෘතිය යටතේ ගොවිපලවල් 576 ක් ස්ථාපිත කිරීමට ඉලක්කගතව පැවතියද ඉන් ගොවිපොළවල් 100ක් එනම් සියයට 17ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.	2022	ඉතිරි ගොවිපළ 476 සම්පූර්ණ කළ යුතුය	ඉතිරි ගොවිපළ 476 සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ගොවිපළ 476 සම්පූර්ණ කර නොතිබුණි.
13	1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනතේ 12 (1) (ඇ) හා 12 (2)(1) වගන්ති ප්‍රකාරව ආනයනික පොහොර සාම්පල ලබාගෙන සිදුකළ යුතු රසායනාගාර විශ්ලේෂණයකින් තොරව කොරෝනා වසංගත කාලය තුළ පොහොර නැව්ගත කරන අවස්ථාවේ ලබාගත් රසායනාගාර විශ්ලේෂණ වාර්තා මත පදනම්ව වෙළඳපොළට පොහොර නිකුත් කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය පරිදි ආනයනික පොහොර ශ්‍රී ලංකාව තුළ බෙදා හැරීමට අනුමැතිය	2022	පොහොර නිකුත්කිරීමට පෙර පනත ප්‍රකාරව පොහොර සාම්පල ලබාගෙන සිදුකළ යුතු රසායනාගාර විශ්ලේෂණ වාර්තා ලබා නොගෙන ක්‍රියාකළ නිළධාරීන්ට එරෙහිව පරීක්ෂණයක් පැවැත්විය යුතුය.	රසායනාගාර විශ්ලේෂණ වාර්තා ලබා නොගෙන ක්‍රියාකළ නිළධාරීන්ට එරෙහිව පරීක්ෂණයක් පැවැත්වීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද අංක 7/1/2/3/4/G/FA/Marketing හා 2020.06.08 දිනැති ලිපිය මඟින් ඉහත ක්‍රමවේදය තවදුරටත් ක්‍රියාත්මක නොකරන බව සියලුම රසායනික පොහොර ගෙන්වනු ලබන සමාගම් වෙත දැනුම් දී ඇති අතර එදින සිට ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් සියලුම සමාගම් වෙත නිකුත් කරන ලද	පොහොර සාම්පල රසායනාගාර විශ්ලේෂණ වාර්තා ලබා නොගෙන ක්‍රියාකළ නිළධාරීන්ට එරෙහිව පරීක්ෂණ පවත්වා නොතිබුණි.

	ලබාදෙන බව දන්වමින් ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් සියලුම ආනයනික පොහොර සමාගම් වෙත 2020 මාර්තු 20 දිනැති අංක 7/1/2/3/4 NFP දරන ලිපියක් නිකුත් කර තිබුණි.			අංක 4/5/6/Quality හා 2009.06.26 දිනැති ලිපියට අනුව පෙර තිබූ ක්‍රමවේදය අනුගමනය කර වර්තමානයේ දී ක්‍රියාත්මක වන බව දන්වා ඇත.	
14	1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනතේ 20 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිර්දේශිත ප්‍රමිතීන් පවතිනවිට එම ප්‍රමිතිවලට අනුකූලව පොහොර සාම්පල විශ්ලේෂණය කළ යුතු වුවත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිර්දේශිත ප්‍රමිතීන්ට අනුකූල නොවන යුරෝපා ප්‍රමිතීන්ට අනුකූලවන TSP පොහොර වෙළඳපොළට නිකුත්කළ හැකි පොහොර ලෙස සලකන බවත් එවැනි තොග වෙළඳපොළට නිකුත් කිරීමට අනුමැතිය ලබාදෙන බවට සඳහන් කරමින් “TSP පොහොර සඳහා අනුමැතිය” මැයෙන් ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් 2020 මාර්තු 20 වන දින අංක 7/1/2/3/4/NFP දරන ලිපියක් සියලු පොහොර සමාගම් වෙත	2022	පනත ප්‍රකාරව පොහොර සාම්පල ලබාගෙන සිදුකළ යුතු රසායනාගාර විශ්ලේෂණ වාර්තා ලබා නොගෙන ක්‍රියාකළ නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණයක් පැවැත්විය යුතුය.	Covid 19 වසංගත කාලය තුළ ක්‍රියාත්මක කල ක්‍රමවේදය තවදුරටත් ක්‍රියාත්මක නොවන අතර එදින සිට මේ දක්වා ආනයනික රසායනික පොහොර නියැදි ලබා ගෙන ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව වෙළඳ අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත	පොහොර සාම්පල රසායනාගාර විශ්ලේෂණ වාර්තා ලබා නොගෙන ක්‍රියාකළ නිළධාරීන්ට එරෙහිව පරීක්ෂණ පවත්වා නොතිබුණි..

	නිකුත් කර තිබුණි.				
15	ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කර ඇති අංක 7/1/2/3/4/NFP හා 2020 මාර්තු 20 වන දිනැති ලිපිය පදනම්කර ගනිමින්, ශ්‍රී ලංකාවට පොහොර තොග ආනයනය කළ පසු නියැදි පරීක්ෂාවක් මඟින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් හඳුන්වාදී ඇති ප්‍රමිතීන්ට අනුකූල බව තහවුරු කර ගැනීමකින් තොරව, රසායනික පොහොර නැව්ගත කිරීමේදී ලබා ගන්නා විශ්ලේෂණ වාර්තාව පමණක් සැලකිල්ලට ගෙන රසායනික පොහොර මෙ.ටොන් 245,448 ක් ශ්‍රී ලංකාව තුළ භාවිතය සඳහා අනුමැතිය ලබාදී තිබුණි.	2022	පනත ප්‍රකාරව පොහොර සාම්පල ලබාගෙන සිදුකළ යුතු රසායනාගාර විශ්ලේෂණ වාර්තා ලබා ලබා නොගෙන ක්‍රියාකළ නිළධාරීන්ට එරෙහිව පරීක්ෂණයක් පැවැත්විය යුතුය.	Covid 19 වසංගත තත්ත්වය හමුවේ ජන ජීවිතය යථා පරිදි පවත්වාගන යාමට අත්‍යාවශ්‍ය වන ආහාර භෝග ජනතාව තුල සුලභ කිරීම සඳහා අත්‍යාවශ්‍ය කාර්යයක් වන පොහොර බෙදාහැරීම සඳහා අංක 25, 26 හා 27 ඡේද වලින් ක්‍රියාත්මක කරන ලද ක්‍රමවේදය 7/1/2/3/4/G/FA/Marketing හා 2020.06.08 දිනැති ලිපිය මඟින් තවදුරටත් ක්‍රියාත්මක නොකරන අතර අංක 4/5/6/Quality හා 2009.06.26 දිනැති ලිපියේ දක්වා ඇති පෙර තිබූ ක්‍රමවේදය වර්තමානයේ දී ක්‍රියාත්මක වේ.	පොහොර සාම්පල රසායනාගාර විශ්ලේෂණ වාර්තා ලබා නොගෙන ක්‍රියාකළ නිළධාරීන්ට එරෙහිව පරීක්ෂණ පවත්වා නොතිබුණි.
16	මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වන ලංකා සතොස මඟින් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ ආදායම රු.376,678,135 ක් විය.	2023	හිඟ ආදායම් නොපමාව අයකර ගත යුතුය.	ලංකා සතොස මගින් අයවිය යුතු හිඟ මුදල් සඳහා ලිපි අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යොමු කිරීමට කටයුතු කර ඇති අතර ඒ අනුව එම ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කිරීම. 2020/21 මහ කන්නය හා 2021 යල කන්නයට අදාලව සහල් ලබා නොදුන් මෝල් හිමියන් , හිඟ සහල් සඳහා මුදල් නොගෙවන ලද සහල්	හිඟ මුදල අයකර නොමැත.

				මෝල් හිමියන් සඳහා නිතිමය ක්‍රියාමාර්ග අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් ගෙන ඇති බව දන්වා ඇත.	
17	එවකට කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයාට වෙන්කල රු.18,000,000 ක් වූ KW-8202 අංක දරන වාහනය 2021 මාර්තු 21 දින සිදුවූ අනතුර සම්බන්ධයෙන් 2022 ජූලි 22 දින පැවත්වූ මු.රෙ. 104(4) යටතේ අලාභයන් පිළිබඳ අවසන් වාර්තාව පරික්ෂාවේදි ස්ථානීය කරුණු සම්බන්ධ නිරීක්ෂණයන් නොවීය.විධිමත් අනුමැතියකින් තොරව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අයත් කටුබැද්ද ගර්හිත වාහන අංගනයේ ගාල් කර තිබිම හා ගර්හිත වාහනයක් ලෙස නම් කිරීමට ටොයෝටා ආයතනය කටයුතු කර තිබුණු බව එම වාර්තාවේ සඳහන් වුවද නිසි ක්‍රමවේදයෙන් බැහැර කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.එම වාහනයට රු.7,500,000 ක වන්දියක් ගෙවීමේ එකඟතාවය මත 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියාපටිපාටි	2023	මු.රෙ. 104(4) යටතේ අලාභයන් සලකා තක්සේරු කිරීමේදී අවස්ථානුකූලව සියලුම කරුණු මෙන්ම අලුත්වැඩියාව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියාපටි පාටි අනුගමනය කළ යුතුය.	මෙම රථයේ අනතුරට අදාලව මු.රෙ.104 (4) වාර්තාව නැවත ලබා ගැනීම සඳහා මු.රෙ. 104 (4) කමිටුව වෙත දන්වා ඇති අතර රථයේ වර්තමාන තත්ත්වය පිළිබඳව ඉංජිනේරු වාර්තාවක් ලබා දෙන ලෙස යාන්ත්‍රික ඉංජිනේරු දැනුම්වත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	අලුත්වැඩියාව නිමකර නොතිබුණි.

	අනුගමනය නොකර පෞද්ගලික ආයතනයකට අලුත්වැඩියාවට සඳහා 2022 දෙසැම්බර් 12 දින භාරදී 2023 මාර්තු 23 දින රක්ෂණ ආයතනය එම ගරාජය වෙත රු.5,625,000 ක් ගෙවීම කර තිබුණි.අමාත්‍යාංශය විසින් ගරාජය සමග ගිවිසුම්ගත වීම, කාර්යසාධන බැඳුම්කරයක් හෝ ලබා නොගෙන අලුත්වැඩියාවට වැයවන සම්පූර්ණ මුදලම සැපයුම්කරුට ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි. විගණනය විසින් 2023 දෙසැම්බර් 21 දින එම අනතුරට පත් වාහනය භෞතිකව නිරීක්ෂණය කළ අතර මෙම වාර්තාවේ දින වනවිටත් අලුත්වැඩියාව නිමකර නොතිබුණි.				
18	2017 හා 2018 වර්ෂයන් වලදී වැඩ ආරම්භ කර 2023 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් රු.මිලියන 279.8ක්, රු.මිලියන 304ක් හා රු.මිලියන 191ක් වැයකර මඩකලපුව, වවුනියාව හා යාපනය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම් අවසන් කර තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් එම ආර්ථික මධ්‍යස්ථාන විවෘත කිරීමට	2023	ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීමට කටයුතු කළ යුතුය.	මඩකලපුව, වව්නියාව සහ යාපනය ආර්ථික මධ්‍යස්ථාව විවෘත කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන ලෙස එක් එක් කළමනාකාර භාර දැනුවත් කිරීමට කටයුතු කර ඇත. අමාත්‍යාංශයේ දැනුවත් කිරීමට අනුව මඩකලපුව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ කළමනාකාර භාර ඔප්පුව 2024.04.07 දින වව්නියාව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ	ආර්ථික මධ්‍යස්ථාන විවෘත කර නොතිබුණි.

	කටයුතුකර නොතිබුණි. 2023 වර්ෂයේ උක්ත ආර්ථික මධ්‍යස්ථාන වෙනුවෙන් විදුලි ගාස්තු රු.මිලියන 1.32ක්ද, ආරක්ෂක සේවා ගාස්තු රු.මිලියන 9.21ක්ද ලෙස එකතුව රු.මිලියන 10.53ක් එම ආර්ථික මධ්‍යස්ථාන විවෘත නොකිරීම හේතුවෙන් රජයට වැය බරක් ඇති වී තිබුණි.			කළමනාකාර භාර ඔප්පුව 2024.04.06 දින හා යාපනය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ කළමනාකාර භාර ඔප්පුව 2024.08.14 දින අත්සන් කර ඇත.ඊට අමතරව එම ආර්ථික මධ්‍යස්ථාන විවෘත කිරීමට අදාළ අනෙකුත් කටයුතු සිදුකරමින් පවතී.	
19	කෘෂිකර්මාන්තය තුළ තරුණයන් රඳවා ගැනීමේ වැඩසටහන (තරුණ ගම්මාන වැඩසටහන) යටතේ හම්බන්තොට,ගාල්ල,ව වුනියාව හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක වල තෝරාගත් ගම්මාන පදනම් කරගනිමින් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 120 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර දී තිබුණි. සමස්ථයක් වශයෙන් සියයට 84.7 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන තිබුණද කුරුණෑගල දිස්ත්‍රික්කයේ තරුණ ගම්මාන වැඩසටහනෙහි මූල්‍ය ප්‍රගතිය සියයට 6 ක් වූ අවම මට්ටමක පැවති අතර එම ගොවීන් සඳහා දෙමුහුන් මිරිස් බීජ කි.ග්‍රෑම් 1 ක් පමණක් ලබා දී ඇති බවත් නිරීක්ෂණය විය.	2023	අපේක්ෂිත කාර්යය සාධන මට්ටම ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කළ අතර මේ සඳහා 2024 වසරට බැදීම් හා බැරකම් වාර්තා කර නොමැත. එබැවින් මෙම ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක නොවේ.එමෙන්ම මෙවැනි සිදුවීම් නැවත නැවත සිදු වීම වැළැක්වීම සඳහා වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් සඳහා නිරන්තර අධීක්ෂණය සිදු කරනු ලබයි.	මෙම ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක නොවන බවත් සඳහන් කර තිබුණි.

20	පශු සම්පත් අංශය විසින් ක්‍රියාත්මක සත්ත්ව අභිජනනය සහ ගොවිපොළ සංවර්ධනය ව්‍යාපෘතියට 2023 ජාතික අයවැය මගින් වෙන්කල රු.මිලියන 50 ප්‍රතිපාදනයෙන් රු.මිලියන 35.3 ක ප්‍රතිපාදන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ කුණ්ඩසාලේ කෘතිම සිංචන මධ්‍යස්ථානය වෙත ශුක්‍ර දායක පුං ගවයින් මිලදී ගැනීමේ ව්‍යාපෘතියට වෙන් කර තිබුණි. ප්‍රසම්පාදනයේදී සුදුසු ලංසුකරුවෙකු ඉදිරිපත් නොවීම මත එම ප්‍රතිපාදනයන්හි ඌන උපයෝජනය හේතුවෙන් සත්ත්ව අභිජනනය සහ ගොවිපොළ සංවර්ධන ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය සියයට 24.02 ක් ලෙස ඉතා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.	2023	අපේක්ෂිත කාර්යය සාධන මට්ටම ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.	අභිජනන සතුන් ආනයනය සඳහා දෙවතාවතක් ප්‍රසම්පාදන කටයුතු සිදු කලද දෙවනවර ලංසු විවෘත කිරීම 2023.09.04 දින සිදු කරන ලද අතර, සතුන් ආනයනය සිදු කළ නොහැකි බව දැනගත් විට නව අභිජනන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කාලය ප්‍රමාණවත් නොවුණි.	සත්ත්ව අභිජනනය සහ ගොවිපොළ සංවර්ධන නැවත ආරම්භකර නොතිබුණි.
21	සමාලෝචිත වර්ෂය අවසාන දිනට අලාභය අයකර ගැනීම ප්‍රමාදවීම හෝ අයකර ගැනීමට අපොහොසත් වීම මත සිද්ධින් 47 කට අදාළව ඉදිරියට ගෙන එනු ලබන අලාභ ශේෂයන් වූ රු.30,231,762 ක් සඳහා මු.රෙ.109 අනුව කටයුතු කර නොතිබුණි.	2023	මු.රෙ. අනුව අලාභ ශේෂයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.	මෙම සිද්ධීන් 47 න් 25 ක් සඳහා මේ වන විට මු.රෙ. 104 (4) අලාභයන් පිළිබඳ අවසන් වාර්තා ලබාගෙන ඇති අතර මු.රෙ.109 අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටින අතර ඉතිරි සිද්ධීන් 22	සිද්ධීන් 22 සම්බන්ධයෙන් ද මු.රෙ. 104 (4) අලාභයන් පිළිබඳ අවසන් වාර්තා ලබාගෙන මු.රෙ.109 අනුව කටයුතු කර නොතිබුණි.

				සම්බන්ධයෙන් ද මු.රෙ. 104 (4) අලාභයන් පිළිබඳ අවසන් වාර්තා ලබා ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.	
22	කෘෂිකර්ම අමාත්‍යාංශය පොහොර ලේකම් කාර්යාලයේ අධීක්ෂණ දුර්වලතා මෙන්ම සහනාධාර පොහොර ආනයනය වෙනුවෙන් දැරියයුතු මුදල් කෙටි කාලීන බැංකු ණය මගින් සැපයුම්කරුවන්ට ගෙවීම් කර එම ණය නියමිත කාලය තුළ නොපියවීම නිසා දිගුකාලීන ණය වලට පරිවර්තනය වීම හේතුවෙන් ආනයනයනික පොහොර පිරිවැයට අමතරව විශාල පිරිවැයක් ණය පොලී වශයෙන් දැරීමට සිදුව තිබුණි. 2023 වර්ෂයේ පොහොර සඳහා වන ප්‍රතිපාදන යටතේ සී/ස ලංකා පොහොර සමාගමෙ හා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ලබාගත් ණය වෙනුවෙන් පිළිවෙලින් රු.9,804,086,114 ක් හා රු.6,475,566,743 ක් ලෙස එකතුව රු.16,279,652,857 ක අමතර පොලී වියදමක් දරා තිබුණි. තවද රජයේ පොහොර සමාගම් දෙක යටතේ එකතු වටිනාකම	2023	සහනාධාර පොහොර ආනයනය අධීක්ෂණය සහ ඒ වෙනුවෙන් දැරියයුතු මුදල් නිසි වේලාවට මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කර පියවිය යුතුය.	රජයේ පොහොර සමාගම් විසින් ආනයනය කර ඇති පොහොර තොග සඳහා දින 180 කින් හෝ දින 270 කින් කල් පිරෙන පරිදි මහජන බැංකුව විසින් විවෘත කර ඇති ණයවර ලිපි සඳහා කල්පිරීමට නියමිත දිනට මහා භාණ්ඩාගාරය සතුව මුදල් ප්‍රතිපදන නොතිබීම හේතුවෙන් නියමිත දිනට ගෙවීම් පියවීමට නොහැකි වූ ණයවර ලිපි මහජන බැංකුව විසින් කෙටි කාලීන ණය බවට පරිවර්තනය කරනු ලබයි. කෙටි කාලීන ණය සඳහා මහජන බැංකුව විසින් අය කරන ලද පොළී මුදල සහ ආනයනය කරන ලද පොහොරවල පිරිවැය එකතු කොට මාසික වාරික හා පොළි ගෙවීමේ පදනම මත මහජන බැංකුව විසින් දිගු කාලීන ණය බවට පරිවර්තනය කරනු ලබයි. වර්තමානයේදී දිගු කාලීන ණය සඳහා අදාල මාසික වාරික හා පොළි ගෙවීම් නියමිත පරිදි සිදු කරනු ලබයි.	අධීක්ෂණ දුර්වලතා මෙන්ම කෙටි කාලීන බැංකු ණය මගින් සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීම තවදුරටත් සිදු වී ඇත.

	රු.3,723,072,859 ක උපචිත පොලී වටිනාකමක් දිගුකාලීන ණයට පරිවර්තනය කිරීමේදී ඒ තුළට ඇතුළත් කර තිබූ අතර ඒ හේතුවෙන් පොලිය මත පොලියක් ගෙවමින් පවතින බවද තවදුරටත් නිරීක්ෂණය විය.				
23	මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452 (1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම් වලින් පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කල යුතු අතර එම විමසුම් වලට වහාම පිළිතුරු ලබා දිය යුතු වුවත් ග්‍රාමීය ආර්ථික අංශයට 2023 වර්ෂය වෙනුවෙන් නිකුත් කළ විගණන විමසුම් 22 කට මෙම වාර්තාවේ දින දක්වා පිළිතුරු ලබාදී නොතිබුණි.	2023	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඉ) ප්‍රකාරව කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දි නොමැති විගණන විමසුම් 22 අතරින් විගණන විමසුම් 13 ක් ආර්ථික මධ්‍යස්ථාන වලට අදාල වන අතර ඉතිරි විගණන විමසුම් 9 ග්‍රාමීය ආර්ථික අංශයට අදාළ වේ. ග්‍රාමීය ආර්ථික අංශයට අදාල සියලුම විගණන විමසුම් සඳහා මේ වන විට පිළිතුරු ලබා දී ඇත. ආර්ථික මධ්‍යස්ථාන වලට අදාල විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දෙන ලෙස කළමනාකරණ භාර දැනුවත් කර ඇති අතර ඒ අනුව එම විගණන විමසුම් 10 කට පිළිතුරු සපයා ඇත.	විගණන විමසුම් 12 ක් සඳහා මේ දක්වා පිළිතුරු ලබා දී නොතිබුණි.
24	ග්‍රාමීය ආර්ථික අංශය විසින් කුරුඳුවත්ත,තඹුත්තේග ම,නුවරඑළිය, පිළියන්දල, නාරාහේන්පිට සහ රත්මලාන යන ආර්ථික මධ්‍යස්ථාන පිහිටි භූමිය මෙම වාර්තාවේ දින වනවිටත් විෂයභාර අමාත්‍යාංශය වෙත	2023	අදාළ ඉඩම් නිසි පරිදි විෂයභාර අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	විගණන නිරීක්ෂණ වල සඳහන් ආර්ථික මධ්‍යස්ථාන පිහිටි භූමි පවරා ගැනීමට අදාලව පෙර අයිතිකරුවන්ගේ එකඟතාවය ලබා ගැනීම සඳහා එම එක් එක් පාර්ශව වෙත ලිපි යොමු කර ඇත.	ආර්ථික මධ්‍යස්ථාන භූමි මේ දක්වා පවරාගෙන නොතිබුණි.

පවරාගෙන නොතිබුණි.

25	නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ අංක 7 හා 8 දරන ගබඩා පරිශ්‍ර 02 සඳහා කිසිදු බදු කුලියක් නොගෙවමින් රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව විසින් ව්‍යපාර කටයුතු පවත්වාගෙන ගොස් ඇතත් ඒවා සම්බන්ධයෙන් සොයා බලා ඊට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	නිසි පරිදි ගිවිසුම්ගතවී හිඟ කුලිය අයකර ගැනීම කළ යුතුය.	මුදල් අමාත්‍යාංශය විසින් 2024/05/22 දිනැති ලිපියෙන් වෙළඳ පරිශ්‍ර අංක 08 සඳහා හිඟ බදු කුලී ගෙවීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන ලෙස රාජ්‍ය වානිජ නීතිගත සංස්ථාවට උපදෙස් ලබා දී ඇත. වෙළඳ පරිශ්‍ර අංක 07 සඳහා නව බදු ගිවිසුමක් සකස් කිරීමට නීති නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත.	වෙළඳ පරිශ්‍ර අංක 07 හා 08 සඳහා බදු කුලී අය කර නොතිබුණි.
26	කුරුඳුවත්ත, දඹුල්ල සහ නාරාහේන්පිට යන ආර්ථික මධ්‍යස්ථානවල 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර පරිශ්‍ර හිඟ කඩ කුලී හා දඩ කුලී රු.153,476,465 ක් හිඟව තිබුණි.	2023	හිඟ කඩ කුලී හා දඩ කුලී අයකර ගැනීමට පියවර ගත යුතුය.	හිඟ කඩකුලී කඩිනමින් අය කර ගන්නා ලෙස කළමනාකරණ භාරය දැනුවත් කර ඇත.මෙම හිඟ හිටි කඩකුලී පිළිබඳව විමර්ශනයක් සිදුකර ඒ පිළිබඳව කාල විශ්ලේෂණයක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස අභ්‍යන්තර විගණන අංශය වෙත යොමු කිරීමට කටයුතු කරමි.	හිඟ කඩ කුලී හා දඩ කුලී අයකර ගෙන නොමැත.

3.19 වී හා ධාන්‍ය,කාබනික ආහාර,එළවළු, පළතුරු,මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	410,502,549	381,977,785	28,524,764	-	තත්ත්වාගණනය නොකළ
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

2021 වර්ෂයේදී මෙම රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි කර ඇත.

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතන විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ තත්ත්වය
	ජීවතුරු උදාන ජාතික වැඩසටහන				
1	ගර්භනී මව්වරුන්, කිරිදෙන මව්වරුන් හා වයස අවුරුදු 5 ට අඩු ළදරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම අරමුණු කරගනිමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව “ජීව තුරු උදාන” ජාතික වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා 2021 මැයි මස 04 දිනැති අංක අමප/21/0689/323/026 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබා දී තිබුණි. මේ යටතේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ සහයෝගයෙන් සෑම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර	2021	පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බැලිය යුතුය.	2021 වර්ෂයේදී මෙම රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි කර ඇත.	පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බලා වාර්තාව විගණනය වෙත ඉදිරිපත්කර නොමැත.

	වසමකම තෝරාගත් ප්‍රතිලාභී පවුල් 100 ක් වන පරිදි මුරුංගා පැළ දසලක්ෂයක් ගෙවතු දසලක්ෂයක සිටුවීම සඳහා 2021 වර්ෂයේදී රාජ්‍ය අමාත්‍යාංශයේ ආහාර සුරක්ෂිතතාවය වැය විෂයගෙන් රු.මිලියන 55.62ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 41.96 ක් පිරිවැයවූ මුරුංගා පැළ 999,211 ක් බෙදා හැර තිබුණි. ඒ පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.				
(අ)	අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද 2021 අප්‍රේල් 06 දිනැති අංක Pa/36/2021 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජනා අංක 3:2 යටතේ ඉහත වැඩසටහනට අවශ්‍ය මුරුංගා බීජ පැළ දිස්ත්‍රික්කයේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළ තවාන් 33 තුළින් සපයා ගැනීමට ප්‍රමුඛත්වය ලබා දීමට හා එසේ නොහැකි වූ විට පමණක් ලියාපදිංචි පෞද්ගලික පැළ තවාන්කරුවන්ගෙන් මිලදී ගැනීමට යෝජනා කර තිබුණි. එහෙත් උක්ත වැඩසටහන සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළතවාන් වලින් මුරුංගා පැළ මිලදී ගැනීම සඳහා කෘෂිකර්ම	2021	පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බැලිය යුතුය.	2021 වර්ෂයේදී මෙම රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි කර ඇත.	පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බලා වාර්තාව විගණනය වෙත ඉදිරිපත්කර නොමැත.

	දෙපාර්තමේන්තුව හෝ දිස්ත්‍රික් පැළතවාන් සමඟ සාකච්ඡා කළ බවට කිසිදු ලේඛනයක් ලිපිගොනුව තුළ අන්තර්ගත වී නොතිබුණු හෙයින් අමාත්‍ය මණ්ඩල නිර්දේශයන්ට පටහැනිව පෞද්ගලික පැළ තවාන්කරුවන්ගෙන් පමණක් මුරුංගා පැළ මිලදී ගැනීමට ක්‍රියාකර තිබූ නමුත් පැළ තවාන් කරුවන් තෝරාගත් පදනම පැහැදිලිකර නොතිබුණි.				
(ආ)	අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජනා අංක 3.3 හා 3.4 අනුව දිස්ත්‍රික්කය තුළ පැළ අවශ්‍යතාවය සපුරා ගැනීමේදී දිස්ත්‍රික්කයේ සියලුම ලියාපදිංචි පැළ තවාන්කරුවන්ට අවස්ථාව සැලසෙන පරිදි දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් මගින් ඒ ඒ පැළ තවාන් වලින් මිලදී ගනු ලබන පැළ ප්‍රමාණය තීරණය කළ යුතුව ඇතත් එවැනි දිස්ත්‍රික් කමිටු පිහිටුවීමකින් තොරව සහ දිස්ත්‍රික් පැළ තවාන්කරුවන්ගෙන් මිලදී නොගෙන තෝරාගත් පැළ තවාන්කරුවන් 15දෙනෙකුගෙන් පමණක් පැළ මිල දී ගැනීමට කටයුතු කර තිබුණි.	2021	පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බැලිය යුතුය.	2021 වර්ෂයේදී මෙම රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි කර ඇත.	පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බලා වාර්තාව විගණනය වෙත ඉදිරිපත්කර නොමැත.
(ඇ)	පැළ සපයා ඇති පැළ	2021	පරීක්ෂණයක්	2021 වර්ෂයේදී මෙම	පරීක්ෂණයක්

	තවාන් කරුවන් 15දෙනා අතරින් පැළ තවාන්කරුවන් 4 දෙනෙකු සපයා ඇති700,000 කට අධික පැළ ප්‍රමාණයන් සැලකිල්ලට ගැනිමේදී මෙම ව්‍යාපෘතිය සඳහා පැළ සැපයීමට පූර්ණ සූදානමකින් කටයුතු කර ඇති බව හා එම පැළ තවාන්කරුවන් වෙතින් මිලදී ගැනීමට සැලසුම් සහගතව ක්‍රියාකර තිබුණි.		සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බැලිය යුතුය.	රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි කර ඇත.	සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බලා වාර්තාව විගණනය වෙත ඉදිරිපත්කර නොමැත.
(ඇ)	දිස්ත්‍රික් කෘෂිකර්ම දෙපාර්තමේන්තු තොරතුරු වලට අනුව ක්ෂේත්‍රයේ සිටුවීම දක්වා පැළයක් සකස් කිරීමට ගතවන කාලය සති 06ක් හා පැළයක පිරිවැය ආසන්න වශයෙන් රු 24.ක් විය . අදාළ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම දක්වා ප්‍රවාහනයද ඇතුළුව මුළු පිරිවැය රු30.කට වඩා අඩුවේ .ඒ අනුව සති 06කට පෙර ව්‍යාපෘතිය සැලසුම් කර කෘෂිකර්ම දෙපාර්තමේන්තු පැළ තවාන් මගින් පැළ සපයා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් මිලදීගත් පැළ තොගයෙන් රජයට ආසන්න වශයෙන් රු 11,990,532.ක පාඩුවක් සිදු වී තිබුණි.	2021	පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බැලිය යුතුය.	2021 වර්ෂයේදී මෙම රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි කර ඇත.	පරීක්ෂණයක් සිදුකර අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සොයා බලා වාර්තාව විගණනය වෙත ඉදිරිපත්කර නොමැත.

3.20 ජනමාධ්‍ය අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	418,505,210	8,041,215	410,463,995	(1,052,573,541)	තත්ත්වාගණනය කළ
2022	411,930,604	8,155,211	403,775,392	(264,719,303)	තත්ත්වාගණනය කළ
2023	419,349,984	7,231,771	412,118,212	(277,190,849)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
1	ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වානිජ වැඩසටහන් බද්දේ හිඟ මුදල වූ රු.25,220,500 අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි .	2023	හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් අදාල ආයතන සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පැවතීම.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් හිඟ මුදල් අය කර ගෙන නොතිබුණි.
2	ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය 2014 ආරම්භ කළද ක්‍රියාත්මක නොවීම නිසා නැවත 2021 වර්ෂයේ කැබිනට් මණ්ඩල තීරණයක් පරිදි යාවත්කාලීන කරන ලද අතර, තාක්ෂණය සමග ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී තිබුණි. ඒ තුලින් රට පුරා විසිරී පවතින විකාශනාගාර 16 ක් ස්ථාපිත කිරීමට නියමිත වුවත්, 2024	2022 2023	ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට පියවර ගත යුතුය.	JICA ආයතනය විසින් අරමුදල් නිදහස් කිරීම තාවකාලිකව නවතා තිබු හෙයින් උපදේශක ආයතනය සමඟ ගිවිසුම් ගත විමට 2024.05.31 වන දින වන විටත් නොහැකි වී ඇත. එසේ වුවද, 2024.07.24 වන දින සිට JICA ආයතනය විසින් අරමුදල් නිදහස් කිරීම ආරම්භ කර ඇති අතර උපදේශක ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කළ පසු ව්‍යාපෘතියට අදාළ	2024 සැප්තැම්බර් 30 දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

	මැයි 31 වන විටත් එක් විකාශනාගාරයක් හෝ ස්ථාපිත කිරීමට නොහැකිවී තිබුණි.			විකාශනාගාර ස්ථාපිත කිරිමේ කටයුතු ආරම්භ කළ හැකි බව දන්වා ඇත.	
3	අමාත්‍යාංශයට අයිතියක් නොමැති රථයක අලුත්වැඩියාව පිළිබඳව යාන්ත්‍රික ඉංජිනේරු විසින් ලබාදී ඇති නිරීක්ෂණය අනුව රථයේ ඉන්ධන වලට ජලය කාන්දුවීම හා ඉන්ධන ටැංකියේ ඉන්ධන අවසන් වනතෙක් ධාවනය කිරීම මෙම අලුත්වැඩියාව සඳහා හේතු වී ඇති බැවින් වගකිවයුතු පුද්ගලයන් හඳුනා ගැනීමට අවධානය යොමු නොකර අලුත්වැඩියාව සඳහා රු.1,687,250 ක් වැයකර තිබුණි.	2022 2023	වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම රථයේ අදාළ හානියට වගකිව යුතු පාර්ශවය නිශ්චිතව හඳුනාගත නොහැකි වී ඇත.	වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.

3.21 අධ්‍යාපන අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	174,872,432,187	1,142,846,540	173,729,585,647	-	තත්ත්වාගණනය කළ
2022	179,269,510,539	907,150,167	178,362,360,372	-	තත්ත්වාගණනය කළ
2023	183,598,521,049	1,143,979,782	182,454,541,267	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	නියැදි පරීක්ෂාවට අනුව දිවයිනේ පාසල් 26 කට අයත් අක්කර 49 රූඩ් 02 පර්.33ක්ද, ගුරු විද්‍යාල 03කට අයත් අක්කර 07 රූඩ් 01 පර්චස් 25 ක් හා විද්‍යාපීඨයක් සතුව පැවති අක්කර 91 පර්චස් 24 ක්ද අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් භුක්ති විදිමින් පැවතුණද ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.	2021	වත්කම් කළමනාකරණය මනාව සිදුකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.	අදාළ ප්‍රාදේශීය ලේකම් හා සම්බන්ධීකරණය වී ගැටළුව විසදා ගැනීමට කටයුතු කරන ලෙස විදුහල්පතිවරුන් හා පීඨාධිපතිවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන බව.	බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් භුක්ති විදින ඉඩම්වල භුක්තිය ලබාගෙන නොතිබුණු අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉඩම් කළමනාකරණයට විධිමත් වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණි.

2	ජාතික පාසල් සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී ජාතික පාසල් 13ක භාවිතයට ගත හැකි තත්ත්වයේ පවතින නිල නිවාස 13ක් භාවිතයෙන් තොරවද, ජාතික පාසල් 21ක නිල නිවාස අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් භාවිතයට ගත නොහැකිවද, ජාතික පාසල් 06ක නිල නිවාස අලුත්වැඩියා කර හෝ භාවිතයට ගත නොහැකි ලෙස අබලන් තත්ත්වයෙන්ද පැවතුණි. එසේම එවැනි නිල නිවාස පාසලේ විවිධ වූ වෙනත් කාර්යයන් සඳහා යොදාගන්නා අවස්ථා 10ක් පැවතුණි.	2021	නිල නිවාස කළමනාකරණය මනාව සිදු කිරීමට කටයුතු කළ යුතුය.	විදුහල්පතිවරුන් වෙත උපදෙස් ලබා දීමට කටයුතු කරන බව.	නිල නිවාස භාවිතයට ගත හැකි ලෙස අලුත්වැඩියාවන් සිදුකර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.
3	විගණනය වෙත ඉදිරිපත් කර තිබූ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 10ක තොරතුරු අනුව විද්‍යාපීඨ වලට අයත් නිල නිවාස 17ක වෙනත් රාජ්‍ය ආයතන වල සේවය කරනු ලබන නිලධාරින් පදිංචි වී සිටින අතර, විද්‍යාපීඨ 2කට අයත් ඉඩම් අනවසරෙන් අත්පත් කරගෙන තිබුණි.	2021	අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.	පීඨාධිපතිවරුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර ඉඩම් අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලීමට කටයුතු කරන බව.	අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

4	නාගරික සංවර්ධන අධිකාරියට අයත් හෙක්ටයාර 1.9320 ක භූමි ප්‍රමාණයක රු. මිලියන 1098.24 ක් වැය කර අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ආරක්ෂක සේවා විද්‍යාලය ඉදි කර තිබුණද, ඉඩමේ නෛතික අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට හා වටිනාකම ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	2021	නෛතික අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.	මුදල් ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් ප්‍රතිපාදන ඉල්ලා අයවැය අධ්‍යක්ෂකට 2024 ජූලි 09 දින ලිපියක් යොමු කර ඇත.	නෛතික අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොමැත.
5	රජයට අයත් සෑම රථයක්ම භාවිතා කරන ආයතනය නමින් ලියාපදිංචි කළ යුතු වුවත් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වාහන 08 ක් අමාත්‍යාංශය විසින් භාවිතා කළද ඒ සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.	2022	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර මේ වන විට වාහන 25 ක් එපරිදි කටයුතු කර නොතිබුණි.
6	2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල අධ්‍යාපන අමාත්‍යාංශය විසින් භාවිතයෙන් ඉවත් කල වාහන 2022 වර්ෂය වනතෙක් අපහරණය කිරීමක් සිදු කර නොතිබුණි.	2022	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	අපහරණය කළ යුතු වාහන හදුනා ගැනීමට කටයුතු කර ඇත.	අපහරණය කළ යුතු ලෙස හඳුනාගෙන තිබූ වාහන 14 ක් භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර අපහරණය කර නොතිබුණි.

7	ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව ලැයිස්තුගත ජාතික පාසල් 64ක් සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරින් විදුහල්පතිවරුන් වශයෙන් පත් කළ යුතුව තිබුණු නමුත් පාසල් 30 කට අදාළව එපරිදි පත්කිරීම් සිදු කර නොතිබුණි.	2022	ලැයිස්තුගත ජාතික පාසල් සඳහා ගැසට් පත්‍රය ප්‍රකාරව විදුහල්ප තිවරුන් පත් කිරීමට කටයුතු කළ යුතුය.	පුරප්පාඩු පාසල් 50 ක් සඳහා විදුහල්පතිවරුන් පත්කර ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.	පාසල් 38 ක් සඳහා මේ වන විටත් පත්කිරීම් සිදු කර නොතිබුණි.
8	2019 වර්ෂයේ නිල්වලා විද්‍යාපීඨය විසින් බාහිර ආයතන වෙත සැපයූ සේවා වෙනුවෙන් අයකරන ලද රු.589,900 ක මුදලක් විද්‍යාපීඨයේ නිල බැංකු ගිණුමට බැර කර නොතිබුණි.	2022	අයකරන ගාස්තු/ ආදායම් විද්‍යාපීඨයේ නිල බැංකු ගිණුමට බැර කිරීමට කටයුතු කළ යුතුය.	විමර්ශනයක් සිදු කිරිමට කටයුතු කර ඇත.	විමර්ශන වාර්තාව ඉදිරිපත් කර නොමැති අතර මේ වන විටත් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
9	විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අධ්‍යාපන පහසුකම් සැපයීම ඇතුළුව ළමයින් සඳහා අන්තර්කරණය අධ්‍යාපනය ලබාදීම පිළිබඳව 2020 දෙසැම්බර් 03 දින අංක 37/2020 දරන චක්‍රලේඛය සමඟ උපදෙස් සංග්‍රහයක් නිකුත් කර තිබුණද උපදෙස් සංග්‍රහයේ ඇතුළත් කාර්යයන් ඉටුකිරීමට අපොහොසත් වී තිබුණි.	2022	චක්‍රලේඛය ප්‍රකාරව උපදෙස් සංග්‍රහයේ ඇතුළත් කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය.	පළාත්වල ගුරුවරුන් පුහුණු කිරීම, අධ්‍යාපනය ලබා දීමට අවශ්‍ය පරීක්ෂණ ක්‍රම අන්තර්ජාතිකව පිළිගන්නා ආකාරයට සකස් කිරීමට පියවර ගනිමින් පැවතීම.	උපදෙස් සංග්‍රහයේ ඇතුළත් කාර්යයන් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

10	විශේෂ අවශ්‍යතා ඇති ළමුන් වෙනුවෙන් කහතුඩුව වෙනිවැල්කොළ ප්‍රදේශයේ විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානයක් නිර්මාණය සහ ඉදිකිරීම් (Design & Built) ක්‍රමයට ඉදිකිරීමට 2017 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවකුට රු.247,252,882ක් ලබාදී තිබුණද කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර අවශ්‍යතාවය පිළිබඳ සැලකිලිමත් නොවීම හේතුවෙන් අවශ්‍යතාවය ඇති ළමයින්ට උචිත ලෙස ඉදිකිරීම් සිදුකර නොතිබුණි.	2022	අවශ්‍යතාවයට අනුකූලවන ලෙස ඉදිකිරීම් සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුය.	වෙනත් කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා ඉටු කර ගනිමින් පවතී.	අඩුපාඩු සහිතව 2019 අගෝස්තු 09 දින විවෘත කර වසර 04 ක කාලයක් ගත වුවද මේ වන විටත් ළමුන්ගේ උපයෝජනය සඳහා විධිමත්ව යොදවා නොතිබුණි. තවද අඩුපාඩු සම්පූර්ණ කිරීමට නව කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණි.
11	අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය 2020 වර්ෂයේ පිහිටුවා 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා එකතුව රු. 5,219,297,390 ක් වැය කර තිබුණද සැලසුම් කළ පරිදි ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමට අපොහොසත් වී තිබුණි. 2022 වර්ෂයේ රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී තිබුණු අතර විෂය පථයට අයත් ව තිබූ කාර්යයන් හා කර්තව්‍යයන් එදින සිට අධ්‍යාපන අමාත්‍යාංශය	2022	අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ ඇති වැදගත්කම සැලකිල්ලට ගෙන ඊට ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය.	අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම , විෂය මාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පැවතීම.	අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට මේ වන විටත් අපොහොසත් වී තිබුණි.

	යටතට පවරා තිබුණි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් වෙනුවෙන් පසුගිය වර්ෂ 03 තුළ දී රාජ්‍ය අමාත්‍යාංශය විසින් දරන ලද ඉහත මුදල හා ජාතික අධ්‍යාපන ආයතනය විසින් දැරූ රු.350,552,393 ක වියදමද ඇතුළුව දරන ලද රු.5,569,849,783ක් වූ වියදම නිශ්කාර්ය වියදමක් වීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය කෙරේ.				
12	353ක් වූ ජාතික පාසල් සංඛ්‍යාව දහසක් (1000) දක්වා ඉහළ නැංවීම අරමුණු කරගෙන ඇති කළ වැඩ සටහන යටතේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය තුළදී පාසල් 622 ක අන්තර්ජාල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රු.මිලියන 576 ක් ද කාන්තා හා ළමා සංවර්ධන පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය මඟින් පාසල් 831 ක් සඳහා භෞතික යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රු.මිලියන 44.7ක් ද උපකරණ	2022	සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කර රාජ්‍ය මුදල් ඵලදායි ලෙස වැය කිරීමට කටයුතු කළ යුතුය.	මෙම ව්‍යාපෘතිය නතර කිරීමට කටයුතු කර ඇත.	සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

	මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 20.5 ක් ද ලෙස රු.මිලියන 2285.2 ක් වැයකර තිබුණද පාසල් 22 ක් පමණක් ජාතික පාසල් බවට පත්කර තිබුණි.				
13	අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේදී සකස් කළ පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සැලසුම් කළ කාර්යයන් සම්පූර්ණ කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි.	2022	සැලසුම් කළ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	කමිටු පත්කර සාකච්ඡා කරමින් පවතී.	නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
14	2019 වර්ෂයේ සිට හඳුනාගන්නා ලද ජාතික වෘත්තීය පහසුකම් මට්ටම් 07 කින් යුත් වර්තමාන ක්‍රමය මට්ටම් 10 දක්වා වැඩි කිරීම හා 2020 වර්ෂයේ සිට හඳුනාගෙන තිබූ පශ්චාත් උපාධි මට්ටම දක්වා වෘත්තීය අධ්‍යාපනය හැදෑරීමට අවස්ථා ලබාදීම යන කාර්යයන් 2023 ජූලි 31 දක්වාම ඉටුකර නොතිබුණි.	2022	සැලසුම් කල පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	සැලසුම් කල පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.
15	2013/2014 වර්ෂයේදී පත්තලගෙදර උපකරණ ගබඩාවේ රු. 12,905,806ක් ලෙස වාර්තා ගතව ඇති අක්‍රමිකතාවය, 2015 වර්ෂයේ මීග/නිවුස්ටඩ්	2022	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුය.	පත්තලගෙදර අක්‍රමිකතාවය, සඳහා කමිටුවක් පත් කිරීමට කටයුතු කිරීම. අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර මේ වන විටත් අක්‍රමිකතාවයට අදාළ මුළු මුදලම අයකර නොතිබුණි.

	බාලිකා විදුහලේ සිදුවී ඇති බවට වාර්තා වී ඇති කුවිතාන්සි පොත්වල සිදුවූ රු. 4,510,409 ක් වූ අක්‍රමිකතාවය හා මීගමුව හරිස්චන්ද්‍ර ජාතික පාසලේ පාසල් සංවර්ධන සමිතියට ලද මුදල් බැංකුගත කිරීමේදී සිදුවී ඇති අක්‍රමිකතාවයෙන් තවදුරටත් අයවිය යුතු රු.1,384,225 කට අදාළව එකතුව රු.18,800,440 ක් සම්බන්ධයෙන් මු.රෙ.104 පරිදි කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද අපොහොසත් වී තිබුණි.				
16	2016 පෙබරවාරි 11 දිනැති අංක අමප/16/0167/716/008 දරන කැබිනට් පත්‍රිකාවෙන් ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට ලබාදී තිබූ අනුමැතිය මත හෝමාගම පිටිපන පිහිටි නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් කොටස පවරා ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු. මිලියන 280 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි අයිතිය අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2022	නාගරික සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කර ඉඩමේ අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.	අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

17	විශේෂ අධ්‍යාපන අංශයක් ඇති පාසල්වල ළමුන් සහ ගුරුවරුන් 5:1 අනුපාතයට අනුව සිටිය යුතු වුවත් පලාත් 09 හි පාසල් 55 ක ගුරුභවතුන් 66 දෙනෙකුගේ අතිරික්තයක් හා පාසල් 212 ක පුරප්පාඩු 349 ක් පැවතුණි. තවද විශේෂ අධ්‍යාපනය සමබන්ධව පුහුණුව සහිත ගුරු පත්වීම් ලබා සිටින නමුත් වෙනත් විෂයයන් ඉගැන්වීම් කටයුතු වල නිරත වන ගුරුභවතුන් 147 දෙනෙක් පාසල් 135ක සිටින බව නිරීක්ෂණය වූ අතර එම ගුරුභවතුන් සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 13 දිනැති අංක 37/2020 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයෙහි උපදෙස් පත්‍රිකාවේ 12 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2022	ගුරු තුලනය ඇතිවන පරිදි කටයුතු කල යුතුය.	අතිරික්තය ගුරුවරුන් පුරප්පාඩු මත පාසල් වෙත යොමු කරමින් පැවතීම.	ගුරු තුලනය ඇතිවන පරිදි කටයුතු සිදු වී නොමැත.
18	භාණ්ඩාගාර ලේඛණ අනුව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.176,407,862,390 ක් වූ අතර 2023 ජනවාරි 01 දිනට එම ශේෂය රු.173,918,252,522 ක් වීමෙන් රු. 2,489,609,868ක වෙනසක් පැවතුණි.	2023	අවසන් හා ආරම්භක ශේෂ සමාන වන ලෙස නිවැරදිව ගිණුම් පිළියෙල කල යුතුය.	නිවැරදි කිරීමට අවශ්‍ය තොරතුරු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණි.	නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.

19	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතනයන්හි නිලධාරීන් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර පැමිණීම හා පිටවීම සලකුණු කල යුතු බවත් පැමිණීම හා පිටවීම සඳහා ලේඛණයක් නඩත්තු කරන්නේ නම් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීමේ ක්‍රමයට අමතරව කළ යුතු බව දක්වා තිබුණු නමුත් පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයෙන් සනාථ කිරීමට පාසල් කිහිපයක කටයුතු කර නොතිබුණි.	2023	අදාල චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතුය.	විදුහල්පතිවරුන් දැනුවත් කිරීමට කටයුතු සිදු කර ඇත.	නිර්දේශය ප්‍රකාරව කටයුතු සිදු වී නොතිබුණි.
20	2017 අප්‍රේල් 27 දිනැති හා අංක EST-EXAMS-05-1007- 06 දරන ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව රාජකාරියේ නියුතු නිලධාරින්ට උපරිම පැය 03 කට යටත්ව හා විශ්‍රාමික නිලධාරින්ට උපරිම පැය 6 කට යටත්ව සම්පත්දායක දීමනා ගෙවීමට නිර්දේශ කර ඇති නමුත් එම විෂයානුබද්ධ රාජකාරියට අයත් විවිධ අත්පොත් සැකසීම, මාර්ගෝපදේශ සංග්‍රහයන් සකස් කිරිම, චක්‍රලේඛ සකස් කිරීම , ගුරු පුහුණු මොඩියුල් සකස් කිරීම වැනි	2023	ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව කටයුතු කල යුතුය.	විගණන හා කළමනාකරණ කමිටුවේදී මේ ගැන විධිමත් චක්‍රලේඛයක් සහ මාර්ගෝපදේශයක් සකස් කළ යුතු බව කමිටුව විසින් ප්‍රකාශ කිරීම.	නිර්දෙශ ක්‍රියාත්මක වී නොතිබුණි.

	දේශන ස්වරූපයේ නොවන කාර්යයන් වෙනුවෙන් සහභාගි වූ නිලධාරීන් සඳහා 2023 වර්ෂයේදී සම්පත් දායක දීමනා ලෙස ලිපියේ උපදෙස්වලට පටහැනිව රු.7,418,540 ගෙවා තිබුණි.				
21	2007 දෙසැම්බර් 13 දිනැති අංක 20/2007 දරන චක්‍රලේඛය ප්‍රකාරව වඩාත් පහසු පාසල් වර්ගීකරණයට අයත් පාසලක ගුරුවරයෙකුගේ සේවා කාලය උපරිම අවුරුදු 6 ක් ලෙස නියම කර තිබුණද පරීක්ෂා කරන ලද වඩාත් පහසු පාසල් 04ක වසර 10 ට වැඩි සේවා කාලයක් ඇති ගුරුභවතුන් 113 ක් සේවයේ නිරත වී තිබුණි.	2023	ජාතික පාසල් ගුරුවරුන් සම්බන්ධ වාර්ෂික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය ප්‍රකාරව නියමිත කාලය සම්පූර්ණ කළ ගුරුවරුන් ස්ථාන මාරුකිරීම්වලට යටත් කළ යුතුය.	ගුරු මාරු ප්‍රතිපත්තියේ කොන්දේසි ඇතුළත් කිරීමට කටයුතු කර තිබුණි.	නිර්දේශය පරිදි ස්ථාන මාරුවීම් සිදුවී නොතිබුණි.
22	2016 මාර්තු 29 දිනැති ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SESIP) යෝජනා ක්‍රමයේ II අදියර ගිවිසුම් 3.2 ඡේදයේ වගන්තිය (f) අනුව II වැනි ගිණුම් වර්ෂය අවසන් වී තුන් මාසයක් ඇතුලත SEPI Loan Scheme – Phase 11 සම්බන්ධයෙන් ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ වගකීම මහ බැංකුව සතු වියයුතු වුවත් 2016 සිට 2024 නොවැම්බර්	2023	නියමිත දිනට ගිණුම් වාර්තා විගණකාධිපති වෙත එවීමට කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	නිර්දේශය ක්‍රියාත්මක වී නොතිබුණි.

	දක්වාම එසේ කටයුතු කර නොතිබුණි.				
23	1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත ප්‍රකාරව රජයට පවරාගත් පාසල්වල දේපල අධ්‍යාපන අමාත්‍යාංශය සතු වන අතර මෙම පනතට අනුව අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දේපල වෙනත් පුද්ගලයෙකුට බදුදීම අනුමත කිරීමට බස්නාහිර පළාත් සභාවට නෛතික හැකියාවක් නොමැත. එසේ වුවද බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පර්චර්ස් 40 කින් යුත් කො/පිංවත්ත උපනන්ද පාසලේ භූමිය හා ගොඩනැගිලි 2008 නොවැම්බර් 01 දින සිට වසර දෙකක කාලයක් සඳහා පෞරාණික රූකඩ කලා ආයතනයක් පවත්වාගෙන යාමට පුද්ගලයෙකු වෙත බදු දීමට කටයුතු කර තිබුණු අතර බදු කාලය අවසන් වී තිබුණද දේපල නැවත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. පාසලක් වැසීම පාසල් ව්‍යුහ කමිටුවේ අනුමැතිය අනුව සිදුකළ යුතු වුවත් මෙම පාසල	2023	අධිකරණ නියෝග අනුව කටයුතු කර දේපල පවරා ගත යුතු අතර මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී සිදු නොවීමට අවශ්‍ය චක්‍රලේඛ විධිවිධාන මගින් අදාල පාර්ශවයන් දැනුවත් කළ යුතුය.	ඉඩම් අධ්‍යාපන කාරයයන් සඳහා යොදවා ගැනීම සම්බන්ධයෙන් යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කරන ලෙස බස්නාහිර පළාත් අධ්‍යක්ෂ අමාත්‍ය ලේකම්ට දන්වා ඇත. ඉඩමෙන් ඉවත් කිරීම සඳහා නීති මාර්ගයෙන් කටයුතු කරන ලෙස විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී දැනුම් දෙන ලදී.	නිර්දේශය ක්‍රියාත්මක වී නොතිබුණි.

	වසා දැමීම සම්බන්ධයෙන් පළාත් පාසල් ව්‍යුහ කමිටු අනුමැතියක් ලබාගෙන නොතිබුණි. මේ හේතුවෙන් ඉහළ වටිනාකමකට මිල කළ හැකි රජයේ ඉඩමක් බාහිර පුද්ගලයෙකුට අනවසරයෙන් භුක්ති විඳීමට ඉඩකඩ ලැබී තිබුණි.				
24	විදේශ සේවානියුක්ති කාර්යාංශය වෙතින් අවස්ථා 02 කදී ලැබී තිබූ රැකියා අවස්ථා 65,657 න් තවදුරටත් පුහුණුලාභීන් යොමුකළ හැකිව තිබූ රැකියා අවස්ථා 33,596 ක් වූ අතර ඒ සඳහා පුහුණුලාභීන් යොමු කිරීමට පියවර ගෙන නොතිබුණි.	2023	විදේශ රැකියා ක්ෂේත්‍රය තුල ඉහල ඉල්ලුමක් පවතින රැකියා සඳහා පුහුණුලාභීන් යොමු කිරීමට කටයුතු කළ යුතුය.	නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
25	සූර්ය පැනල මූලාකෘති ව්‍යාපෘතීන් නිෂ්පාදනය සඳහා පහසුකම් සපයා දෙන විද්‍යා තාක්ෂණ සහ පර්යේෂණ අධ්‍යාපනික පුහුණු වැඩසටහන සඳහා 2016 අප්‍රේල් 06 දින ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදී තිබුණි. දේශීය අරමුදල් රු.මිලියන 240 ක දායකත්වයෙන් 2017 වර්ෂයේදී ආරම්භ වූ මෙම ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 47 ක් පමණක් විය. ක්ෂේත්‍රයේ සිටින සූර්ය	2023	ව්‍යාපෘතියේ අරමුණුවලට අප්‍රමාදව ලඟාවීමට කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	පැනල පිළිබඳ කාර්මිකයින් **(Solar Technicians)** 3,500 එක් කර ගැනීමට හා විශ්වවිද්‍යාලවල විදුලි බලය ජනනය කිරීම සඳහා යොදාගත හැකි සූර්ය පැනල 10 ක් නිපදවීම මෙහි අරමුණු වුවද මේ දක්වා අවුරුදු 07 ක් ගත වී තිබියදීත් නිපදවා තිබුණේ **Laboratory Scale Prototype Solar Panel** 04 ක් පමණි.				
26	කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ තාක්ෂණික පුහුණු කටයුතු වැඩිදියුණු කිරීම පිළිබඳ ඔස්ට්‍රියානු ව්‍යාපෘතිය යටතේ සැලසුම් කර ඉදිකිරීමේ ක්‍රමවේදය අනුව ඉදිකළ තුන්මහල් නව ගොඩනැගිල්ලක් සහ වැඩහල් ගොඩනැගිල්ල 2021 පෙබරවාරි මසදී වැඩ අවසන් කර භාවිතයට ගෙන තිබූ අතර එම වර්ෂයේදීම දෙසැම්බර් 31 දිනට රු.274,405,114 ක් අඩුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර තිබුණි.මෙම ව්‍යාපෘතියෙන් කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය වෙත ලැබිය යුතු රු.13,730,656 ක පුහුණු උපකරණ ආයතනය වෙත ලැබී	2023	සම්පත් උපරිම කාර්යක්ෂමතාව යෙන් හා ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	නොතිබුණි.				
27	ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ අනෝන්‍ය එකඟතාවය මත අවසන් කල රු.367,341,909 ක් වටිනා කර්මාන්ත 45 ක්ද, ප්‍රතිපාදන සීමාවීම මත කොටසක් ඉදිකල රු.351,839,473 ක් වටිනා කර්මාන්ත 32 ක්ද මධ්‍යම පළාත තුල සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවතුණි.	2023	ආරම්භ කරන ලද ව්‍යාපෘති නියමිත පරිදි අවසන් කර අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට කටයුතු කල යුතුය.	මුදල් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට කටයුතු කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර කරමින් පවතී.
28	ද්විතීයික පාසල් 1000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩ සටහන යටතේ පාසල් තුළ තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළව අතරමඟ වැඩ නවතා දමා තිබුණු විද්‍යාගාර තුනක් වූ අතර ඒ සඳහා රු. 24,689,403ක් වැය කර තිබුණි.	2023	ආරම්භ කරන ලද ව්‍යාපෘති නියමිත පරිදි අවසන් කර අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට කටයුතු කල යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර කර නොතිබුණි.
29	**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය.** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල (KFAED) සමඟ උසස් අධ්‍යාපන අංශය විසින්	2023	ව්‍යාපෘතියේ අරමුණු වලට ළඟා විය හැකි පරිදි ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට අදාල නිලධාරීන් වගබලා ගත යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශය ප්‍රකාරව කටයුතු කර කර නොතිබුණි.

	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2016 මාර්තු 24 දින අත්සන් තබන ලද අංක 940 දරන ණය ගිවිසුම යටතේ ක්‍රියාත්මක වේ. එමඟින් කුවේට් ඩිනාර් මිලියන 10ක ණය මුදලක් මෙම ව්‍යාපෘතිය සඳහා ලබාදීමට එකඟ වී තිබුණි. පීඨ ගොඩනැඟිලි සංකීර්ණ ඉදිකිරීම අවසන් කර තිබුණද ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් අක්‍රියවී තිබුණු අතර එහි භෞතික ප්‍රගතිය සියයට 10 මට්ටමේ පැවතුණි. ව්‍යාපෘතිය තුළින් මිලදී ගතයුතු ඉගෙනුම් උපකරණ මිලදී ගැනීමේ ප්‍රගතිය සියයට 40 මට්ටමේ පැවති අතර 2022 ජූනි 08 වන දින සිට ණය මුදල ලබාදීම අත්හිටුවා තිබුණු බැවින් ව්‍යාපෘති කටයුතු තාවකාලිකව නතර කර තිබුණි .				
30	2016 පෙබරවාරි 11 දිනැති කැබිනට් පත්‍රිකාවෙන් ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට ලබාදී තිබූ අනුමැතිය මත අවශ්‍ය ඉඩම් කොටස පවරා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු.මිලියන 280 ක්	2023	අමාත්‍යාංශයට අදාල වත්කම් පවරා ගැනීමට කටයුතු කල යුතු අතර ව්‍යාපෘති නියමිත කාල සටහන තුළදී නිමකර අපේක්ෂිත අරමුණු ඉටුකර	අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

	ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.		ගත යුතුය.		
31	මහ/ධර්මරාජ විද්‍යාලයේ සෞන්දර්ය ගොඩනැගිල්ල පිටුපස බැම්මක් ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේදී රු.3,880,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන මත මිලිමීටර 10 කම්බි යොදා 1:3:6 කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් මීටර 63.65ක් දිග හා මීටර් 4 ක් උස බැම්ම ඉදිකිරීම සඳහා රු.3,215,887 කට 2011 සැප්තැම්බර් 06 දින මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා පෞද්ගලික ඉදිකිරීම් ආයතනයක් සමඟ ගිවිසුම්ගතවී තිබුණි. අතිරේක වැඩ සමඟ රු.4,036,784 ක පිරිවැයකට වැඩ අවසන් කර තිබුණි. 2021 නොවැම්බර් 08 දින බැම්ම අස්ථාවර වී ඉදිරිපස වූ සෞන්දර්ය ගොඩනැගිල්ල මතට බැම්ම බරවී තිබුණි.	2023	නිවැරදි කිරීමේ ඉදිරි ක්‍රියාමාර්ග ඉතා කඩිනමින් සිදුකළ යුතුය.	හේතූන් සොයා බැලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී.	නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
32	මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු ප්‍රතිපාදන මත මහ/ ධර්මරාජ විදුහලේ ආපනශාලාව ඉදිකිරීමේ කටයුතු සිදුකර තිබුණු අතර	2023	අදාළ පර්යේෂණ වාර්තා ලබාගෙන ඉදිකිරීම් සිදුකළ යුතු වීම හා ප්‍රතිපාදන ලබාගෙන වැඩ අවසන් කර,	ව්‍යාපෘතිය නතර කර ඇත.	නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	2023 සැප්තැම්බර් 18 දින වනවිට කොන්ත්‍රාත්කරුට රු.4,400,000 ක මුදලක් ගෙවා තිබුණි. මෙම කර්මාන්තයේ වැඩ අතරමග නවතා තිබුණු අතර 2022 දෙසැම්බර් 20 දින ද්විපාර්ශවීය එකඟතාවය මත කර්මාන්තය අවසන් කර තිබුණ ද ඉදිකළ ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය අවසන් වන විට කායවර්ධන මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කර තිබුණි.නායයාමේ අවධානමක් ඇති භූමියක ඉදිකර ඇති මෙම ගොඩනැගිල්ල සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ද ලබාගෙන නොතිබුණි.		අරමුණුගතව යෙදවීමට කටයුතු කළ යුතුය.		
33	2015 වර්ෂයේ සිට 2019 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව ජාත්‍යන්තර පාසල් නියාමනය සඳහා මැදිහත් වීමේ දී පවත්නා නීතිමය බාධක හඳුනාගෙන පවත්නා රෙගුලාසි සංශෝධනය සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන තිබුණු අතර එදින සිට 2019 වර්ෂය වන විට රෙගුලාසි සකස් කිරීමට හා රජයේ අනුමත පෞද්ගලික පාසල්	2023	පවත්නා නීතිමය බාධක හඳුනාගෙන පවත්නා රෙගුලාසි සංශෝධනය කර අධ්‍යාපනය සම්බන්ධ කාර්යයන් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ නියාමනය වන පරිදි නිර්නායක සකස් කර එම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශයේ	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	සඳහා නිති සැකසීමට අපේක්ෂා කර තිබුණි. මේ පිළිබඳව ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන ලද රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය මැයෙන් සිදුකරන ලද විශේෂ කාර්යසාධන වාර්තාවේද එහි අවශ්‍යතාවය දක්වා තිබුණු නමුත් 2019න් පසු ඒ පිළිබඳව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි .		නියාමනය යටතේ වාර්ෂික බලපත්‍රයක් ලබා ගතයුතු පරිදි ක්‍රමවේදයක් සකස් කර අධීක්ෂණය කළ යුතුය.		
34	**ද්විතීක අධ්‍යාපනික ආංශික සංවර්ධන වැඩසටහන පිළිබඳ විගණන පරීක්ෂාව (SESIP)**	2023			
(අ)	2023 වර්ෂය සඳහා ප්‍රධාන විසර්ජන සබැඳි දර්ශක 07 යටතේ උපවිසර්ජන සබැඳි දර්ශක 22ක් වෙනුවෙන් ඩොලර් මිලියන 98.93 ක් වෙන් වී තිබුණි. එම උපවිසර්ජන සබැඳි දර්ශක 22 තුළ 2021 හා 2022 වර්ෂයේ දී ලගා කර නොගත්, 2023 වර්ෂ සඳහා විතැන් වූ උප විසර්ජන සබැඳි දර්ශක 12 ක් ඇතුලත් වී තිබුණි. වර්ෂය තුල දී මෙම කිසිඳු විසර්ජන සබැඳි දර්ශකයන් ලඟාකර නොගැනීම මත 2023 වර්ෂයේ වැඩසටහන සඳහා වෙන් වී තිබුණු ඉහත ඩොලර් මිලියන 98.93		ඉලක්කගත විසර්ජන සබැඳි දර්ශකයන් නියමිත කාල රාමු තුල ලගා කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ගැනීමට වගබලා ගත යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	ම ලබාගැනීමට නොහැකි වී තිබුණි.				
(ආ)	ආසියානු සංවර්ධන බැංකුව සමඟ එළඹී ණය ගිවිසුමෙහි දෙවන වගන්තියේ උප වගන්ති 2.02/2.03 ප්‍රකාරව ශ්‍රී ලංකා රජය ලබාගත් ණය මුදල් ප්‍රමාණය මත වෙනස් වන පොළී අනුපාතය යටතේ පොළී මුදලට අමතරව නිදහස් කර නොගත් ණය මුදල් ප්‍රමාණය මත 0.15 ක බැඳීම් ගාස්තුද ගෙවිය යුතු වේ. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිදහස් කරගත් ඇ.ඩොලර් 216,270,000 ක් මත රු.3,591,557,763 ක පොළී මුදලක් හා නිදහස් කර නොගත් ඇ.ඩොලර් 183,730,000 මත රු.103,350,603 ක බැඳීම් ගාස්තු ගෙවා තිබුණි. අමාත්‍යාංශය විසින් විසර්ජන සබැඳි දර්ශක ක්‍රියාත්මක කිරිම ප්‍රමාද වීම මත ගෙවන ලද රු. 103,350,603 ක බැඳීම් ගාස්තුව නිශ්කාර්ය වියදමක් වී තිබුණි. තවද 2021,2022 වර්ෂ වලදී රට තුළ පැවති කොවිඩ් වසංගතය, ආර්ථික අර්බුදය, දේශපාලන අස්ථාවරත්වය පිළිබඳව භාණ්ඩාගාරය හරහා ලිඛිතව ආසියානු	2023	2021,2022 වර්ෂවලදී රට තුළ පැවති කොවිඩ් වසංගතය, ආර්ථික අර්බුදය, දේශපාලන අස්ථාවරත්වය පිළිබඳව භාණ්ඩාගාරය හරහා ලිඛිතව ආසියානු සංවර්ධන බැංකුවට කරුණු දක්වමින් බැඳීම් ගාස්තු ඉවත් කර ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	සංවර්ධන බැංකුවට කරුණු දක්වමින් බැඳීම් ගාස්තු ඉවත් කර ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.				
(ඇ)	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2019 අනුව, පූර්ණකාලීනව වැඩ බැලීමේ එනම් වැටුපෙන් 1/3 ක් ගෙවීමේ පදනම මත ඉහත සඳහන් තනතුරු 19 සඳහා බඳවාගෙන තිබුණු අතර ඒ තුළ පළාත් ඇගයීම හා නියාමන නිළධාරින් 09 දෙනෙකු හා පළාත් සම්බන්ධීකරණ නිලධාරින් 06 දෙනෙකු ඇතුලත්ව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී කිසිදු විසර්ජන සබැදි ඉලක්කයක් ලබා කරගෙන නොතිබියදීත් මෙම පළාත් නියෝජිතයන් වෙනුවෙන් ගෙවා තිබුණු රු.6,300,000 ක දීමනා නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	2023	පළාත් සම්බන්ධීකරණ නිලධාරින් බඳවා ගැනීමේ අරමුණු අනුව කාර්යයභාරයන් ඉටුකර ගැනීමට අදාල බලධාරින් පියවර ගෙන ඒ හරහා වැඩසටහන් ඉලක්ක ලගා කර ගැනීමට කටයුතු කල යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
35	පාසල් පද්ධතියෙහි අධ්‍යයන හා අනධ්‍යන කාර්යය මණ්ඩල තොරතුරු, සිසු තොරතුරු හා පාසල සම්බන්ධ තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම පහසු කිරීම වෙනුවෙන් සියළුම කොට්ඨාශ	2023	පිරිවිතර වලට අනුකූල වන බවට තහවුරු කර ගැනීමකින් පසුව පමණක් භාණ්ඩ භාර ගැනීමට කටයුතු කළ යුතුය.	කොන්ත්‍රාත්කරු විසින් පවරන ලද නඩුවට යොමු වීම.	නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	අධ්‍යාපන කාර්යාලයක්ම ආවරණය වන පරිදි ලැප්ටොප් පරිගණක 328 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කාර්යය ප්‍රමාදයකින් යුතුව 2023 ජූලි මස ආරම්භ කර 2023 දෙසැම්බර් 15 දින ආයතනයක් වෙත රු.79,548,000 ක වටිනාකමට ලංසු පිරිනමා තිබුණි. කොන්ත්‍රාත් ලියවිලි ප්‍රකාරව 2024 මාර්තු 08 දින අධ්‍යාපන අමාත්‍යාංශයෙහි මධ්‍යම ගබඩාව වෙත ලැප්ටොප් පරිගණක බාරදී තිබුණු නමුත් ලැප්ටොප් පරිගණක පිරිවිතර වලට අනුකූල වන බවට තහවුරු කර ගැනීමකින් පසුව පමණක් අමාත්‍යාංශයට භාර ගන්නා පරිදි සුදුසු ක්‍රමවේදයක් කලමණාකාරීත්වය හදුන්වා දී නොතිබුණි. උක්ත පරිදි ගබඩාව විසින් භාරගෙන තිබුණු ලැප්ටොප් පරිගණක 328 ම අදාල පිරිවිතරවලට අනුකූල වී නොතිබුණු බව නිරීක්ෂණය විය.				
36	2017 වර්ෂයේ අයවැය යෝජනා 92 අනුව ක්‍රියාත්මක වූ උසස්පෙළ සිසුන්ට හා එම විෂය උගන්වන ගුරුවරුන්ට ටැබ් පරිගණක ලබාදීමේ	2023	ටැබ් පරිගණක උපයෝජනය කර ප්‍රතිලාභ සිසුන්ට ලබා ගැනීමට හැකි වන අයුරින් අනෙකුත්	ගුරු භවතුන් දැනුවත් කිරීමට කටයුතු කිරීම.	නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	වැඩ සටහන යටතේ ටැබ් පරිගණක 96,919 ක් හා අරෝපිත රාක්ක 2639 ක් මිලදීගැනීමට කටයුතු කර තිබුණත්, 6 වසර සිට 11 වසර දක්වා සිසුන් වෙනුවෙන් මෙම ටැබ් පරිගණක ලබාදීම ලෙස, අරමුණු වෙනස් කිරීමට කටයුතු කර තිබුණි. මෙයින් වටිනාකම රු.589,035,758 ක් වූ 18,973 ක් හා රු.88,275,000 ක් වටිනා ආරෝපන රාක්ක 535 ක් බස්නාහිර පළාතේ පාසල් 256 ක් වෙත ලබා දී තිබුණද ඒවායින් බොහොමයක් නිශ්කාර්යය හා ඌන උපයෝජිතව පැවතුණි.		උපදෙස් මාර්ගෝපදේශය න්ද නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය.		
37	අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නමට ලියාපදිංචි කරන ලද මෝටර් රථ 140 ක් අමාත්‍යාංශය සතුව නොපැවතුණි.	2023	අමාත්‍යාංශ ලේකම්ගේ නමට ලියාපදිංචි වී ඇති වාහන නිවැරදිව හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම හා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපනය කිරීමට කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශය පරිදි කටයුතු කර මෝටර් රථ 140 හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.
38	කොටහේන මධ්‍ය මහා විද්‍යාලයේ මහින්දෝදය තාක්ෂණික විද්‍යා පීයයේ ඇතිවූ හදිසි ගිනි ගැනීම හේතුවෙන් සිදු වූ අලාභය සඳහා අදාළ පරිශ්‍රයට පරිගණක	2023	සම්පූර්ණ අලාභය සැපයුම්කාර ආයතනයෙන් අයකර ගැනීමට හා අලාභ පොත්වලින් කපා	අලාභය පියවන ලෙස හෝ තාක්ෂණ විද්‍යාගාරය යථා තත්ත්වයට පත්කර දෙන ලෙස e-vis ආයතනය වෙත දැනුම් දී ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

	උපාංග සපයන ලද හා අභ්‍යන්තර විදුලි පද්ධති ස්ථාපනය කර ඇති සැපයුම්කරු, ඇස්තමේන්තු ගත අලාභය වන රු.12,517,406ක මුදල සඳහා වගකීව යුතු බවට නිර්දේශ කර ඇතත් මෙම අලාභය හා සියයට 28.75 ක දෙපාර්තමේන්තු ගාස්තු මුදල් සමග මුලු අලාභය රු.16,116,160ක් සැපයුම්කාර ආයතනයෙන් අයකර ගැනීමට හා අලාභ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.		හැරීමට කටයුතු කල යුතුය.		
39	පුලස්තිපුර ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය රජයේ නිවාස 29ක් සඳහා 2018 වර්ෂයේදි තක්සේරු කරන ලද ආර්ථික කුලිය අනුමත නොකිරීම හේතුවෙන් තක්සේරු කරන ලද කුලිය අයකරගෙන තිබුණු අතර 2018 වර්ෂයේ තක්සේරු කුලිය අනුමත නොකිරීම හේතුවෙන් 2018 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා රු. 1,446,000 ක කුලී මුදලක් රජයට අහිමි වී තිබුණි.	2023	රජයට අයත් ආදායම් නිසි පරිදි අයකර ගැනීමට අදාළ බලධාරීන් වගබලා ගත යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.
40	වර්තමාන ව්‍යූහ කමිටු කටයුතු පිළිබඳව තීරණ ගැනීමේදී 1981 වර්ෂයේදී එවකට	2023	උපදෙස් සංග්‍රහය යාවත්කාලීන කර නීත්‍යානුකූල අනුමැතිය ලබා	සංශෝධනය කිරිමට කටයුතු කරමින් පවතී.	නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

	ගැළපෙන පරිදි සකස් කර තිබෙන උපදෙස් සංග්‍රහයේ සඳහන් කරුණු අනුව කටයුතු කරන අතර මෙය වර්තමානයට ගැළපෙන පරිදි යාවත්කාලීන කිරීමක් සිදුකර නොමැති අතර මෙම උපදෙස් සංග්‍රහයට නීත්‍යානුකූල ආකාරයෙන් අනුමැතිය ලබා ගැනීමක් සිදුකර නොතිබුණි. එසේ වුවද අධ්‍යාපන අමාත්‍යාංශය මෙම මාර්ගෝපදේශය අනුව කටයුතු කර තිබුණි.		ගැනීම සිදු කල යුතුය.		
41	6 වසර පන්තිය සඳහා ශිෂ්‍යත්ව කඩඉමෙන් ළමුන් ඇතුලත් කිරීමෙන් පසු 7 වසර පන්තිය සඳහා සැලකිය යුතු ලෙස නවක සිසුන් බඳවාගැනීම ඇතැම් පාසල්වලින් සිදුකර තිබුණු අතර මෙය ශිෂ්‍යත්ව කඩඉම සමත් ළමුන් එම පාසල්වලට ඇතුලත් කිරීමට තිබුණු අවස්ථාව අහිමි කිරීමක් වී තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාම 7 ශ්‍රේණියේ නව ඇතුළත් කිරීම් පිළිවෙළින් 470 ක්ද 503 ක්ද 718 ක්ද 829 ක්ද 382 ක්ද 707 ක් හා 889 ක්ද වශයෙන් නව ඇතුළත් කිරීම් සිදුකර තිබුණි.	2023	පාසල් වල **6** වසර පංති ආරම්භ කිරීමේ ධාරිතාවය නිසි පරිදි හඳුනාගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ස්ථාපිත කර එම තොරතුරු යාවත්කාලීනව පවත්වා ගනිමින් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නව පංති ආරම්භ කර **5** වසර ශිෂ්‍යත්ව විභාගය සමත් සිසුන්ට හිමි සියලු අවස්ථාවන් සැලැස්වීමට අදාළ බලධාරීන් වගබලා ගත යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

42	2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශයේ ලැබීමට ඇති ණය/ අත්තිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයේ සාරාංශයට අනුව ස්ථාන මාරු වී ගිය , මිය ගිය විශ්‍රාම ගිය, වැඩ තහනම් කර ඇති සහ සේවය හැරගිය නිලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුළු ණය ශේෂය රු. 170,296,262ක් වන අතර 2024 අප්‍රේල් 30 දින වන විටත් රු.164,077,248 ක් අයවිය යුතුව තිබුණි. ඉන් රු. 16,592,173ක් වර්ෂ 20කට වැඩි කාලයක සිටද රු. 30,899,811 ක් වර්ෂ 10ත් 20ත් අතර කාලයක සිට ද රු. 22,264,959 ක් වර්ෂ 5ත් 10ත් අතර කාලයක සිටද රු. 94,320,305 ක් වර්ෂ 5 ට අඩු කාලයක සිටද පැවතුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ණය ශේෂයන් අයකර ගැනිමට කටයුතු කල යුතුය.	සියළුම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල, විද්‍යාපීය දැනුවත් කිරිමට කටයුතු කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.
43	ජනප්‍රිය පාසල් සදහා 1 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේදි පදිංචිය තහවුරු කිරීම සඳහා බදු ඔප්පුව ඉදිරිපත් කරනු ලබන අයදම්කරුවන්ගේ ප්‍රමාණයේ ඉහළ යාමක් පවතින අතර පාසලට ආසන්නතාව මත ලබාදෙන ලකුණු 50	2023	නිවැරදි බව හා සත්‍ය බව තහවුරු කරගත හැකි පරිදි පවත්නා ගැටලුකාරී තත්ත්වයන්ද සැළකිල්ලට ගෙන තාර්කික නිර්ණායක පදනම්ව චක්‍රලේඛ	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් පාසලට ආසනනතම ලිපිනයක බදු ගිවිසුම්ගත වීම සිදු කර තිබීම නිසා ස්ථිර පදිංචිය සහිත අයදුම් කරුවන්ට වඩා ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට (බදු පදනම යටතේ පාසල් සහ පදිංචි ස්ථානය අතර පවත්නා අනෙකුත් ප්‍රාථමික අංශ සහිත පාසල් සඳහා ලකුණු අඩු නොවන නිසා) අවස්ථාව ලැබී තිබුණි. මාස 06 ට අඩුවෙන් ලියාපදිංචි කරන ලද බදු ඔප්පු සඳහා වුවද 0.5 ක් පමණ ලකුණු ප්‍රමාණයක් ලබාගෙන පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව සඳහා වූ ලකුණු 50 ම ලබා ගනිමින් පාසලට ඇතුළත් වූ අවස්ථා විශාල සංඛ්‍යාවක් පැවතුණි. මේ නිසා දීර්ඝ කාලයක සිට එම ප්‍රදේශයේ ස්ථිර පදිංචිය සහිත දරුවන්ට පාසලට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී තිබුණි.	විධිවිධාන හඳුන්වා දිය යුතුය.

3.22 ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,173,319,117	111,348,985	2,061,970,132	(3,290,166,085)	තත්ත්වාගණනය කළ
2022	3,078,630,812	76,494,468	3,002,136,344	(2,943,650,600)	තත්ත්වාගණනය කළ
2023	3,407,812,504	59,320,548	3,348,491,956	(3,362,617,951)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය**
1	අමාත්‍යාංශය විසින් කුරුණෑගල මලියදේව විද්‍යාලයේ දුනු පිටිය හා වෙඩි පිටිය මාස 06 ක් තුල නිම කිරීම සඳහා රු.මිලියන 12.23ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට 2018 මාර්තු 28 දිනැතිව පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත පිරිනමා තිබුණු නමුත්, ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණි. තවද අවස්ථා කිහිපයකදී කොන්ත්‍රාත් කාලසීමාව මාස 20 කින් දීර්ඝ කිරීම, අමතර වැඩ සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් විධිමත් අනුමැතියක් ලබා නොගෙන කටයුතු කිරීම, බේරුම්කරණ	2022 2023	ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර කාර්යක්ෂමතා වයෙන් හා අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි ව්‍යාපෘති සැලසුම් කල යුතුය. තවද ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රමවත්ව කළමනාකරණය සහ නියාමනය සිදුකළ යුතුය.	ව්‍යාපාතියේ දෙවන අදියර සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් හැකි අයුරින් ඉතිරි කටයුතු සිදුකර ප්‍රයෝජනවත් සේ යොදා ගැනීමට විද්‍යාලය දැනුවත්කර තිබීම.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. (ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැති බැවින් දුනු පිටිය භාවිතා කළ හැකි තත්ත්වයට පත් කර නොමැත.)

	ක්‍රියාවලියකට කඩිනමින් යොමු නොවීම සහ මිල විචලනයන් පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටු විසින් එම තීරණ ලබා දිමට වසරකට වඩා වැඩි කාලයක් ගත කිරීම ආදී කරුණු හේතුවෙන්, එකඟ වූ වටිනාකමට වඩා රු.මිලියන 4.23 ක බදු සහිත වටිනාකමක් අමතරව ගෙවා තිබුණු අතර එම ක්‍රීඩා පිටි භාවිතා කළ හැකි තත්ත්වයට මේ වෙන තෙක් පත් කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.				
2	අමාත්‍යාංශය විසින් දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ක්‍රීඩා ඇකඩමියක් හා අන්තර්ජාතික ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කිරීමට අදාලව 2017 සිට 2022 වර්ෂය දක්වා රු. මිලියන 3,866 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙනතිබුණු අතර, ඉන් රු.මිලියන 606 ක් පමණක් වියදම් කර තිබුණි. එම වියදමින් රු. මිලියන 487 ක් වැය කර ඉදිකර තිබූ මීටර් 400 කෘතිම ධාවන පථයේ ස්ථාන කිහිපයක පළුදු වී පැවතීම හා මන්තීරු	2022 2023	ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රමවත්ව කළමනාකරණය හා නියාමනය කළ යුතුය.	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘතිය භාර දී තිබීම.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. (මීටර් 400 කෘතිම ධාවන පථයේ ස්ථාන කිහිපයක පළුදු වීම, විදුලිජනක යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතිය , කුඩා ප්‍රේක්ෂකාගාරයේ ඉදිකිරීම් සහ මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීමේ කටයුතු මෙතෙක් සිදු කර නොතිබුණි.)

	වෙන් කරන ලද ඉරි මැකී ගොස් තිබීම හේතුවෙන් එම ධාවන පථයේ තරඟ සඳහා සහභාගී වන ක්‍රීඩකයන් අපහසුතාවට පත්වී තිබුණි. එසේම විදුලිජනක යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 30 ක් වැය කර සියයට 65 ක ඉදිකිරීම් ප්‍රගතියක් පැවතියදී ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කර තිබුණු අතර රු. මිලියන 34 ක් වැය කර ඇති කුඩා ප්‍රේක්ෂකාගාරයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 90 ක් වී තිබියදී ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් නිම නොකොට, එම ගිවිසුම අවලංගු කර තිබුණි.තවද මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකර ගැනීම සඳහා, ගිවිසුමක් නොමැතිව රු. මිලියන 5.4 ක අත්තිකාරම් මුදලක් රජයේ ඉදි කිරීමේ ආයතනයක් වෙත 2019 වර්ෂය තුල ගෙවා තිබුණද, අදාළ ඉදිකිරීම් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ගෙවූ අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි.				
3	2021 නොවැම්බර් 16 දින ටෙක්නොමෙඩික්ස් ඉන්ටර්නැෂනල් නැමැති	2023	පිරිවැය ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණයක්	ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ ඉල්ලීම පරිදි ක්‍රීඩා	නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී.

පෞද්ගලික ආයතනය වෙතින් රු.මිලියන 248.59 ක මුදලකට මානව කාර්යසාධන විද්‍යාගාරය සඳහා උපකරණ සැපයීම, ස්ථාපනය කිරීම, පැවරීම, පුහුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා එම සමාගම හා ක්‍රීඩා වෛද්‍ය ආයතනය කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු නමුත්, ඒ සම්බන්ධයෙන් පිරිවැය ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණයක් සිදු කර නොතිබුණි. අදාළ සමාගම විසින් 2023 ජනවාරි 23 හා 24 දින උපකරණ ස්ථාපනය පමණක් සිදු කර තිබුණු නමුත් පරීක්ෂණාගාරයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි. සැපයුම්කරු විසින් පළමු හා දෙවන වර්ෂයේ සේවා සැපයීම සිදුකර නොතිබුණු අතර, ක්‍රීඩා වෛද්‍ය ආයතනය විසින් ඒ පිළිබඳව සැපයුම්කරු සමග සාකච්ඡා කර සේවාවන් ලබාගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු සිදුකර නොතිබුණි. තවද කොන්ත්‍රාත්තුව ගිවිසුම්ගත වූ 2021 නොවැම්බර් 16 දින සිට සති අටක කාලසීමාව තුළ ගිවිසුම්ගත පරිදි උපකරණ ස්ථාපිත කිරීම් සිදු කල යුතු වුවද සැපයුම්කරු මාස 13 ක	සිදු කර ව්‍යාපෘති ආරම්භ කළ යුතුය. වැය කළ මුදලට ප්‍රතිලාභ ලබා ගැනීමට කඩිනමින් සැපයුම්කරු සමඟ සාකච්ඡා කළ යුතු අතර පිළිගත නොහැකි ප්‍රමාදයන් සම්බන්ධයෙන් ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය.	අමාත්‍යාංශය විසින් ඉදිරි කටයුතු සඳහා විශේෂ එකඟතා කමිටුවක් පත්කිරීම.	(ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ඉදිරි කටයුතු සඳහා පත් කල විශේෂ එකඟතා කමිටුවක් විසින් අවසන් වාර්තාව සකසමින් පවතී.)

	ප්‍රමාදයකින් පසුව උපකරණ ස්ථාපනය කර තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි 26.1 අනුව ප්‍රමාද ගාස්තු වශයෙන් එක් සතියකට සියයට 1 බැගින් උපරිම සියයට 10ක් එනම් රු.මිලියන 24.86 ක් අය කළ හැකි වුවද ඒ පිළිබඳ විශ්ලේෂණයක් සිදුකර එම ප්‍රමාද ගාස්තුව අයකර ගැනීමටද අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.				
4	ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 34.5 ක් වන ඉඩමක ඉදිකිරීමට යෝජිතව තිබූ උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ණය සැලසුම් ගාස්තු ලෙස යුරෝ 264,492.34 ක් එනම් රු.51,047,021 ක් ගෙවා තිබුණත්, 2021 වර්ෂයේදී ව්‍යාපෘතිය නවතා දැමීම හේතුවෙන් ඒ සඳහා වැය කළ මුළු වියදම නිෂ්කාර්ය වී තිබුණි. ඊට අමතරව 2023 වර්ෂයේදී මෙම කොන්ත්‍රාත්කරු විසින් යුරෝ මිලියන 23 ක වන්දි මුදලක් ද ඉල්ලුම් කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් ඒ සඳහා නීතිපති උපදෙස් විමසා තිබුණි.	2023	ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු ඉටු කිරීම සඳහා සැලසුම් කළ යුතු අතර වන්දි ඉල්ලීම සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවීම.	කොන්ත්‍රාත් ආයතනය ඉදිරිපත් කළ වන්දි ඉල්ලීම පිළිබඳව නීතිපති උපදෙස් විමසීමෙන් අනතුරුව, ඒ පිළිබඳව තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට තෝරාගත් විශේෂඥවරයාගේ වාර්ථාව අනුව ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී.කොන්ත්‍රාත්කරු වෙළඳ ඉහළ උසාවියේ නඩු පවරා ඇති අතර ඒ සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩු කටයුතු සිදු කරමින් පවතී.	නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී. (තෝරාගත් විශේෂඥවරයාගේ වාර්ථාව අනුව වන්දි ඉල්ලීම පිළිබඳව ඇගයීම් කටයුතු සිදු කිරීම සහ නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩු කටයුතු සිදු කරමින් පවතී.)

5	ක්‍රීඩා වෛද්‍ය ආයතනය සතුව විකිරණ ශිල්පියෙකු නොමැතිව, මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම මත පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් අනුමත නොකිරිම හේතුවෙන් රු.3,232,500 ක Mobile X Ray යන්ත්‍රයක්, රු.1,107,150 ක Radiation Protection Accessories Set උපකරණයක්, රු.4,311,225 ක X කිරණ මේස සහ X-Ray Digital Film Imaging System එකක් ඇතුළත්ව සහ රු. 1,630,289 ක් වැය කර සකස් කරන ලද X කිරණ කාමරය , මිලදී ගත් දින සිට පිළිවෙලින් වර්ෂ 07ක් , වර්ෂ 06 ක් සහ වර්ෂ 02 කට වැඩි කාලයක් උපයෝජනය නොකොට නිශ්කාර්යව පැවතුණි.	2023	ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර වත්කම් මිලදී ගත යුතු අතර මිලදී ගත් උපකරණ උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම.	Radiographer තනතුර සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය සකසා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී. (X Ray යන්ත්‍ර උපයෝජනය නොකොට නිශ්කාර්යව පැවතුණි.)
6	ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ ගැටළු සහිත අවස්ථා නිරාකරණය වන ලෙස 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සංශෝධනය කිරීමේ හා යාවත්කාලීන කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	2021 2022 2023	ක්‍රීඩා පනත කඩිනමින් සංශෝධනය කළ යුතුය.	අමාත්‍යවරයා වෙත භාර දි ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී. (ක්‍රීඩා පනත සංශෝධනය කිරීමේ හා යාවත්කාලීන කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.)
7	සියලුම ජාතික ක්‍රීඩා සංගම් හා ඊට අයත් ක්‍රීඩා පුහුණුකරුවන්ගේ	2023	පුහුණුකරුවන් නියාමනය කිරීම සඳහා	ප්‍රධාන ක්‍රීඩාවන්හි පුහුණුකරුවන් ලියාපදිංචි කර	නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී.

කුසලතා ආකල්ප සංවර්ධනය කර ඔවුන් සඳහා පුහුණුකරු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම ක්‍රීඩා විද්‍යා ආයතනයේ ප්‍රධාන කාර්යයක් වුවත්, විගණිත දින වන විට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සංගම් 66 කින් විවිධ ක්‍රීඩා සංගම් 21 කට අදාළ පුහුණුකරුවන් 2,067ක් වෙත පමණක් ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. ඉතිරි ක්‍රීඩා සංගම් 45 හි පුහුණුකරුවන් ක්‍රීඩා විද්‍යා ආයතනයේ ලියාපදිංචි වී නොතිබුණ ද, ඔවුන් විසින්ද ක්‍රීඩා පුහුණු කිරීම් කටයුතු සිදු කරනු ලබන අතර, ක්‍රීඩා විද්‍යා ආයතනයේ පුහුණුකරු ලියාපදිංචි සහතිකය ලබා නොගත් පුහුණුකරුවන්ට තම පුහුණු කිරීම් කටයුතු සිදුකළ නොහැකි බවට හා ක්‍රීඩා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වගකීම මෙන්ම නෛතික බලතලද, ක්‍රීඩා විද්‍යා ආයතනයට ලබා ගැනීමට අවශ්‍යවන නෛතික සංශෝධනයන් සිදුකර ගැනීමට අවශ්‍ය කටයුතු, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මඟින් සිදුකර නොතිබුණි.	අවශ්‍ය නෛතික බලය ක්‍රීඩා විද්‍යායතනයට ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	ඔවුන් වෙත පුහුණුකරු ලියාපදිංචි සහතිකද නිකුත් කර එම සහතික වසර දෙකකට වරක් යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. මෙහිදි දැනුවත් කිරීම් සිදුකලද පුහුණුකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා යොමුවීමට පුහුණුකරුවන්ගේ දායකත්වය අවම මට්ටමක පැවතීම, පුහුණුකරු ලියාපදිංචිය සඳහා සමත්විය යුතු පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව (පාඨමාලා කාලය මාස 03 - සතියකට එක් දිනයක් බැගින් දින 12ක්) වෙනුවෙන් යම් කාලසීමාවක් ගතවීම සහ ඇතැම් ක්‍රීඩා සංගම්හි පාඨමාලාවක් පැවැත්වීමට තරම් ප්‍රමාණවත් නොවන ඉතා සීමිත පුහුණුකරුවන් ප්‍රමාණයක් පමණක් සිටීම යන කරුණු මත අනෙකුත් ක්‍රීඩා සංගම්හි පුහුණුකරුවන් ලියාපදිංචිය සිදුකිරීමට	(පුහුණුකරුවන් පුහුණු කිරීමේ නෛතික බලතල ක්‍රීඩා විද්‍යා ආයතනයට ලබා ගැනීමට අවශ්‍යවන නෛතික සංශෝධනයන් සිදුකර ගැනීමට අවශ්‍ය කටයුතු මෙතෙක් සිදු කර නොමැත.)

නොහැකි විය. ඒ අනුව අනෙකුත් ක්‍රීඩා සංගම්හි පුහුණුකරුවන්ද ස්ථාපිත ක්‍රියාවලිය යටතේ කඩිනමින් ලියාපදිංචි කිරීමට කටයුතු කරමින් පවතී. පුහුණුකරු ලියාපදිංචිය සඳහා නෛතික බලතල ලබාගැනීම පිළිබඳව පෙර අවස්ථා කිහිපයකදී රැස්වීම් වලදී සාකච්ඡා කල අතර ක්‍රීඩා සංගම් වෙත අදාල ක්‍රියාවලිය පිළිබඳව අමාත්‍යාංශ ලේකම් මඟින් දැනුවත් කිරීම්ද සිදු කර ඇත. ඒ අනුව "ලියාපදිංචි නොවූ පුහුණුකරුවන්ට ක්‍රීඩා පුහුණුකිරීම් කටයුතු සිදු කල නොහැක." යන්න ක්‍රීඩා පනත මඟින් හෝ රෙගුලාසි යටත් නීතිගත කිරීමට අමාත්‍යාංශය හරහා කටයුතු කරනු ලැබේ.

3.23 කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	(ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	742,445,121	7,593,068	734,852,053	14,112,803,549	තත්ත්වාගණනය කළ
2022	1,812,992,725	72,204,404	1,740,788,321	16,988,483,607	තත්ත්වාගණනය නොකළ
2023	2,076,309,122	54,529,173	2,021,779,949	40,945.529,268	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	2015 ජූනි 8 දින ජල පහරකට අසුවීමෙන් අනතුරට පත් වී තිබූ Land Cruiser Jeep රථයේ අලුත්වැඩියාව සඳහා රු.6,817,698 ක මුදලක් වැය වී තිබූ අතර ඉන් රක්ෂණ සමාගම විසින් නොගෙවන ලද රු.3,450,945 ක මුදල මු.රෙ. 104(4) වාර්තාව අනුව රියදුරු මහතාගෙන් අයකර ගන්නා ලෙස දක්වා තිබුණි.එහෙත් එම මුදල අමාත්‍යාංශය විසින් 2021 දෙසැම්බර් මාසයේදී ගෙවීම හේතුවෙන් රජයට රු.3,450,945 ක මූල්‍ය අලාභයක් සිදු වී තිබුණි.	2022	වාහන අනතුරු සම්බන්ධව ප්‍රමාදයකින් තොරව කටයුතු කර රක්ෂණ වන්දි නිසි පරිදි ලබාගැනීමට කටයුතු කල යුතුය.	ඉදිරි කටයුතු සම්බන්ධව නීතිපති විසින් ලබා දී ඇති උපදෙස් පරිදි රක්ෂණ සංස්ථාව වෙත නැවත ලිපියක් ඉදිරිපත් කරන ලදි.	අදාල අලාභය කපා හැරීමට දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කර ඇතත් එයට අනුමැතිය දී නොතිබුණි.
2	2022 දෙසැම්බර් 31 දින වන විට වනිතා ශක්ති සුළු මූල්‍ය ශාඛා	2023	අක්‍රීය ශාඛා ක්‍රියාත්මක කිරීමේ	අක්‍රීය ශාඛා 29 ඇවර කිරීම සඳහා අදාළ සියළු	අක්‍රීය ශාඛා ඇවර කිරීම සඳහා අදාළ සියළු තොරතුරු

	59 න් එකතුව රු.49,071,128ක් පවතින ශාඛා 29 ක් අක්‍රීයව පවතින අතර ශාඛා 07 ක ගිණුම් ශේෂ තොරතුරු කාර්යාංශය සතු නොවීය.		මට්ටමකට ගෙන ඒම හෝ ඇවර කිරීමට හෝ කටයුතු කළ යුතුය.	තොරතුරු රැස් කර අවසන් බව,	රැස් කර අවසන්ව තිබුණි.
3	වනිතා ශක්ති සුළු මූල්‍ය ශාඛා සඳහා අමාත්‍යාංශය විසින් දරන ලද ප්‍රාග්ධනය හා පරිපාලන වියදම් සඳහා පිළිවෙලින් රු.1,600,000 ක් හා රු.2,101,156 ක් ලෙස එකතුව රු.3,701,156 ක් වැයකර තිබුණද වර්තමානය වන විට එම ශාඛාවල පරිපාලනය, ගිණුම් තැබීම, ණය දීම හා ණය අයකර ගැනීම සක්‍රීයව සිදු නොවන බව විගණනයේදී අනාවරණය විය.	2023	යාවත්කාලීන ගිණුම් තොරතුරු ලබා ගැනීමට අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය.	ශාඛා 11 ක් පමණක් සක්‍රිය තත්වයේ පවතින බවට වාර්තා වී ඇති අතර, 2023 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන ගිණුම් තොරතුරු ලබා ගැනීමට සහ සුදුසු විගණනයක් සිදු කිරිමට අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව.	2023 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන ගිණුම් තොරතුරු ලබා ගෙන නොතිබුණි.
4	ව්‍යවසායක කාන්තාවන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීම හා ආර්ථික සවිබල ගැන්වීමේ අරමුණ ඇතිව රු.4,458,063 ක පිරිවැයක් දරා Lanka Women E-market වෙබ් අඩවිය 2022 මාර්තු 08 දින එළි දක්වා තිබුණි.මෙම වෙබ් අඩවිය එළිදක්වා වසර 2 ක කාලයක් ගත වී තිබුණද, තාක්ෂණික සහාය නොලැබීම හා	2023	අවශ්‍ය පහසුකම් සැලසීම මගින් වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.	2023 වර්ෂයේ සිට ක්‍රමානුකූලව ව්‍යවසායක කාන්තාවන් මෙහි ලියාපදිංචි කරවීම පමණක් ආරම්භ කරන ලද බව.	කිසිදු අලෙවිකරණ කාර්යයක් සිදුවී නොතිබුණි.

	පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ප්‍රමාණවත් වගකීමක් අමාත්‍යාංශයේ අදාළ අංශ වලින් නොදැරීම හේතුවෙන් ඩිජිටල් අලෙවිකරණ වේදිකාව අසාර්ථක වී තිබීම හේතුවෙන් දරන ලද වියදම නිෂ්ඵල වී තිබුණි.				
5	අමාත්‍යාංශය යටතේ පවතින අංශයක් වූ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා සංවර්ධන නිළධාරීන් 16 දෙනෙකු සේවයේ යොදවා සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා වේතන ලෙස රු.8,000,000 ක් ගෙවා තිබුණි.	2023	අනුමත කාර්යය මණ්ඩලයට අදාල නිලධාරීන් පමණක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.	ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය සංශෝධනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව	කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර තිබුණි.
6	2017 මාර්තු 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දිළිඳුකම පිටුදැකීම සඳහා පිහිටුවන ලද ග්‍රාම ශක්ති සමිති 3618 න් සමිති 2067 ක් එනම් සියයට 57 ක් පමණ අක්‍රීය මට්ටමේ පැවති අතර එම සමිතිවල වූ ක්ෂුද්‍ර මූල්‍ය ගිණුම්වල රු.635,705,116 ක මුදලක් නිශ්කාර්යව පැවතුණි.	2023	ක්ෂුද්‍ර මූල්‍ය ගිණුම් වල තැන්පත් මුදල් අදාල අරමුණු වෙනුවෙන් වැය කිරීමට කටයුතු කළ යුතුය.	ලියාපදිංචි මුළු සමිති **3696** හි සක්‍රීයතාවය තහවුරු කිරීමට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරමින් පවතින අතර අක්‍රිය සමිතිවලින් සක්‍රීය සමිති සඳහා රජයේ අරමුදල් පැවරීමේ කාර්යය දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතින බව	ලියාපදිංචි මුළු සමිතිවල සක්‍රීයතාවය තහවුරු කිරීමට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරමින් පවතින අතර අක්‍රිය සමිතිවලින් සක්‍රීය සමිති සඳහා රජයේ අරමුදල් පැවරීමේ කාර්යය දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය මට්ටමින් ක්‍රියාත්මක කිරීමට ආරම්භ කර තිබුණි.

3.24 ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය (ශීර්ෂය - 166)

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	අතිරික්තය (ඌනතාවය) රු	මතය
2021	406,121,279	-	406,121,279	-	තත්ත්වාගණනය කළ
2022	310,834,245	122,488	310,711,757	-	තත්ත්වාගණනය කළ
2023	2,713,033,068	35,297,294	2,677,736,314	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව අමාත්‍යාංශය සතු වාහන 20 ක් සඳහා ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.	2021	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවන් සිදුකළ යුතු වීම.	ඉදිරියේදී චක්‍රලේඛ පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබාදෙන ලදී.	ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි.
2	ඉඩම් අත්පත්කර ගැනීම වෙනුවෙන් වන්දි මුදල් ගෙවීමේ ප්‍රමාදය මත විදේශාධාර ව්‍යාපෘති 23 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.33,373,453 ක මුදලක් පොලී වශයෙන් ගෙවා තිබුණි.	2021	ව්‍යාපෘති ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළයුතු වීම.	විධිමත් පරිදි ක්‍රියාකිරීමට නිළධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී.	කඩිනමින් වන්දි මුදල් ගෙවීමට කටයුතු කිරීමට ප්‍රමාණවත් වැඩ පිළිවෙළක් නොතිබුණි.

	චීන රජය විසින් ප්‍රදානයක් ලෙස ජල සම්පාදන අමාත්‍යාංශය වෙත භාර දී තිබූ රු.39,183,806 (USD 211,142.40) ක් වටිනා ජංගම ජල තත්ත්ව පරීක්ෂණ රථය 2022 දෙසැම්බර් 31 දින දක්වා කිසිදු පරීක්ෂණ කටයුත්තක් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල් කර තිබුණි.	2021 සහ 2022	මෙම ජංගම ජල තත්ත්ව පරීක්ෂණ රථය පරිහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගතයුතුය.	අමාත්‍යාංශ ලේකම්වරයා යටතේ පවතින මෙම පහසුකම ප්‍රයෝජනයට ගන්නා ලෙස අමාත්‍යාංශය හරහා පාර්ශවකරුවන් වෙත තුන් වතාවක් සිහිකැඳවීම් කර ඇති බව 2023 අගෝස්තු 03 දින විගණනය වෙත දන්වා තිබුණි.	2024 ඔක්තෝම්බර් 10 දින වන විටත් මෙම රථය පර්යේෂණ කටයුතු සඳහා යොදා ගෙන නොතිබුණි.
3	රාජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් වෙත ලබා දී තිබූ තක්සේරු වටිනාකම රු.12,000,000 ක් වූ වාහනයක් 2022 මැයි 09 වන දින සිට රාජ්‍ය අමාත්‍යාංශය අහෝසිවීමෙන් පසු 2022 ජුනි 20 දින අමාත්‍යාංශයට භාර දී තිබුණු අතර එහිදී එම වාහනය අනතුරට ලක්වී තිබූ බව හඳුනාගෙන තිබුණි. ඒ පිළිබඳව නියමිත කාලය තුල පොලීසිය හා රක්ෂණ ආයතනය දැනුවත් කර නොතිබීම හේතුවෙන් අනතුරට අදාල ඇස්තමේන්තුගත	2022	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර රජයට සිදු වී ඇති පාඩු ආවරණය කර ගැනීමට කටයුතු කල යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුුණි.	2024 ඔක් තෝම්බර් .16දින වන විට රු.359,869.40ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

	අළුත්වැඩියා වියදම වූ රු.572,700 ක් ගෙවීම රක්ෂණ ආයතනය ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර ඉහත කී පරිදි රජයට සිදුවී ඇති පාඩුවට වගකිවයුතු අය හදුනාගෙන අයකර ගැනීමට 2023 මාර්තු 27 දින වන විටත් කටයුතු කර නොතිබුණි.				
4	රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් වූ 2010 මැයි 14 දිනැති සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාල ලිපියේ 2.1 ඡේදය ප්‍රකාරව ගරු අමාත්‍යතුමාගේ කාර්යය මණ්ඩලය උපරිමය 15 ක් නොඉක්මවිය යුතු වුවද 2022 මැයි 24 දින වන විට අමාත්‍ය කාර්යය මණ්ඩලය ලෙස නිලධාරීන් 18 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.	2022	චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව සිදුකර ඇති මෙම පත්වීම් තුලින් රජයට දැරීමට සිදු වී ඇති පාඩුව ආවරණය කර ගැනීමට කටයුතු කළ යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි.	මෙම පත්වීම් තුලින් රජයට දැරීමට සිදු වී ඇති පාඩුව ආවරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
5	හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට රාජකාරී කටයුතු වෙනුවෙන් ලබා දී තිබූ රු.මිලියන 1.4	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කළ යුතුයි.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි.	මු.රෙ 104(4) අවසන් වාර්තාව ප්‍රකාරව වගකිව යුත්තන් තීරණය කල නොහැකි බව

	ක් වටිනා කැමරා උපකරණ, මුද්‍රණ යන්ත්‍රය හා ලැප්ටොප් පරිගණකය 2022 මැයි 09 දින රටේ පැවති අර්බුදකාරී තත්ත්වය මත විනාශ වී තිබූ අතර 2024 මැයි 20 වන විටත් පොත්වලින් ඉවත්කිරීමට භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොතිබූ නිසා මූල්‍ය ප්‍රකාශනවල, මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.මිලියන 1.4 කින් වැඩියෙන් දක්වා තිබුණි.				දක්වා ඇත. 2024 ඔක්තෝම්බර් 10 වන විටත් රු.මිලියන 1.4 ක වත්කම් අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් තුළ ඇතුළත්ව තිබුණි.
6	අමාත්‍යාංශය සතු සියලුම වාහනවල තොරතුරු ඇතුලත් යාවත්කාලීන කරන ලද වාහන ලේඛණයක් නඩත්තු කර නොතිබුණු අතර විගණන නියැදි පරීක්ෂාවට භාජනය වූ 2023 ඔක්තෝම්බර් 31 දින වන විට ලේකම්, ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබූ වාහන 264 ක් සම්බන්ධයන් තොරතුරු ඉහත	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතුයි.	වාහන ලේඛනය යාවත්කාලීන කරමින් පවතී.	වාහන ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

	පරිදි ලේඛන ගත කර නොතිබුණි.				
7	මුදල් රෙගුලාසි 1647(ආ) ප්‍රකාරව අමාත්‍යාංශයේ වාහන හා ඒවායේ උපකරණ පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.	2023	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	2024 වර්ෂයේදී වාහන සමීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	වාහන සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.
	අමාත්‍යාංශ ලේකම් කාර්යාලයේ ධාවනය සඳහා යොදවා තිබූ වාහනයක මයිලෝමීටරය අනුව ධාවනය කල දුර අතර කිලෝමීටර් 905 ක වෙනසක් තිබුණි.	2023	ධාවන සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු අතර නිසි අනුමැතියක් නොමැතිව වාහන භාවිතා කිරීම සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි.	2024 මාර්තු 04 දින පරීක්ෂණ නිළධාරියකු පත් කර ඇත. පරීක්ෂණ වාර්තාව විගණන දිනය වූ 2024 ඔක්තෝම්බර් 10 දින වනවිටත් ලැබී නොතිබුණි.
8	මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව තැන්පත් කළ දින සිට වර්ෂ 2 ක් ඉකුත් වූ තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කල යුතු වුවත් 6000-0-0-16-0-82 අංක දරන තැන්පතු ගිණුමේ අවස්ථා 16 ක එකතු වටිනාකම රු. මිලියන 5.05 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	2023	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි.	ව්‍යාපෘති අවසන් නොවීම, ව්‍යාපෘතිවල අඩුපාඩු පැවතීම හා රැඳවුම් මුදල් නිදහස් කිරීමට ඉල්ලීම් නොලැබීම නිසා තැන්පතු ගිණුමේ මුදල් රඳවාගෙන ඇත.

9	2023 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්ම මඟින් හඳුනාගෙන තිබූ නිවාස වැඩසටහනෙහි කටයුතු මෙහෙයවීම හා සුපරීක්ෂණය වෙනුවෙන් වෙන්කර තිබූ රු.මිලියන 2 ක ප්‍රතිපාදනයෙන් කිසිදු මුදලක් වැයකර නොතිබුණි. එමෙන්ම ප්‍රතිලාභීන් 200 ක් සඳහා ඉඩම් ලබා දීමට සැලසුම්කර තිබුණද ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීම ප්‍රතිලාභීන් 101 කට එනම් සියයට 50 ක් තරම් වූ අවම මට්ටමක පැවතුණි.	2023	ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුලත් වැඩසටහන් නියමිත කාලය තුල ඉටු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි.	මෙම වැඩසටහන අවසන්කර නොතිබුණි.
10	හැටන් හි පිහිටි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම හා අවශ්‍ය උපකරණ ස්ථාපිත කිරීම වෙනුවෙන් රු.මිලියන 33 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. 2023 වර්ෂය අවසාන වන විට අපේක්ෂිත මුදල ඉක්මවා එනම් රු.මිලියන 56.11 ක් වැයකර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් පමණක් සම්පූර්ණ කර තිබුණු අතර යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම විගණන	2023	ව්‍යාපෘතිය අවසන්කර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය නිසි පරිදි සිදු කල යුතුයි.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි.	ව්‍යාපෘතිය අවසන්කර නොතිබුණි.

	දිනය වූ 2024 අප්‍රේල් 10 දින වන විටත් සිදුකර නොතිබුණි.				
11	අමාත්‍යාංශය මගින් සැලසුම් කරන ලද වකුගඩු රෝග නිවාරණ වැඩසටහන යටතේ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට ලැබී තිබූ රු.මිලියන 18.18 ක් වටිනා EDR පිරිපහදු යන්ත්‍ර 2 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට පුත්තලම දිස්ත්‍රික්කයේ පුලිච්චාකුලම ජල ව්‍යාපෘතියට ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 24.3 ක් වෙන්කර තිබුණද 2023 දෙසැම්බර් 31 වන විටත් එම කාර්ය අවසන් කර නොතිබුණි.	2023	මෙම ජල ව්‍යාපෘතිය කඩිනමින් නිමකිරීමට අවශ්‍ය කටයුතු කල යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි.	ප්‍රතිලාභීන්ට අවශ්‍ය පානීය ජලය බෙදාදීමේ කටයුතු සිදුකර නොතිබුණි.
13	ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය (අදියර 01) යටතේ රු.මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර නිවාස ඒකක 154 ක් සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණද, 2023 වර්ෂය අවසාන වන විට නිවාස ඒකක 16 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.	2023	අපේක්ෂිත භෞතික ඉලක්ක කඩිනමින් ළඟාකර ගැනිමට අවශ්‍ය සම්බන්ධිකරණ කටයුතු අමාත්‍යාංශය විසින් සිදුකල යුතුයි.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි.	නිවාස ඒකක 70 ක් නිමකළ යුතුව තිබුණි.

14	ඉන්දියානු ආධාර යටතේ ඉදිකළ නිවාස ඒකක 181 ක් සඳහා යටිතල පහසුකම් සැපයීමට රු.මිලියන 25 ක ප්‍රතිපාදන සලසා තිබුණද වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 24.77 ක් එනම් සියයට 99 ක්ම වැයකර යටිතල පහසුකම් ලබාදී තිබුණේ මුළු නිවාස 111 කට පමණි.	2023	අපේක්ෂිත භෞතික ඉලක්ක ළඟාකර ගත යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුුණි.	2024 අගෝස්තු නිවාසවල ඉදිකිරීම් කටයුතු අවසන් වී නොතිබුණි.
15	2023 වර්ෂය තුළ ස්මාට් පන්තිකාමර 60 ක් ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 155 ක් වෙන්කර තිබුණද, ඉන් කිසිදු මුදලක් වැයකර නොතිබූ අතර ඒ සඳහා අවශ්‍ය පාසල් තෝරාගැනීමේ කටයුතු හා ගිවිසුම්ගත වීමේ කටයුතුද අවසන් කර නොතිබුණි.	2023	අපේක්ෂිත භෞතික ඉලක්ක ළඟාකර ගැනිම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු නිසි පරිදි සිදුකල යුතුයි.	ප්‍රතිපත්ති වෙනස්වීම මත ව්‍යාපෘතියේ විෂය පථය වනස්වීම නිසා නැවත අවබෝධතා ගිවිසුමක් සකස් කර ඉන්දියානු රජයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරඇත.	2024 අගෝස්තු වන විට ගිවිසුම් අත්සන්කර නොතිබුණි.
16	අමාත්‍යාංශයේ වතු යටිතල පහසුකම් සංවර්ධන අංශය විසින් 2017, 2018 හා 2021 වර්ෂයන්වලදී ක්‍රියාත්මක කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 435.77 ක් වූ නිවාස ව්‍යාපෘති 19 ක රු.මිලියන	2023	ප්‍රතිපාදන වෙන්කල අරමුණ ඉටුකර ගැනිම සඳහා නිලධාරීන් වගකීමෙන් යුතුව කටයුතු කළ යුතුයි	2023 ,01,19 දිනැති අංක 2315/35 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව ගිවිසුම් අත්සන් කිරිමෙන් තොරව වැවිලි මානව සංවර්ධන භාරය වෙත වැඩ ඇණවුම් දීම සිදුකරනු ලැබේ.	රජයට වාසිදායක වන අයුරින් අමාත්‍යාංශය විසින් වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවීමට තිබූ අනෙකුත් ව්‍යාපෘතිවල බිල්පත් වෙනුවෙන් හිලව්කර තිබුණි.

	82.12 ක මූලික අත්තිකාරම් මුදලක් හා කළමණාකරණ ගාස්තු වෙනුවෙන් රු.මිලියන 3.6 ක මුදලක්, වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවා තිබුණ නමුත් එම මුදල් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. එමෙන්ම මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි.				
17	මැණික්කඩවර හා මහපල්ලේගම ප්‍රජා ජල ව්‍යාපෘතිය 2019 වර්ෂයේ ආරම්භ කර තිබූ නමුත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ භූ සමීක්ෂණ වාර්තා අනුව භූමිය එම ඉදිකිරීම් කටයුතු සඳහා සුදුසු නොවන බව දක්වා තිබුණද එම උපදෙස් අනුව කටයුතු කර නොතිබුණු බැවින් ඉඩම නායයාම හේතුවෙන් 2024 මාර්තු වන විට ව්‍යාපෘතිය වෙනුවෙන් වැයව තිබූ රු. මිලියන 33ක් නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.	2022 සහ 2023	නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන ලබා දී තිබූ නිර්දේශ නොසලකා ව්‍යාපෘතිය ආරම්භ කිරීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුයි.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුුණි.	නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන ලබා දී තිබූ නිර්දේශ නොසලකා ව්‍යාපෘතිය ආරම්භ කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

18	වැවිලි මානව සංවර්ධන භාරය හා අදාල සමිති සංවිධානය සමඟ එළඹ තිබූ ගිවිසුම් ප්‍රකාරව 2016, 2017, 2018, 2019, 2020 සහ 2021 යන වර්ෂවල ආරම්භ කර තිබූ නිවාස ව්‍යාපෘති 62 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් නිමකර නොතිබුණි. නමුත් එම ව්‍යාපෘතිවල කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම සඳහා රු.මිලියන 846.85 ක මුදලක් සහ අධීක්ෂණය හා කළමණාකරණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් රු.මිලියන 51.37 ක මුදලක් වැවිලි මානව සංවර්ධන භාරය වෙත අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි.	2023	රජයේ අරමුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් හා ඵලදායීතාවයකින් භාවිත කළ හැකි වන පරිදි අදාල කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනිම සහ එම මුදල් නිසි කළමණාකරණයකින් යුතුව වැය කිරීම සඳහා නිසි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි.	2024 වර්ෂයේ වෙන් වී ඇති රු. මිලියන 500ක ප්‍රතිපාදන තුළ ඉතිරි වැඩ කටයුතු කිරීමට අනුමැතිය ලබා දී ඇත.	කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනිම සහ එම මුදල් නිසි කළමණාකරණයකින් යුතුව වැය කිරීම සඳහා නිසි වැඩ පිළිවෙළක් සකස් කර නොතිබුණි.
19	හරිත රන් නිවාස ව්‍යාපෘතිය යටතේ නුවර ප්‍රදේශයේ රොත්වයිල්ඩ් වතුයායේ නිවාස ඒකක 15 ක් සඳහා රු.මිලියන 3.4 ක්ද, නුවරඑළිය, හැටන්, නුවර, ගාල්ල හා රත්නපුර යන ප්‍රදේශවල නිවාස ඒකක 211 ක් සඳහා රු.මිලියන 48.2 ක්ද, තවත් නිවාස ඒකක 29 ක් සඳහා	2023	මෙම නිවාස ව්‍යාපෘති කඩිනමින් නිමකර ප්‍රතිලාභ අපේක්ෂාවෙන් පසුවන ජනතාවට අවශ්‍ය සේවාව කඩිනමින් ලබාදිය යුතුයි.	අඩක් නිමකර ඇති වතු නිවාසවල පැවති ඉදිකිරීම් අදියරයන් පදනම් කර ගනිමින් අමාත්‍යාංශය වෙත ලැබෙන ප්‍රතිපාදන සීමාව තුල ඒ ඒ වර්ෂයන් තුළ අවසන් කල හැකි වැඩ ප්‍රමාණයන් ඉටු කිරීමට සැළසුම් කරනු ලැබේ.	නිවාසවල ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.

	රු.මිලියන 117.2 ක්ද වශයෙන් රු.මිලියන 168.8 ක් වැයකර තිබුණද අදාල නිවාසවල ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.				
20	2021 වර්ෂයේදී නව ජීවන නිවාස ව්‍යාපෘතිය යටතේ නුවරඑළිය, හැටන්, නුවර හා කෑගල්ල ප්‍රදේශවල නිවාස ඒකක 157 ක් සඳහා රු. මිලියන 92 ක් ද 2020 හා 2021 වර්ෂවලදී නුවරඑළිය, හැටන්, නුවර ප්‍රදේශයන්හි රු. මිලියන 45.6 ක් වැය කර තිබූ නිවාස ඒකක 104 ක කටයුතුද කෑගල්ල හා හැටන් යන ප්‍රදේශවල ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 173 ක නිවාස ඒකක 56 ක කටයුතුද 2023 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබුණි.	2023	ප්‍රමාද වූ ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිමකිරීමට කටයුතු කළ යුතුය.	අඩක් නිමකර ඇති වතු නිවාසවල පැවති ඉදිකිරීම් අදියරයන් පදනම් කර ගනිමින් අමාත්‍යාංශය වෙත ලැබෙන ප්‍රතිපාදන සීමාව තුල ඒ ඒ වර්ෂයන් තුළ අවසන් කල හැකි වැඩ ප්‍රමාණයන් ඉටු කිරීමට සැළසුම් කරනු ලැබේ.	නිවාස ඒකක 383 ක ඉතිරි වැඩ කටයුතු ආරම්භ කිරීමට අනුමැතිය ලැබී තිබුණි. අනෙකුත් නිවාස ව්‍යාපෘතිවල වැඩ 2025 වර්ෂයේ ලැබෙන ප්‍රතිපාදන මත නැවත ආරම්භ කිරීමට යෝජිතව ඇත.
21	ඩයගම ප්‍රජා ශක්ති මධ්‍යස්ථානය හරහා සිදුකරන කුකුළු පාලනය, එළු පාලනය, බිම්මල් වගාව හා පොලිතීන් ආශ්‍රිත වගා නියමු ව්‍යාපෘතියෙහි ඉදිකිරීමේ ගිවිසුම	2023	රජයේ අරමුදල් උපයෝගී කරගෙන ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිවලින් මහජනතාව අපේක්ෂා කරන අරමුණු ඉටුකර	ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරිම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබාගන්නා ලදි.	ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කර නොතිබුණි.

	ප්‍රකාරව ව්‍යාපෘතියෙහි වැඩ 2020 දෙසැම්බර් 04 ආරම්භකර 2021 මාර්තු 04 වන විට අවසන් කල යුතු වුවද, ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණේ මාස 06 ක ප්‍රමාදයකින් පසුවය. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා රු.6,092,469 ක් සහ වගා කටයුතු සඳහා රු.920,435 ක් වැයකර තිබූ අතර, ක්ෂේත්‍ර පරීක්ෂණවලදී හඳුනාගත් ඉදිකිරීම් කටයුතුවලට අදාල අඩුපාඩු නිවැරදි කර නොතිබුණි. මේ වන විට ව්‍යාපෘති භූමිය වල් බිහිවී පවතින අතර ජල සැපයුමද අත්හිටුවා තිබුණි.		දිම වෙනුවෙන් අදාල නිළධාරින් වගකීමෙන් යුතුව කටයුතු කල යුතුයි. එමෙන්ම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මගින් අදාල ඉදිකිරීම් සහ නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොවන තත්ත්වයක් තුල රජයේ මුදල් අනාර්ථක ලෙස වැය නොකර වෙනත් විකල්ප වැඩ පිළිවෙලක් යෙදිය යුතුය.		
22	වටගොඩ ප්‍රජා ශක්ති මධ්‍යස්ථානයේ සිදුකරන ලද ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා රු.2,680,657 ක් කොන්ත්‍රාත්කරුවන් වෙතද ඉදිකිරීම් අවසන් නොකර වගා කටයුතු සිදුකිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීම් සඳහා රු.321,002 ක්ද වැයකර තිබුණි. කොන්ත්‍රාත්කරුවන් හා තොණ්ඩමන් පදනම අතර වූ	2023	ගිවිසුම ප්‍රකාරව, අයකල හැකි ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	2021 මාර්තු මාසයෙන් පසු බිල්පත් ඉදිරිපත් නොවීම නිසා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වි ය.	ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කර නොතිබුණි.

ගිවිසුම ප්‍රකාරව, ඇවර කල හානි යටතේ දිනකට රු.1,575 බැගින් ඇවර කරන ලද හානි ලෙස තොණ්ඩමන් පදනමට ගෙවිය යුතු බව සඳහන් කර තිබුණද, වටගොඩ ව්‍යාපෘතිය 2021 මාර්තු 04 දින නිමකළ යුතු වුවද, 2021 සැප්තැම්බර් 22 වන දින අවසන් කිරිම නිසා දින 202 ක ප්‍රමාදයක් පැවති අතර ඒ වෙනුවෙන් අයකළ යුතු මුදල වූ රු.318,150 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.25 තාක්ෂණ අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	707,670,141	28,100	707,642,041	-	තත්ත්වාගණනය කළ
2022	716,912,282	25,000	716,887,282	-	තත්ත්වාගණනය කළ
2023	45,597,696	278,903	45,318,793	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	අමාත්‍යාංශය පවත්වාගෙන යාම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව වර්ග අඩි 7512 ක බිම් ප්‍රමාණයක් රුපියල් මිලියන 1.878 ක මාසික බිම් කුලියක් මත පෞද්ගලික සමාගමක් සමග 2021 ජූනි මස 22 වන දින ගිවිසුම් ගත වෙමින්, වන් ගෝල්ෆේස් කුළුණෙහි පවත්වාගෙන ගිය කාර්යාල පරිශ්‍රයෙන් වර්ග අඩි 2217 ක් ඌන උපයෝජිතව පවතින නිසා 2022 ජූලි 12 දින අදාල ආයතනයට ආපසු භාරදීම හේතුවෙන් එම කාලපරිච්ඡේදයට ගෙවන ලද රු.මිලියන 6.651ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	2021 2022	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීම හා සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කිරීම සඳහා පියවර ගත යුතුය.	කාර්ය මණ්ඩලයේ ඌනතාවය හේතුවෙන් මුළුමනින්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුගත වීම ඉතාමත් දුෂ්කර කාර්යයක් බව දැක්විය යුතුය. ගරු ජනාධිපතිතුමා මෙම අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා ලෙස කටයුතු කරනු ලබන බැවින් එතුමාගේ ආරක්ෂාව සහ ජනාධිපති කාර්යාලයට ආසන්නතාවය යන කරුණු සලකා බලා වන් ගෝල් ෆේස් පරිශ්‍රයට අමාත්‍යාංශය රැගෙන ඒමට තීරණය කරන ලදී. ඩිජිටල් කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය අහෝසිවීමත් සමඟ භූමිය ආපසු භාරදී ඇත.	වර්තමානයේ අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට හා රජයේ චක්‍රලේඛවලට අනුකූලව සිදු කරමින් පවතී.
02	ශ්‍රී ලංකා තොරතුරු හා	2022	ශක්‍යතා	අංක	ව්‍යාපෘතිය අතරමඟ

	සන්නිවේදන තාක්ෂණික නියෝජිතායතනය විසින් රු.මිලියන 40 ක ඇස්තමේන්තු ගත පිරිවැයක් යටතේ ආරම්භ කර 2022 දෙසැම්බර් 31 දින වන විට සමුච්චිත වියදම රු.මිලියන 26.52 ක් දරා රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සඳහා ක්‍රියාත්මක කළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විසඳුම් (ICT Solution for Gov Analyst Dept- GAD) හඳුන්වාදීමේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වලින් සියයට 75ක් පමණ නිමකල පසු නිර්මාණය කරන ලද පද්ධතියේ අයිතමයන් හා ආයතනයේ අවශ්‍යතා අතර වෙනස්කම් පැවතීම හේතුවෙන් අනාවරණය වීම හේතුවෙන් එම ව්‍යාපෘතිය අතරමඟ අත්හිටුවා තිබුණි.		අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති තෝරාගෙන එම ව්‍යාපෘති නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය	CP/23/2443/630/009 හා 2023 දෙසැම්බර් 14 දිනැති කැබිනට් තීන්දුව පරිදි ICTA ආයතනය විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අත්හිටුවා තිබේ.	අත්හිටුවා ඇත.
03	අරමුණු 09ක් ඉටුකර ගැනීමේ පරමාර්ථයෙන් රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් රු.මිලියන 189.909 වැයකර ඉදිකිරීම් කටයුතු හා උපකරණ	2022	පවත්නා සම්පත් කාර්යක්ෂමව භාවිතා කර අදාල ව්‍යාපෘතිවල අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	රොබෝ තාක්ෂණ ආයතනයේ කටයුතු මෙහෙයවීමට තාක්ෂණ අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගනිමින් පවතී.	රොබෝ තාක්ෂණ ආයතනයේ කටයුතු නව මුහුණුවරකින් පවත්වාගෙන යාමට සැලසුම් සකස් කර ඒ සඳහා අනුමැතිය අපේක්ෂා කරමින් සිටී.

	මිලදී ගැනීම් සිදුකර තිබුණද එම අරමුණු 09 ඉටුකරගෙන නොතිබුණි.				
04	රොබෝ තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා වර්ග අඩි 3000 ක පමණ ශ්‍රවණාගාර දෙකක් වායුසමීකරණ යන්ත්‍ර 10ක් සවිකර කාපට් අතුරා බිම් සැලසුම් (foor plan) සකස් කර තිබුණි. මේ සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 40ක් වැය කර ස්ථාපිත කරනු ලැබු Robert Arm යන්ත්‍ර ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතියට අදාල උපකරණ හා යන්ත්‍ර භාවිතා කරන බවට නිරීක්ෂණය විය.	2022	පවත්නා සම්පත් කාර්යක්ෂමව භාවිතා කර අදාල ව්‍යාපෘතිවල අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	මෙය පුද්ගලික අංශයට ඉංජිනේරු හා රොබෝ සේවා ලබාදෙන මධ්‍යස්ථානයක් ලෙස ආදායම් උත්පාදනය කළ හැකි පරිදි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. කර්මාන්ත අමාත්‍යාංශය තාක්ෂණ අමාත්‍යාංශය හා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) අතර ගිවිසුමක් අත්සන් කර මෙය ක්‍රියාත්මක කරනු ලබයි.	මධ්‍යස්ථානය මෙතෙක් ක්‍රියාත්මක නොවේ.
05	අමාත්‍යාංශයේ අංක 02 සංවර්ධන වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව වෙන්කර ගෙන තිබු රු.මිලියන 7,298 ක් වු මුලු ප්‍රතිපාදනයෙන් වර්ෂය තුල භාවිතා කර තිබු වටිනාකම රු.මිලියන 2,071.7 ක් පමණ වු අතර රු.මිලියන 5,226.3ක් හෙවත් මුලු ප්‍රතිපාදනයෙන් සියයට 71.6 ක් ඉතිරි කර තිබුණි. සංවර්ධන වියදම් වැනි විශාල ප්‍රතිපාදන අවශ්‍යතා සඳහා මුදල්	2023	සංවර්ධන වියදම් සඳහා විශාල ප්‍රතිපාදනය න් වෙන්කර ගැනීමේදී අවශ්‍යතා හා පවතින සම්පත් හඳුනාගැනී මෙන්, ඉටුකිරීමේ හැකියාව අධ්‍යයනය කිරීමෙන්ද නිසි පුරෝකථනය කින් යුතුව	වියදම් කළමනාකරණය කිරීමේ චක්‍රලේඛයට අනුගත වීම සහ අත්‍යාවශ්‍ය වියදම් පමණක් දැරීම මත ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	නිසි වියදම් පුරෝකථනයක් සිදුනොකර ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කර ඇත.

වෙන්කර ගැනීමේදී අවශ්‍යතා හා පවතින සම්පත් හදුනාගැනීමෙන්ද, ඉටුකිරීමේ හැකියාව අධ්‍යයනය කිරීමෙන්ද නිසි පුරෝකථනයක් යුතුව සිදුකල යුතු වුවත් එලෙස ඉටුකල නොහැකි කාර්යයන් ඇස්තමේන්තුවල ඇතුලත් කිරීමෙන් ඉහත පරිදි රු.මිලියන 5200 ඉක්මවා ප්‍රතිපාදන ඌන උපයෝජනය සිදු කර තිබුණි.	සිදුකල යුතුය.

3.26 කර්මාන්ත අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,765,813,492	71,930,161	1,693,883,331	-	තත්ත්වාගණනය කළ
2022	2,207,867,042	61,701,774	2,146,165,268	-	තත්ත්වාගණනය කළ
2023	2,180,528,288	57,863,900	2,122,664,388	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	1996 වර්ෂයේ සිට කර්මාන්තපුර 16 ක ඉදිකල පරිපාලන ගොඩනැගිලි 13 ක, කර්මාන්තශාලා 03 ක හා කාර්යාල නිවාස/ සේවා ගොඩනැගිලි 02 ක වටිනාකම වූ රු.මිලියන 544.94 ක් 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කර නොතිබුණි.	2023	ගොඩනැගිලි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.	භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලැබෙන උපදෙස් අනුව ඉදිරියේදී මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	ගොඩනැගිලි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.
02	2023 දෙසැම්බර් 31 වන විට කර්මාන්තපුර 17 කට අදාලව අක්කර 109.5ක් වූ ඉඩම් කට්ටි 89 ක් කර්මාන්තකරුවන් වෙත වෙන් කර තිබුණද ඉඩම් ලබා නොදීම හේතුවෙන් එම ඉඩම් නිෂ්කාර්යව පැවතුණි.	2023	සුදුසු ආයෝජකයින් තෝරා ඉඩම් ලබාදී කර්මාන්ත ආරම්භ කරවීමට ඉක්මන් පියවර ගත යුතුය.	අවලංගු කරන ලද හෝ ඌන උපයෝජිතව පවතින ඉඩම් කොටස් ආයෝජකයින් වෙත නැවත ලබා දීම සඳහා 2024 වර්ෂයේ දී පැවැත් වූ ව්‍යාපෘති ඇගයීම් කමිටු 02 හි ආයෝජකයින් 30 දෙනෙකුට අක්කර 24 රූඩ් 3 පර්චස් 44 ක ඉඩම් ප්‍රමාණයක් ලබා දී තිබුණි. එහි මුළු ආයෝජනය රු. මිලියන 2,109.16 ක් වූ අතර උත්පාදනය කළ හැකි රැකියා ප්‍රමාණය	මේ වන විට අමාත්‍යාංශ ව්‍යාපෘති ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට එවා ඇති ව්‍යාපෘති ගණන 05 කි. අමාත්‍යාංශයට එවීමට ප්‍රාදේශිය කාර්යාලවල ඇති ව්‍යාපෘති ගණන 05ක් හා ප්‍රාදේශිය කර්මාන්ත සේවා

				1431 ක් විය.	කමිටු අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිත ව්‍යාපෘති 08 කි. දැනට කර්මාන්තපුරවල පවතින හිස් ඉඩම් ප්‍රමාණය අක්කර 93කි.
03	බුත්තල කර්මාන්තපුරයට ඉඩම් කට්ටි 43 ක් වෙන් කර තිබුණු අතර ඉන් ඉඩම් කට්ටි 38 ක් කර්මාන්තකරුවන් 20 කට ලබා දී තිබුණි. ඉන් නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබන්නේ කර්මාන්තකරුවන් 5 ක් පමණක් වන අතර කර්මාන්තකරුවන් 03 දෙනෙකු ගොඩනැගිලි ඉදිකර තිබුණද නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි. කර්මාන්තකරුවන් 5 ක් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින අතර කර්මාන්තකරුවන් 7 ක් වෙත වෙන් කර දී තිබුණ පර්චස් 660.13ක් වූ මුලු ඉඩම් ප්‍රමාණයම කිසිඳු සංවර්ධන කටයුත්තක් සිදු නොකර නිෂ්කාර්යව පවති.	2023	කර්මාන්ත කරුවන් විසින් කර්මාන්ත කටයුතු ආරම්භ කිරීම සම්බන්ධයෙන් ලබාදෙන වැඩ සැලැස්ම අනුව කටයුතු කරන්නේද යන්න පිළිබඳව නිරතුරුව පසු විපරම් කර ඒ අනුව කටයුතු නොකරන ඉඩම් නැවත අත්පත් කරගෙන වෙනත් පාර්ශව වෙත පැවරීමට අවශ්‍ය පියවර ගත යුතුය.	බුත්තල කර්මාන්තපුරයට මේ වන විට කර්මාන්තකරුවන් 20 දෙනෙකුට ඉඩම් කොටස් වෙන් කර දී ඇති අතර එයින් කර්මාන්ත 05 ක් සක්‍රීයව පවති. ඉන් දැනට ගොඩනැඟිලි ඉදිකර හෝ ඉදිකරමින් පවතින එහෙත් නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොමැති කර්මාන්ත 09ක් සඳහා 2024.07.31 දින පැවැති ප්‍රාදේශිය කර්මාන්ත සේවා කමිටුව විසින් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා මාස තුනක සහන කාලයක් ලබා දී ඇත.	ඉතිරි කර්මාන්ත 06 2023 දෙසැම්බර් 14 හා 2024 ජූලි 31 දිනයන්හි පැවති ප්‍රාදේශිය කර්මාන්ත සේවා කමිටු විසින් අවලංගු කිරීමට නිර්දේශ ලබා දී ඇති අතර එම කර්මාන්ත 06 න් 05 ක් අවලංගු කිරීම අනුමත කිරීම සඳහා අමාත්‍යාංශය වෙත එවා ඇත. එම අවලංගු කරන ඉඩම් නව ආයෝජකයින් සොයා ඔවුන් වෙත ලබා දීමට නියමිතය.
04	2016 ඔක්තෝබර් 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉලෙක්ට්‍රික් හා ඉලෙක්ට්‍රෝනික උපාංග නිෂ්පාදනය හා එකලස් කිරීම, ඇසුරුම්	2023	කර්මාන්තපුර සංවර්ධන කටයුතු කඩිනමින් නිමකර කර්මාන්ත ආරම්භ	මෙම කර්මාන්තපුරය ආරම්භයේ සිටම විවිධ විරෝධතා පැවති අතර මෙම කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු සිදු කිරීමේ දී සුවශේෂී තත්ත්වයකට මුහුණ දීමට	රයිගම කර්මාන්ත හා තාක්ෂණික සංවර්ධන අධිකලාපය අක්කර 200කින් ආරම්භ කිරීම

	නිෂ්පාදන, අගය එකතු කරන ලද කෘෂිකාර්මික නිෂ්පාදන , රබර් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන, ඇඟළුම් හා ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ස්ථානගත කිරීම කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙමින් අක්කර 200 ක භූමි ප්‍රමාණයක් තුළ රයිගම කර්මාන්තපුරය පිහිටුවීමට අපේක්ෂා කර තිබුණි. කර්මාන්තපුරය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර හා සිදු කළ යුතු සංවර්ධන කාර්යයන් සඳහන් කරමින් ව්‍යාපෘති සැලැස්මක් සකස් කර නොතිබුණි. ඒ හේතුවෙන් කර්මාන්තපුරය සංවර්ධන සඳහා රු.මිලියන 298 ක් වැය කර සංවර්ධන කටයුතු ආරම්භ කර වර්ෂ 07 ක් ගතවී තිබුණද ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි.		කිරීමට දිරිගැන්වීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.	සිදු විය. 2019 නොවැම්බර් මාසයෙන් පසු මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු තාවකාලිකව නතරකල අතර ඉන්පසුව රටතුල ඇති වූ කොවිඩ් වසංගත තත්වය, දේශපාලන අස්ථාවරභාවය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. නැවත මෙම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාම සඳහා අනුමැතිය ලැබුනේ 2023.07.27 දින කර්මාන්ත අමාත්‍යතුමන් විසින් කර්මාන්තපුරයේ කටයුතු නිල වශයෙන් ආරම්භ කිරීමෙන් පසුවය.	සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇතත් පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සකස් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් කර්මාන්තපුරය අක්කර 24කින් ආරම්භ කිරීමට තීරණය වී ඇත. මේ වන විට කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු ආරම්භ කර පවත්වාගෙන යන අතර එහි අභ්‍යන්තර මාර්ග සැකසීම හා ජල සැපයුම, විදුලි සැපයුම ලබා ගැනීම සිදු කෙරෙමින් පවති.
05	2023 දෙසැම්බර් 31 දින වන විට රයිගම කර්මාන්තපුරයේ අභ්‍යන්තර මාර්ගයේ නල එළීමේ කටයුතු සඳහා රු.මිලියන 29.57 ක් හා අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 36.8 ක් වැය කර තිබුණ ද භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 70 ක් හා සියයට	2023	කර්මාන්තපුරය සඳහා වූ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු කඩිනමින් නිමකර කර්මාන්ත ආරම්භ කිරීමට කටයුතු කළ	කර්මාන්තපුර අභ්‍යන්තර මාර්ග ඉදි කිරීම මේ වන විට ආරම්භ කර ඇත. සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා ආයතනය (CESL) විසින් අභ්‍යන්තර මාර්ගය ඉදි කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ සංශෝධිත ඇස්තමේන්තුවට අදාල ප්‍රතිපාදන අනුමත කර ගැනීමෙන් අනතුරුව	කර්මාන්තපුරයට ආදාල කුඹුරු ඉඩම් කොටස අත්පත් කර ගැනීම සඳහා මැනුම් කිරීමට මිනින්දෝරු ආයතනය වෙත ලබා දී තිබුණද මැනුම් කටයුතු සිදු කර ගැනීමට නොහැකි වී ඇත.

	40 ක් විය.		යුතුය.	අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම ආරම්භ කර ඇත.	එබැවින් කර්මාන්තපුරයේ ප්‍රවේශ මාර්ගය සකස් කර ගැනීම ප්‍රමාද වූ අතර එය අභ්‍යන්තර මාර්ගයේ නල එලිමේ කටයුතුවලට බාධාවක් වී ඇති බැවින් මේ පිළිබඳව අමාත්‍යාංශය හා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමඟ එක්ව පියවර ගැනීමට කටයුතු කර ඇත.
06	කර්මාන්තපුරය සඳහා ආයෝජකයින් තෝරා ගැනීමට 2017 ඔක්තෝබර් මස 02 වන දින පල කරන ලද පුවත්පත් දැන්වීමට අනුව ආයෝජකයින් 194 දෙනෙකුගෙන් අයදුම්පත් ලැබී තිබුණු අතර අයදුම්පත් 42 ක් ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව මඟින් ඇගයීම් කර තිබුණි. කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව විසින් තෝරාගත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව තිබුණු ආයෝජකයන් 4 දෙනෙකු තම ආයෝජනයන් ඉවත්	2023	සුදුසු ආයෝජකයින් තෝරා ඉඩම් ලබාදී කර්මාන්ත නැවත ආරම්භ කරවීමට කටයුතු කළ යුතුය.	2019 නොවැම්බර් මාසයෙන් පසු කර්මාන්තපුර ව්‍යාපෘතියේ වැඩ කටයුතු තවකාලිකව නතරකල අතර ඉන් පසුව රටතුල ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය, දේශපාලන අස්ථාවරභාවය, භාණ්ඩ ආනයනය සඳහා තාවකාලිකව පනවා තිබූ සීමාවන් මත කර්මාන්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වූ බැවින් ඇතැම් කර්මාන්තකරුවන් තම ව්‍යාපෘති සිදුනොකරන බව ලිඛිතව දන්වා තිබුණි. නමුත් මේ වන විට කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත.	කර්මාන්තපුරයේ කටයුතු අවසන් කිරීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

	කරගැනීම හේතුවෙන් රු.මිලියන 1185.4 ක් ආයෝජනය තුළින් රැකියා අවස්ථා 715 ක් කර්මාන්ත ක්ෂේත්‍රයට එකතු කිරීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.				
07	බටඅත කර්මාන්තපුරය හම්බන්තොට දිස්ත්‍රික්කයේ අක්කර 105 ක ඉඩම් ප්‍රමාණයක රු.මිලියන 343.41 ක වියදමක් දරා සම් පදම් කිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා 1999 අගෝස්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල තිරණය අනුව ස්ථාපිත කර තිබුණද මෙම කර්මාන්තපුරයේ අපද්‍රව්‍ය බැහැර කිරීමට අදාල විරෝධතා නිසා ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ ආයෝජනය කළ ආයෝජකයින් 06 දෙනෙකුට 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 17.55 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. 2006 පෙබරවාරි 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මිශ්‍ර සංවර්ධන කලාපයක් ලෙස නැවත කර්මාන්තපුරය සංවර්ධනය කර තිබුණ ද කර්මාන්තකරුවන් 23කට ලබාදුන් ඉඩම් අක්කර 70 රූඩ් 1 පර්චස්	2023	කර්මාන්ත සඳහා යෝජිත හා නිෂ්කාර්යව පවතින ඉඩම් ප්‍රමාණය සුදුසු ආයෝජකයන් තෝරා ඉක්මණින් ලබාදීමටත් සංවර්ධනය කරන ලද ඉඩම්වලින් ප්‍රයෝජන ගැනීමටත් කටයුතු කළ යුතුය.	මෙම කර්මාන්තපුරයේ කර්මාන්ත 11 ක් සඳහා ඉඩම් කොටස් වෙන් කර දී ඇත. එහි දැනට සක්‍රිය නොමැති කර්මාන්ත අවලංගු කිරීමට ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව (දකුණ) විසින් කටයුතු කරමින් පවතී.	2023 හා 2024 වන විට මෙම කර්මාන්තපුරය සඳහා නව කර්මාන්තකරුවන් 07 දෙනෙකුට අමාත්‍යාංශය විසින් ඉඩම් කොටස් වෙන් කර දී ඇතත් දැනට පවතින සංවර්ධනය වූ හිස් ඉඩම් ප්‍රමාණය අක්කර 11, රූඩ් 02 පර්චස් 10.8කි. සංවර්ධනය නොවූ හිස් ඉඩම් ප්‍රමාණය සංවර්ධනය කිරීමට 2025 වසර සඳහා යෝජනා ඉදිරිපත් වී ඇත.

	2.3 කින් ප්‍රමාණවත් නිෂ්පාදනයක් සිදුකරනු ලබන්නේ ඉඩම් අක්කර 34 රූඩ් 3 ක් ලබාගත් කර්මාන්තකරුවන් 10ක් පමණක් විය. ඒ අනුව කර්මාන්තපුරයට වෙන් කළ මුලු ඉඩම් අක්කර 105 න් පොදු පහසුකම් සඳහා වෙන් කළ අක්කර 9 රූඩ් 3ක් අඩුකළ පසු ඉතිරි අක්කර 60 කට ආසන්න ඉඩම් ප්‍රමාණයක් උපයෝජනය නොවී නිෂ්කාර්යව පැවතුණි.				
08	බටඅත කර්මාන්තපුරයේ හා රයිගම කර්මාන්තපුරයේ පිළිවෙළින් රු.මිලියන 31.66ක් හා රු.මිලියන 87.96 ක වියදමක් දරා පරිපාලන ගොඩනැගිලි 02ක් ඉදිකර තිබුණද වර්තමානය වන විට භාවිතයකින් තොරව වසා දමා තිබුණි.	2023	කර්මාන්තපුර වල ඉදිකල ගොඩනැගිලි ඵලදායී ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය.	බටඅත කර්මාන්තපුරයේ පවතින පරිපාලන ගොඩනැඟිල්ල එම කර්මාන්තපුරයේ ක්‍රියාත්මක ආයතනයක් වෙත මාසික කුලී පදනම මත සේවකයන්ගේ පරිහරණය සඳහා ලබා දී ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අක්කර 24ක භූමි ප්‍රමාණයක් තුළ ඉදිකරනු ලබන රයිගම කර්මාන්ත හා තාක්ෂණික අධි කලාපය සඳහා වර්ග අඩි 29000ක් පමණ වූ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකර ඇති අතර කර්මාන්තපුරයේ නව කර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා තෝරා ගනු ලැබ ඇති ආයෝජකයින් කිහිපදෙනෙකු එම පරිපාලන	බටඅත කර්මාන්තපුරයේ පවතින පරිපාලන ගොඩනැඟිල්ල මේ වන විට ඉතා අබලන් තත්වයේ පවතී. ප්‍රාදේශිය ලේකම් අම්බලන්තොට විසින් යොමු කරන ලද තාක්ෂණික වාර්තාව අනුව පරිහරණයට නුසුදුසු බැවින් 2021.11.30 දින සේවකයින් ඉන් ඉවත් කරන ලදී. රයිගම කර්මාන්තපුරයේ පරිපාලන ගොඩනැඟිල්ල ආයෝජකයින් වෙත ලබා දීම සඳහා මාසික කුලිය නිර්ණය කර ගැනීමට

				ගොඩනැඟිල්ලෙහි ඉඩකඩ ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත.	තක්සේරු වාර්තාවක් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගෙන ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථානය (බස්නාහිර) වෙත ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත.
09	හම්බන්තොට දිස්ත්‍රික්කයේම දැනට ස්ථාපිත කර තිබෙන බටඅත කර්මාන්තපුරයේ අක්කර 60කට ආසන්න ඉඩම් ප්‍රමාණයක් ඌන උපයෝජිතව පවතින අතර ඊට ආසන්නව සූරියවැව අක්කර 20 ක ඉඩමක කර්මාන්තපුරයක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 252.7 මුදලක් වැය කිරීම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	2023	සැලසුම් කර ආරම්භකර ඇති කර්මාන්තපුර තුළින් අපේක්ෂිත සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.	අක්කර 105 කින් යුතු බටඅත කර්මාන්තපුරයේ මේ වන විට හිස් බිම් කොටස් ඇති නමුත් මෙහි ආහාර නිෂ්පාදන කර්මාන්ත 02ක් ඇතුළුව ලෙඩ්-ඇසිඩ් බැටරි නිෂ්පාදනය, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන, වානේ ආශ්‍රිත නිෂ්පාදන, කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන යන කර්මාන්ත ස්ථාන ගත කොට ඇත. මෙම කර්මාන්තපුරයේ බොහෝ ප්‍රමාණයක් ආහාර නොවන කර්මාන්ත ඇති අතර හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආහාර ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ස්ථානගත කිරීමට යෝජිත සූරියවැව කර්මාන්තපුරය යොදා ගැනීමට නියමිතය.	සූරිය වැව කර්මාන්තපුරයේ ප්‍රවේශ හා අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කිරීම මේ වන විට ආරම්භ කර ඇත.
10	2010 නොවැම්බර් 09 දින මන්නාරම දිස්ත්‍රික්කයේ කර්මාන්තපුරයක් ස්ථාපනය කිරීමට අදාල අමාත්‍ය මණ්ඩල යෝජනාව අනුව අක්කර 24 ක ඉඩම් ප්‍රමාණයක	2023	කර්මාන්ත සඳහා වෙන් කර ඇති හා නිෂ්කාර්යව පවතින ඉඩම් ප්‍රමාණය සුදුසු ආයෝජකයන් තෝරා	කර්මාන්තපුරයේ දැනට ක්‍රියාත්මක ඇහලුම් නිෂ්පාදන ආයතනය එහි ආරම්භක ඇහලුම් කර්මාන්ත ආයතනය නොවූවත් වර්තමානයේද එම ගොඩනැගිලි පරිශ්‍රයන් භාවිතා කරමින් (අක්කර	මන්නාරම කර්මාන්තපුරය සඳහා නව දැව ආශ්‍රිත ගෘහභාණ්ඩ හා සිමෙන්ති ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපෘතියක්

	රු.මිලියන 356 ක වියදමක් දරා කර්මාන්තපුරය ඉදිකර වර්ෂ 13 ක් ගත වී තිබුණද මේ දක්වා කර්මාන්ත ආරම්භ කර නොමැත. අක්කර 6 ක ඉඩම් ප්‍රමාණයක් භාවිතා කරමින් එක් කර්මාන්තකරුවෙක් පමණක් ඇගළුම් කර්මාන්තයක් පවත්වා ගෙන යනු ලැබ තිබුණි.		ලබාදීමටත් දරා ඇති අතිවිශාල පිරිවැයට සරිලන ප්‍රතිලාභයක් ලබාගැනීමට ත් කටයුතු කළ යුතුය.	6ක ඉඩම) ක්‍රියාත්මක වන්නේද ජාත්‍යන්තරව ප්‍රසිද්ධියක් උසුලන තවත් ඇඟලුම් නිෂ්පාදන ආයතනයකි. මෙම නව ඇඟලුම් නිෂ්පාදන ආයතනය තම නිෂ්පාදන කටයුතු පුළුල් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ඉදි කරනු ලැබූ වර්ග අඩි 20,000 බැගින් වූ ගොඩනැගිලි 02ක් සහිතව අක්කර 02 රූඩ් 2.5ක ඉඩම් කොටසක් ලබාදී ඇති අතර එම ආයතනය විසින් අදාල අනෙකුත් පහසුකම් සංවර්ධනය කරමින් පවතී.	වෙත නව ඉඩම් කොටසක් වෙන් කිරීමට අමාත්‍යාංශ අනුමැතිය ලබා දී ඇති අතර තවත් ව්‍යාපාති 02 ක් ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථානය (උතුර) වෙත ලැබී ඇත.
11	ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප පිහිටුවීම සඳහා වන ව්‍යාපෘතිය යටතේ ගිරාදුරුකෝට්ටේ, දිඹුලාගල, දික්වැල්ල හා ත්‍රිකුණාමලය අදියර III යන කර්මාන්තපුර 4ක ඉඩම් මැනුම් කර ගැනීම, එලිපෙහෙලි කිරීම හා ඉඩම් කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කිරීම වැනි කටයුතු සඳහා රු.3,266,558 ක් 2022 වර්ෂයේ වියදම් කර තිබුණද 2023 වර්ෂයේ එම ව්‍යාපෘතිවල කටයුතු අත්හිටුවා තිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් දරන ලද වියදම් නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.	2023	කර්මාන්තපුර සංවර්ධන කටයුතු ප්‍රමුඛතා පදනම මත ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.	2022 අයවැය තුළින් ඒ සඳහා රු. මි. 5000ක් වෙන් වුවද වසර ආරම්භයත් සමඟ රටතුළ ඇති වූ දේශපාලන අස්ථාවරත්වය, රටතුල පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් වෙන්කල මුදල් ප්‍රායෝගිකව නොලැබුණු අතර රජය විසින් සංවර්ධන කාර්යයන් සඳහා මුදල් නිදහස් කිරීම දැඩි සමාලෝචනයකට පත් කෙරුණි. ඒ අනුව නිදහස් වූ සීමිත ප්‍රතිපාදන යොදා ගනිමින් ඒ වන විටත් සංවර්ධන කටයුතුවලින් වැඩි ප්‍රමාණයක් නිම කරනු ලැබ ඇති කර්මාන්තපුරවල කටයුතු පමණක් මුළුමනින් නිම කිරීමට අමාත්‍යාංශය ගත් තීරණයත් සමඟ මෙම කර්මාන්තපුර 03හි	මෙම කර්මාන්තපුර 03හි සංවර්ධන කටයුතු තාවකාලිකව නතරකර ඇත. අයවැය මගින් වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණය අනුව හා ප්‍රමුඛතාවය අනුව ඉදිරියේදී මෙම කර්මාන්තපුර 03හි ද සංවර්ධන කටයුතු සිදු කිරීමට නියමිතය.

				සංවර්ධන කටයුතු තාවකාලිකව නතරකර ඇත.	
12	කර්මාන්තකරුවන් වෙත ඉඩම් වෙන්කිරීමේදී ඉඩම වෙන් කිරීමෙන් පසුව අවුරුදු 35 ක දීර්ඝකාලීන බදු ගිවිසුමක් අත්සන් කල යුතු වුවද කර්මාන්තපුර 25 ක කර්මාන්තකරුවන් 322ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි.	2023	කර්මාන්ත කරුවන් සඳහා දීර්ඝකාලීන බදු ගිවිසුම් ලබාදීමේ කටයුතු කළ යුතුය. ඉඩම් වෙන් කිරීමට ප්‍රථම බදු ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ කරගත යුතුය.	කර්මාන්තපුරවලින් ඉඩම් වෙන් කර දී ඇති , එහෙත් බදු ගිවිසුම් තවමත් සකස් වී නොමැති ආයෝජකයින්ගේ බදු ගිවිසුම් කඩිනමින් සකස් කර දීම සඳහා අමාත්‍යාංශය විසින් කර්මාන්තපුර මට්ටමින් ජංගම සේවා පැවැත්වීම 2021 වර්ෂයේ සිට ආරම්භ කර ඒ සඳහා අදාල සියලුම රාජ්‍ය ආයතනවල නිලධාරීන් හා ආයෝජකයින් සහභාගිත්වයෙන් මේ වන විට ක්‍රියාත්මක කෙරේ.	කර්මාන්තපුරවල කර්මාන්තකරුවන් සඳහා බදු ඔප්පු සැකසීම සම්බන්ධයෙන් පැණ නැගී ඇති ගැටළු සාකච්ඡා කර ඇති අතර ඒ සම්බන්ධව ගත යුතු කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට අදාල ආයතන දැනුවත් කර ඇත.

3.27 පරිසර අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,623,610,877	43,716,469	1,579,894,408	-	තත්ත්වාගණනය කළ
2022	1,631,302,942	33,408,618	1,597,894,324	-	තත්ත්වාගණනය කළ
2023	1,644,399,186	37,471,542	1,606,927,643	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	පරිසර සංරක්ෂණය වැඩසටහන යටතේ රු.මිලියන 100.82 වැයකර ක්‍රියාත්මක කරන ලද හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන මඟින් පැලතවාන් ඇති කිරීම සඳහා ව්‍යවසායකයින් තෝරා ගැනීමේදී නිර්ණායක හා ඔවුන්ගේ ධාරිතාවය සලකා බැලිය යුතු වුවද එසේ නොකිරීම නිසා ව්‍යවසායකයින් 28 දෙනෙකු වැඩසටහන අතර මඟ නවතා දමා තිබුණි. ඒ අනුව නොගැළපෙන හා ශක්‍යතාවයක් නොමැති ප්‍රතිලාභීන් තෝරා ගැනීම නිසා සත්‍ය වශයෙන් ප්‍රතිලාභ හිමි විය යුතු සුදුසුකම් සහිත ව්‍යවසායකයින්ට	2021	අදාල නිරීක්ෂණ හා නිර්ණායක අනුව කටයුතු කල යුතුය.	මෙම වැඩසටහන සඳහා හරිත ව්‍යවසායකයින් තෝරා ගැනීමේදී පදනම් කර ගත යුතු නිර්ණායක හා පොදු උපදෙස් පත්‍රිකාවක් දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කර ඇත. ඒ අනුව සියළු තෝරා ගැනීම් දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය හා අනුමැතිය මත තෝරා එවන ලද අයගෙන් තෝරාගත් අය සඳහා පමණක් මුදල් නිදහස් කර ඇත.	ව්‍යවසායකයින් 19 දෙනෙකු වෙත ලබාදුන් රු.මිලියන 5.7 ක ප්‍රතිපාදන නැවත අයකරගෙන තිබූ අතර ඉතිරි ව්‍යවසායකයින් 09 දෙනෙකුගෙන් අය විය යුතු රු.මිලියන 1.41 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා ලබාගැනීමට කටයුතු කරමින් පවතී.

	අවස්ථාව අහිමි වී තිබුණු අතර රජයේ මුදල් නිෂ්කාර්යව වැය කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.				
02	සොබාදම් පියස ගොඩනැගිලි පරිශ්‍රයේ රු.මිලියන 12.53 ක් වැය කර අපජල පිරිපහදු පද්ධතියක් ස්ථාපිත කර තිබූ අතර ඉන් රු.මිලියන 3.47 ක් ජීව වායු නිෂ්පාදන ඒකකය සඳහා වැය කර තිබුණි. 2017 සැප්තැම්බර් 14 දින සිට විගණිත දිනය වූ 2023 මාර්තු 23 දින දක්වා වූ වර්ෂ 5 කට අධික කාලයක් තුළ ජනනය වූ ජීව වායුව උපයෝජනය නොකර වායු ගෝලයට මුදා හැර තිබුණි. මේ අනුව පද්ධතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	2022	සම්පත් ඵලදායී ලෙස උපයෝජනය කල යුතුය.	ජීව වායු ඒකකයේ සිට ආපනශාලාව තෙක් ජීව වායුව රැගෙන ගොස් පරිහරණය කිරීම සඳහා ඊට අවශ්‍ය උපකරණ යොදා සකස් කරන ලෙස අතිරේක ලේකම් (පාලන) ගේ 02/03/සේවා/01/23 හා 2019 ජනවාරි 08 දිනැති ලිපිය මගින් දන්වා ඇති අතර ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු පිළිබඳව මධ්‍යම ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යාංශයේ නියෝජිතයින් හා 2020 දෙසැම්බර් 09 දින පැවති සාකච්ඡාවකදී එම ආයතනය මෙම අළුත්වැඩියා සිදු කිරීම එදින වන විට අවසන් කර ඇති නමුත් ප්‍රයෝජනයට ගැනීමට ප්‍රමාණවත් ජීව වායු නිෂ්පාදනය මෙමගින් සිදු නොවන අතර අමාත්‍යාංශ ගොඩනැගිල්ල පිහිටි ඉඩමට අපජලය මුදා හැරීමට නොහැකි බැවින් අපජලය මෙම පද්ධතියට මුදා හැරීම කරනු ලබයි.	ජීව වායු ඒකකය ඉදිකිරීමට රු.මිලියන 3.47 ක පිරිවැයක් දරනු ලැබුව ද නිෂ්පාදනය කරනු ලබන ජීව වායු ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් අපේක්ෂා කරන ලද අරමුණු කරා ළඟා වීමට නොහැකි වී ඇත.

03	පරිසර අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන සොබාදම් පියස ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු.මිලියන 261 ක් මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමට හා ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.	2023	සොබාදම් පියස ගොඩනැඟිල්ල පිහිටි ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.	ඉඩම නීත්‍යානුකූලව පවරාගැනීම සඳහා 2024 සැප්තැම්බර් 30 දින වන විටත් සිදුකර නොතිබුණි.
04	අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් අගය තුළ 2023 නොවැම්බර් 09 දින අපහරණය කර තිබූ වාහනයකට සහ 2023 දෙසැම්බර් 31 දින වන විට වෙනත් ආයතන වෙත පවරා දී තිබුණු වාහන 10 කට අදාල රු.මිලියන 27.79 ක වටිනාකමද ඇතුළත්ව තිබුණි.	2023	අපහරණය කල හා පවරා දී ඇති වත්කම් නිසි පරිදි ගිණුම්ගත කල යුතුය.	නීත්‍යානුකූලව තහවුරු කර ගැනීමෙන් අනතුරුව නිවැරදි කරගැනීමට කටයුතු කරනු ලැබේ.	වාහන නීත්‍යානුකූලව පවරා ගැනීමට මේ වන තෙක් කටයුතු කර නොතිබුණි.
05	(i) දේශගුණ විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරී සහයෝගීතා ව්‍යාපෘතියේ අරමුණු ළඟා කර ගැනීමට ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත හුවමාරු ජාලකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 31ක්	2023	ව්‍යාපෘති කාර්යසාධනය පිළිබඳ නියාමනය හා පසුවිපරම් සිදු කල යුතුය.	ජාතික දේශගුණික විපර්යාස දත්ත හුවමාරු ජාලයෙහි පැවති යම් කාර්මික බිඳවැටීම් නැවත එම උපදේශන සමාගමේ ද සහාය ඇතිව ප්‍රතිස්ථාපනය කළ අතර දැනට හඳුනාගත් පාර්ශවකාර ආයතන කිහිපයක් සමග මෙම පද්ධතිය වෙත දත්ත එකතු කිරීමට කටයුතු මේ වන විට සිදු කරමින්	දත්ත හුවමාරුකරන ජාලකරණ පද්ධතිය සඳහා 2022, 2023 වර්ෂ සඳහා නඩත්තු පිරිවැය දරනු ලැබුවද ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතී.

	වැයකර උපදේශන සේවාවක් ලබා ගෙන පැවතියද 2024 මාර්තු 31 වන විටද මෙම පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. මේ සඳහා ලබාගෙන පැවති රු. මිලියන 3.1ක් වූ කාර්යසාධන බැඳුම්කරය ද 2024 අප්‍රේල් 12 දින කල් ඉකුත් වීමට නියමිතව පැවති අතර මෙම පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතියදී 2022 හා 2023 වර්ෂයන්ට අදාලව රු.මිලියන1.86 ක් නඩත්තු කටයුතු සඳහා වැයකර තිබුණි.			පවතී. එම අත්හදා බැලීම් සැසිය අවසානයේ නැවත සියළුම හඳුනාගත් කේන්ද්‍රීය ලක්ෂයන් වෙත පුහුණු සැසියක් පවත්වා දත්ත ඇතුලත් කිරීමට පියවර ගනු ඇත. • වර්තමානයේදී මෙම ව්‍යාපෘති කාර්යසාධනය ඇගයීමට ලක් කරනු ලබන අතර නියාමන හා පසු විපරම් කටයුතු සිදු කරනු ලැබේ. • අපේක්ෂිත කාර්යසාධන මට්ටම ළඟා කරගැනීම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල මට්ටමක් සකස් කරමින් පවතී. ඒ අනුව අවබෝධතා ගිවිසුම් ඇති කර ගැනීමටත්, එම ගිවිසුම් කාලීනව සමාලෝචනය කිරීමට හා ඒ අනුව කටයුතු කිරීමට ක්‍රියා කරනු ලැබේ.	
(ii)	මෙම පද්ධතිය සඳහා දත්ත ලබාදෙන පාර්ශවකාර ආයතන 55 ක් හඳුනාගෙන තිබුණ ද ඉන් ආයතන 08 ක් සමඟ පමණක් අවබෝධතා ගිවිසුම් අත්සන් කර තිබුණු අතර අදාල ආයතන මඟින් ලබාදිය යුතු දත්ත නිශ්චිතව හඳුනාගෙන ඒ සඳහා එකඟතාවය ලබා ගැනීමට කටයුතු කර	2023	අපේක්ෂිත කාර්යසාධන මට්ටම ළඟා කර ගැනීම සඳහා නීත්‍යානුකූල පසුබිමක් ඇතිකල යුතුය.	• ව්‍යාපෘති නිසි පරිදි කළමනාකරණය කර ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. • වර්තමානයේදී නිසි පරිදි කළමනාකරණය කිරීමට උපදෙස් දෙනු ලැබේ.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් කිසිදු ආයතනයක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

නොතිබුණි. පරිසර අමාත්‍යාංශය විසින් දත්ත සපයන ආයතන වෙත දත්ත ජාලය සඳහා අවසර ප්‍රවේශය ලබා දී නොතිබුණි.				
(iii) මෙම පද්ධතිය සඳහා රු. මිලියන 12.45ක වැට් රහිත මිලකට ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍ර 55 ක් 2020 දෙසැම්බර් 30 දින මිලදී ගෙන තිබූ අතර මිලදී ගත් දින සිට මාස 14 කට පසුව පාර්ශවකාර ආයතන 55 ක් වෙත අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට පෙර ඒවා ලබා දී තිබුණි. විගණන නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද පාර්ශවකාර ආයතන 27 අතුරින් පාර්ශවකාර ආයතන 20 ක් ම මෙම ඩෙස්ක්ටොප් පරිගණක ජාලය වෙත දත්ත සම්ප්‍රේෂණය කිරීමට හෝ ඊට අදාල දත්ත සැකසීම සඳහා භාවිත කර නොතිබුණි.	2023	ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හැකි ආකාරයට සැලසුම් කල යුතුය.	මෙම දත්ත හුවමාරු ජාලකරණ පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා නැවත දත්ත සැපයූ පාර්ශවකාර ආයතනවල සහාය ඇතිව පැවති යම් කාර්මික බිඳවැටීම් නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා හඳුනාගත් නව පාර්ශවකාර ආයතන කිහිපයක් සමග දත්ත එකතු කිරීම මේ වන විටත් සිදු කරනු ලැබේ. ඒ අනුව මෙම පරිගණක සියල්ලම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු කරගැනීමට කටයුතු කරනු ලබයි.	කිසිදු ආයතනයක් 2024 නොවැම්බර් 30 දින දක්වා අදාළ දත්ත පද්ධතිය වෙත දත්ත සම්ප්‍රේෂණය කර නොතිබුණි.

	(iv) 2021 නොවැම්බර් 19 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපවතින බැවින් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් පැවතිය යුතු බව හා මෙම පද්ධතිය දිගින් දිගටම පසු විපරම් කිරීමේ අවශ්‍යතාවය ද අවධාරණය කර තිබුණ ද අමාත්‍යාංශය ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	රජයේ ගිණුම්කාරක සභාවේ නිර්දේශ පරිදි කටයුතු කල යුතුය.	පද්ධයෙහි පැවති යම් කාර්මික බිඳවැටීම් නැවත එම උපදේශන සමාගමේ සහාය ඇතිව ප්‍රතිස්ථාපනය කළ අතර දැනට හඳුනාගත් පාර්ශවකාර ආයතන කිහිපයක් සමග මෙම පද්ධතිය වෙත දත්ත එකතු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එම අත්හදා බැලීම් සැසිය අවසානයේ නැවත සියළුම හඳුනාගත් කේන්ද්‍රීය ලක්ෂයන් වෙත පුහුණු සැසියක් පවත්වා දත්ත ඇතුළත් කිරීමට පියවර ගනු ඇත. එසේම පාර්ශවකාර ආයතනයන්ගෙන් ලබාගැනීමට නියමිත දත්ත පිළිබඳව නැවත සමීක්ෂණයක් සිදු කළ යුතු අතර දත්ත ලබාදීමට අපහසු ආයතන හඳුනාගෙන එම දත්ත පිළිබඳව සාකච්ඡා සිදු කරන ලදී. මෙම අත්හදා බැලීම් සැසි අවසානයේ සියළුම පාර්ශවකාර ආයතන සමග ගිවිසුම්ගත වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී.	රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ උපදෙස් අනුව දත්ත පද්ධතිය මේ වන තෙක් යාවත්කාලීන කර නොතිබුණි.
06	සුවදායී භූමි දර්ශ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 51.56 ක් වැය කර වගා කටයුතු සඳහා ජලය ලබා ගැනීමේ අරමුණින්	2023	ව්‍යාපෘතිවල අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකල යුතුය.	මෙම ව්‍යාපෘතිය යටතේ පරිසර ප්‍රතිසංස්කරණයක් ලෙස ඔලගම් වැවක් වන තුම්බිකුලම වැව ප්‍රතිසංස්කරණය කරන	2024 සැප්තැම්බර් 30 දිනැතිව අතිරේඛ ලේකම් (ස්වාභාවික සම්පත්) විසින්

	තුම්බිකුලම වැව ප්‍රතිසංස්කරණය කර තිබුණ ද එම වැව මඟින් වගා කටයුතු සඳහා ජලය මුදා හැරීමේ හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය. වැවෙහි වාන් ජලය එල්ලංගාවේ පහළ පිහිටි වැව් කරා ගලා යාමට හැකිවන පරිදි ඇළ මාර්ග පිළිසකර කිරිම සඳහා අදාල ආයතන සම්බන්ධීකරණය කිරීමට කටයුතු කර නොතිබීම ඊට හේතු වී තිබුණි.			ලදී. මෙම ඔලගම් වැවේ නිසි ක්‍රියාකාරීත්වය එල්ලංගා පද්ධතියේ ඇති අනෙකුත් වැව් වල යහපත් ක්‍රියාකාරීත්වය හා භූ ගත ජල මට්ටම ඉහළ යාම හා එල්ලංගා පද්ධති ආශ්‍රිත පරිසර පද්ධතිවල යහපැවැත්ම සඳහා සෘජු දායකත්වයක් සපයයි. මෙම ඔලගම් වැව් නිසි ලෙස නඩත්තු වන්නේ නම් දිගු නියං කාලවලදී එල්ලංගා පද්ධතිවල හා ඒ ආශ්‍රිත පරිසර පද්ධතිවල ජල සුරක්ෂිතතාවය තහවුරු වනු ඇත. එමගින් ඒ ආශ්‍රිත ජනතාවගේ හා වන ජීවීන්ගේ යහපැවැත්ම තහවුරු වනු ඇත. ඒ අනුව මෙම වැව් ප්‍රතිසංස්කරණය තුළින් එම අරමුණු මේ වන විටත් ළඟා කර ගැනීමට හැකි වී ඇත. මෙම වැව් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වැවක් වන බැවින් අවශ්‍යතාවය අනුව ඉදිරි පියවර ගැනීමට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබූ ලිපිය අනුව එම දෙපාර්තමේන්වේ ඉදිරි ක්‍රියාකාරි සැළසුම් මඟින් පහළ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට අවධානය යොමුකර ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කිරීම් කරන ලෙස ඉල්ලීම් කර තිබුණි. ඉහත කරුණු අනුව 2024 සැප්තැම්බර් 30 දින දක්වා වාන් ජලය එල්ලංගාවේ පහල පිහිටි වැව් වෙත ගලා යෑමට අවශ්‍ය ඇළ මාර්ග සකස් කර නොතිබුණි.
07	එසේම තුම්බිකුලම වැව ප්‍රතිසංස්කරණයට අදාල ගිවිසුමේ නිමැවුම් ලෙස අක්කර 200 ක කුඹුරු ප්‍රතිස්ථාපනය සහ පරිසර පද්ධතිය ප්‍රතිස්ථාපනය ද දක්වා තිබුණ ද 2013	2023	ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම ඒ සම්බන්ධ වූ නීත්‍යානුකූල පසුබිම පිළිබඳව අවධානය යොමු කල යුතුය.	ඉදිරියේදී ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඒ සඳහා වන නීත්‍යානුකූල පසුබිම පිළිබඳ අවධානය යොමු කර කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත.	2023 ජුනි 16 දින ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරනු ලැබුවද වගාකටයුතු

	අගෝස්තු 01 දිනැති හා අංක 1821/34 දරන ගැසට් පත්‍රය මඟින් තුම්බිකුලම වැව සහ ඒ ආශ්‍රිත හෙක්ටයාර් 2,744 ක ප්‍රදේශයක් තුම්බිකුලම රක්ෂිත වනාන්තරයට අයත් ලෙස නම්කර තිබුණු බැවින් උක්ත ගිවිසුමේ නීත්‍යානුකූලව ළඟාකර ගත නොහැකි නිමවුම් දක්වා ඇති බව ද නිරීක්ෂණය විය.				සඳහා ඉඩම් නිදහස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන නොතිබූ අතර අදාළ ආයතන සමඟ ඒකාබද්ධ පරීක්ෂණයක් සිදුකිරීමට කටයුතු කරමින් පවතී.
08	ව්‍යාපෘතිය යටතේ තුම්බිකුලම වැව ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව 2022 ජනවාරි 26 දින පළුගස්වැව ප්‍රාදේශීය සම්බන්ධීකරණ රැස්වීමේදී සාකච්ඡා කර තිබූ අතර වන සංරක්ෂණ හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් වන ජීවීන්ගේ ප්‍රයෝජනය සඳහා මෙම වැව සොරොව්වක් රහිතව ඉදිකිරීමට එකඟතාවය ලබා දී තිබුණ ද රු. මිලියන 1.54ක් වැයකර මෙම වැවෙහි සොරොව්වක් ඉදිකර ඇති බව 2023 අගෝස්තු 14 දින සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාව අනුව නිරීක්ෂණය විය.	2023	ව්‍යාපෘති කටයුතු විධිමත් පරිදි ක්‍රියාත්මක කල යුතුය.	මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය සඳහා තෝරා ගත් වැව් අතර තුම්බිකුලම වැව පැවති අතර ඒ වන විටත් එම වැවට සොරොව්වක් නොපැවතිණි. වැව ප්‍රතිසංස්කරණය කරන අවස්ථාවේදී අබලන්ව පැවති සොරොව්ව ද පිළිසකර කරන ලද අතර ඔබගේ නිර්දේශ අනුව මේ වන විට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අදාල අනුමැතිය ලබාගැනීමට කටයුතු කර ඇත.	තුම්බිකුලම වැව ප්‍රතිසංස්කරණයේ දී සොරොව්වක් ඉදිකිරීම සඳහා 2022 ජනවාරි 26 පැවති සම්බන්ධීකරණ සාකච්ඡාවේදී එකඟතාවය ලබාදී නොතිබූ අතර ඉන් පසුව හෝ ඒ සඳහා වූ තීරණ හා අනුමැතිය ලබාදීම පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

09	2023 සැප්තැම්බර් 27 දින ආසියා ශාන්තිකරයේ අමාත්‍යවරුන්ගේ හා පරිසර බලධාරීන්ගේ සංසදයේ 5 වැනි සැසිය සඳහා සහභාගී වූ නිලධාරීන්හට ආහාර සැපයීමට අදාල ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන කමිටු තීරණය ලබා දී තිබුණ අතර එහි දී බේකරි ආයතනයක් වෙතින් සේවාව ලබා ගැනීමටත් එක් ආහාර වේලක් සඳහා ආහාර පැකට් 200 ක් ලෙස මුළු ආහාර පැකට් 3,712 ක් ලබා දෙන ලෙසත් ඉල්ලීම් කර තිබුණි. ප්‍රසම්පාදන කමිටුව විසින් අවශ්‍යතාවය පදනම් කර ගනිමින් අවශ්‍ය ආහාර පැකට් ප්‍රමාණය ඇණවුම් කිරීමටත් එම ප්‍රමාණය ඉක්මවා යන්නේ නම් නැවත ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට යටත්ව ලබා ගැනීමටත් අනුමැතිය ලබා දී තිබුණි. නමුත් මෙම සමුළුව සඳහා ආහාර පැකට් 8,423 ක් එනම් ඉහත මිල ගණන් කැඳවා තිබූ ආහාර පැකට් 3,712 ට අමතරව ආහාර පැකට් 4,711 ක් මිල දී ගෙන තිබුණි. මේ අනුව මිල දී ගැනීමට අනුමැතිය ලබා දුන් ප්‍රමාණයට වඩා සියයට 127 ක	2023	වැඩසටහනේ කටයුතු නිසි පරිදි හඳුනාගෙන රජයේ අරමුදල් සඳහා උපරිම ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට සැලසුම් කල යුතුය.	මෙලෙස සිදු වූයේ ආරක්ෂක හේතූන් මත පූර්ව දැනුම් දීමක් නොකර අදාළ දිනයේ උදෑසන හෝ යම් රාජකාරියක් පැවරෙන ලද විගස ආරක්ෂක අංශයට ද කැම අවශ්‍යතාවය ලබාදීම නිසා වේ. තවද රාජ්‍ය නායකයින් හා නියෝජිතයෝ මෙරටට පැමිණීම ද එකම දිනයක සිදු වී නැත. කෙසේ වෙතත් ඉදිරියේදී ව්‍යාපෘති කටයුතු නිසි පරිදි හඳුනාගෙන අදාළ මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදී.	ව්‍යාපෘතිය නිසි පරිදි හඳුනාගෙන අදාළ මාර්ගෝපදේශ අනුව ඉදිරියේදී කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇත.

	ආහාර පැකට් ප්‍රමාණයක් මිල දී ගෙන තිබුණ බව විගණනයේ දී නිරීක්ෂණය විය. ඉහත කරුණ අනුව මෙම සමුළුව සඳහා අවශ්‍ය ආහාර සැපයීම වෙනුවෙන් රු.මිලියන 2.42 ක් වෙන් කර තිබුණ ද මේ සඳහා රු.මිලයන 4.44 ක් ගෙවා තිබූ අතර ආහාර සැපයීම සඳහා රු.මිලියන 2.02 ක් අපේක්ෂිත මුදල ඉක්මවා වියදම් කර තිබූ බව නිරීක්ෂණය විය.				
10	ආසියා ශාන්තිකරයේ අමාත්‍යවරුන්ගේ හා පරිසර බලධාරීන්ගේ සංසදයේ 5 වැනි සැසිය සඳහා සහභාගී වූ නිලධාරීන්හට ආහාර සැපයීම සඳහා තෝරාගත් ආයතනය වෙත ඒ සඳහා ගෙවිය යුතු මුදල වූ රු.මිලියන 4.44 ක මුදල සඳහා වූ චෙක්පත ආයතනයේ පුද්ගලයෙකුගේ පෞද්ගලික නමට ලබාදෙන ලෙස අදාළ ආයතනය විසින් ඉල්ලීමක් සිදු කර තිබුණු අතර ඒ අනුව අමාත්‍යාංශය විසින් අදාළ පුද්ගල නාමයට චෙක්පත ලබා දී තිබුණි. ඉහත කරුණු අනුව ආහාර සැපයීමට සේවාව ලබා දුන් ආයතනය නමින් චෙක්පත් ලබා නොදී	2023	අදාල චක්‍රලේඛ හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශන අනුව කටයුතු කල යුතුය.	ආහාර සැපයීම සඳහා තෝරා ගත් ආයතනය අදාල පුද්ගල නමට ලියාපදිංචි කර තිබූ ආයතනයක් බවට ලිපි ඉදිරිපත් කර තිබූ බැවින් නමට චෙක්පත ලබා දෙන ලදී.	ඉදිරියේදී නිර්දේශ ප්‍රකාරව කටයුතු කරන බව දන්වා ඇත.

	එම මුදල පුද්ගල නාමයකට ලබා දීමට අමාත්‍යාංශය කටයුතු කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.				
11	2013 වර්ෂයේදී අනතුරකට ලක්ව තිබූ වාහනයක් වර්ෂ 10 කට අධික කාලයක් අළුත්වැඩියා වියදම පියවීමට නොහැකිව පෞද්ගලික ගරාජයක රඳවා තිබුණු අතර 2023 වර්ෂයේදී මෙම වාහනය රු. මිලියන 1.8කට අපහරණය කර තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) යටතේ පරීක්ෂණය සිදු කර අළුත්වැඩියා වියදම අයකරගත යුතු ආකාරය නිවැරදිව තීරණය කර නොතිබූ බැවින් අපහරණය මඟින් ලද මුදලින් රු.මිලියන 1.61 ක් භාවිතා කරමින් අනතුරු අළුත් වැඩියා කිරීමේ වියදම පියවා ඉතිරි මුදල වූ රු. 185,895 ක් පමණක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේශණය කර තිබුණි. මේ අනුව රු.මිලියන 1.61 කින් රජයට අලාභයක් සිදු වී ඇති බව විගණනයේදී අනාවරණය විය. කෙසේ වුවද අමාත්‍යාංශය විසින් මෙම සිද්ධිය නිසි පරිදි	2023	අනතුරට අදාල අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශව හඳුනාගෙන එම අලාභ අයකර ගැනීමට කටයුතු කල යුතුය.	මේ වන විට මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරමින් පවතී.	මේ සම්බන්ධව විමර්ෂණ කටයුතු තවදුරටත් සිදුකරමින් පවති. සති දෙකක් ඇතුළත විමර්ෂණ කටයුතු අවසන් කරන බවට දැනුම්දෙන ලදි.

	ගිණුම් ගත කර අලාභ හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.				
12	අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/1739/622/021 වූ "එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි නගරයේ දී පැවැත්වෙන දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ පාර්ශවකරුවන්ගේ 28 වන සමුළුව " යන මැයෙන් පරිසර අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ 2023 සැප්තැම්බර් මස 07 දිනැති සංදේශය සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ නිරීක්ෂණ තුළ, " වියදම් පාලනය සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ විදේශ සංචාර සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන් හේතුවෙන්, ඉහත සමුළුව සඳහා අත්‍යාවශ්‍යම හා අවම නිලධාරීන් සංඛ්‍යාවක් සහභාගී වීම සුදුසු වේ සහ එම නිලධාරී මණ්ඩලය නිශ්චිත ලෙස නම් කිරීමෙන් අනතුරුව ජනාධිපති ලේකම්ගේ පූර්ව එකඟතාවය සඳහා ඉදිරිපත් කළ යුතුය " ලෙස දක්වා තිබුණි.	2023	ජනාධිපති ලේකම්ගේ පූර්ව අනුමැතිය රහිතව විදේශ ගත වූ නිලධාරීන් සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා විදේශ සංචාර සම්බන්ධව චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත.	ජනාධිපතිතුමාගේ පූර්ව එකඟතාවය ලබා නොගෙන සමුළුවට සහභාගී නිලධාරීන් 6 සම්බන්ධව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණු අතර අදාල නිලධාරීන් විසින් සමුළුව අවසන් වීමෙන් පසු ඉදිරිපත් කල යුතු ප්‍රගතිය පිළිබඳ වාර්තාව මේ වන තෙක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

එසේ අනුමැතිය ලබාගෙන තිබූ නිලධාරීන්ට අමතරව අමාත්‍යාංශයේ තවත් නිලධාරීන් 06 දෙනෙකු මෙම සමුළුව සඳහා සහභාගී වී ඇති බව නිරීක්ෂණය වූ අතර එම නිලධාරීන් සමුළුවට සහභාගී වීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ පූර්ව එකඟතාවය ලබාගෙන නොතිබුණ බව ද නිරීක්ෂණය විය. තව ද එම නිලධාරීන් 06 දෙනා අතුරින් නිලධාරීන් තිදෙනෙකු පරිසර සැලසුම් හා ආර්ථික අංශයට අනුයුක්තව කටයුතු කරන අතර එම නිලධාරීන් දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ සමුළුව සඳහා සහභාගී වීමට තෝරා ගැනීමේ ප්‍රමුඛතා පදනම විගණනයේ දී තහවුරු නොවිය. තවද මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ලෙස “සමුළුව අවසන් වීමෙන් අනතුරුව , ශ්‍රී ලංකාව සඳහා දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය පිළිබඳ

	වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය ” ලෙස දක්වා තිබුණ ද එවැනි වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණ බව නිරීක්ෂණය විය.				
13	පරිසර අමාත්‍යවරයා හා කාර්යමණ්ඩලය වෙත 2023 ඔක්තෝබර් 24 දින අමාත්‍යාංශය විසින් වාහන 07 ක් අනුයුක්ත කර තිබුණ නමුත් ඉහත වාහන වලට අමතරව විවිධ අවස්ථා වලදී අමාත්‍යාංශය සතු සංචිත වාහන 04 ක් ද අමාත්‍ය කාර්යමණ්ඩලය විසින් භාවිතයට ගෙන තිබුණි. 2023 ඔක්තෝබර් 24 දින සිට 2024 පෙබරවාරි 03 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ඉහත සඳහන් වාහන 04 භාවිතා කර කිලෝමීටර් 16,950 ක් ධාවනය කර තිබුණු අතර මේ සඳහා ඉන්ධන (ඩීසල්) ලීටර් 2,366 ක් අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණි. මේ අනුව චක්‍රලේඛ ප්‍රකාරව අමාත්‍යවරයාට සහ අමාත්‍යකාර්ය මණ්ඩලයට ලබා ගත හැකිව තිබූ වාහන ප්‍රමාණය ඉක්මවා වරින් වර ලබාගත් වාහන 04 සඳහා ඉන්ධන ලීටර් 2,366 ක් ලබා දීමට	2023	චක්‍රලේඛ ප්‍රතිපාදන අනුගමනය කල යුතුය.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී.	වගකිව යුතු රියදුරු මහතුන්ගෙන් අදාළ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොමැත.

අමාත්‍යාංශය රු. මිලියන 0.83ක් වැය කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.28 වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	337,468,698	318,759,366	18,709,332	-	තත්ත්වාගණනය නොකළ
2022	469,423,870	452,157,501	17,266,369	-	තත්ත්වාගණනය කළ
2023	442,325,344	428,634,551	13,690,793	-	තත්ත්වාගණනය නොකළ

විගණන වාර්තාවලට ඇතුළත් කර ඇති ප්‍රධාන අඩුපාඩු	විගණන වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ පියවර	වර්තමාන තත්ත්වය
1. මූල්‍ය සමාලෝචනය				
1.1. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම				
2016 දෙසැම්බර් 29 දිනැති හා අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සෑම මාස 12 ක කාල සීමාවකට වරක් හෝ කි.මී.25000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂාවක් කල යුතු බව දක්වා ඇතත් 2023 වර්ෂයේ අමාත්‍යාංශයේ වාහන සඳහා එම චක්‍රලේඛය අනුව	2023	2016 දෙසැම්බර් 29 දිනැති හා අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව ක්‍රියා කළ යුතු වීම.	පැවති ඉන්ධන අර්බුදය හමුවේ ප්‍රමාණවත් ඉන්ධන සපයා ගැනීමේ අපහසුතාව නිසා ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට නොහැකිව තිබුණි.	අමාත්‍යාංශය භාරයේ ඇති වාහන 47 න් සංචිත වාහන 10 පමණක් 2024.08.01 දින ඉන්ධන පරීක්ෂාව සිදුකර තිබුණු අතර සංචිත වාහන 05 ක්ද ඇතුළුව වාහන 37 ක් සඳහා ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි.

ඉන්ධන පරික්ෂාවක් සිදුකර නොතිබුණි.

2. මෙහෙයුම් සමාලෝචනය

2.1. පාඩු හා හානි

(අ)	2022 අප්‍රේල් 06 දින PG 9548 දරන කැබ් රථය අනතුරකට භාජනයවී තිබූ අතර එහි අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු.587,480 ක මුදලක් වැයකර තිබුණි. එහෙත් රක්ෂණ ආයතනය විසින් ගෙවීමට එකඟවී තිබුණේ රු.250,000 ක මුදලක් පමණි. වාහනය අනතුරට භාජනය වීමෙන් වූ හානිය ප්‍රතිපූර්ණය කර ගැනිම සඳහා රක්ෂණ ආයතනයෙන් පූර්ණ වන්දි මුදල් ලබාගැනිමට හෝ රියදුරු විසින් ගෙවා පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට තිබිය යුතු කොන්දේසි හෝ සපුරා නොතිබීම හේතුවෙන් රජයට රු.337,480 ක පාඩුවක් සිදුවී තිබුණි.	2023	රියදුරන් වෙත රාජකාරී පැවරීමේදී වාහනය විධිමත් අයුරින් භාරදීමට කටයුතු කළ යුතු වීම.	අනතුර සිදු වන විට අදාල වාහනය මෙම අමාත්‍යාංශය සතුව නොව එවකට පැවති රාජ්‍ය අමාත්‍යාංශය සතුව පැවතුණි.	විමසුමේහි සඳහන් වාහනය රක්ෂණය කර ඇති බැවින් රක්ෂණය වන්දි ලබාගැනිම හෝ රියදුරුගෙන් අයකරගැනීම සිදුකල යුතුය එසේ ලබාගැනිමට නොහැකි විම මත රජයට පාඩුවක් සිදුවි ඇත.
(ආ)	වැඩ තහනම් කර තිබුණු නිලධාරියෙකුගෙන් අමාත්‍යාංශය වෙත අයවිය යුතුව තිබුණු රු.293,470 ක ණය ශේෂය වර්ෂ 20 කට	2023	හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම.	වසර 20 කට පෙර සිට පැවත එන ශේෂයකි.	විගණන විමසුමේ සඳහන් ණය මුදල මේ දක්වා අයකර ගැනිමට නොහැකිවී ඇත.

අධික කාලයක සිට හිඟහිටව පැවැත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ශේෂය අයකර ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි. මෙම නිරවුල් නොවූ ණය ශේෂයන් දිගින් දිගටම ණය ලේඛනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි.				
2.2. මතභේදයට තුඩුදෙන ගණුදෙනු				
2011 වර්ෂයේ ඉදිකරන ලද සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවිය යුතු ණය පියවීම සඳහා 2017 දෙසැම්බර් 14 දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ගෙවිය යුතු ලෙස සඳහන් කොට මහජන බැංකුවෙන් රු.3,950,858,870 මුදලක් වාර්ෂිකව සියයට 33.30 ක පොලියත් (පොලි අනුපාතය වෙනස් වේ) සමග වසර 15 ක කාලයක් තුළ ගෙවිය යුතු වන රු.11,796,877,071 ක් ණය මුදලක් ලබාගෙන තිබුණි. ගෙවීම සඳහා ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ හා	2023	අමාත්‍යාංශයේ අරමුණුවලට අනුකූලවන පරිදි සැලසුම් සකස් කර අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගත යුතු විම.	අමාත්‍ය මණ්ඩල සංදේශයන් හරහා මෙම අමාත්‍යාංශය යටතට පවරා ඇත.	විගණන විමසුමේ පෙන්වා දී ඇති පරිදි අමාතංශයෙම අරමුණු හා ක්‍රියාමාර්ග වලට අනුකුල නොවන මෙම වියදම් සඳහා 2024 වර්ෂය තුලද වෙන්කිරීම් සිදුකර තිබුණි.

අමාත්‍ය මණ්ඩල තීරණ මගින් අනුමැතිය ලබා දී තිබුණු අතර ඒ අනුව 2018 වර්ෂයේ සිට ණය පොලී ගෙවීමටත් 2021 වර්ෂයේ සිට ණය පොලී හා වාරික ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් මෙම අමාත්‍යාංශය වෙත සලසා දී තිබුණි. අමාත්‍යාංශයට අයත් නොවන මෙම ක්‍රිඩාංගනය සඳහා සමාලෝචිත වර්ෂයේදී ණය වාරික හා පොලී වශයෙන් රු.1,485,050,090 ක මුදලක් අමාත්‍යාංශයේ බැංකු පොලී හා මූල්‍ය වියදම් ලෙස වැය විෂයය - 176–2–4 – 23 1509 ii (ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සූරියවැව, ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය - රාජ්‍ය ආයතන) යටතේ ගෙවා තිබුණි. මෙම වියදම අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදමෙන් සියයට 73.62 ක්, ප්‍රාග්ධන වියදමෙන් සියයට 26.99 ක් හා මුළු වියදමින් සියයට 46.62 ක් විය.

මෙම ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකර ඇති ඉඩම 2011 අප්‍රේල් 26 දින රජයේ ඉඩම් ආඥා පනතේ 23(2) ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට

පවරා ඇති නමුත් වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශට එහි කිසිදු අයිතියක් නොමැත.

ඉහත කරුණු අනුව අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ දරන ලද මෙම වියදම අමාත්‍යාංශයේ අරමුණු හා ක්‍රියාකාරකම්වලට අනුකූල නොවී තිබුණි.

3.29 මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	අතිරික්තය (ඌනතාවය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	14,542,664,905	14,542,664,905	14,325,048,730	-	තත්ත්වාගණනය නොකළ
2022	14,469,647,590	14,469,647,590	14,224,140,812	-	තත්ත්වාගණනය නොකළ
2023	14,478,344,344	14,478,344,344	13,844,257,042	-	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	මුදල් අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු කටයුතු අංශය සඳහා ඡායාපිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා සීමිත මිල ගණන් යටතේ පෞද්ගලික සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද රු.1,539,000 (බදු සහිත) ක ලංසුව තෝරාගෙන, 2021 වර්ෂයේදී එම කොන්ත්‍රාත් වටිනාකම මත කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. (i) ඉහත යන්ත්‍රය මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය අනුව සකස් කළ ලංසු ලේඛනවල 2.7 වගන්තිය අනුව	2021	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණ ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.	අදාළ ආයතනය වෙත ප්‍රදානය කිරීමේදී කාර්යසාධන ඇපකරය ලබාගෙන නොමැති බව හා ඉදිරියේදී එසේ නොවීමට වගබලා ගැනීමට කටයුතු කරනු ලැබේ.	2024 දෙසැම්බර් 31 දින වන විටත්, අවශ්‍ය නිවැරදිකිරීම් සිදුකිරීමට හෝ ඉදිරියේදී එවැනි තත්වයන් වලක්වාගැනීම ට නිලධාරින් දැනුවත් කිරීමට හෝ අවශ්‍ය විධිමත් ක්‍රියාමාර්ග ගෙන ඇති බවට අණාවරණය නොවුණි.

කොන්ත්‍රාත් මුදලින් සියයට 5 ක් වූ කාර්යසාධන සුරක්ෂණය සැපයුම් කොන්ත්‍රාත්තුව අවසන් වී දින 28 ක් ඔබ්බට වූ දිනය දක්වා කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි ඉදිරිපත් කළ යුතුව තිබුණත්, සැපයුම් කොන්ත්‍රාත්තුව සම්බන්ධව එම කාර්යසාධන සුරක්ෂණ ලබාදී නොතිබුණි.				
(ii) තෝරාගත් කොන්ත්‍රාත්කරුට 2021 මැයි 20 දින මිලදී ගැනීමේ ඇනවුම් නිකුත් කර තිබුණද, සැපයුම් කාල පරිච්ඡේදය හා යන්ත්‍රය පිළිබඳ වගකීම් කාලය ඇතුළත් කොන්දේසි සහිතව කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි.	2021	සැපයුම් කාල පරිච්ඡේදය දක්වා අංග සම්පූර්ණ ලෙස ගිවිසුමක් සකස් කර ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතු වීම.	කොන්ත්‍රාත් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලංසු ලේඛනයේ කොන්දේසි සඳහා දෙපාර්ශවයේ එකඟතාවය මත ප්‍රදානය කරන ලදි.	-එම-
(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 හා 4.2.3 මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදනයක් ආරම්භවීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර	2021	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙළ කර ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු කළ යුතු වීම.	ප්‍රසම්පාදන ක්‍රියාවලියට කාල රාමු සකස් කර නොතිබුණි.	-එම-

පිළිබඳ විස්තර කර අදියර 02 ක් යටතේ ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණි. ප්‍රසම්පාදනය 2021 පෙබරවාරි 18 දින ආරම්භ කර මාස 06 දින 24 ක කාල පමාවකට පසුව අදාළ යන්ත්‍රය 2021 සැප්තැම්බර් 14 දින සපයා තිබුණි.				
(iv) ප්‍රසම්පාදනය යටතේ 2021 සැප්තැම්බර් 14 දින අමාත්‍යාංශය වෙත ලැබුණු ඡායා පිටපත් යන්ත්‍රය සඳහා අදාල සැපයුම් කොන්ත්‍රාත්කරු හට මුදල් ගෙවීමට ප්‍රථම අදාල පිරිවිතරවලට අනුකූලද යන්න පිළිබඳව තාක්ෂණික නිලධාරියෙකුගේ සහතිකයක් ලබාගෙන නොතිබුණි.	2021	සපයා ගන්නා ලද භාණ්ඩ නියමිත පිරිවිතරවලට අනුකූලද යන්න පිළිබඳව තාක්ෂණික නිලධාරියෙකුගේ පරීක්ෂාවට ලක් කර සහතික කරවා ගත යුතු වීම.	තාක්ෂණික නිලධාරියෙකුගේ පරීක්ෂාවට යොමු කර නොමැති බව හා ඉදිරියේදී මෙම දෝෂය වළක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.	-එම-
(v) සැපයුම් කොන්ත්‍රාත්තුවට අදාළව ලංසු ලේඛනවල සඳහන් වූ කොන්දේසි යටතේ නියමිත දිනට අදාළ සැපයුම සිදුකිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වුවහොත් ප්‍රමාදවන සෑම දිනක් වෙනුවෙන් කොන්ත්‍රාත් මුදලින්	2021	සැපයුම් කාල වකවානු දක්වා අංග සම්පූර්ණ ලෙස ගිවිසුමක් සකස් කර ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතු වීම හා ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු වීම.	ප්‍රමාද ගාස්තු අය කිරීමක් සිදු නොකරන ලදි.	-එම-

	සියයට 0.05 කට සමාන මුදලක් අඩුකරගත යුතු බව දක්වා තිබුණි. මෙම සැපයුම් කොන්ත්‍රාත්තුවට අදාළ ඇණවුම 2021 මැයි 21 දින නිකුත් කර මාස 06 දින 24 ක කාලයකට පසුව සැපයුම සිදුකර තිබුණද, මෙම සැපයුම් කොන්ත්‍රාත්තුව සම්බන්ධව සැපයුම් කාල පරිච්ඡේදය දක්වා ගිවිසුම්ගත වී නොතිබුණු බැවින් ඉහත කොන්දේසිය පරිදි ප්‍රමාද අලාභ අයකරගැනීමට නොහැකි වී තිබුණි.				
02.	මහා භාණ්ඩාගාර ගොඩනැගිල්ලෙහි ස්ථාපිත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සිදු කළ අලුත්වැඩියාවක් සඳහා රු.15,698,375 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් සකස් කර තිබුණු අතර, විවෘත මිල ගණන් කැඳවා රු.12,732,080 ක පිරිවැයකට (බදු රහිත) කොන්ත්‍රාත්තුව පිරිනමා 2022 මැයි 05 දින වන විට කොන්ත්‍රාත්කරුට රු.8,418,434 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.	2022	රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව හා ICTAD විසින් නිකුත් කර ඇති උපදෙස් අනුව කාර්යසාධන සුරක්ෂණ ලබාගත යුතු වීම	බැඳුම්කර කාලය තවදුරටත් දීර්ඝ කිරීමට කටයුතු කර නොමැති බව කාරුණිකව දන්වමි.	2024 දෙසැම්බර් 31 දින වන විටත්, අවශ්‍ය නිවැරදිකිරීම් සිදුකිරීමට හෝ ඉදිරියේදි එවැනි තත්වයන් වලක්වාගැනීම ට නිලධාරින් දැනුවත් කිරීමට හෝ අවශ්‍ය විධිමත් ක්‍රියාමාර්ග

(i) ලංසු වටිනාකම ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 20 ක අඩුවක් පැවති බැවින්, 2021 ජනවාරි 11 දිනැති අංක 3/2020(i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා ICTAD ආයතනය නිකුත් කර ඇති උපදෙස් මාලාවේ ITB 34:2 වගන්තිය ප්‍රකාර කාර්යසාධන සුරක්ෂණ සියයට 15 ක් විය යුතු විය. අමාත්‍යාංශය විසින් 2021 දෙසැම්බර් 31 දින දක්වා සියයට 15 කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන තිබුණ ද, 2022 ජනවාරි 01 සිට 2022 අගෝස්තු 12 දක්වා සියයට 5 ක් පමණක් වන පරිදි කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.			ගෙන ඇති බවට අනාවරණය නොවුණි.
(ii) අදාළ 2022 කොන්ත්‍රාත්තුව 2021 ජූලි 16 දින නිම කර භාරදිය යුතු වුවත් කොන්ත්‍රාත්කරු විසින් 2021 දෙසැම්බර් 10 දක්වා දින දීර්ඝ කිරීම ඉල්ලා තිබුණ ද, දින දීර්ඝ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු	පිළිගත හැකි හේතු මත පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට කටයුතු කළ යුතු විම.	උපදේශන ආයතනයේ ලබා දී ඇති එකඟත්වය මත දින දීර්ඝ කිරීම් අනුමත කර ඇත.	-එම-

	ඉදිරිපත් කර ඇති හේතු පිළිගත හැකි මට්ටමේ නොමැති බව උපදේශන ආයතනය දන්වා තිබියදීත් කොන්ත්‍රාත් කාලය 2021 දෙසැම්බර් 10 දක්වා දීර්ඝ කර තිබුණු බව නිරීක්ෂණය විය.				
	(iii) විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව කොන්ත්‍රාත් කාලය 2021 දෙසැම්බර් 10 දිනෙන් පසුව දීර්ඝ කර නොතිබුණු අතර, 2022 පෙබරවාරි 28 දක්වාත් ඉදිකිරීම් සිදු කර තිබුණි. ඒ අනුව, කොන්ත්‍රාත් ගිවිසුමේ 49.1 වගන්තිය ප්‍රකාරව 2022 පෙබරවාරි 28 දක්වා ප්‍රමාද ගාස්තු ලෙස රු.1,018,566 ක් අයවිය යුතු වුවත්, අමාත්‍යාංශය ඒ අනුව අය කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	2022	කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වීම.	ප්‍රමාද ගාස්තු අය නොකරන ලදි.	-එම-
03.	දෙසැම්බර් 31 වන විට අමාත්‍යාංශයේ CIGAS පරිගණක මෘදුකාංග පද්ධතියේ SA 82 පරිගණක මුද්‍රිතයේ සඳහන් වත්කම් ලැයිස්තුව (Asset List) අනුව වාහන අංක හා ඊට අදාළ පිරිවැයන් වෙන්	2022	පරිගණක මුද්‍රිතයේ සඳහන් වත්කම් ලැයිස්තුව අනුව වාහන අංක හා ඊට අදාළ පිරිවැයන් හඳුනාගත හැකි පරිදි ක්‍රමවේදයක් සකස් කළ යුතු	CIGAS පරිගණක මෘදුකාංග පද්ධතිය යාවත්කාලින කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි.	ස්ථාවර වත්කම් ලේඛනය සහ CIGAS පරිගණක මෘදුකාංගය 2024 දෙසැම්බර් 31 දින වන විටත් යාවත්කාලීන

	වෙන් වශයෙන් හඳුනාගත නොහැකි වූ බැවින්, අමාත්‍යාංශය සතු මුළු වාහන සංඛ්‍යාව පරිගණක මුද්‍රිත මඟින් නිශ්චය කර ගත නොහැකි විය. තවද, අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට පවත්වාගෙන ගිය ස්ථාවර වත්කම් ලේඛනය අනුව වාහන පිරිවැය රු.692,869,000 ක් වූ අතර, CIGAS පරිගණක මුද්‍රිතය (SA-82) ප්‍රකාරව එය රු.1,832,801,692 ක් වූයෙන් රු.1,131,932,692 ක වෙනසක් නිරීක්ෂණය විය.		විම.		කර නොතිබුණි.
04.	සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 03 දෙනෙකුගෙන් වසර 10 – 20 දක්වා කාලයක් ඉක්මවූ අයවිය යුතු ණය ශේෂ එකතුව රු.469,418 ක් සහ වසර 1 – 3 දක්වා කාලය ඉක්මවූ අයවිය යුතු රු.119,073 ක ණය ශේෂය වශයෙන් එකතුව රු.588,491 ක හිඟ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍යාංශය වෙත අයවී නොතිබුණි.	2023	හිඟ ණය අයකර ගැනිමට කඩිනම් පියවර ගත යුතුය.	සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් 2024 ජනවාරි මාසය සඳහා රු.5000.00ක මුදලක් අය වී ඇති අතර ඉතිරි වාරික අයකර ගැනීම සඳහා සිහිකැදවීම් ලිපි යොමුකර ඇති බව හා තවදුරටත් ණයහිමියා විසින් ගෙවීම සිදු නොකරන්නේ නම් එම මුදල ඇපකරුගෙන් අයකර ගැනීමට කටයුතු කරන බවත්, තවත් එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය පිළිබඳව නීතිපති උපදෙස් සඳහා යොමු කර ඇත.	සේවය අතහැර ගොස් ඇති නිලධාරින්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට හිඟ හිටව තිබූ ණය ශේෂය රු.563,491 ක් වී තිබුණි.

05.	ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට අනුයුක්තව සිටි නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු.2,633,505 ක් විය. මෙම ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍යාංශය වෙත අයවී නොතිබුණි.	2023	-එම-	එවකට පැවති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය අහෝසි වූ අතර එහි පාලන කටයුතු මුදල් අමාත්‍යාංශයට පැවරුණි. එහෙයින් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අත්තිකාරම් ගිණුමේ ශේෂය මුදල් අමාත්‍යාංශයේ අත්තිකාරම් ගිණුම් අංක 10201 වෙත පවරා ගන්නා ලදි. ඉදිරියේදී එම ණය ශේෂ අයවිය යුතු පුද්ගලයින් සේවය කරන සේවා ස්ථාන තවදුරටත් හඳුනා ගෙන අයකර ගැනීමට හෝ එසේ අයකර ගත නොහැකි ණය ශේෂයන් මු.රෙ. 113 (3) ප්‍රකාරව ණය ශේෂ කපා හැරීමට හෝ කටයුතු කරන බව දැනුම් දෙමි.	2024 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ණය ශේෂය රු.2,040,420 ක් වී තිබුණි
06.	රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණය ඒකකයක් පිහිටුවා තිබූ අතර ඒ පිළිබඳව පහත නිරීක්ෂණ කෙරේ. (i) 2022 ඔක්තෝබර් 25 දිනැති අංක MF/063/CM/2022/	2023	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විමසා අවශ්‍යතාවය, කුසලතාවය හා නිපුණතා මත පදනම්ව බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර කළමනාකරණ සේවා	මේ යටතේ පෙන්වා දී තිබූ පරිදි 2022 ඔක්තෝබර් මස 11 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ MF/052/CM/2022/215 රාජ්‍ය ව්‍යවසායකත්ව ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය සඳහා 37 කින් සමන්විත කාර්යමණ්ඩලයක් බඳවා ගැනීමට	2024 දෙසැම්බර් 31 දින වන තෙක් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

215 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව 37දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් මෙම ඒකකයට අනුමත වී තිබුණ අතර, 2023 සැප්තැම්බර් 25 දිනැති අංක MF/052/CM/2022/177 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බව දක්වා තිබුණි. එසේ වුවද, බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කරවා ගැනීමකින් තොරව ඒකකය සඳහා කොන්ත්‍රාත් පදනම මත 12 දෙනෙකු බඳවාගෙන තිබුණි.	දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමැතිය ලබා ගත යුතු වීම.	අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, මෙම ඒකකය සඳහා තාවකාලිකව බඳවා ගත් තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කරන ලදි. විශේෂයෙන්ම මෙම ඒකකයේ ප්‍රධානතම පරමාර්ථය වූයේ රජයට අයත් සියලුම ව්‍යාපාරික ව්‍යවසායන් ප්‍රතිව්‍යූහගත කිරීමට ප්‍රතිපත්තියක් සකස් කර, ඊට අවශ්‍ය ස්ථාපිත ආයතනයක් පිහිටුවීමයි. ඒ අනුව, එම පිහිටුවන ලබන ආයතන පාලක සමාගම (Holding Company) යටතේ බඳවා ගන්නා කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීමට කටයුතු කරනු ඇත.	
(ii) රජය සතු ව්‍යාපාර 2023 ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියේ සඳහන් 02 වන මූලධර්මයෙහි සඳහන් පරිදි පාලක සමාගමක් පිහිටුවීම හා 2023 මැයි මස 15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන් අංක MF/036/CM/2023/107 හා 2023.05.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	පාලක සමාගමක් පිහිටුවීම සඳහා යෝජනා කර, එහි කෙටුම්පත් සකස් කර මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදි. පසුව එම කාර්යය යෝජිත රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ පනතට ඇතුලත් කර එය ආරම්භ කිරීම සුදුසු බව	2024 දෙසැම්බර් 31 දින වන තෙක් පාලක සමාගමක් ස්ථාපිත කර නොතිබුණි.

4.2 හා 4.3 ඡේද අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඇතුළත් රජය සතු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියේ ඇමුණුම 02 හා 03 හි ලැයිස්තුගත කර ඇති ආයතන 72 ක් ප්‍රතිව්‍යුහගතකරණය සඳහා පාලක සමාගම (HOCO) වෙත, එහි අනුබද්ධිත සමාගම් ලෙස පැවරීමට දක්වා තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි පාලක සමාගමක් (HOCO) ස්ථාපිත කර නොතිබුණි.			රජයේ ප්‍රතිපත්තිය විය. එම නිසා ඉහත යෝජනා මේ වන විටත් ක්‍රියාත්මක වී නොමැත.	
(iii) ඉහත පරිදි පාලක සමාගම (HOCO) වෙත පවරාගෙන, ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා වී තිබූ ඉහත සංදේශයේ ඇතුළත් රජය සතු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියේ ඇමුණුම 02 ලැයිස්තුවේ සඳහන්, ආයතන 08 ක් අතරින් ආයතන 07 ක් මේ වන විටත්, පාලක සමාගම වෙත පවරා ගැනීමකින් තොරව, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ රජය සතු කොටස් බැහැර කිරීමට	2023	-එම-	මේ යටතේ දක්වා ඇති ආයතන 08 අතරින් ආයතන 07 ක් මේ වන විටත් රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ, රජය සතු කොටස් බැහැර කිරීමට (Divestiture) ගනුදෙනු උපදේශකවරුන් බඳවා ගෙන ලංසු කැඳවීමේ ක්‍රියාවලියේ අදියර කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා රජයේ ප්‍රමුඛතාව අනුව 2023.03.13 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී, අංක 23/0431/604/046 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු, මෙම කාර්යයන් ආරම්භ කර	-එම-

	(Divesture) ගනුදෙනු උපදේශකවරුන් බඳවාගෙන ලංසු කැඳවීමේ ක්‍රියාවලියේ අදියර කිහිපයක් ක්‍රියාත්මක කර ඇති බවත්, මේ යටතේ ඇති එක් ආයතනයක් නීතිපතිවරයාගේ උපදෙස් මත තාවකාලිකව අත්හිටුවා ඇති බවත් නිරීක්ෂණය විය.			ඇත. මේ යටතේ Water Edge ආයතනය නීතිපතිවරයාගේ උපදෙස් මත තාවකාලිකව අත්හිටුවා ඇත.	
07.	රාජ්‍ය සේවා කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස රාජ්‍ය ආයතන හා පෞද්ගලික අංශයේ සහයෝගීතාවයෙන් යුත් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදයක් හඳුන්වා දීම අරමුණු කර ගනිමින් 2022 සැප්තැම්බර් මස 13 දින අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් අනුමැතිය මත රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ජාතික නියෝජිතායතනය පිහිටුවා තිබුණ අතර ඒ පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ. (i) අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විමසා අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදුකල යුතු වුවද, 2024 මැයි 06 දින වන විට කාර්යමණ්ඩලය සඳහා 11 දෙනෙකු වසර	2023	අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අනුමැතිය ලබා ගත යුතු වීම.	2023.09.22 දින අප විසින් කාර්යමණ්ඩල බඳවා ගැනීම් හා සම්බන්ධයෙන් (Scheme of Recruitment) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කරන ලදි. එම කරුණ සම්බන්ධව මෙතෙක් පිළිතුරක් ලැබී නොමැත.	බඳවා ගැනීමේ පරිපාටිය සඳහා 2024 දෙසැම්බර් 31 දින තෙක් කළමනාකරණ සේවා දෙපාර්තමේන් තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

03 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා බඳවාගෙන තිබුණ ද, බඳවා ගැනීම් පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.				
(ii) විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව, 2023 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව නියෝජිතායතනය ව්‍යාපෘති 12 සම්බන්ධයෙන් කටයුතු ආරම්භ කර ඇති අතර තවදුරටත් ව්‍යාපෘති 07 ක් සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කිරීමට අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී නිශ්චිත නෛතික රාමුවක් පැවතීම ඉතා වැදගත් වුවද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් පෞද්ගලික හවුල්කාරීත්ව වැඩසටහනේ නෛතික රාමුව (PPP bill) කෙටුම්පත් මට්ටමේ මූලික අදියරයන්හි පැවතුණ බව නිරීක්ෂණය විය.	2023	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර ඊට අදාළ නෛතික ප්‍රතිපාදන සලසා ගත යුතු වීම.	2023 දෙසම්බර් 31 වන දින විට පෞද්ගලික හවුල්කාරිත්වය වැඩසටහනේ නෛතික රාමුව (PPP Bill) මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද පෞද්ගලික හවුල්කාරිත්වය වැඩසටහනේ නෛතික රාමුව අනුමත වන තෙක් PPP ව්‍යාපෘති සඳහා "Guidelines on Government Tender Procedure - Part II" සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක "02/ 2019"උපයෝගී කරගනු ලබයි.	2024 දෙසැම්බර් 31 දින තෙක් මෙම පනත කෙටුම්පත් මට්ටමේ පැවතුණි.

08.	අමාත්‍යාංශයේ 2022 2023 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව Digital Printing ක්‍රමවේදය යටතේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය පිටපත් එකක් පිළිවෙලින් රු.30,894 ක්, රු.38,605 ක් හා රු.28,641 ක් බැගින් රු.4,285,237ක් වැයකර පිටපත් 120 ක් මුද්‍රණය කරවා ගෙන තිබුණ අතර යලි ඇනවුම් කිරීම යටතේ Offset Printing ක්‍රමවේදය යොදාගෙන එම සැපයුම්කරුගෙන්ම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය පිටපත් එකක් පිළිවෙලින් රු.3,768 ක් රු.3,415 ක් හා රු.4,694 ක් බැගින් රු.8,223,190 ක් ගෙවා වාර්තා පිටපත් 1,600 ක් මුද්‍රණය කරවාගෙන තිබුණි. නැවත ඇණවුම් කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 (ඇ) වගන්තියට පටහැනිව සිදු කර ඇති බවත්, Digital Printing යටතේ මුද්‍රණය කළ වාර්තා පිටපත් 120 Offset Printing ක්‍රමවේදය යොදාගෙන මුද්‍රණය කරවා නොගැනීම හේතුවෙන් රු.3,185,633ක අමතර පිරිවැයක් දරා ඇති බවත් නිරීක්ෂණය විය.	ප්‍රසම්පාදනයේදී රජයට වඩාත් වාසිදායක ක්‍රමවේදය තෝරා ගැනීමට කටයුතු කළ යුතු වීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 (ඇ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මඟින් දන්වා තිබූ පරිදි වාර්ෂික වාර්තා පිටපත් 120 මුද්‍රණය කිරීම සඳහා වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ ආයතන 12 වෙතින් මිල ගණන් කැඳවන ලදී. මෙහි දී වාර්ෂික වාර්තා 120 පමණ කුඩා ප්‍රමාණයක් මුද්‍රණය කිරීමට නියමිත බැවින් Offset Printing ක්‍රමයට මුද්‍රණය කිරීමේ දී ඒ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු විය හැකි බව සලකා වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීමේ දී Digital Printing Method භාවිතයෙන් පමණක් මිල ගණන් කැඳවීම. අ.පො.ස උසස්පෙළ හදාරන සියලුම පාසල් ආවරණය වන පරිදි බෙදා දීමට අති ගරු ජනාධිපති තුමා උපදෙස් ලබා දී, ඒ අනුව දෙවන මුද්‍රණයේ පිටපත් 1,600ක් මුද්‍රණය කිරීම සඳහා Offset Printing ක්‍රමවේදය අනුගමනය කිරීම සුදුසු බව අමාත්‍යාංශයේ මහා පරිමාණ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය විය. තවද, ප්‍රථම වාර්ෂික වර්තා 120 මුද්‍රණය කිරීමේ දී පාසල් සඳහා බෙදා දීමට නියමිත වූ පොත් 1,600 පිළිබඳව	2024 දෙසැම්බර් 31 දින තෙක් එම වරද පිළිබඳව ප්‍රසම්පාදනයන් සිදු කරනු ලබන නිලධාරීන් දැනුවත් කර අදාළ උපදෙස් ලබා දී නොතිබුණි.

				දැනුවත්ව නොසිටි අතර පොත් කුඩා ප්‍රමාණයක් මුද්‍රණය කිරීම සඳහා වඩාත් වාසි දායක ක්‍රමය වන Digital Printing ක්‍රමවේදය අනුගමනය කරන ලදී.	
09.	(i)විවෘත තරඟකාරී ලංසු කැඳවා විසඳුම් සපයන්නෙකු (Solution Provider) තෝරා ගැනීමට කටයුතු කිරීමෙන් තොරව 2007 උපදේශකවරුන් තෝරාගැනීම හා සේවය ලබාගැනීම සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.13 වගන්තිය ප්‍රකාරව තනි ප්‍රභවයක් තෝරාගැනීමේ (Single Source Selection – SSS) පදනමට කොළඹ විශ්ව විද්‍යාලයට සම්බන්ධිත ආයතනයක් ලෙස හඳුන්වමින් පුද්ගලික සමාගමක් වෙත e-GP පද්ධතිය සැකසීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීමටත්, ඒ සඳහා මූලික ගිවිසුමකට එළඹීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් 2019 ජුනි 18 දින අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද, 2019 ඔක්තෝබර් 11 දින අමාත්‍ය මණ්ඩලයට	2023	ප්‍රසම්පාදනයේදී රජයට වඩාත් වාසිදායක ලෙස හා ඵලදායී වන අයුරින් නිවැරදි සැපයුම්කරුවන් තෝරා ගැනීමට කටයුතු කළ යුතු වීම.	තීක්ෂණ ආයතනය සමඟ මූලික ගිවිසුම අත්සන් කිරීමේදී ඉදිරිපත් කර තිබූ ලියවිලි අනුව කොළඹ විශ්ව විද්‍යාලයට අයත් බව නිරීක්ෂණය වී ඇති අතර පසුව කොළඹ විශ්ව විද්‍යාලයේ උපකුලපතිනිය දන්වා එවා ඇති පරිදි එම ආයතනය කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ නොමැති බවට තහවුරු වීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර ඇත.	2024 දෙසැම්බර් 31 දින වන විටත් වැරදි තොරතුරු ඉදිරිපත්කල පාර්ශවවලට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි

ඉදිරිපත් කළ සංදේශය අනුව උක්ත කොන්ත්‍රාත්කාර සමාගම, කොළඹ විශ්ව විද්‍යාලය (UCSC) යටතේ ක්‍රියාත්මක නොවන බවටත්, ස්වාධීන සමාගමක් බව කොළඹ විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමිය විසින් 2019 ජුනි 17 දිනැති ලිපිය මඟින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා තිබුණි.			
(ii) e-GP පද්ධතිය 2023 සැකසීමේ මූලික කොන්ත්‍රාත්තුව රු.71,500,000 කට පිරිනමා කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුම්ගත වීම 2019 නොවැම්බර් 25 දින සිදු කර තිබුණ ද 2021 දෙසැම්බර් 31 වන විටත් කොන්ත්‍රාත්කරු ප්‍රමාණවත් කාර්යසාධනයක් පෙන්වා නොතිබුණි. එසේ තිබිය දීත් e-GP පද්ධතියේ මෘදුකාංග සංවර්ධන ක්‍රියාවලිය නිර්දේශිත වැඩි දියුණු කිරීම් ඇතුලත් කරමින් මුල් කොන්ත්‍රාත් වටිනාකමට රු.81,370,000 ක් ඇතුළත් කර රු.152,870,000 ක්වූ	කොන්ත්‍රාත් කාලය තුළ ප්‍රමාණවත් කාර්යසාධනයක් නොපෙන්වන කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම්වල ප්‍රමාණවත් කොන්දේසි ඇතුළත් කරමින් කොන්ත්‍රාත් ගිවිසුම් පිළියෙල කිරීම හා ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම මත අවශ්‍ය පියවර ගැනීම කළ යුතු වීම.	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතන **(ICTA)** සහ ලෝක බැංකුවේ උපදේශකයන් විසින් ලබාදුන් යෝජනා අනුව තීක්ෂණ සමාගම සමඟ පැවති මුල් කොන්ත්‍රාත්තුව සංශෝධනය කිරීමට සිදුවිය.	මේ දක්වා අදාල කාර්‍යය අපේක්ෂිත පරිදි ඉටු කරවා ගැනීමට නොහැකි වී තිබුණි.

කොන්ත්‍රාත් වටිනාකමකට මාස 20 ක කාලයක් තුළ පද්ධතිය සැකසීම සඳහා එම කොන්ත්‍රාත්කාර සමාගම සමඟ 2023 මාර්තු 22 දින මුල් කොන්ත්‍රාත්තුවට අතිරේකයක් අත්සන් කර තිබුණි.				
(iii)2019 නොවැම්බර් 25 දින පද්ධතිය සංවර්ධනය කිරීමේ මූලික ගිවිසුමට එළඹී තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් මිල සැඳහුම් ක්‍රමය යටතේ පමණක් ලංසු කැඳවීමට පද්ධතිය සංවර්ධනය කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට e-GP පද්ධතියේ ලියාපදිංචි රාජ්‍ය ආයතන 465 ක් වූ අතර, එයින් ආයතන 69 ක් හෙවත් සියයට 15 ක් පමණක් e-GP පද්ධතියේ වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමයේ ක්‍රියාවලියට අවතීර්ණ වී තිබුණි. මුදල් අමාත්‍යාංශය විසින් e-GP පද්ධතිය හරහා ප්‍රසම්පාදන කටයුතු අවස්ථා 03 කදී පමණක් වූ අතර, භාණ්ඩාගාරය යටතේ පවතින	2023	රාජ්‍ය ආයතන, e-GP පද්ධතියේ වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමයේ ක්‍රියාවලියට අවතීර්ණ කරගත යුතු වීම. රාජ්‍ය ආයතනවල සියලුම ප්‍රසම්පාදනයන් සඳහා e-GP ක්‍රමය ව්‍යාප්ත කිරීම හා දැනට සංවර්ධනය කර ඇති මොඩියුල භාවිතයටත් අවශ්‍ය පියවර ගත යුතු වීම.	දැනට මිල සැඳහුම් ක්‍රමය යටතේ ලංසු කැඳවීමට පද්ධතිය සංවර්ධනය කර ඇති අතර 2024 වර්ෂය තුළදී විවෘත තරඟකාරී ලංසු ඉදිරිපත් කිරීමේ ක්‍රමයට ප්‍රසම්පාදන කටයුතු කිරීමට හැකිවන ලෙස promise.lk සංවර්ධනය කරමින් පවතී. 2024 මැයි 22 දින වන විට e-GP පද්ධතියේ ලියාපදිංචි රාජ්‍ය ආයතන 523 ක් වූ අතර, එයින් ආයතන 152 ක් හෙවත් සියයට 30ක් පමණක් e-GP පද්ධතියේ වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමයේ ක්‍රියාවලියට අවතීර්ණ වී තිබේ. මුදල් අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු 18 ක් මේ වන විට විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය යටතේ ලියාපදිංචි වී ඇති අතර, 2024 වර්ෂයේ	-එම-

	දෙපාර්තමේන්තු ද මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියට විධිමත්ව අවතීර්ණ වී නොතිබුණු බව නිරීක්ෂණය විය.			ප්‍රසම්පාදනයන් 28 විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හරහා සිදුකර ඇත.	
10.	තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශයේ ප්‍රවාහන ඒකකයට වාහන මෙහෙයුම් කටයුතු පහසු කිරීම සඳහා භාවිතා කළ හැකි පරිගණක යෙදවුමක් සකස් කර දී තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම පද්ධතිය භාවිතා කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.	2023	සකසා දී ඇති පරිගණක මෙහෙයුම් පද්ධතිය භාවිතයේ යෙදවීමට කටයුතු කළ යුතු වීම.	පරිගණක යෙදවුම් පද්ධතිය සම්බන්ධව පුහුණුවක් තොරතුරු තාක්ෂණ කළමණාකරණ දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇතත්, එම නිලධාරීන් දැනට ප්‍රවාහන අංශයේ සේවයේ නියුතුව නොමැති බැවින් නව නිලධාරීන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දී ඊලඟ වර්ෂයේ සිට මෙම පරිගණක යෙදවුම් පද්ධතිය නැවත භාවිතා කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	2024 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.
11.	මුදල් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බදු අභියාචනා කොමිෂන් සභාව වෙත 2011 වර්ෂයේ සිට 2023 ඔක්තෝබර් 31 දින දක්වා බදු අභියාචනා 1,706 ක් ලැබී තිබුණි. ඒ පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ. (i) 2023 දෙසැම්බර් 31 වන විට බදු අභියාචනා කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති	2023	බදු අභියාචනා සම්බන්ධ පරීක්ෂණ කටයුතු කඩිනම් කර හිඟ බදු මුදල් අයකර ගැනීමට නිසි පියවර ගත යුතු වීම.	බදු අභියාචනා කොමිෂන් සභාව විසින් 2023 දෙසැම්බර් 31 දක්වා නිශ්චයන් ලබා නොදුන් අභියාචනා 617 ක් ඇති අතර, ඊට අදාල මතභේදකාරී මුළු බදු මුදලේ වටිනාකම රු.120,632,702,366 ලෙස සඳහන් වුවද, අදාල අභියාචනා විමසීමේ ක්‍රියාවලිය තුල දී බදු ගෙවන්නන් සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අතර	බදු අභියාචනා කොමිෂන් සභාව විසින් 2024.08.31 දක්වා නිශ්චයන් ලබා නොදුන් අභියාචනා 534 ක් වූ අතර, ඊට අදාළ මතභේදකාරී මුළු බදු මුදලේ වටිනාකම රු.53,671,669, 136 ක් වී තිබුණි.

	නිශ්චයන් ලබා නොදුන් අභියාචනා 617 ක් තිබූ අතර ඊට අදාළ මතභේදකාරී මුළු බදු මුදලේ වටිනාකම රු. 120,632,702,366 ක් විය. මේ තුළ රුපියල් බිලියනය ඉක්මවන අභියාචනා 34 ක එකතු වටිනාකම රු.69,971,348,414 ක් හෙවත් නිශ්චයන් ලබා නොදුන් මුළු අභියාචනා වටිනාකමින් සියයට 58 ක් ද, රු.මිලියන 100 - 1000 පරාසය තුළ එකතුව රු. 40,264,266,831 ක් වූ අභියාචනා 133 ක් හෙවත් නිශ්චයන් ලබා නොදුන් මුළු අභියාචනා වල වටිනාකමින් සියයට 33 ක් විය.			සමතයකට පත් කිරීමට බදු අභියාචනා කොමිෂන් සභාව මැදිහත්වීම මෙන්ම කොමිෂන් සභාව විසින් විනිශ්චයන් ලබාදීමේදී මෙම මතභේදකාරී මුළු බදු මුදලේ වටිනාකම වෙනස්විය හැකි බැවින් නිශ්චිත වශයෙන් අදාල අභියාචනා මත අයවීමට ඇති මතභේදකාරී බදු මුදල (Disputed Value of Tax) ගණනය කළ හැකි නොවේ.	
(ii)	බදු අභියාචනා කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති මුළු අභියාචනා සංඛ්‍යාවෙන් අභියාචනා 1,059 ක් හෙවත් සියයට 62 ක් ආදායම් බදු සම්බන්ධයෙන් විය. එම අභියාචනාවලින් 2023 දෙසැම්බර් 31 දින වන විට විභාග කිරීම ආරම්භ කර ඇති අභියාචනා 455 ක් අතරින් ලියාපදිංචි කර වසර 03 – 12	2023	-එම-	2011 අංක 23 දරණ බදු අභියාචනා කොමිෂන් සභා පනතේ සාමාජිකයන් තිදෙනෙකු බැගින් වූ මණ්ඩල තුනක් පවත්වා ගෙන යාමට ප්‍රතිපාදන සලසා තිබුණද 2019 වර්ෂය දක්වාම සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුත් එක් විනිශ්චය සභාවක් වශයෙන් කොමිෂන් සභාව ක්‍රියාත්මක වී ඇති අතර, එකී කාලය තුළද තුන් අවුරුදු කාල	2024.08.31 දින වන විට ආදායම් බදු අභියාචනාවලට අදාළ මතභේදකාරී බදු වටිනාකම රු.11,502,913, 765 ක් වී තිබුණි.

	පරාසය තුළ නිශ්චය ලබා දී නොතිබූ මතභේදකාරී බදු වටිනාකම රු.29,466,916,108 ක් වූ අභියාචනා 183 ක් පැවති බව නිරීක්ෂණය විය.			සීමාව අවසානයේදී නව සාමාජිකයින් පත් කිරීම නිසි පරිදි සිදුවී නොමැතිවීම හේතුවෙන් අභියාචනා විමසීම් කටයුතුද අඛණ්ඩව සිදු වී නොමැත. එසේම, COVID -19 වසංගතය පැතිරුණු කාලසීමාව තුලද, මෙම කොමිෂන් සභාවේ කටයුතු පවත්වා ගෙන යාමට බාධා පැමිණීම හේතුවෙන් අභියාචනා විසදීමේ ප්‍රමාදයන් සිදුව ඇත. ජනාධිපතිතුමා විසින් 2022.09.01 දින සිට වත්මන් සාමාජිකයින් නව දෙනා පත් කිරීමත් සමඟ විධිමත්ව අභියාචනා විමසීම් කටයුතු ආරම්භ විය.	
12.	අංක 2187/27 හා 2020 අගෝස්තු 09 දිනැති ගැසට් පත්‍රය මඟින් ඇවර කිරීමට නියමිත වූ වනජීවී භාරය හා ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය මුදල් අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කර, 2023 දෙසැම්බර් 31 දින වන විට වසර 03 ක් ඉක්මවී තිබුණ ද, මෙම ආයතන දෙක ඇවර කර, නීති ප්‍රකාරව වසා දැමීම සිදු කර නොතිබුණි.	2023	අදාළ ආයතනවල ඇවර කිරීමේ කටයුතු අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතු වීම.	වනජීවී භාරය ආරම්භයේ සිට වසා දැමීම දක්වා සියලුම වර්ෂයන්ට අදාළ අවසන් ගිණුම් වාර්තා සකස් කර විගණනය කර නොමැත. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති පරිදි ආයතනයේ බැංකු ගිණුම වසා දමා සියලු වත්කම් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා දී ඇති බැවින් වසා දැමීමට අවශ්‍ය පියවර ගැනීමට අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබාගෙන	2024 දෙසැම්බර් 31 දින තෙක් ඇවර කර නීති ප්‍රකාරව වසා දමා නොතිබුණි.

		ඇත. වනජීවී භාරය වසා දැමීමට කටයුතු කළයුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබා ගැනීමට නීතිපති වෙත ලිපියක් යොමු කර ඇත. • ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනයේ තොරතුරු සොයාගත නොහැක. ජනාධිපති ලේකම් කාර්යාලය, ජනමධ්‍ය අමාත්‍යාංශ සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය එම තොරතුරු ඔවුන් සතුව නොමැති බව දැනුම් දී ඇත. ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් නැවත තොරතුරු විමසා 2024.05.16 දින ලිපියක් යොමු කර ඇති අතර පිළිතුරක් මේ වන විට ලැබී නොමැත.	
13. අමාත්‍යාංශයේ නිල 2023 නිවාස 12 ක් පිළිබඳව සමාලෝචිත වර්ෂයේදී සිදු කළ විගණන පරීක්ෂාවට අදාළ නිරීක්ෂණයන් පහත දැක්වේ.			
(i) අමාත්‍යාංශය විසින් නිල නිවාස ලබා දීමේදී නිලධාරින් සමග ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව නිලධාරින් 05	නිල නිවාස ලබා දීමේ කාලසීමාව සම්බන්ධයෙන් ඒකාකාරි ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු වීම.	-	සියලු නිල නිවාස ගිවිසුම් කාලසීමාව සංශෝධනය කිරීමට තීරණය කර තිබුණි.

	දෙනෙකු සඳහා වසර 05 ක කාල සීමාවක් සඳහාත්, නිලධාරින් 05 ක් සඳහා අමාත්‍යාංශයේ සේවය කරන තාක්කල් හෝ අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරන අයුරින් යම්කිසි කාලපරිච්ඡේදයක් සඳහා යනුවෙන් සඳහන් කර ලබා දී තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ නිලධාරින් වෙත නිල නිවාස ලබාදීමේ කාල සීමාව තීරණය කිරීම සම්බන්ධයෙන් ඒකාකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.			
(ii)	නිල නිවාස ආපසු 2023 හාරදීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශය විසින් ලිඛිතව දන්වා තිබුණ නිලධාරීන් දෙදෙනෙකු විගණිත දිනය වූ 2023 නොවැම්බර් 30 දින වන විටත් අදාළ නිල නිවාස හාරදීමට හෝ ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට පියවර ගෙන නොතිබුණි. ආයතන	නිල නිවාස හාර දීමට අපොහොසත් වන නිලධාරීන් පිළිබඳව ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 07 වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීම කළ යුතු වීම.	මෙම නිලධාරීන් හට නිල නිවාස හාර දීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශය විසින් ලිඛිතව 2024 මාර්තු මාසයේදී දන්වා ඇත. තව දුරටත් 2024.05.31 දින වන විටත් නිල නිවාස හාර නොදුන්නොත් 2024 මාර්තු මස සිට ආයතන සංග්‍රහය පරිදි 8% ක දඩ මුදලත් 12.5% ක නිවාස කුලී සහ	2024 දෙසැම්බර් 31 දින වන විටත් නිල නිවාස හාර දී නොතිබුණි.

සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 07 වගන්තිය අනුව නිවාසයෙන් අස්වී යන ලෙස නිලධරයෙකුට නියම කළ විට ඔහු එසේ නොකළහොත්, 1971 අංක 3 හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 07 දරණ රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත යටතේ ඔහු එම නිවාසයෙන් ඉවත් කිරීමටත්, බදු කාලය ඉක්මවා නිවාසයක පදිංචිව සිටින කාලය වෙනුවෙන් දණ්ඩන කුලියක්ද ඔහුගෙන් අයකරගත යුතු බව දක්වා තිබුණු නමුත් වසර 07ක පමණ සිට නිල නිවාස ආපසු භාර දී නොමැති නිලධාරිනියන් දෙදෙනා සඳහා අමාත්‍යාංශය විසින් 2023 නොවැම්බර් 30 දින වන විටත් ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.			ආර්ථික කුලී අය කර ගන්නා බවට දැනුම් දී ඇත.	
(iii) අමාත්‍යාංශය සතු නිල නිවාසයක් 2016 වර්ෂයේදී නිලධාරියෙකු වෙත ලබා දී තිබූ අතර, එම නිල නිවාසයට අදාළ	2023	ලිපිගොනු පවත්වාගෙන යනු ලබන විෂය භාර නිලධාරීන් වෙත අදාළ ලිපිගොනු සුරක්ෂිතව	මුල් ලිපිගොනුව අස්ථානගත වී ඇති බැවින් වර්තමානයේ ඇති ලිපිගොනු අනුව කටයුතු කරමින් පවතී.	2024 දෙසැම්බර් 31 දින වන විටත් අස්ථානගත වූ ලිපිගොනුව සොයාගෙන

	මුල් ලිපිගොනුව අස්ථානගත වී තිබුණි.		පවත්වා ගැනීමේ වගකීම පැවරීම හා අස්ථානගත වූ ලිපිගොනුව සොයා ගැනීමට කටයුතු කළ යුතු වීම.		නොතිබුණි.
14.	2023 දෙසැම්බර් 31 දින වන විට අමාත්‍යාංශයේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 103 ක් වී තිබුණි. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 18 ක් ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 57 ක් ද විය.	2023	විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීම හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතු වීම.	වාර්ෂික ස්ථාන මාරු, වාර්ෂික නොවන ස්ථාන මාරු, යටතේ අනුයුක්ත කිරීම්, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සිදු කරන නව බඳවා ගැනීම් යටතේ අනුයුක්ත කරන නිලධාරීන් හා සේවා අවශ්‍යතාව මත අමාත්‍ය මණ්ඩලය විසින් සිදුකරන අනුයුක්ත කිරීම් මගින් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සිදු කරන අතර, පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ පත්කිරීම් බලධාරීන් දැනුවත් කර ඇත. මීට අමතරව මෙම තනතුරු සඳහා අමාත්‍යාංශය මගින් නිලධාරීන් බඳවා ගැනීම සිදු නොවේ.	2024 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 16 ක්, ද්විතියික මට්ටමේ 49 ක් පැවති අතර, සමස්ත පුරප්පාඩු ගණන 65 කි.
15.	වෙනත් ආයතනවල සේවය සඳහා නිදහස් කරන ලද නිලධාරීන් 15 දෙනෙකු සඳහා 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් වැටුප් හා දීමනා ලෙස එකතුව රු.8,086,967 ක් ගෙවා	2023	සේවය කරන ලද ආයතනවලින් වැටුප් හා දීමනා ලබා ගැනීමට හැකිවන පරිදි විධිමත් ලෙස මුදාහැරීමට කටයුතු කළ යුතු	අමාත්‍ය මණ්ඩලය විසින්, අදාළ පත්කිරීම් බලධාරීන් විසින් සේවා අවශ්‍යතාවය මත, සහ නිලධාරීන්ගේ පෞද්ගලික ඉල්ලීම් සාධාරණීකරණය කිරීමෙන් අනතුරුව	2024 දෙසැම්බර් 31 දින වන විටත් වෙනත් ආයතන සඳහා පත්කිරීම් වළක්වන විධිවිධාන

තිබුණි.	වීම.	නිශ්චිත කාල සීමා සඳහා වෙනත් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සඳහා නිලධාරීන් මුදා හැර ඇත.	ඇතුළත් උපදෙස් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.